RESPECT WOMEN

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම

World Health Organization

UNITED NATIONS HUMAN RIGHTS OFFICE OF THE HIGH COMMISSIONER

UNDP

UNFPA

UNODC United Nations Office on Drugs and Crime

UN WOMEN

Ministry of Foreign Affairs of the Nether

Australian Government

UKaid from the British people

USAID FROM THE AMERICAN PEOPLE

Sida SWEDISH INTERNATIONAL DEVELOPMENT COOPERATION AGENCY

WORLD BANK GROUP

WHO/RHR/18.19

© World Health Organization 2019

Some rights reserved. This work is available under the Creative Commons Attribution-NonCommercial-ShareAlike 3.0 IGO licence (CC BY-NC-SA 3.0 IGO; https://creativecommons.org/licenses/by-nc-sa/3.0/igo).

Under the terms of this licence, you may copy, redistribute and adapt the work for non-commercial purposes, provided the work is appropriately cited, as indicated below. In any use of this work, there should be no suggestion that WHO endorses any specific organization, products or services. The use of the WHO logo is not permitted. If you adapt the work, then you must license your work under the same or equivalent Creative Commons licence. If you create a translation of this work, you should add the following disclaimer along with the suggested citation: "This translation was not created by the World Health Organization (WHO). WHO is not responsible for the content or accuracy of this translation. The original English edition shall be the binding and authentic edition".

Any mediation relating to disputes arising under the licence shall be conducted in accordance with the mediation rules of the World Intellectual Property Organization.

Suggested citation. RESPECT women: Preventing violence against women. Geneva: World Health Organization; 2019 (WHO/RHR/18.19). Licence: CC BY-MC-SA 3.0 IGO.

Cataloguing-in-Publication (CIP) data. CIP data are available at http://apps.who.int/iris.

Sales, rights and licensing. To purchase WHO publications, see http://apps.who.int/bookorders. To submit requests for commercial use and queries on rights and licensing, see http://www.who.int/about/licensing.

Third-party materials. If you wish to reuse material from this work that is attributed to a third party, such as tables, figures or images, it is your responsibility to determine whether permission is needed for that reuse and to obtain permission from the copyright holder. The risk of claims resulting from infringement of any third-party-owned component in the work rests solely with the user.

General disclaimers. The designations employed and the presentation of the material in this publication do not imply the expression of any opinion whatsoever on the part of WHO concerning the legal status of any country, territory, city or area or of its authorities, or concerning the delimitation of its frontiers or boundaries. Dotted and dashed lines on maps represent approximate border lines for which there may not yet be full agreement.

The mention of specific companies or of certain manufacturers' products does not imply that they are endorsed or recommended by WHO in preference to others of a similar nature that are not mentioned. Errors and omissions excepted, the names of proprietary products are distinguished by initial capital letters.

All reasonable precautions have been taken by WHO to verify the information contained in this publication. However, the published material is being distributed without warranty of any kind, either expressed or implied. The responsibility for the interpretation and use of the material lies with the reader. In no event shall WHO be liable for damages arising from its use.

Printed in Switzerland

RESPECT women:

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම

World Health Organization

UNITED NATIONS HUMAN RIGHTS OFFICE OF THE HIGH COMMISSIONER

UNDP

UNFPA

UNODC United Nations Office on Drugs and Crime

UN WOMEN

Ministry of Foreign Affairs of the Netherlands

Australian Government

UKaid from the British people

USAID FROM THE AMERICAN PEOPLE

Sida SWEDISH INTERNATIONAL DEVELOPMENT COOPERATION AGENCY

WORLD BANK GROUP

හැඳින්වීම

මෙම ලේඛනයෙහි මූලික පාඨක පිරිස වන්නේ ප්‍රතිපත්ති සම්පාදකයන්ය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ යෙදී සිටින වැඩසටහන් ක්‍රියාත්මක කරන්නන් හට ද මැදිහත්වීම් නිර්මාණය කිරීමේදී, සැලසුම් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී, අධීක්ෂණයේදී හා ඇගයීමේදී එය ප්‍රයෝජනවත් වනු ඇත.

පටුන

I
කරුණු දැනගන්න 4

II
6 අවදානම හා ආරක්ෂක සාධක තක්සේරු කරන්න

III
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මූලෝපාය 7 ක්‍රියාත්මක කරන්න 8

IV
10 මැදිහත්වීම් පිළිබඳ සාක්ෂි තක්සේරු කිරීම

V
වෙනස් කිරීමේ න්‍යායක් නිර්මාණය කරන්න 12

VI
14 වැළැක්වීමේ මාර්ගෝපදේශ මූලධර්ම ආදේශ කරන්න

VII
වැළැක්වීම සඳහා හැකියාව ඇති කරන පරිසරය ශක්තිමත් කරන්න 16

VIII
18 සාර්ථක වන දේ අනුරූප කරගන්න, පුළුල් කරන්න

IX
ප්‍රගතිය අධීක්ෂණය, ඇගයීම හා මැනීම කරන්න 20

X
22 ක්‍රියාකාරීත්වය සඳහා කැපවන්න

කරුණු දැනගන්න

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය (VAW) යනු **මානව හිමිකම් උල්ලංඝනයකි**. එය සමාජභාවී අසමානතාව තුළ මුල්බැසගෙන තිබේ. එය **මහජන සෞඛ්‍ය ප්‍රශ්නයකි**. තිරසර සංවර්ධනයට බාධාවකි.

ආසන්න වශයෙන් ලොව පුරා කාන්තාවන්ගෙන් **තුනෙන් එකක් (35%)** සමීප සහකරු විසින් සිදුකරනු ලබන ශාරීරික සහ/ හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයට හෝ ඕනෑම වැරදිකරුවකු විසින් සිදුකරනු ලබන ලිංගික හිංසනය ඇතුළත් නොවන ලිංගික ප්‍රචණ්ඩත්වයට මුහුණදී තිබේ.

ගෝලීයව, කාන්තාවන්ගෙන් **30%** ක් තම ජීවිත කාලය තුළදී සමීප සහකරු විසින් සිදුකරනු ලබන ශාරීරික සහ/ හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයට මුහුණදී ඇත.

නවයොවුන් ගැහැණු ළමයින්, තරුණ කාන්තාවන්, වාර්ගික හා වෙනත් සුළුතරයන්ට අයිති කාන්තාවන්, සංක්‍රාන්ති ලිංගික කාන්තාවන් සහ ආබාධ සහිත කාන්තාවන් විවිධ ස්වරූපයේ ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධ **ඉහළ අවදානම්වලට** මුහුණදෙති.

මානුෂීය හදිසි අවස්ථා හේතුවෙන් දැනට පවත්නා ප්‍රචණ්ඩත්වය වර්ධනය විය හැකි අතර අමතර ආකාරවල කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැනනැගිය හැකිය.

ගෝලීයව කාන්තා මිනීමැරුම්වලින් **38%-50%** ප්‍රමාණයක් සිදුකරනු ලබන්නේ **සමීප සහකරුවන්** විසිනි.

ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ගේ ශාරීරික හා මානසික **සෞඛ්‍යයට** හා යහපැවැත්මට අහිතකර ලෙස බලපායි. එහි **සමාජ හා ආර්ථික ප්‍රතිඵල** තිබේ. පවුල්වලට, ප්‍රජාවන්ට හා සමාජයන්ට බලපෑම් ඇතිකරයි.

පහළ මට්ටමේ අධ්‍යාපනය, ළමාවියේදී ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම, සමීප සම්බන්ධතාවලදී අසමාන බලය සහ ප්‍රචණ්ඩත්වය හා සමාජභාවී සමානාත්මතාව පිළිගන්නා ආකල්ප සහ සමාජ සම්මතයන් හේතුවෙන් **සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ හා ලිංගික ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලැබීමේ** අවදානම වැඩිවේ.

පහළ මට්ටමේ අධ්‍යාපනය, ළමයින්ට වැරදි ලෙස සැලකීම හෝ පවුල තුළදී ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම, හානිකර අන්දමින් මත්පැන් භාවිතා කිරීම, ප්‍රචණ්ඩත්වය පිළිගන්නා ආකල්ප සහ සමාජභාවී අසමානතාව හේතුවෙන් **සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සිදුකිරීමේ අවදානම** වැඩිවේ.

ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු කාන්තාවන්ගෙන් බහුතරය (**55-95%**) එය හෙළිදරව් කරන්නේ හෝ කිසිදු ආකාරයක සේවාවන්ගේ සහාය ලබාගන්නේ හෝ නැත.

කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය **වැළැක්විය හැකිය**. ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා අවදානම් නිර්මාණය කරන සාධක අවම කරන්න. ආරක්ෂණ සාධක වර්ධනය කරන්න.

අවදානම සහ ආරක්ෂණ සාධක තක්සේරු කරන්න[1]

අවදානම් සාධක

සමාජයීය	ප්‍රජා	අන්තර් පුද්ගල	පුද්ගල
දේපළ හිමිකම සම්බන්ධ වෙනස්කොට සලකන නීති, විවාහය, දික්කසාදය හා ළමා භාරකාරත්වය	පිරිමි වරප්‍රසාදිත තත්වය සහ කාන්තා ස්වාධිපත්‍ය වර්ධනය කරන හානිකර සමාජ සම්මතයන්	සමබන්ධතාවන්ට අදාළව ඉහළ මට්ටම්වල අසමානතාව/ පිරිමින් විසින් සම්බන්ධතා පාලනය කිරීම/සහකරුවා මත රඳාපැවතීම	ළමාවියේ ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලැබීම සහ/ හෝ පවුල තුළ ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම
කාන්තාවන් සවිබලගැන්වී තිබීමේ පහළ මට්ටම හා පහළ මට්ටමේ අධ්‍යාපනය	දරිද්‍රතාවේ හා විරැකියාවේ ඉහළ මට්ටම	පිරිමින්ගේ බහුවිධ ලිංගික සම්බන්ධතා	මානසික අසමතුලිතතා
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් නීති නොමැතිකම හෝ බලාත්මක කිරීමේ අඩුපාඩු	ප්‍රචණ්ඩත්වයේ සහ අපරාධවල ඉහළ අනුපාතිකය	පිරිමින් විසින් මත්ද්‍රව්‍ය සහ මත්පැන් හානිකර ලෙස භාවිතා කිරීම	ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය දෙයක් ලෙස භාරගැනීම සාධාරණීකරණය කරන ආකල්ප
ආයතනවල සමාජභාවී වෙනස්කම් (උදා: පොලිසිය, සෞඛ්‍ය)	මත්පැන්, මත්ද්‍රව්‍ය සහ අවි ආයුධ		

සමාජයීය	ප්‍රජා	අන්තර් පුද්ගල	පුද්ගල
පහත දැක්වෙන ආකාරයේ නීති: • සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන • විධිමත් රැකියාවන් වෙත කාන්තාවන්ගේ ප්‍රවේශය ප්‍රවර්ධනය කරන • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන	අවිහිංසාව හා සමාජභාවී සාධාරණත්වය සහිත සම්බන්ධතා සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කරන සමාජ සම්මතයන්	තීරණ ගැනීමේ හා ගෘහස්ථ වගකීම් බෙදහදාගන්නා සමාජභාවී සමානාත්මතාව ප්‍රධාන ලක්ෂණයක් වන සමීප සම්බන්ධතා	පවුල තුළ ප්‍රචණ්ඩත්වයට නිරාවරණය නොවීම කාන්තාවන් හා පිරිමින් සඳහා ද්විතීයක අධ්‍යාපනය සහ කාන්තාවන් සහ පිරිමින් අතර අධ්‍යාපන මට්ටමේ අඩු අසමානතාව පිරිමින් හා පිරිමි ළමයින් ද, කාන්තාවන් හා ගැහැණු ළමයින් ද සමාජානුයෝගය කර තිබෙන අතර සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප සහිතය

ආරක්ෂණ සාධක

R E S P E C T

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා මූලෝපායන් ක්‍රියාත්මක කිරීම[2]

7

R සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම

පුද්ගලයන් හෝ කාන්තාවන්, පිරිමින් හෝ යුවල කණ්ඩායම් ඉලක්ක කරගත්, අන්තර් පුද්ගල සන්නිවේදනය, ගැටුම් කළමනාකරණය සහ පොදු තීරණ ගැනීම සම්බන්ධ මූලෝපායන්ට අදාළ වේ.

E කාන්තාවන් සවිබලගැන්වීම

මෙය අදාළ වන්නේ, දේපළ හිමිකාරිත්වයේ උරුමය හා අයිතිය, ක්ෂුද්‍ර මූල්‍ය සහ සවිබලගැන්වීමේ පුහුණු මැදිහත්වීම්, සාමූහික ක්‍රියාකාරකම්, ආරක්ෂිත අවකාශ නිර්මාණය කිරීම සහ ස්වයං සඵලතාව, විශ්වසනීය ශක්තිමත් චර්යා, සාකච්ඡා සහ ස්වයං විශ්වාසය සම්බන්ධයෙන් කුසලතා ගොඩනැගීම සඳහා මගපෙන්වීම ඇතුළු ආර්ථික හා සමාජ සවිබලගැන්වීම්වලටයි.

S සේවාවන් තහවුරු කිරීම

පොලිසිය, නීති, සෞඛ්‍ය සහ සමාජ සේවා ඇතුළු ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ට සපයනු ලබන සේවාවන් පරාසයකට අදාළ වේ.

P දිළිඳුකම අවම කිරීම

දිළිඳුකම දුරලීම මූලික වශයෙන් ඉලක්ක කරන ලද කාන්තාවන් හෝ පවුල් හෝ ඉලක්ක කළ මූලෝපායන්ට අදාළ වේ. මුදල් ලබාදීම, ඉතිරි කිරීම්, ක්ෂුද්‍ර මූල්‍ය ණය, ශ්‍රම බලකා මැදිහත්වීම් ආදිය එයට අයත් වේ.

E පරිසරයන් සුරක්ෂිත කිරීම

ආරක්ෂිත පාසල්, පොදු අවකාශ සහ සේවා පරිසරයන් නිර්මාණය කිරීමේ ක්‍රියාමාර්ගයන් ඇතුළු ප්‍රයත්නයන්ට අදාළ වේ.

C ළමා හා නවයොවුන් අපයෝජන වැළැක්වීම

INSPIRE - 7 strategies for preventing violence against children හි සඳහන් ආකාරයේ යහපත් පවුල් සම්බන්ධකම් ස්ථාපිත කිරීම, ශාරීරික දඬුවම් තහනම් කිරීම සහ මව්පිය වගකීම හා සම්බන්ධ වැඩසටහන් සමග අදාළ වේ.

T ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම කිරීම

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කරන හා බේරුණු පුද්ගලයන් පිළිකුලට ලක්කරන හානිකර සමාජභාවී ආකල්පවලට, විශ්වාසයන්ට, සමාජ සම්මතයන්ට හා කාන්තා යටත්භාවය හා පිරිමි වරප්‍රසාදිත තත්වය තහවුරු කරන ඒකාකෘතිවලට අභියෝග කරන මූලෝපායන් සමග සම්බන්ධ වේ. මේවා පොදු ප්‍රචාරණ ක්‍රියාමාලා සහ ප්‍රජා බලමුළුගැන්වීමේ ප්‍රයත්නයන් සඳහා වන සමූහ අධ්‍යාපනය අයත් වන පුළුල් පරාසයක විහිදේ.

මැදිහත්වීම් පිළිබඳ සාක්ෂි තක්සේරු කිරීම[3]

සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම

සමානාත්මතාවාදී ආකල්ප සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කරන කාන්තාව සහ පිරිමි කණ්ඩායම් පාදක වැඩමුළු

H L

යුවලවලට සපයනු ලබන උපදේශනය හා ප්‍රතිකාර

H L

උදාහරණ

කණ්ඩායම් පාදක වැඩමුළු

දකුණු අප්‍රිකාවේ වයස අවුරුදු 15-26 අතර කාන්තාවන් සහ පිරිමින් අතර Stepping Stones වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් පසු අවුරුදු දෙක තුළදී පදනම් නියැදියට සාපේක්ෂව මැදිහත්වීමේ කණ්ඩායම තුළ පිරිමින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය, දූෂණය හා හුවමාරු ලිංගික ගනුදෙනු සිදුකිරීමේ ඉඩ අඩු විය.[x]

කාන්තාවන් සවිබලගැන්වීම

ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ, උපදේශනය ඇතුළු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා පුහුණුව

H L

උරුමය සහ දේපළ හිමිකාරීත්වය සම්බන්ධ ප්‍රතිපත්ති සහ මැදිහත්වීම්

H L

ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් සහ ණය සහ සමාජභාවී හා සවිබලගැන්වීමේ පුහුණු උපාංග

H L

උදාහරණ

ක්ෂුද්‍ර මූල්‍ය සහ සමාජභාවය හා සවිබලගැන්වීම

දකුණු අප්‍රිකාවේ IMAGE ව්‍යාපෘතිය (ක්ෂුද්‍ර මූල්‍ය ආධාර හා සමාජභාවී සාධාරණත්වය සම්බන්ධ මැදිහත්වීම) මගින් ක්ෂුද්‍ර මූල්‍ය හා සමාජභාවය හා ප්‍රජා සවිබලග ැන්වීම සම්බන්ධ පුහුණුව සහ ප්‍රජා බලමුළුගැන්වීම් ක්‍රියාමාර්ග හරහා කාන්තාවන් සවිබලගන්වනු ලැබේ. අධ්‍යයන මගින් පෙන්වා දෙන ලද පරිදි, එමගින් මැදිහත්වීම සිදුවූ කණ්ඩායම තුළ ප්‍රචණ්ඩත්වය වසර දෙකකදී 50%කින් අවම විය. මෙම මැදිහත්වීම පිරිවැය පැත්තෙන් ඉතා ඵලදායී වූ අතර, පුළුල් කිරීමේ දෑවුරුදු කාලය තුළදී එක් මැදිහත්වීමක් වෙනුවෙන් වන එක්සත් ජනපද ඩොලර් 244ක් බැගින් වන මුදල් ඉතිරි කරගත හැකි විය.[w]

සේවාවන් තහවුරු කිරීම

සේවාවන් වෙත ප්‍රවේශය ලබාගැනීමට සහාය ලබාදීම සඳහා සවිබලගැන්වීමේ මැදිහත්වීම් හෝ මනෝසමාජ සහාය (එනම්, උද්දේශනය)

H L

මත්පැන් අවභාවිතය වැළැක්වීමේ මැදිහත්වීම්

H L

රැකවරණ ස්ථාන

H L

සෘජු දුරකථන අංක

H L

එක් තැනකින් සේවා සපයන මධ්‍යස්ථාන

H L

වැරදි කරන්නන්ගේ මැදිහත්වීම්

H L

කාන්තාවන්ගේ පොලිස් ස්ථාන/ ඒකක

H L

පරීක්ෂක සෞඛ්‍ය සේවා

H L

ආයතනික පරිසරය වෙනස් නොකර ආයතනික පිරිස් සංවේදී කිරීම හා පුහුණුව

H L

උදාහරණ

බේරුණු පුද්ගලයන් සඳහා උද්දේශනය

ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන්හි ප්‍රජා උද්දේශන ව්‍යාපෘතිය යනු, සමීප සහකරු ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු කාන්තා වින්දිතයන්ට තම ජීවිතවල පාලනය නැවත ස්ථාපිත කරගැනීම සඳහා උපකාර කිරීම සඳහා සැලසුම් කරන ලද සාක්ෂි මත පදනම් වූ වැඩස-ටහනකි. එහිදී පුහුණු උද්දේශකවරුන් විසින් බේරුණු පුද්ගලයන්ට උද්දේශනය සහ එක් එක් පුද්ගලයා වෙනුවෙන් ප්‍රජා සම්පත් හා සමාජ සහාය වෙත සැලසුම් කරන ලද සහාය සපයනු ලැබේ. මෙම මැදිහත්වීම මගින් ප්‍රචණ්ඩත්වය නැවත සිදුකිරීමේ ප්‍රවණතාව හා විෂාධය අවම කළ හැකි බව සොයාගන්නා ලදී. එසේම, ජීවිත ගුණය හා සමාජ සහාය වර්ධනය කිරීමේ හැකියාව ද එයට තිබේ. මැදිහත්වීම අවසන් වී අවුරුදු දෙකකට පසුව පවා සාධනීය වෙනස්කම් දිගටම සිදුවෙමින් තිබිණි.[y]

දිළිඳුකම අවම කිරීම

කොන්දේසි සහිත හා රහිත මුදල් හුවමාරු ඇතුළු ආර්ථික හුවමාරු සහ වවුචර සහ හුවමාරු ගනුදෙනු

H L

රැකියා ප්‍රතිපත්ති, ජීවනෝපාය සහ රැකියා පුහුණුව ඇතුළු ශ්‍රම බලකා මැදිහත්වීම්

H L

අමතර උපාංග රහිතව ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් මැදිහත්වීම්

H L

පරිසරයන් සුරක්ෂිත කිරීම

යටිතල පහසුකම් සහ ප්‍රවාහනය

H L

අසල සිටින්නන්ගේ මැදිහත්වීම්

H L

සමස්ත පාසල් මැදිහත්වීම

H L

ළමා හා නවයොවුන් අපයෝජන වැළැක්වීම

නිවෙස් වෙත යාම සහ සෞඛ්‍ය සේවකයන්ගේ විහිදීම

H L

දරුවන් හැදීමේ මාපිය මැදිහත්වීම්

H L

ප්‍රචණ්ඩ අත්දැකීම් ලබන සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලබන ළමයින් සඳහා මනෝසමාජයීය සහාය

H L

ජීවන කුසලතා/ පාසල් පාදක විෂයමාලා, දූෂණය සහ තාවකාලික සම්බන්ධවල ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පුහුණුව

H L

ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම කිරීම

ප්‍රජා බලමුළුගැන්වීම

H L

ආකල්ප සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම ප්‍රවර්ධනය කරන කාන්තා සහ පිරිමි කණ්ඩායම් පදනම් කරගත් වැඩමුළු

H L

සමාජ අලෙවිකරණය හෝ විනෝද අධ්‍යාපනය හෝ සාමූහික අධ්‍යාපනය

H L

ආකල්ප සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම සඳහා පිරිමින් සහ පිරිමි ළමයින් සමග සාමූහික අධ්‍යාපනය

H L

තනි දැනුවත් කිරීමේ ව්‍යාපාර/ තනි උපාංග සන්නිවේදන ව්‍යාපාර

H L

උදාහරණ

ආර්ථික හුවමාරු

ලෝක ආහාර වැඩසටහන විසින් මුදල්, වවුචර සහ ආහාර ලබාදීමේ වැඩසටහනක් උතුරු ඉක්වඩෝරයේ ක්‍රියාත්මක කරන ලදී. එහි ඉලක්කය වූයේ නාගරික ප්‍රදේශවල දිළිඳු කාන්තාවන්ය. අරමුණ දිළිඳුභාවය අවම කිරීමයි. මාසික පෝෂණ රැස්වීම්වලට සහභාගී වීමේ කොන්දේසිය මත වැඩසටහනට සහභාගී වූ පවුල්වලට මාස හයක් පුරා ඩොලර් 40ක් වටිනා මුදල් මාසිකව ලැබිණි. කාන්තාවන්ගේ චර්යාවන් පාලනයට ලක්කිරීම සහ සමීප සහකරුවන් විසින් සිදුකරනු ලබන ශාරීරික සහ/ හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය 19-30% අතර ප්‍රමාණයකින් අවම විය. මේ සඳහා සත්‍ය ස්වරූපී යාන්ත්‍රණයක් වන්නේ යුවල අතර දිළිඳුභාවය සම්බන්ධ ආතති හේතුවෙන් සිදුවන ගැටුම් අවම වීමයි.[p]

උදාහරණ

Right to Play - පාසල්වල ළමයින් අතර හා ළමයින්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය වැළැක්වීම

පාකිස්තානයේ සින්ධ් ප්‍රාන්තයේ හයිදරාබාද්හි රයිට් ටු ප්ලේ මැදිහත්වීමට රජයේ පාසල්වල ගැහැණු හා පිරිමි ළමයින් 40ක් සම්බන්ධ වූහ. ක්‍රීඩා පාදක අධ්‍යාපනික වැඩසටහනක් වන එමගින් විශ්වාසය, සන්නිවේදනය, සහකම්පනය, නිශේධාත්මක හැඟීම් සමග කටයුතු කිරීම, දරාගැනීම, සහයෝගය, නායකත්වය, විචාරාත්මක චින්තනය සහ ගැටුම්, නොඉවසීම, සමාජභාවී වෙනස්කම් හා සම වයස් ප්‍රචණ්ඩත්වය පිටුදැකීමට උපකාර කරන ගැටුම් නිරාකරණය ආදී ජීවන කුසලතා සංවර්ධනය කරගැනීමේ අවස්ථාව ලැබිණි. මැදිහත් වීමෙන් මාස 24කට පසුව, පිරිමි ළමයින් අතර 33%ක හා ගැහැණු ළමයින් අතර 59%ක සම වයස් වින්දිතකරණයේ අඩුවක් ද, පිරිමි ළමයින් අතර 45%ක හා ගැහැණු ළමයින් අතර 66%ක ශාරීරික දඬුවම්වල අඩුවක් ද, පිරිමි ළමයින් අතර 65%ක හා ගැහැණු ළමයින් අතර 70%ක ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දැකීමේ අඩුවක් ද ඇගයීමක් මගින් පෙන්නුම් කරන ලදී.[o]

උදාහරණ

ප්‍රජා බලමුළුගැන්වීම්

උගන්ඩාවේ ප්‍රජා මැදිහත්වීමක් වන SASA! මගින් පිරිමින් හා කාන්තාවන් අතර සම්බන්ධතාවල බල තුලනය වෙනස් කිරීම මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම අරමුණු කරන ලදී. එම ප්‍රජාවන්ගේ කාන්තාවන් හා පිරිමින් අතරින් 76%ක් තම සහකාරියට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිගත හැකි දෙයක් ලෙස සලකන බව ද, පාලිත ප්‍රජාවන්ගේ කාන්තාවන් හා පිරිමින් අතරින් එය පිළිගත්තේ 26%ක් පමණක් බව ද අධ්‍යයන මගින් පෙන්වාදෙන ලදී. පරීක්ෂණ අදියරේදී, සහකරු ප්‍රචණ්ඩත්වයේ එක් සිදුවීමකට එක්සත් ජනපද ඩොලර් 460ක් බැගින් වන වියදම් වළක්වාගන්නා ලදී. මැදිහත්වීම පිරිවැය අතින් ඵලදායී වන අතර පුළුල් කිරීම හරහා වැඩි ආර්ථික වාසි ලබාගත හැකිය.[v]

යතුර [4]

- **බලාපොරොත්තු සහගත,** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- **වැඩිදුර සාක්ෂි අවශ්‍යය,** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.[5]
- **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- **අකාර්යක්ෂම,** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- **H** ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- **L** ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

මූලික සිදුවීම

R සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම

E කාන්තාවන් සවිබලගැන්වීම

S සේවාවන් තහවුරු කිරීම

P දිළිඳුකම අවම කිරීම

E පරිසරයන් සුරක්ෂිත කිරීම

C ළමා හා නවයොවුන් අපයෝජන වැළැක්වීම

T ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම කිරීම

දැනුම හා දරාගැනීම මත ගොඩනැගෙමින් විසඳුම් සොයාගැනීම සඳහා ප්‍රජාවන්ට සම්පත් සැපයීම හා සහාය වීම

බාධක

- කාන්තා ස්වාධිපත්‍යයේ **සීමා**
- **ප්‍රචණ්ඩත්වයට** නිරාවරණය වන ළමයි
- **පිරිමි බලය** තහවුරු කරන සමාජ සම්මතයන්
- ප්‍රමාණවත් **සේවා**
- කාන්තාවන්ට **නීතිමය හා සමාජ ආරක්ෂාව**
- **දේශපාලන අධිෂ්ඨානය සහ සම්පත්** හිඟ වීම
- ප්‍රමාණවත් තරම් සම්පත් නැති **කාන්තා සංවිධාන හෝ ව්‍යාපාර**

ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන **කාන්තාවන්**

ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වන **පවුල්**

ඉහළ මට්ටමේ ප්‍රචණ්ඩත්වයක් ඇති **ප්‍රජාවන්**

ප්‍රතිදාන

- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැඩසටහන් පුළුල්ව ක්‍රියාත්මක කර ඇත
- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වැඩි සම්පත් හා දේශපාලන අධිෂ්ඨානය
- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මහජන සෞඛ්‍ය ප්‍රශ්නයක් බවට සහ එය වැළැක්විය හැකි බවට තිබෙන ඉහළ දැනුවත් බව

ප්‍රතිඵල

- සෞඛ්‍යය, ආර්ථිකය සහ සමාජ සංවර්ධනය සම්බන්ධ ආංශික ප්‍රතිඵල වැඩිදියුණු කිරීම (උදා: වැඩියුණු කරන ලද මානසික සෞඛ්‍යය, අවම කරන ලද ගෘහ දරිද්‍රතාව, වැඩිදියුණු කරන ලද කාන්තා හා ළමා සෞඛ්‍යය, වැඩිදියුණු කරන ලද කාන්තා අධ්‍යාපනය හා ඉපැයීම් සහ අවම කරන ලද නොපැමිණීම)
- පවුල්, ප්‍රජාවන් සහ ආයතන සමාජභාවී සමානතාව සමාජ සම්මතයක් ලෙස විශ්වාස කරමින් ප්‍රවර්ධනය කරයි. තවදුරටත් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිනොගනියි
- පිරිමි කාන්තාවන් සමානයන් ලෙස පිළිගෙන සලකති
- කාන්තාවන්ට ස්වාධීන තීරණ ගත හැකිය.
- කාන්තාවන්ට තම අයිතිවාසිකම් හා වැඩසටහන් වෙත ප්‍රවේශය පිළිබඳ දැනුම තිබේ.

බලපෑම

- පවුල්වල, ප්‍රජාවන්ගේ සහ සමාජව වැඩිදියුණු කරන ලද සෞඛ්‍ය හා සංවර්ධන ප්‍රතිඵල
- කාන්තවෝ තම මානව හිමිකම් භුක්ති විඳිමින් සංවර්ධනයට දායක වෙති.
- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරලා තිබේ.
- සමානත්වය හා ගරුත්වය සමීප. පවුල් හා ප්‍රජා සම්බන්ධතාවලදී භාවිතා වේ.
- අන්තර් පුද්ගල ගැටුම් සාමකාමී ලෙස විසඳාගනු ලැබේ.

ඵලදායී වැඩසටහන්කරණය සඳහා

මූලික වටිනාකම්

කාන්තාවන්ගේ ආරක්ෂාවට පළමු තැන දීම හා හානි නොකිරීම

1

තොරතුරුවල රහස්‍යභාවය තහවුරු කරන්න. අනපේක්ෂිත ප්‍රතිඵල පුරෝකථනය කර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න.

සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම

2

අසමාන සමාජභාවී හා බල සම්බන්ධතා සහ කාන්තාවන් මත පිරිමින්ගේ වරප්‍රසාදිත තත්වය විශ්ලේෂණය වැඩසටහන්කරණයේ මධ්‍යයේදී තහවුරු කිරීම

කිසිවකු අත්හැර නොදැමීම

3

බහුවිධ සහ එකිනෙක විනිවිද යන ලිංගිකත්වය, සමාජභාවය, පන්තිය, ජාතිය, ජනවර්ගය, ආබාධිතභාවය, ලිංගික නැමියාව, සමාජභාවී අනන්‍යතාව මත පදනම් වන වෙනස්කම් ස්වරූප සම්බන්ධයෙන් කටයුතු කිරීම

දැනුම ජනනය කිරීම හා බෙදාහැරීම

වනස් කිරීමේ න්‍යායක් සංවර්ධනය කිරීම

4

වැඩසටහන්කරණ ආදානයන් අතරමැදිකාලීන ප්‍රතිඵල සහ ඇතිවිය හැකි බලපෑම් සම්බන්ධ වෙනස්කම්වලට හේතු වන ආකාරය විස්තර කිරීම.

සාක්ෂි මත පදනම් වූ වැඩසටහන්කරණය ප්‍රවර්ධනය කිරීම

5

වැඩසටහන්කරණයට තොරතුරු සැපයීමේදී සාර්ථක වන්නේ හා දැනුම බෙදාගැනීම සඳහා පහසුකම් සලසන්නේ කුමක්ද යන්න පිළිබඳ සාක්ෂි පදනම ගොඩනැගීම සඳහා අධීක්ෂණ සහ ඇගයීම් පද්ධති ශක්තිමත් කිරීම

මාර්ගෝපදේශ මූලධර්ම යොදාගැනීම

6 සහභාගීත්ව ප්‍රවේශයන් අනුගමනය කිරීම

පෞද්ගලික නැවත සිහිපත් කිරීම් හා විචාරාත්මක චින්තනය උත්තේජනය කරන්න. ජනතාවගේ හඬ, නියෝජනය හා මහජනයාගේ කුසලතා ගොඩනගන්න.

7 සම්බන්ධීකරණය ප්‍රවරධනය කරන්න

දේශීය හා ජාතික මට්ටම්වලදී අංශ හා සංවිධාන අතර හවුල්කාරීත්වයන්ට උපකාර කිරීම.

8 ඒකාබද්ධ මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පසුබිමෙහි තිබෙන බහුවිධ අවදානම් සහ පවුල් තුළ විවිධ ස්වරූපවල ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ සාධක පිළිබඳ කටයුතු කිරීම සඳහා පුද්ගලයන්, පවුල් හා ප්‍රජාවන් සමග සාමූහික වැඩසටහන්කරණය සඳහා පහසුකම් සැපයීම.

9 වැළැක්වීමේ ක්‍රියාවල අඛණ්ඩතාව සම්බන්ධයෙන් කටයුතු කිරීම

වැළැක්වීමේ හා ප්‍රතිචාර මැදිහත්වීම් සම්බන්ධ කරන්න.

10 ජීවන මාර්ග එළඹුම

කල්තබා වැළැක්වීම වෙනුවෙන් ළමයින්, නවයොවුන් පුද්ගලයන් සහ තරුණ ජනයා සම්බන්ධයෙන් සාර්ථක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

වැළැක්වීමේ හැකියාවන් ඇතිකරන පරිසරය

a කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෙළාදකිමින් කතාකිරීම සඳහා නායකයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් වෙතින් **දේශපාලනික කැපවීම** නිර්මාණය කරගැනීම.



b **කාන්තා සංවිධාන** සඳහා ආයෝජනය කිරීම, ඒවා සමග කාර්යයන් නිර්මාණය කරගැනීම, සම්පත් සැපයීම හා සහාය වීම.



ශක්තිමත් කිරීම

c කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ සමාජභාවී සමානාත්මතාව සම්බන්ධයෙන් **නීති** නිර්මාණය කිරීම හා **ප්‍රතිපත්ති** බලාත්මක කිරීම. ද්විතීයක අධ්‍යාපනයට ප්‍රවේශය ද එයට අයත් වේ.[6]



d කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වැඩසටහන්, සමීක්ෂණ සහ ආයතන ශක්තිමත් කිරීම හා සෞඛ්‍ය, අධ්‍යාපන, නීතිය බලාත්මක කිරීමේ හා සමාජ සේවා අංශවල ධාරිතා සංවර්ධනය සඳහා **සම්පත් වෙන්කරන්න**.



සාර්ථක වන දේ අනුරූප කරගෙන පුළුල් කරන්න

නියාමන පදනමින් සාර්ථක බව පෙනෙන ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මැදිහත්වීම් විවිධ ආකාරවලින් පුළුල් කළ හැකිය. ඒ ආකාර නම්, ප්‍රතිලාභීන් එකතු කිරීම, වෙනත් භූගෝලීය ස්ථානවල ඒ හා සමාන වැඩසටහන් සිදුකිරීම, එම මැදිහත්වීමේ භූමි ප්‍රදේශය පුළුල් කිරීම ආදියයි. අලුත් පරිසරයක පුළුල් කරනු ලබන මැදිහත්වීම් එම සංදර්භයට අනුරූප කරගත යුතුය. ඒ සඳහා දේශීය සංස්කෘතිය, වටිනාකම් සහ සම්පත් අවබෝධ කරගැනීම අවශ්‍යය.

සාර්ථක ඒවා බවට හඳුනාගත් මැදිහත්වීම් (10-11 පිටු) මාර්ගෝපදේශ මූලධර්මවලට අවධානය යොමුකරමින් අනුරූප කරගැනීම හා පුළුල් කිරීම සිදුකළ හැකිය. එහිදී සලකා බැලිය යුතු කාරණා ඊළඟ පිටුවේ 'වැඩිදුර සාක්ෂි අවශ්‍යය' යනුවෙන් දැක්වේ (10-11 පිටු). ඒවා පුළුල් කිරීමට පෙර ඒ හා සමාන වැඩසටහන් සැකසිය යුතුය. වඩා විධිමත් කළ යුතුය. 'පරස්පර' හෝ 'සාක්ෂි නොමැති' ලෙස හඳුනාගෙන තිබෙන ඒවා වැඩිදුරටත් ඇගයීමට ලක්කළ යුතුය.

a

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමේ හෝ සමාජභාවී සමානාත්මතාව හෝ කාන්තා සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීමේ **ජාතික කැපවීම් සමග අනුරූප වීම** (උදා: ජාතික සැලැස්මක්, ප්‍රතිපත්තියක්, මූලෝපායක්).[7]

b

සමාජභාවී සමානාත්මතාවේ, අයිතිවාසිකම්වල සහ ආරක්ෂාවේ මෙන්ම අවම 'ප්‍රතිකර්මවල' **මූලික මූලධර්ම කෙරෙහි පක්ෂපාතීත්වය හඳුනාගෙන පවත්වාගෙනයාම**. ඒ අතරතුරම, භාෂාව හා සංස්කෘතිය ඇතුළු සංදර්භයට අනුගත වීම.

c

සහක්‍රියාවන් සඳහා වැඩසටහන් විසින් බහුවිධ මූලෝපායන් හා මැදිහත්වීම් පුද්ගල, අන්තර් පුද්ගල, ප්‍රජා සහ සමාජ මට්ටම්වලදී තිරසර බලපෑම් වෙනුවෙන් ඒකාබද්ධ කිරීම.

d

ක්‍රියාත්මක කරවන්නන් අතර ධාරිතාව වෙනුවෙන් ආයෝජනය කිරීම සහ පුළුල් කිරීම සහ වෙනස සිදුවීමට හා තිරසර වීමට ඉඩදීම සඳහා ප්‍රමාණවත් තරම් කාලය ලබාදෙන්න.

e

දැනට සිදුවන මූලපිරුම් මත පදනම් වීම. වැළැක්වීමේ කටයුතු දැනට තිබෙන සෞඛ්‍ය, සංවර්ධන හා වෙනත් ආංශික වැඩසටහන් සමග ඒකාබද්ධ කිරීම

f

පරිමාණය සිතේ තබාගෙන සැලසුම් කිරීම. පිරිවැය සහ තිරසරබව සිත්හි තබාගෙන දිගුකාලීනව ආයෝජනය කිරීම.

g

සුළුවෙන් පටන් ගැනීම. ලේඛනගත කිරීම හා ඇගයීම. නවෝත්පාදනය හා සාක්ෂි මත පදනම් වූ වැඩසටහන්කරණය ශක්තිමත් කිරීම සඳහා පුළුල් කිරීම.

h

වැඩසටහන් සංවර්ධනය කරන්නන් සහ ක්‍රියාත්මක කරන්නන් අතර ඉගෙනීම හා දැනුම බෙදාගැනීම **භාවිතා කරන ප්‍රජාවකට උපකාර කිරීම**.

IX ප්‍රගතිය අධීක්ෂණය, ඇගයීම හා මැනීම

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමෙහි ප්‍රගතිය කෙටිකාලීනව හා දිගුකාලීනව මැනිය හැකිය.

1. දිගුකාලීනව ගත් කල, වැළැක්වීමේ වැඩසටහන්වල බලපෑම විවිධ ස්වරූපවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම වීම අනුව මැනිය හැකියග

2. ගෝලීය මට්ටමේදී, තිරසර සංවර්ධන අරමුණුවල කොටසක් ලෙස, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ ප්‍රගතිය රටවල් විසින් වාර්තා කළ යුතුව තිබේ. දර්ශක දෙකක් යෝජනා කර ඇත.

    - පසුගිය මාස 12 තුළදී, වයස අවුරුදු 15 සහ ඊට වැඩි කාන්තාවන් අතර සමීප සහකරු ප්‍රචණ්ඩත්වය පැවතීම (තිරසර සංවර්ධන අරමුණු 5.2 - සියලු ස්වරූපවල කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දුරලීම)
    - වයස අවුරුදු 18දී ලිංගික ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලද වයස අවුරුදු 18-29 අතර තරුණ කාන්තාවන්ගේ හා පිරිමින්ගේ අනුපාතිකය (තිරසර සංවර්ධන අරමුණු 16.2 - අපයෝජන, සූරාකෑම, කුට්ටනය සහ වෙනත් සියලු ස්වරූපවල ප්‍රචණ්ඩත්වය හා ළමයින්ට වධහිංසා කිරීම අවසන් කිරීම)

3. කෙටි හා මධ්‍ය කාලීනව, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවතීම අඩුකිරීම සඳහා දායක වන අතරමැදි දර්ශක වැඩසටහන් වර්ග අනුව වෙනස් වේ. උදාහරණ ලෙස, පහත දැක්වෙන ආකාරයේ වැඩිදියුණු කිරීම් එයට ඇතුළත් වේ:

   - සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප සහ සමාජ සම්මතයන්
   - සහකරුවන් අතර සන්නිවේදනය
   - කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය, නියෝනය සහ/හෝ ස්වයං සඵලතාව
   - ගැහැණු ළමයින්ගේ හා කාන්තාවන්ගේ අධ්‍යාපනය

4. වැඩසටහන විසින් අතරමැදි දර්ශක වැඩිදියුණු කිරීමේ හා ඒවා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවතීම අවම කිරීමට දායක වන්නේ කෙසේද යන්න විස්තර කරන වෙනස් කිරීමේ න්‍යායක් දැක්වීම වැදගත්ය.

5. පුළුල් කිරීමට පෙර සහ පුළුල් කිරීම එය සිදුවන විටදීම අධීක්ෂණය කිරීම ඇගයීම වැදගත්ය. එමගින් සාර්ථක වැඩසටහන් සඳහා සම්පත් ආයෝජනය කරන බව තහවුරු කළ හැකිය. අනපේක්ෂිත හෝ හානිකර ප්‍රතිඵල අවම කළ හැකිය.පුළුල් කිරීමේ ක්‍රියාවලිය විසින් දේශීය සංදර්භයන් සැලකිල්ලට ගනු ලැබේ.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම ආරම්භ වන්නේ



ඉදිරි මග: **ක්‍රියාකාරීත්වය** සඳහා කැඳවීමක්

වෙනස සඳහා කැපවන්න

අදම ආරම්භ කරන්න

සාක්ෂි මත පදනම් වූ එළඹුම්වලට සහාය දෙන්න

වෙනත් අය සමග එකතු වන්න

උපුටාගැනීම් හා අමතර යොමුකිරීම්

a. CUSP (2017), On the CUSP of change: Effective scaling of social norms programming for gender equality, Community for Understanding Scale Up: http://raisingvoices.org/wp-content/uploads/2013/02/6.CombinedCUSPcasestudies.FINAL_.pdf
b. Heise L (2011), What Works to Prevent Partner Violence?: http://strive.lshtm.ac.uk/system/files/attachments/What%20works%20to%20prevent%20partner%20violence.pdf
c. Salamander Trust (2017), ALIVE[H]E Framework: http://salamandertrust.net/resources/alivhe-framework
d. UN Women (2015), A Framework to Underpin Action to Prevent Violence Against Women: http://www.unwomen.org/-/ media/headquarters/attachments/sections/library/publications/2015/prevention_framework_unwomen_nov2015. pdf?la=en&vs=5223
e. WHO, LSHTM, SAMRC (2013). Global and regional estimates of violence against women: prevalence and health effects of intimate partner violence and non-partner sexual violence. Geneva: WHO. http://apps.who.int/iris/bitstream/handle/10665/85239/9789241564625_eng.pdf;jsessionid=294A291A603A7BCB4B60F588532CE53D?sequence=1
f. World Health Organization (2016), Violence against women, Intimate partner and sexual violence against women, Fact Sheet: http://www.who.int/mediacentre/factsheets/fs239/en/
g. World Health Organization and UNAIDS (2013), 16 Ideas for addressing violence against women in the context of the HIV epidemic - A programming tool: http://www.who.int/reproductivehealth/publications/violence/vaw_hiv_epidemic/en/
h. WHO, LSHTM (2010), Preventing Intimate partner violence and sexual violence: generating evidence and taking action: http://apps.who.int/iris/bitstream/handle/10665/44350/9789241564007_eng.pdf?sequence=1
i. What Works to Prevent Violence (2014), A global programme to prevent violence against women and girls: A Summary of the Evidence and Research Agenda: https://www.gov.uk/government/publications/what-works-in-preventing-violenceagainst-women-and-girls-review-of-the-evidence-from-the-programme
j. Ellsberg M., Arango D.J., Morton M., Gennari F., Kiplesund S., Contreras-Urbina M., Watts C (2015), Prevention of violence against women and girls: what does the evidence say? The Lancet, Volume 385, No. 9977, p1555–1566: https://www.thelancet.com/journals/lancet/article/PIIS0140-6736(14)61703-7/fulltext?rss%3Dyes
k. Contreras-Urbina M., Heilman B., Von Au A. K., Hill A., Puerto Gómez M., Zelaya J., Arango D.J (2016) Community-based approaches to intimate partner violence : a review of evidence and essential steps to adaptation (English). Washington, D.C. : World Bank Group. http://documents.worldbank.org/curated/en/907511467996712161/Community-based-approaches-to-intimate-partner-violence-a-review-of-evidence-and-essential-steps-to-adaptation
l. World Health Organization (2016), Global Plan of Action to strengthen the role of the health system within a national multisectoral response to address interpersonal violence, in particular against women and girls, and against children: http://www.who.int/reproductivehealth/publications/violence/global-plan-of-action/en/
m. Garcia-Moreno C., Zimmerman C., Morris-Gehring A., Heise L., Amin A., Abrahams N., Montoya O., Bhate-Deosthali P., Kilonzo N., Watts C (2015), Addressing violence against women: a call to action, The Lancet, Volume 385, No. 9978, p1685–1695: https://doi.org/10.1016/S0140-6736(14)61830-4
n. World Health Organization (2016) INSPIRE: Seven strategies for Ending Violence Against Children: http://www.who.int/violence_injury_prevention/violence/inspire/en/
o. What works to prevent violence against women and girls global programme (2018), Right to play: preventing violence among and against children in schools in Hyderabad, Pakistan: Evidence brief. South Africa: Medical Research Council and UK: UK aid. https://www.whatworks.co.za/documents/publications/211-right-to-play/file
p. Hidrobo M, Peterman A, Heise L (2016), The effect of cash, vouchers and food transfers on intimate partner violence: evidence from a randomized experiment in Northern Ecuador. American Economic Journal Applied Economics, Volume 8, No 3, p284-303: https://DOI:10.1257/app.20150048
q. National Resource Center on Domestic Violence (2012), Program and Practice Profiles: Community Advocacy Project, Harrisburg, PA: National Resource Center on Domestic Violence. http://www.dvevidenceproject.org
r. Buller A, Peterman A, Ranganathan M, Bleile A, Hidrobo M, Heise L (2018). A mixed-method review of cash transfers and intimate partner violence in low- and middle-income countries. The World Bank Research Observer, Volume 22, No 2, p218-258: https://doi.org/10.1093/wbro/lky002
s. Peterman A, Palermo TM, Ferrari G (2018). Still a leap of faith: microfinance initiatives for reduction of violence against women and children in low-income and middle-income countries. BMJ global health, Volume 3, No. 6: e001143. doi:10.1136/bmjgh-2018-001143.
t. Karakurt G, Whiting K, Van Esch, Bolen S, Calabrese J (2016). Couple therapy for intimate partner violence: A systematic review and meta-analysis. J Marital Fam Ther, Volume 42, No. 4, p567-583: doi:10.1111/jmft.12178.
u. Desai CC, Reece J, Shakespear-Pellington S (2017) The prevention of violence in childhood through parenting programmes: a global review, Psychology, Health & Medicine, Volume 22, Sup1, p166-186: DOI: 10.1080/13548506.2016.1271952.
v. Abramsky T, Devries K, Kiss L, Nakuti J, Kyegombe N, Starmann E, Cundill B, Francisco L, Kaye D, Musuya T, Michau L, Watts C (2014), Findings from the SASA! Study: a cluster randomized controlled trial to assess the impact of a community mobilization intervention to prevent violence against women and reduce HIV risk in Kampala, Uganda. BMC Medicine, Volume 12:122: https://doi.org/10.1186/s12916-014-0122-5.
w. Pronyk PM, Hargreaves JR, Kim JC, Morison LA, Phetla G, Watts C, Busza J, Porter JD (2006), Effect of a structural intervention for the prevention of intimate-partner violence and HIV in rural South Africa: a cluster randomised trial. The Lancet, Volume 368, No. 9551, p1973–1983: doi: 10.1016/S0140-6736(06)69744-4.
x. Jewkes R, Nduna M, Levin J, Jama N, Dunkle K, Puren A, Duvvury N (2008), Impact of Stepping stones on incidence of HIV and HSV-2 and sexual behaviour in rural South Africa: cluster randomised controlled trial. Brit Med J, Volume 337, No. 7666:a506: doi: 10.1136/bmj.a506.
y. Sullivan, CM, Bybee, DI (1999), Reducing violence using community-based advocacy for women with abusive partners. Journal of Consulting and Clinical Psychology, Volume 67, No. 1, p43-53: https://cap.vaw.msu.edu/wp-content/uploads/2014/05/Two-year-followup-CAP-JCCP.pdf.

පසු සටහන්

[1] මේවා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැරදි කිරීම හා වින්දිතයන් වීම යන දෙකම වෙනුවෙනි.

[2] මෙම මූලෝපායන් හත එකිනෙකින් මුළුමනින්ම වෙන්වූ පද්ධති නොවේ. ඒවා එකිනෙක සමග සමපාත වන අවස්ථා තිබේ.

[3] නිශ්චිත මැදිහත්වීම් සහ ඒ සඳහා උදාහරණ ඒ ඒ මූලෝපාය යටතේ ලැයිස්තුගත කර තිබේ. එහෙත්, ඒ බොහොමයක් විසින් සෘජුවක්ම මූලෝපායන් හතෙන් එකකට වඩා අයත් වන බහුවිධ අංග සහිත සහ බහුවිධ මට්ටම්වල මැදිහත්වීම් සම්බන්ධීකරණය/ ඒකාබද්ධ වැඩසටහන්කරණය නිරූපණය කරනු ලබන බව සටහන් කිරීම වැදගත්ය. ඒවා එක් මූලෝපායක් යටතේ වර්ග කිරීම මගින් මැදිහත්වීම්වල මූලික අරමුණ නිරූපණය වේ. උදාහරණයක් ලෙස, සමාජ සම්මතයන් වෙනස් කිරීම යටතේ වන ඇතැම් මැදිහත්වීම්වලට ද සම්බන්ධතා ශක්තිමත් කිරීම අඩංගු විය හැකිය. ඒ අන්දමින්ම, කාන්තාවන් සවිබලගැන්වීමේ මැදිහත්වීම් තුළ ආර්ථික හුවමාරු උපාංගයක් තිබිය හැකිය. එම නිසා මෙම මූලෝපායන් තනි ඒවා ලෙස නොදැකිය යුතුය. ඒ වෙනුවට ඒවා වනාහි වෙනත් ඒවා සමග සම්බන්ධ කිරීම මගින් ඒවායේ බලපෑම වඩා හොඳින් ඉහළ නැංවිය හැකි එළඹුම් විය හැකිය.

[4] සාක්ෂි ශ්‍රේණිගත කිරීම බොහෝදුරට උකහාගෙන තිබෙන්නේ, පර්යේෂණාත්ම කසැලසුම්කරණය බොහෝවිට භාවිතා කරන මැදිහත්වීම් සම්බන්ධ එකකට වඩා ඇගයීම්වල ව්‍යුහගත සමාලෝචනවලිනි. සසම්භාවී, පොකුරු වශයෙන් සසම්භාවී සහ අර්ධ පර්යේෂණාත්මක ක්‍රම ඒවාට අයත් වේ. එය අධිකරණ අංශයෙහි මැදිහත්වීම් වැනි ඇතැම් මූලෝපායන් සම්බන්ධයෙන් පිළිගෙන තිබේ. සාමාන්‍යයෙන් ගුණාත්මකභාවයෙන් අඩු යයි සැලකෙන නමුදු, කාල ශ්‍රේණි, නිරීක්ෂණාත්මක සහ හරස්කඩ සැලසුම් වැනි විකල්ප ඇගයීම් ක්‍රම වඩා යෝග්‍ය විය හැකිය. මෙය අලුතෙන් මතුවෙමින් තිබෙන ක්ෂේත්‍රයකි. එම නිසා, අධ්‍යයන සැලසුම් සහ ඇගයීම සම්බන්ධයෙන් අති විශාල විවිධත්වයක් තිබේ. මෙම සමාලෝචන සහ අධ්‍යයන සඳහා මූලාශ්‍ර යොමුකිරීම් ලෙස සපයා තිබේ.

[5] ඇගයීම් සමග සම්බන්ධ වේ. ඇතැම් අධ්‍යයනයන් මගින් සාධනීය බලපෑම් නිරූපණය කළ හැකිය. තවත් සමහර ඒවායනි නිශේධාත්මක බලපෑම් හෝ කිසිදු බලපෑමක් නොතිබීම ප්‍රදර්ශනය කළ හැකිය. එමගින් අවධාරණය කරනු ලබන්නේ මැදිහත්වීම්වල බලපෑම සංදර්භයට අනුව නිශ්චිත වන බවයි. එබැවින්, මැදිහත්වීම වෙනත් තැනක ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීම හෝ අනුරූප කරගැනීම මගින් සංදර්භීය හෝ ක්‍රියාත්මක කිරීමේ සාධක වෙත සමීප අවධානයක් යොමුකළ යුතුව තිබේ.

[6] ලිංගික අපයෝජන අපරාධ බවට පත්කරන, උරුමයෙහි සමානාත්මතාව ප්‍රවර්ධනය කරන, ළමා විවාහ හා ස්ත්‍රී ලිංගේන්ද්‍රිය විකෘති කිරීම තහනම් කරන, කාන්තාවන්ට සමානාත්මතාව තහවුරු කරන භාරකාරීත්ව හා විවාහ නීති, සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන නීති හා ප්‍රතිපත්ති මෙයට අයත් වේ. අත්අඩංගුවට ගැනීමේ නියෝග හා නීති ආධාර වැනි යුක්තිය ක්‍රියාත්මක කිරීමේ හා නීතිය බලාත්මක කිරීමේ සේවා ද එයට අයත් වේ.

[7] කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ ජාතික කැපවීමක් නොමැති අවස්ථාවලදී පවා, කාන්තාවන් සවිබලගැන්වීම, සමාජභාවී සමානාත්මතාව හෝ කාන්තා සෞඛ්‍යය සඳහා වන වෙනත් කැපවීම් තිබිය හැකිය. ඒවා සලකාබැලිය යුතුය.

For more information, contact
Department of Reproductive Health and Research
World Health Organization
20 Avenue Appia
CH 1211, Geneva 27
Switzerland
Fax: +41 22 791 4171
Email: reproductivehealth@who.int
www.who.int/reproductivehealth/topics/violence/en

WHO/RHR/18.19

RESPECT

WOMEN

RESPECT රාමුව
අධීක්ෂණය සහ ඇගයීම මාර්ගෝපදේශ

UN WOMEN

World Health Organization

හැඳින්වීම

අධීක්ෂණය සහ ඇගයීම සම්බන්ධ මාර්ගෝපදේශය විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම සඳහා මූලෝපායන් සඳහා වැදගත් මාර්ගෝපදේශ ඉදිරිපත් කරයි. මාර්ගෝපදේශයෙහි අරමුණ වන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා අධීක්ෂණ හා ඇගයීම් රාමුවක් සංවර්ධනය කරන හා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සපයන RESPECT රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීමයි. එමගින් RESPECT මූලෝපායන් හත සඳහාම වෙන වෙනම අධීක්ෂණ හා ඇගයීම් දර්ශක සපයයි. ආරක්ෂාකාරී හා ආචාරධාර්මික අධීක්ෂණ හා ඇගයීම් පද්ධතියක් හා ක්‍රියාවලියක් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ උපදෙස් සපයයි. එය පරිසමාප්ත නැත. එය RESPECT මූලෝපාය ලේඛන සමග භාවිතා කිරීම සඳහා යෝග්‍ය සාරාංශයක් ලෙස සැලකීම වඩා සුදුසුය. එය ප්‍රායෝජනවත් සම්පත් සමග අවශ්‍ය පරිදි වැඩිදුරටත් සම්බන්ධ වේ.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම් කටයුතු අධීක්ෂණය හා ඇගයීම වැදගත් ඇයි?[1]

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී හා ප්‍රතිචාර දැක්වීමේදී සාර්ථක වන්නේ කුමක්ද යන්න පිළිබඳ ප්‍රබල ගෝලීය සාක්ෂි නිර්මාණය කිරීම: සාක්ෂි ගොනුව වර්ධනය වෙමින් තිබෙනමුත්, වැඩියෙන්ම සාර්ථක වන්නේ කුමන මූලෝපායන් හා මැදිහත්වීම්ද, ඒ කුමන සංදර්භය තුළද, කුමන ජනගහන කණ්ඩායමට ද, ඒ මක් නිසාද යන්න තේරුම්ගැනීම සම්බන්ධයෙන් තවදුරටත් අඩුපාඩු තිබේ. සමීප සහකරුගේ ප්‍රචණ්ඩත්වය සහ සහකරු නොවන පුද්ගලයන්ගේ ලිංගික හිංසනය වැනි කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ඇතැම් ස්වරූප සඳහා සාක්ෂි ප්‍රමාණවත්ය. එහෙත්, වෙනත් ස්වරූපයන් සම්බන්ධයෙන් සීමිතය.

වැඩසටහන් සාර්ථකත්වය හා ඵලදායීතාව අධ්‍යයනය කිරීම සඳහා: වැඩසටහනක් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත හැකි පරිදි එම වැඩසටහන නිසි මාර්ගයේ ගමන් කරන්නේද, නැතිනම්, හැඩගැස්වීම් අවශ්‍යද යන්න අධීක්ෂණ හා ඇගයීම් ක්‍රියාවලිය ඔස්සේ හඳුනාගත හැකිය. එමගින් මැදිහත්වීමක සාර්ථකත්වය තක්සේරු කළ හැකිය. මැදිහත්වීම් ඵලදායීදැයි සහ ඒ කවුරුන් සම්බන්ධයෙන් කුමක් නිසාදැයි හඳුනාගත හැකිය.

අවශ්‍ය ප්‍රමාණයෙන් ක්‍රියාත්මක කළ හැකි වඩාත්ම ඵලදායී හා කාර්යක්ෂම ක්‍රම හඳුනාගැනීම: ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේලා සාර්ථක වන්නේ කුමක්ද යන කරුණ පිළිබඳ සාක්ෂි ගොනුව වර්ධනය වෙමින් තිබෙනමුත්, මැදිහත්වීමේ බලපෑම අවම කරනොගෙන ප්‍රචණ්ඩත්වය අවශ්‍ය ප්‍රමාණයෙන් වඩාත්ම ඵලදායී ලෙස වළක්වාගන්නේ කෙසේද යන්න පිළිබඳ තිබෙන්නේ අඩු දැනුමකි.

වැඩසටහනට හා ප්‍රතිලාභීන් හට බලපෑ හැකි අවදානම් හඳුනාගැනීම සහ කළමනාකරණය කිරීම: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් මගින් ඉලක්ක කරනු ලබන්නේ සමාජභාවී හා බල අසමානතා වෙනස් කිරීමයි. එමනිසා එම වැඩසටහන් හේතුවෙන් ප්‍රජාවේ සාමාජිකයන්, පිරිමින් සහ බලය හොබවන්නන් වෙතින් ප්‍රතිරෝධය, චර්යාවන් පාලනය කිරීම සහ/හෝ වැඩිදුර ප්‍රචණ්ඩත්වය වැනි සෘණාත්මක ප්‍රතිචාර ඇතිවිය හැකිය. මෙම අවදානම් හඳුනාගැනීමට හා ඒවා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අධීක්ෂණ හා ඇගයීම් පද්ධති වැදගත් වේ.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ගෝලීය මට්ටමින් වැළැක්වීමේ ප්‍රගතිය ස්ථාවර අන්දමින් හඳුනාගැනීම හා මැනීම තහවුරු කිරීම: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කටයුතුවල ප්‍රගතිය මැනීම සමග සම්බන්ධ ප්‍රධාන අභියෝගයක් වන්නේ දර්ශකවල සහ මිනුම්වල අධික පුළුල්කමයි. ඒ හේතුවෙන් ලැබෙන දත්ත සන්සන්දනය කළ නොහැකි වේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ඇතැම් වර්ග සම්බන්ධයෙන් ප්‍රතිඵල මට්ටමේ දර්ශක සහ මිනුම් වඩා විධිමත් කරනු ලබමින් තිබේ. වෙනත් වර්ගවල ප්‍රචණ්ඩත්වය සහ සමාජ සම්මතයන්ගේ වෙනස්කම් වැනි ප්‍රතිඵල සම්බන්ධ දර්ශකවල විශාල විවිධත්වයක් තිබේ. බලපෑම සහ ප්‍රතිඵල යන කාරණා දෙකම වෙනුවෙන් සන්සන්දනය කළ හැකි ගෝලීය දර්ශක කට්ටලයක් සංවර්ධනය කිරීම වැදගත්ය.

1 කොටුව: අර්ථ නිරූපණ

අධීක්ෂණය: යනු, අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීමට අදාළව සහ කළමනාකරණ තීරණවලට මගපෙන්වීම සඳහා වැඩසටහනක ප්‍රගතිය සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමේ, විශ්ලේෂණය කිරීමේ හා භාවිතා කිරීමේ ක්‍රියාවලියයි. අධීක්ෂණය විසින් සාමාන්‍යයෙන් ක්‍රියාකාරකම් සිදුකරන්නේ කවදාද, කොහිදීද, කවුරුන් විසින්ද, ඒවා පුද්ගලයන් හා ආයතන කීදෙනෙකු වෙත සමීප වෙනවාද යනාදී ක්‍රියාවලි කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ.

ඇගයීම: යනු, ක්‍රියාකාරකමක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක්, මූලෝපායක්, ප්‍රතිපත්තියක්, මාතෘකාවක්, තේමාවක්, අංශයක්, මෙහෙයුම් කලාපයක් හෝ ආයතනික කාර්යසාධනයක් විධිමත් අන්දමින් තක්සේරු කිරීමයි. අපේක්ෂිත හා සාක්ෂාත් කරගන්නා ලද සාර්ථකත්වයන් කෙරෙහි ඇගයීමෙහි අවධානය යොමුවේ. ප්‍රතිඵල දාමය (යෙදවුම්, ක්‍රියාකාරකම්, ප්‍රතිඵල, ප්‍රතිදාන සහ බලපෑම්), ක්‍රියාවලි, සංදර්භීය සාධක සහ අවදානම් කෙරෙහි ඇගයීමෙහි අවධානය යොමුවේ. එහි අරමුණ වන්නේ සාර්ථකත්වය හෝ අඩු සාර්ථකත්වය අවබෝධ කරගැනීමයි.

මූලාශ්‍රය: Programming Essentials, Monitoring & Evaluation. UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වල අධීක්ෂණය හා ඇගයීම සඳහා මූලධර්ම

අධීක්ෂණය හා ඇගයීම සැලසුම් කිරීමේ ව්‍යුහයන්හිදී **දේශීය පාර්ශ්වකරුවන් සහ හවුල්කරුවන් ඇතුළත් කරගන්න**. ඒවා සංදර්භයට ගැලපෙන තත්වයට පත්කරගැනීමට හා සාක්ෂි අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා යෝග්‍ය වේ.

අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ ප්‍රවේශයන් බේරුණු පුද්ගලයන් කේන්ද්‍රීය බව තහවුරු කරන්න. මෙහි අරුත නම් එමගින් එයට සහභාගී වන කාන්තාවන්ගේ පෞද්ගලිකත්වය, රහස්‍යභාවය සහ ශාරීරික සහ භාවමය සුරක්ෂිතභාවය ආරක්ෂා වන බවයි.

සමාජභාවයට ප්‍රතිචාරාත්මක ප්‍රවේශයක් අනුගමනය කරන්න: සමාජභාවය සහ බල සම්බන්ධතා පිළිබඳ විශ්ලේෂණයක් අධීක්ෂණය හා ඇගයීමට ඇතුළත් විය යුතුය. සැමදෙනා ඇතුළත් කරගන්නා සවිබලගැන්වීමේ ක්‍රමයක් භාවිතා කළ යුතුය.

අරමුදල් සපයන්නන්ට හා වැඩසටහනට සහභාගී වන්නන්ට **ඉගෙනුම හා වගවීම යන කාරණා දෙකම තහවුරු කරන්න**. මේ සඳහා වැඩසටහන් සැලසුම් කිරීමට, හැඩගස්වාගැනීමට, තීරණ ගැනීමට, වැඩසටහන් තක්සේරු කිරීමට සහ පාඩම් ඉගෙනීමට ප්‍රයෝජනවත් දත්ත එක්රැස් කිරීම අවශ්‍ය වේ. සහභාගී වූවන් සහ සම්බන්ධ වූ ප්‍රජාවන් සමග ප්‍රතිඵල බෙදාගැනීමේ හා ප්‍රතිපෝෂණය ලබාගැනීමේ යාන්ත්‍රණයන් තිබිය යුතුය.

සක්‍රිය සහභාගීත්වය තහවුරු කරන ක්‍රම සහ මෙවලම් භාවිතා කරන්න: ක්‍රම සහ මෙවලම් මගින් සක්‍රිය සහභාගීත්වය උපරිම කළ යුතුය. ඒවා දේශීය සංදර්භයට ගැලපිය යුතුය. සමාජ සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සංදර්භයට, භාෂාවට හා සාක්ෂරතා මට්ටමට සහ සහභාගිකයන්ගේ ඕනෑම ආබාධිත මට්ටමකට අවධානය යොමුකිරීම ද එයට ඇතුළත් විය යුතුය. ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත සහ යෝග්‍ය අධීක්ෂණය හා ඇගයීම් ප්‍රවේශයන් වැඩසටහන් සැලසුම් තුළට ආරම්භයේ සිටම ඇතුළත් කරගත හැකිවන පරිදි **ප්‍රමාණවත් අයවැය තහවුරු කරන්න**.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා අධීක්ෂණය හා ඇගයීම රාමුවක් සංවර්ධනය කිරීම

අධීක්ෂණ හා ඇගයීම් රාමුවක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගත යුතු වැදගත් පියවර රාශියක් තිබේ. එය ශක්තිමත් අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමයක පදනමයි. මෙම පියවර සම්පාදනය කර තිබෙන්නේ විවිධ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ හා අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ සම්පත් ඇසුරෙනි. වැඩිදුර මගපෙන්වීම් ඒ ඔස්සේ ලබාගත හැකිය.[2]

1. සංවර්ධනාත්මක සමීක්ෂණ (Formative Research) / තත්ව විශ්ලේෂණ

ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මැදිහත්වීම් සංවර්ධනය කිරීමට පෙර හා සංවර්ධනය කරන අතරතුර සංවර්ධනාත්මක සමීක්ෂණ මෙහෙයවීම වැදගත් වනු ඇත. ඇතැම්විට ඒවා තත්ව විශ්ලේෂණයන් ලෙස හැඳින්වේ. එමගින් වැඩසටහන් සැලසුම් කිරීම හා හැඩගස්වාගැනීම සඳහා තොරතුරු ලබාදිය හැකිය. සංවර්ධනාත්මක සමීක්ෂණ මගින් පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක වන විශේෂිත සංදර්භයන් පරීක්ෂා කරනු ලැබේ:

- ප්‍රචණ්ඩත්වය පැවැත්මේ හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ විශේෂිත ධාවකයන්ගේ වර්ග හා මට්ටම් - මෙම ධාවකයන් සම්බන්ධ මූලික දැක්ම ද ඇතුළත්ව
- විවිධ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වරූප නිර්මාණය කරන හා ඒවා තහවුරු කරන විශේෂිත විශ්වාසයන් හා සමාජ සම්මතයන්
- අවදානම් සහිත කණ්ඩායම් ඇතුළු විවිධ ජන කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා සහ අත්දැකීම්
- දැනට පවතින මැදිහත්වීම්, උගත් පාඩම් සහ ඒවායේ බලපෑම් සම්බන්ධ සාක්ෂි
- බේරුණු පුද්ගලයන් සඳහා සහායක සේවා, ඒවා වෙත ප්‍රවේශය සහ ධාරිතාව
- විධිමත් සහ අවිධිමත් ක්‍රියාකරුවන් ඇතුළත් ප්‍රධාන පාර්ශ්වකරුවන්, ඔවුන්ගේ ධාරිතාවන්, දැනුම, ආකල්ප සහ භාවිතාවන්

මේ සමග ඇති වැඩපොතෙහි පළමු පියවර ජාතික වැළැක්වීමේ මූලෝපායක් සැකසීම සම්බන්ධයෙන් වන අතර ජාතික/ උප ජාතික මට්ටමේදී තත්ව විශ්ලේෂණයක් සිදුකරන ආකාරය පිළිබඳ වඩා සවිස්තර මාර්ගෝපදේශයක් එහි අඩංගු වේ.

2. වෙනස වෙනුවෙන් න්‍යායක් සංවර්ධනය කිරීම

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය රාමුවක් සංවර්ධනය කිරීමේ වැදගත් පියවරක් වන්නේ වැඩසටහන සඳහා වෙනස් කිරීමේ න්‍යායක් (ToC) සැලසුම් කිරීමයි. එමගින් පහත දැක්වෙන සිතියම්ගත කිරීම සිදුකළ යුතුය:

- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ දැනුමේ, ආකල්පවල සහ චර්යාවන්ගේ වෙනස්කම හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අවධානම් සාධකවල අපේක්ෂිත ගමන් මාර්ග
- එම ගමන් මාර්ග අපේක්ෂිත ප්‍රතිඵලය වෙත යොමුවන්නේ කෙසේද යන්න
- වෙනසට නායකත්වය දෙනු ඇතැයි අපේක්ෂිත ගමන් මාර්ග සහ ක්‍රියාවලි විස්තර කරන උපකල්පන

වෙනත් අධීක්ෂණය හා ඇගයීම රාමු සඳහා ප්‍රතිඵල රාමු සහ තාර්කික රාමු අයත් වේ. එමගින් සාමාන්‍යයෙන් වැඩසටහනකින් අපේක්ෂිත යෙදවුම්, ක්‍රියාකාරකම්, ප්‍රතිදාන, ප්‍රතිඵල සහ බලපෑම් වඩා රේඛීය අන්දමින් සිතියම්ගත කරනු ලැබේ. රේඛීය අධීක්ෂණ හා ඇගයීම් රාමු සාමාන්‍යයෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වලදී ප්‍රමාණවත් වන්නේ නැත. එයට හේතුව එමගින් වෙනස සඳහා වන විවිධ ගමන් මාර්ගවල සංකීර්ණතා සහ සබඳතා සිතියම්ගත නොකරන බැවිනි. සෑම RESPECT මූලෝපාය සාරාංශයක් විසින්ම සරල වෙනස් කිරීමේ න්‍යායක් සපයනු ලැබේ. වැඩසටහන් සාරාංශවල නිශ්චිත වැඩසටහන් උදාහරණ සඳහා වෙනස් කිරීමේ න්‍යාය ඉදිරිපත් කර තිබේ.

3. අධීක්ෂණ හා ඇගයීම් ප්‍රශ්න සැලසුම් කිරීම

අධීක්ෂණය හා ඇගයීම ප්‍රශ්න කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහනේ සමස්ත අරමුණ මත පදනම් විය යුතුය. එය මනා ඇගයුම් සැලැස්මක පදනමයි. අපේක්ෂිත ආසන්න හා දිගුකාලීන ප්‍රතිඵල සාක්ෂාත් කරගත්තාද (සිදුවන්නේ කුමන වෙනස්කම්ද) යන ප්‍රශ්නය ඇසීමට අමතරව, වෙනස්කම් සිදුනොවන්නේ ඇයිද යන්නද ප්‍රශ්න මගින් අධ්‍යයනය කළ යුතුය. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාඩම්, සාර්ථකත්වයන් හා අභියෝග අධ්‍යයනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රොටොකෝල අනුගමනය කෙරේද යන්න පිළිබඳ ප්‍රශ්න ද අඩංගු විය යුතුය. මෙය බොහෝ විට බලපෑම් ඇගයීමකට වඩා ක්‍රියාවලි ඇගයීමක් ලෙස සැලකේ.

වෙනස් කිරීමේ න්‍යායෙන් ඔබ්බට විහිදෙන ප්‍රශ්න ඇසීම සහ වැඩසටහනේ අනපේක්ෂිත සාධනීය හා නිශේධනීය ප්‍රතිඵල තිබේද යන්න විමසීමේ ප්‍රශ්න ඇසීම වැදගත්ය. අවදානම කළමනාකරණය කිරීමේ මූලෝපායන් සාර්ථකද යන්න අධ්‍යයනය කළ යුතුය. අවසාන වශයෙන්, OECD DAC ඇගයුම් නිර්ණායක අනුව (ඒවා 2 කොටුවෙහි දැක්වේ) එයින් ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂිත සහභාගිකයන්ට වැඩසටහනේ අදාළත්වය පිළිබඳ ප්‍රශ්න ඇසීම ද ප්‍රයෝජනවත්ය. සාධනීය බලපෑමක් නිරීක්ෂණය කර තිබේ නම්, වැඩසටහනේ කාලරාමුවට ඔබ්බෙන් මැදිහත්වීමේ ප්‍රතිලාභ තිරසර කරගත හැක්කේ කෙසේද යන්නද විමසිය හැකිය.

4. ඇගයුම් ප්‍රවේශය සැලසුම් කිරීම

වැඩසටහනක ප්‍රතිඵල හා බලපෑම මැනීම හා පැහැදිලි කිරීම සඳහා භාවිතා කරනු ලබන ඇගයුම් සැලසුම් ප්‍රධාන වශයෙන් වර්ග තුනකි.

1. **පර්යේෂණාත්මක සැලසුම:** මෙම සැලැස්ම බොහෝවිට අහඹු ලෙස කරනු ලබන පාලන අත්හදාබැලීමක් (RCT) ලෙස හැඳින්වේ. එහිදී පුද්ගලයන් හෝ සමූහයන් (උදා: ප්‍රජාවන් හෝ පාසල්) මැදිහත්වීමක් ලබාගැනීම සඳහා අහඹු ලෙස යොදවනු ලැබේ (ප්‍රතිකාර හෝ මැදිහත්වීම සිදුවන කණ්ඩායම). අනෙක් කණ්ඩායම (පාලන කණ්ඩායම) එසේ නොවේ. මෙම ඇගයුම් සැලැස්ම ඉතා දැඩි එකක් ලෙස සැලකේ. එය මැදිහත්වීම සහිතව හා රහිතව තත්වයන් සෘජුවම සන්සන්දනය කරයි. ඒ අනුව, මැදිහත්වීම්වලට වෙනස්කම් ආරෝපණය කිරීම ද කළ හැකිය. එය ඉතා අනන්‍ය වන අතර මිල අධික විය හැකිය. ඇගයීම්වලදී වැඩසටහනෙන් සෘජුව ප්‍රතිලාභ නොලබන කාන්තාවන් අහඹු ලෙස පාලක කණ්ඩායම්වලට සම්බන්ධ කිරීම කෙතරම් ආචාරධාර්මිකද යන ගැටලුව සම්බන්ධයෙන් විවාද තිබේ. එම නිසා, යහපත් භාවිතාව වන්නේ, බලපෑම සම්බන්ධයෙන් කරන ලද ඇගයීම් මගින් සාධනීය ප්‍රතිඵල ලැබී තිබේ නම්, පාලක කණ්ඩායම්වල මැදිහත්වීම සිදුකරන ආකාරය ඇගයීම අවසන් වීමෙන් පසු සැලසුම් කිරීමයි.

2 කොටුව: ඇගයීම සඳහා නිර්ණායක

අදාළත්වය: ආධාර ක්‍රියාකාරකම ඉලක්ක කණ්ඩායමේ, ප්‍රතිලාභීන්ගේ හා ආධාරකරුවන්ගේ ප්‍රමුඛතා සහ ප්‍රතිපත්තිවලට ගැලපෙන තරම.

ඵලදායීතාව: ආධාර ක්‍රියාකාරකම විසින් එහි අභිමතාර්ථය සාක්ෂාත් කරගන්නා ප්‍රමාණය පිළිබඳ මිනුමක්.

කාර්යක්ෂමතාව: ආදානවලට සාපේක්ෂව ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් තිබෙන ප්‍රතිදාන මනියි. කැමති ප්‍රතිඵලය ලබාගැනීම සඳහා අඩුම වියදම් ක්‍රමය එයද?

බලපෑම: සංවර්ධන මැදිහත්වීමක් මගින් නිර්මාණය කරනු ලබන සෘජු හා වක්‍ර, අපේක්ෂිත හා අනපේක්ෂිත, සාධනීය හා නිශේධනීය වෙනස්කම්.

තිරසරභාවය: ආධාරකරුවන්ගේ ආධාර ඉවත් කරගත් පසුව පවා ක්‍රියාකාරකමක ප්‍රතිලාභ තවදුරටත් පවතින්නේදැයි මැනීම.

මූලාශ්‍රය: OECD (2010) Glossary of Key Terms in Evaluation and Results-Based Management

2. **අර්ධ පර්යේෂණාත්මක සැලසුම - සන්සන්දනාත්මක කණ්ඩායමත් සමග:** මෙම සැලැස්ම පර්යේෂණාත්මක සැලැස්මකට සමාන වේ. එහිදී එක් කණ්ඩායමක් වෙත මැදිහත්වීම සිදුවේ (ප්‍රතිකාර හෝ මැදිහත්වීම් කණ්ඩායම). තවත් කණ්ඩායමකට එය නොලැබේ (සන්සන්දනාත්මක කණ්ඩායම). කෙසේ වෙතත්, එක් කණ්ඩායමකට හෝ තවෙකෙකට අහඹු පැවරීම් නැත. එමගින් සාම්පලයට බලපෑමක් ඇතිවීමේ හැකියාව තිබීම එයට හේතුවයි. කෙසේ වෙතත්, සන්සන්දනාත්මක කණ්ඩායම තෝරාගනු ලබන්නේ මැදිහත්වීම් කණ්ඩායමට හැකි තරම් සමීප 'සන්සන්දනයක්' සිදුකිරීමේ අරමුණ වෙනුවෙන් අදාළ නිර්ණායක අනුව නම්, මෙම සැලැස්ම බැරෑරුම් එකක් විය හැකිය.බොහෝ දුරට අහඹු ලෙස කරනු ලබන පාලන අත්හදාබැලීම්වල පරිද්දෙන්, සන්සන්දනාත්මක කණ්ඩායම් සහිත අර්ධ පර්යේෂණාත්මක සැලසුම් ද වියදම් අධික විය හැකිය. ඇතැම්විට එහි වියදම අහඹු ලෙස කරනු ලබන පාලන අත්හදාබැලීම්වලට වඩා වැඩි විය හැකිය. එයට හේතුව, අහඹු ලෙස සිදු නොවන බව තහවුරු කරගැනීම සඳහා විශාල සාම්පල භාවිතා කිරීමට සිදුවීමයි. සන්සන්දනාත්මක කණ්ඩායම් සහිත අර්ධ පර්යේෂණාත්මක සැලසුම් හේතුවෙන් ආචාරධාර්මික ප්‍රශ්න ද ඇතිවිය හැකිය. එම ප්‍රශ්න පර්යේෂණාත්මක ක්‍රම සම්බන්ධයෙන් පෙන්වාදෙන ලද ප්‍රශ්නවලට සමානය.

3. **පර්යේෂණාත්මක නොවන සැලැසුම:** මේවා වනාහි පාලක හෝ සන්සන්දනාත්මක කණ්ඩායමක් භාවිතා නොකරන ඇගයුම් සැලසුම්ය. පර්යේෂණාත්මක නොවන සැලසුම්වලදී සාමාන්‍යයෙන් පූර්ව හා පශ්චාත් පරීක්ෂණ ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ. එහිදී ප්‍රතිඵල මනිනු ලබන්නේ මැදිහත්වීමක් ලබාගන්නා ජනගහනයේ කාල ලක්ෂ්‍ය දෙකක් (උදා: පදනම් මට්ටම සහ අවසන් මට්ටම) හෝ වැඩි ගණනක් අතරය. ඇගයුම් කාල ලක්ෂ්‍ය

දෙකකට වැඩි ගණනකදී (උදා: කාලය තුළදී තිරසරභාවය අධ්‍යයනය කිරීම සඳහා වන මැද මට්ටමේදී කරනු ලබන අධ්‍යයනයක් සහ/හෝ මැදිහත්වීම අවසන් වීමෙන් ටික කලකට පසු අධ්‍යයනයක්) ප්‍රතිඵල මැනීම යහපත් භාවිතාවක් ලෙස සැලකේ.

පර්යේෂණාත්මක නොවන ක්‍රමය භාවිතා කිරීමේ ප්‍රධාන සීමාවක් වන්නේ නිරීක්ෂණය කරනු ලබන ඕනෑම ප්‍රතිඵලයක් අවශ්‍යයෙන්ම මැදිහත්වීම සමග සම්බන්ධ නොවීමයි. පහත දැක්වෙන මිශ්‍ර ක්‍රම භාවිතයෙන් මෙම අවදානම් අවම කළ හැකිය. විශ්ලේෂණයේ විශ්වසනීයත්වය වර්ධනය කළ හැකිය. මෙම සැලසුම් සඳහා වියදම් පර්යේෂණාත්මක සැලසුම් සඳහා වියදම්වලට වඩා අඩු විය හැකිය.

ඉහත විස්තර කරන ලද එක් එක් සැලසුම් සඳහා විවිධ ක්‍රම භාවිතා කළ හැකිය.

ප්‍රමාණාත්මක ක්‍රම: සංවෘත අවසානයක් තිබෙන ප්‍රශ්න වැනි ප්‍රමාණාත්මක ක්‍රම සකස් කරගනු ලබන්නේ සංඛ්‍යා දත්ත ඇසුරෙනි. වෙනස්කම සිදුවෙමින් තිබේද, ඒ කොපමණ තරමකින්දැයි අවබෝධ කරගැනීමට එය ප්‍රයෝජනවත්ය.

ගුණාත්මක ක්‍රම: ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සහ විවෘත අවසානයක් සහිත ප්‍රශ්න වැනි ගැඹුරු සම්මුඛ සාකච්ඡා වැනි ගුණාත්ම ක්‍රම යොදාගනු ලබන්නේ ලේඛනමය හා ආඛ්‍යානමය විශ්ලේෂණයන් සඳහාය. කාලය තුළ වෙනස සිදුවන්නේ ඇයිද හා කෙසේද යන්න තේරුම්ගැනීමටත්, වැඩසටහන්කරණය සම්බන්ධයෙන් සිදුවන අනපේක්ෂිත ප්‍රතිඵල හෙළිදරව් කිරීමටත් ඒවා ප්‍රයෝජනවත් වේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඇගයීම හා පර්යේෂණ විශේෂයෙන්මත්, සමාජ සම්මතයන් වැනි ඇතැම් ප්‍රතිඵලත් ප්‍රමාණාත්මකව ගණනය කිරීම දුෂ්කර විය හැකිය. වඩා විවෘත හා ආඛ්‍යානමය ක්‍රම මගින් ඒවා අධ්‍යයනය කළ හැකිය.

මිශ්‍ර ක්‍රම: විවිධ ක්‍රම හා මූලාශ්‍ර මගින් දත්ත එක්රැස් කිරීම හා සන්සන්දනය කිරීම විශ්ලේෂණය සම්බන්ධයෙන් විශ්වාසය වර්ධනය කිරීමට උපකාරී විය හැකිය. ඇගයීම් සැලසුම් තුනෙහිදීම ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ක්‍රම දෙකම භාවිතා කිරීම වැඩි වටිනාකමකින් යුක්ත බව වැඩි වැඩියෙන් පිළිගැනීමට ලක්වෙමින් තිබේ.

සහභාගීත්ව ක්‍රම: අසමාන බල සම්බන්ධතා, ගතිකයන් හා සම්මතයන් තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මුල් ඇද තිබෙන පසුබිම තුළ අධීක්ෂණය හා ඇගයීම සඳහා සහභාගීත්ව ක්‍රම වඩා යෝග්‍ය විය හැකිය. සහභාගීත්ව ක්‍රමවලදී මෙම අසමානතා පිළිගන්නා අතර අර්ථවත් සහයෝගය හා අධීක්ෂණය හා ඇගයීම ක්‍රියාවලි සහ ප්‍රතිඵල සමග සම්බන්ධ වීම මගින් කාන්තාවන් හා ප්‍රජාවන් සවිබලගැන්වීමට අරමුණු කරයි.[3] වෙනස් සහභාගිකයන් කණ්ඩායම් විසින් වැඩසටහන සහ ආශ්‍රිත වෙනස්කම් සම්බන්ධ අත්දැකීම් ලබාගන්නා ආකාරය අවබෝධ කරගැනීමට මෙම ක්‍රම ප්‍රයෝජනවත්ය.

5. දර්ශක සැලසුම් කිරීම

යෝග්‍ය ඇගයුම් සැලැස්මක් තෝරාගත් පසු, ප්‍රගතිය, ප්‍රතිඵල සහ බලපෑම ග්‍රහණය කරගැනීම සඳහා දර්ශක සංවර්ධනය කරගත යුතුය. එම දර්ශක SMART (Specific - විශේෂිතල Measurable - මිනිය හැකි, Achievable - සාක්ෂාත් කරගත හැකි, Relevant - අදාළ, Time-bound - කාලය තුළ ක්‍රියාත්මක කළ යුතු) විය යුතුය.

1. **ප්‍රතිදාන දර්ශක** මගින් වැඩසටහන් ක්‍රියාකාරකම් සම්පාදනය කිරීමේ ප්‍රගතිය මනිනු ලැබේ. ප්‍රතිදාන දර්ශකවල දත්ත බොහෝවිට එක්රැස් කරනු ලබන්නේ ස්ථාවර අධීක්ෂණය මගිනි.

2. **ප්‍රතිඵල දර්ශක** මගින් වැඩසටහන් මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස මධ්‍ය කාලීනව වෙනස මනිනු ලැබේ. ප්‍රතිඵල පිළිබඳ දත්ත සාමාන්‍යයෙන් එක්රැස් කරනු ලබන්නේ ඇගයීම මගිනි.

3. **බලපෑම් දර්ශක** මගින් වැඩසටහනක දිගුකාලීන බලපෑම මනිනු ලැබේ. බලපෑම් දර්ශකවල දත්ත එක්රැස් කරනු ලබන්නේ ඇගයීම මගිනි.

අධීක්ෂණය හා ඇගයීම ප්‍රශ්නවල ස්වභාවය අනුව, මට්ටම් තුනේදීම ප්‍රමාණාත්මක හා ගුණාත්මක දර්ශක භාවිතා කළ හැකිය. RESPECT මූලෝපායන් හත පිළිබඳ දර්ශක සංවර්ධනය කිරීම සහ දත්ත එක්රැස් කිරීමේ මෙවලම් පිළිබඳ වැඩිදුර මගපෙන්වීම් A ඇමුණුමෙහි දැක්වේ.

6. අධීක්ෂණය හා ඇගයීම මෙවලම් සංවර්ධනය කිරීම

දර්ශක පිළිබඳ එකඟ වූ පසු, ඒවා මැනීම සඳහා දත්ත එක්රැස් කිරීමේ මෙවලම් සැලසුම් කළ යුතුය. දත්ත මූලාශ්‍ර රැසක් තිබේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ඒ හා සම්බන්ධ ආකල්ප, චර්යාවන් සහ සමාජ සම්මතයන් මැනීම සඳහා දැනට තිබෙන මෙවලම් ගෝලීය පරිමාණයෙන් භාවිතා කරනු ලැබේ. ප්‍රමාණාත්මක සමීක්ෂණ සඳහා ප්‍රමිතිගත ප්‍රශ්න පහත දැක්වෙන ප්‍රශ්නාවලිවල දැක්වේ. ජාතික මට්ටමෙන් ජනගහනයේ දත්ත එක්රැස් කිරීම සඳහා බොහෝ රටවල ඒවා භාවිතා කර තිබේ. මෙම නිශ්චිත දර්ශක භාවිතා කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ A ඇමුණුමෙහි දැක්වේ.

- The World Health Organization (WHO) multicountry study on women's health and domestic violence (WHO MCS).[4]
- The Domestic Violence Module of the Demographic and Health Survey (DHS).[5]
- The United Nations Children's Fund (UNICEF) Multiple Indicator Cluster Survey (MICS).[6]
- International Men and Gender Equality Survey (IMAGES).[7]
- The UN multi-country cross-sectional study on men and violence in Asia and the Pacific (UN MCS).[8]
- The Violence Against Children Survey (VACS).[9]

මෙම සමීක්ෂණවලින් සකස්කරගන්නා ලද **ප්‍රමිතිගත ප්‍රශ්න** පහත දැක්වෙන ආකාරයට ඇතුළත් කිරීම යහපත් භාවිතාවක් ලෙස සලකනු ලැබේ.

» සමාජභාවය, වයස, ආබාධිත තත්වය ඇතුළු පෞද්ගලික ජනවිකාස දත්ත[10]

» සංයුතිය, ආදායම, වත්කම් ආදී ගෘහස්ථ සමාජ ආර්ථික දත්ත

» සමාජභාවී සමානාත්මතාව සහ විශේෂිත කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වර්ග පිළිබඳ ආකල්ප[11]

» විවිධ නිශ්චිත වර්ගවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ අත්දැකීම් (කාන්තාවන් සඳහා)

» උපකාර ඉල්ලීමේ සහ සේවා වෙත පිවිසීමේ චර්යාවන් (කාන්තාවන් සඳහා)[12]

විශේෂිත සංදර්භයන් අනුව ප්‍රචණ්ඩත්වයේ වර්ග, වැඩසටහන් සැලසුම්, වෙනස්කම් කිරීමේ න්‍යාය සහ විශේෂිත ඉලක්ක ජනගහනයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අත්දැකීම් සහ වැරදි කිරීම සම්බන්ධ වැදගත් දත්ත සහ අවදානම් සාධක ලබාදීම සඳහා **විකල්ප මොඩියල** ද ලබාදිය හැකිය.

» මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය (ප්‍රමාණය, නිරන්තරභාවයේ මට්ටම)[13]

» මානසික සෞඛ්‍යය සහ විශාධය[14]

» විශේෂිත ස්වරූපවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැරදි කිරීම (පිරිමින්, ගැහැණුන් සඳහා)[15]

» ළමයින් හදාවඩාගැනීම හා විනයගත කිරීම සම්බන්ධ ආකල්ප සහ භාවිතාවන්[16]

» කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන් සම්බන්ධ ආකල්ප[17]

» සමාජ සම්මතයන් සහ යොමුකිරීම් කණ්ඩායම් අවබෝධ කරගැනීම සඳහා වෙනත් අයගේ ආකල්ප සම්බන්ධ දැක්ම[18]

එයට අමතරව, කාන්තාවන්, පිරිමින්, ප්‍රජා පහසුකම් සපයන්නන්, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල, ප්‍රජා නායකයන්, කාන්තා අයිතිවාසිකම් සංවිධාන සහ සේවා සම්පාදකයන් සමග ගැඹුරු සම්මුඛ සාකච්ඡා, ඉලක්ක කණ්ඩායම් සහ ප්‍රජා වැඩමුළු සඳහා සංවර්ධනය කරන ලද ගුණාත්මක මෙවලම් රැසක් තිබේ. කරුණු අනාවරණය කරන කතා භාවිතා කිරීම සමාජ සම්මතයන් හැදෑරීම සඳහා ප්‍රයෝජනවත් ක්‍රමයකි.[19]

7. පර්යේෂණ, අධීක්ෂණය හා ඇගයීම සහායට අනුරූප වීම (adaptation) හා පුළුල් කිරීම (scaling-up)

පර්යේෂණ, අනුරූප වීමට උපකාර කිරීම සඳහා අධීක්ෂණය හා ඇගයීම සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් පුළුල් කිරීම මෙහෙයවීමේදී සිතෙහි තබාගත යුතු වැඩිදුර සලකාබැලීම් ගණනාවක් තිබේ.

අනුරූප වීම: වැළැක්වීමේ ප්‍රවේශයන්, උපාංග සහ මාදිලි දේශීය සංදර්භයන්ට යෝග්‍ය බව තහවුරු කිරීම සඳහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වලට සාර්ථක ලෙස අනුරූප වීම සඳහා සංවර්ධනාත්මක පර්යේෂණ (formative research) ඉතා වැදගත් වේ. පර්යේෂණ සහ අධීක්ෂණය හා ඇගයීම මගින් අනුරූප වීමට සහාය විය හැකි අමතර ක්‍රම රැසක් තිබේ.

- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් අනුරූප කරගැනීමේදී මුල් වැඩසටහනේ ප්‍රධාන මූලිකාංගවලට අනුකූලතාවආරක්ෂා කරගැනීම වැදගත්ය. අධීක්ෂණ දත්ත මගින් අනුකූලතාව අධීක්ෂණය කළ හැකි අතර ප්‍රධාන මූලිකාංග සහ වටිනාකම් නඩත්තු කළ හැකිය.

- වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි ඇගයීම (එනම්, ආදාන, ක්‍රියාකාරකම්, ප්‍රොටොකෝල සහ පටිපාටි) වැඩසටහන්වලට සාර්ථක වන්නේ කුමක්ද, අසාර්ථක වන්නේ කුමක්ද, අමතර අනුරූප කිරීම් අවශ්‍ය වේද යන්න තේරුම්ගැනීම සඳහා උපකාර වේ.

පුළුල් කිරීම: WHO/ExpandNet සාමූහිකය විසින් පුළුල් කිරීම පහත දැක්වෙන ආකාරයට අර්ථ නිරූපණය කර තිබේ. 'නියාමන හෝ පර්යේෂණාත්මක ව්‍යාපෘතිවල සාර්ථක ලෙස පරීක්ෂා කරන ලද නවෝත්පාදනයන්ගේ බලපෑම වැඩිකිරීම සඳහා සිතාමතා දරන ප්‍රයත්නයන්හි අරමුණ වන්නේ වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබාදීම සහ කල්පවත්නා පදනමකින් ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවර්ධනය කිරීමයි.'[20] Community for Understanding Scale-Up (CUSP) යනු, සමාජ සම්මතයන් වෙනස් කිරීමේ වැඩසටහන් සංවර්ධනය, අනුරූප වීම සහ පුළුල් කිරීම සඳහා ක්‍රියාත්මක වන සංවිධාන සමූහයකි. එම වැඩසටහන් අතරට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ සමාජභාවී සමානාත්මතාව අයත් වේ. එමගින් පුළුල් කිරීම සඳහා නිර්දේශ නිර්මාණය කර තිබේ. ඒවායින් ඇතැම් ඒවා පර්යේෂණ හා අධීක්ෂණය හා ඇගයීම සඳහා බලපෑම් කරයි.[21]

- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් අවශ්‍ය ප්‍රමාණයට පුළුල් කර ක්‍රියාත්මක කිරීමේදී අනුකූලතාව (Fidelity) අතිශය වැදගත්ය. එහෙත්, කාලසීමාවන්, පුහුණුව සහ මාර්ගෝපදේශනය, ක්‍රියාකාරකම්වල නිරන්තරභාවය හෝ ආවරණය පුළුල් කිරීම සඳහා වන වෙනත් වැඩසටහන් මූලිකාංග අවම කරගැනීම සඳහා සම්පත් හිඟය සහ වියදම් අරපිරිමසාගැනීමේ උවමනාව නිසා මතුවන ඉල්ලීම් හේතුවෙන් බොහෝවිට අනුකූලතාවට බලපෑම් ඇතිවේ. එබැවින්, අනුකූලතාව පරීක්ෂා කිරීම සඳහා අධීක්ෂණ දත්ත භාවිතා කළ යුතුය. මූලික වැඩසටහන් අංග පවත්වාගෙන යන බව එමගින් තහවුරු කළ යුතුය.

- අහඹු ලෙස කරනු ලබන පාලන අත්හදාබැලීමක් (RCT) හෝ වෙනත් වර්ගයක පර්යේෂණාත්මක හෝ අර්ධ පර්යේෂණාත්මක ඇගයීමක් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වල බලපෑම තක්සේරු කිරීමේදී යෝග්‍ය විය හැකිය. එහෙත්, පුළුල් පරිමාණයෙන් වැඩසටහන්කරණයෙහි ඵලදායීතාව ඇගයීම සඳහා එවැනි ප්‍රවේශයක් ඇගයීම සඳහා යෝග්‍ය නොවිය හැකිය. පුළුල් පරිමාණ වැඩසටහන් සම්බන්ධයෙන් වෙනස සඳහා යාන්ත්‍රණයන් සහ ගමන් මාර්ග අවබෝධ කරගැනීම සඳහා වෙනත් ක්‍රමවේද අවශ්‍ය වනු ඇත.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ සමීක්ෂණ ආචාරධර්ම

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැඩසටහන්කරණය සම්බන්ධ අධීක්ෂණය හා ඇගයීම මෙහෙයවීම මගින් ආචාරධාර්මිකත්වය හා ආරක්ෂාව සම්බන්ධ අභියෝග රැසක් මතුවේ. ඒ, සාමාන්‍යයෙන් වෙනත් වැඩසටහන් අංශවල අධීක්ෂණය හා ඇගයීම තුළදී සාමාන්‍යයෙන් සිදුවන දේට අමතරවය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ආචාරධාර්මික සමීක්ෂණ සිදුකිරීමේ මූලධර්ම අටක් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2001දී සංවර්ධනය කරන ලදී (එය 2016දී යාවත්කාලීන කරන ලදී). එය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැඩසටහන්කරණයේදී අදාළය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සමීක්ෂණ හෝ ඇගයීම් අධ්‍යයනයන් සැලසුම් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ බෙදාහැරීමේදී අදාළ වන එක් එක් මූලධර්මයන්ගේ සාරාංශයක් 1 වගුවෙහි දැක්වේ.[22] ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආචාරධර්ම මාර්ගෝපදේශ ලේඛන දෙකෙහි සම්පූර්ණ නිර්දේශ කට්ටලය තිබේ.[23] පහත දැක්වෙන ප්‍රධාන මූලධර්ම අටට අතිරේක ආචාරධර්ම මූලධර්ම මෑතකාලීන ලෝක සෞඛ්‍ය සංවිධාන මාර්ගෝපදේශවල අඩංගු වේ. ඇතැම් ඒවා අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමවේදවල හා ප්‍රවේශයන්ගේ විශේෂිත ස්වරූපවලට නිශ්චිත වේ.

1 වගුව: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ආචාරධාර්මික සමීක්ෂණ සඳහා වන ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූලික මූලධර්ම

1 **ප්‍රතිචාර දක්වන්නන්ගේ සහ සමීක්ෂණ කණ්ඩායමේ ආරක්ෂාව ඉතා වැගත් වන අතර සියලු ව්‍යාපෘති තීරණවලට එමගින් මගපෙන්විය යුතුය.**

- ✓ සහභාගී වන්නන්ගේ දැනුවත් කැමැත්ත ලබාගන්නා බව සහතික කරන්න. එයට අඛණ්ඩව සිදුවන සිරස් (longitudinal) ඇගයීම් හෝ සමීක්ෂණ ද ඇතුළත් වේ.
- ✓ පෞද්ගලික පසුබිම්වලදී සම්මුඛ සාකච්ඡා මෙහෙයවන්න.
- ✓ අධ්‍යයනය කාන්තාවන්ගේ සෞඛ්‍යය හෝ පවුල් සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනයක් ලෙස ප්‍රතිචාර දක්වන්නන්ට, පවුල් සාමාජිකයන්ට සහ ප්‍රජාවට විස්තර කරන්න.
- ✓ ගෘහස්ථ හිංසනය සම්බන්ධයෙන් නිවසකින් එක් කාන්තාවක පමණක් සම්මුඛ සාකච්ඡාවට ලක්කරන්න. නිවසේ වෙනත් සාමාජිකයන් සම්මුඛ සාකච්ඡාවට ලක්කිරීමේදී ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රශ්න නොඅසන්න. යුවල වැඩසටහනක කොටසක් ලෙස සහකරු/ සහකාරියන් දෙදෙනාම සම්මුඛ සාකච්ඡාවට ලක්කරන විට පමණක් මෙය වෙනස් වේ. එවැනි අවස්ථාවලදී අවදානම බොහෝදුරට අවම වන අතර වැඩසටහන විසින් ආධාර අනුබල සැපයිය හැකිය.
- ✓ බාධා සමග කටයුතු කිරීම සඳහා සම්මුඛ සාකච්ඡාකරුවන් පුහුණු කළ යුතුය.

ක්‍රියාත්මක කිරීම අධ්‍යයනය කිරීමට පෙර, සංස්කෘතික වශයෙන් යෝග්‍ය අධ්‍යයන මෙවලම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා සංවර්ධනාත්මක සමීක්ෂණයක් හා පාර්ශ්වකාර විශ්ලේෂණයක් පවත්වන්න.

2 **අධ්‍යයනයන් ක්‍රමවේදී වශයෙන් ප්‍රබල විය යුතුය. ප්‍රචණ්ඩත්වය අඩුවෙන් වාර්තා වීම පිළිබඳ වර්තමාන සමීක්ෂණ අත්දැකීම අනුව සම්පාදනය කළ යුතුය.**

- ✗ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ වැඩසටහන් වෙනුවෙන් දුර්වල ලෙස සැලසුම් කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද අධීක්ෂණයන් හා ඇගයීම් ආචාරධාර්මික නොවේ. එමගින් සම්පත් නාස්ති වේ. එය කාන්තාවන් ප්‍රචණ්ඩත්වය අඩුවෙන් වාර්තා කිරීමට පොළඹවයි. කාන්තාවන් හානි සම්බන්ධ වැඩි අවදානමකට ලක්කළ හැකිය.
- ✓ යෝග්‍ය මෙවලම් හා ක්‍රම භාවිතා කළ යුතුය. ආරක්ෂිතව තම කාර්යය කරන ආකාරය පිළිබඳ සම්මුඛ සාකච්ඡාකරුවන් පුහුණු කළ යුතුය.

3 **කාන්තාවන්ගේ හා දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රහස්‍යභාවය ආරක්ෂා කිරීම අත්‍යවශ්‍යය.**

- ✓ සම්මුඛ සාකච්ඡාකරුවන් රහසිගතභාවයේ වැදගත්කම තේරුම්ගැනීම සහතික කරන්න. ඔවුන් ඒ අනුව පුහුණු කළ යුතුය.
- ✗ ප්‍රශ්නාවලිවල සහභාගිකයන්ගේ නම් සටහන් නොකරන්න. ඒ වෙනුවට සුවිශේෂ අනන්‍යතා කේත භාවිතා කර ඒවා දත්තවලින් වෙන්කර තබාගන්න.
- ✓ දත්ත එක්රැස් කිරීම සඳහා ටැබ්ලට් පරිගණක හෝ වෙනත් ඩිජිටල් උපාංග භාවිතා කරන්නේ නම්, ඒවා මුරපද යොදා ආරක්ෂා කර ඇති බව හා දත්ත එන්ක්‍රිප්ට් කර ඇති බව තහවුරු කරන්න.
- ✓ සියලු දත්ත ආරක්ෂිත අල්මාරි තුළ හෝ මුරපද මගින් ආරක්ෂා කරන ලද විද්‍යුත් ගොනු තුළ තබාගැනීමට කටයුතු කරන්න.
- ✓ ප්‍රකාශ පටිගත කරගැනීමට පෙර සහභාගී වන්නන්ගේ කැමැත්ත විමසන්න. ලේඛනගත කරගැනීමෙන් පසු එම ශබ්ද ගොනු මකාදමන්න.
- ✓ වාර්තා කිරීමේදී ප්‍රමාණවත් තරමින් දත්ත රැස්කරගෙන තිබේදැයි සැලකිලිමත් වන්න. එහිදී විශේෂිත ප්‍රජාවක් හෝ පුද්ගලයකු වෙන්කර හඳුනාගත නොහැකි විය යුතුය.
- ✓ සහභාගී වූවන් සිරස් අධ්‍යයනවලදී හෝ පසු විපරම් දත්ත එක්රැස් කිරීම්වලදී නැවත හමුවීමේදී ආරක්ෂිත සහ යෝග්‍ය ක්‍රම භාවිතා කරන බව තහවුරු කරන්න.

4 **සමස්ත සමීක්ෂණ කණ්ඩායමම පරිස්සමෙන් තෝරාගත යුතුය. ඔවුන්ට අඛණ්ඩව සුවිශේෂ පුහුණුවීම් ලබාදිය යුතුය.**

- ✓ සමීක්ෂණ හා අධීක්ෂණය හා ඇගයීම කාර්ය මණ්ඩල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, සමාජභාවී සමානාත්මතාව සහ ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් සම්බන්ධයෙන් තමන්ගේම සමාජභාවය ආශ්‍රිත අගතීන් හා ඒකාකෘති දැනුවත්ව මගහරවා ගන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් පුහුණු වී තිබිය යුතුය.
- ✓ දත්ත එක්රැස් කරන්නන් ඇතුළු කාර්ය මණ්ඩලය ද පුහුණුව ලබා තිබිය යුතුය. සම්මුඛ සාකච්ඡා හේතුවෙන් කාර්ය මණ්ඩලයට ද්විතීයක ක්ෂතිමය අත්දැකීම් ලැබිය හැකි බැවින් ඔවුන්ට අඛණ්ඩව සහාය ලබාදිය යුතුය. ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් කාර්ය මණ්ඩලවලට අතීත ක්ෂතිමය අත්දැකීම් පිළිබඳ මතකයන් නැවත අවදි වී පීඩාවන් ඇතිවිය හැකිය.

අධ්‍යයනයට සහභාගී වන අයට එරෙහිව ප්‍රචණ්ඩත්වය භාවිතා කරන්නන් වෙතින් කාර්ය මණ්ඩලයට වෙත ද ප්‍රචණ්ඩත්වය එල්ලවීමේ අවදානමක් තිබේ. එබැවින් ඔවුන්ට ආරක්ෂිත ප්‍රවාහනය, යෝග්‍ය සන්නිවේදන තාක්ෂණයන් හා ක්‍රියාවලි වැනි ආරක්ෂක සහයෝගීතාවන් හා සැපයුම් අඛණ්ඩව අවශ්‍යය.

5 **සමීක්ෂණය හේතුවෙන් සහභාගිකයන්ට සිදුවිය හැකි විපත් අවම කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග අධ්‍යයන සැලසුමට ඇතුළත් විය යුතුය.**

- ✓ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම හෝ එසේ කිරීම පිළිබඳ අත්දැකීම් පිළිබඳ ප්‍රශ්න සම්මුඛ සාකච්ඡාව ආරම්භයේදී හෝ අවසානයේදී සෘජුවම නොඅසන බවට වගබලාගන්න.
- ✓ සහායක සහ විනිශ්චයක් මත නොපිහිටි ආකාරයෙන් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රශ්න ඇසීමට සම්මුඛ සාකච්ඡාකරුවන් පුහුණු කරන්න.
- ✓ බේරුණු පුද්ගලයන්ට සම්මුඛ සාකච්ඡාව නිසා සිදුවිය හැකි බලපෑම් පිළිබඳ අවබෝධ කරගත හැකි ලෙස සම්මුඛ සාකච්ඡාකරුවන් පුහුණු කරන්න. විපත්වලට ප්‍රතිචාර දක්වන ආකාරය සහ අවශ්‍ය නම් සම්මුඛ සාකච්ඡාවක් අවසන් කරන ආකාරය පුහුණු කරන්න.

6 **සහාය අපේක්ෂා කරන කාන්තාවන් සපයාගත හැකි දේශීය සේවාවන් හා සහායක සම්පත් වෙත යොමු කිරීම සඳහා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතුය. සම්පත් සීමිත විටදී, අධ්‍යයනය මගින් කෙටිකාලීන සහායක යාන්ත්‍රණයන් සම්පාදනය කරගත යුතුය.**

- ✓ දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාකාරකම්වලට පෙර, කාන්තාවන්ට සහාය ලබාදීම සඳහා යොමු කළ හැකි පුද්ගලයන් හා කාන්තා සංවිධාන ඇතුළු ආයතන හඳුනාගන්න. සෞඛ්‍ය, නීති හා සමාජ සේවා සම්පාදනය කළ හැකි විය යුතුය.
- ✓ දත්ත එක්රැස් කිරීමේදී ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සමග පුහුණු උපදේශන සේවා සම්පාදකයකු යන බව තහවුරු කරන්න. එමගින් කාන්තාවන්ට අවශ්‍ය සේවා සම්පාදනය ප්‍රමාණවත් නොවන පසුබිම්වලදී ඔවුන්ට ම උපදේශන සේවා සැපයිය හැකිය.

7 **සමීක්ෂකයන් හා ආධාරකරුවන් සතුව තම සොයාගැනීම් නිසි ලෙස අර්ථකථනය කිරීමේ සහ ප්‍රතිපත්ති හා මැදිහත්වීම් සංවර්ධනය කිරීම සඳහා භාවිතා කිරීමේ ආචාරධර්මික වගකීම් තිබේ.**

- ✓ සමීක්ෂණ හා අධීක්ෂණය හා ඇගයීම ප්‍රතිඵල සමීක්ෂණයට සහභාගී වූ කණ්ඩායම්වලට යෝග්‍ය ප්‍රතිපත්ති, උද්දේශන සහ මැදිහත්වීම් ක්‍රියාකාරකම් පෝෂණය කිරීම සඳහා භාවිතා කරන බව සහතික කරන්න.
- ✓ සොයාගැනීම් වලංගු කිරීමේදී, බෙදාහැරීමේදී සහ භාවිතා කිරීමේදී භූමිකාවක් ඉටුකළ හැකි උපදේශක කමිටු හෝ පාර්ශ්වකාර ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවන්න.

8 **ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රශ්න වෙනත් අරමුණු වෙනුවෙන් සැලසුම් කරන ලද සමීක්ෂණවලට සම්බන්ධ කළ යුත්තේ ආචාරධර්මික හා ක්‍රමවේද අවශ්‍යතා සම්පූර්ණ වන්නේ නම් පමණි.**

- ✓ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රශ්න වෙනත් අරමුණු හා තේමා වෙනුවෙන් සැලසුම් කරන ලද අධ්‍යයන හා අධීක්ෂණය හා ඇගයීම ක්‍රියාකාරකම්වලට ඇතුළත් කිරීම සිදුකළ යුත්තේ මෙහි ඉදිරිපත් කර තිබෙන මූලධර්ම අටෙන් විස්තර කරනු ලබන ආචාරධර්මික හා ක්‍රමවේදී ප්‍රමිතිවලට අනුකූල වන්නේ නම් පමණි.

අධීක්ෂණය සහ ඇගයීම

ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආචාරධර්මික මාර්ගෝපදේශ ලේඛන විසින් ළමයින්ට හා නව යෞවනයන්ට එරෙහිව කරනු ලබන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සමීක්ෂණ හෝ අධීක්ෂණය හා ඇගයීම සිදුකිරීම සම්බන්ධ වන විශේෂිත අවදානම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැත. ඒ වෙනුවෙන් ඉහත දක්වන ලද ක්‍රියාවලි සහ ප්‍රවේශයන්ට අතිරේක ක්‍රියාවලි සහ ප්‍රවේශයන් අවශ්‍ය වේ. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ දත්ත එක්රැස් කිරීමේ මාර්ගෝදේශ ලේඛන ගණනාවක් තිබේ. ඒ අතරින් තෝරාගත් කීපයක් පහත දැක්වේ. 1 වගුවේ දැක්වෙන ආචාර ධාර්මික සමීක්ෂණ පිළිබඳ මූලධර්ම බොහෝදුරට ළමයින්ට අදාළ වන නමුදු, ළමයින්ට හා නව යෞවනයන්ට අදාළ වන අතිරේක මූලධර්ම තිබේ. ඒවායේ සාරාංශයක් 2 වගුවෙහි දැක්වේ.[24]

2 වගුව: ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ආචාරධාර්මික සමීක්ෂණ සම්බන්ධ අතිරේක මූලධර්ම

ස්වේච්ඡා අනුමැතිය සහ කැමැත්ත

වයස අවුරුදු 18ට අඩු ළමයින්ට සාමාන්‍යයෙන් සමීක්ෂණ හා අධීක්ෂණය හා ඇගයීම සඳහා නීතිමය කැමැත්ත ලබාදීමේ හැකියාව නැත. ඔවුන් වෙනුවෙන් කැමැත්ත ලබාදිය යුත්තේ මව්පියන් හෝ භාරකරුවන්ය. කෙසේ වෙතත්, මව,පියා හෝ භාරකරුවකුගේ කැමැත්තට යටත්ව සහභාගී වීම සම්බන්ධයෙන් ස්වේච්ඡා, දැනුවත් අනුමැතිය පළකිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවස්ථාව ළමයින්ට ලබාදිය යුතුය. මව්පිය කැමැත්ත සලකා බලනවාද නැතිනම් නොතකා හරිනවාද යන කරුණ සලකා බැලීමට සමීක්ෂකයන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නන් සූදානමින් සිටිය යුතුය. උදාහරණයක් ලෙස, සමීක්ෂණය හෝ අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ මව්පියන් දැනගැනීම මගින් ළමයින් ප්‍රචණ්ඩත්වයේ හෝ අපයෝජනයේ අවදානමට ලක්වෙනවා නම් එසේ කළ යුතුය.[25]

- ✓ අධ්‍යයනය විස්තර කිරීමට හා අනුමැතිය ලබාගැනීමට භාවිතා කරනු ලබන භාෂාව (ලිඛිත හෝ වාචික) ළමයාගේ වයසට යෝග්‍යදැයි තහවුරු කරගන්න.
- ✓ ළමයින්ගේ අනුමැතිය ස්වේච්ඡාවෙන් ලැබෙන්නේද යන්න පැහැදිලි කරගන්න. සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීමෙහි නිශේධාත්මක ප්‍රතිඵල නොමැති බව ද තහවුරු කරන්න.
- ✓ අනුමැතිය/ කැමැත්ත ලබාගැනීමේදී, ළමයින් හා මව්පියන්/ භාරකරුවන් විශ්වසනීයත්වයේ තිබිය හැකි සීමා සම්බන්ධයෙන් දැනුවත් කිරීමට වගබලාගන්න. උදාහරණයක් ලෙස, ළමා අපචාර පිළිබඳ අනිවාර්ය වාර්තාකරණයේ නීතිමය අවශ්‍යතාව රහස්‍යභාවයේ අවශ්‍යතාවට වඩා වැදගත් විය හැකිය (විස්තර පහත දැක්වේ).

හානි අවදානම අවම කිරීම

ප්‍රතිචාර දක්වන්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම හා ඔවුන්ට හානි සිදුවීමේ අවදානම අවම කිරීම සෑම සමීක්ෂණයකදීම ඉතා වැදගත්ය. කෙසේ වෙතත්, ළමයින් සමග දත්ත එක්රැස් කිරීම, විශේෂයෙන්ම ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මාතෘකාවලදී පහත දැක්වෙන විශේෂිත අවදානම් නිර්මාණය කරන්නට ඉඩ තිබේ.

- ✓ සමීක්ෂණ ප්‍රොටොකෝල මගින් ළමයින්ට තිබිය හැකි සියලු අවදානම් හඳුනාගන්නා බව තහවුරු කරන්න.
- ✓ ළමයින්ට සිදුවිය හැකි අවදානම් හඳුනාගැනීම සඳහා දැනුවත් දේශීය පාර්ශ්වකරුවන්ගේ උපදෙස් ලබාගන්න.
- ✓ ළමයින් සමග සමීක්ෂණ කිරීම හා දත්ත එක්රැස් කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණ කණ්ඩායමට පුහුණුව ලබාදී තිබෙන බව තහවුරු කරන්න. එම පුහුණුවට සංවේදී මාතෘකා ද, ළමයින්ගේ විපත්වලට ප්‍රතිචාර දක්වන ආකාරය ද අයත් වේ.
- ✓ ළමා අපයෝජන අධිකාරීන් වෙත දැනුම්දීමේ අනිවාර්ය අවශ්‍යතාවේදී ඇතිවිය හැකි ඇඟවුම් සහ අවදානම් කළමනාකරණය කරගැනීමට සූදානම් වන්න. මෙම අවශ්‍යතා විවිධ සංදර්භයන්හිදී විවිධ වේ. ඒවායින් ඇතිවිය හැකි වාසි සහ වාර්තා කිරීමේ අවදානම විශ්ලේෂණය කළ යුතුය. සංස්කෘතික සහ නීතිමය සංදර්භය අනුව තුලනය කරගත යුතුය.
- ✓ සමීක්ෂණ කණ්ඩායම සමග පුහුණු උපදේශන සේවා සම්පාදකයකු යන බව තහවුරු කරන්න. එමගින් අවශ්‍ය උපදේශන සේවා සැපයිය හැකිය.

ප්‍රයෝජනවත් සම්පත්

අධීක්ෂණය හා ඇගයීම මාර්ගෝපදේශ

Programming Essentials, Monitoring & Evaluation. UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls.
UNWOMEN's Virtual Knowledge Center හි මාර්ගෝපදේශ, සිද්ධි අධ්‍යයන සහ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සහ වැළැක්වීම සම්බන්ධ බලපොරොත්තු ඇතිකරන භාවිතාවන් පිළිබඳ උදාහරණ ඇතුළු අදාළ සම්පත් පරාසයක් ඇත.

Global Women's Institute (2019) Participatory Monitoring and Evaluation (M&E) of Gender Based Violence Programs. SVRI Pre-Conference Workshop October 2019, The Global Women's Institute, George Washington University.
මෙම ස්ලයිඩ් එකතුව භාවිතා කරනු ලැබුවේ Sexual Violence Research Initiative හි ද්විවාර්ෂික සහභාගීත්ව අධීක්ෂණ හා ඇගයුම් වැඩමුළුවක පූර්ව කටයුතුවලදීය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ සමාජභාවී ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සහභාගීත්ව අධීක්ෂණ හා ඇගයීම් ප්‍රවේශයන්හිදී භාවිතා කරනු ලබන ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ මූලධර්ම එහි අඩංගු විය.

UNICEF (2018) INSPIRE Indicator Guidance and Results Framework. New York: UNICEF.
INSPIRE මූලෝපායන් හත තුළ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට හා කාලය තුළ වෙනස අධ්‍යයනය කිරීම සඳහා රජයන්ට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපකාර කිරීම සඳහා සැලසුම් කර තිබේ. ප්‍රතිඵල රාමුවක් සහ මූලික දර්ශක කට්ටලයක්, එය භාවිතා කරන ආකාරය පිළිබඳ සවිස්තර මාර්ගෝපදේශ සමග මෙම ලේඛනයෙහි අඩංගු වේ.

ANROWS (2017) Counting on change. A guide to prevention monitoring. Australian National Research Organisation for Women's Safety.
ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන් සහ උද්දේශකයන් සඳහා වන, කාන්තාවන්ට හා ඔවුන්ගේ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මැනීම හා සම්බන්ධ ජනගහන මට්ටමේ ප්‍රගතිය මැනීමේ මාර්ගෝපදේශයකි.

DFID (2012) How to Note: Guidance on Monitoring and Evaluation for Programming on Violence against Women and Girls. CHASE Guidance Note Series.
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ වැඩසටහන්වල වැදගත් අවධි හතරක් විස්තර කරයි. අධීක්ෂණ හා ඇගයීම් චක්‍රයේ සෑම මට්ටමකදීම එය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ සවිස්තර මාර්ගෝපදේශයක් සපයයි.

Bloom, S.S. (2008) Violence Against Women and Girls: A Compendium of Monitoring and Evaluation Indicators. Measure Evaluation, for the USAID East Africa Regional Mission and Inter-agency Gender Working Group.
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැඩසටහන් අධීක්ෂණයේ හා ඇගයීමේ පරිපූර්ණ දර්ශක සංග්‍රහයකි. දර්ශක අර්ථ නිරූපණවල මාර්ගෝපදේශ, එම දර්ශක මැනිය යුතු ආකාරය හා දත්ත එක්රැස් කිරීම සඳහා භාවිතා කළ හැකි මෙවලම් එහි තිබේ.

Ellsberg, M. & Heise, L. (2005) Researching Violence Against Women: A Practical Guide for Researchers and Activists. World Health Organization, PATH.
ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ හා වැළැක්වීමේ ක්ෂේත්‍රයේ යෙදීසිටින පර්යේෂකයන් සඳහා අත්පොතකි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අන්තර්ගතයන් අඩංගු සමීක්ෂණ සිදුකිරීමේ ක්‍රමවේදීය හා ආචාරධාර්මික අභියෝග සහ එම අභියෝගවලදී අනුගමනය කළහැකි නිර්මාණාත්මක තාක්ෂණයන් එහි අඩංගු වේ.

ආචාරධර්ම සහ ආරක්ෂාව - කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

WHO (2016) Ethical and safety recommendations for intervention research on violence against women. Building on lessons from the WHO publication Putting women first: ethical and safety recommendations for research on domestic violence against women. Geneva: World Health Organization.
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සමීක්ෂණ සිදුකිරීමේදී අනුග මනය කළ යුතු ආචාරධාර්මික හා ආරක්ෂක නිර්දේශ (පහත දැක්වේ) පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ 2001 මුල් ලේඛනයේ යාවත්කාලීන කිරීමකි. ඒවා පදනම් වන්නේ, අමතර ක්‍රියාමාර්ග සහ යහපත් භාවිතාවන් තහවුරු කිරීම සඳහා වන වඩා මෑතකාලීන සාක්ෂි හා අධ්‍යයනයන් මතය.

WHO (2001) Putting Women First: Ethical and Safety Recommendations for Research on Domestic Violence Against Women. Geneva: World Health Organization.
ලෝක සෞඛ්‍ය සංවිධානයේ කාන්තා සෞඛ්‍යය සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ බහු රාජ්‍ය අධ්‍යයනයේ කොටසක් ලෙස සම්පාදනය කරන ලද මාර්ගෝපදේශ ලේඛනයයි. එහි මූලික ආචාරධාර්මික හා ආරක්ෂක මූලධර්ම අවධාරණය කරනු ලැබේ. ඒවා මෙහෙයවන ආකාරය පිළිබඳ විස්තරයක් ද අඩංගු වේ.

ආචාරධර්ම සහ ආරක්ෂාව - ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

UNICEF (2018) INSPIRE Indicator Guidance and Results Framework. New York: UNICEF.
මෙම ලේඛනය විසින් INSPIRE මූලෝපායන්වල ප්‍රතිඵල ව්‍යුහය සහ දර්ශක සම්බන්ධ මාර්ගෝපදේශය වෙත අවධානය යොමුකරනු ලබන නමුත්, ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා සම්බන්ධයෙන් ද එහි පරිච්ඡේදයක් අඩංගු වේ.

CP MERG (2012) Ethical principles, dilemmas and risks in collecting data on violence against children: A review of available literature. New York: Statistics and Monitoring Section/ Division of Policy and Strategy, UNICEF.
මෙය මාර්ගෝපදේශ ලේඛනයක් නොවේ. එය ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ආචාරධාර්මික සමීක්ෂණ මාර්ගෝපදේශයන්ගේ අනාගත පදනම නිර්මාණය කිරීමේ ලේඛන සමූහයක් සහ සමාලෝචනයකි. ලේඛනය විසින් ළමයින් සමග සමීක්ෂණ සිදුකිරීම හා සම්බන්ධ විවිධ මූලධර්ම, අර්බුද සහ පර්යේෂකයන් මුහුණදිය හැකි අවදානම් පිළිබඳ පුළුල් සමාලෝචනයක් සපයයි. යහපත් භාවිතාවන් පිළිබඳ නිර්දේශ සපයයි.

ඇමුණුම A: RESPECT මූලෝපායන්ගේ බලපෑම සහ ප්‍රතිඵල සම්බන්ධ දර්ශක

RESPECT මූලෝපායන් එකිනෙක සතුව බලපෑම්, ප්‍රතිඵල සහ ප්‍රතිදාන ප්‍රකාශන කට්ටලයක් තිබේ. එම මූලෝපායන් හත හරහාම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දුරලීම බලපෑමක් ලෙස දැක්වේ. 3 සහ 4 වගු විසින් පහත දැක්වෙන විස්තර ඉදිරිපත් කරනු ලැබේ. එක් එක් මූලෝපායන් විසින් ඉලක්ක කරනු ලබන බලපෑම් සහ ප්‍රතිඵල, මෙම ප්‍රතිඵල මැනීම සඳහා භාවිතා කළ හැකි සහ අනුරූප කරගත හැකි දර්ශක සඳහා නිදර්ශන, මෙම දර්ශක භාවිතා කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ සහ සම්පත්වල සාරාංශයක්. ප්‍රතිදාන (outputs) සම්බන්ධ දර්ශක ඇතුළත් කර නැත. ඒවා වැඩසටහනට සහ ක්‍රියාත්මක කිරීමේ සංදර්භයට අනුරූප කරගත හැකිය.

වගුව 3: RESPECT මූලෝපාය බලපෑම, දර්ශක සහ මාර්ගෝපදේශ

සටහනට RESPECT රාමුව තුළ බලපෑම් ප්‍රතිඵල හතරක් තිබේ. ඒවාට විවිධ මූලෝපායන් දායක වේ. ඒවා 3 වගුවෙහි බලපෑම් 1 සිට 4 දක්වා ලේබල් කර තිබේ. ඒ හා අනුගත දර්ශක ද ඒ අනුව ලේබල් කර තිබේ (උදා: 1 බලපෑම සඳහා 1.1 සහ 1.2). එම දර්ශක නිශ්චිත RESPECT මූලෝපායට යෝග්‍ය වේ.

මූලෝපාය	බලපෑම	දර්ශක	මාර්ගෝපදේශ
R **සම්බන්ධතා කුසලතා ශක්තිමත් කර ඇත**	1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	1.1. කිසියම් කලක සහකාරියක වී තිබෙන වයස අවු: 15 සහ එයට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමයින් වත්මන් හෝ හිටපු සමීප සහකරු වෙතින් පසුගිය මාස 12 තුළදී ශාරීරික, ලිංගික හෝ මානසික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වී තිබෙන අනුපාතය. (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.2.1)	මෙම දර්ශක තිරසර සංවර්ධන අරමුණු 5.2.1 සමග සම්බන්ධ වේ. ජනගහන මට්ටමේදී (උදා: භූගෝලීය ප්‍රදේශය) හෝ වැඩසටහන් මට්ටමේදී (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙනුවෙන්) මැනිය හැකිය. සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (IPV) යනු සුලබම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ස්වරූපයකි. දර්ශකය අනුව එයට වත්මන් හෝ හිටපු සහකරුවකු හෝ කලත්‍රයකු විසින් සිදුකරනු ලබන ශාරීරික, ලිංගික හෝ මානසික (චිත්තවේගී ලෙස ද හැඳින්වේ) ප්‍රචණ්ඩත්වය අයත් වේ. තිරසර සංවර්ධන අරමුණු දර්ශක මගින් පසුගිය මාස 12 ඇතුළතදී නවයොවුන් ගැහැණු ළමයින් සහ වයස අවුරුදු 15 - 49 අතර ප්‍රජනන වියේ කාන්තාවන් මුහුණදුන් ඕනෑම ආකාරයක IPV මනිනු ලැබේ. RESPECT දර්ශකවල ඉහළ වයස් සීමාව ඉවත් කර තිබේ. IPV අත්දැක තිබෙන වැඩිහිටි කාන්තාවන් ඇතුළත් කරගැනීම එහි අරමුණයි. දර්ශකයේ මිනුම් ඉලක්කගත IPV ස්වරූපයට අනුරූප කළ යුතුය. ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය, වයස සහ වෙනත් අදාළ චරිත ලක්ෂණ අනුව දත්ත වෙන්කර වෙනම වර්ග කළ යුතුය. IPV මිනුම් බොහෝ විට ශාරීරික සහ ලිංගික IPV වෙත අවධානය යොමුකරයි. ශාරීරික ප්‍රචණ්ඩත්වය වෙත අවධානය යොමුකරන්නේ අඩුවෙනි. අඩුවෙන් මනිනු ලබන තවත් IPV ස්වරූපයක් වන්නේ ආර්ථික ප්‍රචණ්ඩත්වයයි. ඇතැම්විට එය මානසික IPV මිනුම් වෙත ඒකාබද්ධ කරනු ලැබේ. ඇතැම් විට වෙනම IPV ස්වරූපයක් ලෙස සැලකේ. මෑත සාක්ෂිවලින් හෙළිවන පරිදි චිත්තවේගී සහ ආර්ථික IPV සතුව කාන්තාවන්ට අදාළ කැපීපෙනෙන බලපෑම් තිබේ. ඒවා IPV ක්‍රියාමාර්ග සමග සම්බන්ධ කළ යුතුය.[26] WHO MCS විසින් ශාරීරික සහ ලිංගික IPV මැනීම සඳහා ප්‍රශ්න මාලාවක් සැලසුම් කරන ලදී. ඒවා බහුවිධ පළාත් හා රාජ්‍යවල ඵලදායී ලෙස භාවිතා කර තිබේ. මෙම ප්‍රශ්න දකුණු අප්‍රිකාව විසින් ද අනුගත කරගෙන පුළුල්ව භාවිතා කර තිබේ.[27] උදාහරණයක් ලෙස What Works to Prevent Violence Against Women and Girls ගෝලීය වැඩසටහන සැලකිය හැකිය. චිත්තවේගී හා ආර්ථික IPV වෙනුවෙන් මූලාශ්‍ර රැසක් තිබේ. WHO MCS, DHS සහ UN MCS අංග එයට ඇතුළත් වේ.

මූලෝපාය	බලපෑම	දර්ශක	මාර්ගෝපදේශ
		1.2. වයස අවු: 15 සහ එයට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමීප සහකරු නොවන වෙනත් අය වෙතින් පසුගිය මාස 12 තුළදී ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වී තිබෙන අනුපාතය. (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.2.2)	මෙම දර්ශක තිරසර සංවර්ධන අරමුණු 5.2.2 සමග සම්බන්ධ වේ. එමගින් කිසිවකු මත පටවනු ලබන දූෂණය, ලිංගික අපයෝජනය, බලහත්කාර ලිංගික සම්බන්ධතා, ව්‍යභිචාරය හෝ ලිංගික පීඩා වැනි ඕනෑම ලිංගික ක්‍රියාකාරකමක් හෝ චර්යාවක් ලිංගික ප්‍රචණ්ඩත්වය ලෙස අර්ථ නිරූපණය කරනු ලැබේ. තිරසර සංවර්ධන අරමුණු දර්ශක විසින් පසුගිය මාස 12 ඇතුළතදී නවයොවුන් ගැහැණු ළමයින් සහ වයස අවුරුදු 15 - 49 අතර ප්‍රජනන වියේ කාන්තාවන් මුහුණදුන් සමීප සහකරු නොවන වෙනත් පුද්ගලයකු විසින් සිදුකරන ලද ඕනෑම ආකාරයක ලිංගික හිංසන මනිනු ලැබේ. ජනගහන මට්ටමේදී (උදා: භූගෝලීය ප්‍රදේශය) හෝ වැඩසටහන් මට්ටමේදී (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙනුවෙන්) මැනිය හැකිය. RESPECT දර්ශකවල ඉහළ වයස් සීමාව ඉවත් කර තිබේ. සමීප සහකරු නොවන වෙනත් පුද්ගලයකු විසින් සිදුකරන ලද ලිංගික හිංසනය අත්දැක තිබෙන වැඩිහිටි කාන්තාවන් ඇතුළත් කරගැනීම එහි අරමුණයි. දර්ශකයේ මිනුම ඉලක්ක කරනු ලබන ලිංගික ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය අනුව අනුරූප කරගත යුතුය. වයස, සිදුවූ ස්ථානය හෝ වරදකරුගේ ස්වරූපය වැනි වෙනත් අදාළ ලක්ෂණ අනුව වෙනම ගණනය යුතුය. සමීප සහකරු නොවන වෙනත් අයෙකු විසින් සිදුකරන ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත එක්රැස් කරන බොහෝ සමීක්ෂණ විසින් බලහත්කාර ලිංගික සංසර්ගය හෝ ඒ සඳහා උත්සාහ කිරීම හෝ වෙනත් ලිංගික ක්‍රියා පිළිබඳ මිනුම් ගනු ලැබේ. සමීප සහකරු නොවන වෙනත් අයෙකු විසින් සිදුකරන ලිංගික ප්‍රචණ්ඩත්වය මැනීම උදෙසා භාවිතා කරන ප්‍රශ්න සඳහා උදාහරණ WHO MCS, DHS සහ VACS හි තිබේ. එවැනි ජනගහන සමීක්ෂණ මගින් සාම්පලය ලෙස සලකනු ලබන්නේ වයස අවුරුදු 15ට වැඩි ගැහැණු ළමයින් සහ කාන්තාවන්ය. VACS විසින් සාම්පලය ලෙස සලකන්නේ වයස අවුරුදු 13ට වැඩි ගැහැණු ළමයින්ය.
E **කාන්තාවන් සවිගැන්වීම**	1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	බලන්න බලපෑම් දර්ශක 1.1	1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		බලන්න බලපෑම් දර්ශක 1.2	1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
	2. කාන්තාවෝ තම මානව හිමිකම් අභ්‍යාස කරමින් සංවර්ධනයට දායක වෙති	2.1. ජාතික පාර්ලිමේන්තුවේ සහ පළාත් පාලන ආයතනවල කාන්තාවන් සතු ආසන සංඛ්‍යාව (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.5.1)	මෙම බලපෑම් ප්‍රකාශය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක 5.5 සමගය. එනම්, දේශපාලන, ආර්ථික සහ පොදු ජීවිතයේදී තීරණ ගැනීමේ මට්ටම්වල පූර්ණ හා ඵලදායී සහභාගීත්වය සහ සමාන නායකත්ව අවස්ථා සහතික කිරීමයි. තිරසර සංවර්ධන අරමුණු ඉලක්කවලට පහත දැක්වෙන දර්ශක ද අයත් වේ: 5.5.1(a), ජාතික පාර්ලිමේන්තුවල කාන්තාවන්ගේ ආසන අනුපාතය සහ 5.5.1(b) පළාත් පාලන ආයතනවල කාන්තාවන්ගේ ආසන අනුපාතය. පාර්ලිමේන්තුවෙන් ලබාගත් සංඛ්‍යාලේඛන, මැතිවරණ වාර්තා හෝ අමාත්‍යාංශවලින් ලබාගත හැකි රාජ්‍ය පරිපාලන දත්ත ද දත්ත මූලාශ්‍රවලට අයත් වේ.
		2.2. නීතිමය ව්‍යුහය (සම්ප්‍රදායික නීති ද ඇතුළත්ව) මගින් ඉඩම් සම්බන්ධ කාන්තාවන්ගේ සමාන අයිතිවාසිකම් සහ/ හෝ පාලනය තහවුරු කරන රටවල් අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.a.2)	මෙම බලපෑම් ප්‍රකාශය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.a.2 සමගයි. එය ඉඩම් අයිතිය සහ/ හෝ පාලනය අවධාරණය කරයි. වෙනත් ආර්ථික මූලාශ්‍රවල පාලනය සහ කාන්තාවන්ගේ දිළිඳුකම අවම කිරීම සහ මානව හිමිකම් වෙත ප්‍රවේශය සමග සම්බන්ධය. මෙම දර්ශකය මනිනු හා අධීක්ෂණය කරනු ලබන්නේ නියෝජනයන් හයකට සාපේක්ෂවය. එය දර්ශක මාර්ගෝපදේශ හා මෙටාඩේටාවල මූලික අර්ථදැක්වීම හා මූලාශ්‍ර සමග දැක්වේ. මෙම නියෝජනයන් මගින් එක් එක් රට කාන්තාවන්ගේ ඉඩම් හිමිකමට සහාය දක්වන ආකාරය මැනිය හැකිය.

මූලෝපාය	බලපෑම	දර්ශක	මාර්ගෝපදේශ
		2.3. ලිංගික සම්බන්ධතා, ප්‍රතිසන්ධිරෝධක භාවිතය සහ ප්‍රජනන සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ දැනුවත් ස්වාධීන තීරණ ගතහැකි වයස අවුරුදු 15-49 අතර කාන්තාවන් අනුපාතය. (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.6.1)	මෙම බලපෑම් දර්ශකය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.6.1 සමගයි. ක්ෂේත්‍ර තුනෙහිදීම කාන්තාවන්ගේ තීරණගැනීම මනියි. එනම්, ලිංගික සම්බන්ධතා (තම සැමියා/ සහකරු සමග ලිංගික සම්බන්ධතා පවත්වන්නට ඔවුන්ට අවශ්‍යද යන කාරණය), ප්‍රතිසන්ධිරෝධක භාවිතය සහ ප්‍රජනන සෞඛ්‍යාරක්ෂාවට ප්‍රවේශයයි. දර්ශක මාර්ගෝපදේශ හා මෙටාඩේටා විසින් දර්ශක මැනීම සඳහා භාවිතා කරන සමීක්ෂණ ප්‍රශ්න තුනක් සපයා තිබේ. ඒවා උපුටාගෙන තිබෙන්නේ DHS සහ MICS වෙතිනි. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්).
		2.4. SIGI සූචිය	බලපෑම් දර්ශක 2.1, 2.2 සහ 2.3 කාන්තාවන් තම අයිතිවාසිකම් අභ්‍යාස කරන සහ සංවර්ධනයට දායක වන විවිධ මානයන් මනියි. කාන්තා අයිතිවාසිකම්වල බහුවිධ මානයන් ඒකාබද්ධ කරන සමාජභාවී දර්ශක රැසක් තිබේ. ඒවායින් සමහරක් Data2X, Mapping Gender Data Gaps (බලන්න පිටුව 42) ලේඛනයෙහි තිබේග OECD සංවර්ධන මධ්‍යස්ථානයෙහි සමාජ ආයතන සහ සමාජභාවී දර්ශකය - Social Institutions and Gender Index (SIGI) විසින් සමාජ ආයතනවලදී කාන්තාවන්ට වෙනස්කම් කිරීම මනිනු ලැබේ. එමගින් සංවර්ධනයට දායක වීම සඳහා කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ හැකියාවන් සීමා කරනු ලැබේ. කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ විශේෂිත මානයන් වැඩසටහන් විසින් තෝරාගනු ඇත. ඒ සඳහා විකල්පයන් SIGI වෙතින් ලබාගත හැකිය. SIGI විසින් වර්තමානයේදී රටවල් 180ක් සම්බන්ධ මිනුම් කරනු ලැබේ. වෙනස්කොට සැලකීම් කරන සමාජ ආයතනවල මානයන් හතරක් ආවරණය කරනු ලැබේ. » පවුලේ වෙනස්කම් කිරීම් - ළමා විවාහ, කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ පවුල් වගකීම්, දික්කසාදය ලබාගැනීමේ හැකියාව සහ උරුම අයිතිවාසිකම් ලබාගැනීමේ හැකියාව එයට අයත් වේ. » ශාරීරික ඒකාග්‍රතාවය සීමාකිරීම - කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවතීම සහ ප්‍රචණ්ඩත්වයෙන් නීතිමය ආරක්ෂණයන්, කාන්තා ලිංගේන්ද්‍රිය විකෘති කිරීම (FGM) සහ කාන්තාවන්ගේ ප්‍රජනන ස්වාධිපත්‍යය එයට අයත් වේ. » ඵලදායී සහ මූල්‍ය සම්පත්වලට ප්‍රවේශය සීමාකිරීම - ඉඩම් වත්කම්වලට, ඉඩම් නොවන වත්කම්වලට සහ නිල මූල්‍ය සේවාවන්ට ප්‍රවේශය සුරක්ෂා කිරීම, සේවා ස්ථාන අයිතිවාසිකම්වලට ප්‍රවේශය මෙයට අයත් වේ. » සිවිල් නිදහස සීමාකිරීම - පුරවැසි අයිතිවාසිකම්, දේශපාලන හඬ, සංචලනයේ නිදහස සහ යුක්තිය වෙත ප්‍රවේශය මෙයට අයත් වේ.
S **සේවා සහතික කර ඇත**	1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	බලන්න බලපෑම් දර්ශක 1.1	1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		බලන්න බලපෑම් දර්ශක 1.2	1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න

මූලෝපාය	බලපෑම	දර්ශක	මාර්ගෝපදේශ
	3. නිවාසවල ප්‍රජාවේ සහ සමාජයේ වැඩිදියුණු කරන ලද සෞඛ්‍යය සහ සංවර්ධන ප්‍රතිඵල	3.1. ශාරීරික, මානසික සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පැත්තෙන් ඉලක්ක කරන ලද කාන්තාවන් සහ පිරිමින් අනුපාතය	වැඩසටහන මගින් ඉලක්ක කරන ලද සේවා මත රඳාපවතිමින් සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමට සහ බේරුණු පුද්ගලයන්ගේ හදිසි සෞඛ්‍ය අවශ්‍යතාවලට අනුව කිසියම් වැඩසටහන් මැදිහත්වීමක් පුළුල් සෞඛ්‍ය ප්‍රතිඵල වර්ධනය කිරීමට අරමුණු කරන්නේද යන්න සැලකිල්ලට ගනිමින් මෙම බලපෑම සම්බන්ධ දර්ශක වඩා නිශ්චිත කිරීම අවශ්‍යය. ආදර්ශ දර්ශකවලට පහත දැක්වෙන කාරණා ඇතුළත්ය: » බෝවෙන සහ බෝ නොවන රෝග සහිත ගැහැණුන් හා පිරිමින් අනුපාතය » හානිකර මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතා කරන බව කියන ගැහැණුන් හා පිරිමින් අනුපාතය » පසුගිය මාසයේදී විෂාධ ලක්ෂණ පෙන්වූ ගැහැණුන් හා පිරිමින් අනුපාතය » චිත්තවේගී යහපැවැත්ම වාර්තා කළ ගැහැණුන් හා පිරිමින් අනුපාතය » පුහුණු වෘත්තික සහාය සහිතව පසුගිය මාස 12 තුළදී දරුවකු ප්‍රසූත කළ ගැහැණුන් අනුපාතය » ආසන්නම දරු උපත මෙම කාලය තුළදී සිදුකිරීමට අවශ්‍ය වූ ගැහැණුන් අනුපාතය
		3.2. පොලිසියට වාර්තා වූ, විමර්ශනය කරන ලද හා නඩු පවරන ලද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නඩු අනුපාතය	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුවීම්වලට ප්‍රතිචාර දක්වන සක්‍රිය, කාර්යක්ෂම පොලිසියක් හා නීති පද්ධතියක් පැවතීම සම්බන්ධ ප්‍රධාන මිනුම වන්නේ පොලිසිය විසින් විමර්ශනය කර නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලද නඩු සංඛ්‍යාවයි. පොලිස් හා අධිකරණ වාර්තා මගින් දර්ශකය මැනිය හැකිය. වැඩිදුර මාර්ගෝපදේශ මෙතනින්: UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls සහ Violence Against Women and Girls: A Compendium of Monitoring and Evaluation Indicators.
P **දිළිඳුභාවය අවම කර ඇත**	1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	බලන්න බලපෑම් දර්ශක 1.1	1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		බලන්න බලපෑම් දර්ශක 1.2	1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
	3. නිවාසවල, ප්‍රජාවේ සහ සමාජයේ වැඩිදියුණු කරන ලද සෞඛ්‍යය සහ සංවර්ධන ප්‍රතිඵල	3.3. ශාරීරික, මානසික සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය ප්‍රතිඵල වර්ධනය කරගෙන තිබෙන ගැහැණුන් හා පිරිමින් අනුපාතය	3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		3.4. ලිංගිකභාවය සහ වයස අනුව, ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ජනගහනයේ අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 1.2.1)	මෙම බලපෑම් දර්ශකය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු දර්ශක 1.1 සමගයි. එමගින් මනිනු ලබන්නේ ජාතික දරිද්‍රතා අනුපාතිකය සහ ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ජනගහනයේ අනුපාතයයි. ආදායම වෙනුවට ගෘහ පාරිභෝජනය මගින් දරිද්‍රතාව මනින ලෙස මාර්ගෝපදේශ සහ මෙටාඩේටා දර්ශක නිර්දේශ කරයි. සවිස්තර මාර්ගෝපදේශ අර්ථ නිරූපණ සහ දත්ත මූලාශ්‍ර එමගින් සපයනු ලැබේ.
		3.5. ජාතික අර්ථ නිරූපණානුකූල සෑම මානයකටම අනුව සෑම වයසකම පිරිමින් ගැහැණුන් හා ළමයින් අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 1.2.2)	මෙම බලපෑම් දර්ශකය සම්බන්ධ වන්නේ 1.2.2 තිරසර සංවර්ධන අරමුණු දර්ශකය සමගය. මෙම තිරසර සංවර්ධන අරමුණු දර්ශකය වෙනුවෙන් විශේෂිත මාර්ගෝපදේශ හෝ මෙටාඩේටා තවම ප්‍රසිද්ධ කර නැත. කෙසේ වෙතත් ඇතැම් මූලාශ්‍ර උකහාගෙන තිබෙන්නේ බහුපාර්ශ්වීය දරිද්‍රතා දර්ශකයෙනි. එමගින් දුර්වල සෞඛ්‍යය, අධ්‍යාපනයේ අඩුව, ජීවන ප්‍රමිතියේ අප්‍රමාණවත්බව, ආදායම් අප්‍රමාණවත්කම, බලය නොමැතිකම, වැඩවල දුර්වල ගුණාත්මකබව සහ ප්‍රචණ්ඩත්වයේ තර්ජනය අනුව සිදුවන දුෂ්කරතාව එමගින්

මූලෝපාය	බලපෑම	දර්ශක	මාර්ගෝපදේශ
		3.6. සමාජභාවී සමානාත්මතාව සහ ගෞරවනීය සම්බන්ධකම් සමීප සහකරු/ කාරිය සමග පවත්වන සෑම වයසකම පිරිමින් සහ ගැහැණුන් අනුපාතය	වැඩසටහන අනුව, මෙම බලපෑම් ප්‍රකාශනය සඳහා වන දර්ශක වඩා නිශ්චිත විය යුතුය. සමීප සම්බන්ධතාවලදී සමාජභාවී සමානාත්මතාව ප්‍රදර්ශනය කිරීමට ඒකාබද්ධ තීරණ ගැනීම සහ සමාජභාවී වශයෙන් වඩා සාධාරණ අන්දමින් ගෘහස්ථ භූමිකාවන් බෙදීයාම අවශ්‍යය. ගෞරවනීය සම්බන්ධතා ප්‍රදර්ශනය කිරීම තුළට වටිනාකම්, සම්මානනය සහ අනුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ සැලකිල්ල ඇතුළත්ය. ප්‍රතිචාර දැක්වූවකු කරන ප්‍රකාශය සහ ඔවුන්ට සෙසු අය සලකන/ අගයන ආකාරය පිළිබඳ ඔවුන්ට හැඟෙන ආකාරය යන දෙකම එහිදී අදාළය.
E **පරිසරය සුරක්ෂා වීම**	1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	බලන්න බලපෑම් දර්ශක 1.1	1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		බලන්න බලපෑම් දර්ශක 1.2	1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		1.3. ලිංගිකත්වය, වයස, ආබාධිත තත්වය සහ සිදුවන ස්ථානය අනුව පසුගිය මාස 12 තුළදී ශාරීරික හෝ ලිංගික හිංසනයේ විඳින්නන් බවට පත්වූ අනුපාතය	මෙම දර්ශක සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු 11.7.2 සමගය. එමගින් ලිංගික හිංසනය ඕනෑම ලිංගික අර්ථයක් ඇති ක්‍රියාවක් ලෙස අර්ථ නිරූපණය කරයි. පුද්ගලයකුගේ ශාරීරික ඒකාග්‍රතාවට සහ/ හෝ චිත්තවේගී ස්වභාවයට පටහැණි බියක් නිර්මාණය කරන හිංසනය ඇතුළු සියලු ශාරීරික හිංසාවන් එයට ඇතුළත් වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). ලිංගිකත්වය, වයස, ආබාධිත තත්වය සහ සිදුවන ස්ථානය අනුව මෙම දර්ශකය වෙන්කර දක්වනු ලැබේ. 11.7.2 තිරසර සංවර්ධන අරමුණ වෙනුවෙන් මාර්ගෝපදේශයට මෙම දර්ශකය මනින ක්‍රම ඇතුළත් වේ. ඒ අනුව, ගෘහස්ථ සමීක්ෂණයට ප්‍රශ්න අට ඇතුළත් කළ යුතුය.
	4. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ මුලිනුපුටා දමා ඇත	4.1. වයස අවුරුදු 18 වන විට ලිංගික ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන් වයස අවුරුදු 18-29 අතර තරුණ කාන්තාවන්ගේ හා පිරිමින්ගේ අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු 16.2.3)	මෙම දර්ශක සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු 16.2.3 සමගය. වයස අවුරුදු 18 වන විට ලිංගික ප්‍රචණ්ඩත්වය යනු වයස අවුරුදු 17 හෝ ඊට අඩු ළමයකුට සිදුකරන ලිංගික ක්‍රියාවක් ලෙස එමගින් අර්ථ දක්වයි. ලිංගික අපයෝජනය, ලිංගික බලහත්කාරය, වාණිජ ලිංගික සූරාකෑම (කුට්ටනය ඇතුළු), ළමා ලිංගික සේවා සහ ලිංගික සූරාකෑම හෝ වහල්භාවයට පත්කිරීම එයට ඇතුළත් වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). වයස අවුරුදු 18-42 අතර කාන්තාවන් සහ පිරිමින් වෙනුවෙන් මෙම දර්ශකය විසින් මිනුම් ගනු ලැබේ. ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ මිනුම්වලට ප්‍රචණ්ඩත්වයේ වර්ගය සහ වැරදිකරු ඇතුළත් විය යුතුය. ඇතැම් අධීක්ෂණය හා ඇගයීම මෙවලම්වලට ප්‍රචණ්ඩත්වය සිදුවන වයස සහ ස්ථානය ද ඇතුළත් වේ. ළමා වියේදී මුහුණදෙන ලිංගික ප්‍රචණ්ඩත්වය, අපයෝජනය සහ සූරාකෑම පරිසමාප්ත ප්‍රශ්න කට්ටලයක් VACS හි අඩංගු වේ. විවිධ වර්ගවල ලිංගික ප්‍රචණ්ඩත්වය, ප්‍රචණ්ත්වය සම්බන්ධ වැරදි සිදුකිරීම, ප්‍රතිචාර දක්වන්නා ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් වයස සහ වැරදිකරුවා ඉජග් වයස සම්බන්ධ මිනුම් එයට ඇතුළත් වේ.
		4.2. සත්කාර සපයන්නන් වෙතින් පසුගිය මාසය තුළ කිසියම් ශාරීරික දඬුවමක් සහ/ හෝ මානසික හිංසනයක් වයස අවුරුදු 1 - 17 අතර ගැහැණු ළමයින්ගේ හා පිරිමි ළමයින්ගේ අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු 16.2.1)	මෙම බලපෑම් දර්ශකය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු 16.2.1 සහ INSPIRE: Seven strategies for ending violence against children සමගය. ශාරීරික දඬුවම් අතරට අල්ලා සෙලවීම, කම්මුලට පහරදීම, ගුටිබැට දීම සහ වාචික හිංසනය, කෑගැසීම, බැණවැදීම හෝ නම් පටබැඳී වැනි මානසික ආක්‍රමණික ක්‍රියා අයත් වේ. මෙම දර්ශකය මගින් පසුගිය මාසය තුළදී වයස අවුරුදු 1-17 අතර ළමයින් සහ නවයොවුන් පුද්ගලයන් විසින් මුහුණදුන් දඬුවම් හෝ ආක්‍රමණික ක්‍රියා මනිනු ලැබේ. එය ලිංගිකත්වය, වයස සහ ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය අනුව වෙන්කර දැක්විය යුතුය. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). රැකබලාගන්නන් විසින් සිදුකරනු ලබන ශාරීරික හා චිත්තවේගී ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් ළමයින් හා නව යොවුන් පුද්ගලයන්ට අදාළ ප්‍රශ්න කට්ටලයක් VACS හි අඩංගු වේ. බොහෝ අධ්‍යයනයන් විසින් ඒ වෙනුවට මව්පියන්/ රැකබලාගන්නන් විසින් ශාරීරික දඬුවම් සහ මානසික ආක්‍රමණශීලීත්වය භාවිතා කිරීම පිළිබඳ වාර්තා මනිනු ලැබේ. උදාහරණයක් ලෙස, MICS Child Discipline Moduleහි වයස අවුරුදු පහට අඩු හා 5-17 අතර ළමුන් සඳහා වෙන වෙනම මිනුම් අඩංගු වේ. මෙම දර්ශකය පිළිබඳ තවත් මාර්ගෝපදේශ පහත දැක්වෙන ලේඛනවල අඩංගු වේ: INSPIRE Indicator Guidance and Results Framework සහ 16.2.1 දර්ශකය සඳහා තිරසර සංවර්ධන අරමුණු මාර්ගෝපදේශ.

මූලෝපාය	බලපෑම	දර්ශක	මාර්ගෝපදේශ
C ළමා සහ නවයොවුන් අපයෝජන වැළැක්වීම	1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	බලන්න බලපෑම් දර්ශක 1.1	1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		බලන්න බලපෑම් දර්ශක 1.2	1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
	4. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	බලන්න බලපෑම් දර්ශක 4.1	4.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		බලන්න බලපෑම් දර්ශක 4.2	4.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
T ආකල්ප, විශ්වාසයන් සහ සම්මතයන් පරිවර්තනය කර ඇත	1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	බලන්න බලපෑම් දර්ශක 1.1	1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		බලන්න බලපෑම් දර්ශක 1.2	1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න

වගුව 4: RESPECT මූලෝපාය ප්‍රතිඵල, දර්ශක සහ මාර්ගෝපදේශ

සටහන: 4 වගුවෙහි R මූලෝපාය යටතෙහි වන ප්‍රතිඵල ප්‍රකාශනය R1, R2, R3 ලෙස ලේබල් කර තිබේ. ඒ සමග අනුකූල ලෙස දර්ශක ද ලේබල් කර තිබේ. උදා: R1 ප්‍රතිඵලය වෙනුවෙන් R1.1, R1.2 සහ R1.3. සෙසු ප්‍රතිඵල ප්‍රකාශන වෙනුවෙන් ද ඉක්මණින් එසේ කරනු ඇත. යොමුකිරීමේ පහසුව සඳහා මූලෝපාය හරහා මෙම ලේබල්කරණය නැවත නැවත භාවිතා කර තිබේ.

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
R සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	R1. සමාජභාවී සමානාත්මතාව සහ ගරුත්වය සමීප හා පවුල් සම්බන්ධතාවලදී භාවිතා කරනු ලැබේ.	R1.1. වයස අවුරුදු 15-49 අතර වර්මානයේදී සහකරුවකු සිටින කාන්තාවන් සහ ගැහැණු ළමයින් අතර (තනිව හෝ සාමූහිකව) පවුලේ තීරණ ගැනීමට සහභාගී වන අනුපාතය	මෙම ප්‍රතිඵල දර්ශකය INSPIRE හි 7.3 දර්ශකය සමග සම්බන්ධ වේ. එහෙත්, එය මිනුම් ස්වරූපයෙන් මඳක් වෙනස් වේ. INSPIRE විසින් තමන්ගේම සෞඛ්‍යය, නිවසේ වැදගත් මිලදීගැනීම් සිදුකිරීම හෝ පවුලේ මිතුරන් බලන්නට යාම සම්බන්ධ පවුලේ තීරණ ගැනීම සඳහා (තනිව හෝ සැමියා සමග සාමූහිකව) සහභාගී වීම කාන්තා සහභාගීත්වය ලෙස අර්ථකථනය කරනු ලැබේ. මෙහිදී, තීරණ ගැනීමෙහිලා කාන්තාවන් සහ ගැහැණු ළමයින් සහභාගී වීම (තනිව හෝ සැමියා සමග සාමූහිකව) මනිනු ලබන්නේ පවුලට සම්බන්ධ තීරණ වෙනුවෙන් පමණි. උදාහරණයක් ලෙස පවුල වෙනුවෙන් මිලදීගැනීම් සහ පවුලේ ආදායම වියදම් කිරීම එයට ඇතුළත් වේ. කාන්තාවන් තම ස්වාධීන ක්‍රියාවන් සම්බන්ධයෙන් තීරණ ගන්නා අනෙකුත් තීරණ ගැනීම් වර්ග සවිබලගැන්වීමේ මූලෝපාය යටතේ කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට ස්වාධීන තීරණ ගත හැකිය ප්‍රතිඵලය මගින් ග්‍රහණය කරගෙන තිබේ. දර්ශකය මැනීම DHS වෙතින් අනුරූප කරගත හැකිය. පවුලේ ප්‍රශ්න රැසක් සම්බන්ධයෙන් කාන්තාවන්ගේ තීරණ ගැනීම මනින ප්‍රශ්න මාලාවක් එහි අඩංගු වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්).

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
			R1.2. සමාජභාවී වශයෙන් සමාන අන්දමින් ගෘහ කටයුතුවල වගකීම බෙදාගන්නා බව වාර්තා කරන ගැහැණුන් හා පිරිමින් අනුපාතය	සමාජභාවී සමාන අන්දමින් පවුලේ භූමිකාවන් බෙදාගැනීම අර්ථ නිරූපණය කර තිබෙන්නේ ගෙදරදොර කටයුතුවලදී කාන්තාවන්ගේ හා පිරිමින්ගේ සහභාගීත්වය ලෙසයි. දරුවන් බලාගැනීම, ගෙදරදොර කටයුතු සහ වෙනත් පවුල් ගෘහ කටයුතු එයට අයත් වේ. උදාහරණයක් ලෙස, IMAGES සමීක්ෂණය තුළ පවුලේ ශ්‍රම විභජනය හා රැකබලාගැනීමේ කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ප්‍රශ්න අඩංගු වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්).
			R1.3. පසුගිය මාස 12 තුළදී සමීප සහකරුවකු වෙතින් පාලනය කරන චර්යාවකට මුහුණදුන් වයස අවු: 15 සහ එයට වැඩි ගැහැණුන් අනුපාතය	සමීප සහකරුවකුගේ පාලන චර්යාවන් වඩා දැඩි සමීප සහකරු ප්‍රචණ්ඩත්වයකට හේතු විය හැකි කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ස්වරූපයක් ලෙස පුළුල්ව හඳුනාගෙන තිබේ.සංචලනය සීමා කිරීම, යහළුවන් හෝ පවුල ඇසුරු කිරීම සීමාකිරීම සහ ඊර්ෂ්‍යාව හෝ අවිශ්වාසය ප්‍රකාශ කිරීම පාලන චර්යාවන් තුළ තිබිය හැකිය. කලත්‍රයකුගේ පාලන චර්යාවන්ට අදාළව වෛවාහක පාලනය මොඩියුලය හරහා යෝජිත DHS ක්‍රියාමාර්ගවලට පහත දැක්වෙන ආකාරයේ පාලනයන් සම්බන්ධ සමීක්ෂණ අයිතමයන් අයත් වේ. » ඇය වෙනත් පිරිමියකු සමග කතා කළහොත් ඊර්ෂ්‍යාව හෝ කෝපය » විශ්වාසය කඩකිරීම පිළිබඳ ඇයට නිරතුරු චෝදනා කිරීම » ඇයට ඇගේ මිතුරියන් හමුවීමට නොදීම » ඇයට ඇගේ පවුල සමග සම්බන්ධතා පැවැත්වීමට ඉඩ නොදීම » හැම විටම ඇය සිටින්නේ කොහිදැයි දැනගැනීමට අවශ්‍ය වීම » මුදල් සම්බන්ධයෙන් ඇය විශ්වාස නොකිරීම මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්).
		R2. පුද්ගලාන්තර ගැටුම් සාමකාමී ලෙස විසඳාගනු ලැබේ.	R2.1. තම ආසන්නම නොවකඟතා තුන ප්‍රචණ්ඩ නොවන ආකාරයෙන් විසඳාගත් බව ප්‍රකාශ කරන සෑම වයසකම පිරිමින් සහ ගැහැණුන් අනුපාතය	අහිංසාවාදී ගැටුම් විසඳීමේ මාර්ග තුළට ශාරීරික සහ චිත්තවේගී ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කිරීම සහ ධනාත්මක සන්නිවේදනය ඇතුළත් කරගැනීම ද අයත් වේ. එයට සාමකාමී සංවාදය, සහකම්පනය, සවන්දීම, කෝපය කළමනාකරනය කිරීම, සාකච්ඡාව, මැදිහත්වීම සහ සංහිඳියාව අයත් වේ. යුවල අතර අහිංසාවාදී ගැටුම් විසඳීම මිනිය හැකි අඩු හා මැදි ආදායම් රටවල භාවිතා කළ හැකි මෙවලම් පරාසයක්ම තිබේ. ගැටුම් උපාය පරිමාණ, යුවල ක්‍රියාත්මකභාවයේ තක්සේරු මෙවලමෙහි සන්නිවේදන උප පරිමාණල සන්නිවේදන රටා ප්‍රශ්නාවලියෙහි ධනාත්මක සන්නිවේදන උප පරිමාණය සහ පොදු සන්නිවේදන සහ ගැටුම් විසඳුම් පරිමාණයෙහි අන්‍යෝන්‍ය වශයෙන් ධනාත්මක සන්නිවේදනයට දායක වීම ඒ අතර වේ.

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
		R3. යුවල සහ පවුල් සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස විශ්වාස කරති. ඔවුහු තවදුරටත් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිනොගනිති.	R3.1. ස්වාමියකු (පුරුෂයකු) තම බිරිඳට (සහකාරියට) එක් අවස්ථාවකදී හෝ පහරදීම සාධාරණීකරනය කරන ජනයාගේ අනුපාතය ලිංගිකභාවය හා වයස අනුව වෙන් වෙන්ව	ප්‍රචණ්ඩත්වය ගැටුම් විසඳීමෙහි, කාන්තාවන් විනයගත කිරීමෙහි හෝ ගෞරවයට වූ හානිය නැති කරගැනීමෙහි යුක්ති සහගත ක්‍රමයක් ලෙස මිනිසුන් පිළිගන්නා විට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය භාරගන්නා හෝ සාධාරණීකරණය කරන ආකල්ප ඇතිවිය හැකිය. මෙම මූලෝපායේදී 'මිනිසුන්' යන්නෙන් සහකරුවන්/ සහකාරියන් සහ වෙනත් පවුල් සාමාජිකයන් අදහස් කරනු ලැබේ. මෙම දර්ශකය ජනගහන අධ්‍යයනවලදී භාවිතා කරනු ලබන WHO MCS සහ DHS වැනි සුලබ එකකි. එහි සාමාන්‍යයෙන් අවස්ථා පහක් ඉදිරිපත් කරනු ලැබේ. කාන්තාවක් තම සැමියාට නොපවසා නිවසින් බැහැරව යන්නේ නම්, ඇය ළමයින් නොතකාහරින්නේ නම්, ඇය තම සැමියා සමග වාද කරන්නේ නම්, ඇය සැමියා සමග ලිංගික ක්‍රියා ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ ඇය ආහාර පුළුස්සන්නේ නම් වශයෙනි. ඇතැම් අධ්‍යයන විසින් වෙනත් අවස්ථා ද අධ්‍යයනය කරනු ලැබේ. ඒ කාන්තාවක් ඇගේ සැමියාට හෝ සහකරුට අකීකරු වන්නේ නම් හෝ හිතෛෂී නොවන්නේ නම් ආදී වශයෙනි. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්).
			R3.2. සමාජභාවී වශයෙන් සමානාත්මතා අදහස් දරන ජනයාගේ අනුපාතය	කාන්තාවන්ගේ හා පිරිමින්ගේ අයිතිවාසිකම්, භූමිකාවන් සහ වගකීම් පිළිබඳ සාධාරණත්වය හා සමානාත්මතාව පිළිබඳ ආකල්ප සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප ලෙස සැලකේ. මෙම මූලෝපායේදී 'මිනිසුන්' යන්නෙන් සහකරුවන්/ සහකාරියන් සහ වෙනත් පවුල් සාමාජිකයන් අදහස් කරනු ලැබේ. සමාජභාවී වශයෙන් සාධාරණ මිනිසුන් (GEM) සම්බන්ධ පරිමාණය සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප මැනීම සඳහා ප්‍රයෝජනවත් මෙවලමකි. එය බහුවිධ රටවල සංදර්භයන් තුළ පිරිමින්ගේ හා කාන්තාවන්ගේ භූමිකාවන් සහ වගකීම් පිළිබඳ දැක්ම මැනීම සඳහා භාවිතා කර තිබේ.
E **කාන්තාවන් සවිබලගැන්වීම**	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත කාන්තාවෝ තම මානව හිමිකම් අභ්‍යාස කරමින් සංවර්ධනයට දායක වෙති	E1. සමීප, පවුල් හා ප්‍රජා සම්බන්ධතාවලදී සමාජභාවී සමානාත්මතාව සහ ගරුත්වය භාවිතා කරනු ලැබේ.	E1.1. පවුලේ තීරණ ගැනීමේදී (තනිව හෝ ඒකාබද්ධව) සහභාගී වන, වර්තමානයේදී සහකරුවන් සිටින වයස අවුරුදු 15-49 අතර කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ අනුපාතය	R1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
			E1.2. සමාජභාවී වශයෙන් සාධාරණ අන්දමින් පවුලේ කටයුතු බෙදාගන්නා භාවිතයක් ඇති බව වාර්තා කරන ගැහැණුන් හා පිරිමින් අනුපාතය	R1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
		E2. කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ස්වාධීන තීරණ ගත හැකිය.	E2.1. තමන්ගේ ජීවිත පිළිබඳ ස්වාධීන තීරණ ගත හැකි ගැහැණුන් සහ ගැහැණු ළමයින් අනුපාතය වයස අනුව වෙන්කර	ස්වාධීන තීරණ ගැනීම කාන්තාවන්ගේ නියෝජනයේ කොටසක් ලෙස සැලකේ. කාන්තාවන් සෞඛ්‍යාරක්ෂාව වෙත පිවිසීම, ප්‍රතිසන්ධිරෝධක භාවිතය සහ සංචලනය (පවුලේ අය සහ මිතුරියන් බලන්නට යාම) තම පෞද්ගලික ක්‍රියාකාරකම්වල තීරණ ගැනීම ද එයට අයත් වේ. ඒවා පවුලේ තීරණ ගැනීමෙන් වෙනස් වේ. පවුලේ තීරණගැනීම සම්බන්ධ DHS ප්‍රශ්න (බලන්න: සම්බන්ධතා මූලෝපාය යටතේ පවුලේ තීරණගැනීම සම්බන්ධ කාන්තාවන්ගේ සහභාගීත්වයේ වැඩිවීම පිළිබඳ ප්‍රතිඵල සඳහා මාර්ගෝපදේශ) සමග අනුරූප වීමෙන් මෙම දර්ශකය මැනිය හැකිය. අමතර ක්‍රියාමාර්ග ද භාවිතා කළ හැකිය. උදාහරණයක් ලෙස, කාන්තාවන් තම සංචලනය සම්බන්ධයෙන් ස්වාධීන තීරණ ගැනීම (උදා: ඔබගේ ගමේ වෙසෙන මිතුරියක/ පවුලේ සාමාජිකයකු බැලීමට පයින් හෝ පොදු ප්‍රවාහනයේ යාම සඳහා ඔබට අවසර තිබේද?) සැලකිය හැකිය.
			E2.2. නියෝජනයක් (agency) තිබෙන බව වාර්තා කරන ගැහැණුන් සහ ගැහැණු ළමයින් අනුපාතය	කාන්තාවන් සවිබලගැන්වීම සම්බන්ධ මෑතකාලීන කටයුතු මගින් යෝජනා කරන පරිදි තීරණ ගැනීම යනු කාන්තාවන්ගේ නියෝජනයේ අසම්පූර්ණ මිනුමකි. එම නියෝජනය සෘජුව මැනිය හැකිය. නියෝජනය යනු, ජීවිත අරමුණු සහ අභිමතාර්ථ අර්ථ නිරූපණය කිරීමට සහ ඒ අනුව කටයුතු කිරීමට කාන්තාවන්ට තිබෙන හැකියාව ලෙස අර්ථකථනය කළ හැකිය.28 කාන්තාවන්ගේ නියෝජනය මැනීම තුළ, අරමුණු සකසාගැනීම, හැකියාව සහ පාලනය පිළිබඳ දැක්ම (ඇතැම් විට ස්වයං හැකියාව ලෙස හඳුන්වනු ලැබේ), අරමුණු අනුව කටයුතු කිරීම ඇතුළු විවිධ මානයන් අඩංගු විය හැකිය.[28] මෙම මානයන් මැනීම සඳහා භාවිතා කරනු ලබන මෙවලම් සඳහා උදාහරණ ලෝක බැංකුව විසින් සම්පාදනය කරන ලද 'Measuring Women's Agency' මාර්ගෝපදේශයෙහි අඩංගු වේ.
		E3. කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනතාව වර්ධනය කරගෙන තිබේ.	E3.1. මූල්‍ය ස්වාධීනත්වය වර්ධනය කරගන්නා ලද බව වාර්තා කරන ගැහැණුන් අනුපාතය	ආදායම් සහ ආර්ථික සම්පත් වෙත කාන්තාවන්ගේ ප්‍රවේශය සවිබලගැන්වීම සම්බන්ධ වැදගත් මිනුමකි. එහෙත්, තමන් උපයන ආදායම හෝ අත්පත් කරගන්නා සම්පත් සහ ආර්ථික ක්‍රියාකාරකම් සහ සම්පත්වලින් වාසි ලබාගැනීමේ බලය කාන්තාවන් විසින්ම පාලනය නොකරන නිසා එය ප්‍රමාණවත් නැත. ආර්ථික සම්පත් අතරට කුසලතා (උදා: වෘත්තීය පුහුණුව), මූල්‍ය ප්‍රාග්ධනය (උදා: මෙවලම්, ඉඩම්) අයත් වේ. ආර්ථික ක්‍රියාකාරකම් සහ සම්පත්වලින් වාසි ලබාගැනීමේ බලය මගින් අදහස් කරනු ලබන්නේ කාන්තාවන්ට තීරණ ගැනීමේ සහ මූල්‍ය ප්‍රාග්ධනය භාවිතා කරන හා වැයකරන ආකාරය ගැන තීරණගැනීමේ හැකියාව තිබෙන බවයි. කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනත්වය සහ ආර්ථික සවිබලගැන්වීම මනිනු ලබන ප්‍රශ්න සහ දර්ශක සංවර්ධනය කරගැනීම පිළිබඳ වැඩිදුර මාර්ගෝපදේශ ICRW, Oxfam විසින් සම්පාදනය කරන ලද මාර්ගෝපදේශවල සහ මෙම මාර්ග සිතියමෙහි තිබේ.
		E4. කාන්තාවෝ පොදු සහ දේශපාලන ජීවිතයට සම්බන්ධ වෙති.	E4.1. පසුගිය මාස හය තුළදී මහජන රැස්වීමක් ඇමතූ ගැහැණුන් අනුපාතය	වැඩසටහනේ ස්වභාවය සහ දේශීය සංදර්භය අනුව මෙම දර්ශකය තවදුරටත් විධිමත් කළ යුතුය ඇතුළත් කළ යුතු මහජන රැස්වීම් වර්ග, කාලසීමාව (උදා: මාස හයක් වැනි) සහ වැඩසටහන් මට්ටම (සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් සඳහා) එමගින් නිශ්චය කළ යුතුය.

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
S **සේවා තහවුරු කර තිබේ**	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත නිවාසවල ප්‍රජාවේ සහ සමාජයේ වැඩිදියුණු කරන ලද සෞඛ්‍යය සහ සංවර්ධන ප්‍රතිඵල	S1. සෞඛ්‍යය, යුක්තිය, ආරක්ෂාව සහ සමාජ සේවා වෙතින් ආයතනික ප්‍රතිචාර වැඩිදියුණු කිරීම	S1.1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන්ට වැඩිදියුණු කරන ලද ප්‍රතිචාර දක්වන සේවා සම්පාදකයන් සංඛ්‍යාව	මිනුම් සඳහා වන මෙම දර්ශකය සහ ප්‍රවේශය දේශීය වැඩසටහන් සංදර්භයට සහ ඉලක්ක සේවා ආයතනවලට අනුව සකස් කරගත යුතුය. වැඩිදියුණු කරන ලද ආයතනික ප්‍රතිචාර මගින් අංශ රැසක් ආවරණය කරනු ලැබේ. ඒවා නම්, ප්‍රතිපත්ති සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම, සේවා ප්‍රතිචාර සඳහා පටිපාටි සහ ප්‍රොටොකෝල, සමාජභාවී පරිවර්තන ව්‍යුහයන් හෝ විෂයමාලා සංවර්ධනය කිරීම හා ඒවා සේවා කාර්ය මණ්ඩල පුහුණුවීම්වලට ඇතුළත් කිරීම හා පුහුණු පහසුකම් සැපයීම, පරිපූර්ණ යොමුකිරීම් පද්ධතියක් සංවර්ධනය කිරීම වේ. විවිධ සේවා අංශ සම්බන්ධ වැඩිදියුණු කරන ලද ආයතනික ප්‍රතිචාර සම්බන්ධයෙන් තිබිය හැකි උප දර්ශක පිළිබඳ ඇතැම් උදාහරණ Violence Against Women and Girls: A Compendium of Monitoring and Evaluation Indicators වෙතින් ලබාගත හැකිය.
		S2. සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස පිළිගෙන ප්‍රවර්ධනය කරන සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිනොගන්නා සේවා සම්පාදකයන් සහ ආයතන	S2.1. අඩු වශයෙන් එක් වතාවක් හෝ සැමියා (පිරිමි) විසින් බිරිඳට (සහකාරියට) පහර දීම සාධාරණ යයි එකඟ වන ජන අනුපාතය ලිංගිකභාවය සහ වයස අනුව වෙන්කර	R3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – මූලෝපායේ 'ජනයා' ලෙස හැඳින්වෙන්නේ සේවා සම්පාදකයාගේ කාර්ය මණ්ඩලයේ පුද්ගලයන් සේවාව අනුව වෙන්කර වේ.
			S2.2. සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප සහිත ජන අනුපාතය	R3.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – මූලෝපායේ 'ජනයා' ලෙස හැඳින්වෙන්නේ සේවා සම්පාදකයාගේ කාර්ය මණ්ඩලයේ පුද්ගලයන් සේවාව අනුව වෙන්කර වේ.
			S2.3. සමාජභාවී සමානාත්මතාව සම්බන්ධයෙන් වෙනම අභ්‍යන්තර ප්‍රතිපත්තියක් සේවා සම්පාදකයා සතුය	ආයතනයක සමාජභාවී සමානාත්මතාව කෙරෙහි කැපවීම මැනීමෙහි එක් ක්‍රමයක් වන්නේ, සමාජභාවය සම්බන්ධයෙන් එහි අභ්‍යන්තර ප්‍රතිපත්ති, පටිපාටි සහ භාවිතාවන් පරීක්ෂා කිරීමයි. මෙම දර්ශකය එක් සරල උදාහරණයකි. එහෙත්, කිසියම් ආයතනයක සමාජභාවී සමානාත්මතා ප්‍රතිපත්තියක අවම මූලිකාංග නිශ්චය කිරීම සඳහා එය වැඩිදුරටත් සංවර්ධනය කළ යුතුය. ආයතනයේ සමාජභාවී විගණනයක් හෝ ධාරිතා තක්සේරුවක් හෝ සිදුකිරීමෙන් හෝ ඇතැම් සමාජභාවී ඒකාබද්ධ කිරීම්/ මූලධාරාගත කිරීම් සම්බන්ධ පරීක්ෂා ලැයිස්තු සම්පාදනය කිරීමෙන් මෙම දර්ශකය ශක්තිමත් කළ හැකිය. උදාහරණ සඳහා එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ Gender Equality Capacity Assessment Tool ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ A Manual for Gender Audit Facilitators.
			S2.4. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වෙනම ක්‍රියාවලියක් සේවා සම්පාදකයා සතුය	සමාජභාවී වෙනස්කම් කිරීම් සම්බන්ධ අභ්‍යන්තර පැමිණිලි, ලිංගික හිංසනය සහ සමාජභාවී ප්‍රචණඩත්වය සම්බන්ධයෙන් සංවිධානයක් කටයුතු කරන ආකාරය එම සංවිධානය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට කැපවීම සම්බන්ධ මනා දර්ශකයකි. ආයතනයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තියක අවම මූලිකාංග නිශ්චිත කර දැක්වීම සඳහා මෙය හෝ මේ හා සමාන දර්ශකයක් භාවිතා කළ හැකිය. එසේම, වැඩිදුර සංවර්ධනය කරගත යුතුය.

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
		S3. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවාවන්ගේ ගුණාත්මකබව සහ ආරක්ෂාව	S3.1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවාවන්ගේ ගුණාත්මකබව සහ ආරක්ෂාව පිළිබඳ වැඩි තෘප්තිමත්භාවයක් වාර්තා කරන කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන් අනුපාතය	මෙම දර්ශකය දේශීය වැඩසටහන් සංදර්භයට අනුව අනුරූප කරගත යුතුය. සම්පාදනය කරනු ලබන සේවයේ ස්වභාවය සහ ඒ හා අනුගත ගුණාත්මකභාවය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රමිති එයට ඇතුළත්ය. උදාහරණයක් ලෙස, ගුණාත්මක සේවාවල තිබිය හැකි ප්‍රමිති මගින් ප්‍රවේශය, ලබාගැනීමේ හැකියාව, ලබාගැනීමට තිබීම, කාර්ය මණ්ඩල දැනුම, බේරුණු පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීම සහ දුෂ්කර තත්වයන් හසුරුවාගැනීමේ සංවේදීභාවය ආදිය ඉලක්ක කළ හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවාවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ඇතිවිය හැකි ප්‍රමිතිවලට පෞද්ගලිකත්වය, විශ්වසනීයත්වය සහ වැඩිදුර ප්‍රචණ්ඩත්වයේ අවදානම අවම කිරීම ඇතුළත් විය හැකිය. සේවා සම්බන්ධයෙන් බේරුණු පුද්ගලයන්ගේ තෘප්තිය මැනීමේ එක් ක්‍රමයක් වන්නේ, සේවාදායක තෘප්තිය හෝ පිටවීම සම්බන්ධ සමීක්ෂණයයි. එය සෞඛ්‍ය සේවා මැදිහත්වීම් සම්බන්ධයෙන් පුළුල්ව භාවිතා කරනු ලැබේ. සේවා සම්පාදනය ආශ්‍රිත විවිධ ප්‍රමිති හෝ අත්දැකීම් සඳහා වන විශේෂිත සමීක්ෂණ අංග එයට අයත් වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට අදාළ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවාලාභී පිටවීමේ සමීක්ෂණයක් සඳහා උදාහරණයක් පහත සබැඳියෙහි දැක්වේ: Improving the Health Sector response to Gender based Violence: A Resource Manual for Health Acre Professionals in Developing Countries.
		S4. බේරුණු පුද්ගලයන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවා ලබාගැනීම වර්ධනය වීම	S4.1. කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සේවා භාවිතා කරන බේරුණු පුද්ගලයන්ගේ අනුපාතය	මෙම දර්ශකය මගින් ප්‍රචණ්ඩත්වය අත්දැක තිබෙන කාන්තාවන් විසින් හිල වශයෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවා භාවිතා කිරීම මනිනු ලැබේ. බේරුණු පුද්ගලයන්ගේ උපකාර සෙවීමේ චර්යාවන්ට අදාළ ප්‍රශ්න WHO MCS හි අඩංගු වේ. නොනිල ක්‍රියාකරුවන් සහ ජාලයන් හමුවේ පළකරනු ලබන චර්යාවන් ද එයට අයත් වේ (උදා: මිතුරන්, පවුල, අසල්වැසියන්, ප්‍රජාව හෝ ආගමික නායකයන්). පසුගිය මාස 12 තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අත්දැකීම් ලැබූ බව වාර්තා කරන කාන්තාවන්ගෙන් මෙම ප්‍රශ්න අසනු ලැබේ.
P **දිළිඳුකම අවම කර ඇත**	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත නිවාසවල ප්‍රජාවේ සහ සමාජයේ වැඩිදියුණු කරන ලද සෞඛ්‍යය සහ සංවර්ධන ප්‍රතිඵල	P1. පවුල් දරිද්‍රතාව සහ ආර්ථික පීඩනය අවම කර තිබේ.	P1.1. ආහාර අනාරක්ෂිතභාවය වාර්තා කරන ගැහැණුන් හා පිරිමින් අනුපාතය ලිංගිකත්වය අනුව වෙන්කර	පවුලේ ආහාර අනාරක්ෂිතභාවය පවුල් දරිද්‍රතාව මැනීම සඳහා සුලබව භාවිතා කරනු ලැබේ. එය අධ්‍යයන ගණනාවකම හමුවී තිබේ. එය කාන්තාවන්ගේ සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම සහ පිරිමින්ගේ සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම සමග ශක්තිමත් ලෙස සම්බන්ධ වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී) නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: ඍජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). ආහාර අනාරක්ෂිතභාවය මනිනු ලබන මෙවලම් අතරට පහත දැක්වෙන අංග ඇතුළත් වේ: ආහාර අනාරක්ෂිතභාවයේ පරිමාණය සහ පවුලේ ආහාර අනාරක්ෂිතභාවය සම්බන්ධ ප්‍රවේශයේ පරිමාණය.
			P1.2. සමස්ත ගෘහස්ථ පරිභෝජනය	පාරිභෝජනය පවුල් දරිද්‍රතාවේ වැදගත් මිනුමකි. ආහාර, නිවාස, බලශක්ති/ ඉන්ධන, ගෘහ උපකරණ, ප්‍රවාහනය, අධ්‍යාපනය සහ වෙනත් භාණ්ඩ හා සේවා එයට අයත් වේ. දත්ත මූලාශ්‍ර සහ ඒ හා සම්බන්ධ මෙවලම් ද ජාතික ආදායම් වියදම් සමීක්ෂණයෙන් ලබාගත හැකිය. වැඩිදුර මාර්ගෝපදේශ Evidence Consortium on Women's Groups (ECWG) Guide for Measuring Women's Empowerment and Economic Outcomes in Impact Evaluations of Women's Groups වෙතින් ලබාගත හැකිය.
			P1.3. ආතතිය අත්දැක තිබෙන බව වාර්තා කරන ගැහැණුන් හා පිරිමින් අනුපාතය	ආතතිය දුර්වල මානසික සෞඛ්‍යයේ හා චිත්තවේගී යහපැවැත්වේ නිර්ණායකයකි. දිළිඳුකම සහ ආතතිය අතර සම්බන්ධය සහ ආතතිය සහ ප්‍රචණ්ඩත්වයේ වැරදිකාරීත්වය අතර සම්බන්ධය ලේඛනගත වී තිබේ. මෙම දර්ශකය මගින් කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ පොදු ආතතිය සම්බන්ධයෙන් ස්වයංව වාර්තා කරන ලද අත්දැකීම් මනිනු ලැබේ. ආතතිය මැනීම සඳහා පුළුල්ව භාවිතා කරන මෙවලමක් වන්නේ Perceived Stress Scale (PSS - අනුමාන ආතති පරිමාණය) වේ. එය බහුවිධ රාජ්‍ය සංදර්භයන්හිදී භාවිතා කර තිබේ. එය පුද්ගලයන් තම ජීවිතයේ වත්මන් තත්වය කෙතරම් ආතතික ලෙස සලකන්නේද යන්න ගැන මිනුමකි.

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
		P2. කාන්තාවන් ආර්ථික සුරක්ෂිතභාවය වර්ධනය කරගෙන ඇත	P2.1. ආර්ථික සුරක්ෂිතභාවය වාර්තා කරන ගැහැණුන් අනුපාතය	ආර්ථික ආරක්ෂාව මූලික අවශ්‍යතා සහ ස්ථාවර ආදායම් හෝ වියදම් සඳහා ප්‍රවේශය ලෙස අර්ථ නිරූපණය කළ හැකිය. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය උදා: භූගෝලීය ප්‍රදේශයකදී) නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). ආර්ථික ආරක්ෂාව සහ සවිබලගැන්වීම මනින මෙවලම් එකතුවක් අබ්දුල් ලතීෆ් ජමීල් විසින් සම්පාදනය කරන ලද Poverty Action Lab (J-PAL) ලේඛනයෙහි, A Practical Guide to Measuring Women's and Girls' Empowerment in Impact Evaluations හි අඩංගු වේ. කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම මැනීමේ වැඩිදුර මාර්ගෝපදේශ Women's Economic Empowerment: A Roadmap වෙබ්අඩවියෙහි තිබේ.
		P3. කාන්තාවන් මූල්‍ය සුරක්ෂිතභාවය වර්ධනය කරගෙන ඇත	P3.1. වැඩිවූ මූල්‍ය ස්වාධීනත්වය වාර්තා කරන ගැහැණුන් අනුපාතය	බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ E3.1 බලන්න
E **පරිසරය සුරක්ෂිත කරනු ලැබේ.**	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරලා තිබේ	EN1. පාසල්, සේවා ස්ථාන, වෙනත් ආයතන සහ පොදු අවකාශ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට සුරක්ෂිත වේ.	EN1.1. පාසලේදී, සේවා ස්ථානයේදී සහ පොදු ස්ථානවලදී ආරක්ෂිත බව වාර්තා කරන ගැහැණුන් සහ ගැහැණු ළමයින් අනුපාතය ලිංගිකභාවයසහ වයස අනුව වෙන්කර	බහුවිධ සංදර්භයන්හිදී කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට ආරක්ෂාව දැනීම මෙම දර්ශකය විසින් මනිනු ලැබේ. එයට පාසල් සහ වෙනත් අධ්‍යාපන පරිශ්‍රයන් ද, සේවා ස්ථාන සහ පොදු අවකාශයන් ද අයත් වේ. ආරක්ෂා වීම යන්නෙන් අදහස් කරනු ලබන්නේ ප්‍රචණ්ඩත්වය, හිංසනය හෝ සූරාකෑම සම්බන්ධ අවදානමක් අත්දැකීමට නොලැබීමයි. මෙම දර්ශකය සඳහා මිනුම් පසුබිම අනුව වෙනස් වේ. Global school-based student health survey (GSHS - ගෝලීය පාසල් පාදක සෞඛ්‍ය සමීක්ෂණය) තුළ පාසල් යන අතරමගදී ආරක්ෂාව පිළිබඳ සිසුන්ගේ අවබෝධය මනින අංග අඩංගු වේ. ගෙදරදී, ප්‍රජාවේදී සහ පාසලේදී ඇතුළු විවිධ පරිසරයන්හිදී ආරක්ෂාව සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ළමයින්ගේ හා තරුණ පුද්ගලයන්ගේ දැක්ම හා අත්දැකීම් මනින පරිපූර්ණ අංග කට්ටලයක් VACS හි අඩංගු වේ.
		EN2. ප්‍රජාවන් සහ ආයතන සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස පිළිගනියි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තවදුරටත් පිළිග න්නේ නැත.	EN2.1. ස්වාමියකු (පුරුෂයකු) තම බිරිඳට (සහකාරියට) එක් අවස්ථාවකදී හෝ පහරදීම සාධාරණීකරනය කරන ජනයාගේ අනුපාතය ලිංගිකභාවය හා වයස අනුව වෙන් වෙන්ව	R3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – EN මූලෝපායෙහි 'ජනයා' යනුවෙන් හැඳින්වෙන්නේ ප්‍රජා සාමාජිකයන්, ගුරුවරුන්, සේවාස්ථානයේ සමානයන් කළමනාකරුවන් සහ රාජකාරි වගකීම් දරන්නන්
			EN2.2. සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප සහිත ජන අනුපාතය	R3.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – EN මූලෝපායෙහි 'ජනයා' යනුවෙන් හැඳින්වෙන්නේ ප්‍රජා සාමාජිකයන්, ගුරුවරුන්, සේවාස්ථානයේ සමානයන් කළමනාකරුවන් සහ රාජකාරි වගකීම් දරන්නන්
			EN2.3. ආයතනය තම ප්‍රතිපත්ති සමාජභාවී සමානාත්මතාව වෙනුවෙන් කැපකර තිබේ.	S2.3 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
			EN2.4. අභ්‍යන්තර කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැමිණිලි පාලනය සඳහා කැපවුණ ප්‍රතිපත්තියක් ආයතනයෙහි තිබේ.	S2.4 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		EN3. ප්‍රජාවන් තුළ සහ ඉන් ඔබ්බෙහි කාන්තාවන්ගේ වැඩිවුණ නිදහස් සංචලනය	EN3.1. පසුගිය මාසය තුළදී a) තම ප්‍රජාව තුළ කොහේ හෝ යාමට b) තම ප්‍රජාවෙන් පිටත කොහේ හෝ යාමට කාන්තාවන් තම නිවෙස්වලින් පිටත ගිය සාමාන්‍ය වාර ගණන.	කාන්තාවන්ගේ වර්ධනය වූ සංචලනය මගින් සවිබලගැන්වීම නිරූපණය කර සවිබලගැන්වීම වර්ධනය කළ හැකිය. එහෙත්, කාන්තාවන් හට තම පරිසරයට පිවිසීම සඳහා විශ්වාසය හා සුරක්ෂිතබව හැඟෙන බව ද නිරූපණය කළ හැකිය. මෙම දර්ශකය පසුගිය මාසය තුළ තම ප්‍රජාව තුළ සහ ඉන් පිටත කාන්තාවන්ගේ සංචලනය මනියි. එය ඔවුන් පරිසරය භාවිතා කිරීම සම්බන්ධයෙන් වැදගත් මිනුමකි. එය පොදු අවකාශය තුළ චලනය වීමේදී කාන්තාවන්ට සුරක්ෂිතබව හැඟෙන බව තහවුරු කිරීම සඳහා EN1.1 දර්ශකය සමග විශ්ලේෂණය කළ යුතුය. පසුගිය මාසය තුළ කාන්තාවන් කීවරක් තම ප්‍රජාවෙන් පිටත ගියාද, එසේ ගියේ තනිවද වෙනත් අයෙකු සමගද යන්න ඇතුළු අතිරේක ප්‍රශ්න ඇසිය හැකිය.
C **ළමා සහ නව යොවුන් අපයෝජන වළක්වාඇත**	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරලා තිබේ	C1. මව්පියන් සහ භාරකරුවන් ධනාත්මක මාපිය භාවිතාවන් ශක්තිමත් කරයි. වඩා ආදරණීය සහ උපකාරශීලී ලෙස මව්පියන් හා දරුවන් අතර සම්බන්ධතා පවත්වයි.	C1.1. පසුගිය මාසය තුළදී කිසියම් ප්‍රචණ්ඩ නොවන ක්‍රමයක් මගින් භාරකරුවකු විසින් විනයගත කරනු ලැබීමේ අත්දැකීම ලද වයස අවුරුදු 1 - 17 අතර ගැහැණු හා පිරිමි ළමයින් අනුපාතය ලිංගිකභාවයසහ වයස අනුව වෙන්කර	මෙම ප්‍රතිඵල ප්‍රකාශය තිරසර සංවර්ධන අරමුණු දර්ශක 16.2.1 සමග සහ INSPIREහි 6 ප්‍රතිඵලය සම්බන්ධ වේ. එහි අංශ තුනක් තිබේ: එනම්, භාරකරුවන් විසින් ධනාත්මක ලෙස විනයගත කිරීම, ළමයින් හා මව්පියන් අතර ධනාත්මක සම්බන්ධතා සහ මව්පිය/ භාරකාර අධීක්ෂණය. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී) නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). මෙම දර්ශකය සඳහා භාවිතා කළ හැකි වැඩිදුර මෙවලම් INSPIRE Indicator Guidance and Results Framework වෙතින් ලබාගත හැකිය. MICS වෙතින් ලබාගත් ඒවා ඇතුළු ආදර්ශ ප්‍රශ්න එහි තිබේ.
		C2. සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස ප්‍රවර්ධනය කරන සහ කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තවදුරටත් විශ්වාස නොකරන පවුල්, ප්‍රජාවන් සහ ආයතන	C2.1. අඩු වශයෙන් එක් වතාවක් හෝ සැමියා (පිරිමි) විසින් බිරිඳට (සහකාරියට) පහර දීම සාධාරණ යයි එකඟ වන ජන අනුපාතය ලිංගිකභාවය සහ වයස අනුව වෙන්කර	R3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – C මූලෝපායෙහි 'ජනයා' යන්නෙන් අදහස් කරනු ලබන්නේ පවුල් සාමාජිකයන්, ප්‍රජාවේ සාමාජිකයන්, ගුරුවරුන් සහ වගකීම් දරන්නන්ය.

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
			C2.2. සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප දරණ ජන අනුපාතය	R3.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – C මූලෝපායෙහි 'ජනයා' යන්නෙන් අදහස් කරනු ලබන්නේ පවුල් සාමාජිකයන්, ප්‍රජාවේ සාමාජිකයන්, ගුරුවරුන් සහ වගකීම් දරන්නන්ය.
			C2.3. සමාජභාවී සමානාත්මතාව සම්බන්ධයෙන් ඇපකැප වූ අභ්‍යන්තර ප්‍රතිපත්තියක් පාසල්වල තිබේ.	S2.3 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
			C2.4. අභ්‍යන්තරිකව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කැපවූ ක්‍රියාවලියක් පාසලේ තිබේ.	S2.4 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
		C3. ගැහැණු හා පිරිමි ළමයින්ට සමාන අවස්ථා ලබාදී තිබේ.	C3.1. පිරිමි සහ ගැහැණු ළමයින්ට සමාන අවස්ථා ලබාදුන් බව වාර්තා කරන මව්පියන් අනුපාතය ලිංගිකත්වය අනුව වෙන්කර	මව්පියන් විසින් කාන්තාවන් සහ පිරිමි ළමයින් හට සමාන අවස්ථා සැපයීම තුළ අධ්‍යාපනයේ හෝ ආරක්ෂිත, සාධාරණ ලෙස වැටුප් ගෙවන රැකියා, වැඩිහිටියකු ලෙස විවාහට තෝරාගැනීමේ අයිතිය, ගෘහස්ථ වගකීම් බෙදාගැනීමේදී සහ නිදහස් සංචලනයේදී සමාජභාවී සමානාත්මතාව අයත් විය හැකිය. නිර්ණායකය මැනීම දේශීය වැඩසටහන් සංදර්භයට අනුකූල කරගත යුතුය. මැදිහත්වීම මගින් ආමන්ත්‍රණය කිරීමට බලාපොරොත්තු වන අවස්ථා වර්ග එයට ඇතුළත්ය.
		C4. සමාජභාවී සමානාත්මතාව සහ ගරුත්වය පාසල්වල, ඉගෙනුම් හා සම වයස් පරිසරවල භාවිතා කර තිබේ.	C4.1. සමාජභාවී සමානාත්මතාව සහ ගෞරවනීය සම්බන්ධතා නිරූපණය කරන පාසල්, ඉගෙනුම් හා සම වයස් පරිසරයන් සංඛ්‍යාව	වැඩසටහන් සංදර්භය සහ ඉලක්ක කණ්ඩායම් අනුව මෙම ප්‍රතිඵලය සඳහා වන දර්ශකය වඩා නිශ්චිත කළ යුතුය. උදාහරණයක් ලෙස, පාසල් සහ ඉගෙනුම් පරිසරයන් විසින් සමාජභාවී සමානාත්මතාව ප්‍රදර්ශනය කිරීම තුළට ගුරුවරුන් ගැහැණු හා පිරිමි ළමයින්ට පන්ති කාමරය තුළදී සමාන අන්දමින් සැලකීම අයත් වේ. වටිනාකම්, සම්මානනය සම්බන්ධ ආදර්ශ නිර්මාණය කිරීම සහ අනෙක් අයගේ හිමිකම් සැලකිල්ලට ගැනීම ගෞරවනීය සම්බන්ධකම්වලට අයත් වේ.
		C5. පාසල් හා පොදු ස්ථාන ගැහැණු හා පිරිමි ළමයින්ට ආරක්ෂිත වේ.	C5.1. ආරක්ෂිත බව වාර්තා කරන ගැහැණු සහ පිරිමි ළමයින් අනුපාතය	මෙම දර්ශක INSPIRE outcome indicator 9.2 සමග සම්බන්ධ වේ. පාසලේදී හෝ පාසලට යද්දී සහ එද්දී ළමයින්ගේ ආරක්ෂාව කෙරෙහි අවධානය යොමුකරන මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී) නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්).
			ලිංගිකභාවය සහ වයස අනුව වෙන්කර	ගෝලීය පාසල් පාදක ශිෂ්‍ය සෞඛ්‍ය සමීක්ෂණයෙහි (GSHS) පාසලේදී හා පාසල් යන එන මගදී ආරක්ෂාව පිළිබඳ සිසුන්ගේ දැක්ම අඩංගු වේ. නිවස, ප්‍රජාව සහ පාසල ඇතුළු විවිධ පසුබිම්වලදී ආරක්ෂාව පිළිබඳ සිසුන්ගේ දැක්ම මනින පරිපූර්ණ ප්‍රශ්න කට්ටලයක් VACS හි ද අඩංගු වේ.

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
		C6. අධ්‍යාපනඥයෝ විනය ඇතිකිරීම සඳහා ධනාත්මක, අහිංසාවාදී ස්වරූප අනුගමනය කරති.	C6.1. අවසාන අවස්ථා තුනෙහිදී විනය ඇතිකිරීම සඳහා විකල්ප, අහිංසාවාදී ස්වරූප අනුගමනය කරන අධ්‍යාපනඥයන් අනුපාතය	පාසල් තුළ හෝ වෙනත් ඉගෙනුම් පරිසරයන් තුළ සිටින ගුරුවරුන් සහ වෙනත් අධ්‍යාපනික කාර්යමණ්ඩල අධ්‍යාපනඥයන් අතරට අයත් වේ. තරුණ සමාජ, ප්‍රජා මධ්‍යස්ථාන හෝ ළමයින් සහ තරුණ පුද්ගලයන් ඉගෙනුමට සහභාගී වන වෙනත් අවකාශයන් (ඔවුන් පාසලට බැඳී හෝ පාසලෙන් පිටත) ද මෙයට අයත් වේ. අහිංසාවාදී විනයගත කිරීමේ ස්වරූපවලට ශාරීරික සහ මානසික දඬුවම්වලට විරුද්ධ වීම සහ විකල්ප විනයගත කිරීමේ ක්‍රම භාවිතා කිරීම අයත් වේ. වැඩිපුර ගෙදර වැඩ සහ අධ්‍යාපනික වැඩ පැවරීම, පන්තියෙන්/ කණ්ඩායමෙන් සමාවගන්නැයි ළමයාට කීම, ළමයාගේ දුර්වල චර්යාව ගැන සාකච්ඡා කිරීමට මව්පියන්ට පාසලට එන්නැයි කීම ආදිය එවැනි විකල්ප ක්‍රම වේ. ළමයකු විනයගත කළ අවසන් අවස්ථා තුනෙහිදී අනුගමනය කළේ කුමන ක්‍රමයදැයි අධ්‍යාපනඥයන්ගෙන් ඇසීමෙන් මෙම දර්ශකය මැනිය හැකිය. එහිදී ප්‍රචණ්ඩ සහ ප්‍රචණ්ඩ නොවන ක්‍රමවල බහුවිධ තෝරාගැනීම් සිදුකළ හැකිය.
T **ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් පරිවර්තනය කිරීම**	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත	T1. පවුල්, ප්‍රජාවන් සහ ආයතන සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස ප්‍රවර්ධනය කිරීම විශ්වාස කරති. තවදුරටත් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිනොගනිති.	T1.1. අඩු වශයෙන් එක් වතාවක් හෝ සැමියා (පිරිමි) විසින් බිරිඳට (සහකාරියට) පහර දීම සාධාරණ යයි එකඟ වන ජන අනුපාතය ලිංගිකභාවයසහ වයස අනුව වෙන්කර	R3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – T මූලෝපායෙහි 'ජනයා' යනුවෙන් හැඳින්වෙන්නේ පවුලේ, ප්‍රජාවේ සාමාජිකයන් සහ රාජකාරි වගකීම් දරන්නන්ය.
			T1.2. සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප සහිත ජන අනුපාතය	R3.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – T මූලෝපායෙහි 'ජනයා' යනුවෙන් හැඳින්වෙන්නේ පවුලේ, ප්‍රජාවේ සාමාජිකයන් සහ රාජකාරි වගකීම් දරන්නන්ය.
			T1.3. කාන්තාවක හෝ පිරිමියකු X ආකාරයෙන් කටයුතු කළහොත් ප්‍රජාවේ අනෙක් අය X ආකාරයෙන් ප්‍රතිචාර දක්වනු ඇතැයි විශ්වාස කරන අනුපාතය	සමාජ සම්මතයන් යනු ජනගහනය විසින් හෝ කණ්ඩායම් විසින් බෙදාහදාගනු ලබන චර්යා නීති වේ. වෙනත් අය කරන්නේ කුමක්ද යන්න සහ යමෙකු අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න පිළිබඳ විශ්වාසයන් එයට අයත් වේ. සමාජ සම්මතයන් තේරුම්ගැනීම සඳහා නිශ්චිත සමාජ සම්මතයන් යනු මොනවාද, එම සම්මතයන් වෙනුවෙන් අදාළ වන කණ්ඩායම් මොනවාද, පුද්ගලයන්ගේ චර්යාවන් වෙනස්කිරීම වළක්වන ධනාත්මක හා සෘණාත්මක සමාජ සම්බාධක යනු මොනවාද, චර්යාත්මක වෙනස්කම්වලට ව්‍යතිරේඛ තිබේද (උදා: සමාජ සම්මතයක් බිඳීම පිළිගත හැකි අවස්ථාවක්) යනාදිය පිළිබඳ විශ්ලේෂණාත්මක ප්‍රවේශයක් විය යුතුය. එවැනි විශ්ලේෂණයක් මෙහෙයවීම සඳහා සමාජ සම්මතයක මෙවැනි එකිනෙකට වෙනස් අංග (එනම්, යොමුකිරීම් කණ්ඩායම්, සම්බාධක, ව්‍යතිරේඛ) මැනීම අවශ්‍යය. ඒ සඳහා බහුවිධ දර්ශක අවශ්‍යය. මෙම දර්ශකය යනු සමාජ සම්බාධක සහ ප්‍රජාවක වෙනත් අය නිශ්චිත චර්යාවකට ප්‍රතිචාර දක්වන්නේ කෙසේදැයි මැනීම සඳහා භාවිතා කරනු ලබන උදාහරණයකි. චර්යාවන් සහ ප්‍රතිචාර වැඩසටහන් සංදර්භය සහ අපේක්ෂිත වෙනස අනුව හැඩගස්වාගත යුතුය. උදාහරණයක් ලෙස, වැඩසටහන් අරමුණක් වන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සෙසු අය අත නොපෙවිය යුතු පවුලේ කාරණයක් වීම ආශ්‍රිත සමාජ සම්මතයන් වෙනස් කිරීම නම්, යෝග්‍ය දර්ශකයක් වන්නේ, පිරිමියකු සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ යෙදෙන අවස්ථාවකදී ප්‍රජාවේ සෙසු අය මැදිහත්විය යුතුය යයි සිතනජන අනුපාතයයි. සමාජ සම්මතයන් විශ්ලේෂණය කිරීම සඳහා භාවිතා කළ හැකි මෙවලම් රැසක් තිබේ. CAREහි සමාජ සම්මත විශ්ලේෂණ මූලෝපාය එවැනි ඒවා වේ. මේවා සහ සමාජ සම්මතයන් මැනීමේ වෙනත් මූලාශ්‍ර පහත දැක්වෙන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය: Advancing Learning and Innovation on Gender Norms (ALIGN)

මූලෝපාය	බලපෑම	ප්‍රතිඵල	දර්ශක	මාර්ගෝපදේශ
		T2. සමාජභාවී සමානාත්මතාව සහ ගරුත්වය සමීප පවුල් සහ ප්‍රජා සම්බන්ධතා තුළ භාවිතා කරනු ලැබේ.	T2.1. පවුලේ තීරණගැනීමට සහභාගී වන (තනිව හෝ ඒකාබද්ධව) වයස අවුරුදු 15 - 49 අතර වර්තමානයේදී සහකාරියන් වී සිටින කාන්තාවන්ගේ අනුපාතය	R1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
			T2.2. සමාජභාවී වශයෙන් සාධාරණ අන්දමින් ගෘහ කටයුතු බෙදාගන්නා බව වාර්තා කරනගැහැණුන් සහ පිරිමින් අනුපාතය	R1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න
			T2.3. වෙනත් ප්‍රජාවන්ගේ සාමාජිකයන් වැදගත් කරුණු සම්බන්ධයෙන් තම අදහස් විමසා ඇති බව පවසන ගැහැණුන් අනුපාතය	මෙම දර්ශකය විසින් ප්‍රජා තීරණවලදී කාන්තා සහභාගීත්වය මනිනු ලැබේ. එමගින් කාන්තාවන්ගේ වටිනාකම, ඔවුන්ගේ මතයන් සහ ප්‍රජා කාරණාවලදී ඔවුන්ගේ සහභාගීත්වය සම්බන්ධ සමාජ සම්මතයන්ගේ වෙනස්කම් නිරූපණය කළ හැකිය. ප්‍රජාවේ සාමාජිකයන් ඔවුන්ගේ අදහස් විමසා තිබේදැයි සමීක්ෂණ ප්‍රශ්නයක් ඇසිය හැකිය. එසේ විමසනු ලැබුවේ කුමන කාරණා සම්බන්ධයෙන් කුමන අදහස්ද යන්න පිළිබඳ ඉන් පසු ප්‍රශ්න ඇසිය හැකිය.

පසු සටහන

[1] මූලාශ්‍රවලට පහත දැක්වෙන ඒවා අයත් වේ: Programming Essentials, Monitoring & Evaluation. UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls; DFID (2012) How to Note: Guidance on Monitoring and Evaluation for Programming on Violence against Women and Girls. CHASE Guidance Note Series; Programming Essentials, Monitoring & Evaluation; USAID (2014) Toolkit for Monitoring and Evaluating Gender-Based Violence Interventions Along the Relief to Development Continuum. United States Agency for International Development.

[2] Programming Essentials, Monitoring & Evaluation. UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls; Ellsberg, M. & Heise, L. (2005) Researching Violence Against Women: A Practical Guide for Researchers and Activists. World Health Organization, PATH; Global Women's Institute (2019) Participatory Monitoring and Evaluation (M&E) of Gender Based Violence Programs. SVRI Pre-Conference Workshop October 2019, The Global Women's Institute, The George Washington University; DFID (2012) How to Note: Guidance on Monitoring and Evaluation for Programming on Violence against Women and Girls. CHASE Guidance Note Series.

[3] අමතර මාර්ගෝපදේශනය සඳහා බලන්න: Global Women's Institute (2019) Participatory Monitoring and Evaluation (M&E) of Gender Based Violence Programs. SVRI Pre-Conference Workshop October 2019, The Global Women's Institute, George Washington University.

[4] García-Moreno, C., Jansen, HAFM., Ellsberg, M., Heise, L. & Watts, C. (2005) WHO multi-country study on women's health and domestic violence against women: initial results on prevalence, health outcomes and women's responses. Geneva: World Health Organization.

[5] https://dhsprogram.com/pubs/pdf/DHSQMP/DHS6_Module_Domestic_Violence_6Aug2014_DHSQMP.pdf

[6] https://mics.unicef.org/

[7] https://promundoglobal.org/programs/international-men-and-gender-equality-survey-images/

[8] Fulu, E., Jewkes, R., Roselli, T., García-Moreno, C. (2013) Prevalence of and factors associated with male perpetration of intimate partner violence: findings from the UN Multi-country Cross-sectional Study on Men and Violence in Asia and the Pacific. Lancet Global Health, 1(4): e208-e218.

[9] https://www.cdc.gov/violenceprevention/childabuseandneglect/vacs/index.html

[10] ආබාධිතභාවය මැනීම සඳහා බොහෝවිට Washington Group Short Set of Disability ප්‍රශ්න භාවිතා කරනු ලැබේ. එය ජනගහන සමීක්ෂණයන්හිදී භාවිතා කළ හැකි ප්‍රායෝගික ප්‍රශ්න හයක කට්ටලයකි. මෙම කෙටි ප්‍රශ්න කට්ටලය භාවිතා කිරීමේ යම් සීමා තිබිය හැකිය. එමගින් සියලු ප්‍රායෝගික දුෂ්කරතා මැනිය නොහැකි වනු ඇත. ආබාධිතභාවය සම්බන්ධ වඩා පරිපූර්ණ දත්ත අවශ්‍ය නම්, Washington Group Extended Set on Functioning (WG ES-F) භාවිතා කළ හැකිය. UNICEF සමග එක්ව Washington Group විසින් Child Functioning Question Set නිර්මාණය කර තිබේ. එය වයස අවුරුදු 2-17 ළමයින් සඳහා භාවිතා කළ හැකිය.

[11] සමාජභාවී ආකල්ප මැනීම සඳහා භාවිතා කළ හැකි මෙවලම් පරාසයක්ම තිබේ. IMAGES ඇතුළු සමීක්ෂණ කීපයක් සකස් කරගෙන තිබෙන්නේ Gender Equitable Mens (GEM) Scale ඇසුරෙනි. Gender Equity Scale ද විවිධ පසුබිම්වලදී භාවිතා කරනු ලැබේ. විවිධ තත්වයන් පහකදී බිරිඳට පහරදීම නිවැරදි යයි සැලකීම DHS මිනුම් මගින් මනිනු ලැබේ. එයට බිරිඳ ආහාර පිළිස්සීම, සැමියා සමග වාද කිරීම, සැමියාට නොකියා පිටත යාම, ළමයින් නොතකාහැරීම සහ සැමියා සමග ලිංගික සංසර්ගයට අකැමැති වීම ඇතුළත් වේ. මෙම DHS මෙවලම විවිධ අධ්‍යයනයන්හිදී අමතර අවස්ථා මැනීම සඳහා සකස් කරගෙන තිබේ. උදාහරණයක් ලෙස, බිරිඳක සැමියාට හිතවත් නොවේ නම්, එය මෙමගින් මැනිය හැකිය.

[12] උදාහරණයක් ලෙස, DHS Domestic Violence Module හි බේරුණු, උපකාර පතන පුද්ගලයන්ගේ උපකාර අපේක්ෂා කරන චර්යාවන් අධ්‍යයනය කරයි. ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් පසු ඔවුන් උපකාර පතන්නේ කාගෙන්ද යන කරුණ ද එහි ඇතුළත් වේ. මෙම ප්‍රශ්න සංස්කෘතික පසුබිම අනුව සකස් කරගත හැකිය.

[13] මත්පැන් භාවිතය, අපයෝජනය සහ යැපුම් ස්වභාවය මැනීම සඳහා භාවිතා කරනු ලබන මෙවලමක් පහත දැක්වේ: Alcohol Use Disorders Identification Test (AUDIT) - පහළ සහ මැද මට්ටමේ ආදායම් සහිත රටවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අධ්‍යයන ද එයට ඇතුළත් වේ.

[14] විෂාධයෙහි සහ කාංසාව සහ පශ්චාත් ක්ලමථ ආතති ආබාධය (PTSD) ඇතුළු වෙනත් මානසික රෝගයන්ගේ රෝග ලක්ෂණ මැනීම සඳහා විවිධ මෙවලම් රැසක් තිබේ. වැඩිහිටියන් අතර විෂාධය මැනීමේ පොදු මිනුමක් වන්නේ සංශෝධිත Center for Epidemiologic Studies Depression Scale (CESD- R) ය. එය පරිසරයන් ගණනාවක් සම්බන්ධයෙන් භාවිතා කර ප්‍රමිතිගත කර තිබේ. ළමයින් සඳහා පොදුවේ භාවිතා කරනු ලබන විෂාධ රෝග ලක්ෂණ මැනීමේ ක්‍රම අතරට Center for Epidemiologic Studies Depression Scale for Children (CES-DC) අයත් වේ. එය නව යොවුන් පුද්ගලයන් සම්බන්ධයෙන් විශ්වසනීය බව සොයාගෙන තිබේ. එහෙත්, තරුණ ළමයින් සඳහා යෝග්‍ය නැත. Children's Depression Inventory (CDI-2) එවැනි තවත් එකකි.

[15] ප්‍රචණ්ඩත්වයේ සූදානම මැනීම සඳහා මෙවලම් පරාසයක් තිබේ. ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම මැනීම සඳහා භාවිතා කිරීම සඳහා සාමාන්‍ය වශයෙන් සකස් කරගෙන තිබෙන මේවා ප්‍රාණවත් වචනවලින් ලේඛනගත කර තිබේ. උදාහරණයක් ලෙස UN MCS විසින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (IPV) සහ සහකරු නොවන අයගේ ලිංගික ප්‍රචණ්ඩත්වය (NPSV) සම්බන්ධ වැරදි මැනීම සඳහා WHO MCS ප්‍රශ්න කට්ටලය සකස් කරගෙන තිබේ. What Works to Prevent Violence Against Women and Girls Global Programme ඇතුළු වෙනත් අධ්‍යයනවලදී ඉන්පසු මෙම සකස් කරගන්නා ලද ප්‍රශ්න කට්ටලය භාවිතා කර තිබේ.

[16] MICS Child Discipline Module සකස් කරගෙන තිබෙන්නේ Parent-Child Conflict Tactics Scale ඇසුරෙනි. ළමයින් විනයගත කිරීම ආශ්‍රිතව මව්පියන් සහ භාරකරුවන්ගෙන් අසනු ලබන ප්‍රශ්න කට්ටලයක් එහි අඩංගු වේ. VACS හි ද අඩංගු වන්නේ ළමයින් හා නව යොවුන් පුද්ගලයන් අත්දකින ශාරීරික දඬුවම් සම්බන්ධ ප්‍රශ්න කට්ටලයකි. එය සත්කාර සපයන්නන්ගෙන් අසනවාට වඩා විශ්වසනීය මිනුමක් විය හැකිය.

[17] කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් සම්බන්ධයෙන් ආකල්ප මැනීම මගින් ආකල්ප පරාසයක්ම මැනිය හැකිය. දූෂණ පිළිබඳ මිථ්‍යාවන් සහ කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය ඉවසීමේ අපේක්ෂා එයට අයත් වේ. උදාහරණයක් ලෙස, Illinois Rape Myth Acceptance Scale හි කෙටි ස්වරූපයක් විවිධ සංස්කෘතික පසුබිම්වලදී ප්‍රතිචාර දක්වන්නන් අපයෝජන මිථ්‍යාවන් සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන්නන්ගේ එකඟතාව මැනීම සඳහා විවිධ සංස්කෘතික පසුබිම්වලදී භාවිතා කර තිබේ.

[18] සමාජභාවය සම්බන්ධයෙන් පුද්ගල ආකල්ප සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ආකල්ප මැනීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අධීක්ෂණයේ හා ඇගයීමේ වැදගත් අංගයකි. සමාජ සම්මතයන් අවබෝධ කරගැනීම සඳහා ප්‍රජාවේ වෙනත් අයගේ ආකල්ප සම්බන්ධ දැක්ම ඇතැම් මැදිහත්වීම් ප්‍රයෝජනවත් විය හැකිය. මෙය ක්‍රම ගණනාවකින් කර තිබේ. උදාහරණයක් ලෙස, What Works to Prevent Violence Against Women and Girls Global Programme, GEM Scale වෙතින් ලබාගන්නා ලද අධ්‍යයන හෝ Gender Equity Scale වැනි අධ්‍යයනවලින් ලබාගෙන ප්‍රජාව සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සිතන ආකාරය මැනීම සඳහා අනුරූප කරගන්නා ලද ප්‍රශ්න සැලකිය හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මැදිහත්වීම් විශේෂයෙන් සමාජ සම්මතයන් වෙනස් කිරීම අරමුණු කරන්නේ නම්, ප්‍රජාවේ දැක්ම පිළිබඳ පුද්ගල ආකල්ප සහ දැක්ම පිළිබඳ වඩාත් පරිපූර්ණ දත්ත ලබාගැනීම අවශ්‍ය වේ. සමාජ සම්මතයන් හා වාරණයන් හෝ සමාජ සම්මතයන් ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිගැනීම සම්බන්ධයෙන් වැදගත් යොමු කණ්ඩායම්වල දත්ත එයට අයත් වේ. ලබාගත හැකි විවිධ සමාජ සම්මතයන් මැනීමේ මෙවලම් සම්බන්ධ මාර්ගෝපදේශ සඳහා බලන්න: Samman, E. (2019) Quantitative measurement of gendered social norms. Advancing Learning and Innovation on Gender Norms (ALIGN).

[19] උදාහරණ සඳහා බලන්න: Stern, E., Heise, L. & McLean, L. (2018) The doing and undoing of male household decision-making and economic authority in Rwanda and its implications for gender transformative programming. Culture, Health and Sexuality 20(19); Ellsberg, M. & Heise, L. (2005) Researching Violence Against Women: A Practical Guide for Researchers and Activists. World Health Organization, PATH.

[20] https://www.who.int/immunization/hpv/deliver/nine_steps_for_developing_a_scalingup_strategy_who_2010.pdf

[21] Goldmann, L., Lundgren, R., Welbourn, A. et al. (2019) On the CUSP: the politics and prospects of scaling social norms change programming. Sexual and Reproductive Health Matters, 27(2): 51-63.

[22] විශේෂ වර්ගවල ජනගහනයන් හෝ සහභාගිකයන් සමග සමීක්ෂණ සහ අධීක්ෂණ හා ඇගයුම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූලධර්ම අට විසින් සලකුණු කරන ලද ඒවාට අතිරේක ආචාරධර්මික හ ආරක්ෂක අභියෝගයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම අවශ්‍යය. උදාහරණයක් ලෙස, ප්‍රචණ්ඩත්වයේ වැරදිකරුවන් සමග සමීක්ෂණ සිදුකිරීමේදී ඔවුන් ගැහැණුන් වුවත්, පිරිමින් වුවත්, විශේෂිත අවදානම් මතුකරයි. ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීමට සූදානම්ව සිටිය යුතුය. උදාහරණ සඳහා බලන්න: Jewkes, R., Dartnall, E. & Sikweyiya, Y. (2012). Ethical and Safety Recommendations for Research on the Perpetration of Sexual Violence. Sexual Violence Research Initiative. Pretoria, South Africa, Medical Research Council.

[23] WHO (2001) Putting Women First: Ethical and Safety Recommendations for Research on Domestic Violence Against Women. Geneva: World Health Organization; WHO (2016) Ethical and safety recommendations for intervention research on violence against women. Building on lessons from the WHO publication Putting women first: ethical and safety recommendations for research on domestic violence against women. Geneva: World Health Organization.

[24] මෙම මාර්ගෝපදේශය ප්‍රධාන වශයෙන්ම පදනම් වන්නේ, UNICEF (2018) INSPIRE Indicator Guidance and Results Framework ලේඛනය මතය. ළමයින් සමග සමීක්ෂණ සහ අධීක්ෂණය හා ඇගයීම මෙහෙයවීමේදී ආචාරධර්ම හා ආරක්ෂාව සම්බන්ධ පරිච්ඡේදයක් එයට අයත් වේ.

[25] මෙම කරුණ සම්බන්ධයෙන් සම්මුතියක් නැත. ඇතැම් ළමා අයිතිවාසිකම් උද්දේශකයන් තර්ක කරන පරිදි මව්පිය කැමැත්තෙන් තොරව සමීක්ෂණයට සහභාගී වන්නේදැයි තීරණය කිරීමේ අයිතිය ළමයාට ලබාදිය යුතුය. ආරක්ෂිතව කළ හැකි නම් පමණක් ළමයා මව්පිය කැමැත්තෙන් තොරව සම්මුඛ සාකච්ඡාවට සම්බන්ධ කරගත හැකිද යන්න සමීක්ෂකයන් හා වැඩසටහන් කාර්ය මණ්ඩලය තීරණය කළ යුතුය. උදාහරණයක් ලෙස, ළමා විවාහවලදී, ළමා ලිංගික ශ්‍රමිකයන් හෝ පවුලෙන් වෙන්වූ/ වීදි වැහි ළමයින් සඳහා එසේ කිරීමට සිදුවේ. එවැහි අය සමීක්ෂණයට සහභාගී වන බව මව්පියන් දැනගැනීම මගින් අපයෝජන අවදානම වැඩිවිය හැකිය.

[26] Gibbs, A., Dunkle, K. & Jewkes, R. (2018) Emotional and economic intimate partner violence as key drivers of depression and suicidal ideation: A cross-sectional study among young women in informal settlements in South Africa. PLOS ONE, https://doi.org/10.1371/journal.pone.0194885.

[27] Jewkes, R., Nduna, M., Levin J., Jama, N., Dunkle, K., Khuzwayo, N. et al. (2006) A cluster randomized-controlled trial to determine the effectiveness of Stepping Stones in preventing HIV infections and promoting safer sexual behaviour amongst youth in the rural Eastern Cape, South Africa: trial design, methods and baseline findings. Trop Med Int Health. 2006;11 (1):3–16.

[28] Donald, A., Koolwal, G., Annan, J., Falb, K. & Goldstein, M. (2020) Measuring women's agency. Feminist Economics, https://doi.org/10.1080/13545701.2019.1683757.

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT වියුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women and Social Development Direct (2020) RESPECT Framework Monitoring and Evaluation (M&E) Guidance.

RESPECT WOMEN

මූලෝපාය සාරාංශය

සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම

(Relationship skills strengthened)

UN WOMEN

World Health Organization

සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම

මූලෝපායේ අරමුණ : අන්තර් පුද්ගල සන්නිවේදනය, ගැටුම් කළමනාකරණය සහ පොදුවේ තීරණ ගැනීමේදී පිරිමින්ගේ, කාන්තාවන්ගේ සහ යුවලවල කුසලතා සංවර්ධනය කිරීම

තාර්කිකත්වය

සම්බන්ධතා ගතිකයන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් අවදානමක් මෙන්ම ආරක්ෂණ සාධකයක් ද විය හැකිය. සමීප සහකරු සම්බන්ධතාවලදී කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට ලක්වීමේ අවදානම වැඩිය.[1] අසමාන බල සම්බන්ධතා, පාලන චර්යාවන් හෝ එක් සහකරුවකු/කාරියක සම්බන්ධතාවලදී ප්‍රචණ්ඩත්වය පිළිගැනීම මගින් එය නිරූපණය වේ. අනෙක් පැත්තෙන්, යුවල අතර සන්නිවේදනය ශක්තිමත්, සහකරුවන්/කාරියන් දෙදෙනාම සමාන සමාජභාවී ආකල්ප බෙදාගන්නා සහ වියදම් ද ඇතුළුව කාරණා සම්බන්ධයෙන් සමාන මට්ටමින් තීරණ ගන්නා සම්බන්ධතාවලදී කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමේ අවදානම අඩුය.[2] බොහෝ සංදර්භයන්හිදී නීතිමය ඥාතීන් සමග දුර්වල සම්බන්ධතා මගින් ප්‍රචණ්ඩත්වයේ අවදානම් ඇතිවිය හැකිය.[3]

බහු විවාහ සංදර්භයන් ඇතුළු යුවල සහ වෙනත් වැඩිහිටි පවුල් සාමාජිකයන් සමග එකම නිවසේ වැඩකිරීම සිදුවන අවස්ථාවන්හිදී ඔවුන් අතර බල අසමතුලිතබව හා සමාජභාවී අසමානතා ආමන්ත්‍රණය කිරීමෙන් සම්බන්ධතා ශක්තිමත් කිරීමේ අනගි අවස්ථාවක් ලැබේ.

මෙම මූලෝපාය මගින් විධිමත් මෙන්ම අවිධිමත් යුවල ආවරණය කරනු ලැබේ. අවිධිමත් සමීප සම්බන්ධතා වෙත ළඟාවීම අසීරු බව වටහා ගනු ලැබේ. එහෙත්, රහස්‍යභාවය සම්බන්ධ කාරණා සම්බන්ධ වන විට සහ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඉවහල් වන නීතිමය ගිවිසුම් නොමැති විට ඒවා වඩා ප්‍රචණ්ඩ විය හැකි බව ද අවබෝධ කරගනු ලැබේ. පවුල් සහ නව යොවුන් පුද්ගලයන් (තාවකාලික සම්බන්ධතාවලදී ප්‍රචණ්ඩත්වය) සමග වැඩකිරීමේදී ඵලදායී එළඹුම් කෙරෙහි වැඩිදුර මගපෙන්වීම් සහිතව වැඩිහිටි සම්බන්ධතා කෙරෙහි එමගින් අවධානය යොමුකරනු ලැබේ. එය පහත දැක්වෙන මූලෝපායික සාරාංශයෙහි ඇතුළත් කර තිබේ: **RESPECT Strategy Summaries on Environments Made Safe and Child and Adolescent Abuse Prevented**.

අවදානම් සහ ආරක්ෂක සාධක

පහත දැක්වෙන අවදානම් සාධක කෙරෙහි සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ආරක්ෂණ සාධක ප්‍රවර්ධය කිරීම කෙරෙහි මෙම මූලෝපාය මගින් අවධානය යොමුකරනු ලැබේ:

මට්ටම	අවදානම් සාධක	ආරක්ෂණ සාධක
පුද්ගල	ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය හෝ පිළිගත හැකි දෙයක් ලෙස සලකන ආකල්ප හා භාවිතාවන් (කාන්තා සහ පිරිමි)	සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප සහ භාවිතාවන් (කාන්තා සහ පිරිමි)
	අඩු ස්වයං සඵලතාව සහ ස්වයං අභිමානය (කාන්තා)	ඉහළ ස්වයං සඵලතාව සහ ස්වයං අභිමානය (කාන්තා)
	ළමා වියේදී ප්‍රචණ්ඩත්වය සහ/හෝ පවුල් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අත්දැකීම් ලැබීම (කාන්තා සහ පිරිමි)	ළමා වියේදී ප්‍රචණ්ඩ නොවන සන්නිවේදනය සහ ගැටුම් නිරාකරණය සම්බන්ධ අත්දැකීම් ලැබීම (කාන්තා සහ පිරිමි)
අන්තර් පුද්ගල	සමීප සම්බන්ධතාවල සහ නීතියෙන් ඥාති වූවන් සමග ඉහළ මට්ටමේ අසමානතාව	පොදු තීරණ ගැනීම සහ ගෘහ වගකීම් ඇතුළු සමාජභාවී සමානාත්මතාව ලක්ෂණයක් වන සමීප සහ පවුල් සම්බන්ධතා.
	දුර්වල සන්නිවේදනය, අකාර්යක්ෂම ගැටුම් නිරාකරණය සහ ගැටලු විසඳීමේ කුසලතා	ප්‍රචණ්ඩත්වය ඇතිකරන සාධක අවම කරන සම්බන්ධතා කුසලතා (ගැටුම් නිරාකරණය, සන්නිවේදනය)
ප්‍රජාව	පිරිමින්ගේ වරප්‍රසාදිත තත්වය ප්‍රවර්ධනය කරන හා කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය සීමාකරන හානිකර සමාජභාවී සම්මතයන්	අහිංසාව, විවිධත්වයට ගරු කිරීම සහ සමාජභාවී සමානාත්මතාවට උපකාරී වන සමාජ සම්මතයන් සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම
	සම්බන්ධතාවලදී ආතතිය ඇතිකරන ඉහළ මට්ටමේ දරිද්‍රතාව සහ විරැකියාව	

වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහන විසින් සරල කරන ලද වෙනස් කිරීමේ න්‍යායක් ඉදිරිපත් කරනු ලැබේ. සම්බන්ධතා ශක්තිමත් කරන සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම වීම තිරසර කළ හැකි ආකාරය එමගින් නිරූපණය කරනු ලැබේ. විශේෂිත වැඩසටහන් වෙනුවෙන් එය වැඩිදුර සංවර්ධනය කිරීම හා අනුරූප කරගැනීම අවශ්‍යය. මූලෝපායන් කීපයක් වෙන වෙනම භාවිතා කිරීමෙන් හා බහුවිධ ප්‍රවේශ ස්ථාන භාවිතා කිරීමෙන් බලපෑම උපරිම කළ හැකි බව සාක්ෂි මගින් නිරූපණය වේ.[4]

R: සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම



මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ග

මෙම මූලෝපාය යටතේ වන මැදිහත්වීම්වල මූලික අරමුණ වන්නේ පිරිමින්ට සහ ගැහැණුන්ට වැදගත්සන්නිවේදන හා සාකච්ඡා කුසලතා ලබාදීමයි. තම සහකරුවන්/කාරියන් හා වෙනත් පවුල් සාමාජිකයන් (උදා: නැන්දම්මා) සමග සන්නිවේදනයේදී, ප්‍රචණ්ඩත්වය ඇතිකරන සාධක කළමනාකරණයේදී සහ සාධනීය අහිංසාවාදී විකල්ප සමග අනුරූප වීමේදී ඒවා අදාළ වේ. පහත දැක්වෙන වගුව මගින් RESPECT රාමුවෙහි දැක්වෙන මැදිහත්වීම් වර්ග දෙකක් නිරූපණය කරනු ලැබේ. එසේම, වර්තමාන සාක්ෂි පදනම[5] පිළිබඳ සාරාංශයක් සපයමින් ඒවා සඳහා උදාහරණ වැඩසටහන් දක්වනු ලැබේ.

යතුර

- ● **බලාපොරොත්තු සහගත.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
කාන්තාවන් සහ පිරිමින් සහභාගී වන, සමානාත්මතා ආකල්ප සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කරනු ලබන කණ්ඩායම් පාදක වැඩමුළු	සහභාගීත්ව වැඩමුළු මාලාවක් මෙම වර්ගයේ මැදිහත්වීම්වලට අයත් වේ. එමගින් සෞඛ්‍ය සම්පන්න, අහිංසාවාදී සම්බන්ධතා සම්බන්ධ කුසලතා පිරිමින් සහ කාන්තාවන් වෙත ලබාදෙයි. එසේම, සම්බන්ධතාවන්හි සමාජභාවී බල අසමානතා සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. මෙම මැදිහත්වීම් අවදානම් සාධක අවම කිරීමෙහිලා ද ප්‍රයෝජනවත් වේ. මත්පැන් අවභාවිතය හා අසාධාරණ තීරණ ගැනීම් සහ සම්බන්ධතා තුළ වඩා හොඳ සන්නිවේදන කුසලතා ආරක්ෂණ සාධක වර්ධනය කිරීම ද උදාහරණ වේ.[6] මෙම මැදිහත්වීම් වයස් හා සමාජභාවී සම කණ්ඩායම් සමග හෝ සමග ඇතැම් විට පවුල් සාමාජිකයන් ද සම්බන්ධ කරගනිමින් මැනැවින් ක්‍රියාත්මක වේ. පිරිමි හෝ ගැහැණු බොහෝ විට තමන් හා සමාන්තර ලිංගික කණ්ඩායම් සමග සම්බන්ධ වෙති. මිශ්‍ර ලිංගික සැසි නිර්මාණය කරන ඇතැම් මැදිහත්වීම් මගින් යුවලවලට එක්විය හැකිය. මෙම මැදිහත්වීම් ප්‍රචණ්ඩත්වයේ ඉතිහාසය නොතකා සෑම අයෙකු සමගම කටයුතු කරයි. ග්‍රාමීය රුවන්ඩාවේ විවාහක යුවලවල සිට දකුණු අප්‍රිකාවේ නාගරික තරුණ පුද්ගලයන් දක්වා සංදර්භයන් ගණනාවක ඒවා භාවිතා කර තිබේ.	L H	LMIC රටවලින් **බලාපොරොත්තු ඇතිකරන සාක්ෂි** ලැබී තිබේ. ඒ අනුව, මෙම වර්ගයේ මැදිහත්වීම් මගින් කාන්තාවන්ගේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කළ හැකිය. මෙම වර්ගයේ මැදිහත්වීම් මගින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වර්ධනයන් සිදුකළ හැකි බවට HIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**.	Indashyikirwa (රුවන්ඩා) Stepping Stones (උගන්ඩාව සහ ලෝකය) Zindagii Shoista(තජිකිස්තානය) PREPARE (දකුණු අප්‍රිකාව) Unite for a Better Life (ඉතියෝපියාව)

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
යුවල උපදේශනය සහ චිකිත්සාව	මෙම ආකාරයේ මැදිහත්වීම් විසින් යුවල උපදේශනය සහ එකට ජීවත් වීමේ උවමනාව ඇති යුවල අතර ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ උපාය මාර්ගයක් ලෙස චිකිත්සාව භාවිතා කරනු ලැබේ. මෙම වර්ගයේ මැදිහත්වීම් සාමාන්‍යයෙන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ඉතිහාසයක් ඇති යුවල ඉලක්ක කරයි. HIC රටවල බහුලව භාවිතා වේ. යුවලු චිකිත්සක සැසි බොහෝ විට අක්‍රිය සම්බන්ධතා රටා කෙරෙහි අවධානය යොමු කරයි. සන්නිවේදන දුෂ්කරතා, ගැටුම් කළමනාකරණ ගැටලු, ලිංගිකත්ව ගැටලු සහ සම්බන්ධතා සංකූලතා එයට අයත් වේ.[7] චිකිත්සාව සාමාන්‍යයෙන් මත්පැන් සහ ද්‍රව්‍ය භාවිතය ද එය ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ වන ආකාරය ද ආමන්ත්‍රණය කරයි. සැසිවලට හැසිරීම් සම්බන්ධ චිකිත්සාවේ සිට සංජානන චර්යාත්මක හෝ විසඳුම් කේන්ද්‍රීය චිකිත්සාව දක්වා විවිධ වර්ගයේ යුවල චිකිත්සාවන් ඇතුළත් වේ. බොහෝ වැඩසටහන්වලදී, යුවල විසින් හානියක් නොවන ගිවිසුමකට බැඳී චිකිත්සා කාලය තුළදී එකට වැඩ කිරීම සිදුවේ. එනම්, සාමාන්‍යයෙන් මාස 3-6.[8]	L	යුවලු චිකිත්සාව සහ උපදේශනය ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අතරමැදි ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට මගපෑදීම සම්බන්ධයෙන් බඵෂක රටවලින් තවත් සාක්ෂි අවශ්‍ය වේ. ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා යුවල චිකිත්සාවේ වාසි සම්බන්ධයෙන් ඉහළ ආදායම් ලබන රටවලින් හොඳ සාක්ෂි තිබේ. තත්වානුකූලව මෘදු-මධ්‍යස්ථ තත්වයන්ගේ ප්‍රචණ්ඩත්ව ඉතිහාසයක් ඇති යුවල එයට අයත් වෙති.[9] කෙසේ වෙතත්, මෙම ප්‍රතිලාභ යුවල අනුව වෙනස් විය හැක.	Becoming One (උගන්ඩාව)
		H		

උදාහරණ වැඩසටහන්

පහත වගුවෙහි සාරංශ දැක්වෙන්නේ එකිනෙකට වෙනස් වැඩසටහන් කීපයකි. එමගින් වැඩසටහන් කාලරාමු තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම අඩුකිරීම සම්බන්ධයෙන් ප්‍රතිඵල පෙන්නුම් කර තිබේ (දළ වශයෙන් මාස හයේ මූලික ක්‍රියාකාරකම්). මෙම වගුව 9 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාලය	ඇගයීම හා බලපෑම
Indashyikirwa	**යුවල පාදක කරගත් තීව්‍ර මැදිහත්වීමක්** වන මෙහි අරමුණ වන්නේ සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම, වඩා සාධාරණ සම්බන්ධතා ගොඩනැගීම සහ සමාජභාවී සාධාරණත්වය හා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය යටපත් කරන සමාජ සම්මතයන් විශ්වාස කිරීම වැඩිකිරීම කිරීමයි.	**රුවන්ඩාවේ** නැගෙනහිර, උතුරු හා බටහිර පළාත්	කෙයාර් ජාත්‍යන්තරයේ ග්‍රාමීය ඉතුරුම් හා ණය සංගමය (VSLA) යටතේ බඳවාගන්නා ලද අඩුආදායම්ලාභී පවුල්වල විෂමලිංගික යුවල	යුවල කණ්ඩායම් 15ක් සහභාගී වන **සති 21 පුහුණුවකි**. එය මෙහෙයවනු ලබන්නේ එක් පිරිමි හා එක් ගැහැණු මෙහෙයවන්නකු විසිනි. විෂයමාලාව විසින් බලය හා සමාජභාවය, හිමිකම්, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය ඇතිකරන තත්වයන් පිළිබඳ මූලික සංකල්ප ආවරණය කරනු ලැබේ. මත්පැන් අවභාවිතය, ඊර්ෂ්‍යාව, ආර්ථික අසමානතා, සමාජභාවී පවුල් භූමිකා, සෞඛ්‍ය සම්බන්ධතා, ක්‍රියාකාරිකත්වය හඳුන්වාදීම සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන අයට සවිබලගැන්වීමේ ප්‍රතිචාර සැපයීම මෙයට අයත් වේ.	මාස 6	**ඇගයීම් වර්ගය:** පොකුරු සසම්භාවී පාලන පරීක්ෂණ (cRCT) සහ ඒ හා සම්බන්ධ ගුණාත්මක පර්යේෂණ.[10] **බලපෑම:** • කාන්තාවන් විසින් ශාරීරික සහ/හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ 55%ක අඩුවක්. • පිරිමින් විසින් ශාරීරික සහ/හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සිදුකළ බව වාර්තා කිරීමේ 47%ක අඩුවක්. • වර්ධනය වූ සම්බන්ධතා ගුණාත්මකබව, වඩා හොඳ සන්නිවේදනය, පුළුල් විශ්වාසය සහ වර්ධනය කරන ලද ගැටුම් කළමනාකරණය සහ බිරිඳට පහරදීම සාධාරණීකරණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන හේතු සංඛ්‍යාව අවම වීම. • නිවසේදී ළමයින්ට ශාරීරික දඬුවම් අඩුවීම

මූලෝපාය සාරාංශය

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාලය	ඇගයීම හා බලපෑම
Stepping Stones	මෙම වැඩසටහන සැලසුම් කර තිබෙන්නේ වයස හා සමාජභාවය අනුව **සම කණ්ඩායම් හතරක්** විසින් භාවිතා කිරීමටයි. එහි අරමුණ වන්නේ, විධිමත් හා අවිධිමත් සම්බන්ධතාවලදී පරම්පරාන්තරව හා සමාජභාවයන් අතර අන්‍යෝන්‍ය ගෞරවාන්විත සන්නිවේදනය හා සම්බන්ධතා කුසලතා ප්‍රවර්ධනය කිරීමයි.[11]	මුලින් ග්‍රාමීය උගන්ඩාවේ[12] සංවර්ධනය කරන ලද මෙම වැඩසටහන එතැන් සිට රටවල් 400ක පමණ පසුබිම් රැසක අනුරූප කරගෙන භාවිතා කරන ලදී. පාසල්, ආගමික ආයතන හා සිරගෙවල් එයට අයත් වේ.	**තරුණ පිරිමින් හා ගැහැණුන්** (වයස අවුරුදු 15 සහ ඊට වැඩි) වෙනුවෙන් සහ වැඩි වයස් පිරිමින් සහ ගැහැණුන් වෙනුවෙන් වන ඒක ලිංගික සම කණ්ඩායම් සමග සම්බන්ධ කාන්තාවන් සහ පිරිමින් (එකිනෙකා සමග සම්බන්ධතා නොමැති අය).	**පැය 23ක සැසි** මාස හයක කාලයක් තුළ සමාන්තරව පැවැත්වේ.[13] සමාජභාවී සමානාත්මතාව හා ප්‍රචණ්ඩත්වය, තරුණයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, ප්‍රචණ්ඩත්වයේ ජීව චක්‍ර, ආදරය, පිළිකුල් කිරීම, ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන/ එච්අයිවී, කොන්ඩම් භාවිතය, ස්වයං අභිමානය සහ මත්ද්‍රව්‍ය අවභාවිතය (වෙනත් ඒවා අතර) වැනි මාතෘකා සහභාගීත්ව පුහුණුවට අයත් වේ.	මාස 6	**ඇගයුම් ස්වරූපය:** දකුණු අප්‍රිකාවේ පොකුරු සසම්භාවී පාලන පරීක්ෂණ (cRCT)[14] සහ විවිධ ක්‍රම. **බලපෑම:** දකුණු අප්‍රිකාවේ පරීක්ෂණය මගින් පිරිමින් විසින් ලිංගික අවදානම් චර්යා ස්වයංව වාර්තා කිරීමේ හා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සිදුකිරීමේ අඩුවක් සොයාගන්නා ලදී. කෙසේ වෙතත්, කාන්තා සහභාගිකයන් විසින් ලිංගික අවදානම් චර්යා හෝ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන් වීම සම්බන්ධ පහළ මට්ටමක් හෝ වාර්තා කර නොතිබිණි. එයට හේතුව විය හැක්කේ, තරුණ කාන්තාවන්ගේ සහ කරුවන් වැඩසටහනට සම්බන්ධ වී නොතිබීමයි. එයට පරස්පරව, ගැම්බියාවේ අනුරූප කරගන්නා ලද වැඩසටහනේදී සම කණ්ඩායම් හතරම, කාන්තාවන් මෙන්ම පිරිමි ද, සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අඩුවීමක් වාර්තා කළහ.[15]
Becoming one	**යුවල උපදේශන ආගමික වැඩසටහනක්** වන මෙය සැලසුම් කර තිබෙන්නේ සෞඛ්‍ය සම්පන්න, වඩා සමානාත්මතාවාදී සම්බන්ධතා ප්‍රවර්ධනය මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහාය.	බටහිර **උගන්ඩාව**	විෂමලිංගික යුවල් 2381 ආගමික නායකයන් 140	පුහුණු ආගමික නායකයන් විසින් මෙහෙයවනු ලබන, සන්නිවේදන කුසලතා, චිත්තවේගී නියාමනය, පොදු මූල්‍ය පාලනය, ලිංගික කැමැත්ත හා සතුට ආවරණය කරනු ලබන පුද්ගල සැසි 12ක්. බයිබලානුකූල මූලධර්ම සහ පද්‍ය ඇතුළත් වේ. පිරිමි ආධිපත්‍යය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කිරීම සඳහා බොහෝවිට යොදාගනු ලබන බයිබල් කරුණු සාධාරණීකරණය කිරීම ඉලක්ක කරයි.	මාස 3-4	**ඇගයීම් ස්වරූපය:** සසම්භාවී පාලිත පරීක්ෂණ (RCT) සහ ඒ සමග ක්‍රියාත්මක කරනු ලබන ගුණාත්මක සමීක්ෂණ.[16] **බලපෑම:** මාස 18ක ඇගයීම 2018 ඔක්තෝබර් මාසයේදී ආරම්භ විය. කෝවිඩ්-19 අධි වසංගතය හේතුවෙන් ප්‍රතිඵල ප්‍රමාද විය.

මූලෝපාය සාරාංශය

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාලය	ඇගයීම හා බලපෑම
Unite for a Better Life **(UBL)**	සැලසුම් කර තිබෙන්නේ **විෂමලිංගික යුවල්** වල සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අඩුකිරීම-ටයි. ඉතියෝපියාවේ පිරිමින්ට පමණක්, ගැහැණුන්ට පමණක් සහ යුවල කණ්ඩායම්වල කෝපි උත්සවවල සංදර්භය තුළ කණ්ඩායම් පාදක සැසි ලෙස මෙහෙයවන ලදී.	නිරිතදිග **ඉතියෝපියාවේ** ගැමි ප්‍රජාවන්	• විෂමලිංගික යුවල • විෂමලිංගික පිරිමි පමණක් • විෂමලිංගික කාන්තාවන් පමණක් (මෙම සියලුදෙනා වයස අවුරුදු 15-49 අතර වර්තමානයේදී විවාහක හෝ එකට ජීවත් වන අයයි) පිරිමි සහ කාන්තා මෙහෙයවන්නන් 48ක් පුහුණු කරන ලදී.	එකිනෙකට වෙනස් සමාජභාවී පරිවර්තක විෂයමාලා තුනක් එකිනෙකට සමාන්තරව පුහුණු මෙහෙයවන්නන් විසින් ඉදිරිපත් කරන ලදී. පිරිමි UBL, කාන්තා UBL සහ යුවල UBL. මේවා ඉදිරිපත් කරනු ලැබුවේ සම්ප්‍රදායික ඉතියෝපියානු කෝපි උත්සවවලදීය. පුද්ගලයන් 20ක් වෙනුවෙන් සහභාගීත්ව හා කුසලතා ගොඩනැගීමේ සැසි 14ක් සති 7-14 අතර කාලයේදී පවත්වන ලදී. එහි අරමුණ වූයේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ විවිධ හේතු සම්බන්ධයෙන් කටයුතු කිරීමයි. එය කරනු ලැබුවේ සමාජභාවී ඒකාකෘතිවලට අභියෝග කිරීමෙන් සහ සමාජභාවී සාධාරණ ආකල්ප හා චර්යාවන් ප්‍රවර්ධනය කිරීමෙනි.	සති 7-14 අතර	**ඇගයීම් වර්ගය:** සසම්භාවී පාලන පරීක්ෂණ (RCT)[17] **බලපෑම: පිරිමි UBL** • පසුගිය වසර තුළදී පිරිමින් ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ 30%ක අඩුවක් • වසරේ කොටසකදී පිරිමින් විසින් ශාරීරික සහ/ හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ 20%ක අඩුවක් • පසුගිය වසර තුළදී කාන්තාවන් ශාරීරික සහ/හෝ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දැකීමේ සංඛ්‍යාත්මකව කැපීපෙනෙන අඩුවීමක්. **කාන්තා සහ යුවල UBL** • ශාරීරික හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයෙහි සංඛ්‍යාත්මකව කැපීපෙනෙන බලපෑමක් නැත. • එහෙත්, ළමයින් රැකබලාගැනීමේ හා ගෘහ කටයුතුවල පිරිමින් යෙදීම කැපීපෙනෙන ලෙස වැඩිවී තිබේ.

සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම හා සම්බන්ධ **පොදු මූලිකාංග සහ ඵලදායී එළඹුම්වල මූලධර්මවලට** පහත දැක්වෙන කරුණු අයත් වේ:[18]

සැලසුම් කිරීම හා අනුරූප කරගැනීම

1. **සමාජභාවී පරිවර්තක යුවල විෂයමාලාව සැලසුම් කිරීම, අනුරූප කිරීම සහ නියාමනය කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සම්පත් ඇති බව සහතික කරන්න.** සාර්ථක එළඹුම් ව්‍යුහගත කර තිබෙන්නේ හොඳින් සැලසුම් කරන ලද විෂයමාලා අනුවය. ඒවා විශේෂයෙන් සැලසුම් කර තිබෙන්නේ දේශීය සංදර්භයන්ට අනුකූලව වන අතර අන්තර්ගතය දේශීය සංදර්භයට යෝග්‍ය බව සහ ප්‍රධාන පණිවුඩ ඉලක්ක ජනගහණය අතර මනාව පැතිරෙන බව තහවුරු කිරීම සඳහා දැඩි ලෙස පරීක්ෂාවට ලක්කර හා නියාමනය කර තිබේ. ප්‍රසිද්ධ විෂයමාලා රැසක් තිබේ (පහත කොටුව බලන්න). ඒවා අලුත් සංදර්භයනට අනුරූප කරගත හැකිය. දැනට තිබෙන විෂයමාලා අනුරූප කරගන්නා විටදී, මුල් සංවර්ධකයන්/ ක්‍රියාත්මක කරන්නන් සමග සම්බන්ධ වන ලෙස, එළඹුමේ මූලික මූලධර්මවලට පක්ෂපාතීත්වය සහතික කරන ලෙස සහ වෙනත් තැන්වල අනුරූප කරගැනීමේ අත්දැකීම්වලින් ඉගෙනගන්නා ලෙස දැඩි ලෙස නිර්දේශ කරනු ලැබේ.

විෂයමාලා උදාහරණ

Stepping Stones and Stepping Stones Plus (Global) විසින් සමාජභාවය, ජනනය, එච්අයිවී සන්නිවේදනය සහ සම්බන්ධතා කුසලතා පිළිබඳ තම පුහුණු පැකේජය යාවත්කාලීන කර තිබේ.

රුවන්ඩාවේ Indashyikirwa විවැඩසටහනෙහි යුවල සඳහා යාවත්කාලීන කරන ලද විෂයමාලා පුහුණු මොඩියුලයක් තිබේ. එයට අන්තර් ක්‍රියාකාරී පුහුණුවීම් සහ යුවල අතර ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා ඉගෙනගෙන ගොස් කළ හැකි අභ්‍යාස ඇතුළත් කර තිබේ.

තජිකිස්තානයේ Zindagii Shoista (ගරුත්වයෙන් ජීවත් වීම) සතුව වැඩමුළු අත්පොත් දෙකක් තිබේ:
(1) Social Empowerment විසින් පවුලේ එක්සත්බව ප්‍රවර්ධනය කරන අතර ප්‍රචණ්ඩත්වය අවම කිරීමට ඉලක්ක කරයි.
(2) Enabling Economic Empowerment through Income Generating Activities පවුල් අයවැය කළමනාකරණය කරගැනීම සඳහා පවුල්වලට උපකාර කරයි. කාන්තාවන්ගේ තීරණ ගැනීම ශක්තිමත් කිරීම ද එයට අයත් වේ.

2. **සම්බන්ධතාවල සමාජභාවී බලය හා සමාජ සම්මතයන් පිළිබඳ න්‍යාය හා විශ්ලේෂණ සහිත බිම්මට්ටමේ යුවල විෂයමාලාව.** ෂබෝයහසනසරඅ් යුවල විෂයමාලාව විසින් තමන්ගේම සම්බන්ධතාවලදී සහ ප්‍රජාවේදී ධනාත්මක හා සෘණාත්මක වර්ගවල සංකල්ප සහ එමගින් යුවලවලට සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හඳුනාගැනීම, වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා ලැබෙන පිටිවහල හඳුන්වාදෙන ලදී.[19] හානිකර සමාජ සම්මතයන් පිළිබඳ පණිවුඩ සන්නිවේදනයට වඩා, අලුත් ධනාත්මක හා අපේක්ෂා සහගත සම්බන්ධකම් ප්‍රවර්ධනය කිරීම චර්යා වෙනස්කම් දිරිමත් කරයි. ඇතිවිය හැකි ප්‍රතිචාර වැළැක්වීම සඳහා උපකාර වේ. 'පවුලේ සංවර්ධනය සඳහා එකට වැඩකිරීම', 'එකට යහපත් මව්පියන් බවට පත්වීම' සහ 'වර්ධනය කරන ලද ලිංගික සම්බන්ධතා' එවැනි සම්බන්ධතා සඳහා උදාහරණ වේ.

3. **දැනට පවතින දේශීය වටිනාකම්, භාෂාව සහ ප්‍රජා ව්‍යුහයන් සම්බන්ධයෙන් වැඩසටහන් නම්නීකරණය සහ සම්බන්ධ කිරීම කරන්න.** දේශීය සංදර්භයට සාර්ථක ලෙස අනුරූප කරගන්නා ලද එළඹුම් විසින් තම විෂයමාලාව සිතාමතාම දැනට පවත්නා සාධනීය සංස්කෘතික හා ආගමික වටිනාකම් වෙත නම්නීකරණය කර තිබේ. එසේම, දේශීය භාෂාවෙහි යෝග්‍ය සංකල්ප භාවිතා කරයි. එමගින් විශේෂිත සංදර්භයකදී සම්බන්ධතාවලට බලපාන වැදගත් පුද්ගලයන් සහ පාර්ශ්වකරුවන් හඳුනාගෙන ඇතුළත් කරනු ලැබේ. දැනට පවත්නා ප්‍රජා ව්‍යුහයන් යුවල, පවුල්, පිරිමි සහ කාන්තාවන් සමග සම්බන්ධ වීමේ වැදගත් ප්‍රවේශ ස්ථානයන් ලෙස භාවිතා කරනු ලැබේ.

අනුරූප කරගැනීම හා පුළුල් කිරීම සඳහා සම්පත්

Community for Understanding Scale-up (CUSP) සතුව විවිධ මුලපිරුම් ඵලදායී හා ආචාරධාර්මික ලෙස අනුරූප කරගැනීම හා පුළුල් කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ තිබේ. Guidelines for Adapting Stepping Stones මාර්ගෝපදේශ විසින් ද වැඩසටහන්වල පක්ෂපාතීත්වය හා කාර්යක්ෂමතාව පවත්වාගැනීමට කළ යුතු දේ හා නොකළ යුතු දේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සපයනු ලැබේ.

මූලෝපාය සාරාංශය

ක්‍රියාත්මක කිරීම හා පුළුල් කිරීම

4. **පිරිමින් හා ගැහැණුන් විචාරාත්මක ලෙස සම්බන්ධ කරගැනීම සහ යෝග්‍ය අවස්ථාවලදී වෙනත් පවුල් සාමාජිකයන් සම්බන්ධ කරගැනීම.** සමීප සම්බන්ධතාවක පුද්ගලයන් දෙදෙනාම සම්බන්ධ කරගැනීමෙන් කැපවීම තිරසර කරගත හැකියි එසේම, එමගින් යුවලවලට පවුලේ සමාජභාවී හා බල ගතිකයන්ට සහාය වීම සඳහා එකිනෙකාට උපකාර කරගත හැකිය. පිරිමින් සම්බන්ධ වීම තහවුරු කරගැනීම හා තිරසර කරගැනීම සඳහා විශේෂ ප්‍රයත්නයන් අවශ්‍යය.[20] ඇතැම් වැඩසටහන් විසින් පිරිමින් සම්බන්ධ කරගැනීමට පෙර හා ඉවත්වීමේ අනුපාතිකය අඩුකරගැනීම සඳහා අභිප්‍රේරණාත්මක සම්මුඛ සාකච්ඡා තාක්ෂණයන් භාවිතා කර තිබේ.[21] පුරුෂෝත්තමවාදී පසුබිම්වලදී ඇතිවිය හැකි නිශේධාත්මක ප්‍රතිචාර අවම කරගැනීම සඳහා නීතිමය නෑදෑයන් සම්බන්ධ කරගැනීම ද අවශ්‍ය වනු ඇත.

5. **සහකරුවන් අතර සම සහභාගීත්වය සඳහා ආරක්ෂිත අවකාශයක් නිර්මාණය කරන්න.**[22] යුවලවලට දැනුම බෙදාහදාගැනීමට හා ඉගෙනීමට ආරක්ෂිත සහ ඵලදායී වාතාවරණයක් තහවුරු කිරීම සඳහා වැඩසටහන විසින් කණ්ඩායම්වල ප්‍රමාණය, ස්ථානය සහ කාලය පරිස්සමෙන් සැලකිල්ලට ගත යුතුය. මේ සඳහා පිරිමින් සහ ගැහැණුන් වෙනුවෙන් වෙනම ලිංගිකත්වය සඳහා නිශ්චිත හා වයස අනුව නිශ්චිත සැසි මෙන්ම සහකරුවන්/කාරියන් දෙදෙනාම ඇතුළත් වන ඒකාබද්ධ සැසි ද ඇතුළත් කළ යුතුය. Stepping Stones වැඩසටහනේදී, සම කණ්ඩායම් එකිනෙක විසින් වඩාත්ම යහපත් ආකාරයෙන් තමන්ගේ අවකාශය සහ රැස්වීම සඳහා වේලාව තෝරාගන්නා ලදී.[23]

6. **සන්නිවේදනයේ හා ගැටුම් විසඳීමේ කුසලතා ගොඩනගන්න.** සාර්ථක ප්‍රවේශයන් විසින් කුසලතා ගොඩනැගීම කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. පුහුණු වී නිවසේදී භාවිතා කළ හැකි අලුත් කුසලතා ලබාගැනීම සඳහා අවස්ථා ලබාදෙයි.

7. **සම්බන්ධතා ශක්තිමත් කිරීම සඳහා පිරිමි හා ගැහැණු මෙහෙයවන්නන් පරිස්සමින් තෝරාගන්න.** මෙම මැදිහත්වීම්වල තීව්‍ර ස්වභාවය අනුව, මෙහෙයවන්නන් විසින් වැඩසටහනේ සහභාගී වන්නන් බවට පත්වී මුලින්ම එහි අත්දැකීම් ලබාගත යුතුය. ඒ හරහා ඔවුන් තමන්ගේ ම පරිවර්තනීය හා ඉගෙනුම් ක්‍රියාවලියක් හරහා යා යුතුය. ඔවුන්ට මෙහෙයවන්නන් බවට පත්විය හැක්කේ ඉන් අනතුරුවය.[24] වැඩිදුරටත්, මෙහෙයවන්නන්ට සහභාගීත්ව මෙහෙයවීමේ විලාසිතාවක් වෙනුවෙන් ශක්තිය හා සහාය ලබාදිය යුතුය. වෙනස සඳහා ගමනෙහි සහභාගිකයන්ට ප්‍රමාණවත්සහාය සැපයීමට හැකි විය යුතුය.

8. **ආපසු හැරී බැලීමට හා සහාය වීමට අවස්ථා සහිත සහභාගීත්ව එළඹුම් යොදාගන්න.** ඵලදායී සහභාගිත්ව ඉගෙනුම් තාක්ෂණයන් විසින් සමාජභාවී භූමිකා, කාන්තාවන්ගේ ස්ථානය ප්‍රවර්ධනය කිරීම, අසමාන සම්පත් බෙදාහැරීමට අභියෝග කිරීම සහ පිරිමින් සහ ගැහැණුන් අතර බල අසමතුලනය සම්බන්ධයෙන් සංවාදයට සහ විචාරාත්මක චින්තනයට සහාය දිරිගන්වනු ලැබේ.

9. **පහසුවෙන් ලබාගත හැකි, අදාළභාවය සහිත සහ ජනතාව සම්බන්ධ කරගන්නා සන්නිවේදන මෙවලම් භාවිතා කරන්න.** ඉගෙනගෙන පවුලේදී භාවිතා කළ හැකි සම්පත් ඇතුළු වර්ණවත් සහ සුබවාදී දෘෂ්‍ය සන්නිවේදන මෙවලම් අඩු සාක්ෂරතාවක් සහිත ක්ෂේත්‍රවලදී අත්‍යවශ්‍යය. එය සහභාගී වන්නන්ගේ අවධානය ග්‍රහණය කරගැනීමට ඉවහල් වේ. ප්‍රධාන පණිවුඩ සන්නිවේදනයට උපකාර වේ.[25] සහභාගී වන්නන්ගේ සාක්ෂරතාව අඩු පසුබිම්වලදී ඔවුන්ට පුහුණු මෙවලම් අවබෝධ කරගැනීම සඳහා පහසු කිරීම පිණිස මෙහෙයවන්නන් දෙදෙනෙකු සහභාගී කරගැනීම ප්‍රයෝජනවත් වේ. Indashyikirwa වැඩසටහනේදී එසේ කරන ලදී.

10. **වඩාත්ම කොන්කිරීමට ලක්වූ යුවල සම්බන්ධ කරගැනීම සඳහා සියල්ලන් ඇතුළත් කරගන්නා එළඹුමක් යොදාගන්න.** වැඩසටහන ආබාධ සහිත පුද්ගලයන්ට සහභාගී වියහැකි එකක් බව තහවුරු කිරීම සඳහා Indashyikirwa වැඩසටහන විසින් විශේෂිත මූලෝපායන් භාවිතා කරන ලදී. ආබාධ සහිත ජනයා සඳහා වන ජාතික සභාව සමග හවුල්කාරිත්වයක් නිර්මාණය කරගැනීම, ආබාධ සහිත පුද්ගලයන් 280ක් ඉලක්ක කිරීම සහ ඔවුන් වෙනුවෙන් සුවිශේෂයෙන් සකස් කරන ලද සන්නිවේදන මෙවලම් භාවිතා කිරීම එයට ඇතුළත් විය.[26]



ඇතුළත් වීමේ ස්ථාන

බලපෑම උපරිම කිරීම සඳහා සම්බන්ධතා කුසලතා වර්ධනය කිරීම සඳහා වන එළඹුම් බහුවිධ පරිසරයන් සහ අංශ සමග ඒකාබද්ධ කළ හැකිය. වැළැක්වීමේ වැඩසටහන්වල ව්‍යාප්තිය වර්ධනය කිරීම හා දැනට පවතින මූලපිරුම් ශක්තිමත් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක මූලපිරුම් සහ ව්‍යුහයන් සමග සම්බන්ධ වීම එයට ඇතුළත්ය. පහත දැක්වෙන වගුව විසින් අවධාරණය කරනු ලබන්නේ මෙම මූලෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා ඇතුළත් විය හැකි ස්ථානයි. එයට උදාහරණ වැඩසටහන් ද ඇතුළත් වේ.

පිවිසුම් ලක්ෂ්‍ය	තර්කනය
දැනට තිබෙන ප්‍රජා පාදක සමාජ හා ආර්ථික ආයතන උදා: ආගමික කණ්ඩායම්, ඉතුරුම් හා ණය කණ්ඩායම්, ස්වයං උපකාර කණ්ඩායම්, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන්	ප්‍රජා මට්ටමේ දැනට පවත්නා සමාජ හා ආර්ථික ව්‍යුහයන් සහ ආයතන මගින් පිරිවැය අතින් ඵලදායී පිවිසුම් ස්ථාන සම්පාදනය කළ හැකියි එමගින් යුවල, පවුල්, පිරිමින් සහ කාන්තාවන් සමග වැඩ කළ හැකිය. වෙනස් වීම හා වෙනස ස්ථාවර කරගැනීම සඳහා යුවලවලට හැකියාව ලබාදෙන පරිසරයක් නිර්මාණය කිරීමට මෙම ප්‍රජා ව්‍යුහයන්ට හැකිය. දැනට පවතින ව්‍යුහයන් භාවිතා කිරීම මගින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවස්ථා පුළුල් කළ හැකිය. යුවල බවට පත්වීමට අපේක්ෂිත අය ද සම්බන්ධ කරගැනීමේ හැකියාවක් තිබේ. එනම්, ආගමික ආයතන මගින් හෝ රාජ්‍ය ව්‍යුහයන් විසින් විවාහය වෙත යොමුකරනු ලබන පුද්ගලයන්ය. උදාහරණයක් ලෙස, රුවන්ඩාවේ Indashyikirwa මැදිහත්වීමෙහිදී, යුවල සම්බන්ධ කරගැනීම සඳහා කෙයාර් සංවිධානයේ එවකට පැවති ඉතුරුම් හා ණය සමිති (VSLA) මත පදනම්ව ක්‍රියාත්මක වන ලදී. උගන්ඩාවේ Stepping Stones වැඩසටහනේදී, Redd Barna සංවිධානයේ ආදායම් උත්පාදන වැඩසටහන් මත පදනම් විය.[27] උගන්ඩාවේ පදනම් වුණේ එරට දේවස්ථාන විසින් සපයන ලද පූර්ව විවාහ හා විවාහ උපදේශන සේවා මතයි. එමගින් යුවලවලට කුසලතා පාදක උපදේශනය සැපයීම සඳහා ආගමික නායකයන් සම්බන්ධ කරගන්නා ලදී. එහිදී සන්නිවේදනය, පොදු මුදල්, ලිංගික කැමැත්ත හා සතුට ආවරණය කරන ලදී. සුබවාදී සම්බන්ධතා ගොඩනැගීම සඳහා බයිබලය උපයෝගී කරගන්නා ලදී.
පාසල් හා අධ්‍යාපනික පහසුකම්	ගෞරවනීය සම්බන්ධතා තරුණ පුද්ගලයන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා පාසල් පාදක මැදිහත්වීම් මගින් අවස්ථාව ලැබේ. වඩාත්ම පුළුල් ලෙස ඇගයීමට ලක්කරනු ලැබුවේ තාවකාලික සම්බන්ධකම් පිළිබඳ මැදිහත්වීම්ය. එමගින් සමාන සම්බන්ධතා නිර්මාණය කිරීමට සහ තාවකාලික සම්බන්ධතා පිළිබඳ ආකල්ප හා සමාජ සම්මතයන් වෙනස් කිරීමට උත්සාහ දරණ ලදී. උදාහරණයක් ලෙස, දකුණු අප්‍රිකාවේ PREPARE වැඩසටහනට පාසලින් පසු පවත්වන ලද ගැඹුරු වැඩමුළු 21ක් අයත් විය. සමීප සම්බන්ධතාවලදී වටිනාකම් සහ අපේක්ෂා, සන්නිවේදන කුසලතා, සමාජභාවී බල අසමානතා, ගෞරවනීය සම්බන්ධතා සහ ලිංගික තීරණ ගැනීම් එහිදී ආවරණය කරන ලදී. වැඩසටහන මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අඩුවක් සිදුවිය.[28] නවයොවුන් පුද්ගලයන් විශේෂයෙන් ඉලක්ක කරනු ලබන වැඩසටහන් පිළිබඳ පහත දැක්වෙන ලේඛනයේ විස්තර කරනු ලැබේ:**RESPECT Strategy Summaries on Environments Made Safe and Child and Adolescent Abuse Prevented.**
ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවා ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රය	සෞඛ්‍ය ක්ෂේත්‍රය විසින් යුවල සමග පුළුල් පරිමාණයෙන් සම්බන්ධ වීම සඳහා කැපීපෙනෙන අවස්ථා පිරිනමනු ලැබේ. උදාහරණයක් ලෙස, ලිංගික හා ප්‍රජනන සේඛ්‍යය සේවා මගින් එසේ කළ හැකිය. දැනට පවතින එවැනි වැඩසටහන් සහ උපදේශන සේවා තුළට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ පණිවුඩ ඇතුළත් කළ හැකිය. එසේම, විශේෂිත අවදානම්වලට මුහුණදෙන යුවල හඳුනාගත හැකි අතර වඩා ගැඹුරු යුවල පාදක මැදිහත්වීම් වෙත ඔවුන් යොමුකළ හැකිය. සෞඛ්‍ය වෘත්තිකයන් ද සම්බන්ධ කරගත හැකි අතර හානිකර සම්බන්ධතා සමාජ සම්මතයන් පරිවර්තනය කිරීම සම්බන්ධ දැනුමින් ඔවුන් සන්නද්ධ කළ හැකිය. ඒ සඳහා අධ්‍යාපනික මෙවලම් සහ රැඳීසිටින ස්ථානවල, පරීක්ෂණ මැදිරිවල සහ උපදේශන අවකාශවල තිබෙන සම්පත් සහ පෞද්ගලිකව සේවාදායකයන්ට/ රෝගීන්ට සන්නිවේදනය කරන පණිවුඩ භාවිතා කළ හැකිය.[29]

ප්‍රධාන සම්පත්

යුවල සමග වැඩසටහන්කරණය

Preventing partner violence, working with couples. Practice brief. Starmann, E. The Prevention Collaborative. 2018
මෙම ප්‍රායෝගික සාරාංශය විසින් යුවල සමග සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වැඩකිරීම සම්බන්ධ කෙටි විස්තරයක් ඉදිරිපත් කරයි. වැදගත් සැලසුම් මූලිකාංග සහ ක්‍රියාත්මක කරවීම් ද, අප්‍රිකාවේ වැඩසටහන්වලින් ලබාගත් අදහස් ද එහි අඩංගු වේ.

Working with couples to prevent IPV, Indashyikirwa, Rwanda What Works Evidence Brief. Stern, E., Mclean, L., and Heise, L. 2018
මෙම ප්‍රායෝගික සාරාංශය විසින් යුවල සමග සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වැඩකිරීම සම්බන්ධයෙන් Indashyikirwa වැඩසටහනේ පාඩම් පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරයි.

Programme Summary: The Indashyikirwa Programme Rwanda. The Prevention Collaborative. 2019
මෙම සාරාංශ ලේඛනය මගින් රුවන්ඩාවේ Indashyikirwa යුවල වැඩසටහන පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරයි. වැඩසටහන් උපාංග පිළිබඳ සවිස්තර තොරතුරු මෙන්ම වැඩසටහන්කරණයේදී උගත් පාඩම් ද එහි අඩංගු වේ.

විධිමත් සහ අවිධිමත් ලිංගික සහකරුවන් සමග වැඩසටහන්කරණය පිළිබඳ සාක්ෂි

Couple therapy for intimate partner violence: A systematic review and meta-analysis. Karakurt G, Whiting K, Van Esch, Bolen S, Calabrese J. J Marital Family Therapy, Volume 42, No. 4, p567583: doi:10.1111/jmft.12178. 2016
ප්‍රචණ්ඩත්වයට ප්‍රතිකාරයක් ලෙස යුවල ප්‍රතිකාරවල ඵලදායීතාව පිළිබඳ එක්සත් ජනපදයේ අධ්‍යයන හයක ප්‍රතිඵල මෙම විධිමත් සමාලෝචනයෙහි අඩංගු වේ.

Synchronising gender strategies: A cooperative model for improving reproductive health and transforming gender relations
Greene, M and Levack, A. USAID. 2010
සමාජභාවී සමාජ සම්මතයන්ට අභියෝග කරන ආකාරයෙන්, සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය වන ආකාරයෙන් සහ සෞඛ්‍යය වර්ධනය වන ආකාරයෙන් පිරිමින් සහ කාන්තාවන් ද, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් ද සමග අභිපායන්ට අනුකූලව හා අන්‍යෝන්‍ය වශයෙන් වැරගැන්වෙන ආකාරයට වැඩකිරීම සම්බන්ධ සාක්ෂි සහ වැඩසටහන් උදාහරණ මෙම ප්‍රකාශනය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

පිරිමින් සහ පිරිමි ළමයින් සම්බන්ධ කරගැනීම සම්බන්ධ න්‍යාය

From work with men and boys to changes of social norms and reduction of inequities in gender relations: A conceptual shift in prevention of violence against women and girls. Jewkes, R. K., Flood, M. G. and Lang, J.
The Lancet, 385 (9977), 1580-1589. 2015
මෙම විද්‍යාර්ථී ලේඛනය සාකච්ඡා කරන්නේ පිරිමින් සහ පිරිමි ළමයින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කටයුතුවලට සම්බන්ධ කරගැනීමේ වැදගත්කම පිළිබඳවයි.
අනාගත කටයුතුවලදී පිරිමින් සහ පිරිමි ළමයින් මෙන්ම කාන්තාවන් සහ ගැහැණු ළමයින් ද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ධාවනය කරන සමාජභාවය සම්බන්ධ සමාජ සම්මතයන් වෙනස් කිරීමට සම්බන්ධ කරගත යුතු බව එමගින් යෝජනා කරනු ලැබේ.

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT වියුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women and Social Development Direct (2020) Relationship Skills Strengthened, RESPECT: Preventing Violence against Women Strategy Summary.

පසු සටහන

[1] Heise (2011) What works to prevent partner violence? An evidence review. December 2011.

[2] Fulu, E and Kerr-Wilson, A (2015) What works to prevent violence against women and girls evidence reviews Evidence review of interventions to prevent violence against women and girls. September 2015

[3] Shai, N., Devi Pradhan, G., Chirwa, E., Shrestha, R., Adhikari, A. & Kerr-Wilson, A (2019) Factors associated with IPV victimisation of women and perpetration by men in migrant communities of Nepal, PLOS One, DOI: https://doi.org/10.1371/journal.pone.0210258

[4] UN Women (2015) A Framework to Underpin Action to Prevent Violence against Women, New York: UN Women.

[5] සාක්ෂි ශ්‍රේණිගත කිරීම් විශාල වශයෙන් උකහාගනු ලබන්නේ එකකට වඩා මැදිහත්වීම් ඇගයීම්වලිනි. ඒවා විසින් බොහෝවිට පර්යේෂණාත්ම සැලසුම භාවිතා කරනු ලැබේ. සසම්භාවී, පොකුරු සසම්භාවී හා අර්ධ පර්යේෂණාත්මක ක්‍රම එයට අයත් වේ. අධිකරණ ක්ෂේත්‍රයේ මැදිහත්වීම් වැනි ඇතැම් මූලෝපායන් සඳහා විකල්ප ඇගයීම් ක්‍රම වඩා යෝග්‍ය විය හැකි බව හඳුනාගෙන තිබේ. කාල ශ්‍රේණි, නිරීක්ෂණ සහ අංශාන්තර සැලසුම් එයට ඇතුළත් වේ. ඒවා සාමාන්‍යයෙන් සැලකෙන්නේ ගුණාත්මක අතින් පහළ ඒවා ලෙසයි. මෙය අලුතෙන් පැනනැගෙමින් පවතින ක්ෂේත්‍රයකි. එම නිසා, අධ්‍යයන සැලසුම් හා ඇගයීම් සම්බන්ධයෙන් පුළුල් පරිමාණයක විචල්‍යයන් තිබේ. මෙම සමාලෝචන සහ අධ්‍යයනයන් සඳහා මූලාශ්‍ර යොමුකිරීම්වල කොටසක් ලෙස ඉදිරිපත් කර තිබේ.

[6] Fulu, E and Kerr-Wilson, A (2015) Ibid.

[7] Karakurt, G., Whiting, K., Van Esch, C., Bolen, S. & Calabrese, J. (2016) Couple Therapy for Intimate Partner Violence: A Systematic Review and Meta Analysis, Journal of Marital Family Therapy, 42(4): 567-583

[8] Carr, A (2020) 'Evidence for the efficacy and effectiveness of systemic family therapy' in Wampler, K. et al (Eds.) The Handbook of Systemic Family Therapy, Chichester: John Wiley & Sons.

[9] See forthcoming Becoming One Evaluation; Karakurt G, Whiting K, Van Esch, Bolen S, Calabrese J (2016). Couple therapy for intimate partner violence: A systematic review and meta-analysis. J Marital Fam Ther, Volume 42, No. 4, p567583.

[10] Dunkle, K., Stern, E., Chatterji, S,. and Heise, L., (2019) Indashyikirwa programme to reduce intimate partner violence in Rwanda: Report of findings from a cluster randomized control trial. CARE. London.

[11] විධිමත් සහ අවිධිමත් සම්බන්ධතාවල වෙනස්කම් පිළිබඳ ප්‍රශ්නය මුල් Stepping Stones විසින් විශේෂ වශයෙන් මතුකරන ලදී. එය සිදුකරනු ලැබුවේ 'ආදරය යනු කුමක්ද?' යන අභ්‍යාසය ඔස්සේය. වැඩසටහන සැලසුම් කර තිබෙන්නේ අවිධිමත්/ රහස් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මෙන්ම විධිමත් ලිංගික සම්බන්ධතා සහ බහු විවාහ සම්බන්ධතා පිළිබඳ කටයුතු කිරීම සඳහාය.

[12] See Stepping Stones website for further information: www.steppingstonesfeedback.org

[13] Salamandar Trust (2019) Stepping Stones and Stepping Stones Plus

[14] Jewkes R, Nduna M, Levin J, Jama N, Dunkle K, Puren A, Duvvury N. (2008) Impact of stepping stones on incidence of HIV and HSV-2 and sexual behaviour in rural South Africa: cluster randomised controlled trial. Bmj. Aug 7;337:a506. For a summary, see https://pubmed.ncbi.nlm.nih.gov/18687720/

[15] Paine, K., Hart, G., Jawo, M., Ceesay, S. & Jallow, M. (2010) 'Before we were sleeping, now we are awake': Preliminary evaluation of the Stepping Stones sexual health programme in The Gambia, African Journal of Aids Research, Volume 1, Issue 1.

[16] https://airbel.rescue.org/projects/becoming-one/ See forthcoming Becoming One Evaluation

[17] https://www.uniteforabetterlife.org

[18] McLean, L., Heise, L. & Stern, E. (2019) Shifting and transforming gender-inequitable beliefs, behaviours and norms in intimate partnerships: the Indashyikirwa couples programme in Rwanda, Culture, Health & Sexuality, DOI: 10.1080/13691058.2019.1679394; Starmann, E. (2018) Preventing Partner Violence, Working with Couples. Prevention Collaborative Prevention Brief ; The Prevention Collaborative (2019) Programme Summary: Stepping Stones. The Prevention Collaborative, December 2019 .

[19] Mclean et al (2019) Ibid.

[20] Starmann, E (2018) Preventing partner violence working with couples. Practice brief The Prevention Collaborative.

[21] Saftlas, A. F., Harland, K. K., Wallis, A. B., Cavanaugh, J., Dickey, P., & Peek-Asa, C. (2014). Motivational interviewing and intimate partner violence: a randomized trial. Annals of epidemiology, 24(2), 144-150; Lila, M., Gracia, E., Catalá-Miñana, A., 2018. Individualized motivational plans in batterer intervention programs: A randomized clinical trial. Journal of consulting and clinical psychology 86 (4), 309–320; Schumacher, J.A., Coffey, S.F., Stasiewicz, P.R., Murphy, C.M., Leonard, K.E., Fals-Stewart, W., 2011. Development of a brief motivational enhancement intervention for intimate partner violence in alcohol treatment settings. Journal of Aggression, Maltreatment & Trauma. 20 (2), 103–127.

[22] Stern, E.; Nyiratunga, R. (2017) A Process Review of the Indashyikirwa Couples Curriculum to Prevent Intimate Partner Violence and Support Healthy, Equitable Relationships in Rwanda. Soc. Sci. 2017, 6, 63.

[23] Stern, E., Mclean, L., and Heise, L (2018) Working with couples to prevent IPV. The Indashyikirwa in Rwanda.

[24] Starmann, E (2018) ibid.; Community for Understanding Scale-up (CUSP) guidance; Salamandar Trust (2017) Guidelines for Adapting Stepping Stones.

[25] Ibid.

[26] Dunkle et al (2019) Ibid.

[27] Salamandar Trust (2015) Stepping Stones Revisited: Stories from the village of Buwenda. Video on Vimeo by Salamandar Trust

[28] Mathews, C., Eggers, S.M., Townsend, L. et al (2016). Effects of PREPARE, a Multi-component, School-Based HIV and Intimate Partner Violence (IPV) Prevention Programme on Adolescent Sexual Risk Behaviour and IPV: Cluster Randomised Controlled Trial. AIDS Behav 20, 1821–1840 (2016).

[29] Shepard, B (2010) Addressing violence against women and girls in sexual and reproductive health services. New York: UNFPA

RESPECT WOMEN

මූලෝපාය සාරාංශය

කාන්තාවන් සවිබලගැන්වීම

(Empowerment of women)

UN WOMEN

World Health Organization

කාන්තාවන් සවිබලගැන්වීම

මූලෝපායේ අභිමතාර්ථය : කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වය ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධතා වර්ධනය කිරීම සහ පවුල්, ප්‍රජාවන් සහ සමාජය තුළ සාධාරණ සමාජභාවී බල සම්බන්ධතා ගොඩනැගීම සඳහා ආර්ථික, සමාජ, මානසික,සහ දේශපාලනික වශයෙන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබලගැන්වීම සඳහා පහසුකම් සැපයීම.

තාර්කිකත්වය

ආර්ථික සමාජ, මානසික සහ දේශපාලනික වශයෙන් කාන්තාවන් සවිබලගැන්වීම යනු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ ආරක්ෂණ සාධකයකි.[1] කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යනු, සමාජය හා පවුල තුළ කාන්තාව හොබවන පහත් තත්වය පවත්වාගෙන යන සාධකයකි.

මෙම මූලෝපාය යටතේ කරනු ලබන මැදිහත්වීම් විසින් කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ස්වයං සඵලත්වය (self-efficacy) ගැන ස්වයං විශ්වාසය හා කුසලතා ද, ස්වයං ගරුත්වය සහ සාකච්ඡා කුසලතාද ගොඩනගනු ලැබේ. එමගින් කාන්තාවන්ගේ ආර්ථික සාක්ෂරතාව, දේපල හා ස්වාධිපත්‍යය ද වර්ධනය වේ. පිරිමින් සහ පවුලේ වෙනත් සාමාජිකයන් මත මූල්‍ය වශයෙන් රඳාපැවතීම අවම වේ. සවිබලගැන්වීමේ මූලෝපායන් හේතුවෙන් කාන්තාවන්ගේ කේවල් කිරීමේ බලය, විශ්වාසය, තීරණ ගැනීමේ ස්වාධිපත්‍යය වර්ධනය වේ. ඔවුන්ට තමන් සහ තම පවුල වෙනුවෙන් ගෞරවනීය හා ආරක්ෂාකාරී ලෙස ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් තෝරාගැනීම් හා නියෝජිතභාවය හිමිවේ.

ප්‍රජාවේ සිටින කොන්කරන ලද කාන්තා කණ්ඩායම් (උදා: කාන්තා ලිංගික ශ්‍රමිකයන් සහ ආබාධ සහිත කාන්තාවන්) ඇතුළු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමග වැඩකිරීමේ ප්‍රවේශයන් මූලෝපායට අයත් වේ. විශේෂිත කාන්තා කණ්ඩායම් සමග එළඹුම් කෙරෙහි අවධානය RESPECT මාර්ගෝපදේශ මූලධර්මවලට අනුකූල වේ. බහුවිධ හා එකිනෙක විනිවිද යන විෂමතා ස්වරූප සහ අසමානතා සම්බන්ධයෙන් කටයුතු කිරීම මගින් කිසිවකු අත්හැර නොදැමීම එයට අයත් වේ.[2] තම තරුණ විය හා සම්බන්ධ බල ගතිකයන් හේතුවෙන් විශේෂ අවදානම්වලට හා අනතුරුවලට ලක්විය හැකි නවයොවුන් ගැහැණු ළමයින් ඉලක්ක කිරීමේ ප්‍රයත්නයන් ද එයට අයත් වේ.

අවදානම් සහ ආරක්ෂණ සාධක

පහත දැක්වෙන අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා වන පහත දැක්වෙන ආරක්ෂණ සාධක ප්‍රවර්ධනය කිරීමට මෙම මූලෝපාය ඉලක්ක කරයි.

මට්ටම	අවදානම් සාධක	ආරක්ෂණ සාධක
පුද්ගල	ආර්ථික අනාරක්ෂිතභාවය (කාන්තා) ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය හෝ පිළිගත හැකි දෙයක් ලෙස සාධාරණීකරණය කරන ආකල්ප (පිරිමි සහ ගැහැණු) පහළ ස්වයං සඵලත්වය සහ ස්වයං අභිමානය[3]	ආර්ථික අනාරක්ෂිතභාවය (පිරිමි සහ කාන්තාවන්) මූල්‍ය ස්වාධිපත්‍යය (කාන්තා) සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප හා භාවිතාවන් (පිරිමි සහ ගැහැණු) ස්වයං සඵලත්වය හා ස්වයං අභිමානය පිළිබඳ ඉහළ හැඟීම (ගැහැණු)
අන්තර් පුද්ගල	සමීප සහකරු හා නීතියෙන් ඇති වූ සම්බන්ධතාවලදී ඉහළ මට්ටමේ අසමානතාව. කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනත්වය හා පවුලේ තීරණ ගැනීමේදී සීමිත බලය	සමීප සම්බන්ධතාවල ලක්ෂණ වන්නේ, සමාජභාවී සමානතාවයි. පවුලේ තීරණ හා වගකීම් හවුලේ ගැනීම එයට අයත් වේ. කාන්තාවන් සහ පිරිමින් අතර අධ්‍යාපන මට්ටමේදී වැඩි සමානත්වය
ප්‍රජාව	පිරිමින් වරප්‍රසාදිත තත්වයට පත්කරන හා කාන්තාවන් පවුලේ තීරණ ගැනීම සීමාකරන හානිකර සමාජභාවී සම්මතයන්	අවිහිංසාවට, විවිධත්වයට ගරුකිරීමට හා සමාජභාවී සමානාත්මතාව දිරිදෙන සමාජ සම්මතයන් සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම
සමාජයීය	විරැකියාවෙන් පෙළෙන, ඌන රැකියා නියුක්තිය සහිත සහ සූරාකෑම සිදුවන සේවා පරිසරයන්හි සිටින කාන්තාවන් කාන්තාවන්ගේ පහළ මට්ටමේ දේශපාලන සහභාගීත්වය	කාන්තා රැකියා නියුක්තියේ ඉහළ මට්ටම කාන්තාවන්ගේ අධ්‍යාපනයේ ඉහළ මට්ටම කාන්තාවන් සක්‍රිය ලෙස දේශපාලනයේ නියුතු වීමේ ඉහළ මට්ටම

වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහනෙන් නිරූපණය කරනු ලබන්නේ, සමාජමය හා ආර්ථික වශයෙන් කාන්තාවන් සවිබලගන්වන හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමට හේතු වන සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් සඳහා සරල කරන ලද වෙනස්කිරීමේ න්‍යායකි. එය විශේෂිත වැඩසටහන් සඳහා තවදුරටත් සංවර්ධනය කර අනුරූප කරගත යුතුය.

E: කාන්තාවන් සවිබලගැන්වීම



මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ග

මෙම මූලෝපාය යටතේ මැදිහත්වීම්වලට පහත සඳහන් කරුණු ඇතුළත් වේ:කාන්තාවන්ගේ වෘත්තීය, මූල්‍ය හා ජීවන කුසලතා, අසමාන ලෙස උරුමය බෙදීයාම හා දේපළ අයිතිය වැනි සමාජ, දේශපාලනික හා ආර්ථික වශයෙන් ඇතුළත් කරගැනීමට ඇති බාධා සහ සමාජ ජාල හා සාමූහික නියෝජනයන් නිර්මාණය කරගැනීම. මෙම මූලෝපායන්ගේ අරමුණ වන්නේ, තම සම්බන්ධතාවන්වලදී, පවුල්වලදී හා ප්‍රජාවේදී අසමානතාවට හා යටත් කරගැනීමට අභියෝග කිරීම සඳහා පුද්ගල, කණ්ඩායම් හා සමූහ බලය ගොඩනැගීමයි. ඇතැම් අවස්ථාවලදී, වැඩසටහන් විසින් සහමුලින්ම එක් ආර්ථික හෝ සමාජ සවිබලගැන්වීමක් කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. වෙනත් වැඩසටහන් සමාජ හා ආර්ථික මැදිහත්වීම් සමග සම්බන්ධ කරයි. පහත දැක්වෙන වගුව විසින් නිරූපණය කරනු ලබන්නේ RESPECT ව්‍යුහයෙහි දක්වා තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ගයි. වර්තමාන සාක්ෂි පදනම හා වැඩසටහන් උදාහරණ ගැන ද එහි දැක්වේ.

LEGEND

- ● **බලාපොරොත්තු සහගත.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා සවිබලගැන්වීම පුහුණුකිරීම. ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ[4] සහ මාර්ගෝපදේශය	කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ සමාජ සවිබලගැන්වීම කෙරෙහි අවධානය යොමු කළ මැදිහත්වීම් මෙයට ඇතුළත් වේ. ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ සහ මාර්ගෝපදේශය එයට අයත්ය. ලිංගික ශ්‍රමිකයන් වැනි කොන්කරන ලද කාන්තා කණ්ඩායම් ද එයට ඇතුළත් විය හැකිය.	L H	මෙම වර්ගයේ මැදිහත්වීම් මගින් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය ඇතුළු ප්‍රචණ්ඩත්වය අත්දැකීම අඩුකළ හැකි බවට LMIC රටවලින් **බලාපොරොත්තු සහගත** සාක්ෂි තිබේ. මෙම වර්ගවල ප්‍රවේශයන් මගින් ප්‍රචණ්ඩත්වය වැඩිවිය හැකි බවට HIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. නවයොවුන් ගැහැණු ළමයින් සමග වැඩකිරීමේදී, වඩාත්ම ඵලදායී ප්‍රවේශයට වසරක් හෝ වැඩි කාලයක් තුළ සම්පාදනය කරන ලද තීව්‍ර කණ්ඩායම් පාදක සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම් සම්බන්ධ වේ.[5]	The Adolescent Girls Initiative (AGI) (කෙන්යාව) AVAHAN sex worker collectivisation (ඉන්දියාව)
උරුමය හා දේපළ හිමිකාරීත්වය ප්‍රතිපත්ති සහ මැදිහත්වීම්	ඉඩම් සහ වෙනත් ඵලදායී දේපළ සම්බන්ධයෙන් කාන්තාවන්ගේ ප්‍රවේශය හා පාලනය උරුමය සහ දේපළ හිමිකම් සම්බන්ධ නීති වැඩිදියුණු කිරීම ඉලක්ක කරන මෙන්ම පවුල්වලට ගැහැණු ළමයින්ගේ වටිනාකම වැඩිකරන මැදිහත්වීම් මෙයට ඇතුළත්ය.	L H	අසමාන උරුමය හා දේපළ අයිතිය සංශෝධනය කිරීම සමස්ත කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම අඩුකිරීමේදී වැදගත් වන බව බඵෂක රටවලින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** තිබේ. උරුම හිමිකම් පිරිමින් හා ගැහැණුන් අතර සමාන අන්දමින් බෙදී යන තත්වය සැකසූ ඉන්දියාවේ ප්‍රාන්තව විශ්ලේෂණවලින් ද එය හෙළි විය. 1976 - 2004 අතර වකවානුවේදී පොලිසියට වාර්තා වූ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය 36%කින් පහළ වැටිණි. HIC රටවලින් **සාක්ෂි ලැබී නැත**.	The change in inheritance law (ඉන්දියාව)

මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි	උදාහරණ වැඩසටහන්
සමාජභාවය සමග සම්බන්ධ කරන ලද ක්ෂුද්‍ර මූල්‍ය ණය සහ සවිබලගන්වන ලද පුහුණු සංරචක	ආර්ථික හා සමාජ සවිබලගැන්වීමේ සංරචක ඒකාබද්ධ කරන බලාපොරොත්තු සහගත එළඹුම් රැසක් තිබේ. මෙම මැදිහත්වීම් කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින් සවිබලගැන්වීම, කාන්තාවන්ගේ සමාජ කුසලතා හා විශ්වාසය සහ ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාව හා ස්වාධීනත්වය වර්ධනය කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සාකල්‍ය දැක්මකින් කටයුතු කරයි. ඇතැම් මැදිහත්වීම්වලදී පිරිමි සහකරුවන් හෝ සම වයස් පිරිමි ළමයින් සම්බන්ධ කරගනු ලැබේ. එහි අරමුණ වන්නේ ඇතිවිය හැකි ප්‍රතිරෝධයන් අවම කිරීම සහ පිරිමින්ගේ හා පිරිමි ළමයින්ගේ සහාය ලබාගැනීමයි. පිරිමින් හෝ පිරිමි ළමයින් වඩා ගැඹුරින් මෙම වැඩසටහන් සමග සම්බන්ධ කිරීම වෙනත් වර්ගවල මැදිහත්වීම්වලට අයත්ය. එහි අරමුණ වන්නේ පිරිමින් හා පිරිමි ළමයින් හට ද මැදිහත්වීම හරහා පූර්ණ ආර්ථික හා සමාජ සවිබලගැන්වීම ලබාදීමයි.	ආර්ථික හා සමාජ සවිබලගැන්වීමේ සංරචක (ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ සහ ආර්ථික මැදිහත්වීම් සමග සම්බන්ධ මාර්ගෝපදේශනය ඇතුළු) ඒකාබද්ධ කළ කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ සමාජ සවිබලගැන්වීමේ අරමුණු මගින් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදීම අඩුකළ හැකි බවට LMIC රටවලින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** තිබේ. මෙම මැදිහත්වීම්වලට පිරිමින් හා කාන්තාවන් සම්බන්ධ විටදී, ඔවුන්ට පිරිමින්ගේ වාර්තාගත සමීප සහකරු ප්‍රචණ්ඩත්ව වැරදි අඩුකළ හැකි බවට ද සාක්ෂි තිබේ. HIC රටවලින් **සාක්ෂි ලැබී නැත**.	MAISHA (ටැන්සානියාව) Zindagii Shoista (තජිකිස්තානය) Do Kadam Barabari Ki Ore (Two Steps Towards Equality) (ඉන්දියාව)

උදාහරණ වැඩසටහන්

වැඩසටහන් කාල රාමුව තුළදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්මෙහි අඩුවීමක් වාර්තා කළ එකිනෙකට වෙනස් වැඩසටහන් තුනක් පහත දැක්වෙන වගුවේ සාරාංශගත කර තිබේ. මෙම ක්‍රමවේද ඕනෑම එකක් අනුරූප කරගැනීමේදී මෙම වගුව 8වන පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ සෘජුතාක්ෂ වියුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
MAISHA (based on IMAGE)[6]	ක්ෂුද්‍ර මූල්‍ය හා සමාජභාවී සවිබලගැන්වීමේ මැදිහත්වීමකි. එහි අරමුණ වන්නේ ප්‍රජාවන්ගේ ආර්ථික යහපැවැත්ම සහ ස්වාධීනත්වය වර්ධනය කිරීමයි. එච්අයිවී හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවදානම අඩුකිරීමට ද ඉලක්ක කරනු ලැබේ.	ටැන්සානියාව	ක්ෂුද්‍ර මූල්‍ය කණ්ඩායම්වල දුප්පත් ග්‍රාමීය කාන්තාවන්	කලින් පිහිටුවන ලද ක්ෂුද්‍ර මූල්‍ය කණ්ඩායම්වල කාන්තාවන්ට දින 20ක කාලයක් තුළ **සහභාගීත්ව සවිබලගැන්වීමේ සැසි 10කට** සහභාගී වීමට ආරාධනා කරන ලදී. සෑම වැඩසටහනක්ම පැය 1.5 - 2 අතර කාලයක් පැවැත්විණි. එය ඉදිරිපත් කරනු ලැබුවේ කාන්තා මෙහෙයවන්නියක විසිනි. Wanawake Na Maisha (කිස්වහිලි බසින් කාන්තාවන් හා ජීවිතය) විෂයමාලාව අනුගමනය කරන ලදී	මාස 24	**ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලිත පරීක්ෂණය (RCT) සහ සිරස් ගුණාත්මක පර්යේෂණ (longitudinal qualitative research)[7] **ප්‍රධාන සොයාගැනීම්:** • කාන්තාවන් ශාරීරික සහ/ හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම 25%කින් අඩුවීම • සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හා වැඩිවුණු කාන්තා ආත්ම විශ්වාසය සම්බන්ධයෙන් වර්ධනය වූ අදහස්

මූලෝපාය සාරාංශය

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
Zindagii Shoista **(ගරුත්වයෙන් ජීවත් වීම)**	සමාජභාවී සවිබල-ගැන්වීම, ආදායම් උත්පාදනය කිරීමේ ක්‍රියාකාරකමක් ආරම්භ කිරීමේ පුහුණුව සහ පවුල් තුළ එයට සහාය වීම සඳහා ක්ෂුද්‍ර ප්‍රදාන සහිත පවුල් මූලික මැදිහත්වීමකි.	ග්‍රාමීය තජිකිස්තානය	තරුණ විවාහක කාන්තාවන් සහ ඔවුන්ගේ පවුල් (නීතිමය ඥාතීන් ද ඇතුළුව)	මැදිහත්වීම ක්‍රියාත්මක කරනු ලැබුවේ බහු පාරම්පරික පවුල් සාමාජිකයන් සිව්දෙනෙකු දක්වා පිරිසකගෙනි. එහි පහත දැක්වෙන අය ඇතුළත් වූහ: • සති 10ක් පුරා සමාජභාවී සාධාරණත්වය, ගරුත්වය, සන්නිවේදනය සහ ප්‍රචණ්ඩත්වය අවම කිරීම ඇතුළත් සමාජ සවිබලගැන්වීමේ සැසි 10ක්ග • සති 10ක් පුරා සමාජභාවය, වැඩ සහ ජීවනෝපාය ශක්තිමත් කිරීම, ව්‍යාපාර සංවර්ධනය සහ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහිත තරුණ විවාහක කාන්තාවන් සහ පවුලේ වෙනත් සාමාජිකයන් ඉලක්ක කරගත් ආර්ථික සවිබලගැන්වීමේ සැසි • සෑම පවුලකටම ආදායම් උත්පාදන ක්‍රියාකාරකමක් ආරම්භ කිරීම සඳහා ඩොලර් 370ක මුදලක් ලබාදෙන ලදී. • අධීක්ෂණය සහ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා උපකාර කිරීම[8]	මාස 18යි	**ඇගයීම් වර්ගය:** මිශ්‍ර ක්‍රමය **ප්‍රධාන සොයාගැනීම්:** • සම්බන්ධතා ගතිකයන්ගේ, මානසික සෞඛ්‍යයේ සහ සමාජ ආර්ථික තත්වයන්ගේ සාධනීය වෙනස්කම් සොයාගන්නා ලදී. • පිරිමින් විසින් සිදුකරන හා කාන්තාවන් විසින් විඳිනු ලබන සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ සෑම ස්වරූපයකම සංඛ්‍යාත්මක වශයෙන් කැපීපෙනෙන අඩුවීමක් සිදුවිය.

මූලෝපාය සාරාංශය

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
The Adolescent Girls Initiative, **කෙන්යාව**	නවයොවුන් ගැහැණු ළමයින් සඳහා බහුආංශික සවිබලගැන්වීමේ මැදිහත්වීම් (සමාජ, සෞඛ්‍ය, අධ්‍යාපනික සහ ආර්ථික)	කෙන්යාවේ කොන්කරන ලද ප්‍රදේශ දෙකක් නයිරෝබිහි කිබරා සහ ඊසානදිග කෙන්යාවේ වජීර් ප්‍රාන්තය	වයස 11-15 අතර නව යොවුන් වියේ පසුවන ගැහැණු දරුවන්	මෙම වැඩසටහනෙහි එකිනෙකට වෙනස් අංග හතරකි. ප්‍රජා පාදක ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහනක්, අධ්‍යාපන කොන්දේසිය මත මුදල් ලබාදීමේ වැඩපිළිවෙලක්, සෞඛ්‍යය මූලික කරගත් ගැහැණු ළමයින් සවිබලගැන්වීමේ සමාජ සහ මූල්‍ය අධ්‍යාපය හා ඉතුරුම්	වයස අවුරුදු 2ට වැඩි	**ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලිත පරීක්ෂණය (RCT) සත්කාර අංග හතරක් සමග[10] **අවුරුදු දෙකක මැදිහත්වීමෙන් පසු ප්‍රධාන සොයාගැනීම්:** • ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සම්බන්ධයෙන් කැපීපෙනෙන සාධනීය ප්‍රතිඵල, ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය දැනුම, සමාජ ආරක්ෂණ ජාල, මූල්‍ය සාක්ෂරතාව සහ ඉතුරුම් චර්යා සහ නාගරික ප්‍රදේශවල පවුල් ආර්ථික තත්වය **සම්පූර්ණ කිරීමෙන් දෙවසරකට පසු ප්‍රධාන සොයාගැනීම්:** • ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් තිරසර බලපෑමක් නැත. • වජීර්හි මූලික මට්ටමේදී පාසලෙන් ඉවත්වූ ගැහැණු ළමයින් සම්බන්ධයෙන් විවාහය හා ගර්භණීභාවය ප්‍රමාද වීම සම්බන්ධ කැපීපෙනෙන සාධනීය බලපෑම් සහ පාසලට ඇතුළත්වීම වැඩිවීම • කිබරාහි වැඩිමහල් ගැහැණු ළමයින් සම්බන්ධයෙන් ලිංගික ජීවිතයට ඇතුළු වීම හා ළමයින් හැදීම සම්බන්ධයෙන් කැපීපෙනෙන සාධනීය බලපෑම්

සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

කාන්තාවන්ගේ සමාජ හා ආර්ථික සවිබලගැන්වීමට අදාළ වන **එලදායී එළඹුමක පොදු ලක්ෂණ සහ මූලධර්ම**

වැඩසටහන් සැකසීම හා අනුරූප කරගැනීම

1. **ඉලක්ක ජනගහනය හඳුනාගන්න.** ජීවිත යථාර්ථයන්ට අනුව හැඩගස්වන ලද ඉලක්ක එළඹුම් හා යෝග්‍ය මැදිහත්වීම් ඔස්සේ වඩාත්ම කොන්කරන ලද කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමග වැඩකරන්න. සංදර්භයන්ට නිශ්චිත අවදානම් හඳුනාගැනීමට හා පාසලෙන් බැහැර වූ ගැහැණු ළමයින් සහ ආබාධ සහිත කාන්තාවන් හා ගැහැණු ළමයින් වැනි විශේෂයෙන් කොන්කරන ලද උප ජනගහනයන් වෙත ළඟාවීම සඳහා සහභාගීත්ව මෙවලම් හා උපදෙස් විමසීමේ ක්‍රියාවලි උපයෝගී කරගත හැකිය. මැදිහත්වීම් සැලසුම් කිරීමට පෙර, විශේෂිත කාන්තා උප කණ්ඩායම් මුහුණදෙන බාධක හඳුනාගැනීම් සඳහා තත්ව විශ්ලේෂණයක් හා අවශ්‍යතා තක්සේරුවක් සිදුකළ යුතුය.[11] මැදිහත්වීම් සැලසුම් කළ යුතු වන්නේ සහ හැඩගස්වාගත යුත්තේ ඒ අනුවයි.

2. **සමාජභාවී භූමිකා සහ ආදායම් උත්පාදනය පිළිබඳ සංවර්ධනාත්මක සමීක්ෂණ පවත්වන්න.** විවාහක සහ අවිවාහක කාන්තාවන් විසින් ආදායම් ඉපැයීම භාරගත හැක්කේ කුමන තත්වයන් යටතේද, කළ යුත්තේ කුමන රැකියාද, ඒ ඇයිද යන්න තේරුම්ගැනීම සඳහා මෙය ඉතා වැදගත්ය. වැඩකරන කාන්තාවකට පිරිමින්, පවුල සහ ප්‍රජාව ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් එහි විශාල බලපෑමක් තිබේ. මැදිහත්වීම් සමාජභාවී භූමිකාවන්ට අභියෝගාත්මක වන විට ඇතිවිය හැකි ප්‍රතිචාර අවම කිරීම සඳහා සූදානම් වන්න.

3. **ආර්ථික සවිබලගැන්වීමේ සංරචක ප්‍රාදේශීය ජීවනෝපාය අවස්ථා මත පදනම් වන බව සහතික කරන්න.** උදාහරණයක් ලෙස, ආර්ථික සවිබලගැන්වීමේ මැදිහත්වීම් සැලසුම් කළ යුත්තේ කාන්තාවන් සඳහා තිබෙන ජීවනෝපාය විකල්ප පිළිබඳ වෙළඳපොළ විශ්ලේෂණයක් මතය. හැකි විටදී, තිබෙන සහාය ලබාගත යුතුය.[12] (උදා: ක්ෂුද්‍ර ණය, ග්‍රාමීය ඉතුරුම් සහ ණය සංගම් (VSLAs), ස්වයං උපකාර කණ්ඩායම් (SHGs)

4. **ඇතිවිය හැකි ප්‍රතිචාර හඳුනාගෙන අවම කරන්න.** මෙම මූලෝපාය මගින් පීතෘමූලික පසුබිම් තුළදී සම්ප්‍රදායික සමාජභාවී භූමිකාවන්ට සෘජුව අභියෝග විය හැකිය. එම නිසා, ඇතිවිය හැකි ප්‍රතිරෝධය අවම කිරීමේ උත්සාහයන් එයට ඇතුළත් විය යුතුය. ප්‍රචණ්ඩත්වය වැඩිකිරීමේ අවදානම ද එයට අයත් වේ. සම්බන්ධතාවලදී හෝ පවුලේදී මූල්‍ය ගැටුම් හැසිරවිය යුත්තේ කෙසේද යන පුහුණුව ද එයට ඇතුළත් විය යුතුය.[13] පිරිමි සහකරුවන් සමග සම්බන්ධ වන මූලෝපාය ද එහි තිබිය යුතුය.[14] උදාහරණයක් ලෙස, කාන්තාවන්ගේ ඉහළ ගිය මූල්‍ය ආදායම් පවුලේ ආදායමට දායකත්වයක් ලෙස සැලකීම ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සඳහා පවුලේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් එක්ව වැඩකිරීමේ අදහස උපකාරී විය හැකිය. නීතියෙන් ඥාති වූවන්ගේ බලපෑම් මත කාන්තාවන්ගේ ජීවිත සීමාකර තිබෙන විටදී, පවුල් පාදක එළඹුම් යෝග්‍ය විය හැකිය. උදාහරණයක් ලෙස, තජිකිස්තානයේ Zindagii Shoista විසින් තරුණ විවාහක කාන්තාවන් සහ ඔවුන්ගේ ඥාතීන් (නීතිමය නෑදෑයන්) ඉලක්ක කරන ලදී. විය හැකි ප්‍රතිරෝධය අවම කිරීමට එය ඉවහල් විය. එසේ වන්නේ පවුල තුළ කාන්තාවන්ගේ තත්වය සහ ඔවුන් මුහුණදෙන විවිධ ස්වරූපවල ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන අතරය.[15]

5. **පුහුණුව හා ධාරිතා ගොඩනැගීම මෙහෙයවන්නන්ට ප්‍රමාණවත් කාලය සහ සම්පත් තහවුරු කිරීම.** සමාජභාවී පරිවර්තනීය මැදිහත්වීම් සඳහා හොඳින් පුහුණු වූ මෙහෙයවන්නන් අවශ්‍යය. එසේම, ප්‍රමාණවත් කාලය සහ පෞද්ගලික නැවත සලකාබැලීම් හා ප්‍රශ්න කිරීම් සහ මෙහෙයවන්නන්ට විවිධ තත්වයන් හා සහභාගිකයන්ගේ ප්‍රශ්න හැසිරවීම ඉගෙනීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍යය.[16] උදාහරණයක් ලෙස, මෙහෙයවන්නන්ට විෂය මාලාව සහ භාවිතා කිරීමේ කුසලතා හුරුවීම සඳහා පුළුල් පුහුණුව MAISHA තුළ අඩංගු විය.[17]

6. **ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් සතුව ප්‍රමාණවත් විශේෂඥභාවය තිබෙන බව සහතික කරන්න.** ක්ෂුද්‍ර මූල්‍ය වැනි මැදිහත්වීම් සඳහා ආයතනික (යෝග්‍ය අධීක්ෂණ හා ඇගයීම් පද්ධති වැනි) සහ පුද්ගල කාර්ය මණ්ඩල නිපුණතා (ශක්තිමත් මෙහෙයවීමේ කුසලතා සහ සමාජභාවී සාධාරණ ආකල්ප වැනි) විශේෂිත කුසලතා සහ අත්දැකීම් අවශ්‍යය. සේවා සම්පාදනය කළ යුතු වන්නේ ශක්තිමත් ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් සමගය. ඔවුන්ට අදාළ අත්දැකීම් තිබිය යුතුය. එවැනි මැදිහත්වීම් මෙහෙයවීම සම්බන්ධයෙන් පුළුල් පුහුණුව ලබා සිටිය යුතුය. වටිනාකම්, මූලධර්ම හා එළඹුම් ගැන අවබෝධය තිබිය යුතුය.[18]

ක්‍රියාත්මක කිරීම හා පුළුල් කිරීම

7. **කාන්තාවන්ගේ ආර්ථික තත්වයෙහි සැලකියයුතු වෙනසක් ඇතිකිරීම සඳහා ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ කාර්යයන් සඳහා අවශ්‍ය තරම් අරමුදල් තහවුරු කරගන්න.** පරිණත වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන්න. ක්ෂුද්‍ර මූල්‍ය සහ කුඩා පරිමාණ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල ආර්ථික වාසි කාන්තාවන්ට හා ඔවුන්ගේ පවුල්වලට ලැබීමට කාලයක් (මාස 12කට වැඩි) ගතවේ. අනපේක්ෂිත කම්පනයන් නිසා ඒවාට තර්ජන එල්ලවීමට ද පුළුවන. කාන්තාවන්ගේ ආර්ථික වාසි කාන්තාවන්ට තම සම්බන්ධතා පරිවර්තනය කරගැනීම සඳහා අවශ්‍ය ආර්ථික වත්කම් ලබාදීම සඳහා ප්‍රමාණවත් තරම් කැපීපෙනෙන මට්ටමක තිබිය යුතුය. සමාජභාවී ආකල්ප හා භාවිතාවන්ගේ වෙනස්කම්වලට ඉඩදීම සඳහා ද කාලයක් ගතවේ. ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශිත කාලය අවුරුදු තුනකට වැඩිය. අවුරුද්දක සූදානම් වීමේ කාලයක් ද අවශ්‍යය.

8. **සෑම සංරචකයක් වෙනුවෙන්ම වෙනම අරමුදලක් පවත්වාගන්න.** සමාජභාවී සවිබලගැන්වීම තහවුරු කිරීම සඳහා පුළුල් කිරීමේදී ස්වයංව තිරසර වීමේ හැකියාව තිබෙන ක්ෂුද්‍ර මූල්‍ය වියදම්වලට බලපෑමක් ඇතිවන්නේ නැත. සමාජභාවී සවිබලගැන්වීමේ සංරචකය සඳහා බාහිර අරමුදල් අවශ්‍ය වීමේ ඉඩක් තිබේ.[19]

9. **වැඩිකරන ලද ඉතුරුම් සහ ආදායම් ගෘහස්ථ මට්ටමේදී භාවිතා කරන බව තහවුරු කිරීම සඳහා පරිස්සමෙන් අධීක්ෂණය කරන්න.** උදාහරණයක් ලෙස, කාන්තාවන්ට සම්පත් සම්බන්ධයෙන් තනි හෝ හවුල් පාලනය තිබෙන බව තහවුරු කිරීම සඳහාත්, මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස සම්බන්ධතාවල හා පවුල්වල ප්‍රචණ්ඩත්වය වැඩි නොවන බව තහවුරු කිරීම සඳහාත් අධීක්ෂණය අවශ්‍යය.[20] සවිබල-ගැන්වීමේ මූලෝපායන් ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන්ම, ආර්ථික වශයෙන් සවිබලගැන්වීමට අදාළ ඒවා ද අධීක්ෂණය කරන්න. වැටුප් නොගෙවන කාන්තා ශ්‍රමය භාවිතා කිරීම පිළිබඳ අදහස වැරගැන්වීම හෝ සුරැකෙන පරිදි කටයුතු කිරීම නොකරන්න. ඔවුන්ගේ සවිබලගැන්වීම අහිමි කරන අමතර කාලභාරයන් නොපණවන්න.[21]

10. **ගැහැණු ළමයින්ගේ සංකීර්ණ හා බහුවිධ අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සවිබලගැන්වීමේ මැදිහත්වීම් අධ්‍යාපනය හා සෞඛ්‍යය සමග ඒකාබද්ධ කරන්න.** ඒ නවයොවුන් ගැහැණු ළමයින්ගේ ජීවිතවල ඉතා වැදගත් සමයන්හිදී මැදිහත්වීම්වල බලපෑම සහ පිරිවැය කාර්යක්ෂමතාව උපරිම කිරීම සඳහාය. උදාහරණයක් ලෙස, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය තොරතුරු වෙත ප්‍රවේශය තහවුරු කිරීම නවයොවුන් ගැහැණු ළමයින්ට ඉතා වැදගත්ය. එමගින් ඔවුන්ට තම ශරීරය හා ජීවිත ගැන තෝරාගැනීම් කළ හැකිය.[22] ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය තොරතුරු සහ සේවා බොහෝවිට අහිමි වන ආබාධ සහිත නවයොවුන් ගැහැණු ළමයින් ඇතුළත් කරගත යුතුය. කිසිවකුට හානි නොකිරීමේ මූලධර්මය මත පදනම්ව, නවයොවුන් ගැහැණු ළමයින්ගේ ජීවනෝපාය ඉපයීමේ ඕනෑම ක්‍රියාකාරකමක් ප්‍රවේශමෙන් අධීක්ෂණය කරන්න. එමගින් ඔවුන් නොසිතූ අන්දමේ සූරාකෑමකට හෝ අපයෝජනයට ලක්නොවිය යුතුය. එසේම, එමගින් ඔවුන්ට අධ්‍යාපනය අහිමි නොවිය යුතුය.

11. **කාන්තාවන් සහ ගැහැණු ළමයින් සම්බන්ධයෙන් පවත්නා යථාර්ථයන් හා සීමාවන් සමග ගැලපෙන පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.** උදාහරණයක් ලෙස, ගෘහස්ථ හා ළමයින් රැකබලාගැනීමේ වගකීම්, පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යයන. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට අඳුරු වැටුණු පසු ගමන් යාමේ සීමා, ආරක්ෂාව හා ගමන් බිමන් යාම සම්බන්ධ ගැටලු ආදිය සැලකිය හැකිය.

12. **කාන්තාවන් සහ ගැහැණු ළමයින් නමට පමණක් සහභාගී කරගැනීමෙන් වළකින්න.** ඒ වෙනුවට, ව්‍යාපෘතිය හරහා කෙතරම් හොඳින් කාන්තාවන් සවිබලගැන්විය හැකිද යන කරුණ සම්බන්ධයෙන් අඛණ්ඩව සිහි කැඳවීම වෙනුවෙන් අවස්ථා නිර්මාණය කරන්න. හවුල් නිෂ්පාදනය ද සිතෙහි තබාගන්න.

13. **කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට හමුවිය හැකි, සමාජානුයෝගය විය හැකි, වැදගත් කරුණු සාකච්ඡා කළ හැකි සහ කුසලතා සංවර්ධනය කරගත හැකි ආරක්ෂිත ස්ථාන සපයන්න.** උදාහරණයක් ලෙස, විශේෂිත වශයෙන් සැලසුම් කරන ලද ආරක්ෂිත ස්ථාන, කාන්තා මධ්‍යස්ථාන, සැලෝන් හෝ ප්‍රජා මධ්‍යස්ථානයක හමුවීම සඳහා වෙන්කරන ලද නිශ්චිත කාලයක්, සායන ආදිය සැලකිය හැකිය. කණ්ඩායම් පාදක මැදිහත්වීම් මගින් කාන්තාවන්ට සම්බන්ධතා ගොඩනැගීම, සන්නිවේදනය, ගැටලු විසඳීම හා ව්‍යාපාරික කුසලතා සම්බන්ධයෙන් එකිනෙකාට අවවාද දීමෙන් උපකාර කරගැනීම සඳහා වේදිකාවක් සැපයේ. එය ආර්ථික, චිත්තවේගී සහ ශාරීරික ලිංගික ප්‍රචණ්ඩත්වයේ අවදානම අඩුකිරීමට දායක වන බව සොයාගෙන තිබේ.[23] ආරක්ෂිත ස්ථාන විශේෂිත අවදානම් සහිත අය ද ඇතුළු සියලු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට පිවිසිය හැකි ස්ථාන විය යුතුය. ඒවා කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ටත්, වෙනත් පවුල් සාමාජිකයන්ටත් පිළිගත හැකි ඒවා විය යුතුය.



මූලෝපාය සාරාංශය

ඇතුළත් වීමේ ස්ථාන

පහත දැක්වෙන වගුවෙහි අවධාරණය කරනු ලන්නේ මෙම මූලෝපාය සඳහා වන ප්‍රධාන පිවිසුම් ලක්ෂ්‍යයන්ය. වැඩසටහන් උදාහරණ ද එයට ඇතුළත් වේ.

පිවිසුම් ලක්ෂ්‍ය	තර්කනය
දැනට පවතින ප්‍රජා ව්‍යුහයන් සහ ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් හා ණය සේවා, ස්වයං උපකාරී කණ්ඩායම්ල ඉතුරුම් ගිනුම්ල ගැමි ඉතුරුම් හා ණය සමිති	කාන්තාවන්ගේ ස්වයං උපකාරී කණ්ඩායම් හෝ ගැමි ඉතුරුම් හා ණය සමිති වැනි කාන්තාවන් සහභාගී වන දැනට පවත්නා ප්‍රජා ව්‍යුහයන් විසින් කාන්තාවන් සවිබලගැන්වීමේ මැදිහත්වීම් සඳහා පිවිසුම් ස්ථාන සැපයිය හැකිය. එම වැඩසටහන් අනුකරණය කිරීමට සහ පුළුල් කිරීමට එමගින් අවස්ථාව ලැබේ. උදාහරණයක් ලෙස, බිහාරයේ Do Kadam Barabari Ki Ore (සමානාත්මතාව දෙසට පියවර දෙකක්) වැඩසටහන විවිධ කණ්ඩායම් ඉලක්ක කළ මැදිහත්වීම් හතරකින් සමන්විත විය. එක් මැදිහත්වීමක් විසින් විවාහක කාන්තාවන් ඉලක්ක කරන ලදී. ඔවුහු ඒ වන විටත් ගම් මට්ටමේ ස්වයං උපකාරී කණ්ඩායමක සාමාජිකයෝ වූහ. වැඩසටහන විසින් මෙම ස්වයං උපකාරී කණ්ඩායම් ශක්තිමත් කරන ලදී. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිලිබඳ දැනුම හා දැනුවත්භාවය වර්ධනය කරන ලදී. එමගින් වැළැක්වීමේ කටයුතුවලට සහාය දෙන ලද අතර බේරුණු පුද්ගලයන්ට සහාය පිරිනමන ලදී. මෙම මැදිහත්වීම් උදාහරණය දැනට පවත්නා ඉතුරුම් කණ්ඩායම් සඳහා පිවිසුම් ලක්ෂ්‍යයක් ලෙස භාවිතා කරන ලදී. ඉතුරුම් කණ්ඩායම් පිහිටුවීම මගින් අනිවාර්යයෙන්ම ප්‍රචණ්ඩත්වය අඩුවීමක් සිදු නොවන බව සඳහන් කළ යුතුය. මේ වෙනුවෙන් වැඩිදුර සමීක්ෂණ අවශ්‍යය. සාක්ෂි පරස්පර වීම එයට හේතුවයි. විශේෂයෙන්ම මෙම ප්‍රජා ව්‍යුහයන් පවත්වාගැනීම ශක්තිමත් කිරීම, නායකත්වය ගොඩනැගීම හා තිරසර කිරීම (සාක්ෂරතාව සහ සංඛ්‍යාත්මක සංරචක එකතු කිරීම ඇතුළුව) සහ පිරිමි සහකරුවන් වෙත ළඟාවීම සඳහා ක්‍රීඩා සහ තරුණ සමාජ වැනි විවිධ වේදිකා සලකාබැලීමේ අවශ්‍යතාව සඳහා සම්පත් කැපකිරීමේ අවශ්‍යතාව උගත් පාඩම් අතරට ඇතුළත්ය.
ගැහැණු ළමයින් කණ්ඩායම් සහ පාසල්වල සහ/ හෝ ප්‍රජාවන්හි ආරක්ෂිත අවකාශ	කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට ශාරීරික හා චිත්තවේගී ආරක්ෂාව සැලසෙන කාන්තාවන්ට පමණක් වන අවකාශයන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබලගැන්වීම සඳහා හොඳ පිවිසුම් ලක්ෂ්‍ය විය හැකිය. එමගින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රතිචාර සේවා ගැන තොරතුරු සහ ඒවා වෙත ප්‍රවේශය ද සැපයේ. ආරක්ෂිත ස්ථාන සාමාන්‍යයෙන් පාදක වන්නේ පාසල් හෝ ප්‍රජාවන් මතය. ප්‍රජා පාදක වැඩසටහන් විවාහක ගැහැණු ළමයින්, පාසලින් පිටවූ ගැහැණු ළමයින් සහ/ හෝ ආබාධ සහිත ගැහැණු ළමයින් වැනි කොන්කරන ලද නවයොවුන් පුද්ගලයන් වෙත සමීප වීමට උපකාරී වේ. ඔවුහු ප්‍රචණ්ඩත්වයට ලක්වීමේ වැඩි අවදානමකට ලක්වෙති. ඔවුන් වෙත සමීප වීමේ අභිලාෂය සහිත ප්‍රයත්නයන් නොමැති වීමෙන් ඔවුන් නොතකාහැරීමට ලක්විය හැකිය. උදාහරණයක් ලෙස, කෙන්යාවේ නවයොවුන් ගැහැණු ළමයින්ගේ මූලපිරුම (AGI) ගැහැණු ළමයින් සවිබලගැන්වීමේ සමාජ සම්බන්ධ කරගන්නා ලදී. එම සමාජවල අවධානය යොමුවන්නේ සෞඛ්‍ය දැනුම වර්ධනය, ස්වයං සඵලත්වය සහ සමාජ ආරක්ෂණ ජාල කෙරෙහිය. ගැහැණු ළමයි සතිපතා කණ්ඩායම් රැස්වීම්වලට හෝ ආරක්ෂිත අවකාශවලට සහභාගී වූහ. ඒවා මෙහෙයවනු ලැබුවේ ප්‍රජාවේ තරුණ කාන්තා මාර්ගෝපදේශකවරයකු විසිනි. ගැහැණු ළමයින් විසින් සෞඛ්‍ය සහ ජීවන කුසලතා මාතෘකා පරාසයක් සාකච්ඡා කරන ලදී. විවෘත සාකච්ඡාවලට අවස්ථාව ලබාගන්නා ලදී. මැදිහත්වීමේ කොටසක් ලෙස ඇතැම් ගැහැණු ළමයින් මූල්‍ය අධ්‍යාපන විෂයමාලාවක් තම ආරක්ෂිත අවකාශයේදී හදාරන ලදී. සති අන්ත පාසල් සැසි, නේවාසික පාසල්වල ඉගෙනීම, පවුල් වගකීම් සහ ආගමික සේවා වැනි ගැටුම් සහගත වගකීම් හේතුවෙන් ගැහැණු ළමයින්ට ආරක්ෂිත අවකාශවලට ස්ථාවරව සහභාගී වීමට තිබෙන ගැටලු උගත් පාඩම් අතරට අයත් වේ. කාලීනව කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ජීවිත යථාර්ථයන් සම්බන්ධව අවබෝධය ගොඩනගාගැනීම සහ පවුලේ සහාය සහ අවබෝධය ලබාගැනීමේ වැදගත්කම සොයාගැනීම් මගින් අවධාරණය කරනු ලැබේ.[24]

මූලෝපාය සාරාංශය

පිවිසුම් ලක්ෂ්‍ය	තර්කනය
නීති සහ ව්‍යවස්ථා	2020 ලෝක බැංකුවේ කාන්තා, ව්‍යාපාරික සහ නීති වාර්තාව අනුව, ලෝක ආර්ථිකයන්ගෙන් 40%ක් විසින් කාන්තාවන්ගේ දේපළ අයිතිවාසිකම් සීමාකරනු ලැබේ.[25] නීතිය විසින් කාන්තාවන්ගේ දේපළ හිමිකම් පිළිගන්නා අවස්ථාවලදී පවා එහි ප්‍රායෝගිකත්වය අභියෝගාත්මක වේ. ප්‍රචණ්ඩත්වය අඩු කිරීමට කටයුතු කරන උද්දේශකයන් සහ සමාජ ව්‍යාපාර විසින් කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට වෙනස් අන්දමින් සලකන උරුමය, විවාහය, පවුල සහ දේපළ සම්බන්ධ නීති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බලපෑම් කළ යුතුය.
කාන්තා ලිංගික ශ්‍රමිකයන් සමග මැදිහත්වීම්	කාන්තා ලිංගික ශ්‍රමිකයන් සවිබලගැන්වීම ඉලක්ක කරන මැදිහත්වීම් ගනුදෙනුකරුවන්, පොලිසිය සහ සමීප සහකරුවන් වෙතින් සිදුවන ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සඳහා ප්‍රවේශයට හොඳ ලක්ෂ්‍යයකි. මෙම වැඩසටහන්වලදී බොහෝවිට ලිංගික ශ්‍රමිකයන් එක්රැස් කර ජීවත් වීමේ හා වැඩකිරීමේ තත්වයන් වැඩිදියුණු කිරීම පිළිබඳ පැහැදිලි කරනු ලැබේ. මානව හිමිකම් පිළිබඳ පුහුණුව, අපකීර්තිමත් ආකල්ප අවම කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු සහ ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන ලිංගික ශ්‍රමිකයන් සඳහා ප්‍රතිචාරාත්මක සේවා වැනි වෙනත් මූලෝපායන් ද ක්‍රියාත්මක වේ. ඒවා සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ සෞඛ්‍ය රාජ්‍ය නොවන සංවිධාන, කාන්තා අයිතිවාසිකම් සංවිධාන හෝ ලිංගික ශ්‍රමිකයන් විසින් පිහිටුවන ලද සංවිධාන ආදිය මගිනි. උදාහරණයක් ලෙස, ඉන්දියාවේ 'අවහන්' වැඩසටහන මගින් තම අයිතිවාසිකම් වෙනුවෙන් උද්දේශනය කිරීම සඳහා කාන්තා ලිංගික ශ්‍රමිකයන් බලමුළුගන්වනු ලැබේ. කර්ණාටක සෞඛ්‍ය ප්‍රවර්ධන භාරය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම මැදිහත්වීමට ගනුදෙනුකරුවන් සහ පොලිසිය වෙතින් සිදුවන ප්‍රචණ්ඩත්ව වැළැක්වීමේ සංරචකයක් ද අයත් වේ. ඒ වෙනුවෙන් සෑම දිස්ත්‍රික්කයකම 24 පැයේ ක්‍රියාත්මක වන අර්බුද කළමනාකරණ කණ්ඩායමක් තිබේ. මානව හිමිකම් නීතීඥවරුන් විසින් ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ඔවුන් පුහුණු කර ඇත. වැරදිකරුවන් නීතිය හමුවට ගෙන ඒමට කටයුතු කර තිබේ. අවහන් පිළිබඳ කරන ලද ඇගයීමකින් සොයාගත් පරිදි ලිංගික ශ්‍රමිකයන් ගනුදෙනුකරුවන් සහ පොලිස් නිලධාරීන් වෙතින් ප්‍රචණ්ඩත්වයට ලක්වීම කැපීපෙනෙන පරිදි අඩුවී තිබිණි.[26]

ප්‍රධාන සම්පත්

සවිබලගැන්වීම අර්ථ නිරූපණය කිරීම හා මැනීම

Understanding and Measuring Women's Economic Empowerment. Definition, Framework and Indicators, Washington, DC. International Center for Research on Women (ICRW) Golla, Anne Marie, Anju Malhotra, Priya Nanda, and Rekha Mehra. 2011
මෙම ප්‍රයෝජනවත් ලේඛනය විසින් කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම අර්ථ නිරූපණය කරයි. මිනුම් රාමුවක් සහ දර්ශක සපයයි. කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම එයට අයත් වේ.

A Review of Approaches and Methods to Measure Economic Empowerment of Women and Girls, Gender and Development 22(2): 233–251. Pereznieto, Paola, and Georgia Taylor. 2014
මෙම විවරණයේ අරමුණ වන්නේ ඇගයීම් මෙහෙයවන ප්‍රතිපත්ති සම්පාදකයන්ට කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම ඇතුළත් කරගැනීම සඳහා තොරතුරු සැපයීමයි. ඒ අතර, සාර්ථක ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන්වල මූලිකාංග හඳුනාගැනීම සඳහා භාවිතා කරන්නන්ට උපකාර කරනු ලැබේ.

ආර්ථික සහ සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම්වල සාක්ෂි

Combined Economic Empowerment and Gender-transformative Interventions. Evidence Review. What Works to Prevent VAWG programme. Gibbs, A and Bishop, K. 2019
මෙම විවරණය විසින් සවිබලගැන්වීමේ මැදිහත්වීම් හතරක සොයාගැනීම් ඉදිරිපත් කරනු ලැබේ. DFID හි What Works to Prevent Violence against Women and Girls Global Programme (What Works) වැඩසටහන මගින් ඒවා ඇගයීමට ලක්කරනු ලැබේ.

Promoting Women's Economic Empowerment: What Works? The World Bank Group, Policy Research Working Paper 7087. Buvinic, M. and Furst-Nichols, R. 2014
ආර්ථික සවිබලගැන්වීමේ මැදිහත්වීම්වල දැඩි ඇගයීම්වල ලෝක බැංකු විවරණයකි.

Gender, livelihood capabilities and women's economic empowerment: Reviewing Evidence Over the Life Course. London: AGEG. Kabeer, N (2018)
මෙම විවරණය විසින් ආර්ථික හා ජීවනෝපාය ක්ෂේත්‍රවල කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කරන ලද ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්බන්ධ සාක්ෂි අධ්‍යයනය කරනු ලැබේ. වැඩිහිටි (60ට වැඩි) කාන්තාවන්, වැඩකරන වයසේ කාන්තාවන් (20-59) සහ අවසානයේදී නවයොවුන් ගැහැණු ළමයින් (10-19) පිළිබඳ සාක්ෂි විශ්ලේෂණයක් ද එයට ඇතුළත් වේ.

ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන

UN Women Economic Empowerment, New York: UN Women, 2020.
මෙම වෙබ් පිටුව විසින් එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.

A Roadmap for Promoting Women's Economic Empowerment. Exxon and the United Nations Foundation. Buvinic, M. et al. 2013
සාක්ෂි මත පදනම් වූ ක්‍රියාමාර්ග සඳහා වන මාර්ග සිතියමක් මෙම සමීක්ෂණය වාර්තාව විසින් ඉදිරිපත් කරනු ලැබේ. විවිධ රාජ්‍ය සංදර්භයන් තුළ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සහ ප්‍රතිපත්ති සඳහා වන විකල්ප එමගින් ඉදිරිපත් කරනු ලැබේ. එය මූලික වශයෙන් ඉලක්ක කරනුයේ පෞද්ගලික සහ රාජ්‍ය හවුල්කාරිත්වයන්ය. වාර්තාව විසින් සවිබලගැන්වීම මනිනු ලබන්නේ ඵලදායීතාවේ හා ආදායම්වල වර්ධනය ලෙසයි.

නවයොවුන් ගැහැණු ළමයින්

Investments in Adolescent Girls' Physical and Financial Assets: issues and review of the evidence. Girl Hub. Quisimbing, A.R. and Kovarik, C. 2013
දේපළ සමාජභාවී වශයෙන් බෙදීයාම, සවිබලගැන්වී සහ යහපැවැත්ම පිළිබඳ සංකල්පීය රාමුවක් මෙම පත්‍රිකාව විසින් ඉදිරිපත් කරනු ලැබේ. ගැහැණු ළමයින්ගේ දේපළ වර්ධනය කිරීම අරමුණු කරගනිමින් කරනු ලබන මැදිහත්වීම් පිළිබඳ සාක්ෂි එමගින් විවරණය කරනු ලැබේ. විශේෂයෙන්ම, මූල්‍ය සම්පත් වර්ධනය කිරීමේ ප්‍රයත්නයන් අධ්‍යාපනය සහ පුහුණුව සමග ඒකාබද්ධ කරන ඒකාබද්ධ සහ සාකල්‍ය වැඩසටහන් කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ.

Interventions Promoting Adolescent Girls' Economic Capabilities: What Works? London: GAGE Programme, Stavropolou, M, 2018
මෙම වේගවත් සාක්ෂි සමාලෝචනය විසින් අවධානය යොමුකරනු ලබන්නේ LMIC රටවල ගැහැණු ළමයින්ගේ ආර්ථික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් සවිබලගැන්වීම ඉලක්ක කරනු ලබන ආර්ථික මූලෝපායන් කෙරෙහිය.

Delivering Impact for Adolescent Girls: Emerging Findings from Population Council Research. New York: Girl Center, 2018
නවයොවුන් ගැහැණු ළමයින් සම්බන්ධයෙන් හොඳම ප්‍රතිඵල ලබාදිය හැක්කේ කුමන මැදිහත්වීම් පැකේජය විසින්ද යන්න ගවේෂණය කිරීම සඳහා වන බලපෑම් ඇගයීම් නවයක සොයාගැනීම් මෙම සමීක්ෂණය විසින් සාරාංශගත කරයි. ප්‍රචණ්ඩ සහ සමාජභාවී සාධාරණ ප්‍රතිඵල ද එයට අයත් වේ.

පසු සටහන

[1] රටවල් 44ක සහ කාන්තාවන් 481,205ක සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අවදානම් සමග සම්බන්ධ මහේක්ෂ මට්ටමේ සාධක අධ්‍යයනයක් මගින් පෙන්වාදෙන ලද පරිදි සමීප සහකරු ප්‍රචණ්ඩත්වය පුද්ගල මට්ටමේදී අවම කිරීම සම්බන්ධ මහේක්ෂ මට්ටමේ සාධකවලට ඉඩම්, දේපළ, උරුමය හා සම්පත් අදාළ වේ. සමාජ මට්ටමේදී රැකියා, අධ්‍යාපනය සහ දේපළ වෙත කාන්තාවන්ගේ ප්‍රවේශය ද කාන්තාවන් සවිබලගැන්වීමේ සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ මට්ටම අනුමාන කිරීමේ දර්ශක බව අධ්‍යයනය විසින් නිගමනය කරන ලදී. මූලාශ්‍රය:
Heise, L. & Kotsadam, A. (2015) Cross-national and multilevel correlates of partner violence: an analysis of data from population-based surveys, Lancet Global Health, 3(6): E332-E340

[2] තිරසර සංවර්ධන අරමුණුවල කිසිවකු අත්නොහැරීමේ මූලධර්මය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා බලන්න:
United Nations Committee for Development Policy (CDP) (2018) Leaving no one behind; UNDP (2018) What does it mean to leave no one behind? New York: UNDP; United Nations SDG (2019) Leaving No One Behind: A UNSDG Operational Guide for UN Country Teams, New York: UNSDG.

[3] ස්වයං සඵලතාව මගින් අදහස් කරනු ලබන්නේ පුද්ගලයකුට නිශ්චිත කාර්යසාධන ජයග්‍රහණයන් නිර්මාණය කරගැනීම සඳහා අවශ්‍ය වීර්යාවන් සඳහා තමන්ගේ හැකියාව කෙරෙහි තිබෙන විශ්වාසයයි. (Bandura, A. (1997). Self-Efficacy: The exercise of control. New York, NY: W. H. Freeman)

[4] ආරක්ෂිත ස්ථාන යනු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට සවිබලගැන්වීමේ ක්‍රියාවලියක් හරහා උපකාර කළ හැකි ස්ථානයි. බලන්න:
International Medical Corps (IMC) and International Rescue Committee (IRC) (2020) Women and Girls Safe Spaces: A Toolkit for Advancing Women's and Girls' Empowerment in Humanitarian Settings. London and New York: IMC and IRC.

[5] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, South Africa; What Works to Prevent VAWG

[6] Intervention for Microfinance for AIDS and Gender Equity (IMAGE) Project (South Africa) – an intervention combining microfinance and gender training for women. See: Pronyk, P. M., Hargreaves, J. R., Kim, J. C., Morison, L. A., Phetla, G., Watts, C., ... & Porter, J. D. (2006) Effect of a structural intervention for the prevention of intimate-partner violence and HIV in rural South Africa: A cluster randomised trial. The Lancet, 368(9551), 1973- 1983

[7] Harvey, S., Mshana, G., Kapinga, I., Lees, S., Kapiga, S. (2019) STRIVE Impact Case Study: MAISHA – set to reduce violence against women in Tanzania; Mwanza Intervention Trials Unit, Mwanza, Tanzania; National Institute for Medical Research, Mwanza, Tanzania; London School of Hygiene & Tropical Medicine, London, UK; 2019; Kapiga, S., Harvey, S., Mshana, G., Holm Hansen, C., Mtolela, G.J., Madaha, F. … & Watts, C. (2019). A social empowerment intervention to prevent intimate partner violence against women in a microfinance scheme in Tanzania: findings from the MAISHA cluster randomised controlled trial. The Lancet Global Health, 7(10), 1423- 34.

[8] Gibbs, A., and Bishop, K., (2018) Combined economic empowerment and gender-transformative interventions. Evidence Review. What Works to Prevent VAWG programme.

[9] Mastonshoeva, S., Shonasimova, S., Gulyamova P., Jewkes R., Shai, N., Chirwa, E.D., & Myrttinen, H. (2019). Mixed methods evaluation of Zindagii Shoista (Living with dignity) intervention to prevent violence against women in Tajikistan.

[10] Austrian, K., Soler-Hampejsek, E., Mumah, J., Kangwana, B., Wado, Y., Abuya, B., Shah, V. and Maluccio, J. (2018). Adolescent Girls Initiative-Kenya: Midline Results Report. Nairobi: Population Council.

[11] සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අවදානමට වැඩිපුර ගොදුරු වන වයස අවුරුදු 30ට අඩු කාන්තාවන් ගෙදරදොර කටයුතු සහ ළමයින් බලාගැනීමේ වගකීම් හේතුවෙන් සහභාගීත්වය සීමිත වේ. WEE සහ SE වැඩසටහන් අත්නොහැර තබාගැනීම අවශ්‍යය. සමාජ සහායෙන් සහ සම වයස් කණ්ඩායම් සහායෙන් ප්‍රතිඵල ලබාගැනීම අඩුය. බලන්න:
Knight, L., Ranganathan, M., Abramsky, T., Polzer-Ngwato, T., Muvhango, L., Molebatsi, M., Stockl, H., Lees, S. & Watts, C. (2020) Intervention with Microfinance for AIDS and Gender Equity (IMAGE): Women's Engagement with the Scaled-up IMAGE Programme and Experience of Intimate Partner Violence in Rural South Africa. Prevention science, 21, 268-281.
(Knight, 2019).

[12] මෑතදී ආරම්භ කරන ලද ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන් මෙන් නොව, දැනට පවත්නා සහ හොඳින් පිහිටුවන ලද වේදිකා බොහෝ විට වඩා ස්ථාවර සහ එකතු කරන ලද සංරචක ඒකාබද්ධ කරගැනීමට සූදානම් වීවාය. ආර්ථික සවිබලගැන්වීමේ මැදිහත්වීම් දැනට පවත්නා සමාජ සවිබලගැන්වීමේ (ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ) වැඩසටහන්වලට එකතු කළ හැකිය. ක්‍රියාත්මක කරන, සෑම හවුල්කරුවකුම වෙනුවෙන් ඒකාබද්ධ මැදිහත්වීම් මෙහෙයවන සහ ධාරිතා ගොඩනගන මාදිලිය තීරණය කිරීම වැදගත්ය. බලන්න:
Pronyk, K., Hargreaves, M., Morison L.A., Watts, C. & Porter, J. (2005) Microfinance and HIV prevention–emerging lessons from rural South Africa. Small Enterprise Development, 16, 26-38.

[13] Knight, L. et al (2020) Ibid.

[14] Manji, K, Heise, L and Cislaghi, B (2020) Couples' Economic Equilibrium, Gender Norms and Intimate Partner Violence in Kirumba, Tanzania in Violence Against Women 1-21

[15] What Works (2018) Working with families to prevent violence against women and girls in Tajikistan. What Works Evidence review.

[16] Goldmann, L., Lundgren, R., Welbourn, A., Gillespie, D., Bajenja, E., Muvhango, L. and Michau, L., 2019. On the CUSP: the politics and prospects of scaling social norms change programming. Sexual and reproductive health matters, 27(2), pp.51-63.

[17] Kapiga, S et al (2019) Ibid.

[18] Milat, A., Bauman, A. & Redman, S. (2015) Narrative review of models and success factors for scaling up public health interventions, Implementation Science, 10(15).

[19] Hargreaves, J., Hatcher, A., Strange, V., Phetla, G., Busza, J., Kim, J., Watts, C., Morison, L., Porter, J., Pronyk, P. and Bonell, C., 2010. Group-microfinance and health promotion among the poor: Six-year process evaluation of the Intervention with Microfinance for AIDS and Gender Equity (IMAGE) in rural South Africa. Health Education Research, 25(1), pp.27-40.

[20] Ranganathan, M., Knight, L., Abramsky, T., Muvhango, L., Polzer Ngwato, T., Mbobelatsi, M., Ferrari, G., Watts, C. and Stöckl, H., (2019) Associations between women's economic and social empowerment and intimate partner violence: Findings from a microfinance plus program in rural North West Province, South Africa. Journal of interpersonal violence, p.0886260519836952

[21] Molyneux, M (2008) Conditional Cash Transfers: A Pathway to Women's Empowerment? Pathways to Women's Empowerment Working Paper 5, Institute of Development Studies, Brighton

[22] For example, the Abriendo Oportunidades ('Opening Opportunities') Initiative which provides vulnerable Mayan girls in Belize, Guatemala, and Mexico with skills and support to improve their lives.

[23] Knight, L. et al. (2020) Ibid.

[24] Austrian, K., Soler-Hampejsek, E., Kangwana, B., Maddox, N., Wado, Y., Abuya, B., Shah, V., & Maluccio, J. (2020) Adolescent Girls Initiative–Kenya: Endline Evaluation Report. Nairobi: Population Council.

[25] World Bank (2020) Women, Business and the Law 2020. Washington DC.

[26] Beattie, T. S., Bhattacharjee, P., Isac, S., Mohan, H. L., Simic-Lawson, M., Ramesh, B. M., ... & Heise, L. (2015) Declines in violence and police arrest among female sex workers in Karnataka state, South India, following a comprehensive HIV prevention programme. Journal of the International AIDS Society, 18(1), 20-32.

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT වියුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women and Social Development Direct (2020) Empowerment of Women, RESPECT: Preventing Violence against Women Strategy Summary

RESPECT WOMEN

මූලෝපාය සාරාංශය

සේවා සහතික කිරීම

(Services ensured)

UN WOMEN

World Health Organization

සේවා සහතික කිරීම

මූලෝපායේ අරමුණ : කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන්ගේ අවශ්‍යතා සපිරීම සහ පොලිස්, නීති, සෞඛ්‍ය සහ සමාජ සේවා වැනි අත්‍යවශ්‍ය සේවා[1] සම්පාදනය ඔස්සේ තවදුරටත් ප්‍රචණ්ඩත්වය සිදුවීම වැළැක්වීම. එම සේවාවන්ට පහත දැක්වෙන අංශ ඇතුළත් වේ. බේරුණු පුද්ගලයාට සත්කාර හා සහාය පිරිනැමීම. එමගින් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හෝ නැවත සිදුවීම වැළැක්වීම හෝ අඩුකිරීම, මනෝසමාජ සහාය පිරිනැමීම. එමගින් අවදානමට මුහුණදෙන පිරිමින්, කාන්තාවන්, ළමයින්/ නවයොවුන් පුද්ගලයන් සහ පවුල් වෙනුවෙන් මත්පැන් හා මත්ද්‍රව්‍ය අවභාවිතය වැළැක්වීම, එමගින් මානසික සෞඛ්‍යය වැඩිදියුණු කිරීම, සම්බන්ධතා ගැටුම් අවම කිරීම සහ මත්ද්‍රව්‍ය අවභාවිතය අඩුකිරීම.

තාර්කිකත්වය

ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් පුද්ගලයන්ට ගුණාත්මක සේවා සම්පාදනය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාමාර්ගවලට අඛණ්ඩව දායක වීමේදී වැදගත් දායකත්වයකි. පළමුව, වැළැක්වීමේ මැදිහත්වීම් හේතුවෙන් බොහෝවිට තමන් පීඩාවට පත්වන ප්‍රචණ්ඩත්වය පිළිබඳ කතාකිරීමට හා උපකාර සෙවීමට පෙළඹවීම වැඩිකරයි. එබැවින්, කාන්තාවන්ට ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම සඳහා සහ ඔවුන්ට අවශ්‍ය සේවාවන් වෙත ඔවුන් යොමුකිරීම සඳහා ආරක්ෂිත විශ්වසනීය යාන්ත්‍රණයන් පැවතීම අත්‍යවශ්‍යය. දෙවනුව, කාන්තාවන්ගේ අයිතිවාසිකම්වලට ගරුත්වය ඇතිවන පරිදි ගුණාත්මක සේවාවන් සම්පාදනය කර තිබෙන විට, එමගින් අවදානම් සාධක අවම කළ හැකිය. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ අවදානම් සාධක අඩු කළ හැකිය. ආරක්ෂණ සාධක ශක්තිමත් කළ හැකිය (එහෙත්,සේවා මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නැවත සිදුවීම සම්බන්ධයෙන් සෘජු භූමිකාවක් ඉටුවේද, නැතිනම්, අලුත් සිදුවීම් වාර්තා වීම අධෛර්යවත් කෙරේද යන කරුණ සම්බන්ධයෙන් ලැබී තිබෙන සාක්ෂි මිශ්‍ර ඒවාය). තුන්වනුව, පොලිස්, නීති, සෞඛ්‍ය හා සමාජ සේවා මගින් දිවි ගලවාගත් පුද්ගලයන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් තිබෙන නිශේධාත්මක ප්‍රතිඵල අවම කළ හැකිය. එමගින් ප්‍රචණ්ඩත්වය කල්තබා හඳුනාගැනීමේ පිවිසුම් ස්ථාන සැපයිය හැකිය. නැවත සිදුවීම සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්විය හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සහ එයට ප්‍රතිචාර දැක්වීමේ මහා පරිමාණ වේදිකාවන් සඳහා ඇතුළත් වීමේ ස්ථාන සම්පාදනය කළ හැකිය.

පොලිස් හා නීතිමය සේවාවන් සම්පාදනය කිරීම සඳහා සහාය වීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහි නීති ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා ඉතා වැදගත්ය. එමගින් එවැනි ප්‍රචණ්ඩත්වයන් පිළිගත නොහැකි බවට සංඥාවක් සමාජයන්ට සන්නිවේදනය වේ. මෙම නීති මගින් කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ආරක්ෂාව සැලසෙන අතර, වැරදි කරන්නන්ට එරෙහි නීතියේ මුක්තිය අවසන් කර ඔවුන් වගවිය යුතු තත්වයට පත්කරනු ලැබේ. මෙම වර්ගයේ සේවා සම්පාදනය කරන ක්‍රියාකරුවන් ඇතැම්විට යුක්ති සේවා සපයන්නන් වෙත යොමුකරනු ලැබේ. එමගින් බලාපොරොත්තු වන්නේ විවිධාකාරයේ විධිමත් සහ අවිධිමත් යුක්ති ක්‍රියාකාරීත්වයන් විවිධ සංස්කෘතික, ආගමික, සම්ප්‍රදායික සහ නීතිමය සංදර්භයන් තුළ නිර්මාණය කිරීමයි.[2] ආගමික හෝ ප්‍රජා නායකයන් වැනි අවිධිමත් යුක්ති සම්පාදකයන් හට ඇතැම් විට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ නඩු සම්ප්‍රදායික උසාවිවලදී අසන්නට සිදුවේ. නැතහොත්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් බේරුම්කරුවන් ලෙස කටයුතු කිරීමට සිදුවේ. කෙසේවෙතත්, බේරුම්කරණය පරිස්සමෙන් සිදුකළ යුතුය. ඇතැම් පසුබිම්වලදී, අවිධිමත් අධිකරණ පද්ධතියේ පීතෘමූලික ස්වභාවය හේතුවෙන් පවුලේ ඒකීයත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් බේරුම්කරණය භාවිතා කළ හැකිය. නැතිනම්, දූෂණ සිදුවීම්වලදී කාන්තාවන්ට වැරදි කරන්නන් විවාහ කරගැනීමට සිදුවිය හැකිය.[3]

වෛද්‍ය සත්කාර අවශ්‍ය බේරුණු පුද්ගලයන් හට ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත සෞඛ්‍ය සේවා[4] ඉතා වැදගත් වේ. එයට මානසික සෞඛ්‍ය සත්කාර ද අයත් වේ. ඒවා වැඩසටහන්කරණය සඳහා වැදගත් පිවිසුම් ස්ථාන වේ. එයට හේතුව වන්නේ සෞඛ්‍ය සත්කාර සපයන්නන් බොහෝවිට බේරුණු පුද්ගලයන් හමුවන පළමු විධිමත් සේවා සම්පාදකයන් පිරිස වීමයි. එහිදී කාන්තාවන් ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමට හෝ නොකර සිටීමට ඉඩ තිබේ. සෞඛ්‍ය සේවා මැදිහත්වීම් මගින් දිවි ගලවාගත් පුද්ගලයන්ගේ ශාරීරික. මානසික සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කළ හැකිය. තුවාලවලට ප්‍රතිකාර කිරීම, මානසික සහාය, දූෂණවලින් පසු කරනු ලබන සත්කාර, හදිසි ප්‍රතිසන්ධිරෝධක, ආරක්ෂිත නීතිමය ගබ්සා සහ ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන ආසාදන වැළැක්වීම සහ ප්‍රතිකාර, එච්අයිවීවලට නිරාවරණය වීමෙන් පසු සිදුකරනු ලබන ප්‍රතිකාර ආදිය එයට ඇතුළත් වේ. එමගින් බේරුණු පුද්ගලයන්ගේ කෙටිකාලීන හා දිගුකාලීන මානසික සෞඛ්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් ද කටයුතු කළ හැකිය.[5]

සමාජ සේවා මගින් විවිධ ක්‍රියාකාරකම් රැසක් ඔස්සේ ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ගේ යහපැවැත්ම, සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා සහාය පිරිනමනු ලැබේ. අර්බුද සම්බන්ධ උපදේශනය, උපකාරක සේවා පිළිබඳ තොරතුරු සහ සහාය, සේවා සමග සම්බන්ධ කිරීම, ආරක්ෂිත නිවාස සහ රැකවරණ ස්ථාන වෙත ප්‍රවේශය, මූල්‍ය සේවා සම්පාදනය සහ නීතිමය හා අයිතිවාසිකම් තොරතුරු සහ සහාය ලබාගැනීම එයට ඇතුළත් වේ.[6] වැළැක්වීම අරමුණු කරගත් මැදිහත්වීම් ද සමාජ සේවාවන්ට අයත් වේ. එමගින් අවදානම් කණ්ඩායම්වල මනෝසමාජයීය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. මත්ද්‍රව්‍ය අවභාවිතය අවම කිරීම සහ මානසික සෞඛ්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම ද එයට අයත් වේ.

පොලිසිය, නීතිමය අංශ, සෞඛ්‍ය සහ සමාජ සේවා සම්පාදනයේදී බේරුණු පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගරුකිරීම සහ බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත් සත්කාර වැදගත් වේ. එයට ආරක්ෂාව ද අයත් වේ. මේවා එක්සත් ජාතීන්ගේ අත්‍යවශ්‍ය සේවා පැකේජයෙහි විස්තර කර තිබේ. එය ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් සියලු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට අදාළ වේ.[7]

අවදානම් සහ ආරක්ෂක සාධක

මෙම මූලෝපාය විසින් පහත දැක්වෙන අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉලක්ක කරයි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන ආරක්ෂණ සාධක ප්‍රවර්ධනය කරයි.

මට්ටම	අවදානම් සාධක	ආරක්ෂණ සාධක
පුද්ගල	ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය දෙයක් ලෙස සාධාරණීකරණය කරන ආකල්ප (කාන්තා සහ පිරිමි) මානසික අසමතුලිතබව/ දුර්වල චිත්තවේගී නියාමනය (පිරිමි) මත්පැන් සහ මත්ද්‍රව්‍ය හානිකර භාවිතය (කාන්තා සහ පිරිමි)	සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප (පිරිමි සහ කාන්තා) මනෝසමාජයීය යහපැවැත්ම (පිරිමි සහ කාන්තා)
අන්තර් පුද්ගල	දුර්වල සන්නිවේදනය, අකාර්යක්ෂම ගැටුම් නිරාකරණය සහ ගැටලු විසඳීමේ කුසලතා කාන්තාවන් හුදකලා වීම සහ සමාජ සහාය අඩුවීම	ප්‍රචණ්ඩත්වය අවම කිරීමට හේතුවන සම්බන්ධතා කුසලතා (උදා: ගැටුම් නිරාකරණය, සන්නිවේදනය) සමාජ සම්බන්ධතාව
ප්‍රජා	පිරිමින්ගේ වරප්‍රසාදිත තත්වය ප්‍රවර්ධනය කරන, කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය සීමාකරන හානිකර සමාජභාවී සමාජ සම්මතයන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිගන්නා සමාජ සම්මතයන් මත්පැන්, මත්ද්‍රව්‍ය සහ ආයුධ ලබාගත හැකි වීම	අහිංසාව සහ සමාජභාවී සාධාරණ සම්බන්ධතාවලට සහාය වන සහ කාන්තාවන් සවිබලගැන්වීම දිරිගන්වන සමාජ සම්මතයන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැරදි කරන අයට එරෙහි සමාජ සම්බාධක
සමාජයීය	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ක්‍රියා කරන නීති නැතිවීම හෝ ඒවා බලාත්මක නොවීම ආයතනවල සමාජභාවී වෙනස්කම් (උදා: පොලිසිය, නීති, සෞඛ්‍ය වැනි ආයතන)	සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන නීති (උදා: ඉඩම් හා උරුමය පිළිබඳ) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන නීති

මූලෝපාය සාරාංශය

වෙනස් කිරීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහන විසින් සරල කරන ලද වෙනස් කිරීමේ න්‍යායක් ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ට සේවාවන් සපයන, සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම විය හැකි ආකාරය එමගින් නිරූපණය කරනු ලැබේ. ඒ සඳහා විශේෂිත වැඩසටහන් වැඩිදුර සංවර්ධනය කිරීම හා අනුරූප කරගැනීම අවශ්‍යය.

S: සේවා සහතික කිරීම



මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ග

ඉහළ ආදායම් රටවල (HICs), අඩු සහ මැදි ආදායම් රටවල (LMICs) ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් හට සේවාවන් වෙත පිවිසීම පහසු කිරීම සඳහා විවිධ මැදිහත්වීම් රැසක් ක්‍රියාත්මක කර තිබේ. HIC සහ LMIC රටවල සේවා මැදිහත්වීම් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ සාක්ෂි, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අවදානම් සාධක සම්බන්ධ අතරමැදි ප්‍රතිඵල සහ කාන්තාවන්ගේ සෞඛ්‍යය, යහපැවැත්ම හා සවිබලගැන්වීම සමග සම්බන්ධ ද්විතීයක ප්‍රතිඵල මෙම වගුවෙහි සාරාංශගත කර තිබේ.[8] RESPECT ව්‍යුහයෙහි අවධාරණය කර තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ග වගුව විසින් විස්තර කරනු ලැබේ. වර්තමාන සාක්ෂි පදනම සහ උදාහරණ වැඩසටහන් ද එහි සංක්ෂිප්තව දැක්වේ. තිබෙන අවස්ථාවලදී LMIC රටවල සහ/ හෝ කාන්තා සංවිධානවල වැඩසටහන් උදාහරණ ප්‍රමුඛ ලෙස දක්වා තිබේ. එම උදාහරණ වනාහි ප්‍රජාවේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන්ට සේවා සම්පාදනයේදී වැදගත් භූමිකාවක් තිබෙන අයගේ ඒවාය. සාක්ෂි ප්‍රධාන වශයෙන්ම ලබාගෙන තිබෙන්නේ 2014 - 2015 සමයේ කරන ලද ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සමාලෝචනවලිනි.[9] වඩාත් මෑත කාලීන සාක්ෂි අදාළ තැන්වලදී ඇතුළත් කර තිබේ. සෞඛ්‍ය සේවා සඳහා උදාහරණ පදනම් වන්නේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ කාන්තාවන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා වන ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ මතය.

යතුර

- ● **බලාපොරොත්තු සහගත.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
සේවාවන් වෙත ප්‍රවේශය සහ උද්දේශනය පහසු කිරීම සඳහා සවිබලගැන්වීමේ උපදේශන මැදිහත්වීම් හෝ මනෝසමාජ සහාය	ලබාදිය හැකි පුළුල් පරාසකයක සේවාවන් සඳහා කාන්තාවන්ට තොරතුරු, සහාය සහ අනුග්‍රාහකත්වය සැපයීම මෙම වර්ගයේ මැදිහත්වීම්වලට අයත් වේ. උපදේශනය, මනෝසමාජ සහාය හෝ නීති උපදෙස් එම සේවාවන් අතර වේ. බේරුණු පුද්ගලයන් වෙනුවෙන් උද්දේශනය කරන්නන් සහ උපකාර ලබාගන්නේද, ඒ කොතැනින්ද යන්න තීරණය කිරීම සඳහා කාන්තාවන්ට තොරතුරු සහ සහාය සපයන්නන් ප්‍රධාන සේවා සම්පාදකයන් අතර වේ. මෙම සේවා සම්පාදකයෝ බොහෝවිට කාන්තාවන් සේවාවන් වෙත කැටුව යන අතර ඔවුන් වෙනුවෙන් උද්දේශනය කරති.	H	HIC රටවලින් **බලාපොරොත්තු ඇතිකරන සාක්ෂි** ලැබී තිබේ. ඒ අනුව, මෙම වර්ගයේ මැදිහත්වීම් ඔස්සේ කාන්තාවන් මුහුණදෙන ඇතැම් වර්ගවල සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (ශාරීරික හා චිත්තවේගී) කෙටිකාලීනව අඩුකළ හැකිය. විශේෂයෙන්ම උද්දේශනය තීව්‍ර නම් එසේ සිදුවේ. කෙසේ වෙතත්, දිගුකාලීන බලපෑම පිළිබඳ සාක්ෂි සීමිතය.[10]	The Community Advocacy Project (ඇමරිකා එක්සත් ජනපද)
		L	උද්දේශන මැදිහත්වීම් සම්බන්ධයෙන් ඇගයීම් කර තිබෙන්නේ ඉතා මඳ වශයෙන් බැවින් LMIC රටවලින් **වැඩිපුර සාක්ෂි අවශ්‍යය**. අඩු වශයෙන් එක් අධ්‍යයනයකින් හෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අතරමැදි ප්‍රතිඵල වැඩිදියුණු කරයි. ඇතැම් ආරක්ෂණ චර්යාවන්ට අනුරූප වීම එයට අයත් වේ.[11] මෙම මැදිහත්වීම් වැඩි වශයෙන් ක්‍රියාත්මක කර ඇත්තේ රටවලය. පූර්ව ප්‍රසව සත්කා සේවා සංදර්භය එයට අයත් වේ. ඒවා සම්පත් සමග දැඩිව බැඳී තිබේ. එම නිසා, LMIC රටවල පසුබිමේ ඒවා යොදාගැනීමේ හැකියාව තහවුරු කරගත යුතුය.	Empowerment intervention for pregnant women (එක්සත් ජනපදයේ සැලසුම් කර හොංකොං, ඉන්දියාවේ සහ පේරුහි අනුරූප කරගන්නා ලදී.)[12]

මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
ආරක්ෂිත නිවාස	ආරක්ෂිත නිවාස මැදිහත්වීම් මගින් ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු කාන්තාවන්ට සහ ඔවුන්ගේ ළමයින්ට අන්තර්කාලීන නවාතැන් සපයනු ලැබේ. ඒ හරහා වෙනත් සේවාවන් වෙත ප්‍රවේශය ලබාගැනීම හෝ සම්බන්ධීකරණය කිරීම ද සිදුකළ හැකිය. එම සේවාවන් වන්නේ මනෝසමාජයීය උපදේශනය, සෞඛ්‍ය සත්කාර, රැකියා, ආර්ථික සහාය සහ පුහුණුව ආදියයි.	H L	ආරක්ෂිත නිවාස නිසා බේරුණු පුද්ගලයන් මුහුණදෙන ප්‍රචණ්ඩත්වය අඩුවෙනවාද යන්න පිළිබඳ HIC මෙන්ම LMIC රටවලින් ද **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.**[a] එමගින් කෙටිකාලීනව ප්‍රචණ්ඩත්වය වැඩිවුණ ද දිගුකාලීනව අඩු විය හැකි බව ඇතැම් අධ්‍යයන විසින් පෙන්වාදෙනු ලැබේ. ආරක්ෂිත නිවාසවලින් නික්ම යන කාන්තාවන්ට ස්වාධීනව ජීවත් විය හැකිද, හිංසාකාරී සහකරුවන් අත්හැර යා හැකිද යන කාරණය මත අනාගතයේදී ප්‍රචණ්ඩත්වය සිදුවේද යන කරුණ තීරණය වේ. ආරක්ෂිත නිවාස හේතුවෙන් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ද්විතීයක ප්‍රතිඵලවල වර්ධනයක් සිදුවිය හැකිය. බේරුණු පුද්ගලයන්ට වැඩි ආරක්ෂිතබවක් දැනීම ඒ අතර වේ. කෙසේ වෙතත්, ආරක්ෂිත නිවාසවල බලපෑම පිළිබඳ කරනු ලබන අධ්‍යයනවලට බලපාන ක්‍රමවේදීය සීමා රැසක් තිබේ. ස්වයංව වාර්තා කරන දත්ත කෙරෙහි විශ්වාසය තබන්නට සිදුවීම එකකි.[13]	Maiti Nepal Transit Homes (නේපාලය)
උපකාරක සේවා	දුරකථන හෝ අන්තර්ජාල උපකාරක සේවා යනු අර්බුද සම්බන්ධයෙන් මැදිහත්වීම් වර්ගයකි. එහිදී ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ට හෝ ඔවුන්ට සමීප පුද්ගලයන්ට කිසියම් පුද්ගලයකු සමග කතාකර සහාය ලබාගත හැකි ආකාරය පිළිබඳ තොරතුරු ලබාගත හැකිය.	H L	කාන්තාවන් ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලැබීම අවම කිරීම සඳහා ආධාරක සේවාවන්ගේ ඵලදායීතාව ඇගයීම පිළිබඳ HIC මෙන්ම LMIC රටවලින් ද **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. කෙසේ වෙතත්, පසුබිම සැකසීම සහ ආධාරක සේවා මගින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ද්විතීයක ප්‍රතිඵල වර්ධනය කළ හැකි බවට සාක්ෂි තිබේ. බේරුණු පුද්ගලයන්ට සහාය ලැබෙන බව අවබෝධ වීම සහ ඔවුන්ට සම්පත් සැපයීමේ අවශ්‍යතාව ඒ අතර වේ.[14]	SAWA Women's Protection Helpline (පලස්තීන භූමි ප්‍රදේශ)

[a] ආරක්ෂිත නිවාස විසින් ප්‍රචණ්ඩත්වය වළක්වනවාද යන කරුණ කෙසේ වෙතත්, මෙම සේවාවන් අත්‍යවශ්‍යය. එමගින් තම නිවසින් පිටවීමට අවශ්‍ය කාන්තාවන්ට ආරක්ෂිත ස්ථානයක් සහ පහසුකම් සපයනු ලැබේ.

මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
අර්බුද සම්බන්ධයෙන් සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන	සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන බහු ආංශික එළඹුමකි. එහිදී සෞඛ්‍ය, සමාජ සහ නීතිමය සේවාවන් එක් ස්ථානයකින් සපයනු ලැබේ. මෙම මධ්‍යස්ථාන තනිව පිහිටි ඒවා හෝ රෝහල් හෝ අධිකරණ වැනි තැන්වල පිහිටුවන ලද ඒවා විය හැකිය. සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන යනු සම්බන්ධීකරණය කරන ලද බහු ආංශික සේවා සපයන එක් මාදිලියක් පමණි.[15]	H L	සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන කාන්තාවන් මුහුණදෙන ප්‍රචණ්ඩත්වයට බලපාන ආකාරය පිළිබඳ HIC රටවලින් **සාක්ෂි නැත**. LMIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. විධිමත් සමාලෝචන දෙකක් මගින් හෙළිදරව් වන පරිදි එතරම් ගැඹුරු ඇගයීම් නැත. සිදුකර තිබෙන ඇගයීම් අනුව, අර්බුද සම්බන්ධයෙන් සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන මගින් සේවාවන්ගේ ගුණාත්මකබව වැඩිකරන බවට හෝ සෞඛ්‍යය හෝ යහපැවැත්ම වර්ධනය කරන බවට හෝ සාක්ෂි නැත.[16] LMIC රටවල ඇතැම් ව්‍යාපෘති ඇගයීම් අනුව, එමගින් භාවිතා කරන්නන්ගේ තෘප්තිය වැඩිවිය හැකිය. හෙළිදරව් කිරීම් සමග සවිබලභාවය හා පහසුව දැනීම වැඩි වේ.[17] ඒවා වියදම් අධික විය හැකිය. කෙසේ වෙතත්, සියලු සංදර්භයන් සඳහා යෝග්‍ය නොවේ. එම නිසා, ඒවා සලකා බැලිය යුත්තේ වෙනත් සේවා සම්පාදන එළඹුම් සමගයි.	Isange One Stop Centre (රුවන්ඩා) Thuthuzela Care Centres (දකුණු අප්‍රිකාව) Dilaasa Crisis Centres (ඉන්දියාව)
මත්පැන් අවභාවිතය වැළැක්වීමේ මැදිහත්වීම්	මත්පැන් හෝ මත්ද්‍රව්‍ය අවභාවිතය වැළැක්වීමේ මැදිහත්වීම් මගින් ඉලක්ක කරනු ලබන්නේ එම හේතුව මත සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හෝ සහකරු නොවන ලිංගික ප්‍රචණ්ඩත්වය සිදුකරන පිරිමි වැරදිකරුවන්ය. ඇතැම් මැදිහත්වීම් මගින් මත්පැන් සහ මත්ද්‍රව්‍ය අවභාවිතා කරන අවදානමට මුහුණදෙන කාන්තාවන් හෝ බේරුණු අය ද ඉලක්ක කරනු ලැබේ.	H L	මත්පැන් අවභාවිතය වැළැක්වීමේ මැදිහත්වීම් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී සාර්ථක වන ආකාරය පිළිබඳ HIC මෙන්ම LMIC රටවලින් ද **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර සහ සමාජභාවී පරිවර්තන එළැඹුම් හෝ යුවල සමග මැදිහත්වීම් වැනි වෙනත් සෞඛ්‍ය හෝ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ එළඹුම් සමග සම්බන්ධ කළ විට මත්පැන් අවභාවිතය වැළැක්වීමේ මැදිහත්වීම් ඵලදායී වන බවට සාක්ෂි තිබේ. කෙසේ වෙතත්, කාන්තාවන් මුහුණදෙන ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සහ පිරිමින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුකිරීම සම්බන්ධයෙන් මත්පැන් අවභාවිතය සම්බන්ධ තනි මැදිහත්වීම්වල බලපෑම මිශ්‍ර එකකි. HIC මෙන්ම LMIC රටවල ද මත්පැන් අවභාවිතය සම්බන්ධ මැදිහත්වීම් මගින් ප්‍රචණ්ඩත්වය සමග සම්බන්ධ අවදානම් සාධක අඩුකළ හැකිය. මානසික සෞඛ්‍යය වැඩිදියුණු කිරීම හෝ මත්පැන් හා මත්ද්‍රව්‍ය අවභාවිතය අඩුකිරීම එයට අයත් වේ.[18]	Common Elements Treatment Approach (CETA) (සැම්බියා) Women's Health Co-op (දකුණු අප්‍රිකාව)

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
වැරදිකරුවන්ට මැදිහත්වීම	ප්‍රචණ්ඩත්වය සිදුකරන පිරිමි වැරදිකරුවන් ඉලක්ක කර මැදිහත්වීම මගින් ඉලක්ක කරනු ලබන්නේ නැවත වැරදි කිරීමට පෙළඹීම වැළැක්වීමයි. මෙයට බොහෝවිට සහභාගී කරගනු ලබන්නේ අධිකරණ විසින් එසේ සහභාගී වීමට නියම කරනු ලබන වැරදිකරුවන්ය. කෝපය පාලනය කරගැනීම පිළිබඳ සැසි සහ සම්බන්ධතාවල බලය සහ පාලනය වෙත අවධානය යොමුකරන ස්ත්‍රීවාදී එළඹුම් ඇතුළු මනෝ අධ්‍යාපනික එළැඹුම් මෙම මැදිහත්වීමට අයත් විය හැකිය. මෙම මැදිහත්වීම් ඇතැම්විට මත්පැන් සහ මත්ද්‍රව්‍ය අවභාවිතාව සමග සම්බන්ධ එළඹුම් සමග ද සම්බන්ධ වේ. මත්ද්‍රව්‍ය අවභාවිතාව සමග සම්බන්ධ එළඹුම් ඉහත දැක්වේ.	H	පිරිමි වැරදිකරුවන්ගේ මැදිහත්වීම් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී HIC රටවල සාර්ථක ද යන්න පිළිබඳ **පරස්පර සාක්ෂි තිබේ**. තිබෙන සාක්ෂිවල කැපීපෙනෙන ක්‍රමවේදීය අභියෝග තිබේ. ඇතැම් මැදිහත්වීම් විසින් පිරිමි වැරදිකරුවන් සමග සම්බන්ධ මැදිහත්වීම් මත්පැන් හා මත්ද්‍රව්‍ය අවභාවිතය සම්බන්ධ වැඩසටහන් සමග හෝ යුවල උපදේශනය සමග සම්බන්ධ කරයි. මෙම ඒකාබද්ධ මැදිහත්වීම්ව ද ප්‍රතිඵල මිශ්‍ර වීවාය.[19]	
		L	වරදකරු වෙනුවෙන් මැදිහත්වීමේ ඵලදායීතාව පිළිබඳ LMIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. දැනට තිබෙන සාක්ෂිවල වැඩිපුර අවධානය යොමුකරනු ලබන්නේ වැරදිකරු සම්බන්ධ මත්පැන් හා මත්ද්‍රව්‍ය අවභාවිතය කෙරෙහිය. ඉහත දක්වන ලද පරිදි අවදානම් සාධ අඩුකිරීම හා සම්බන්ධ බලපෑම පිළිබඳ ඇතැම් සාක්ෂි තිබේ.	
කාන්තා පොලිස් ස්ථාන/ ඒකක	මෙම මැදිහත්වීම්වල සාමාන්‍යයෙන් තිබෙන්නේ, විශේෂයෙන් ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් කාන්තාවන්ට (සහ ඇතැම්විට ළමයින්ට) විශේෂිත සේවා සපයන පොලිස් ඒකක පිහිටුවීමයි. ඒවා බොහෝවිට සමන්විත වන්නේ විශේෂ පුහුණුව ලද කාන්තා නිලධාරිනියන්ගෙනි. එවැනි ඒකක මගින් පුළුල් පරාසයක කාර්යයන් ඉටුකළ හැකිය. පැමිණිලි සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා ලබාගැනීම, වෙනත් සේවාවන් වෙත යොමුකිරීම සහ නීතිමය ක්‍රියාමාර්ග මුලපිරීම ඒ අතර වේ. මෙම ඒකක ඇතැම්විට නඩු සම්බන්ධයෙන් මැදිහත්වීම් සිදුකරන අතර කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ විමර්ශන ද කරනු ලැබේ.	H	HIC රටවල මෙම මැදිහත්වීම්වල ඵලදායීතාව සම්බන්ධයෙන් **සාක්ෂි නැත**. කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් හෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් අතරමැදි ප්‍රතිඵල වර්ධනය කිරීම සම්බන්ධයෙන් එය අදාළ වේ.	Comisaría de la Mujer (ආර්ජන්ටිනා) Delegacias Especualizad as de Atendimento das Mulheres (බ්‍රසීලය)
		L	LMIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. කාන්තා පොලිස් ස්ථාන හෝ ඒකක පිහිටුවීම මගින් අපයෝජන වාර්තා කිරීම ඇතුළු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ද්විතීයක ප්‍රතිඵලවල වර්ධනයක් සිදුවේ.[20] කෙසේ වෙතත්, කාන්තා පොලිස් ස්ථාන මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවදානම් සාධක අඩුවන බවට සාක්ෂි මඳය. බ්‍රසීලයේ මෑතදී කරන ලද අධ්‍යයනයකට අනුව කාන්තා පොලිස් ස්ථාන පැවතීම හේතුවෙන් ඇතැම් කාන්තා කණ්ඩායම් අතර කාන්තා මිනීමැරුම් අඩුවී තිබේ.[21]	

මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
සෞඛ්‍ය සේවා හරහා හඳුනාගැනීම	තමන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදී තිබේදැයි සෞඛ්‍ය සේවා ලබාගැනීමට පැමිණෙන සියලු කාන්තාවන්ගෙන් ඇසීම හඳුනාගැනීමේ මැදිහත්වීම්වලට අයත් වේ. ඒ සඳහා සෞඛ්‍ය සේවා ලබාගැනීමට පෙර හෝ ලබාගන්නා අතරතුර ප්‍රමිතිගත මෙවලම්, ප්‍රොටොකෝල හෝ ප්‍රශ්න පරාසයක්ම භාවිතා කළ හැකිය.	H L	HIC රටවලින් ලැබෙන සාක්ෂි අනුව, හඳුනාගැනීමේ මැදිහත්වීම් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමේදී **ඵලදායී නැත**. හඳුනාගැනීමේ කාර්යයන් නිසා කාන්තාවන් ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම වැඩිවේ. එමගින් යොමුකිරීම් හෝ සේවාවන් ලබාගැනීම වැඩිවන බවට සාක්ෂි නැත.[22] රටවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවදානම් සාධක අඩුවීමට හඳුනාගැනීමේ ක්‍රියාකාරකම් ඵලදායීව ඉවහල් වන බවට LMIC රටවලින් **සාක්ෂි ලැබී නැත**.[23]	
ආයතනික පිරිස් සංවේදී කිරීම සහ පුහුණු කිරීම (ආයතනික පරිසරය වෙනස් නොකර)	පොලීසිය, අධිකරණය සහ සෞඛ්‍ය සේවා සම්පාදකයන් වැනි ආයතනික කාර්ය මණ්ඩල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දැනුවත්භාවය, වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් සංවේදී කිරීම සහ කුසලතා පාදක පුහුණුවීම් සිදුකිරීම මෙම වර්ගයේ මැදිහත්වීම්වලට ඇතුළත් වේ.	H L	HIC සහ LMIC රටවලින් ලැබෙන සාක්ෂි අනුව ආයතනික ක්‍රියාකරුවන් පුහුණු කිරීම ප්‍රචණ්ඩ ප්‍රතිඵල අවම කිරීමෙහිදී **ඵලදායී නැත**. කෙසේ වෙතත්, පුහුණුව සමාජභාවී ආකල්ප, ආයතනික ප්‍රතිපත්ති සහ වැඩසටහන් කාර්ය මණ්ඩලයට උපකාර කිරීම හරහා පද්ධතිය පුරා පැතිරී ආයතනික වෙනස්කම් සමග සම්බන්ධ කිරීමෙන් බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත් ප්‍රතිචාර වැඩිදියුණු කළ හැකිය.[24]	

උදාහරණ වැඩසටහන්

වැඩසටහන් ව්‍යුහයන් තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම අඩුකිරීමට ඉවහල් වන වැඩසටහන් තුනක් පහත වගුවෙහි සාරංශ කර දැක්වේ. මෙම වගුව 11 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
සෞඛ්‍ය සම්පන්න ක්‍රියාකාරකම් වැඩසටහන	මනෝසමාජයීය ප්‍රතිකාර මැදිහත්වීම. එය අනුරූප කරගනු ලැබුවේ 'චර්යාත්මක ක්‍රියාත්මක කිරීම' මගින් වන අතර මෙහෙයවනු ලබන්නේ විෂාධය රෝගීන් සඳහා වන උපදේශන සේවා සපයන්නන් විසිනි.	ගෝව, ඉන්දියාව	ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සායන අටක රෝගීන්. ඔවුහු මධ්‍යස්ථ දරුණු තත්වයේ සිට දරුණු තත්වය දක්වා විෂාධයෙන් පෙළෙති. ඔවුන්ට උපදේශන සේවා සපයන්නන් ප්‍රජාවේ සාමාජිකයෝය.	මනෝසමාජයීය ප්‍රතිකාරී උපදේශන සේවා සපයන්නන් මගින් මෙහෙයවනු ලැබේ. මූලික මූලෝපාය මගින් මෙහෙයවනු ලබන සැසිවලින් සමන්විතය. චර්යාත්මක ඇගයීමක් සහ ස්වයං අධීක්ෂණය, මානසික අධ්‍යාපනය, ගැටලු විසඳීම ව්‍යුහගත කළ ක්‍රියාකාරකම් එයට අයත් වේ.[25]	මාස 2 - 3 කාලය තුළදී 8ක් දක්වා සැසි පැවැත්වේ. සෑම සැසියක්ම විනාඩි 30 - 45 අතර වේ.	**ඇගයීම් ස්වරූපය:** සසම්භාවී පාලක පරීක්ෂාව (RCT)[26] **ප්‍රධාන සොයාගැනීම්:** පාලක කණ්ඩායම සමග සන්සන්දනය කළ විට මැදිහත්වීමේ කණ්ඩායමේ සහභාගී වන්නන් තුළ කැපීපෙනෙන අන්දමින් විශාල ලෙස දරුණු විශාධ ලක්ෂණ අඩුවිය (මූලික ප්‍රතිඵලය). එසේම, ආබාධිතභාවයෙහි ද, වැඩට නොපැමිණෙන දින ගණනෙහි ද, සියදිවි නසාගැනීමේ සිතුවිලිවල ද, ශාරීරික සමී සහකරු ප්‍රචණ්ඩත්වය අත්දැකීමෙහි ද (කාන්තාවන් අතර) කැපීපෙනෙන අඩුවක් සිදුවිය.[27]

මූලෝපාය සාරාංශය

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
පොදු මූලිකාංග සත්කාර එළඹුමේ (CETA) ප්‍රචණ්ඩත්වය සහ මත්පැන් ප්‍රතිකාර පරීක්ෂණය (VATU)	පොදු මූලිකාංග සත්කාර එළඹුම මගින් මානසික සෞඛ්‍යය වර්ධනය කිරීමට සහ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමටත්, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කිරීමටත් ඉලක්ක කරනු ලැබේ.[28]	සැම්බියාවේ ලුසාකාහි නාගරික සමාජයන් තුනක්	පවුල්වලින් පුද්ගලයන් තිදෙනා බැගින් වැඩිහිටි කාන්තාවක්, ඇගේ ස්වාමි පුරුෂයා හෝ සහකරු සහ පිරිමි හෝ ගැහැණු දරුවෙක් (වයස 8 - 17)	පිරිමින්, ගැහැණුන් සහ ළමයින් වෙනුවෙන් වෙන වෙනම කණ්ඩායම් සැසි පැවැත්වේ. මත්පැන් අවම කිරීමේ උපාංගය විසින් මත්පැන් ප්‍රශ්නයක් ලෙස දැනුවත් කිරීම සහ එය ප්‍රචණ්ඩත්වය සහ සමාජභාවී සමාජ සම්මතයන් සමග සම්බන්ධ වන ආකාරය දැනුවත් කිරීමට අවධානය යොමුකරනු ලැබේ. ඈඕ අන්තර්ගතය විසින් අවධානය යොමුකරනු ලබන්නේ මත්ද්‍රව්‍ය භාවිතය, සාධනීය මාපිය හා පවුල් සම්බන්ධතා, ගැටුම් කළමනාකරණය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ආකල්ප සහ විශ්වාසයන් කෙරෙහිය.[29]	සතිපතා සැසි 6 - 12. එක් සැසියක් පැය 1 - 2.	**ඇගයීම් ස්වරූපය:** RCT[30] **ප්‍රධාන සොයාගැනීම්:** පිරිමි මත්පැන් භාවිතයේ, හානිකර මත්පැන් භාවිතයේ සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ සැලකිය යුතු අඩුවක් වාර්තා කළහ. කාන්තාවෝ කැපීපෙනෙන අන්දමින් මත්පැන් භාවිතයේ අඩුවක්, හානිකර මත්පැන් භාවිතයේ අඩුවක් සහ ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදීමේ අඩුවක් පෙන්නුම් කළහ. පිරිමි සහ ගැහැණු දෙකොටසම දුබල මානසික සෞඛ්‍යයේ ලක්ෂණවල කැපීපෙනෙන අඩුවක් පෙන්නුම් කළහ.[31]
ආරක්ෂිත නිවාස සහ සෑම කෙනෙකුටම ගරුකිරීමේ (SHARE) මැදිහත්වීම්	කාලානුරූපව සිදුකරනු ලබන එච්අයිවී වැළැක්වීමේ සහ ප්‍රතිකාර සේවා සමග ඒකාබද්ධ කරන ලද ප්‍රජා පාදක බලමුළුගැන්වීම්	උගන්ඩාව	දේශීය පිරිමි සහ කාන්තා ප්‍රජා ස්වේච්ඡා සේවකයන් 40ක්. ස්වේච්ඡා ප්‍රජා උපදේශක සේවකයන් 12ක්.	වැඩසටහන විසින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ එච්අයිවී අවදානමට දායක වන ආකල්ප සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම සඳහා ප්‍රජා පාදක බලමුළුගැන්වීම්, කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සඳහා පරීක්ෂා කිරීමට හා ඉන්පසු එච්අයිවී හෙළිදරව් කිරීම සමග සම්බන්ධ ප්‍රචණ්ඩත්වය අඩුකිරීමේ මැදිහත්වීම් සමගත්, එච්අයිවී උපදේශනය සහ පරීක්ෂාවන් ලබාගැනීමට අපේක්ෂා කරන කාන්තාවන් මුහුණදෙන ප්‍රචණ්ඩත්වය සමගත් ඒකාබද්ධ කරනු ලැබේ. SHARE යනු SASA සහ Stepping Stones එළඹුම් ආදර්ශයට ගන්නා ලද වැඩසටහනකි. විෂයමාලා විසින් උසස් තත්ත්වයේ, සංස්කෘතික වශයෙන් යෝග්‍ය ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාකාරකම් පෙර සිට පවතින සෞඛ්‍ය සහ සමාජ සහයෝගිතා ව්‍යුහයන්ට සම්බන්ධ කරනු ලැබේ.	අවුරුදු 5	**ඇගයීම් ස්වරූපය:** පොකුරු සසම්භාවී ඒකක අධ්‍යයනය **බලපෑම:** පසුගිය වසර තුළදී කාන්තාවන් ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම අඩුවීම. කිනාත්වන් සහ පිරිමින් අතර එච්අයිවී පැවැත්මේ සහ එච්අයිවී හෙළිදරව් කිරීමේ අනුපාතයන් අඩුවීම.[32]

සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

සේවා සම්පාදනයේ **ඵලදායී ඵළඹුම්වල පොදු මූලිකාංග හා මූලධර්මවලට** පහත දැක්වෙන ලක්ෂණ අඩංගු වේ:

වැඩසටහන් සැලසුම් සහ අනුරූප වීම:

1. **ප්‍රාථමික වැළැක්වීමේ සහ සේවා මූලිකාංග ඒකාබද්ධ කරන ක්‍රියාත්මක කිරීමේ මැදිහත්වීම්.** ඉහළ ගුණාත්මකභාවයක් සහිත, බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සේවා මගින් කාන්තාවන්ට කතාකිරීමට සහ උපකාර සෙවීමටත්, වැළැක්වීමේ අරමුණුවලට දායක වන සුබවාදී පරිසරයක් නිර්මාණය කිරීමටත් උපකාර කළ හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම ඉහළ තත්වයක පවතින ඕනෑම ප්‍රජාවක ප්‍රාථමික වැළැක්වීම සේවා සමග ඒකාබද්ධ කිරීමෙන් වැළැක්වීමේ මැදිහත්වීම් විසින් සේවා සඳහා ඉල්ලුමක් නිර්මාණය කරනු ඇත. කාන්තාවන් කතාකිරීමට පටන් ගැනීම නිසා මෙම සේවා ක්‍රියාත්මක විය යුතු වීම එයට හේතුවයි. එක්සත් ජාතීන්ගේ අත්‍යවශ්‍ය සේවා පැකේජය සහ සෞඛ්‍ය උපාංගය වෙනුවෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට ඒකාබද්ධව ප්‍රතිචාර දැක්වීමේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙවලම් විසින් ගුණාත්මක සේවා සම්පාදනය සඳහා වන ප්‍රයෝජනවත් මාර්ගෝපදේශයක් සපයයි (උදා: ආරක්ෂාවට ප්‍රමුඛතාව ලබාදීම, බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත් ඵළඹුම්, විශ්වසනීයත්වය, රහස්‍යභාවය සහ ස්වාධිපත්‍යය). එසේම, සම්බන්ධීකරණය හරහා අංශ සහ නියෝජිතායතන සමග සම්බන්ධ කරයි.

2. **ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් වෙනුවෙන් සෞඛ්‍ය සත්කාර සම්පාදනයේදී පද්ධතිය පුරා විහිදුණු ඵළඹුමක් භාවිතා කිරීම.** පද්ධතිය පුරා විහිදුනු ඵළඹුමක් වෙනුවෙන් ප්‍රතිපත්ති, ප්‍රෙටොකෝල, යටිතල පහසුකම්, සම්පත්, කාර්ය මණ්ඩල ධාරිතාව, සමාජ භාවය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ කාර්ය මණ්ඩල ආකල්ප, සිද්ධි ලේඛනගත කිරීම, දත්ත පද්ධති සහ යොමුකිරීම් කෙරෙහි අවධානය අවශ්‍යය.[33] ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් වෙනුවෙන් සෞඛ්‍ය අංශයේ සේවා පුළුල් කිරීම සලකා බලන විට ප්‍රමාණවත් සෞඛ්‍ය යටිතල පහසුකම් සහ පද්ධති පැවතීම තහවුරු කිරීම විශේෂයෙන්ම වැදගත් වේ.[34]

3. **දැනට සිදුවන සේවා පුහුණුව පුළුල් ආයතනික ව්‍යුහයන් සමග සම්බන්ධ කිරීම.** ප්‍රචණ්ඩත්වය වැළැක්වීම, ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම හෝ සාධනීය සමාජ සම්මතයන් තනිව සැලකූ කල පුහුණු සේවා සම්පාදකයන් සම්බන්ධයෙන් හුදකලා තනි ක්‍රියාකාරකම් විසින් සේවා සම්පාදක භාවිතාවන්වල වෙනස්කම් තිරසර කරන්නේ නැත. බලපෑම් සහගත වීම සඳහා, පුහුණු අවශ්‍යතා ආයතනික ව්‍යුහයන්, කාර්යරාමු, ප්‍රතිපත්ති හෝ විෂයමාලාවලට සම්බන්ධ කළ යුතුය. ඒවා 'සමාජභාවී වශයෙන් පරිවර්තනාත්මක' වීම සඳහා පුද්ගල ආකල්ප සහ සමාජභාවය සම්බන්ධ සමාජ සම්මතයන් මෙන්ම ආයතන තුළ පවතින ප්‍රචණ්ඩත්වය, වෙනස්කම් කිරීම හා අසමානතාව සහිත පද්ධති හා ව්‍යුහයන් ද වෙනස් කිරීමට කටයුතු කළ යුතුය. වේ.[35] බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත්, ඔවුන්ගේ බහුවිධ අවශ්‍යතා සලකා බලන සහ ද්විතීයක වින්දිතකරණය අවම කරන සත්කාර සම්බන්ධයෙන් සේවා සම්පාදකයන් පුහුණුව ලබාගත යුතුය. ආරක්ෂාව තහවුරු කිරීමේදී, ගුණාත්මක සේවාවන්හිදී සහ අංශ අතර සම්බන්ධීකරණයේදී භූමිකාවන් සහ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් සේවා සම්පාදකයන්ට පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. බහු ආංශික කණ්ඩායමක් ලෙස බහුවිධ අංශවල සේවා සම්පාදකයන් අතර දියත් කරනු ලබන සේවාස්ථ පුහුණුව ද සම්බන්ධීකරණය කරන ලද ප්‍රතිචාර විධිවිධාන කෙරෙහි සාධනීය ලෙස බලපෑම් කිරීම සඳහා ඉවහල් වන බව දැකිය හැකිය.

ක්‍රියාත්මක කිරීම සහ පුළුල් කිරීම

4. **කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන් වෙනුවෙන් ප්‍රජා පාදක සත්කාර සහ සහාය ශක්තිමත් කරන්න.** මැනැවින් පිහිටුවන ලද ප්‍රජා ජාලයන් සහ සේවා සම්පාදනය සම්බන්ධයෙන් කාන්තා අයිතිවාසිකම් සංවිධාන සතුව ශක්තිමත් ඉතිහාසයක් තිබේ.[36] ප්‍රජාවේ ස්වේච්ඡා සේවකයන් හට ප්‍රජා සාමාජිකයන් සහ රාජ්‍ය නියෝජිතායතන හා වෙනත් රාජ්‍ය නොවන සේවා සම්පාදකයන් අතර වැදගත් පාලමක් ලෙස කටයුතු කළ හැකිය. එසේ කළ හැක්කේ පීඩාවන් හෙළිදරව් කරන සහ සෞඛ්‍ය සත්කාර, ආරක්ෂාව, සමාජ සුබසාධනය සහ නීතිමය සේවා ලබාගැනීමට අපේක්ෂා කරන බේරුණු පුද්ගලයන් වෙනුවෙන් යොමුකිරීම් සිදුකිරීම, කැටුව යාම සහ සහාය පිරිනැමීම මගිනි.

5. **ප්‍රජා ස්වේච්ඡා සේවකයන් පරිස්සමෙන් තෝරාගන්න, පුහුණු කරන්න, අධීක්ෂණය කරන්න.** සම්පත් හිඟ පරිසරයන්හිදී, මනෝසමාජ උපදේශනය ඇතුළු ඇතැම් වර්ගවල සේවා සැපයීමේදී ප්‍රජා ස්වේච්ඡා සේවකයන්ට වැදගත් භූමිකාවක් ඉටුකළ හැකිය. එවැනි පසුබිමකදී, ප්‍රජා ස්වේච්ඡා සේවකයන් පරිස්සමෙන් තෝරාගෙන පුහුණු කර ඔවුන් සමාජභාවී වශයෙන් ප්‍රතිචාරාත්මක, බේරුණු පුද්ගලයන්ට සහායක ආකල්පයකින් යුක්ත සහ පළමු පෙළ සහාය පිරිනැමීමට සහ බේරුණු පුද්ගලයන්ට ප්‍රතිචාරාත්මක සේවාවන් වෙත ප්‍රවේශය ලබාග ැනීමට උපකාර කිරීමට අවශ්‍ය කුසලතා සහ දැනුම සහිත අය බව තහවුරු කළ යුතුය. ස්වේච්ඡා සේවකයන් හට කාලීනව ප්‍රතිචාරාත්මක සහාය ලැබෙන බව තහවුරු කළ හැකි එක් ආකාරයක් වන්නේ පරිස්සමෙන් සංවර්ධනය කරන ලද අධීක්ෂණ/ මගපෙන්වීම් ක්‍රමයක් සම්පාදනය කිරීමයි. නිරන්තර පරීක්ෂා කිරීම්, වැදගත් සංකල්ප පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමේ සැසි සහ ඔවුන් මුහුණදෙන කිසියම් විශේෂ අභියෝග යක් තිබේ නම්, එය පිළිබඳ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබාදීම ඒ අතර වේ.

මූලෝපාය සාරාංශය

6. **කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ශාරීරික සහ මනෝසමාජයීය ආරක්ෂාවට ප්‍රමුඛතාව ලබාදෙන්න.** ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ සහ වැළැක්වීමේ මැදිහත්වීම්වලදී කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ඇතිවිය හැකි අවදානම් ස්ථාවර අධීක්ෂණය සහ ඇගයීම ඔස්සේ හඳුනාගන්නා බව තහවුරු කරන්න. එසේම, මෙම අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ වැඩිදුරටත් හානි සිදුකිරීම වළක්වාගැනීමට වැඩසටහන්වල ප්‍රමාණවත් තරම් අවම කිරීමේ පද්ධති ක්‍රියාත්මක වන බව තහවුරු කරන්න.

7. **ඇතැම් වර්ගවල ප්‍රතිචාරාත්මක මැදිහත්වීම්වල ප්‍රමාණවත් තීව්‍රතාව සහ කාලය තහවුරු කරන්න.** සාක්ෂි මගින් යෝජනා කරන පරිදි, ඇතැම් වර්ගවල ප්‍රතිචාරාත්මක මැදිහත්වීම් මගින් කාන්තාවන්ට සාධනීය බලපෑමක් සිදුවීම සඳහා ප්‍රමාණවත් තීව්‍රතාවක් සහ කාලයක් අවශ්‍යය. උදාහරණයක් ලෙස, සවිබලගැන්වීමේ උපදේශනය සහ මනෝසමාජයීය සහයෝගය සහිත උද්දේශනය එය වඩා තීව්‍ර තැන්වලදී වඩා ඵලදායී බව පෙනේ. එමගින් යෝජනා කරනු ලබන්නේ 'සැහැල්ලු ස්පර්ශය' සහිත මැදිහත්වීම් සහ කෙටි කාලරාමු ප්‍රමාණවත් නොවන බවයි.

8. **සේවා සම්පාදකයන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව, ඔවුන් දර්ශනය වීම සහ ඔවුන් කෙරෙහි විශ්වාසය වැඩිකරන්න.** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සේවා වෙත ප්‍රවේශය ලබාගැනීමේදී කාන්තාවෝ බොහෝ බාධකවලට මුහුණදෙති. ගුණාත්මක සේවා සම්පාදනය ඉලක්ක කළ ඕනෑම මැදිහත්වීමක් විසින් මෙම අභියෝග සම්බන්ධයෙන් කටයුතු කිරීමට උත්සාහ කළ යුතුය. ඒවා සංදර්භීය සහ භූගෝලීය හා ජනගහන විවිධත්වය අනුව වෙනස් වේ. භාවිතා කරන්නාට හැකි තරම් සමීප අන්දමින් ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා සේවාවන් සැපයිය යුතුය (උදා: ප්‍රාථමික සෞඛ්‍ය සේවා, ප්‍රජා පොලිස් සේවා, ජංගම අධිකරණ). සේවා සම්පාදකයන් දර්ශනය වීම ද වැදගත්ය. ප්‍රජාවන් සමග සංවාදයන්හි යෙදීම සඳහා නිරතුරුව භූමියට යාම මගින් දැනුවත්භාවය වැඩිකළ හැකිය. සේවා සම්පාදකයා කෙරෙහි විශ්වාසය ගොඩනැගීම අතිශය වැදගත් වේ. විශේෂයෙන්ම, කාන්තාවන්ට විශ්වාසය, පිළිකුලට සහ ඇණුම් බැණුම්වලට ලක්වීම පිළිබඳ ගැටලු තිබෙන විටදී එය වැදගත් වේ. එසේම, මෙම විශ්වාසය ගොඩනැගීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ද උපකාර කළ හැකිය. ඔවුන් සතු ප්‍රජා ජාලයන් එයට යොදාගත හැකිය. සංදර්භයට අනුකූල ඇතුළුවීමේ ලක්ෂ්‍යයන් භාවිතා කිරීම ද අත්‍යවශ්‍යය. උදාහරණයක් ලෙස, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සේවාවන්හිදී එම සේවා සම්පාදකයන්ට එතරම් පිළිගැනීමක් නොලැබිය හැකිය. එහෙත්, සෞඛ්‍ය කඳවුරක් වැනි අවස්ථාවකදී එසේ කිරීම ගැටලු අවම කරයි. වෛද්‍ය, මනෝසමාජයීය, නීතිමය ලේඛනගත කිරීම සහිත සහ යොමුකිරීම් සහාය ලබාදෙන සෞඛ්‍ය කඳවුරු දුෂ්කර ස්ථානවල සිටින බේරුණු පුද්ගලයන් වෙත සමීප වීම සඳහා උපකාර වේ.



ඇතුළත් වීමේ ස්ථාන

සේවාවන් විසින් බේරුණු පුද්ගලයන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ ප්‍රතිචාර විකල්ප වෙනුවෙන් වැදගත් ඇතුළත් වීමේ ස්ථාන සැපයිය හැකිය. එමගින් ප්‍රාථමික වැළැක්වීමේ වැඩසටහන් සඳහා ඇතුළත් වීමේ ලක්ෂ්‍ය ද සම්පාදනය කළ හැකිය. පහත දැක්වෙන වගුව විසින් අවධාරණය කරනු ලබන්නේ මෙම මූලෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා ඇතුළත් විය හැකි ස්ථානයි.

ඇතුළත් වීමේ ස්ථානය	තර්කනය
සෞඛ්‍ය සේවා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවා ද ඇතුළුව (මාතෘ හා ළමා සෞඛ්‍යය ඇතුළු), මානසික සෞඛ්‍ය සේවා සහ එච්අයිවී සේවා	සෞඛ්‍ය පද්ධතිය ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවාගත් පුද්ගලයන් වෙත සමීප වීම සඳහා වැදගත් ප්‍රවේශ ස්ථානයකි. එයට හේතුව වන්නේ සෞඛ්‍ය සේවා වෘත්තිකයන් යනු බේරුණු පුද්ගලයන් වෙත සමීප වන පළමු සම්බන්ධතාවන් වීමයි. සෞඛ්‍ය සේවාවන් ලබාගැනීමේදී ඇතැම්විට ඔවුන් ගැටලු සඳහා හේතුව ලෙස ප්‍රචණ්ඩත්වය විශේෂයෙන් හෙළිදරව් කරන්නේ නැත. තනි මධ්‍යස්ථානවලට වඩා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර මට්ටම්වල සේවාවන්හිදී දැනට පවත්නා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය, එච්අයිවී, මානසික සෞඛ්‍යය සහ නවයොවුන් සෞඛ්‍ය සේවා ඇතුළු සෞඛ්‍ය සේවාවන් වෙත කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඒකාබද්ධ කළ යුතු බව සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ විසින් නිර්දේශ කරනු ලැබේ. සියලු සෞඛ්‍ය සේවකයන් හට සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන කාන්තාවන් හඳුනාගැනීමට පුහුණුව ලබාදිය යුතු බව ද, ඔවුන් ඉදිරිපෙළ සහාය සහ පශ්චාත් අපයෝජන සත්කාර සැපයිය යුතු බව ද එමගින් නිර්දේශ කරනු ලැබේ. පුහුණුව විසින් ඔවුන්ගේ සමාජභාවී ආකල්ප සම්බන්ධයෙන් කටයුතු කළ යුතු අතර සෞඛ්‍ය පද්ධති පටිපාටිවල වෙනස්කම් ඒ සමග සිදුකළ යුතුය. එයට පහත දැක්වෙන අංශ අයත් වේ. සත්කාරවලට මගපෙන්වන ලිඛිත ප්‍රොටොකෝල, සත්කාර සේවා සම්පාදනයට උපකාර කිරීම පිණිස සාර්ථකත්වයට පත් බේරුණු පුද්ගලයන් යොදාගැනීම, රෝගීන් පැමිණීමේ වර්ධනය, පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය සම්බන්ධ යටිතල පහසුකම්, යොමුකිරීම් සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ලේඛනගත කිරීම් සෞඛ්‍ය තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම.[37] ඇෆ්ගනිස්තානය විසින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ අනුරූප කරගෙන ක්‍රියාත්මක කර තිබේ. පන්දහසකට වැඩි සෞඛ්‍ය සේවකයන් අවුරුදු පහක කාලය තුළදී පුහුණු කර සෞඛ්‍ය පද්ධතියේ සූදානම බොහෝ දිස්ත්‍රික්කවල වැඩිදියුණු කර තිබේ. උගන්ඩාව, නැමිබියාව, සැම්බියාව, පකිස්තානය, ඉන්දියාව සහ කාම්බෝජය ඇතුළු රටවල් විසින් ද එය ක්‍රියාත්මක කර තිබේ. පුහුණු ප්‍රජා සේවකයන් (ප්‍රජා සෞඛ්‍ය සේවකයන්, වින්නඹුවන්, ප්‍රජා මනෝසමාජ සේවකයන් ඇතුළු) හට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය විසින් ඇති කරන හානිකර බලපෑම්, උපකාර ලබාගත හැකි ආකාරය පිළිබඳ දැනුවත්භාවය නැංවිය හැකි අතර බේරුණු පුද්ගලයන් සේවා සමග සම්බන්ධ කළ හැකිය. නේපාලය හා බ්‍රසීලය වැනි රටවලදී, ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන විසින් ඉදිරිපෙළ වෘත්තික කාඩරය ප්‍රජාව සෞඛ්‍ය සේවා සමග සම්බන්ධ කිරීම සඳහා යොදාගනු ලැබේ. එසේම, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ අමතර උපකාර සෙවීමේ චර්යාවන් පිළිබඳ දැනුවත් කිරීමට ද ඔවුන් යොදාගනු ලැබේ.[38]
පොලිස් සේවා කාන්තා පොලිස් ස්ථාන/ ඒකක ඇතුළු	කාන්තා පොලිස් ස්ථාන හා ඒකක ඇතුළු පොලිස් සේවා මගින් ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ට විධිමත් අධිකරණ පද්ධති වෙත පිවිසීම සඳහා වැදගත් ඇතුළුවීමේ ස්ථානයක් සැපයිය හැකිය. එසේම, එය ප්‍රාථමික වැළැක්වීමේ මැදිහත්වීම් සමග සම්බන්ධ කළ හැකිය. කාන්තා පොලිස් ස්ථාන මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සම්බන්ධයෙන් බේරුණු පුද්ගලයන්ගේ දැක්ම වර්ධනය කළ හැකි බවට සාක්ෂි ප්‍රමාණයක් තිබේ. එහෙත්, එමගින් ඇත්ත වශයෙන්ම ප්‍රචණ්ඩත්වයේ පැවැත්ම අඩුවෙනවාද යන කරුණ සම්බන්ධයෙන් සාක්ෂි තිබෙන්නේ මඳ වශයෙනි. කෙසේ වෙතත්, ලේඛන මගින් යෝජනා කරන පරිදි, කාන්තා පොලිස් ස්ථාන මගින් බේරුණු පුද්ගලයන්ට අධිකරණ සේවා වෙත ප්‍රවේශය ලබාදිය හැකිය. එමගින් අනිවාර්යයෙන්ම වැරදිකරුවන්ට නඩු පැවරීමක් සිදුවන බව ප්‍රකාශ වන්නේ නැත.[39] වෙනත් පොලිස් හා අධිකරණ ප්‍රතිචාර මැදිහත්වීම් අතරට නඩු පැවරීමේ ක්‍රියාමාර්ග හා ආරක්ෂාව සැලසීමේ නියෝග ආදිය අයත් වේ. එමගින් ප්‍රචණ්ඩත්වය නැවත සිදුවීම, උත්සන්න වීම සහ ප්‍රචණ්ඩත්වයේ තර්ජන වළක්වාගත හැකිය.[40] ආර්ජන්ටිනාවේ Comisaria de la Mujer කාන්තා පොලිස් ස්ථානවලට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ බලය හිමිවේ. එය කළ යුතු වන්නේ පොලිස් බහු ආංශික සේවා සම්පාදනයේ ආදර්ශයක් ඔස්සේය. ඒ සමග සමාජ සේවකයෝ, නීතිඥවරු සහ මනෝ විද්‍යාඥයෝ ද සම්බන්ධ වෙති. දැනුවත්භාවය නිර්මාණය කිරීමේ ක්‍රියාමාලා සහ දේශීය වැළැක්වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය මගින් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා පොලිස් ස්ථාන පාසල්, ප්‍රාදේශීය ප්‍රජා කණ්ඩායම් සහ පළාත් පාලන ආයතන සමග ද සම්බන්ධ වේ. එහි ඉලක්කය වන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ධාවනය කරන සෘණාත්මක සමාජ සම්මතයන් වෙනස් කිරීමයි. Comisaria de la Mujer පිළිබඳ කරන ලද අධ්‍යයනයක් මගින් කාන්තා පොලිස් ස්ථාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පාඩම් කීපයක් ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රමාණවත් සම්පත් ලබාදීම සහ පොලිසියට හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දක්වන පළමු පුද්ගලයන් වන වෙනත් කාර්ය මණ්ඩලවලට උපදේශනය හා ස්වයං ආරක්ෂණ සහාය සැපයීමේ අවශ්‍යතාව ද එයට ඇතුළත් වේ.

වැදගත් සම්පත්

සෞඛ්‍ය සේවා

Responding to intimate partner violence and sexual violence against women: WHO clinical and policy guidelines. Geneva: World Health Organisation. 2013.
මෙම ප්‍රයෝජනවත් ලේඛනය විසින් කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම අර්ථ නිරූපණය කරයි. මිනුම් රාමුවක් සහ දර්ශක සපයයි. කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම එයට අයත් වේ.

Responding to children and adolescents who have been sexually abused: WHO clinical guidelines. Geneva: World Health Organisation. 2017
ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ මූලික වශයෙන් අඩු සම්පත් සැකසීම් වලින්, දිවි ගලවා ගත් අයට සාක්ෂි මත පදනම් වූ, ගුණාත්මක භාවයෙන් යුතුව, ක්ෂතියෙන් තොරව සත්කාර සැපයීම සඳහා ඉදිරි පෙළ සෞඛ්‍ය සේවකයින්ට උපකාර කිරීම අරමුණු කර ගෙන ඇත. දරුවන්ගේ සහ නව යොවුන් වියේ දරුවන්ගේ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම, තේරීම් ඉදිරිපත් කිරීම සහ කැමැත්තට සහ ස්වාධීනත්වයට ගරු කිරීමේ වැදගත්කම මාර්ගෝපදේශ මගින් අවධාරණය කෙරේ.

Health care for women subjected to IPV and Sexual Violence: A clinical handbook. Geneva: World Health Organisation. 2014
ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙම සායනික අත්පොත ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් සඳහා සෞඛ්‍ය සේවා සපයන්නන්ට උපකාර කිරීම අරමුණු කර ගෙන ඇත. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත් කිරීම්, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ ලිංගික හිංසන සඳහා පළමු පෙළ සහාය, ලිංගික අතවරවලින් පසු අතිරේක සායනික සත්කාර සහ මානසික සෞඛ්‍යය සඳහා අමතර සහාය එහි ඇතුළත් වේ.

Strengthening health systems to respond to women subjected to intimate partner violence or sexual violence: A manual for health managers. Geneva: World Health Organisation. 2017
ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙම අත්පොත ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අයට රහසිගත, ඵලදායී සහ කාන්තා කේන්ද්‍රීය සේවාවන් සැපයීම සඳහා සෞඛ්‍ය පද්ධති ශක්තිමත් කිරීමට සහ සක්‍රීය කිරීම සඳහා අදාළ සෞඛ්‍ය කළමනාකරුවන් ඉලක්ක කර ඇත.

Caring for women subjected to violence: A WHO curriculum for training health-care providers. Geneva: World Health Organisation. 2019
මෙම විෂය මාලාව සැලසුම් කර ඇත්තේ ගෘහස්ථ/ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ කාන්තාවන්ට එරෙහි ලිංගික හිංසනයට ප්‍රතිචාර දැක්වීම සඳහා සෞඛ්‍ය සේවා සපයන්නන්ට පදනමක් සැපයීම සඳහා ය. විෂය මාලාව කුසලතා ගොඩනැගීමට සහ ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අය කෙරෙහි සේවා සපයන්නන්ගේ ආකල්ප ආමන්ත්‍රණය කිරීමට උත්සාහ කරයි.

Psychological therapies for women who experience intimate partner violence. Tan, M., O'Doherty, L., Gilchrist, G., Taft, A., Feder, G., Tirado Munoz, J., Chondros, P., Sadowski, L. & Hegarty, K., Cochrane Systematic Review. 2018.
මෙම Cochrane සමාලෝචනය සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්විඳින කාන්තාවන් සඳහා මනෝවිද්‍යාත්මක මැදිහත්වීම් වල සඵලතාවය තක්සේරු කරයි.

Screening women for intimate partner violence in healthcare settings. O'Doherty L, Hegarty K, Ramsay J, Davidson LL, Feder G, Taft A. Cochrane Database of Systematic Reviews 2015.
මෙම Cochrane සමාලෝචනය (යාවත්කාලීන කිරීම) විසින් සෞඛ්‍ය ආරක්ෂණ සැකසුම් තුළ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කාන්තාවන් පරීක්ෂා කිරීම පිළිබඳ සාක්ෂි පරීක්ෂා කරයි. පරීක්ෂා කිරීම මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හඳුනාගැනීම වැඩි වන අතර, පූර්ව ප්‍රසව ගර්භනී කාන්තාවන් පරීක්ෂා කිරීමේදී සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අනාවරණය කිරීමට වැඩි ඉඩක් ඇති බව සොයා ගනී. කෙසේ වෙතත්, පරීක්ෂාව සෞඛ්‍ය ප්‍රතිඵලවලට සහ ප්‍රචණ්ඩත්වයට නැවත නිරාවරණය වීමට බලපාන බවට ප්‍රමාණවත් සාක්ෂි නොමැත.

පොලිස්, අධිකරණ හා සමාජ සේවා

Essential services package for women and girls subject to violence. UNWOMEN, UNFPA, WHO, UNDP and UNODC, 2015.
මෙය ප්‍රචණ්ඩත්වය අත්විඳින කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා සේවා සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරන පුළුල් සම්පත් සහ මාර්ගෝපදේශ පැකේජයකි. 2017 දී ප්‍රකාශයට පත් කරන ලද ක්‍රියාත්මක කිරීම පිළිබඳ අතිරේක මොඩියුලයක් සමඟ සෞඛ්‍ය, යුක්තිය සහ පොලිස්, සමාජ සේවා සම්බන්ධීකරණය සහ පාලනය පිළිබඳ මොඩියුල එයට ඇතුළත් වේ. (මෙතැනින් ලබාගත හැකිය)

UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls.
එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අතථ්‍ය දැනුම මධ්‍යස්ථානය සතුව සෞඛ්‍යය, යුක්තිය සහ ආරක්ෂාව ඉලක්ක කරගත් මැදිහත්වීම් හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට වෙත නවාතැන් ප්‍රතිචාර දැක්වීම්වලට අදාළ මාර්ගෝපදේශ, සිද්ධි අධ්‍යයන සහ පොරොන්දු වූ පරිචයන් පිළිබඳ උදාහරණ ඇතුළුව අදාළ සම්පත් පරාසයක් ඇත.

The implementation and effectiveness of the one stop centre model for intimate partner and sexual violence in low- and middle- income countries: a systematic review of barriers and enablers, Olsen, R.M, García-Moreno, C. and Colombini, M. BMJ Glob Health. 2020; 5(3): e001883
මෙම ක්‍රමානුකූල සමාලෝචනය කාර්ය මණ්ඩලයේ කාල සීමාවන් සහ මූලික වෛද්‍ය සැපයුම් නොමැතිකම ඇතුළුව, එක් ස්ථානයකින් සියලු සේවා ලබාගත හැකි මධ්‍යස්ථාන ආකෘතිය ක්‍රියාත්මක කිරීමට සහ ඵලදායී වීමට ඇති බාධක කිහිපයක් හඳුනා ගනී. එය ප්‍රමිතිගත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සහ නිතිපතා අන්තර් සම්බන්ධතා රැස්වීම් වැනි සක්‍රීය කරන්නන් ද අවධාරණය කරයි.

පසු සටහන

[1] UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) UN Essential Services Package and Guidelines. සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් ඉහත ප්‍රයෝජනවත් සම්පත් අංශයෙහි දැක්වෙන ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ සහ මෙවලම් බලන්න.

[2] UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) Ibid.

[3] UN Women (2012) UN Handbook for Legislation on Violence against Women, New York: UN Women.

[4] These should be provided in line with the WHO clinical and policy guidelines for responding to intimate partner violence and sexual violence (2013)

[5] Ibid.

[6] Ibid.

[7] UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) Ibid.

[8] Here we use the term intermediate outcome to indicate an outcome that is part of the theory of change or pathway to reducing VAW prevalence. Secondary outcomes are not necessarily part of a theory of change but are other desirable outcomes associated with women's rights and wellbeing.

[9] García-Moreno, C., Hegarty, K., Lucas d'Oliveira, A.F., Koziol-Maclain, J., Colombini, M. & Feder G (2014) The health-systems response to violence against women. Lancet; Jewkes, R., Mclean Hilker, L., Khan, S., Busiello, F & Fraser, E. (2015) Response mechanisms to prevent violence against women and girls. What works to prevent violence against women and girls – Evidence Review 3; Ellsberg, M., Arango DJ., Morton, M., Gennari, F., Kiplesund, S., Contreras, M. & Watts, C. (2015) Prevention of violence against women and girls: what does the evidence say? Lancet, 385: 1555-66.

[10] Rivas, C., Ramsay, J., Sadowski, L. et al. (2016) Advocacy interventions to reduce or eliminate violence and promote the physical and psychosocial wellbeing of women who experience intimate partner abuse. Campbell Systematic Reviews, 2016:2, DOI: 10.4073/ csr.2016.2; Tirado-Muñoz, J., Gilchrist, G., Farré, M. et al. (2014) The efficacy of cognitive behavioural therapy and advocacy interventions for women who have experienced intimate partner violence: A systematic review and meta-analysis. Annals of Medicine, 46(8).

[11] Cripe, SM., Sanchez, S., Sanchez, E. et al. (2010) Intimate partner violence (IPV) during pregnancy: A pilot intervention program in Lima, Peru. Journal of Interpersonal Violence, 25(11): 2054-2076.

[12] Parker, B., McFarlane, J., Soeken, K. et al. (1999) Testing an intervention to prevent further abuse to pregnant women. Research in Nursing and Health, 22(1): 55-66; Tiwari, A., Leung, WC., Leung, TW. et al. (2005) A randomised controlled trial of empowerment training for Chinese abused pregnant women in Hong Kong. Obstetrics & Gynaecology, 112(9): 1249-1256; Cripe et al. (2010) Ibid; Sapkota, D., Baird, K., Saito, A. & Anderson, D. (2019) Interventions for reducing and/or controlling domestic violence among pregnant women in low- and middle-income countries: a systematic review, Systematic Reviews, 8(79).

[13] Jewkes et al. (2015) Ibid; Sullivan, CM. (2012) Domestic violence shelter services: A review of the empirical evidence. Harrisburg: National Resource Center on Domestic Violence.

[14] Jewkes et al. (2015) Ibid; Hayes, C. (2014) Tackling gender-based violence with technology: Case studies of mobile and internet technology interventions. STATT.

[15] UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) Module 5: Coordination and Governance of Coordination; UN Women (2019) Coordinated Responses, Virtual Knowledge Centre to End VAW.

[16] Olsen, R.M, García-Moreno, C. and Colombini, M. (2020) The implementation and effectiveness of the one stop centre model for intimate partner and sexual violence in low- and middle-income countries: a systematic review of barriers and enablers, BMJ Glob Health. 2020; 5(3): e001883; WHO (2013) Responding to intimate partner violence and sexual violence against women: WHO clinical and policy guidelines. Geneva: World Health Organisation

[17] Jewkes et al. (2015) Ibid; Kirk, L., Terry, S., Lokuge, K. & Watterson, J. (2017) Effectiveness of secondary and tertiary prevention for violence against women in low and low-middle income countries: a systematic review. BMC Public Health, 17: 622; Keesbury, J., Onyango-Ouma, W., Undie, CC., et al. (2012) A review and evaluation of multi-sectoral response services ('one-stop centers') for gender-based violence in Kenya and Zambia. Nairobi: Population Council.

[18] Tarzia, L., Forsdike, K & Feder, G. (2017) Interventions in health settings for male perpetrators or victims of intimate partner violence. Trauma, Violence & Abuse, 21(1); Stephens-Lewis, D., Johnson, A., Huntley, A. et al. (2019) Interventions to reduce intimate partner violence perpetration by men who use substances: A systematic review and meta-analysis of efficacy. Trauma, Violence and Abuse, doi: 10.1177/1524838019882357; Ramsoomar, L., Gibbs, A., Machisa, M. et al. (2019) Associations between alcohol, poor mental health and intimate partner violence. Evidence Review, What Works to Prevent Violence Against Women and Girls Global Programme; Kerr-Wilson, A., Gibbs, A., McAslan, FE., Ramsoomar, L., Parke, A., Khuwaja, HMA. & Jewkes, R. (2020) A rigorous global evidence review of interventions to prevent violence against women and girls. What Works to prevent violence against women and girls global programme, Pretoria, South Africa.

[19] Arango D, Morton M, Gennari F, Kiplesund S, Contreras M, Ellsberg M. (2014) Interventions to reduce or prevent violence against women and girls: a systematic review of reviews. Washington, DC: Women's Voice, Agency and Participation Research Series, World Bank. Stephens-Lewis, D., Johnson, A., Huntley, A. et al. (2019) Interventions to reduce intimate partner violence perpetration by men who use substances: A systematic review and meta-analysis of efficacy. Trauma, Violence and Abuse. Feder, L., Austin, S., & Wilson, D. (2008) Court Mandated Interventions for Individuals Convicted of Domestic Violence. Campbell Systematic Review (12); UN Women (2010) Perpetrators of Violence / Batterers, Virtual Knowledge Centre to End VAW; ANROWS (2020) Working with perpetrators of domestic and family violence; ANROWS Notepad.

[20] Nair, S., Darak, S., Bhumika T.V, Darak, T., Mathews, M., Devi, L.D.Ratheebhai V, and Dave, A (2017) Gender-responsive policing initiatives designed to enhance confidence, satisfaction in policing services and reduce risk of violence against women in low and middle income countries - A systematic review . London: EPPI-Centre, University College London.

[21] Perova, E. & Reynolds, SA. (2017) Women's police stations and intimate partner violence: Evidence from Brazil. Social Science & Medicine, 174: 188-196.

[22] O'Doherty L, Hegarty K, Ramsay J, Davidson LL, Feder G, Taft A. (2015) Screening women for intimate partner violence in healthcare settings. Cochrane Database of Systematic Reviews.

[23] O'Doherty L, et al. (2015) Ibid. WHO (2013) Ibid.

[24] WHO (2013) Ibid; Ellsberg et al. (2015) Ibid; Morrison, A., Ellsberg, M. & Bott, S. (2007) Addressing gender-based violence: a critical review of interventions. The World Bank Research Observer, 22(1): 25-51. Feder, F., et al (2011) Identification and Referral to Improve Safety (IRIS) of Women Experienc-

ing Domestic Violence With a Primary Care Training and Support Programme: A Cluster Randomised Controlled Trial, Lancet, 378(9805):1788-95.

[25] Patel, V., Weobong, B., Nadkarni, A. et al. (2014) The effectiveness and cost-effectiveness of lay counsellor-delivered psychological treatments for harmful and dependent drinking and moderate to severe depression in primary care in India: PREMIUM study protocol for randomized controlled trials. Trials, 15: 101.

[26] Ibid.

[27] Patel, V., Weobong, B., Weiss, HA., Anand, A., Bhat, B., Katti, B. et al. (2016) The Health Activity Program (HAP), a lay counsellor-delivered brief psychological treatment for severe depression, in primary care in India: a randomised controlled trial. The Lancet, 389(10065): 176-185.

[28] Jewkes et al. (2015) Ibid.

[29] https://www.whatworks.co.za/about/global-programme/global-programme-projects/item/99-violence-alcohol-treatment- zambia-vatu

[30] Kane et al. (2017) Ibid.

[31] Ramsoomar et al. (2019) Ibid.

[32] The Prevention Collaborative (2019a) Study Summary: Integrating IPV and HIV Prevention: Impacts of the SHARE Intervention in Uganda

[33] García-Moreno, C., Hegarty, K., d'Oliveira, A., Koziol-McLain, J., Colombini, M., Feder, G. (2015) The Health-Systems Response to Violence Against Women, Lancet, 385(9977):1567-79; UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls, Health Module.

[34] Colombini, M., Mayhew, SH., Ali SH., Shuib, R. & Watts, C. (2012) An integrated health sector response to violence against women in Malaysia: lessons for supporting scale up. BMC Public Health, 12: 548.

[35] For example, teenage pregnancies caused by schoolteachers or negative attitudes from healthworkers to women living with HIV. See Orza, L., Bewley, S., Tyler Crone, E., Mworeko, L., Namiba, A., Otieno, T., Vazquez, M. & Welbourn, A. (2017) Ask women living with HIV what's needed to achieve safe pregnancies in serodifferent relationships, J Int AIDS Soc. 2017; 20(Suppl 1): 21469.

[36] Esplen, E. (2013) Leaders for change: why support women's rights organisations? London: Womankind Worldwide

[37] WHO (2013) Ibid.

[38] Perry, H., Zulliger, R., Scott, K., Javadi, D. & Gergen, J (2013) Developing and Strengthening Community Health Worker Programs at Scale A Reference Guide for Program Managers and Policy Makers, Baltimore: Jhpiego Corporation; Thapa, A., Betron, M., Amatya, R., Thapa, K., Schuster, A., & Arlotti-Parish, E. (2019) The Feasibility and Acceptability of Female Community Health Volunteers Facilitating GBV Survivor Care and Support In Nepal, Presentation at SVRI Forum, 2019; See also Jhpiego website

[39] Jubb, N. et al. (2010) Women's police stations in Latin America: An entry point for stopping violence and gaining access to Justice. Quito: CEPLAES, IDRC.

[40] Cordier, R., Chung, D., Wilkes-Gillan, S. and Speyer, R. (2019) The Effectiveness of Protection Orders in Reducing Recidivism in Domestic Violence: A Systematic Review and Meta-Analysis, Trauma, Violence & Abuse; UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) Ibid (Module 3); UN Women (2019) Security Module, Virtual Knowledge Centre to End VAWG; UNODC (2010) Handbook on Effective police responses to violence against women, Vienna: UNODC.

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT වියුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women, World Health Organization and Social Development Direct (2020) Services Ensured, RESPECT: Preventing Violence against Women Strategy Summary.

RESPECT WOMEN

මූලෝපාය සාරාංශය

දිළිඳුකම අවම කිරීම

(Poverty reduced)

UN WOMEN

World Health Organization

දිළිඳුකම අවම කිරීම

මූලෝපායේ අරමුණ : කාන්තාවන් හෝ පවුල් ඉලක්ක කර සිදුකරනු ලබන මුදල් ලබාදීම්, ඉතුරුම්, ක්ෂුද්‍ර මූල්‍ය ණය සහා ශ්‍රම බලකා මැදිහත්වීම් ඔස්සේ දිළිඳුකම දුරලීම.

තාර්කිකත්වය

දිළිඳුකම[1] සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර තිබෙන සම්බන්ධය ඉතා පැහැදිලි කාරණයකි. දිළිඳු පවුල්වල කාන්තාවෝ ප්‍රචණ්ඩත්වයේ[2] වැඩි අවදානමකට ලක්වෙති. ගෝලීය වශයෙන්ම, දිළිඳු ජීවිත ගතකරන ජනතාව බොහෝවිට ජීවත් වන්නට වැඩි ඉඩක් තිබෙන්නේ ගැටුම් වැඩි ස්ථානවලය. ඔවුන්ට සහායක සේවා ප්‍රමාණවත් නැත. නීති පද්ධති ද දුර්වලය.[3] දිළිඳුකම හේතුවෙන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අවදානම ද වැඩි වේ. සෞඛ්‍ය ගැටලු, අවම අධ්‍යාපනික අවස්ථා සහ ගෘහ ජීවිතයේ ආතතිය ද එයට අයත් වේ. ඒ අතරතුර, ප්‍රචණ්ඩත්වය හේතුවෙන් කාන්තාවන් දිළිඳුභාවයට පත්වීමේ අවදානම වැඩිවේ. සෘජු ප්‍රචණ්ඩත්වයේ පිරිවැය එයට හේතුවයි. සෞඛ්‍යය වෙනුවෙන් තමන්ගේ අතින් වියදම් කිරීමට සිදුවීම සහ ආදායම් ඵලදායීතාව අඩුවීම වැනි වක්‍ර වියදම් ද එයට හේතු වේ.[4] ඒ අනුව, මෙම කාරණා දෙක අතර සම්බන්ධය එකිනෙක පෝෂණය කරන එකකි. එමගින් නිර්මාණය කරනු ලබන්නේ යහපත් හෝ අයහපත් චක්‍රයකි.

දිළිඳුකම අවම කිරීම සහ ආර්ථික ආරක්ෂාව වැඩිකිරීම අරමුණු කරගත් මැදිහත්වීම් විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බලාපොරොත්තු සහගත හා පිරිවැය අතින් කාර්යක්ෂම විසඳුම් සම්පාදනය කළ හැකිය. විශේෂයෙන්ම, දිළිඳුකම හා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අතර ද්විපාර්ශ්වීය සම්බන්ධතා එයට හේතු වේ (1 රූපය බලන්න). මෙම දිළිඳුභාවය අවම කිරීමේ වැඩසටහන් කාන්තාවන් විශේෂයෙන් ඉලක්ක කරනමුත්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ අවධානයක් නොමැති විටදී පවා මෙය අදාළ විය හැකිය.[5] එම නිසා, මෙම මූලෝපාය විසින් සමාජයේ මහා පරිමාණ ආරක්ෂක ජාලයන් තත්වයෙන් උසස් කිරීම ඉලක්ක කරනු ලැබේ. මුදල් ලබාදීම, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම, පුළුල් කිරීම සඳහා පෙර නොවූ අවස්ථා ලබාදීම ඒ අතර වේ.



1 රූපය: දිළිඳුකම සහ කාන්තාවන් ප්‍රචණ්ඩත්වය අත්දැකීම අතර ද්වි දිශා සම්බන්ධය. රූපය උපුටාගැනීම: Gibbs, Duvvury and Scriver (2017) What Works Evidence Review: The relationship between poverty and intimate partner violence

මූලෝපාය සාරාංශය

අවදානම් සහ ආරක්ෂක සාධක

මෙම මූලෝපාය විසින් පහත දැක්වෙන දිළිඳුභාවය අවම කිරීමේ අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉලක්ක කරයි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන ආරක්ෂණ සාධක ප්‍රවර්ධනය කරයි.

මට්ටම	අවදානම් සාධක	ආරක්ෂණ සාධක
පුද්ගල	ආර්ථික අනාරක්ෂිතබව (කාන්තා සහ පිරිමි) දිළිඳුකම සමග සම්බන්ධ ආතතිය සහ චර්යාවන් හැඩග ස්වාගැනීමේ දුර්ව (පිරිමි සහ කාන්තා) අඩු ස්වයං සඵලතාව සහ ස්වයං අභිමානය (කාන්තා)	ආර්ථික ආරක්ෂිතබව (කාන්තා සහ පිරිමි) මනෝසමාජයීය යහපැවැත්ම (පිරිමි සහ කාන්තා) ඉහළ ස්වයං සඵලතාව සහ ස්වයං අභිමානය (කාන්තා) මූල්‍ය ස්වාධීනත්වය (කාන්තා)
අන්තර් පුද්ගල	අනාරක්ෂිත සහ අස්ථාවර ගෘහ ආර්ථික තත්වයන් (ධනය හා මූල්‍ය දේපළ මඳවීම සහ ආහාර අනාරක්ෂිතභාවය) ඉහළ මට්ටමේ ගෘහ ආතතිය සහ පවුල තුළ ගැටුම් සමීප සම්බන්ධතාවල සහ නීතියෙන් ඥාති වූවන් සමග ඉහළ මට්ටමේ අසමානතාව	ආරක්ෂිත සහ ස්ථාවර පවුල් ආර්ථික තත්වය (ඉහළ මට්ටමේ ධනය, මූල්‍ය සම්පත් සහ ආහාර ආරක්ෂිතබව) පහළ මට්ටම්වල ගෘහ ආතතිය සහ පවුල තුළ ගැටුම් අවම වීම සමාජභාවී සමානාත්මතාව සහිත සමීප සම්බන්ධතා. පොදුවේ තීරණ ගැනීම සහ ගෘහ වගකීම් මෙයට අයත් වේ.
ප්‍රජාව	ඉහළ මට්ටමේ දරිද්‍රතාව සහ විරැකියාව ආර්ථික හේතු මත සිදුවන අපරාධවල ඉහළ මට්ටම්	පහළ මට්ටම්වල දරිද්‍රතාව සහ විරැකියාව ආර්ථික හේතු මත සිදුවන අපරාධවල පහළ මට්ටම්
සමාජයීය	කාන්තා රැකියා නියුක්තියේ පහළ මට්ටම් ආර්ථික කම්පනයන් (ආර්ථිකය කඩාවැටීම, ආපදා, ගැටුම්)	කාන්තා රැකියා නියුක්තියේ ඉහළ මට්ටම් ශක්තිමත් ආර්ථික සමාජ ජාල සහ සමාජ ආරක්ෂාව[6] ආර්ථික ස්ථාවරත්වය

මූලෝපාය සාරාංශය

වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහන විසින් සරල කරන ලද වෙනස් කිරීමේ න්‍යායක් ඉදිරිපත් කරනු ලැබේ. දිළිඳුභාවය අවම කිරීමේ වැඩසටහන් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම විය හැකි ආකාරය එමගින් නිරූපණය කරනු ලැබේ. ඒ සඳහා විශේෂිත වැඩසටහන් වැඩිදුර සංවර්ධනය කිරීම හා අනුරූප කරගැනීම අවශ්‍යය.

P: දිළිඳුකම අවම කිරීම



මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ග

මෙම මූලෝපාය යටතේ වන මැදිහත්වීම්වල මූලික අරමුණ වන්නේ දිළිඳුකම දුරලීම හා සංවර්ධන ප්‍රතිඵල වර්ධනය කිරීමයි. පහත දැක්වෙන වගුව මගින් RESPECT රාමුවෙහි දිළිඳුකම දුරලීමේ මැදිහත්වීම්වල ප්‍රධාන සුලබ මැදිහත්වීම් තුනක් දක්වනු ලැබේ. සෑම මැදිහත්වීමක් මගින්ම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට සිදුවන බලපෑම පිළිබඳ දැනට තිබෙන සාක්ෂි පදනමෙහි සාරාංශයක් ද, ඒවා ක්‍රියාත්මක තැන්වල උදාහරණ වැඩසටහන් ද එහි දැක්වේ.[7] මෙම දර්ශවාදය පරිසමාප්ත නැත. අනාගත සමීක්ෂණ විසින් දැනුම පුළුල් කරනු ඇත. විශේෂයෙන්ම, කාන්තාවන්ගේ දේපළ හිමිකාරිත්වයට හෝ ඉඩම් හෝ නිවාසවල උරුමය ඉල්ලාසිටීමට සහයෝගී මැදිහත්වීම් සම්බන්ධයෙන් එසේ සිදුවනු ඇත.[8] මෙම මූලෝපාය යටතේ වඩාත්ම බලාපොරොත්තු සහගත මැදිහත්වීම වන්නේ ආර්ථිකමය පිරිනැමීම්ය. අමතර උපාංග නොමැති ශ්‍රම බලකාය සහ ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් මැදිහත්වීම් කාන්තාවන්ගේ සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම් අවම කිරීමේ තනි මැදිහත්වීම් ලෙස නිර්දේශ කරනු නොලැබේ.

යතුර

- ● **බලාපොරොත්තු සහගත,** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය,** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම,** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
කොන්දේසි සහිත/ රහිත මුදල් වව්චර ලබාදීම සහ භාණ්ඩ ලෙස කරන පිරිනැමීම් ඇතුළු ආර්ථික පිරිනැමීම්	මධ්‍යම මට්ටමේ ආදායම් සහිත රටවල දිළිඳුකම අවම කිරීමේ හා දිළිඳු හා අවදානමට ලක්වන ජනයාගේ ජීවිත වර්ධනය කිරීමේ මෙවලම් ලෙස සෘජුව පවුල්වලට දෙන මුදල්, ආහාර වව්චර වැනි ආර්ථික පිරිනැමීම් වේගයෙන් පුළුල් වෙමින් තිබේ. එළඹුම, ක්‍රමවේදය හා බෙදාහරින යාන්ත්‍රණය අනුව ආර්ථික පිරිනැමීම් සැලකිය යුතු තරමින් වෙනස් වේ. විශේෂිත චර්යාවන් සම්බන්ධයෙන් ඒවා කොන්දේසි සහිත හෝ රහිත විය හැකිය. ළමා සෞඛ්‍ය නිරීක්ෂණයන්, පාසල් පැමිණීම හෝ පෝෂණ උපදේශනයන්ට සහභාගී වීම් එවැනි ඒවාය. ඒවා රාජ්‍ය මූලික මහා පරිමාණ ජාතික සමාජ ආරක්ෂණ වැඩසටහන් හෝ රාජ්‍ය නොවන සංවිධානවල කෙටිකාලීන මැදිහත්වීම්වල කොටස් විය හැකිය. පිරිනැමීම්වල ප්‍රතිලාභීන් සාමාන්‍යයෙන් ගත් කල ගෘහ මූලිකයා හෝ පවුලේ කාන්තාවක් වේ. එය සිදුවන්නේ වැඩසටහනේ අභිමතාර්ථය අනුවයි.	L H	LMIC රටවලින් **බලාපොරොත්තු ඇතිකරන සාක්ෂි** ලැබී තිබේ. දිළිඳු පවුල්පලට ආර්ථික පිරිනැමීම් සිදුකිරීමෙන් ප්‍රචණ්ඩ ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් සිදුවී තිබේ. මුදල් ලබාදීම් සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධය පිළිබඳ අධ්‍යයනය 22ක සමාලෝචන අයත් වේ. එම අධ්‍යයන අතරින් 73%ක් විසින් පෙන්වාදෙනු ලැබුවේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අඩුවීමකි.[9] HIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** ප්‍රමාණාත්මක සාක්ෂි මගින් නිරූපණය කරන පරිදි, ශාරීරික සහ/හෝ සහ හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අවම වීම් ප්‍රබලය. චිත්තවේගී අපයෝජනය හා පාලන චර්යාවන් වැනි වෙනත් ප්‍රචණ්ඩත්ව ස්වරූප සම්බන්ධයෙන් බලපෑම ඉතා දුර්වලය.[10] ගුණාත්මක සාක්ෂි මගින් නිරූපණය කරනු ලබන්නේ මෙම අඩුවීම් ප්‍රධාන මාර්ග තුනක් ඔස්සේ සිදුවිය හැකි බවයි. 1) පවුලේ ආර්ථික සුරක්ෂිතබව සහ චිත්තවේගී යහපැවැත්ම වැඩිවීම 2) පවුල තුළ ගැටුම් අවම වීම 3) කාන්තාවන්ගේ සවිබලගැන්වීම වැඩිවීම. ඉලක්ක කිරීම හා ක්‍රමවේදය අදාළ වන ආකාරය (විශේෂයෙන්ම කාන්තාවන්ටම එම ප්‍රතිලාභ ලැබෙන්නේ නම්) සහ වෙනත් මූලෝපායන් සමග කෙතරම් හොඳින් ඒකාබද්ධ විය හැකිද යන කරුණ තේරුම්ගැනීම සඳහා වැඩිදුර සාක්ෂි අවශ්‍යය (බලන්න **Empowerment of Women RESPECT Strategy Summary**). වැඩසටහන් කාලරාමුවලට ඔබ්බෙන් ප්‍රතිඵල තිරසර වන්නේද, ඒ කෙසේද යන්න සහ ගැටුම් පසුබිම්වලදී එමගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කළ හැකිද යන්න එමගින් අවබෝධ කරගත හැකිය.[11]	ලෝක ආහාර වැඩසටහනේ උතුරු ඉක්වඩෝරයේ ආර්ථික ප්‍රදාන සහ බංග්ලාදේශයේ පෝෂණ වැඩසටහන්කරණය සමග සම්බන්ධ ආර්ථික ප්‍රදාන දකුණු අප්‍රිකාවේ HPTN 068[12]

මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
රැකියා ප්‍රතිපත්ති සහ ජීවනෝපාය හා රැකියා පුහුණුව ඇතුළු ශ්‍රම බලකා මැදිහත්වීම්	මෙම මැදිහත්වීම් මගින් පුද්ගලයකුට හෝ පවුලකට හෝ ආර්ථික දේපළ සංවර්ධනය කරගැනීම සඳහා උපකාර කරනු ලැබේ. ඒ රැකියා වැඩිකිරීම, ශ්‍රම බලකා සහභාගීත්වය හෝ ආදායම් සහ ආදායම් උත්පාදන අවස්ථා (ජීවනෝපාය පුහුණුව හෝ ඵලදායී දේපල පිරිනැමීම් හා වැඩ හා පොදු කාර්යයන් සඳහා මුදල් ලබාදීම) ඔස්සේය.	L H	HIC රටවලින් **බලාපොරොත්තු සහගත ප්‍රතිඵල** ලැබී තිබේ. ඒ කාන්තාවන්ගේ රැකියා වැඩිකිරීම මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුවිය හැකි බවටය. LMIC රටවල් වෙතින් **වැඩිදුරටත් සාක්ෂි අවශ්‍යය**. රටවලින් දැනට ලැබී තිබෙන සාක්ෂි අනුව දක්නට ලැබෙන්නේ මෙම මැදිහත්වීම් මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම්ව ල ආරක්ෂක සාධක සම්බන්ධයෙන් වැඩිදියුණු කිරීම් සිදුකළ හැකි බවයි. එම වැඩිදියුණු කිරීම් අතර කාන්තාවන්ගේ සහ පවුල්වල ආර්ථික යහපැවැත්ම මෙන්ම කාන්තාවන්ගේ සම්බන්ධතාවල වැඩිදියුණු කිරීම් තිබේ.[13] කෙසේ වෙතත්, ඍජු, රළු ආකාරවලින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමේ හැකියාවෙහි සීමිතකම පිළිබඳ සාක්ෂි ප්‍රමාණවත් නැත (වැඩිපුර සාක්ෂි තිබෙන්නේ වෙනත් සමාජ උපාංග සමග සම්බන්ධ වූ වැඩසටහන්කරණයේ කොටසක් ලෙසයි).	බර්කිනෝ ෆාසෝහි Trickle-Up ජීවනෝපාය පුහුණු වැඩසටහන[14]
කිසිදු අමතර උපාංග යක් නොමැති ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් මැදිහත්වීම්	පුද්ගලයකුට හෝ පවුලකට ඉතුරුම් හෝ ණය මගින් තම ආර්ථික දේපළ සංවර්ධනය කරගැනීම සඳහා ආධාර කිරීම කෙරෙහි අවධානය යොමුකරන මැදිහත්වීම්. ක්ෂුද්‍ර මූල්‍ය සහ පුද්ගල හෝ සමූහ ග්‍රාමීය ඉතුරුම් හා ණය සංගම් (VSLAs) මෙයට අයත් වේ. ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් ඒකාබද්ධ කරන මැදිහත්වීම් මෙයට අයත් නොවේ (එය **Empowerment of Women RESPECT Strategy Summary** තුළ අඩංගු වේ).		LMIC රටවලින් ලැබෙන සාක්ෂි මගින් හෙළිදරව් වන පරිදි ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් මැදිහත්වීම් පමණක් ප්‍රචණ්ඩ ප්‍රතිඵල අවම කිරීමේදී **ප්‍රමාණවත් වන්නේ නැත**. මැදිහත්වීම් තවමත් දැඩි ඇගයීමකට ලක්කර නොමැති නිසා HIC රටවලින් **සාක්ෂි ලැබී නැත**. මැදිහත්වීම් රැසක් විසින් ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් වෙනත් වර්ගවල සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම් සමග ඒකාබද්ධ කරයි. ඒවා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් වඩා බලාපොරොත්තු සහගත ප්‍රතිඵල පෙන්නුම් කර තිබේ.[15] ඒකාබද්ධ ආර්ථික සහ සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන් සඳහා උදාහරණ **Empowerment of Women RESPECT Strategy Summary** හි ඇතුළත් කර තිබේ.	බර්කිනෝ ෆාසෝහි Trickle-Up ජීවනෝපාය පුහුණු වැඩසටහන (VSLAs සහ ආරම්භක ප්‍රාග්ධනය)

උදාහරණ වැඩසටහන්

පහත වගුවෙහි සාරංශ දැක්වෙන්නේ එකිනෙකට වෙනස් ආර්ථික පිරිනැමුම් වැඩසටහන් දෙකකි. එමගින් වැඩසටහන් කාලරාමු තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම අඩුකිරීම සම්බන්ධයෙන් ප්‍රතිඵල පෙන්නුම් කර තිබේ. අනෙකුත් දෙයාකාරයේ මැදිහත්වීම් සම්බන්ධයෙන් උදාහරණ දැක්වෙන්නේ නැත. ඒවා තිබෙන සාක්ෂි මත පදනම්ව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ තනි වැඩසටහන් ලෙස නිර්දේශ කරනු නොලැබේ. මෙම වගුව 9 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

එළඹුම	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාලය	ඇගයීම හා බලපෑම
ලෝක ආහාර වැඩසටහනේ මුදල් ලබාදීමේ වැඩසටහන (ඉක්වදෝරය)	කොන්දේසි සහිත මුදල් ලබාදීමේ වැඩසටහනකි. එහි අරමුණ වන්නේ ලෝක ආහාර වැඩසටහන විසින් ක්‍රියාත්මක කරනු ලබන ආහාර විවිධත්වයට හා පෝෂණයටත්, ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් කාන්තාවන්ගේ කේවල් කිරීමේ බලයටත්, කොලොම්බියානු සරණාගතයන් ඉක්වදෝර ප්‍රජාව වෙත ඒකාබද්ධ කිරීමටත් සම්බන්ධ වැඩසටහන්වලට උපකාර කිරීමයි.	උතුරු ඉක්වදෝරයේ දිළිඳු නාගරික ප්‍රදේශ	කොලොම්බියානු සරණාගතයන් හා සත්කාරක ඉක්වදෝර් ජාතිකයන් ඇතුළු දිළිඳු කාන්තාවන් (වැඩිහිටි කාන්තාවක් නොමැති සුළු පවුල් ප්‍රමාණයක පිරිමින් ද ඉලක්ක කරන ලදී)	සහභාගී වන පවුල්වල කාන්තාවන් හට (සහ ඇතැම් පිරිමින්ට) මසකට ඇමරිකානු ඩොලර් 40ක් පමණ (පවුලේ පරිභෝජනයෙන් 11%ක් පමණ) බැගින් වන පිරිනැමීම් මුදල්, වවුචර සහ ආහාර ලෙස ලැබිණි. මාසික පෝෂණ පුහුණුවට සහභාගී වීමේ කොන්දේසිය මත මෙම පිරිනැමීම් මාස හයක කාලයක් තිස්සේ ලබාදෙන ලදී.	මාස 6	**ඇගයීම් වර්ගය**: සසම්භාවී පාලිත පරීක්ෂණ (RCT)[16] **බලපෑම**: පිරිනැමීම්වලින් දළ වශයෙන් මාස හයකට පමණ පසුව සහකරුවන් විසින් සිදුකරනු ලබ ශාරීරික සහ/ හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය 30%කින් අවම කළ හැකි බව ඇගයීම මගින් සොයාගන්නා ලදී. පිරිනැමීම් වර්ගය අනුව ප්‍රතිඵල වෙනස් වූයේ නැත. ද්‍රව්‍ය මෙන්ම මුදල් ද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීමට ඉවහල් විය. විශ්ලේෂණය මගින් එකිනෙකට අනුපූරක වන මාර්ග තුනක අවම වීමක් පෙන්නුම් කරනු ලැබේ. 1) අවම කරන ලද විවාහක ගැටුම් මීට පෙර දෛනික පවුල් අවශ්‍යතා සම්බන්ධයෙන් මුදල් ලබාගැනීම සමග කලින් මේවා සම්බන්ධ විය. 2) පවුල් යහපැවැත්මේ හා ප්‍රීතිමත්භාවයේ වර්ධනය 3) කාන්තාවන්ගේ තීරණ ගැනීමේ හැකියාවේ, ස්වයං විශ්වාසයේ හා සංචලනයේ නිදහසෙහි වර්ධනය

මූලෝපාය සාරාංශය

එළඹුම	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාලය	ඇගයීම හා බලපෑම
HPTN 068, දකුණු අප්‍රිකාවේ එච්අයිවී අවම කිරීමේ කොන්දේසිය මත මුදල් පිරිනැමීම	ගැහැණු ළමයින්ගේ හා තරුණ කාන්තාවන් පාසල් යාමේ කොන්දේසිය මත මුදල් පිරිනැමීමේ වැඩසටහනකි.	ග්‍රාමීය දකුණු අප්‍රිකාව	ද්විතීයක පාසල්වල (වයස අවුරුදු 13 - 20 අතර) තරුණ කාන්තාවන් සහ ගැහැණු ළමයින් සහ ඔවුන්ගේ මව්පියන් සහ/ හෝ භාරකරුවන්	අවම වශයෙන් ද්විතීයක පාසල් යාම මසකට 80% ක දින ගණනක සාමාන්‍යයක් පවත්වාගැනීමේ කොන්දේසිය මත ගැහැණු ළමයින්ට හා ඔවුන්ගේ පවුලවලට මුදල් ලබාදෙන ලදී. මෙම මුදල් වැඩසටහනට පෙර පවුලේ මාසික වියදමෙන් ආසන්න වශයෙන් 15.7%ක් විය. ගැහැණු ළමයින්ට ඩොලර් 10ක් හා මව්පියන්ට/ භාරකරුවන්ට ඩොලර් 20ක් සෑම මසකම ලබාදෙන ලදී.	අවුරුදු 3 දක්වා	**ඇගයීම් වර්ගය**: සසම්භාවී පාලිත පරීක්ෂණ (RCT)[17] **බලපෑම**: මුදල් ලැබීම හේතුවෙන් ගැහැණු ළමයින්ගේ හා තරුණ කාන්තාවන්ගේ ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අත්දැකීම් වසර තුනකට පසු 34% දක්වා අඩුවූ බව ඇගයීම මගින් සොයාග්නා ලදී. මුදල් පිරිනැමීම් මගින් ප්‍රචණ්ඩ විය හැකි සහකරුවන්ට කාන්තාවන් සහ ගැහැණු ළමයින් නිරාවරණය වීමේ අවකාශය අවම විය හැකි බව සහ ඔවුන් මුල්වරට ලිංගික කටයුතුවල යෙදීම ප්‍රමාද කළ හැකි බවත්, ලිංගික සහකරුවන් සංඛ්‍යාව අඩු කළ හැකි බවත් විශ්ලේෂණය මගින් යෝජනා කරනු ලැබේ.

සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම් අවම කිරීම සම්බන්ධයෙන් දිළිඳුකම අවම කිරීමේ මැදිහත්වීම්වල **ඵලදායී ඵළඹුම්වල පොදු මූලිකාංග හා මූලධර්මවලට** පහත දැක්වෙන ලක්ෂණ අඩංගු වේ:

වැඩසටහන් සැලසුම් සහ අනුරූප වීම

වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මකභාවය සහ ආර්ථික වැඩසටහන්කරණයේ ප්‍රමාණවත් ප්‍රතිලාභී මට්ටම් සහතික කරන්න. දිළිඳුභාවය සම්බන්ධයෙන් කටයුතු කිරීම තුළ සහභාගිකයන් පරිවර්තනය කිරීමේ විභවයක් තිබෙන අතර, ක්‍රියාත්මක කිරීමේ හා ප්‍රතිලාභ මට්ටම්වල ගුණාත්මකබව ඉතා වැදගත් වේ. උදාහරණයක් ලෙස, අඩු වටිනාකම් සහිත හා දුර්වල ලෙස ක්‍රියාත්මක කරනු ලබන, ක්‍රියාත්මක වීම පවා හරිහැටි කිව නොහැකි මුදල් පිරිනැමීමේ වැඩසටහන් මගින් ප්‍රතිලාභීන්ට පුළුල් ප්‍රතිඵල ලබාදීමේ හැකියාව අඩුය. ඒ හා සමාන ලෙසම, සූරාකෑමේ හා අනාරක්ෂිත තත්වයන් මත පදනම් වූ, කාන්තාවන්ට වෙනස්කම් සිදුකරන රැකියා හා ශ්‍රම ප්‍රතිපත්ති සහ වැඩසටහන් මගින්ද සමාජභාවී සමානාත්මතා ප්‍රතිඵල නිර්මාණය කිරීමේ හැකියාව අඩුය. ජීවනෝපාය පුහුණුව පසුබිමට අනුව කුසලතා සහිත පුහුණුකරුවන් හරහා ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය විය යුතුය. අධික හා ගොදුරු කරගන්නා අන්දමේ පොළී අනුපාතික සහිත ඉතුරුම් හා ණය වැඩසටහන් මගින් දරිද්‍රතාව සහ දරිද්‍රතාව ආශ්‍රිත ආතතිය අවම කිරීමේ හැකියාවක් නැත. ඒ අනුව, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මැදිහත්වීම හා එය අවම කිරීම සාර්ථක වීමට නම්, වැඩසටහන්කරණය විසින් දරිද්‍රතාව දුරලීම සම්බන්ධ ප්‍රබල බලපෑමක් ඇතිකිරීමේ හැකියාව තිබිය යුතුය.

1. **කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ප්‍රධාන මාර්ග සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පිරිනැමීම් මැදිහත්වීම් සැලසුම් කර අනුරූප කරගන්න.** දරිද්‍රතාව දුරලීම සඳහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කරනු ලබන මැදිහත්වීම්වල ප්‍රතිඵල ප්‍රශස්ථ කිරීම සඳහා සංදර්භීය හා සැලසුම් ලක්ෂණ නිශ්චිත පසුබිමක කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා යොදාගත හැකි මාර්ග යට බලපාන්නේ කෙසේද යන්න පරිස්සමෙන් සලකා බැලීම වැදගත්ය. උදාහරණයක් ලෙස, ආර්ථික පිරිනැමීම් වැඩසටහන් සම්බන්ධයෙන්, මුදල් පිරිනැමීම් කරන්නේ පිරිමි ගෘහ මූලිකයන්ට ද කාන්තාවන්ට ද යන කාරණය, පිරිනැමීම හා සම්බන්ධ පණිවුඩ මගින් සුබවාදී සමාජභාවී සමාජ සම්මතයන් ප්‍රවර්ධනය වෙනවාද යන්න සහ සමූහ පුහුණුවීම් වැනි කොන්දේසි සහිත ලක්ෂණ කිසිවක් පවුල තුළ විභවයන් වෙනස් කිරීමට හා ප්‍රති ක්‍රියාමාර්ග අවම කිරීමට අවශ්‍ය ද යන්න සලකා බැලිය යුතුය.[18] මෙම සාධක තීරණය වන්නේ පසුබිම අනුවය. ප්‍රධාන සමාජභාවී අසමානතා, සමාජභාවය සම්බන්ධ සමාජ සම්මතයන් සහ විශේෂිත ඉලක්ක කණ්ඩායම්වල සලකා බැලීම් පිළිබඳ තක්සේරුවක් එයට ඇතුළත් වේ.

2. **මේ දක්වා මැදිහත්වීම් පිළිබඳ සාක්ෂි මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මට්ටම් සම්බන්ධයෙන් ස්ථාවර බලපෑමක් ප්‍රදර්ශනය කර නැති නිසා ශ්‍රම බලකාය වෙනුවෙන් පමණක් හෝ ක්ෂුද්‍ර මූල්‍ය මැදිහත්වීම් අවශ්‍යද යන්න වැඩිදුරටත් පරීක්ෂා කිරීම.**[19] මෙයට එක් හේතුවක් වන්නේ, LMIC රටවල ගැඹුරු අධ්‍යයනයන්ගේ මඳකමයි. එසේම, වෙනත් උපාංග කට්ටලවලට සාපේක්ෂව ආර්ථික උපාංගවල විශේෂිත දායකත්වයන් ලබාගැනීම සම්බන්ධයෙන් අධ්‍යයනයන්ගේ සීමිත හැකියාව එයට හේතු වේ. විය හැකි බලපෑමේ ශක්තිය තක්සේරු කිරීම සඳහා එවැනි වැඩසටහන්වල ආර්ථික ඵලදායීතාව සම්බන්ධ පුළුල් සාහිත්‍යය වෙත අවධානය යොමුකළ යුතුය.[20] ඒ අනුව, මෙම වර්ගවල වැඩසටහන් නිර්දේශ කිරීමට පෙර, පරිස්සම් සහගත සලකාබැලීම් හා වැඩිදුර පරීක්ෂණ අවශ්‍යය.

3. **කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දිළිඳුභාවය අවම කිරීමේ වැඩසටහන්වල බලපෑම ශක්තිමත් කිරීම හා ප්‍රශස්ථ කිරීම සඳහා අනුපූරක ක්‍රියාකාරකම් සම්බන්ධ කරන්න.** පවුල්වල කාන්තාවන්ගේ තත්වය සෘජුව හෝ වක්‍රව වර්ධනය කරන අනුපූරක ක්‍රියාකාරකම් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය කෙරෙහි ඇති බලපෑම තිරසර කිරීම සඳහා වැදගත් විය හැකිය. උදාහරණයක් ලෙස, බංග්ලාදේශයේ ලෝක ආහාර වැඩසටහනේ පිරිනැමීම් වැඩසටහන් පිළිබඳ ඇගයීමක් මගින් පිරිනැමීම් ලද සහභාගිකයන් අතර ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වවල 26%ක අඩුවීමක් වාර්තා විය. එමෙන්ම, වැඩසටහන අවසන් වීමෙන් පසු මාස 6 සිට 10 අතර කාලයක් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන පෝෂණ වර්යා විපර්යාස සන්නිවේදන උපාංග ද එයට අයත් වේ. එහෙත්, පිරිනැමීම් පමණක් ලැබුණු සහභාගිකයන් අතර එවැනි වෙනසක් වාර්තා වූයේ නැත.[21]

4. **මැදිහත්වීම් රාමුගත කරන ආකාරය පරිස්සමෙන් සලකා බලන්න.** උදාහරණයක් ලෙස, ළමා සෞඛ්‍යය හෝ ගෘහ යහපැවැත්ම ආවරණය කරන පිරිනැමීම් වැඩසටහනක් රාමුගත කිරීම වඩා පහසුවෙන් පිළිගත හැකිය. වැඩසටහන සෘජුව කාන්තාවන් සවිබලගැන්වීම වටා රාමුගත කිරීමේදී සිදුවනවාට වඩා එයට එරෙහි ක්‍රියාමාර්ග අවම විය හැකිය.[22] මෙම පිරිනැමීම් අධ්‍යයනය කිරීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ වෙනත් සාහිත්‍යයන් සමග අනුගත ප්‍රමාණාත්මක සාක්ෂි නැති නමුදු, පිරිමින් වැඩසටහන් දකින හා පිළිගන්නා ආකාරය (පිරිමි සම්බන්ධතාව) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩසටහන් බලපෑම නිර්ණය කිරීමේදී වැදගත් විය හැකි බව විශේෂඥවරු උපකල්පනය කරති.

ක්‍රියාත්මක කිරීම හා පුළුල් කිරීම

5. **වැඩසටහන් විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම පිළිබඳ සාක්ෂි ජනනය කිරීම සඳහා අධීක්ෂණ හා ඇගයීම් රාමු සැලසුම් කරන්න.** වෙනසෙහි මාර්ගය ග්‍රහණය කරගැනීම සඳහා සහ විවිධ උපාංගවල වාසි තේරුම් ගැනීම සඳහා විශ්වසනීය ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රම (වැඩිදුර විස්තර සඳහා අධීක්ෂණ හා ඇගයීම් මාර්ගෝපදේශය බලන්න) රැසක් මෙයට ඇතුළත් විය යුතුය. යෝග්‍ය තැන්වලදී, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුවන නිරන්තරභාවය සහ එහි බැරෑරුම්භාවය සුළු වෙනස්කම් සහිතව ග්‍රහණය කරගැනීම සඳහා ක්‍රියාමාර්ග ඇතුළත් කළ යුතුය. වැදගත් කාරණය වන්නේ, දිගු කාල පරාසයන් තුළදී වැඩිපුර සාක්ෂි අවශ්‍ය වීමයි. ප්‍රතිලාභ අවසන් වීමන් පසු හෝ ප්‍රතිලාභ බලපෑම තවදුරටත් පවතිද්දී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැඩසටහනට පෙර පැවති මට්ටම දක්වා අවම වී තිබේදැයි අවබෝධ කරගැනීම සඳහා මධ්‍ය හා දිගු කාලීන මැදිහත්වීම් (අවුරුදු 5 -10) සහ පශ්චාත් මැදිහත්වීම් බලපෑම් ද එයට අයත් වේ.

6. **ශාරීරික හා ලිංගික ස්වරූපවලට අමතරව ආර්ථික සහ චිත්තවේගී ස්වරූපවල ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඇති බලපෑම මනින්න, ග්‍රහණය කරගන්න.** දරිද්‍රතාව අවම කිරීමේ වැඩසටහන් ආර්ථික හා චිත්තවේගී ප්‍රචණ්ඩත්වයට බලපාන ආකාරය පිළිබඳ සාක්ෂිවල අඩුවක් තිබේ. ඇතැම් ඇගයීම් විසින් යෝජනා කරනු ලබන්නේ ප්‍රචණ්ඩත්වයේ මෙම ස්වරූප වෙනස් කිරීම ශාරීරික හෝ ලිංගික ස්වරූප වෙනස් කිරීමට වඩා දුෂ්කර බවයි. එසේ නැතහොත්, පවුල් මට්ටම්වලදී සම්පත්වල සහ සමාජභාවී බල විභවයන්ගේ වෙනස්වීම් අනුව පිරිමින්ගේ ප්‍රතිචාරවල ප්‍රතිඵලයක් ලෙස වැඩිවීමේ හැකියාවක් ද තිබේ.

7. **විවිධ වර්ගයේ පවුල්වලට සිදුදු බලපෑම් වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා දත්ත විශ්ලේෂණය කරන්න.** කාන්තා ගෘහ මූලික පවුල්, ආබාධ සහිත කාන්තාවන් සහ ගැහැණු ළමයින් සිටින පවුල්, අවතැන් වූ පවුල් සහ විවාහ කීපයක් සහිත පවුල් ආදිය මෙම පවුල් වර්ග වේ. උදාහරණයක් ලෙස, ඝානාවේ අලුත් මව්වරුන් සඳහා වන LEAP 1000 මුදල් පිරිනැමීමේ වැඩසටහන ක්‍රියාත්මක වෙද්දී සමස්ත මැදිහත්වීම තුළම සමීප සහකරු ප්‍රචණ්ඩත්ව සිදුවීමේ නිරන්තරභාවය අඩු විය. එහෙත්, සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම් අඩු වූයේ එක විවාහයක් සහිත පවුල් තුළ පමණි. (බහු විවාහක පවුල්වල ඉහළ මට්ටමින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය තිබේ.)[23] එයට ප්‍රතිවිරුද්ධව, මාලිහි පවුල්වල පිරිමි ගෘහ මූලිකයන් ඉලක්ක කර ක්‍රියාත්මක කරන ලද ජාතික පිරිනැමීම් වැඩසටහනක් සම්බන්ධයෙන් සිදුකරන ලද ඇගයීමකදී බහු විවාහක පවුල් තුළ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය කැපී පෙනන අන්දමේ අඩුවීමක් වාර්තා විය. එහෙත්, ඒක විවාහක පවුල්වල එම බලපෑම වඩා සීමිතය.[24] මේ පිළිබඳ පැහැදිලි කිරීමක් සංදර්භයට අනුව නිශ්චිත විය හැකිය. මට්ටම් දෙකේම ප්‍රචණ්ඩත්වය සහ වැඩසටහන්කරණය සඳහා ප්‍රතිචාර පවුල් ව්‍යුහය අනුව වෙනස් විය හැකි බව මතුවෙමින් තිබෙන සාක්ෂි මගින් යෝජනා කරනු ලැබේ.



ඇතුළත් වීමේ ස්ථාන

පහත දැක්වෙන වගවූ විසින් අවධාරණය කරනු ලබන්නේ මෙම මූලෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා ඇතුළත් විය හැකි ස්ථානයි. සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සාධනීය ප්‍රතිඵල උපරිම කිරීම සඳහා දැනට පවතින දරිද්‍රතාව අවම කිරීමේ වැඩසටහන් හෝ වේදිකාවන් උසස් කිරීම මෙයට අයත් වේ. ඒ අතරතුර විය හැකි ඍණාත්මක බලපෑම් අවම කළ යුතුය. එයට පහත දැක්වෙන ආකාරයේ වැඩසටහන් ද ඇතුළත් වේ.

පිවිසුම් ලක්ෂ්‍ය	තර්කනය
සමාජ ආරක්ෂණ ජාල • ඍජු ආර්ථික පිරිනැමීම්	LMIC රටවල බිලියන 2.5ක් ජනයා කිසියම් ආකාරයක සමාජ ආරක්ෂණ ජාලයක ආවරණය ලබති.[25] ආර්ථික පිරිනැමීම් ද එයට අයත් වේ. පහළ මට්ටමේ සම්පත් සහිත පසුබිම් තුළ ඔවුන්ගේ පුළුල් හා පුළුල් වෙමින් තිබෙන ප්‍රවේශය සහ කාන්තාවන් හා ආර්ථික වශයෙන් කොන් කරන ලද කණ්ඩායම් ඍජුව ඉලක්ක කිරීමේ ඔවුන්ගේ හැකියාව හේතුවෙන්, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් විසින් ප්‍රතිපත්ති සම්පාදකයන් හට මහා පරිමාණ ප්‍රතිඵල ලබාගැනීමට පෙර නොවූ අවස්ථා සපයනු ලැබේ. ආර්ථික පිරිනැමීම් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම ඍජුව ඉලක්ක කර නැති විටදී පවා, එමගින් මහා පරිමාණයෙන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම වීම සිදුවිය හැකි බව මතුවන සාක්ෂි විසින් පෙන්වා දී තිබේ. නිවෙස් තුළ ගතිකයන් ඇතුළු වෙනස සඳහා අවශ්‍ය වැදගත් සවිබලගැන්වීම් සිතාමතා ග්‍රහණය කරගැනීම සඳහා සැලසුම වෙනස් කිරීමෙන් හෝ අමතර උපංග එකතුකිරීමෙන්, කාන්තාවන්ගේ ආර්ථික සවිලගැන්වීම සහ පවුල් ආර්ථික යහපැවැත්ම විශාල කළ හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ වඩා තිරසර අඩුකිරීම් කළ හැකිය. උදාහරණයක් ලෙස, බංග්ලාදේශයේ පිරිනැමීම් මාදිලි සමීක්ෂණ මුලපිරුමෙහි (මව්වරුන් සඳහා අන්තර් ක්‍රියාකාරී කණ්ඩායම් පුහුණුව මෙන්ම ප්‍රජාව සම්බන්ධ වීම ඇතුළත් වූ) අමතර චර්යා වෙනස් කිරීමේ උපාංගය ආහාර හා මුදල් පිරිනැමීම අවසන් වී මාස 6 - 10 කාලයකට පසු ප්‍රතිඵල තිරසර කිරීම සඳහා වැදගත් විය. මෙම අතිරේක උපාංගය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ ප්‍රධාන මාර්ග තුනකට ඍජුව බලපා ඇති බව සාක්ෂි මුලපිරුමෙහි ඇගයීමක් මගින් පෙන්නුම් කරන ලදී. කාන්තාවන්ගේ වැඩි කරන ලද සමාජ ප්‍රාග්ධනය හා කේවල් කිරීමේ බලය, ප්‍රචණ්ඩත්වය ඇතිකරන පිරිමින්ට දැරීමට සිදුවන පුළුල් සමාජ පිරිවැය සහ පවුල් යහපැවැත්මේ දිගුකාලීන වර්ධනය එයට ඇතුළත් විය.[26]
දැනට තිබෙන ප්‍රජා පාදක ආර්ථික ආයතන උදා: ඉතුරුම් හා ණය කණ්ඩායම්, ස්වයං උපකාර කණ්ඩායම්, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන්	තනි මැදිහත්වීම් ලෙස පවතිනවාට අතිරේකව, ප්‍රජා මට්ටමේ දැනට තිබෙන ආර්ථික ව්‍යුහයන් සහ ආයතන විසින් වෙනත් ආකාරයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කාර්යයන් වෙනුවෙන් පිරිවැය අතින් කාර්යක්ෂම සහ පුළුල් කළ හැකි පිවිසුම් ස්ථාන පිරිනැමිය හැකිය. මේ ආකාරයේ මැදිහත්වීම් පමණක් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමෙහිදී ඵලදායී බවට දෘඪ සාක්ෂි නැත. අනුපූරක සාක්ෂි මගින් යෝජනා කරනු ලබන්නේ ඒකාබද්ධ කරන ලද ආර්ථික හා සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම් සාර්ථක වන බවයි. මෙම මැදිහත්වීම් සාර්ථක වී තිබෙන්නේ කාන්තාවන්ගේ සමාජ කුසලතා, විශ්වාසය හා ජාල ගොඩනැගීම ඔස්සේය. එය ආර්ථික උපාංගවලට සමාන්තර වේ. උදාහරණයක් ලෙස, රුවන්ඩාවේ Indashyikirwa මැදිහත්වීම මගින් CARE සංවිධානය විසින් පවත්වාගෙන ගිය VSLA ඇතුළත් වීමේ ස්ථානයක් ලෙස පාවිච්චි කර අසමාන සම්බන්ධතා විභවයන් වර්ධනය කිරීමට හා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා යුවල සම්බන්ධ කරගන්නා ලදී.[27] ඒ අනුව, හවුල්කරුවන් සහ පුළුල් ප්‍රජාව විසින් දැනටමත් පිළිගෙන තිබෙන ජාලයක් ඔස්සේ ආර්ථික වැඩසටහන්කරණය කාන්තාවන් වෙත ළඟාකරවීමට හා ඔවුන් සම්බන්ධ කරගැනීම සඳහා ප්‍රයෝජනවත්ය. ටැන්සානියාවේ MAISHA මැදිහත්වීම විසින් ක්ෂුද්‍ර මූල්‍ය සමාජභාවී සවිබලගැන්වීමේ මැදිහත්වීම් සමග සම්බන්ධ කරන ලදී. එහි අරමුණ කාන්තාවන් ශාරීරික සහ/ හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීමේ අවදානම අවම කිරීමයි. ඒකාබද්ධ කරන ලද එළඹුම් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා බලන්න:**RESPECT Strategy Summaries on Relationships Skills Strengthened and Empowerment of Women**

ප්‍රධාන සම්පත්

සාක්ෂි සමාලෝචන

A Mixed-Method Review of Cash Transfers and Intimate Partner Violence in Low- and Middle-Income Countries. Buller, A. M., Peterman, A., Ranganathan, M., Bleile, A., Hidrobo, M., & Heise, L. The World Bank Research Observer, 33(2), pp.218–258. 2018
පහළ සහ මධ්‍ය මට්ටමේ ආදායම් සහිත රටවල ප්‍රමාණාත්මක අධ්‍යයන 14ක හා ගුණාත්මක අධ්‍යයන අටක මෙම මිශ්‍ර ක්‍රමයේ අධ්‍යයන සමාලෝචනය මගින් මාර්ග තුනක් යෝජනා කරන න්‍යායක් ඉදිරිපත් කරන ලදී. එමගින් මූල්‍ය පිරිනැමීම් මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට බලපෑමක් විය හැකිය. 1) ආර්ථික සුරක්ෂිතබව හා චිත්තවේගී යහපැවැත්ම වැඩි කරයි. 2) පවුල් තුළ ගැටුම් වෙනස් කරයි. 3) කාන්තාවන් සවිබලගැන්වීම වෙනස් කරයි.

What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R. What Works to Prevent VAWG. 2020
මෙම ගැඹුරු සාක්ෂි සමාලෝචනය මගින් ආර්ථික පිරිනැමීම් වැඩසටහන්වල, ක්ෂුද්‍ර මූල්‍ය ඉතුරුම්වල හා මූල්‍ය මැදිහත්වීම්වල සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ ඒකාබද්ධ ආර්ථික සවිබලගැන්වීමේ හා සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම්වල ප්‍රතිඵල හඳුනාගෙන ඉදිරිපත් කරනු ලැබේ.

Humanitarian Cash Transfer Programming and Gender-Based Violence Outcomes: Evidence and Future Research Priorities, Cross, A, Manell, T. & Megevand, M. R. New York: Women's Refugee Commission and IRC. 2018.
මෙම වාර්තාව මගින් මානුෂීය සංදර්භයන් තුළ සමාජභාවය හා මුදල් පිරිනැමීම් වැඩසටහන් පිළිබඳ අධ්‍යයන 28ක සාක්ෂි සාරාංශගත කරනු ලැබේ.

සිද්ධි අධ්‍යයන හා සාරාංශ

Cash, food, and vouchers reduce intimate partner violence in urban areas in Ecuador. Cash Transfer and Intimate Partner Violence Research Collaborative. Washington, DC: International Food Policy Research Institute (IFPRI). 2019.
මෙම සිද්ධි අධ්‍යයනය විසින් උතුරු ඉක්වඩෝරයේ නාගරික දිළින්දන් අතර කෙටිකාලීන ආහාර, මුදල් හා වව්චර වැඩසටහන් සාරාංශගත කරයි. එමගින් ශාරීරික සහ/හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයෙහි 30%ක අඩුවීමක් වාර්තා විය.

Food and cash transfers coupled with nutrition behaviour change communication lead to sustained reductions in intimate partner violence in Bangladesh. Cash Transfer and Intimate Partner Violence Research Collaborative. Washington, DC: International Food Policy Research Institute (IFPRI). 2019.
මෙම සිද්ධි අධ්‍යයනය විසින් බංග්ලාදේශයේ ආර්ථික පිරිනැමීම් වැඩසටහනක සොයාගැනීම් සාරාංශගත කරයි. එම වැඩසටහන පෝෂණ චර්යා වෙනස් කිරීම් සන්නිවේදන උපාංගයක් සමග ද සම්බන්ධය. එමගින් ශාරීරික සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වහි 26%ක අඩුවීමක් සිදුවිය.

Cash transfers conditional on schooling reduce IPV among young women in South Africa. Cash Transfer and Intimate Partner Violence Research Collaborative. Washington, DC: International Food Policy Research Institute (IFPRI). 2019.
මෙම ඉදිරිපත් කිරීම මගින් දකුණු අප්‍රිකාවේ නව යොවුන් ගැහැණු ළමයින් ඉලක්ක කළ කොන්දේසි සහිත මුදල් පිරිනැමීම් වැඩසටහනක බලපෑම සාරාංශගත කරනු ලැබේ.

එම වැඩසටහන මගින් ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය 34%කින් අඩු විය. එසේ කරනු ලැබුවේ ගැහැණු ළමයින්ට අවදානම් විය හැකි ප්‍රචණ්ඩ සම්බන්ධතා වැළැක්වීමෙනි. මුදල් පිරිනැමීම් හේතුවෙන් පළමු ලිංගික අත්දැකීම ලැබීම ප්‍රමාද වූ අතර ලිංගික සහකරුවන් ගණන අඩු විය.

Getting down to business: Women's economic and social empowerment in Burundi. International Rescue Committee (IRC), New York: IRC.
මෙම සිද්ධි අධ්‍යයනය විසින් බුරුන්ඩියේ IRC ආයතනයේ EA$E (Economic And Social Empowerment for women) වැඩසටහනේ සොයාගැනීම් සාරාංශගත කරනු ලැබේ. VSLA වෙත සමාජභාවය පිළිබඳ සාකච්ඡා කරන කණ්ඩායමක් එකතු කිරීමෙන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ කැපීපෙනෙන අඩුවීමක් (අවසන් සති දෙක තුළ 22%) ප්‍රතිඵල විසින් පෙන්නුම් කරනු ලැබේ. බලන්න: EA$E Programme Implementation Manual.

ප්‍රායෝගික මගපෙන්වීම්

Resources for Mainstreaming Gender-Based Violence (GBV) Considerations in Cash and Voucher Assistance (CVA) and Utilizing CVA in GBV Prevention and Response. Women's Refugee Commission, Mercy Corps, IRC. New York: Women's Refugee Commission and IRC; Portland: Mercy Corps. 2020.
අර්බුද හා ගැටුම් මගින් පීඩාවට පත් ජනගහනයන්ගේ මුදල් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ මෙහෙයුම්කරුවන්ට සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂාව ලැබීම තහවුරු කිරීම මෙම සාරාංශය සහාය සපයයි.

Cash & Voucher Assistance and Gender-Based Violence Compendium: Practical Guidance for Humanitarian Practitioners. CARE and Cash Learning Partnership (CaLP). 2019.
මෙම එකතුව මගින් ඉලක්ක කරනු ලබන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අවදානම අවම කිරීම හා වැළැක්වීම ඇතුළත් කරගැනීම සඳහා මානුෂීය සේවා මෙහෙයුම්කරුවන්ට උපකාර කිරීමයි. මුදල් ලෙස ලබාදෙන ආධාර, වව්චර් මගින් සහාය වීමේ මැදිහත්වීම්, ඒවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සමග සම්බන්ධ කිරීම හා යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීම එයට අයත් වේ.

වෙබිනාර්

Leveraging Cash Transfers to Reduce Intimate Partner Violence at Scale, Promise and Potential from Research around the Globe. The Transfer Project (2019) CSW63 Side Event [online video]. Available at: https://www.youtube.com/watch?v=dtNxb8FKmyc
එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය, සිඩා සහ ටැන්සානියාවේ අගමැති කාර්යාලය විසින් සත්කාරකත්වය දරන මෙම CSW63 අතුරු වැඩසටහන විසින් මුදල් පිරිනැමීම කාන්තාවන්ට එරෙහි සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කිරීමට උපකාර වන අකාරය පිළිබඳ ලෝකය පුරා මතුවෙමින් තිබෙන සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ.

පසු සටහන

[1] දරිද්‍රතාව පිළිබඳ සංකල්ප, ආර්ථික සුරක්ෂිතභාවය, ආර්ථික අනාරක්ෂිතභාවය, ධනය, දේපළ අතර වෙනස්කම් තිබෙන බව මෙම මූලෝපාය විසින් පිළිගනු ලැබේ. එහෙත්, ආඛ්‍යාන/ ව්‍යුහමය අරමුණු වෙනුවෙන් එකිනෙක අතර භාවිතා කරනු ලැබේ. විශේෂිත සමීක්ෂණයක් විස්තර කිරීමේදී පුද්ගල දර්ශක වෙනුවෙන් වඩා නිශ්චිත සංකල්ප භාවිතා කරනු ලැබේ.

[2] Stockl H, March LM, Pallitto C, et al. (2014) Intimate partner violence among adolescents and young women: prevalence and associated factors in nine countries: a cross sectional study. BMC Public Health. 2014;14:751;
Decker MR, Peitzmeier S, Olumide A, et al. (2014) Prevalence and health impact of intimate partner violence and non-partner sexual violence among female adolescents aged 15–19 years in vulnerable urban environments: a multi-country study. J Adolesc Health;55:S58–S67; Heise L, Kotsad-am A. (2015) Cross-national and multilevel correlates of partner violence: an analysis of data from population-based surveys. Lancet Global Health. 2015;3:e332–e340. Jewkes, R. (2017) What are the drivers of violence against women and girls and how to prevent it. Presentation for What Works to Prevent VAWG.

[3] Peterman, A., Roy, S., and Ranganathan, M. (2019) How is economic security linked to gender-based violence? New insights from the Sexual Violence Research Initiative Forum 2019. IFPRI Blog.

[4] Gibbs, A and Bishop, K (2019) Combined economic empowerment and gender-transformative interventions. Evidence Review. What works to prevent VAWG programme.

[5] Ibid.

[6] සමාජ ආරක්ෂණ ජාල මෙසේ නිර්වචනය කළ හැකිය: 'දුප්පත් සහ අවදානමට මුහුණදෙන පුද්ගලයන්ට උපකාර කිරීමේ අරමුණෙන් මූල්‍ය හෝ ද්‍රව්‍ය ලෙස සපයනු ලබන දායක නොවන ප්‍රතිලාභ. ඒවා විශාල සමාජ ආරක්ෂණ පද්ධතියක උපාංගයකි. විශ්‍රාම වැටුප් හා සෞඛ්‍ය රක්ෂණ මෙන්ම ශ්‍රම වෙළඳපොළ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්බන්ධ දායකත්ව සමාජ රක්ෂණය ද එයට අයත් වේ.' – p.4 of Beegle, K., Coudouel, A. & Monsalve, E. (2019) Realizing the Full Potential of Social Safety Nets in Africa, Washington D.C.: World Bank.

[7] සාක්ෂි ශ්‍රේණිගත කිරීම් විශාල වශයෙන් උකහාගනු ලබන්නේ පද්ධතිමය සමාලෝචන මගිනි. එය මැදිහත්වීම් එකකට වඩා වැඩි ගණනක විය යුතුය. එමගින් සසම්භාවී, පොකුරු වශයෙන් සසම්භාවී හා අර්ධ පර්යේෂණාත්මක ක්‍රම වැනි පර්යේෂණාත්මක සැලසුම් භාවිතා කළ යුතුව තිබේ. යුක්ති ක්ෂේත්‍රයේ මැදිහත්වීම්, විකල්ප ඇගයීම් ක්‍රම වැනි ඇතැම් මූලෝපායන් සඳහා කාල ශ්‍රේණි,නිරීක්ෂණාත්මක හා හරස්කඩ සැලසුම් (ගුණාත්මකභාවයෙන් අඩු වුව ද) වඩා යෝග්‍ය වියහැකි බව හඳුනාගෙන තිබේ. මෙය අලුත් ක්ෂේත්‍රයක් වන අතර, අධ්‍යයන සැලසුමෙහි හා ඇගයීමෙහි දැඩිබව සම්බන්ධයෙන් පුළුල් වෙනස්කම් තිබේ. මෙම සමාලෝචන හා අධ්‍යයන සම්බන්ධ මූලාශ්‍ර යොමුවල කොටසක් ලෙස ඉදිරිපත් කර තිබේ.

[8] උදා: සමාන දේපළ හිමිකම් වැනි නීතිමය මැදිහත්වීම් ඉන්දියාවේ දිළිඳුබව සෘජුව අවම කිරීමේ මැදිහත්වීම්වල මූලෝපායන්හිදී සාර්ථක වී තිබේ. බලන්න: Amaral, S (2017) Do Improved Property Rights Decrease Violence Against Women in India? Institute for Social and Economic Research.

[9] Buller, A. M., Peterman, A., Ranganathan, M., Bleile, A., Hidrobo, M., & Heise, L. (2018) A Mixed-Method Review of Cash Transfers and Intimate Partner Violence in Low- and Middle-Income Countries. The World Bank Research Observer, 33(2), pp.218–258.

[10] Ibid.

[11] Falb, K., Annan, J., Blackwell, A., & Stennes, J. (2019). Cash transfers in Raqqa Governorate, Syria: Changes over time in women's experiences of violence and wellbeing. Washington DC: International Rescue Committee and London: UK Department for International Development; Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, South Africa; What Works to Prevent VAWG

[12] Pettifor, A., MacPhail, C., Selin, A., Gómez-Olivé, F. X., Rosenberg, M., Wagner, R. G., Mabuza, W., Hughes, J. P., Suchindran, C., Piwowar-Manning, E., Wang, J., Twine, R., Daniel, T., Andrew, P., Laeyendecker, O., Agyei, Y., Tollman, S., Kahn, K., & HPTN 068 protocol team (2016). HPTN 068: A Randomized Control Trial of a Conditional Cash Transfer to Reduce HIV Infection in Young Women in South Africa-Study Design and Baseline Results. AIDS and behavior, 20(9), 1863–1882.

[13] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) Ibid.

[14] The Trickle-Up programme comprised a control arm and an economic intervention-only arm, with VSLA, livelihoods training and start-up capital for women over a six-month period.

[15] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) Ibid.

[16] Hidrobo, Melissa, Amber Peterman, and Lori Heise. (2016). "The Effect of Cash, Vouchers, and Food Transfers on Intimate Partner Violence: Evidence from a Randomized Experiment in Northern Ecuador." American Economic Journal: Applied Economics, 8 (3): 284-303.

[17] Pettifor, A., MacPhail, C., Huges, J., Selin, A., Wang, J., Gomez-Olive, F.X…Khan, K. (2016) The effect of a conditional cash transfer on HIV incidence in young women in rural South Africa (HPTN 068): a phase 3, randomized controlled trial. Lancet Global Health, 4(12) PE978-E988

[18] Prevention Collaborative (2019) Cash transfers and intimate partner violence: Findings from a review of quantitative and qualitative studies in low and middle-income countries. Prevention Collaborative evidence brief. Prevention Collaborative.

[19] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) Ibid.

[20] Peterman A, Palermo TM, Ferrari G. (2018) Still a leap of faith: microfinance initiatives for reduction of violence against women and children in lowincome and middle-income countries. BMJ Glob Health;3:e001143. doi:10.1136/ bmjgh-2018-001143

[21] Roy, Shalini & Hidrobo, Melissa & Hoddinott, John & Ahmed, Akhter. (2018). Transfers, Behavior Change Communication, and Intimate Partner Violence: Post-Program Evidence from Rural Bangladesh. The Review of Economics and Statistics. 1-45.

[22] Buller, A. M., Peterman, A., Ranganathan, M., Bleile, A., Hidrobo, M., & Heise, L. (2018). Ibid.

[23] Peterman, A., Valli, E. & Palermo, T. (2020) Government Anti-Poverty Programming and Intimate Partner Violence in Ghana, Economic Development and Cultural Change (in press).

[24] Heath, R., Hidrobo, M., and Shalini, R (2020) Cash transfers, polygamy, and intimate partner violence: Experimental evidence from Mali Journal of Development Economics, Vol 143 March 2020

[25] The World Bank (2018) The State of Social Safety Nets 2018. World Bank. Washington DC.

[26] Roy, S., Hidrobo, M., Hoddinott, J., & Ahmed, A. (2019) Ibid.

[27] Dunkle, K., Stern, E., Chatterji, S,. and Heise, L., (2019) Indashyikirwa programme to reduce intimate partner violence in Rwanda: Report of findings from a cluster randomized control trial. CARE. London.

[28] Kapiga, S., Harvey, S., Mshana, G., Holm Hansen, C., Mtolela, G.J., Madaha, F. … & Watts, C. (2019). A social empowerment intervention to prevent intimate partner violence against women in a microfinance scheme in Tanzania: findings from the MAISHA cluster randomised controlled trial. The Lancet Global Health, 7(10), 1423- 34.

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT වියුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women and Social Development Direct (2020) Poverty Reduced, RESPECT: Preventing Violence against Women Strategy Summary

RESPECT WOMEN

මූලෝපාය සාරාංශය

පරිසරයන් ආරක්ෂිතය

(Environments made safe)

UN WOMEN

World Health Organization

පරිසරයන් ආරක්ෂිතය

මූලෝපායේ අභිමතාර්ථය : කාන්තාවන්ට බියෙන් තොර සහ හිංසනයෙන් සහ වෙනත් ස්වරූපවල ප්‍රචණ්ඩත්වයෙන් තොර පාසල්[1], සේවාස්ථාන[2] සහ වෙනත් පොදු අවකාශ ඇතුළු ආරක්ෂිත පරිසරයන් නිර්මාණය කිරීම

තාර්කිකත්වය

ගෝලීයව, කාන්තාවෝ පාසල්, සේවාස්ථාන, වීදි, පොදු ප්‍රවාහනය, ජලය බෙදාහරින ස්ථාන, කුඹුරු, අන්තර්ජාලය සහ තවත් පොදු අවකාශවලදී දිගින් දිගටම විවිධ ස්වරූපයේ ප්‍රචණ්ඩත්වයන්ට මුහුණදෙති.

සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (IPV) පරිද්දෙන්ම, පොදු පරිසරයන්හිදී ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අත්දැකීම් හා තර්ජන කාන්තාවන්ගේ සෞඛ්‍යය හා යහපැවැත්මට සෘණාත්මක ලෙස බලපායි. එමගින් ඔවුන්ගේ සංචලනය සහ ආර්ථික, සමාජ හා පුරවැසි සහභාගීත්වය සීමා කළ හැකිය. එමගින් රටක ජාතික සංවර්ධනයට කැපීපෙනෙන බලපෑමක් සිදුකරයි.[3] උදාහරණයක් ලෙස, සේවාස්ථානයේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පුද්ගල සේවකයන්ට සිදුවන ආර්ථික, සමාජ සහ සෞඛ්‍ය බලපෑම අතිමහත්ය. එමගින් ව්‍යාපාරවලට දැවැන්ත පිරිවැයක් එකතු වේ. ඵලදායීතාව අඩුවීම, සේවයට වාර්තා නොකිරීම, සේවක ඵලදායීතාව, නඩු සහ වන්දි මගින් දේශීය හා ජාතික ආර්ථිකයන්ට බලපෑම් ඇති වේ.[4]

ඒ අතරතුරම, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කටයුතු විශාල ජන සංඛ්‍යාවක් වෙත ළඟාවීමේ හැකියාවෙන් ද යුක්තය. එමගින් ඔවුන්ගේ ආකල්ප, සමාජ සම්මතයන් සහ චර්යාවන් වෙනස් විය හැකිය. කාන්තා අයිතිවාසිකම් හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයෙන් තොර අවකාශ ප්‍රවර්ධනය කළ හැකිය. උදාහරණයක් ලෙස, සම්පූර්ණ පාසල් පරිසරය වෙනස් කිරීම මගින් සහ පුළුල් පරිමාණයෙන් තරුණ ජනයා වෙත ළඟාවීම මගින් හානිකර සමාජ සම්මතයන්, ආකල්ප සහ චර්යාවන් ස්ථාපිත වීමට පෙර මුල් වයසේදීම සමාජභාවී භූමිකාවන් හා යහපත් සම්බන්ධතා සමග බැඳුණු ළමයින්ගේ අවබෝධය හැඩගැස්වීමෙන් පාසල් පාදක එළඹුම හරහා ප්‍රචණ්ඩත්වය වැළැක්විය හැකිය. ඒ හා සමාන අන්දමින්, නගර සැලසුම් කිරීමේදී වැදගත් භූමිකාවක් කරන සනීපාරක්ෂාව, වැඩිදියුණු කරන ලද ආලෝකකරණය සහ ආරක්ෂිත ජල පහසුකම් ආදිය හරහා අත්‍යවශ්‍ය පොදු සේවා සඳහා ආයෝජන සහිත සමාජභාවී එළඹුමක් මගින් කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ බියෙන් තොරව නිදහසේ සංචලනය විය හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රධාන භූමිකාවක් ඉටුකළ හැකිය.[5]

අවදානම් සහ ආරක්ෂණ සාධක

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මට්ටම්වලදී ආරක්ෂණ බලපෑමක් තිබෙන සාධක තීව්‍ර කරමින් පහත දැක්වෙන ප්‍රචණ්ඩත්ව අවදානම වැඩිකරන අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම මූලෝපායෙහි අරමුණයි.

මට්ටම	අවදානම් සාධක	ආරක්ෂණ සාධක
පුද්ගල	නීති, ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ ක්‍රියාවලි (කාන්තා සහ පිරිමි) ඇතුළු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත්භාවය අඩුකම ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය ලෙස භාරගන්නා හෝ සාධාරණීකරණය කරන ආකල්ප (කාන්තා සහ පිරිමි) ළමාවියේ ප්‍රචණ්ඩත්ව අත්දැකීම් සහ/ හෝ පවුල හෝ ප්‍රජාව තුළ ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම (පිරිමි සහ ගැහැණු)	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කුසලතා සහ ඒ පිළිබඳ දැනුවත්භාවය (කාන්තා සහ පිරිමි) නායකත්වය, තීරණ ගැනීම සහ උද්දේශන කුසලතා (කාන්තා) සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප සහ භාවිතාවන් (කාන්තා සහ පිරිමි) ද්විතීයක අධ්‍යාපනය (කාන්තා සහ පිරිමි)
අන්තර් පුද්ගල	සම වයස් කණ්ඩායම්, ගුරුවරුන්, කළමනාකාරවරුන් සහ එකට වැඩකරන සේවකයන් හට නීති, ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ ක්‍රියාවලි ඇතුළු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත්භාවය අඩුය. කාන්තාවන් සහ පිරිමින් අතර අධ්‍යාපන මට්ටම්වල විෂමතා	සම වයස් කණ්ඩායම්, ගුරුවරුන්, කළමනාකාරවරුන් සහ එකට වැඩකරන සේවකයන් සතුව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කුසලතා සහ ඒ පිළිබඳ දැනුවත්භාවය තිබේ.[6] කාන්තාවන් සහ පිරිමින් අතර අධ්‍යාපන මට්ටම්වල වැඩි සමානතාවක් තිබේ.

මූලෝපාය සාරාංශය

මට්ටම	අවදානම් සාධක	ආරක්ෂණ සාධක
ප්‍රජාව	අනාරක්ෂිත, දුර්වල ලෙස ආලෝකකරණය කරන ලද පොදු ස්ථාන සහ සෙනග පිරි පොදු ප්‍රවාහනය[7] පාසල් සහ සේවා ස්ථානවල අධීක්ෂණය සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණයන්ගේ අඩුව[8] පිරිමි වරප්‍රසාදිත තත්වය තහවුරු කරන සහ කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය සීමාකරන හානිකර සමාජභාවී සමාජ සම්මතයන්	හොඳින් ආලෝකකරණය කරන ලද පොදු ස්ථාන, පැහැදිලිව පෙනෙන ස්ථාන සීමා, පැහැදිලි සංඥා පුවරු සහ ආරක්ෂිත මාර්ග යටිබිම් ශක්තිමත් පාසල් හා සේවාස්ථාන කළමනාකරණ ධාරිතාව සහ වගවීමේ යාන්ත්‍රණයන් අහිංසාවට, විවිධත්වයට සහ සමාජභාවී සමානාත්මතාවට ගරුකිරීමට සහාය වන සමාජ සම්මතයන් මගින් කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම[9]
සමාජයීය	දුර්වල සහ සමාජභාවී වශයෙන් අන්ධ හෝ නිෂ්ක්‍රීය යටිතල පහසුකම් සහ නාගරික සැලසුම්කරණය පාසල්, සේවාස්ථාන, පොදු අවකාශ සහ අන්තර්ජාලයේ ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වයේ වෙනත් ස්වරූප සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ නීතිවල අඩුව සහ/හෝ ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක නොවීම පහසුවෙන් ළඟාවිය හැකි, ඉහළ ගුණාත්මබවකින් යුක්ත ප්‍රතිචාරාත්මක සේවාවන්ගේ අඩුව කාන්තා රැකියා නියුක්තියේ සහ අධ්‍යාපනයේ පහළ මට්ටම	සමාජභාවී වශයෙන් ප්‍රතිචාරාත්මක සහ සහභාගීත්ව නාගරික සැලසුම්කරණය[10] පාසල්, සේවාස්ථාන හා පොදු ස්ථානවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තහනම් කරන නීති සහ ප්‍රතිපත්ති අධිකරණය ඇතුළු සමීප විය හැකි වාර්තා කිරීමේ හා ප්‍රතිචාර දැක්වීමේ සේවා කළමනාකරණ හා තීරණ ගැනීමේ මට්ටම ඇතුළු සෑම තලයකදීම කාන්තාවන්ගේ සම සහභාගීත්වය සහිත සමාජභාවය පැත්තෙන් වඩා සාධාරණ ආයතන

වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහනෙන් නිරූපණය කරනු ලබන්නේ සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් සඳහා සරල කරන ලද වෙනස්කිරීමේ න්‍යායකි. එමගින් පවුල් සම්බන්ධතා ස්ථාපිත කිරීමට, ශාරීරික දඬුවම් තහනම් කිරීමට, දරුවන් හැදීමේ රළු භාවිතාවන් අවම කිරීමට හා සාධනීය මාපිය-දූදරු සම්බන්ධතා නිර්මාණය කිරීමට උපකාර කරනු ලැබේ. ඒවා විශේෂිත වැඩසටහන් සඳහා තවදුරටත් සංවර්ධනය කර අනුරූප කරගත යුතුය.

E: පරිසරයන් ආරක්ෂිතය



ප්‍රතිදාන ප්‍රතිඵල බලපෑම්

මූ ලෝ පා ය සා රා ං ශ ය

මැදිහත්වීම් වර්ග

කාන්තාවන්ට සුරක්ෂිත පරිසරයන් නිර්මාණය කිරීමේ අරමුණින් විවිධ මැදිහත්වීම් රැසක් විවිධ රාජ්‍ය සංදර්භයන් තුළ ක්‍රියාත්මක කර තිබේ. පද්ධතිමය හා සාකල්‍ය එළඹුම් ඒවා අතර වේ. සමස්ත පාසල් වෙත මැදිහත්වීම, යටිතල පහසුකම්වලදී කාන්තාවන් මුහුණදෙන අවදානම් හඳුනාගෙන ඒවා වැළැක්වීමේ මැදිහත්වීම් සහ ප්‍රවාහනය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, සහකරුවන් නොවන අයගේ ලිංගික ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකි තත්වයන් හඳුනාගැනීම සහ මැදිහත්වීම සඳහා පුද්ගලයන්ගේ හැකියාවන් ගොඩනගන මැදිහත්වීම් ඒ අතර වේ.

පහත දැක්වෙන වගුව විසින් නිරූපණය කරනු ලබන්නේ RESPECT ව්‍යුහයෙහි දක්වා තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ගයි. වර්තමාන සාක්ෂි පදනම හා වැඩසටහන් උදාහරණ ගැන ද එහි දැක්වේ. LMIC රටවල වැඩසටහන් උදාහරණ ඒවා තිබෙන තැන්වලදී ප්‍රමුඛතාව ලබාදී තිබේ.

LEGEND

- ● **බලාපොරොත්තු සහගත.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

මැදිහත්වීම් වර්ගය	විස්තරය		කාර්යක්ෂමතාවේ සාක්ෂි	උදාහරණ වැඩසටහන්
යටිතලය සහ ප්‍රවාහනය	මෙම ක්ෂේත්‍රයේ මැදිහත්වීම් විසින් යටිතල පහසුකම් අංශ ගණනාවක් ආවරණය කරනු ලැබේ. ඒ අතරට ප්‍රවාහනය, ජලය, සෞඛ්‍යය, බලශක්තිය, සනීපාරක්ෂාව සහ නිවාස අයත් වේ. පුළුල් පරාසයක මැදිහත්වීම් ඒ සමග සම්බන්ධ වේ. ඒවා නම්, ඇතුළත්කාරී සමාජභාවී ප්‍රතිචාරාත්මක නගර හා ප්‍රවාහන සැලසුම්කරණය, සංවිධාන සංස්කෘතියේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ශක්තිමත් සංරචක, හානිකර සමාජ සම්මතයන් සම්බන්ධයෙන් යටිතල පහසුකම් අංශය තුළ කටයුතු කරන ප්‍රතිපත්ති හා පටිපාටි වේ.[11] බේරුණු අයට අත්‍යවශ්‍ය සේවා තහවුරු කරන නීති හා ප්‍රතිපත්ති කටයුතු ද, ප්‍රජා බලමුළුගැන්වීම වැනි ක්‍රියාමාර්ග හරහා සමාජ සම්මතයන් සම්බන්ධයෙන් කටයුතු කරන වැඩසටහන් ද මෙම මැදිහත්වීම්වලට අයත් වේ.[12]	L H	HIC සහ LMIC රටවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම්වලදී යටිතල පහසුකම් හා ප්‍රවාහන මැදිහත්වීම් මගින් වියහැකි බලපෑම පිළිබඳ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. කෙසේ වෙතත්, දෘඪ ඇගයීම් විසින් ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ අතරමැදි ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්වා දී තිබේ. කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ සවිබලගැන්වීම සහ ආරක්ෂාව පිළිබඳ හැඟීම එයට අයත් වේ.[13] ආරක්ෂිත පරිසරයන් නිර්මාණය කිරීමේ වැඩසටහන්වල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම්වල බලපෑම මැනීමේ දෘඪ ඇගයීමක් සඳහා ආයෝජන මඳකමක් තිබේ.[14]	එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ ආරක්ෂිත පුරවර සහ ආරක්ෂිත පොදු අවකාශ මූලපිරුම[15] Safetipin intervention (ඉන්දියාව) HarassMap technology (කයිරෝ, ඊජිප්තුව)

මැදිහත්වීම් වර්ගය	විස්තරය		කාර්යක්ෂමතාවේ සාක්ෂි	උදාහරණ වැඩසටහන්
සිදුවීම් දකින්නන්ගේ මැදිහත්වීම්	සිදුවීම් දකින පුද්ගලයන්ගේ මැදිහත්වීම් මූලිකවම ක්‍රියාත්මක වන්නේ වැඩිහිටි සහ/ හෝ ළමා කණ්ඩායම් සමගයි. එමගින් ඔවුන්ට පාසල්වල, විද්‍යායතනවල සහ ප්‍රජාවන් තුළ ලිංගික ප්‍රචණ්ඩත්වයේ සංඥා හඳුනාගැනීමට සහ තාවකාලික සම්බන්ධතාවලදී ප්‍රචණ්ඩත්වය වැළැක්වීමටත්, සහකරු නොවන පාර්ශ්වවල ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමටත් උපකාර කරනු ලැබේ. මුලින්ම එක්සත් ජනපදයේ ක්‍රියාත්මක කරන ලද මෙය වඩා සාර්ථක වූයේ, ක්‍රීඩා කණ්ඩායම් ඇතුළු තරුණයන් හා පිරිමි ළමයින් අතරය. ඔවුන් විසින් දූෂණය වටා තිබෙන මිථ්‍යා දුරලන ලදී. සමාජභාවී සම්මතයන් හා ආකල්ප පිළිබඳ විචාරශීලීව විමසීමට දිරිගන්වන ලදී. එහිදී ආකල්ප වෙනස් කිරීම සඳහා සාමාන්‍යයෙන් ක්‍රීඩා ගුරුවරුන් වැනි මතවාදී නායකයන් සම්බන්ධ කරගන්නා ලදී. සිදුවීම් දකින පුද්ගලයන් සම්බන්ධ වැඩසටහන් කාල රාමුව හා තීව්‍රතාව පැත්තෙන් කැපීපෙනෙන අන්දමින් විවිධ වේ. ඇතැම් ඒවා කෙටි කාලීන, එක් වරක් පැවැත්වෙන පුහුණුවීම්/ දැනුවත් කිරීම් වන අතර අනෙක් ඒවා සති හෝ මාස ගණන් වන බහුවිධ ඒවා වේ.	H L	HIC රටවලින් **පරස්පර සාක්ෂි ලැබේ**. ඒවායේ ඇගයීම් අනුව ඇතැම් වැඩසටහන් මගින් ප්‍රචණ්ඩත්වය අඩුවී තිබෙන අතර ඇතැම් ඒවා මගින් බලපෑමක් ඇතිවී නැත. ඇගයීම් සිදුකරන ලද බොහෝ මැදිහත්වීම් එක් වරක් පමණක් පවත්වන ලද සැසි වූ බව ද සටහන් කිරීම වැදගත්ය. HIC රටවල සාක්ෂිවලින් යෝජනා වූයේ බහුවිධ සැසි සහිත Green Dot වැනි දිගුකාලීන මැදිහත්වීම් මගින් ප්‍රචණ්ඩත්වයේ අඩුවීමක් සිදුවිය හැකි බවයි. තනි වැඩසටහන් ලෙස, සිදුවීම් දකින පාර්ශ්ව සඳහා තනි වැඩසටහන් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුවීමක් සිදුවී නැත.[16] දැඩි ලෙස ඇගයීමට ලක්කරන ලද බහුතර මැදිහත්වීම් සිදුවී තිබුණේ එක්සත් ජනපදයේය. සිදුවීම් දකින පාර්ශ්ව වෙත කරනු ලබන මැදිහත්වීම් මගින් ප්‍රචණ්ඩත්වය අඩුවන බවට LMIC රටවලින් **සාක්ෂි ලැබී නැත**.[17] කෙසේ වෙතත්, පර්යේෂණාත්මක නොවන ඇගයීම් මගින් අතරමැදි ප්‍රතිඵල සම්බන්ධයෙන් සාධනීය ප්‍රතිඵල පෙන්වාදී තිබේ. Bell Bajao සම්බන්ධ ඇගයීම එයට අයත්ය. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුම හා ආකල්ප සම්බන්ධයෙන් සාධනීය වෙනස්කම් පෙන්වන ලදී. එසේම පුළුල් උපකාර සෙවීමේ චර්යාවන් හා මැදිහත්වීම් ද ප්‍රදර්ශනය කරන ලදී.[18]	Green Dot (එක්සත් ජනපදයේ පාසල්) Coaching Boys into Men (එක්සත් ජනපදය), "Parivartan" (ඉන්දියාව) Bell Bajao (Ring the Bell, ඉන්දියාව)

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
සමස්ත පාසල් මැදිහත්වීම්	සමස්ත පාසල් මැදිහත්වීම් යනු ළමයින්ට උගත හැකි ආරක්ෂිත, ළමා හිතවාදී සහ සමාජභාවී වශයෙන් සංවේදී පරිසරයන් නිර්මාණය කිරීමේ සාකල්‍ය එළඹුම්ය.[19] මෙම වැඩසටහන් විසින් පාසල්වල ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පොදු දැක්මක් නිර්මාණය කර ක්‍රියාත්මක කරයි. ඒවා සාමාන්‍යයෙන් පාසල්වල සහ ප්‍රජාවේ එකිනෙකට වෙනස් කණ්ඩායම් සමග කටයුතු කරයි. සාමාන්‍යයෙන් එයට ළමයින් සඳහා වන විෂයමාලාව පාදක ඉගෙනුම් මැදිහත්වීමක් ඇතුළත් වේ. එසේම, එය ගුරුවරුන්, මව්පියන්, පාසල් පාලක මණ්ඩල සහ පළාත් පාලන ආයතන සමග ද සම්බන්ධ වේ. මෙම මැදිහත්වීම් මේ දක්වා සාමාන්‍යයෙන් ඉලක්ක කළේ සම වයස් ප්‍රචණ්ඩත්වය හා ශාරීරික දණ්ඩනයන් අවම කිරීමයි. ඒ සමග සම්බන්ධ වූ කණ්ඩායම් පුළුල් පරාසයක මැදිහත්වීම් හා ක්‍රියාකාරකම් මත රඳා පවතී. විවිධ මට්ටම්වලදී සම්බන්ධ වීමෙන්, මැදිහත්වීම් විසින් ඉලක්ක කරනු ලන්නේ ක්‍රමානුකූල හා තිරසර වෙනසකි. ආකල්ප සහ චර්යාවන්ගේ වෙනස්කම් ද එයට අයත් වේ. ඒ සඳහා ධනාත්මකබව ඇති කිරීමේ පාසල් හා ප්‍රජා පරිසරයන්ගේ සහාය ලැබේ.[20]	H	සමස්ත පාසල් මැදිහත්වීම් මගින් ප්‍රචණ්ඩත්වය අඩුවන බවට HIC රටවලින් **සාක්ෂි නැත**.	Good Schools Toolkit (උගන්ඩාව)
		L	LMIC රටවලින් ලැබෙන සාක්ෂි අනුව, සමස්ත පාසල් මැදිහත්වීම් මගින් පාසල් කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ශාරීරික දඬුවම් වැනි අතරමැදි ප්‍රතිඵලවලට සාධනීය බලපෑම් ඇතිවිය හැකිය. කෙසේ වෙතත්, **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**.[21] LMIC රටවලින් ලැබෙන සාක්ෂි වැඩිපුර අවධානය යොමුකරන්නේ, දැනුවත්භාවය වර්ධනය කිරීමේ හා ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කුසලතා සංවර්ධනය කිරීමේ විෂයමාලා පාදක මැදිහත්වීම් කෙරෙහිය. (මෙය **ළමා හා නවයොවුන් අයෝජන වැළැක්වීම සම්බන්ධ RESPECT මූලෝපාය සාරාංශය** මගින් ආවරණය කරනු ලැබේ)[22]. සමස්ත පාසල් මැදිහත්වීම්වලදී ඵලදායීතාව මැනීම අභියෝගාත්මක වන නමුදු, තිබෙන සාක්ෂි අවධාරණය කරන්නේ ශක්තිමත් ප්‍රතිපත්තිවල, පාසල් තුළ හා අවට ප්‍රජාවන් තුළ සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන ධනාත්මක සංස්කෘතියක සහ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සාකච්ඡා පුහුණු මෙහෙයවන්නකු විසින් මෙහෙයවීමේ වැදගත්කමයි.[23]	Transforming Education for Girls in Nigeria and Tanzania (TEGINT)

උදාහරණ වැඩසටහන්

වැඩසටහන් කාලරාමු තුළ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම සිදුකරන බව පෙන්නුම් කළ එකිනෙකට වෙනස් වැඩසටහන් තුනක් පහත දැක්වෙන වගුව විසින් සාරාංශ කරනු ලැබේ. මෙම ක්‍රමවේද ඕනෑම එකක් අනුරූප කරගැනීමේදී මෙම වගුව 8වන පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණය සම්බන්ධ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
Green Dot	උසස් පාසල්වල ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම අරමුණු කරගත්, **සිදුවීම් දකින්නන් සඳහා වන සම ක්‍රියාකාරිත්ව වැඩසටහනකි**[24]	ඇමරිකා එක්සත් ජනපදය	උසස් පාසල් සිසුන්	වැඩසටහනට පහත දැක්වෙන අය ඇතුළත් කරගනු ලාබේ: ගුරුවරුන් විසින් තෝරාගන්නා ගැහැණු සහ පිරිමි ජනමත නායකයන්. ඔවුන් පැය පහක කාලයක් පුරා දිවෙන සිදුවීම් දකින්නන් සඳහා වන මැදිහත්වීම්වලට සහභාගී වනු ඇත. ඒවා මෙහෙයවනු ලබන්නේ පුහුණු දූෂණ අර්බුද මධ්‍යස්ථාන අධ්‍යාපනය සපයන්නන් විසිනි. පුහුණුව ලබන ශිෂ්‍ය නායකයන් හැඳින්වෙන්නේ ග්‍රීන් ඩොට්ස් ලෙසයි. ඔවුහු ලිංගික ප්‍රචණ්ඩත්වයට යොමුවිය හැකි චර්යාවන් හඳුනාගනිති (රෙඩ් ඩොට්ස්). ආරක්ෂාකාරී ලෙස මැදිහත්වන ආකාරය ඔවුහු උගනිති. වාර්ෂික පාසල් ඉදිරිපත් කිරීම් මගින් මෙයට උපකාර කෙරේ. ඒවා මගින් ග්‍රීන් ඩොට්ස්, රෙඩ් ඩොට්ස් සංකල්පය වැරගන්වනු ලැබේ.	අවුරුදු 5යි	**ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලිත පරීක්ෂණය (RCT) **බලපෑම:** වසර දෙකකට පසු, ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සිදුකිරීමේ කැපීපෙනෙන අඩුවක් තිබේ. වැඩසටහනේ පසුගිය වසර දෙක තුළදී ගැහැණු ළමයින්ගේ ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම්වල ද කැපීපෙනෙන අඩුවක් තිබේ.[25]

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
Good Schools Toolkit, Raising Voices	ප්‍රාථමික පාසල්වල ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලනය කිරීමේ **සමස්ත පාසල් එළඹුමක්**	උගන්ඩාව	ප්‍රාථමික පාසල් ගුරුවරුන් සහ සිසුන්	මෙම මෙවලම් කට්ටලයෙහි අරමුණ වන්නේ පාසලේ මෙහෙයුම් සංස්කෘතියට බලපෑම් කිරීම මගින් පාසලේදී ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමයි.[26] එයට ක්‍රියාකාරකම් 60ක් පමණ අඩංගු පියවර හයේ ක්‍රියාවලියක් අයත් වේ. ඒවා පාසල් මට්ටමේදී වෙනත් ක්‍රියාකාරකම් සමග සම්බන්ධීකරණය කරනු ලැබේ. මව්පියන් සහ ප්‍රජාව සමස්තයක් ලෙස සම්බන්ධ කරගනු ලැබේ.	මාස 18යි.	**ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලිත පරීක්ෂණය (RCT) **බලපෑම:** මැදිහත්වීම් සිදුකරන පාසල්වලදී, මෙම මෙවලම් කට්ටලය හේතුවෙන් ගුරුවරුන් සහ පාසල් කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ළමයින්ට එරෙහි ශාරීරික ප්‍රචණ්ඩත්වය 42%කින් (මාස 18 තුළදී) අඩු විය. එසේම, (පාලනය කරන ලද කොටසට සාපේක්ෂව) ළමයින්ට එරෙහි ශාරීරික ප්‍රචණ්ඩත්වය භාවිතා කරන බව වාර්තා කළේ ගුරුවරුන් 50%ක් අඩුවෙනි. මෙවලම් කට්ටලය විසින් සිසුන් තම පාසල ඔස්සේ හඳුනාගැනීම මෙන්ම ඔවුන්ගේ ආරක්ෂාව හා පාසලට අයත්වීම පිළිබඳ හැඟීම ද ප්‍රවර්ධනය කරන ලදී.[27]

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
Port Moresby: A Safe City for Women and Girls Programme, UN Women	සාකල්‍ය සහ බහු ආංශික **ආරක්ෂිත නගර හා ආරක්ෂිත පොදු අවකාශ වැඩසටහන** විසින් කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ආරක්ෂිත වෙළඳපොළ සහ පොදු ප්‍රවාහන මූලපිරුම් සහතික කිරීමේ පරිපූර්ණ එළැඹුම් සම්බන්ධ කරගන්නා ලදී. පොදු අවකාශවල ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම කෙරෙහි අවධානය යොමුකරන ලද මහජන ක්‍රියාමාලාවක් සහ සමාජ බලමුළුගැන්වීමේ ක්‍රියාකාරකම් ද එයට ඇතුළත් විය.[28]	පෝට් මෝස්බි, පැපුවා නිව්ගිනියා	කාන්තා වෙළඳුන් හා පාරිභෝගිකයන්, ගමන් කරන කාන්තාවන්, වෙළඳපොළ කළමනාකරණය, ප්‍රවාහන අධිකාරීන් ඇතුළු රාජ්‍ය නියෝජිතායතන, සිසුන්, සේවා සපයන්නන්, අධිකාරීන් සහ සාමාන්‍ය ජනතාව	**ආරක්ෂිත වෙළඳපොළ මූලපිරුම:** වෙළඳපොළ කළමනාකරණයේ ධාරිතා ගොඩනැගීම, වෙළඳුන්ගේ සංගම් පිහිටුවීම, වෙබ් පාදක වෙළඳපොළ ගාස්තු අයකිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම, මූල්‍ය සාක්ෂරතාව, ව්‍යාපාර සංවර්ධනය සහ සෞඛ්‍ය දැනුවත්භාවය **ආරක්ෂිත පොදු ප්‍රවාහන මූලපිරුම:** පොදු ස්ථානවල ඉහළ මට්ටමේ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයක් තිබෙන විටදී කාන්තාවන්ගේ සහ ළමයින්ගේ ආරක්ෂාව සඳහා තාවකාලික විශේෂ විසඳුමක් ලෙස කාන්තාවන් සඳහා පමණක් වන බස් සේවාවන්ට සහාය. ප්‍රවාහන අධිකාරීන්ගේ, බස් හා ටැක්සි රියදුරන්ගේ (පිරිමි සහ කාන්තා) ආයතනික දැනුවත්භාවය සහ ධාරිතා ගොඩනැගීම සහ නගරයේ ප්‍රවාහන සැලැස්මට තොරතුරු මගින් දායක වීම සඳහා මුළු නගරයේම සමාජභාවය හා ප්‍රවාහනය සම්බන්ධ අධ්‍යයනයක් සිදුකිරීම වෙනත් ක්‍රියාමාර්ගවලට අයත් වේ. **තරුණ සහ ප්‍රජා ක්‍රියාකාරිත්වය:** සාක්ෂි මත පදනම් වූ චර්යා වෙනස් කිරීමේ ක්‍රියාමාලාවක් වන “Sanap Wantaim” (එක්ව නැගීසිටිමු) විසින් ප්‍රධාන පණිවුඩ[29] ප්‍රවර්ධනය කරනු ලැබේ. පාසල්වල, වෙළඳපළවල සහ පහළ ආදායම් සහිත නිවාසවල තරුණ නායකත්ව වැඩසටහන්, ආරක්ෂිත නිවාස සහ පොලිසිය සඳහා පුහුණුව, කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ට සේවා වෙත ප්‍රවේශ තහවුරු කරන ප්‍රජා යොමුකිරීම් සහ මාර්ගෝපදේශ සේවා (CRMS) එයට අයත් වේ.	අවුරුදු 9 (ආරක්ෂිත වෙළඳපොළ මූලපිරුම) අවුරුදු 5 (ආරක්ෂිත පොදු ප්‍රවාහන මූලපිරුම)	**ඇගයීම් වර්ගය:** පර්යේෂණාත්මක නොවන, පශ්චාත් සිද්ධි සහභාගීත්ව බලපෑම් තක්සේරුව **බලපෑම:** වෙළඳපොල පාලනයේදී තීරණ ගැනීමේදී හඬක් තිබෙන කාන්තා වෙළඳුන් ඇතුළු කාන්තාවන් සවිබලගැන්වීම සම්බන්ධ ප්‍රතිඵලවල වැඩිදියුණු කිරීම්. වෙළඳපොළේදී සහ බස්රියවලදී ආරක්ෂාව, සුවපහසුව හා ගරුත්වය සම්බන්ධයෙන් කාන්තාවන්ගේ දැක්මෙහි වැඩිදියුණු කිරීම්.[30]

සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

ආරක්ෂිත පරිසරයන් නිර්මාණය කිරීමට අදාළ වන ඵලදායී එළඹුමක පොදු ලක්ෂණ සහ මූලධර්ම.[31,32]

වැඩසටහන් සැකසීම හා අනුරූප කරගැනීම

1. **ගුණාත්මක ක්‍රම ඇතුළත් පරාසකරණය කිරීමේ අධ්‍යයනයක් මෙහෙයවන්න. කාන්තාවන්ගේ ආරක්ෂක විගණනයන් ද එයට ඇතුළත් විය හැකිය. කාන්තාවන් සහ ගැහැණු ළමයින් ප්‍රචණ්ඩත්වය සහ අනන්‍යතා සාධක හේතුවෙන් විශේෂයෙන් පීඩාවට පත්වන්නේ කෙසේද යන්න ගැන බහුවිධ පාර්ශ්වකරුවන්ට වඩා හොඳින් අවබෝධ කරගැනීමට එය උපකාරී විය හැකිය.** ඒවා ඔබ විසින් ඉලක්ක කරනු ලබන පරිසරයන්ගේ ආරක්ෂාව සම්බන්ධ දැක්මට බලපෑ හැකිය. විය හැකි සහායකයන් හඳුනාගැනීමට සහ ඵලදායී විසඳුම් සැලසුම් කිරීම සඳහා පාර්ශ්වකරුවන් සිතියම්ගත කරගැනීමක් ද මෙම එළඹුමට අයත් වේ. සහභාගීත්ව වැඩමුළුවල ප්‍රධාන පාර්ශ්වකරුවන් විසින් පරාසකරන අධ්‍යයනයේ සොයාගැනීම් නිරූපණය කළ යුතුය. එය වැඩසටහනේ සැලැස්ම තුළට ඇතුළත් කළ යුතුය.

2. **සෑම අවධියකදීම විවිධ කාන්තා සහ ගැහැණු ළමයින් කණ්ඩායම් සම්බන්ධ කරගන්න. බහුවිධ සහ එකිනෙක විනිවිද යන වෙනස්කම් කිරීම්වලට මුහුණදෙන සහ ප්‍රචණ්ඩත්වයේ සහ වැඩ ලෝකයේ සහ පොදු අවකාශවල වැඩි අවදානමකට මුහුණ දෙන කාන්තාවන් ඇතුළත් කරගත යුතුය.**[33] අවිධිමත් ක්ෂේත්‍රයේ වැඩකරන කාන්තාවන්, සංක්‍රමණික කාන්තාවන්, ගෘහ සේවිකාවන් සහ කාන්තා ලිංගික ශ්‍රමිකයන් ද එයට අයත්ය. වයස, ජනවර්ගය, ආබාධිතබව, සමාජ ආර්ථික තත්වය සහ තවත් කාරණා අනුව විවිධ කාන්තාවන් සහ ගැහැණු ළමයින් විවිධාකාරයෙන් ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන ආකාරය මැදිහත්වීම් විසින් සලකා බලන බව සහතික කිරීමට මෙය උපකාරී වේ.[34] කෙසේ වෙතත්, වර්තමානයේදී මේ සම්බන්ධයෙන් තිබෙන්නේ සුළු සාක්ෂි ප්‍රමාණයකි.

3. **පොදු අවකාශවලදී සහ වෙනත් පරිසරයන්හිදී ප්‍රචණ්ඩත්වය පවත්වාගෙන යාමේ ආකාරයක් ලෙස හිංසනය සහ වෙනත් ස්වරූපවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන්න.**[35] අන්තර්ජාලය ඇතුළු ප්‍රසිද්ධ හා පෞද්ගලික අවකාශවලදී කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය සිදුකිරීම අතර සම්බන්ධකම් සාක්ෂි මගින් පෙන්නුම් කරනු ලැබේ. කෙසේ වෙතත්, මෙම පරාසය තුළ සක්‍රියව කටයුතු කරන්නේ වැඩසටහන් කීපයක් පමණි.

4. **හිමිකම් පාදක ප්‍රවේශයක් අනුගමනය කරන්න.** උදාහරණයක් ලෙස, මැදිහත්වීම්වල 'නගරය සඳහා අයිතිය' එළඹුම විසින් පොදු අවකාශවල ප්‍රචණ්ඩත්වය, කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනයට, සේවාවන්ට, රැකියාවලට, අයිතිය, විනෝදයට සහ දේශපාලනිකව සංවිධානය වීමට තිබෙන අයිතිය.[36]

ක්‍රියාත්මක කිරීම

5. **සහභාගීත්ව එළඹුම ඔස්සේ සමාජභාවී සමාජ සම්මතයන් සහ බලය ගැන විචාරශීලී ලෙස සලකාබැලීම සඳහා සහභාගිකයන් උනන්දු කරන්න.** උදාහරණයක් ලෙස, පාසල්වල සම වයස් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම අරමුණු කරගත් මැදිහත්වීම් ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී ඵලදායී බව සොයාගෙන තිබේ. සමාජභාවී සමාජ සම්මතයන් නිරූපණය කිරීම සඳහා ඒවායේ සාමාන්‍යයෙන් යොදාගනු ලබන්නේ ඒක ලිංගික හෝ මිශ්‍ර පිරිමි හෝ පිරිමි ළමා මෙන්ම ගැහැණු සහ ගැහැණු ළමා කණ්ඩායම්යග[37]

6. **මැදිහත්වීම් ප්‍රමාණවත් තරම් තීව්‍රතාවකින් යුක්තබව සහ වෙන වෙනම පවත්වනු ලබන ඒවා නොවන බව තහවුරු කිරීම.** උදාහරණයක් ලෙස, ආරක්ෂාව සිතියම්ගත කිරීමේ ඇප් වැනි සැසියක්, දෙකක් ඇතුළත් ඩිජිටල් මැදිහත්වීම් සහිත 'සිදුවීම් දකින පුද්ගලයන්' සඳහා වන වෙනම ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුවීමක් සිදුවේ යයි සිතිය නොහැකිය.[38]

7. **ප්‍රාදේශීය, කලාපීය සහ ජාතික රජයන් ඇතුළු විවිධ ක්ෂේත්‍රවල පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කර හවුල්කාරිත්වයන් ගොඩනගන්න.**[39] උදාහරණයක් ලෙස, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන සමග වැඩකිරීම සහ සැලසුම් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා සහ අධීක්ෂණය හා ඇගයීම දක්වා කාන්තා සංවිධාන සමග හවුල්කාරිත්වයන් ගොඩනගාගැනීමට උත්සාහ කිරීම.[40] ධනාත්මක හවුල්කාරිත්වයන් ගොඩනගාගැනීම සහ වැදගත් තීරණ ගැනීමේ භූමිකාවන්හිදී ප්‍රාදේශීය හිමිකාරිත්වය ගැන හැඟීම මූලෝපාය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේදී වැදගත් වේ.

8. **සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සංවිධාන සංස්කෘතිය සලකා බලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. එයට පාසල්, ප්‍රවාහනය, යටිතල පහසුකම් සහ සමාගම් ඇතුළත් කරගන්න.** උදාහරණයක් ලෙස, Good School මෙවලම් කට්ටලය විසින් ඉලක්ක කරනු ලබන්නේ සියලු ළමයින්ට ආරක්ෂිත ලෙස ඉගෙනගත හැකි ධනාත්මක පාසල් සංස්කෘතියක් නිර්මාණය කිරීමයි. පාසල විසින් අරමුණක් නිර්මාණය කරනු ලබන අතර එම අරමුණ වෙත ළඟාවීම සඳහා මෙන්ම පාසල් පාලනය ශක්තිමත් කිරීම සඳහා ද ක්‍රියාකාරකම් සැලැස්මකට එකඟ වේ.[41]

9. **පොදු අවකාශවලදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමග විශේෂිත වශයෙන් සම්බන්ධ වන නීති පිළිබඳ උද්දේශනය සහ අධීක්ෂණය සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට**

සහාය සපයන්න. එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය විසින් ඉක්වඩෝරයේ ක්විටෝ නගරයෙහි සහ පිලිපීනයේ ක්වෙසෝන් නගරයෙහි ක්‍රියාත්මක කළ Safe Cities and Safe Public Spaces Global Flagship Programme[42], වැඩසටහන්වලදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන සමීක්ෂණ හවුල්කරුවන් සමග පොදු ස්ථානවල ලිංගික හිංසනය පිළිබඳ දත්ත එක්රැස් කළහ. එය පොදු අවකාශවල ලිංගික හිංසනය සම්බන්ධ නීතිවල අඩුපාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පරාසකරන අධ්‍යයනයේ කොටසක් විය. බහු ආංශික පාර්ශ්වකරුවන් සමග වැඩකිරීමේ මෙම එළඹුමෙහි ප්‍රතිඵලයක් ලෙස ඓතිහාසික නීතියක් සම්මත විය. පොදු අවකාශවල ලිංගික හිංසනය සම්බන්ධයෙන් දඬුවම් එහි ඇතුළත් විය. නීතිමය අඩුපාඩු සම්බන්ධ අවශ්‍යතාවන් ස්ථානගත කිරීමට උපකාරී වීම වෙනත් නගරවලදී කටයුතු කිරීමට නියමිත විය.[43]

10. **ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මැදිහත්වීම්වල ඵලදායීතාව අධීක්ෂණය කරන දත්ත සහ සාක්ෂි නිර්මාණය කරන්න, පාවිච්චි කරන්න, පළකරන්න.** විශේෂයෙන්ම, පොදු අවකාශවල සහ වෙනත් පරිසරයන්ගේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන මැදිහත්වීම්වල ඵලදායීතාව පිළිබඳ දත්ත සහ සාක්ෂිවල අඩුවක් තිබේ.

ඇතුළත් වීමේ ස්ථාන

ආරක්ෂිත පරිසරයන් නිර්මාණය කිරීම සඳහා වන එළඹුම්වල බලපෑම උපරිම කිරීම සඳහා ඒවා බහුවිධ පසුබිම් සහ අංශ සමග ඒකාබද්ධ කළ හැකිය. පහත දැක්වෙන වගුවෙහි අවධාරණය කරනු ලන්නේ මෙම මූලෝපාය සඳහා වන ප්‍රධාන පිවිසුම් ලක්ෂ්‍යයන්ය. වැඩසටහන් උදාහරණ ද එයට ඇතුළත් වේ.

පිවිසුම් ලක්ෂ්‍ය	තර්කනය
ප්‍රවාහනය • ප්‍රවාහන සැලසුම්කරණය සහ යටිතල පහසුකම් (ස්ථාන, නැවතී සිටීමේ ප්‍රදේශ, සේවා සහ 'අවසන් සැතපුමේ සම්බන්ධතාව'[44]) • පොදු ප්‍රවාහනය	පොදු ප්‍රවාහනය තුළ සහ ඒ ආශ්‍රිතව ඉහළ මට්ටමක ලිංගික හිංසනය සහ වෙනත් ස්වරූපවල ප්‍රචණ්ඩත්වයන් පැවතීම සහ දුර්වල සැලසුම්කරණය හේතුවෙන් ප්‍රචණ්ඩත්වය සඳහා යෝග්‍ය ස්ථාන නිර්මාණය විය හැකි ආකාරය අධ්‍යයන මගින් පෙන්වාදී තිබේ.[45,46] කාන්තාවන් සහ ගැහැණු ළමයින් වෙතින් විවෘතවම සහ අර්ථවත් අන්දමින් උපදෙස් විමසන සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කරන, සමාජභාවී වශයෙන් ප්‍රතිචාරාත්මක ප්‍රවාහන සැලසුම්කරණය, ප්‍රතිපත්ති සහ වෙනත් මැදිහත්වීම්, ආරක්ෂාව සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ කාන්තාවන්ගේ දැක්ම වැඩිදියුණු කිරීමට උපකාර වේ. උදාහරණයක් ලෙස, ඉක්වඩෝරයේ ක්විටෝ නගර ආරක්ෂක වැඩසටහන විසින් 2012දී පරාසකරන අධ්‍යයනයක් සිදුකරන ලදී. ක්විටෝ නගරයේ කාන්තාවන් අතරින් 65%ක්ම කිසියම් ස්වරූපයක ලිංගික හිංසනයකට මුහුණදී තිබෙන බව එමගින් සොයාගන්නා ලදී. එය බොහෝවිට සිදුවන්නේ පොදු ප්‍රවාහනයේය. එයට ප්‍රතිචාර ලෙස නගර පාලනය විසින් තම වාර්ෂික සැලැස්මට ආරක්ෂිත ප්‍රවාහනය ඇතුළත් කරන ලදී.පොදු ප්‍රවාහනයේ ලිංගික හිංසනය සහ වෙනත් ස්වරූපවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා පරිසමාප්ත මූලෝපායක් සංවර්ධනය කිරීම සඳහා කමිටුවක් පත්කරන ලදී. කෙටුම්පත් කරන ලද ප්‍රොටොකෝල බස් රියදුරු සහ මෙහෙයුම්කරු කණ්ඩායම් අතර වලංගු කරන ලදී. එයට ප්‍රතිචාර ලෙස පැහැදිලි වගකීම් බෙදීමේ සටහනක් නිර්මාණය කරන ලදී. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ වාර්තා කිරීම තම භූමිකාව බව එම කණ්ඩායම් වෙත අවබෝධ කරදෙන ලදී'[47] තවත් උදාහරණයක් වන්නේ, දිල්ලියේ රියදුරන්, කොන්දොස්තරවරුන් සහ සියලු ප්‍රවාහන කාර්ය මණ්ඩලවලට ලිංගික හිංසනය අවබෝධ කරගැනීමට උපකාර පිණිස සමාජභාවී පුහුණුව ලබාදීමයි. මෙම පුහුණුව 2007 සිටම සිදුවේ. වර්තමානයේදී ඕනෑම වාහනයක් වාර්ෂිකව ලියාපදිංචිය සඳහා පැමිණෙන විට, ඔවුන් ලිංගික හිංසනය පිළිබඳ දැනුම අලුත් කිරීමේ පැයක පුහුණුවකට සහභාගී විය යුතුය.[48]

මූලෝපාය සාරාංශය

පිවිසුම් ලක්ෂ්‍ය	තර්කනය
නගර සැලසුම් කිරීම සහ ඉදිකිරීම • පොදු අවකාශ • බලශක්ති සම්පාදනය • ජලය සහ සනීපාරක්ෂක සේවා • ඉඩම් සහ නිවාස (අවිධිමත් ජනාවාස ඇතුළු) • සරණාගත/ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ කඳවුරු පසුබිම්	නාගරික සංවර්ධන ව්‍යාපෘතිවලදී ආරම්භයේ සිටම කාන්තාවන්ගේ නාගරික අවකාශ භාවිතය සහ ආරක්ෂක අවදානම් සැලකිල්ලට ගැනීම මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුවීම වැළැක්විය හැකිය. උදාහරණයක් ලෙස, ආරක්ෂිත පොදු පදික මාර්ග සහ මනා ආලෝකකරණය සැලකිය හැකිය. ආරක්ෂක විගණනයන්, කාන්තාවන් සහ ගැහැණු ළමයින් සම්බන්ධ කරගැනීම සහ වාර්තා කරන හෝ සිතියම්ගත කරන ඇප් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම හා එය වැඩියෙන් පවතින ස්ථාන හඳුනාගැනීම මගින් ඵලදායී ක්‍රියාමාර්ග දිරිගැන්විය හැකිය.[49] උදාහරණයක් ලෙස, කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයෙන් තොර දිල්ලි ආරක්ෂිත නගර වැඩසටහන විසින් කාන්තා ආරක්ෂණ විගණනයන් (WSAs) භාවිතා කරන ලදී. එයට ජගෝරි සංවිධානය, පළාත් පාලන ආයතනය සහ එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය හවුල් වූහ. එමගින් කාන්තාවන්ගේ ආරක්ෂාව පිළිබඳ තොරතුරු වැඩසටහනේ පරාසකරණ අධ්‍යයනය සමග එක්රැස් කරන ලදී. WSA අදියර තුනකින් ක්‍රියාත්මක කරන ලදී. පළමුව සහභාගිකයන් 5-6 වැනි පිරිසකගෙන් ප්‍රජා පසුබිමකදී කඩදාසි, පෑන් භාවිතා කර විගණනයන් සිදුකරන ලදී. දෙවනුව, ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ හවුල්කරු වූ ජගෝරි සංවිධානය විසින් බහුවිධ රාජ්‍ය හරහා ක්‍රමවේදය පිළිබඳ පුහුණුව ලබාදෙන ලදී. අවසානයේදී විවෘත වීදි විගණන සිතියම්කරණය (OSAM) මගින් කාන්තාවන්ගේ හා පිරිමින්ගේ ද, ගැහැණු හා පිරිමි ළමයින්ගේ ද අදහස් ලබාගන්නා ලදී. එහි ජයග්‍රහණ අතර අවසන් සැතපුමේ සම්බන්ධතාවේ සහ භයානක මර්මස්ථානවල වැදගත්කම අවධාරණය කිරීම විය. ඒවා සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනය විසින් කටයුතු කරන ලදී. WSA ක්‍රමවේදය ඉන්දියාවේ සියලු නාගරික සැලසුම් සහ සුහුරු නගර ව්‍යාපෘති සඳහා අනිවාර්ය විය.[50]
වැඩ සහ රැකියා[51] • විධිමත් සේවකයෝ • අවිධිමත් සේවකයෝ • සේවා තත්වයන් සහ කම්කරු නීති මූලපිරුම් • තරුණ රැකියා වැඩසටහන් • කාන්තා රැකියා වැඩසටහන්	වැඩ ලෝකයෙහි ප්‍රචණ්ඩත්වය සහ හිංසනය කෙරෙහි අවධානය යොමුකරන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) 2019 (C190) දරණ ප්‍රචණ්ඩත්වය සහ හිංසනය පිළිබඳ සම්මුතිය විසින් මෙම මූලෝපාය සඳහා ප්‍රධාන පිවිසුම් ලක්ෂ්‍යයක් සපයනු ලැබේ.[52] නීතිමය බැඳීමක් සහිත මෙම සම්මුතිය විසින් සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ හිංසනය අසමානුපාතික ලෙස කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට බලපාන බව හඳුනාගනියි. වැඩ කිරීම, වැඩට යාම සහ ඒම, වැඩ හා සම්බන්ධ ගමන්, වැඩ සම්බන්ධ සන්නිවේදනය සහ සේවායෝජකයා විසින් සපයනු ලබන නවාතැන් ආදියෙහිදී කාන්තාවන් මුහුණදෙන ප්‍රචණ්ඩත්වයට සහ හිංසනයට මෙය අදාළ වේ. මෙය පෞද්ගලික හෝ රාජ්‍ය, විධිමත් සහ අවිධිමත් ආර්ථිකයන්ගේ සියලු අංශවලට අදාළ වේ. උදාහරණයක් ලෙස, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සුනිසි රැකියා මූලපිරුම ඇඟලුම් කර්මාන්තයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධයෙන් තුන් ආකාරයක එළඹුමක් අනුගමනය කරයි. ඒ ලිංගික හිංසන ප්‍රතිපත්ති, දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණයන් හා යොමුකිරීම්, සේවකයන් අතර දැනුවත්භාවය වැඩි කිරීමේ වැඩසටහන් සහ කළමනාකරුවන්, මානව සම්පත් සම්බන්ධයෙන් වගකිවයුත්තන්, රේඛීය කළමනාකරුවන් සහ සේවකයන් සමග ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් වැනි පද්ධති ස්ථාපිත කිරීම හරහාය.[53] අවිධිමත් කම්කරුවන් ආරක්ෂා කරන ජාතික නීති සම්බන්ධයෙන් උදාහරණ අතර ඉන්දියාවේ 2013දී හඳුන්වාදුන් සේවා ස්ථානයේ කාන්තාවන් ලිංගික හිංසනයට ලක්කිරීම (වැළැක්වීම, තහනම් කිරීම, සහන සැලසීම) පනත තිබේ. එය ඉතා පැහැදිලිව විධිමත් හා අවිධිමත් යන සේවක දෙවර්ග යම ඇතුළත් කරගෙන තිබේ. නිවස ද සේවා ස්ථානයක් ලෙස සැලකෙන අතර ගෘහ සේවකයන්ට ද දිස්ත්‍රික් පැමිණිලි කමිටුව වෙත පැමිණිලි කිරීම සඳහා පැමිණිලි යාන්ත්‍රණය භාවිතා කළ හැකිය.[54]

පිවිසුම් ලක්ෂ්‍ය	තර්කනය
පාසල් සහ වෙනත් අධ්‍යාපනික ආයතන • සමස්ත පාසල් එළඹුම • විෂයමාලා පාදක ඉගෙනුම් මැදිහත්වීම් • ගුරු පුහුණුව	පාසල් සතුව ප්‍රචණ්ඩත්වය විශාල වශයෙන් වැළැක්වීමේ විභවයන් තිබේ. එය හුදෙක් පාසල් පරිසරයට සීමා නොවන අතර, නිවසේ හා අනාගත සම්බන්ධතාවලදී ද ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට ඉවහල් වේ.55 පාසල්වල, ප්‍රජාවන්ගේ සහ පවුල්වල අන්තර් සම්බන්ධිතභාවය සම්බන්ධයෙන් සැලකිලිමත් වන සමස්ත පාසල් එළඹුම ආරක්ෂිත ඉගෙනුම් පරිසරයන් නිර්මාණය කිරීමේ ඵලදායී මාර්ගයක් විය හැකිය.[56] පාසල් පාදක විෂයමාලා එළඹුම් වැනි වෙනත් මැදිහත්වීම් එළඹුම් විසින් ද විශ්වාසයක් ප්‍රදර්ශනය කරනු ලැබේ. (බලන්න ළමා හා නවයොවුන් අපයෝජන වැළැක්වීම පිළිබඳ RESPECT මූලෝපායික සාරාංශය) උදාහරණයක් ලෙස, Right to Play නම් රාජ්‍ය නොවන සංවිධානය විසින් පකිස්තානයේ රාජ්‍ය පාසල් 40ක ක්‍රියාත්මක කරන ලද ක්‍රීඩා පාදක ජීවන කුසලතා අධ්‍යාපන වැඩසටහනෙහි ඉලක්කය වූයේ ළමයින් සවිබලගන්වමින් ප්‍රචණ්ඩත්වය වැළැක්වීමයි. මෙම මැදිහත්වීම තුළට ගුරු පුහුණුව, ග්‍රීෂ්ම නිවාඩු කඳවුරු, ක්‍රීඩා තරගාවලි සහ ළමයින් සඳහා තේමාත්මක සෙල්ලම් දින ඇතුළත් විය. අවුරුද්දට කීප වතාවක් ඒවාට සහභාගී වීමට මව්පියන්ට ආරාධනා කරන ලදී. මැදිහත්වීම සමග සම්බන්ධ වූ ළමයින් විසින් සම වයස් ප්‍රචණ්ඩත්වයේ සහ පාසල්වල ශාරීරික දඬුවම්වල කැපීපෙනෙන අඩුවක් වාර්තා කරන ලදී.[57]
ඩිජිටල් තාක්ෂණය • අන්තර්ජාල තොරතුරු සහ ඇප් • ඩිජිටල් ක්‍රියාමාලා	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා අදාළ ප්‍රශ්න මෙන්ම පිළිතුරු ද ඩිජිටල් තාක්ෂණය විසින් සපයනු ලැබේ. අන්තර්ජාලය හරහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වර්ධනය වී වඩාත් නරක තත්වයට පත්වී තිබේ. අලුත් සහ නවීන තාක්ෂණයන් මගින් වැරදිකරුවන්ට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුකිරීම සඳහා නව ක්‍රම සම්පාදනය වේ. කෙසේ වෙතත්, ඩිජිටල් තාක්ෂණය මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාල උද්දේශනය හා ක්‍රියාකාරිත්වය සඳහා ද අවකාශයක් සැපයේ. වර්තමානයේදී අන්තර්ජාල ක්‍රියාමාලා විසින් කාන්තා අයිතිවාසිකම් සංවිධානවල කාර්යයන්ගේ සහ අලුත් මැදිහත්වීම්වල ප්‍රධාන කොටසක් නිර්මාණය කරනු ලැබේ. උදාහරණයක් ලෙස, ආරක්ෂාව සිතියම්ගත කිරීමේ ඇප් සැලකිය හැකිය.[58] ඩිජිටල් විසඳුම් සතුව ආරක්ෂිත සහ යෝග්‍ය ප්‍රතිචාර තිබීම වැදගත් වේ. අන්තර්ජාල උපදේශන සේවා සැපයීම සඳහා පුහුණු උපදේශකවරුන් සහ සිතියම්ගත කිරීමේ/ පොලිස් ප්‍රතිචාර අවදි කිරීමේ පද්ධතියක් අවශ්‍යය. ඩිජිටල් තාක්ෂණයන්ට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්විය හැක්කේ කෙසේද යන්න ගැන සාක්ෂි මඳය. ප්‍රතිඵලදායක වීම සඳහා ඒවා පැකේජයක කොටස් ලෙස ක්‍රියාත්මක කළ යුතු බව දක්නට ලැබේ.59 #MeToo ව්‍යාපාරය අන්තර්ජාල කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එදිරි ක්‍රියාමාලා සඳහා උදාහරණයකි. වෙනත් උදාහරණ අතර, #BringBackOurGirls මගින් නයිජීරියාවේ චිබොක්හිදී 2014දී පැහැරගෙන යන ලද ගැහැණු ළමයින් ආපසු ලබාදෙන ලෙස ඉල්ලාසිටිනු ලැබේ. #NiUnaMenos 2015දී ආර්ජන්ටිනාවේ දියත් කරන ලද යනු සමාජභාවී ප්‍රචණ්ඩත්වයට එරෙහි ක්‍රියාමාලාවකි. එය පසුව ලතින් ඇමරිකාව හා කැරිබියානු කලාපය තුළ පැතිරිණි.

ප්‍රයෝජනවත් මූලාශ්‍ර

ආරක්ෂිත පාසල්

Global Guidance on Addressing School-related Gender-based Violence, Paris and New York: UNESCO and UN Women; 2016.
මෙමගින් පාසල් ආශ්‍රිත සමාජභාවී ප්‍රචණ්ඩත්වය (SRGBV) පිළිබඳ සම්පත් සපයයි.

Raising Voices Good School Toolkit.
ළමා හිතවාදී ආරක්ෂිත පාසලක් යනු කුමක්දැයි තේරුම්ගැනීම සඳහා සහ එම දැක්ම යථාවත් කරගැනීම සඳහා අධ්‍යාපන සේවා සපයන්නන්ට සහ ළමයින්ට සහාය වීම සඳහා සැලසුම් කරන ලද ක්‍රමවේදයකි. පාසල්වල ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී එය සාර්ථක බව ඔප්පු වී තිබේ.

Effects of Bystander Programs on the Prevention of Sexual Assault Among Adolescents and College Students. Hensman Kettrey, H., Marx, R. A., and E. E Tanner-Smith. Campbell Collaboration. 2019
නවයොවුන් පුද්ගලයන් හා විද්‍යාල ශිෂ්‍යයන් අතර සිදුවීම් දකින්නන් වෙනුවෙන් වන වැඩසටහන්වල ඵලදායීතාව පිළිබඳ ක්‍රමානුකූල සමාලෝචනයකි. මෙහි තිබෙන දෘඪ ඇගයීම් 27න් 25ක් කරනු ලැබුවේ එක්සත් ජනපදයෙහිය.

A Whole School Approach to Prevent School-Related Gender-Based Violence: Minimum Standards and Monitoring Framework, Global Working Group to End SRGBV & UNGEI (2017)
මෙම මාර්ගෝපදේශය විසින් ප්‍රතිපත්ති සම්පාදකයන් සහ භාවිතා කරන්නන් සඳහා පාසල්වල ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් සැලසුම් කිරීමට සහ ප්‍රතිචාර ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට රාමුවක් සපයනු ලැබේ.

ආරක්ෂිත පොදු අවකාශ

Safe Cities and Safe Public Spaces for Women and Girls Global Flagship Initiative: International Compendium of Practices. And Second Compendium. UN Women: New York. 2019
ලොව පුරා නගරවල කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කරන ලද මැදිහත්වීම් සාරාංශගත කරයි..

Safe Cities and Safe Public Spaces for Women and Girls Global Flagship Initiative: Global Results Report. UN Women: New York. 2017
එක්සත් ජාතීන්ගේ සන්නාම මූලපිරුමක ප්‍රතිඵලයි. වැඩසටහන් රාමුවක් ද, සිද්ධි අධ්‍යයන හා ගෝලීය වැඩසටහන්වලින් උගත් පාඩම් ද එයට අයත් වේ.

Violence against Women and Girls, Infrastructure and Cities Briefing Paper. Fraser, E., Viswanath, K. and L. McLean. 2017.
යටිතල පහසුකම් හා නගර කටයුතු, ප්‍රවේශ ලක්ෂ්‍ය සහ සිද්ධි අධ්‍යයන හරහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සාරාංශගත කරන කෙටි පත්‍රිකාවකි.

Violence Against Women and Girls Resource Guide: Transport Brief. World Bank. 2015
කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ ප්‍රවාහනය, ප්‍රවාහන වැඩසටහන්කරණයේදී ආචාර ධාර්මිකත්වය හා ආරක්ෂක සලකාබැලීම්, කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ප්‍රවාහන මූලපිරුම් හා නිර්දේශිත සම්පත් තුළට නාභිගත කිරීමේ පිවිසුම් ලක්ෂ්‍ය අවධාරණය කරන කෙටි පත්‍රිකාවකි.

ආරක්ෂිත වැඩ පරිසරය

Violence and Harassment Convention, International Labour Organization (ILO). 2019
වැඩ පාදක කරගත් ගරුත්වයේ සහ ප්‍රචණ්ඩත්වයෙන් සහ හිංසනයෙන් තොර අනාගතයක් හැඩගැස්වීම සඳහා ප්‍රායෝගික රාමුවක් සපයන ජාත්‍යන්තර සම්මුතියයි.

Handbook: Addressing Violence and Harassment in the World of Work, UN Women and ILO. 2019.
වැඩ ලෝකයේ ප්‍රචණ්ඩත්වය හා හිංසනය සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ කෙසේද යන කරුණ සම්බන්ධයෙන් පාඩම්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහ බලාපොරොත්තු සහගත උදාහරණ සපයයි.

What Works? Preventing & Responding to Sexual Harassment in the Workplace A Rapid Review of Evidence. CARE. 2018සේවාස්ථානයේ ලිංගික හිංසනයට ප්‍රතිචාර දැක්වීමේ බලාපොරොත්තු සහත භාවිතාවන් සම්බන්ධයන් ක්ෂණික විවරණයක් සපයයි.

සාක්ෂි සමාලෝචන

A Rigorous Review of Global Research Evidence on Policy and Practice on School-related Gender-based Violence, Parkes, J., Heslop, J., Johnson Ross, F., Westerveld, R. & Unterhalter, E. University College London, Institute of Education, 2016.
පාසල් ආශ්‍රිත සමජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ එළඹුම් පිළිබඳ ගෝලීය විවරණයක් සපයයි.
A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, Kerr-Wilson, A.; Gibbs, A.; McAslan Fraser E.; Ramsoomar, L.; Parke, A.; Khuwaja, HMA.; Rachel Jewkes. What Works to prevent violence among women and girls global Programme, Pretoria, South Africa. 2020
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වල ඵලදායීතාව පිළිබඳ යාවත්කාලීන කරන ලද විවරණයක් සපයයි.

What Works to Prevent Sexual Violence against Children: Evidence Review. Ligiero, D., Hart, C., Fulu, E., Thomas, A., & Radford, L. Together for Girls. 2019
ළමයින්ට සහ නව යොවුන් පුද්ගලයන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා තිබෙන සාක්ෂි පිළිබඳ භාවිතා කරන්නට පහසු සාරාංශයක් ඉදිරිපත් කරයි.

පසු සටහන

[1] විශ්වවිද්‍යාලවල, විද්‍යාලවල හෝ තාක්ෂණික ආයතනවල මෙන්ම තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුව සපයන පශ්චාත් ද්විතීය අධ්‍යාපනය ද අඩංගු වේ.

[2] ශ්‍රම බලකා මැදිහත්වීම් දිළිඳුකම අවම කිරීමේ මූලෝපාය යටතේ ඉදිරිපත් කරනු ලැබේ.

[3] UN Women website: https://www.unwomen.org/en/what-we-do/ending-violence-against-women/creating-safe-public-spaces

[4] ILO (2018) Ending violence and harassment against women and men in the world of work: International Labour Conference 107th Session 2018, ILO: Geneva.

[5] UN Women (2017) Safe Cities and Safe Public Spaces: GLOBAL RESULTS REPORT. UN Women: New York.

[6] UNESCO (2016) Global Guidance on School-related Gender-Based Violence. UNESCO: Paris and UN Women: New York.; UN Women (2019a) Guide to Support the Implementation of the Global Women's Safety Framework. UN Women: New York; UN Women and ILO (2019) Addressing Violence and Harassment against Women in the World of Work: Handbook; New York and Geneva: UN Women and ILO; UN Women (2018) A Global Women's Safety Framework in Rural Spaces: Informed by experience in the tea sector, New York: UN Women.

[7] Fraser et al., (2017) Violence against Women and Girls, Infrastructure and Cities Briefing Paper.

[8] ILO (2018) Ibid.; UNESCO (2016) Global Guidance on Addressing School-related Gender-based Violence,

[9] UN Women (2017) Ibid.

[10] UN Women (2017) Ibid.; UN Women (2019a) Ibid.

[11] Fraser et al., (2017) Ibid.

[12] UN Women (2017) Ibid.; World Bank, The Global Women's Institute, IDB and ICRW (2015) VAWG Transport Brief: VAWG Resource Guide.

[13] පර්යේෂණාත්මක නොවන ඇගයීම විසින් මෙම මැදිහත්වීම් මනාව ක්‍රියාත්මක වන බව පෙන්වාදී තිබේ. උදාහරණයක් ලෙස, එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය විසින් පැපුවා නිව්ගිනියාහි ක්‍රියාත්මක කරන ලද කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ආරක්ෂිත නගර වැඩසටහනේ මෑත ඇගයීම විසින් පෙන්වාදෙන ලද කරුණක් වූයේ මූලපිරුම පෝර්ට් මොරෙස්බීහි වෙළඳපොළවල වැඩකරද්දී කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ සවිබලගැන්වීමට, ආරක්ෂාවට, සුවපහසුවට හා ගරුත්වයට දායක විය හැකි බවයි. බලන්න: එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (2019a)

[14] Fulu (2016) A Regional Study of Interventions to Enhance Women and Girls' Safety and Mobility in Public Spaces, Asia and the Pacific Region

[15] එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ Safe Cities and Safe Public Spaces Global Flagship Initiative හි ස්ථාන පාදක මැදිහත්වීම් කෙරෙහි අවධානය යොමුකරන මැදිහත්වීම් ඇතුළත්ය. එහෙත්, දිස්ත්‍රික්කවල සහ නගර හා ගම්වල ජනාවාස කලාපවල පරිසමාප්ත වැළැක්වීමේ වළලුම් ද ඒවායේ අඩංගුය. කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය, ආර්ථික සවිබලගැන්වීම සහ කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම කෙරෙහි අවධානය එය සමග ඒකාබද්ධ කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, Global Initiative යටතේ රටවල් 25ක් තුළ සුරක්ෂිත නගර සහ පොදු අවකාශ මූලපිරුමක් සම්බන්ධයෙන් Respect Framework හි කලාප කීපයක් අදාළ වේ. පැපුවා නිව්ගිනියාවේ පෝර්ට් මොරෙස්බී ආරක්ෂිත නගර වැඩසටහන Respect Framework හි මෙම කලාපයේ ඇතුළත් කර තිබේ. පරාසකරණ අධ්‍යයනයේ තොරතුරු මත වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කිරීම හා නගරයේ විශේෂිත පොදු අවකාශ වෙත අවධානය යොමුකිරීම එහිදී සැලකිල්ලට ගනු ලැබේ.

[16] Kerr-Wilson, A.; Gibbs, A.; McAslan Fraser E.; Ramsoomar, L.; Parke, A.; Khuwaja, HMA.; and Rachel Jewkes (2020). A rigorous global evidence review of interventions to prevent violence against women and girls, What Works to prevent violence among women and girls global programme, Pretoria, South Africa.

[17] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, South Africa; What Works to Prevent VAWG

[18] Breakthrough Insights (undated) Breakthrough's Bell Bajao! A Campaign to Bring Domestic Violence to a Halt.

[19] UNESCO (2016) Ibid; Global Working Group to End SRGBV & UNGEI (2017) A Whole School Approach to Prevent School- related Gender-Based Violence: Minimum Standards and Monitoring Framework. Global Working Group to End SRGBV (2019) Ending School-Related Gender-Based Violence A Series of Thematic Briefs.

[20] Fulu, E., Kerr-Wilson, A. & J. Lang (2014) What works to prevent violence against women and girls? Evidence Review of interventions to prevent violence against women and girls. What Works: Pretoria. ; Kerr-Wilson et al., (2020); WHO (2019) School-based violence prevention: a practical handbook. Geneva: World Fi!LHh Organization.

[21] Devries, K. M., Knight, L., Child, J. C., Mirembe, A., Nakuti, J., and R. Jones (2015) The Good School Toolkit for reducing physical violence from school staff to primary school students: a cluster-randomised controlled trial in Uganda' in The Lancet, vol. 3, no. 7.

; UNICEF (2020) What Works to Prevent Online and Offline Child Sexual Exploitation and Abuse? Review of national education strategies in East Asia and the Pacific. UNICEF: Bangkok. Available at:

[22] UNICEF (2020) Ibid.

[23] Ligiero, D., Hart, C., Fulu, E., Thomas, A., & L. Radford (2019) What Works to Prevent Sexual Violence Against Children: Evidence Review. Together for Girls.

[24] Green Dot වළලුම ද ප්‍රාථමික, මධ්‍ය හා විද්‍යාල මණ්ඩවවල භාවිතය සඳහා අනුරූප කරගෙන තිබේ.

[25] Coker, A. L., Bush, H. M., Cook-Craig, P. G., DeGue, S. A., Clear, E. R., Brancato, C. J. Fisher, B & Recktenwald, E. A. (2017). RCT testing bystander effectiveness to reduce violence. American Journal of Preventive Medicine, 52(5), 566-578.

[26] Good School Toolkit මෙවලම් කට්ටලය මගින් ඉලක්ක කරනු ලබන්නේ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ සම වයස් ප්‍රචණ්ඩත්වය හා ගුරුවරුන් විසින් ළමයින්ට එරෙහිව පළකරනු ලබන ප්‍රචණ්ඩත්වය ඇතුළු ස්වරූප කීපයක් පාලනය කිරීමයි.

[27] Devries, K. M., Knight, L., Child, J. C., Mirembe, A., Nakuti, J., Jones, R., Sturgess, J., Allen, E., Kyegombe, N., Parkes, J., Walakira, E., Watts, C., Elbourne, D., and D. Naker (2015). The Good School Toolkit for reducing physical violence from school staff to primary school students: A cluster-randomised controlled trial in Uganda. The Lancet Global Fi!LHh, 3(7), e378-e386.

මූලෝපාය සාරාංශය

[28] සාකල්‍ය එළඹුමක් ලෙස Port Moresby Safe City මූලපිරුමට ආයතනික සංවිධානමය සංස්කෘතිය, ප්‍රතිපත්ති සහ පටිපාටි, පුහුණුව සහ දැනුවත්භාවය නැංවීම, වාර්තා කරන යාන්ත්‍රණයන් සහ පාසල්වල, වෙළඳපොළවල සහ පොදු ප්‍රවාහනයේ බහු ආංශික චර්යා වෙනස් කිරීමේ ව්‍යාපෘති අයත් වේ.

[29] මේවා සමාජභාවී සමානාත්මතාව, කැමැත්ත, හිංසනයේ සාවද්‍යබව, කාන්තාවන් සහ පිරිමින්, ගැහැණු සහ පිරිමි ළමයි ආරක්ෂිත නගරයක් සෑදීම සඳහා එක්ව ක්‍රියාත්මක වන බව සහ නගරය ශ්‍රේෂ්ඨ පුරයක් බව යන කරුණු වටා ගොඩනැගේ.

[30] UN Women (2019b) Evaluation of the Port Moresby: A Safe City for Women and Girls Programme.

[31] Kerr Wilson, A et al (2020) Ibid.

[32] UNICEF (2020) Ibid.

[33] CARE (2018) Ending violence and harassment against women and men in the world of work CARE International's position on the new ILO Convention.

[34] Women in Cities International (2012) Tackling Gender Exclusion: Experiences from the Gender Inclusive Cities Programme; Fraser et al., (2017) Ibid.

[35] Fulu (2016) Ibid.

[36] Fulu (2016); UN Women (2019c) .UN Women Safe Cities and Safe Public Spaces for Women and Girls Global Flagship Initiative: International Compendium of practices. UN Women: New York.

[37] Kerr-Wilson et al., (2020) Ibid.

[38] Kerr-Wilson et al., (2020) Ibid.

[39] Fulu (2016) Ibid; Fraser et al., (2017) Ibid.

[40] UN Women (2019b) Ibid.

[41] Raising Voices website: http://raisingvoices.org/good-school/

[42] UN Women (2017) Safe Cities and Safe Public Spaces Global Results Report, New York: UN Women.

[43] UN Women (2017) Ibid.

[44] ඔවුන් හිංසනයට මුහුණදෙන්නේ පොදු ප්‍රවාහනය තුළදී පමණක් නොවන බවත්, ප්‍රවාහන මධ්‍යස්ථානයට යන සහ එහි සිට එන 'අවසන් සැතපුම' තුළදීත් එසේ සිදුවන බවත් කාන්තාවෝ වාර්තා කරති. එය බොහෝවිට 'අවසන් සැතපුමේ සම්බන්ධතාව' ලෙස හැඳින්වේ.

[45] World Bank et al (2015) Ibid.

[46] Fraser et al., (2017) Ibid.

[47] UN Women (2019c) Ibid.

[48] Vaishnavi, H (2017) Manas Foundation has trained 2.4 lakh auto, taxi and bus drivers of Delhi to become women-friendly, YourStory.

[49] UN Women (2017) Ibid.

[50] UN Women (2019c) Ibid.

[51] Labour force interventions are covered under Strategy "P" – Poverty reduced

[52] ILO (2019) ILO Convention 190: Convention Concerning the Elimination of Violence and Harassment in the World of Work, Adopted by the Conference at its one hundred and eighth session, Geneva, 21 June 2019.

[53] ILO & IFC (2019) Sexual harassment at work: Insights from the global garment industry. Thematic brief.

[54] Martha Farrell Foundation (2018) Sexual Harassment of Domestic Workplaces Workers at their Workplaces: An Ongoing Study on Part-time Domestic Workers in Gurgaon, Faridabad and South Delhi, Delhi: Martha Farrell Foundation

[55] Kerr Wilson, A et al (2020) Ibid.

[56] Global Working Group to End SRGBV & UNGEI (2017) Ibid.

[57] Karmaliani, R., McFarlane, J., Maqbool Ahmed Khuwaja, H., Bhamani S., Saeed Ali, T., Somani, Y., Asad, N., Chirwa, E. D., & Jewkes R. (2019). Right to play's Intervention to Reduce Peer Violence among Children in Public Schools in Pakistan: A Cluster-Randomized Controlled Trial Evaluation. Draft manuscript – What Works

[58] Faith, B and Fraser, E (2018) What Works to Prevent Cyber Violence against Women and Girls, VAWG Helpdesk Research Report No. 212. London, UK: VAWG Helpdesk.

[59] Kerr-Wilson et al., (2020) Ibid.

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT ව්‍යුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women and Social Development Direct (2020) Environments Made Safe, RESPECT: Preventing Violence against Women Strategy Summary.

RESPECT WOMEN

මූලෝපාය සාරාංශය

ළමා සහ නවයොවුන්
අපයෝජන වැළැක්වීම

(Child and adolescent abuse prevented)

UN WOMEN

World Health Organization

ළමා සහ නවයොවුන් අපයෝජන වැළැක්වීම

මූලෝපායේ අභිමතාර්ථය : සාධනීය පවුල් සම්බන්ධතා නිර්මාණය කිරීම, ශාරීරික දඬුවම් තහනම් කිරීම, රළු ළමයින් හදාවඩාගැනීමේ ක්‍රම අවම කිරීම සහ ධනාත්මක මාපිය-දූදරු සම්බන්ධතා නිර්මාණය කිරීම

තාර්කිකත්වය

ගෝලීයව, වයස අවුරුදු 2-17 අතර ළමයින්ගෙන් අඩක්ම පසුගිය වසර තුළදී යම් ආකාරයක අපයෝජනයන්ට මුහුණදී තිබේ.[1] කෙසේ වෙතත්, බොහෝ සංදර්භයන්හිදී ළමයින් හා නවයොවුන් පුද්ගලයන් අපයෝජනයට ලක්වීම වාර්තාවන්නේ අඩුවෙන් නිසා එය සිදුවන ප්‍රමාණය වැඩිය.

ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය (VAC)[2] විවිධ ස්වරූපයන්ගෙන් සිදුවිය හැකිය. ළමා සංවර්ධනයේ විවිධ අවධිවලදී සිදුවන ළමයින් සම්බන්ධව නරක ලෙස සැලකීම, විනෝද හිංසනය (bullying), තරුණ ප්‍රචණ්ඩත්වය, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (IPV), ලිංගික ප්‍රචණ්ඩත්වය හෝ චිත්තවේගී ප්‍රචණ්ඩත්වය එයට අයත් වේ.[3]

ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමීපව සම්බන්ධය. මේ දෙක අතර බහුවිධ සම්බන්ධතා පිළිබඳ ප්‍රබල සාක්ෂි දක්නට ලැබේ. පොදු අවදානම්, පොදු ප්‍රතිඵල සහ එකිනෙක මත ක්‍රියාත්මක වීම් එහි තිබේ. (1 රූපය බලන්න).

- **සහකරුවන් අතර ප්‍රචණ්ඩත්වය සහ ළමා අපයෝජන/ නරක ලෙස සැලකීම් බොහෝ විට එකම නිවස තුළ සිදුවේ.**[4] මව අපයෝජනයට ලක්වන නිවෙස් තුළ ජීවත් වන ළමයින් ප්‍රචණ්ඩ විනයගත කිරීමේ අවදානමට ලක්වීමේ වැඩි අවදානමක් තිබේ.[5] විශේෂයෙන්ම, දැඩි පීතෘමූලික ව්‍යුහයන් සාමාන්‍යකරණය හා සාධාරණීකරණය වී තිබෙන විට ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම වැඩිවේ. උදාහරණයක් ලෙස, ඇෆ්ගනිස්තානයේ සමීක්ෂණ මගින් හෙළිදරව් වූ පරිදි, පසුගිය මාස 12 තුළදී ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලද කාන්තාවන් එසේ නොවූ කාන්තාවන්ට වඩා තම ළමයින්ට පහරදීමට ඉඩ තිබෙන බව වාර්තා වී තිබේ.[6]

1 රූපය: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධතා



මූලාශ්‍රය: උපුටාගැනීමකි Fulu et al (2017)[1]

- මෙම පීතෘමූලික ව්‍යුහයන් **හානිකර සමාජ සම්මතයන්** මගින් තිරසර කරනු ලැබේ. ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම සීමාකරන, ප්‍රචණ්ඩ විනයගත කිරීම පිළිගන්නා (බිරිඳට පහරදීම සහ ශාරීරික දඬුවම්), පවුලේ ගරුත්වයට ප්‍රමුඛතාව දෙන හා බේරුණු පුද්ගලයන්ට බණින, සමාජභාවී අසමානතාවලට උපකාර කරන සමාජ සම්මතයන් ඒ අතර වේ.[7]

- ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය **නවයොවුන් වියේදී** (වයස අවුරුදු 10-19) **බොහෝවිට එකිනෙක මත ක්‍රියාත්මක වේ**. එය මුලින්ම සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැනි ප්‍රචණ්ඩත්වයන්ගේ අත්දැකීම් ලබන හා වැරදි සිදුකරන, අපයෝජනයට වැඩි අවදානමක් තිබෙන කාලය වේ. සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යන වයස අවුරුදු 15-19 අතර නවයොවුන් වියේ ගැහැණු ළමයින් සෑම තිදෙනෙකුගෙන්ම එක් අයෙකු කිසියම් දිනෙක චිත්තවේගී, ශාරීරික හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වී තිබේ. එය උප සහරා අප්‍රිකාවේ ඇතැම් රටවලදී 50%ට ආසන්න වේ.[8] කෙසේ වෙතත්, නවයොවුන් විය ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ අවස්ථාවක් ද සපයයි.[9]

- ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය **පරම්පරාන්තර අපයෝජන චක්‍රය** සමග ද සම්බන්ධය. ළමාවියේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අනාගතයේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දැකීමේ හා එම වරද සිදුකිරීමේ අවදානම වැඩිවේ. ළමාවියේ ක්ෂතිය, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ රළු ළමයින් හදාවඩාගැනීම අතර සම්බන්ධයක් තිබේ.[10]

සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර පුළුල්ව පැතිර පවත්නා සම්බන්ධය හේතුවෙන් ඒ දෙක අතර අවදානම් සාධක හා අන්තර් සම්බන්ධතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වැඩි අවශ්‍යතාවක් නිර්මාණය වේ. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්ෂේත්‍ර අතර පුළුල් සන්නිවේදනයක් සහ සහයෝගයක් අවශ්‍ය වේ.

මූලෝපාය සාරාංශය

INSPIRE ව්‍යුහය තුළ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා මූලෝපායන් හතක් අඩංගු වේ. INSPIRE නම් වචනයෙහි සෑම අකුරක් විසින්ම එම එක් මූලෝපායක් නියෝජනය කරනු ලැබේ. 2 වගුව මගින් නිරූපණය කරනු ලබන්නේ RESPECT සහ INSPIRE ව්‍යුහයන් අතර වෙනස්කම්ය.

2 වගුව: INSPIRE සහ RESPECT ව්‍යුහයන් සැසඳීම[11]

2

INSPIRE සහ RESPECT ව්‍යුහයන් සැසඳීම

INSPIRE: ළමයින්ව එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම	RESPECT: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම
නීති ක්‍රියාත්මක හා බලාත්මක කිරීම	නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා බලාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම*
සමාජ සම්මතයන් සහ වටිනාකම්	ආකල්ප, විශ්වාසයන් හා සම්මතයන් පරිවර්තනය වීම
ආරක්ෂිත පරිසරයන්	පරිසරයන් ආරක්ෂා කර තිබේ
මව්පියන්ගේ හා රැකබලාගන්නන්ගේ සහාය	ළමා හා නවයොවුන් අපයෝජන වළක්වා තිබේ
ආදායම් හා ආර්ථිකය ශක්තිමත් කිරීම	දිළිඳුකම අවමකර තිබේ
	කාන්තාවන් සවිබලගැන්වීම
ප්‍රතිචාර සහ සහායක සේවා	සේවා සහතික කර තිබේ
අධ්‍යාපනය සහ ජීවන කුසලතා	සම්බන්ධතා කුසලතා ශක්තිමත් කර තිබේ
බහු පාර්ශ්වීය සහයෝගය***	අංශ හරහා සම්බන්ධීකරණය හා හවුල්කාරිත්වය**
අධීක්ෂණය හා ඇගයීම***	අධීක්ෂණ හා ඇගයීම් පද්ධති ශක්තිමත් කිරීම**

* පරිසරය සැකසීමේ උපාංගය ** ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම *** එකිනෙක සමග සම්බන්ධ වන මූලෝපාය

අවදානම් හා ආරක්ෂක සාධක

මෙම මූලෝපාය මගින් ඉලක්ක කරනු ලබන්නේ ළමයින්ට හා නවයොවුන් පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ බහුවිධ ස්වරූප වැළැක්වීමයි. සිතාමතා පොදු අවදානම් සාධක අවම කිරීම හා පරම්පරාන්තර ප්‍රචණ්ඩත්ව චක්‍රය වැළැක්වීමත්, පවුල් හා ප්‍රජාවන් තුළ අපයෝජනය වැළැක්වීමත් සඳහා වන ඒකාබද්ධ එළඹුම් කෙරෙහි එහිදී අවධානය යොමුකරනු ලැබේ.[12,13]

නවයොවුන් පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම ඉලක්ක කරන ලද එළඹුම් මෙම මූලෝපාය තුළ අඩංගු වේ. එම ප්‍රචණ්ඩත්ව ස්වරූප අතරට, විනෝද හිංසනය, සම වයස් සහ අවිවාහක සහකරුවන් අතර තාවකාලික සම්බන්ධතාවලදී සිදුවන ප්‍රචණ්ඩත්වය සහ පාසල් පරිසරයන් තුළ සිදුවන ලිංගික සූරාකෑම් අත්දැකීම් අයත් වේ.

Environments Made Safe RESPECT Strategy Summary හි සමස්ත පාසල් සඳහා වන එළඹුම් ඇතුළත් කර තිබේ. නවයොවුන් වියේ ගැහැණු ළමයින් සවිබලගැන්වීම සම්බන්ධ ජීවන කුසලතා එළඹුම් කෙරෙහි අවධානයන් පහත දැක්වෙන ලේඛනයෙහි ඇතුළත් වේ: **Empowerment of Women Strategy Summary.**

මෙම මූලෝපායෙහි අරමුණ වන්නේ පහත දැක්වෙන සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමයි. එම සාධක මගින් ළමයින්ට හා වැඩිහිටියන්ට තිබෙන ප්‍රචණ්ඩත්ව අවදානම අඩු වැඩි කළ හැකිය.

මූලෝපාය සාරාංශය

මට්ටම	අවදානම් සාධක	ආරක්ෂණ සාධක
පුද්ගල	ළමාවියේ ප්‍රචණ්ඩත්ව අත්දැකීම් සහ/ හෝ පවුල තුළ ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම (පිරිමි සහ ගැහැණු) පහළ අධ්‍යාපන මට්ටම (පිරිමි හෝ ගැහැණු) මත්පැන් හෝ මත්ද්‍රව්‍ය හානිකර ලෙස භාවිතා කිරීම (පිරිමි සහ ගැහැණු) මානසික වශයෙන් වැරදි ක්‍රියාකාරීත්වය/ දුර්වල චිත්තවේගී නියාමනය (පිරිමි) ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය හෝ පිළිගත හැකි දෙයක් ලෙස සාධාරණීකරණය කිරීම (පිරිමි සහ ගැහැණු)	ප්‍රචණ්ඩ නොවන සන්නිවේදන මාර්ග පිළිබඳ ළමාවියේ අත්දැකීම් + ගැටුම් විසඳීම (පිරිමි සහ ගැහැණු) අධ්‍යාපනය සහ සාක්ෂරතාව (පිරිමි සහ ගැහැණු) ස්වයං සඵලත්වය හා ස්වයං අභිමානය පිළිබඳ ඉහළ හැඟීම (පිරිමි සහ ගැහැණු) සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප හා භාවිතාවන් (පිරිමි සහ ගැහැණු)
අන්තර් පුද්ගල	දුර්වල/නිශේධාත්මක දරුවන් හැදීමේ භාවිතා විවාහ ගැටුම් හා පවුල් බිඳීම් දුර්වල සන්නිවේදනය, අකාර්යක්ෂම ගැටුම් කළමනාකරණය හා ගැටලු විසඳීමේ කුසලතා ප්‍රචණ්ඩත්වයේ නියුතු සමවයස් පුද්ගලයන්	සාධනීය දරුවන් හැදීමේ භාවිතා ප්‍රචණ්ඩතාව ඇතිකිරීමට ඉවහල් වන සාධක අවම කිරීමේ සම්බන්ධතා කුසලතා (උදා: ගැටුම් නිරාකරණය, සන්නිවේදනය)
ප්‍රජාව	පිරිමින්ගේ වරප්‍රසාදිත තත්වය ප්‍රවර්ධනය කරන සහ කාන්තා ස්වාධිපත්‍යය සීමාකරන හානිකර සමාජභාවී සම්මතයන් පාසල්වල පුළුල් ලෙස ශාරීරික දඬුවම් භාවිතා කිරීම ප්‍රචණ්ඩත්වය ඉවසන/ එයට ප්‍රතිචාර දැක්වීමට අසමත් වන ප්‍රජා ආයතන	අහිංසාවට උපකාරී වන සමාජ සම්මතයන්, විවිධත්වයට හා සමාජභාවී සමානාත්මතාවට ගරු කිරීම සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම ළමා හිතවාදී සහ සමාජභාවී වශයෙන් සාධාරණ විෂයමාලා හා ඉගැන්වීම් ප්‍රවර්ධනය කරන පාසල් පරිසරයන්

මූලෝපාය සාරාංශය

වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහනෙන් නිරූපණය කරනු ලබන්නේ සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් සඳහා සරල කරන ලද වෙනස්කිරීමේ න්‍යායකි. එමගින් පවුල් සම්බන්ධතා ස්ථාපිත කිරීමට, ශාරීරික දඬුවම් තහනම් කිරීමට, රළු දරුවන් හැදීමේ භාවිතාවන් අවම කිරීමට හා සාධනීය මාපිය-දූදරු සම්බන්ධතා නිර්මාණය කිරීමට උපකාර කරනු ලැබේ. ඒවා විශේෂිත වැඩසටහන් සඳහා තවදුරටත් සංවර්ධනය කර අනුරූප කරගත යුතුය.

C: ළමා සහ නවයොවුන් අපයෝජන වැළැක්වීම



මැදිහත්වීම් වර්ග

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සඳහා විවිධ රටවල සංදර්භයන් තුළ විවිධාකාරයේ මැදිහත්වීම් සිදුකර තිබේ. වඩාත්ම විශ්වාසවන්ත එළඹුම වන්නේ සුබවාදී දරුවන් හදාවඩාගැනීමේ භාවිතාවන්ය. වෙනත් වර්ගවල මැදිහත්වීම් සම්බන්ධයෙන් වඩා සීමිත සාක්ෂි තිබේ. විශේෂයෙන්ම පහළ සහ මැද මට්ටමේ ආදායම් සහිත රටවලින් විශේෂිත සාක්ෂි තිබේ.

පහත දැක්වෙන වගුව විසින් නිරූපණය කරනු ලබන්නේ RESPECT ව්‍යුහයෙහි දක්වා තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ගයි. වර්තමාන සාක්ෂි පදනම හා වැඩසටහන් උදාහරණ ගැන ද එහි දැක්වේ. LMIC රටවල වැඩසටහන් උදාහරණ ඒවා තිබෙන තැන්වලදී ප්‍රමුඛතාව ලබාදී තිබේ.

LEGEND

- ● **බලාපොරොත්තු සහගත.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ ළමයින්ට නරක ලෙස සැලකීම සම්බන්ධයෙන් කටයුතු කරන මව්පිය මැදිහත්වීම්	මෙම මූලෝපාය යටතේ වඩාත්ම බලාපොරොත්තු සහගත එළඹුම වන්නේ භාරකාර - ළමා සම්බන්ධතා සහ විනයගත කිරීමේ භාවිතාවන් මෙන්ම සිතාමතා සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන සහ සීමාකාරී සමාජභාවී සම්මතයන්, භූමිකාවන් හා සම්බන්ධතා අභියෝගයට ලක්කරන සංවර්ධනය කිරීම ඉලක්ක කරන මැදිහත්වීම් හෝ සේවාවන්ය. මෙම වැඩසටහන් විසින් පියවරුන් හා යුවල ඉලක්ක කරනු ලැබේ. ඒවා විසින් මව්පිය - ළමා සන්නිවේදනය සහ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩ විනයගත කිරීම, ආපසු හැරී බැලීම ප්‍රවර්ධනය කිරීම, සංවාදය හා ක්‍රියාකාරීත්වය කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. ළමයින් හදාවඩාගැනීමේ මැදිහත්වීම් අතරට සාමාන්‍යයෙන් පුද්ගල උපදේශනය හෝ කණ්ඩායම් සාකච්ඡා, සාධනීය ආදර්ශ චරිත, මව්පියන් හා ඔවුන්ගේ ළමයින් අතර ව්‍යුහගත ක්‍රීඩා ඇතුළත් වේ.[14]	H L	මෙය සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ ප්‍රචණ්ඩ ලෙස ළමයින් විනගයගත කිරීම ඵලදායී මැදිහත්වීමක් බවට HICs සහ LMICs[15] රටවල් වෙතින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** ලැබී තිබේ. HIC රටවල් වෙතින් ලැබෙන සාක්ෂි මගින් පෙන්වා දෙනු ලබන්නේ ළමයින්ට නරක ලෙස සැලකීම හා තරුණයන් කෙරෙහි හා ඔවුන් විසින් කරනු ලබන ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ දිගුකාලීන ප්‍රතිඵලයි.	Bandeberho (රුවන්ඩා) Real Fathers (උගන්ඩා) Parenting for Lifelong Health (දකුණු අප්‍රිකාව) Parents Make the Difference (ලයිබීරියාව) Building Happy Families (තායිලන්තය)
ජීවන කුසලතා/ පාසල් පාදක විෂයමාලා - දූෂණය හා තාවකාලික සම්බන්ධතා ඇතුළුව	පාසලේ හා ඉන් පිටත හා නවයොවුන් පුද්ගලයන් සමාජභාවී සමානාත්මතාව හා සම වයස් සම්බන්ධතා ප්‍රචණ්ඩත්වය විෂයමාලා පාදක එළඹුම් මෙයට ඇතුළත් වේ.	H L	තාවකාලික සම්බන්ධතාවල ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් ඇතුළු HIC රටවල පාසල් පාදක මැදිහත්වීම් සම්බන්ධ ඇගයීම් පෙන්නුම් කරන්නේ **පරස්පර ප්‍රතිඵලයි**. මෙම වැඩසටහන් විසින් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකර තිබේද යන්න ගැටලු සහගතය.	Prepare (දකුණු අප්‍රිකාව) Right to Play (පකිස්තානය)

මැදිහත්වීම් වර්ගය	විස්තරය		කාර්යක්ෂමතාවේ සාක්ෂි	උදාහරණ වැඩසටහන්
ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පුහුණුව			LMIC රටවල ප්‍රචණ්ඩත්වය අවම කිරීමේදී මෙම මැදිහත්වීම් වර්ගයේ ඵලදායීතාව සම්බන්ධයෙන් **වැඩිපුර සාක්ෂි අවශ්‍යය.** එයට අමතරව, විද්‍යාල පාදක ස්වයං ආරක්ෂක මැදිහත්වීම් HIC රටවල ඵලදායී බව පෙන්වාදීම සඳහා විධිමත් සාක්ෂි තිබේ. LMIC රටවල පාසල්වල තාවකාලික සම්බන්ධතාවල ප්‍රචණ්ඩත්වය අවම කිරීමේදී ස්වයං ආරක්ෂක මැදිහත්වීම් ඵලදායී බවට පරස්පර සාක්ෂි තිබේ.	Ujamaa/ No Means No Empowerment Transformation Training (කෙන්යාව)
නිවෙස් නිරීක්ෂණය සහ සෞඛ්‍ය සේවකයන්ගේ සේවා ව්‍යාප්තිය	මෙම මැදිහත්වීම්වලට නිවෙස් නිරීක්ෂණයන් අයත් වේ. එය සාමාන්‍යයෙන් සිදුකරනු ලබන්නේ ප්‍රජා සෞඛ්‍ය සේවකයන් විසිනි. එමගින් ඉලක්ක කරනු ලබන්නේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දකින අවදානමට පත් මව්වරුන් සහ ළමා අපයෝජන සිදුවීමේ අවදානම සහිත නිවාසය. මෙම වැඩසටහන් සාමාන්‍යයෙන් ගර්භණී මව්වරුන්, සෑම වයසකම ළමයින්ගේ මව්වරුන් සහ දරුවන් ඇතුළු මව්වරුන් සමග වැඩකරයි. හදාවඩාගැනීමේ කුසලතා ශක්තිමත් කිරීම ඉලක්ක කරයි.[16]	H L	HIC රටවල බහුවිධ සැසි සහිත නිවෙස් නිරීක්ෂණය හා සෞඛ්‍ය සේවකයන්ගේ සේවා විහිදීම සම්බන්ධ වැඩසටහන් කාන්තාවන් හා ළමයින් අත්දකින ප්‍රචණ්ඩත්ව මට්ටම් අඩුකිරීමේදී **බලාපොරොත්තු තැබිය හැකි ඵළඹුම්** බවට සාක්ෂි තිබේ. මැදිහත්වීම් මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ සහ ළමයින්ට වැරදි ලෙස සැලකීමේ මට්ටම් අඩුකළ හැකි බවට LMIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** සාධනීය ප්‍රතිඵල තිරසර කර හැකිද යන කරුණ සම්බන්ධයෙන් පසු විපරම් අධ්‍යයනයන් එයට ඇතුළත් වේ.[17]	Nurse-Family Partnership (එක්සත් ජනපදය) VoorZorg (නෙදර්ලන්තය) The Infants programme (දකුණු අප්‍රිකාව)
ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දකින ළමයින් සඳහා මානසික සහාය මැදිහත්වීම්	මෙම මානසික මැදිහත්වීම් කට්ටලය විසින් ඉලක්ක කරනු ලබන්නේ ළමා අත්දැකීම් හෝ ප්‍රචණ්ඩත්වය දැකීම මගින් මානසික සෞඛ්‍යයට සහ ක්ෂතියට සම්බන්ධ ප්‍රතිඵල පිළිබඳ කටයුතු කිරීමයි. එය කරනු ලබන්නේ ප්‍රචණ්ඩත්වයේ චක්‍රය අවසන් කිරීමේ ද්විතීයක වැළැක්වීමේ ඵළඹුම් ලෙසයි. මෙම මැදිහත්වීම් ළමා යහපැවැත්ම වර්ධනය කිරීමේදී සහ පරම්පරාන්තර ප්‍රචණ්ඩත්ව චක්‍රය වැළැක්වීමේදී වැදගත් විය හැකිය.	H L	මෙම වර්ගවල මැදිහත්වීම් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම් අඩුකළ හැකි බවට **බලාපොරොත්තු ඇතිකරන සාක්ෂි** HIC රටවලින් ලැබේ. LMIC රටවලින් ලැබෙන සාක්ෂිවලින් පෙන්නුම් කරන්නේ වෙන වෙනම සැසිවලින් හා සියලු සැසි එක්කර මව්වරුන් හා ඔවුන්ගේ ළමයින් ඉලක්ක කරන වැඩසටහන් මගින් ප්‍රචණ්ඩත්වයේ මනෝ සමාජයීය බලපෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විශේෂයෙන් වාසිදායක වේ.[18] කෙසේ වෙතත්, මෙම ඵළඹුම් වර්ගයන් මගින් අනාගත ළමා අපයෝජන මෙන්ම නිවෙස්වල සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ බඵෂක රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.**	WHO Guidelines for Mental Health (mh-GAP) (ගෝලීය) VEGA Family Violence Project (කැනඩාව)

උදාහරණ වැඩසටහන්

වැඩසටහන් කාලරාමු තුළ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම සිදුකරන බව පෙන්නුම් කළ එකිනෙකට වෙනස් වැඩසටහන් තුනක් පහත දැක්වෙන වගුව විසින් සාරාංශ කරනු ලැබේ. මෙම ඕනෑම ක්‍රමවේදයක් අනුරූප කරගැනීමේදී වගුව සමාලෝචනය කළ යුත්තේ 9 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යුහය විසින් සපයා තිබෙන **ඵලදායී වැඩසටහන්කරණය සම්බන්ධ මාර්ගෝපදේශ මූලධර්ම** සමගය. එක් එක් වැඩසටහනක් පිළිබඳ වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
Bandebereho, MenCare+, රුවන්ඩා පිරිමින්ගේ සම්පත් මධ්‍යස්ථානය (RWAMREC)	සාධනීය පීතෘභාවය සහ සමාජභාවී සමානාත්මතාව පියවරුන් හා ඔවුන්ගේ සහකරුවන අතර ප්‍රවර්ධනය කිරීම සඳහා යුවලකගේ මැදිහත්වීම. මෙහි අරමුණ වන්නේ සමාජභාවී බල අසමානතා වෙනස් කිරීම සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හා ළමයින් ප්‍රචණ්ඩ ලෙස විනයගත කිරීම අවම කිරීමයි.	රුවන්ඩාවේ දිස්ත්‍රික්ක හතරක කරන ලදී. Karongi, Musanze, Nyaruguru සහ Rwamagana	විවාහක හෝ අවිවාහකව එකට ජීවත් වන, පියවරුන් වීමට අපේක්ෂා කරන සහ වයස අවුරුදු පහට අඩු ළමයින්ගේ පියවරුන් වන වයස අවුරුදු 21-35 අතර පිරිමි සහ ඔවුන්ගේ සහකරු/කාරියන්	පිරිමින් හා ඔවුන්ගේ සහකරු/කාරියන්ට සහභාගීත්ව, කුඩා කණ්ඩායම් සැසි, පිරිමින්ට සැසි 15ක් හා ඔවුන්ගේ සහකරු/කාරියන්ට සැසි අටක්. සැසිවල අරමුණ වන්නේ, සමාජභාවය හා බලය, පීතෘත්වය, දරුවන් රැකබලාගැනීම, ළමා සංවර්ධනය, යුවල අතර සන්නිවේදනය හා තීරණ ගැනීම සම්බන්ධයෙන් ගැඹුරින් නැවත විමසීම හා සංවාදය ප්‍රවර්ධනය කිරීමයි. විෂයමාලාව අනුරූප කරගනු ලැබුවේ, මාතෘ හා ළමා සෞඛ්‍යය සම්බන්ධ MenCare+'s Program P ඇසුරෙනි.	අවුරුදු 1	**ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලනය කරන ලද පරීක්ෂා (RCT) **බලපෑම:** මාස 21 පශ්චාත් පදනම් මට්ටම. මෙමගින් කාන්තාවන්ගේ ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ සමීප සහකරු ලිංගික ප්‍රචණ්ඩත්වය අත්දැකීම් සැලකියයුතු අන්දමින් අවම වියග මැදිහත්වීමෙහි නිමග්න කාන්තාවන් සහ පිරිමින් ද වාර්තා කළේ ළමයින්ට දඬුවම් කිරීම කැපීපෙනෙන ලෙස අඩුවූ බවයි.[19]

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
PREPARE, Western Cape Department of Health, the City of Cape Town Health Department, the Desmond Tutu HIV Foundation; Centre for Justice and Crime Prevention (CJCP)[20]	බහු පාසල් පාදක එච්අයිවී සහ නවයොවුන් පුද්ගලයන් සඳහා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්	දකුණු අප්‍රිකාවේ බටහිර කේප්හි උසස් පාසල් 42ක ක්‍රියාත්මක කරන ලදී.	වයස අවුරුදු 13 - 14 අතර 8 ශ්‍රේණියේ සිසුන්	සහභාගී වන්නන් 25 දක්වා පිරිස් වෙනුවෙන් පුහුණු පහසුකම් සපයන්නන් විසින් සැසි 21ක් මෙහෙයවන ලදී. සාධනීය සමාජභාවී සම්මතයන් හා ලිංගිකත්ව අධ්‍යාපනය දරාගැනීමේ හැකියාව සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදී. සැසි විසින් සන්නිවේදනය, සම්බන්ධතා, සමාජභාවී බල අසමානතා සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය ආවරණය කරන ලදී. අධ්‍යාපනික උපාංගයට පාසල් සෞඛ්‍ය සේවා සහ පාසල් ආරක්ෂක වැඩසටහන් මගින් සහාය ලැබිණි. පුහුණුව සහ අනාරක්ෂිත ශාරීරික අවකාශයන් සිතියම්ගත කිරීම එයට ඇතුළත් වේ.	මාස 12	**ඇගයීම් ස්වරූපය:** RCT **බලපෑම:** ආරම්භක මට්ටමේ සිට මාස 12ක් තුළදී තාවකාලික සම්බන්ධතාවලදී ගැහැණු ළමයින් අත්දකින ප්‍රචණ්ඩත්වයේ අඩුවීමක්.[21]
Right to Play Right to Play Pakistan (RTP) and the Aga Khan Foundation	පාසල්වල සම වයස් ප්‍රචණ්ඩත්වය අවම කිරීම අරමුණු කරගත් සෙල්ලම් හා ක්‍රීඩා පාදක වැඩසටහනක්	පකිස්තානයේ සින්ධ් පළාතේ හයිදරාබාද්	සාමාන්‍යයෙන් වයස අවුරුදු 12ක් වන 6 ශ්‍රේණියේ සිසුන්	සතියට දෙවරක් විනාඩි 40 බැගින් වන ව්‍යුහගත හා අන්තර් ක්‍රියාකාරී සෙල්ලම් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් පාසල් වැඩ සැලැස්මට ඇතුළත් කරන ලදී. ක්‍රියාකාරකම්වල අවධානය යොමුවුණේ අත්‍යවශ්‍ය ජීවන කුසලතා ගොඩනගාගැනීම කෙරෙහිය. ප්‍රචණ්ත්වයට සහ සමාජභාවී අසමානතාවට අභියෝග කිරීම සඳහා විචාරශීලී ලෙස සිතීමේ හැකියාව එයට ඇතුළත්ය. තරගාවලි, උත්සව සහ ස්ථාවර තේමාත්මක 'සෙල්ලම් දින' (උදා: 'ප්‍රචණ්ඩත්වය නැවැත්වීම' යන තේමාවට අවධානය යොමුකළ) මව්පියන් හා පුළුල් ප්‍රජාව සම්බන්ධ කරගැනීම ද පාසල් පාදක මැදිහත්වීම්වලට අයත් වේ.[22]	අවුරුදු 2යි	**ඇගයීම් ස්වරූපය:** RCT **බලපෑම:** සම වයස් ප්‍රචණ්ඩත්වයේ, පාසල්වල සහ නිවසේ ශාරීරික දඬුවම්වල, සැලකියයුතු මට්ටමේ අඩුවීමක්. පිරිමි සහ ගැහැණු ළමයින් විසින් නිවසේදී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දැකීම පිළිබඳ වාර්තාවල කැපීපෙනෙන අඩුවක්. පිරිමි සහ ගැහැණු ළමයින් තුළ සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප වර්ධනය වීම.[23]

පිරික්සුම් ලැයිස්තුව සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම



ළමා සහ නවයොවුන් අපයෝජනය වැළැක්වීමේ **පොදු මූලිකාංග සහ කාර්යක්ෂම එළඹුමක මූලධර්ම**වල පහත දැක්වෙන ලක්ෂණ අඩංගු වේ.[24, 25]

වැඩසටහන් සැකසීම හා අනුරූප කරගැනීම

1. **ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කරන වැඩසටහන් සැලසුම් කරන්න.** ළමා අපයෝජන පමණක් සැලකිල්ලට ගන්නා වැඩසටහන් මගින් තම මව්වරුන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට ලක්වන ආකාරය දිගින් දිගටම දකින ළමයින්ට වන්නේ සීමිත බලපෑමක් බව සාක්ෂි මගින් පෙන්නුම් කරනු ලැබේ.[26] ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට පොදු අවදානම් සාධක දුරලීම කෙරෙහි අවධානය යොමුකරන වැඩසටහන්වලට ප්‍රචණ්ඩත්වයේ ස්වරූප දෙකම අවම කිරීමේ වැඩි විභවයක් තිබේ. උදාහරණයක් ලෙස, වඩා ඒකාබද්ධ වැඩසටහන් මගින් පවුල් තුළ ප්‍රචණ්ඩත්වයේ ස්වරූපයන් සියල්ල වැළැක්විය හැකි බව උගන්ඩාවේ මැදිහත්වීමේ අධ්‍යයනයක් මගින් හඳුනාගන්නා ලදී.[27]

2. **පවුල තුළ ඇතුළුව සමාජභාවය හා බලය සම්බන්ධයෙන් විචාරශීලී ප්‍රත්‍යාවලෝකන කෙරෙහි අවධානය.**[28] සමාජභාවී සම්මතයන් ළමයින්ට ඉගැන්වීම සම්බන්ධ ආදර්ශ සැකසීමට සහ තම චර්යාවන් ගැන අධ්‍යාපනය අත්හැරීමට හා වෙනස්කිරීමට උපකාර වන රුවන්ඩාවේ Bandebereho යුවල වෙත මැදිහත්වීමේ වැඩසටහන වැනි වැඩසටහන් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීමේදී බලාපොරොත්තු සහගත ප්‍රතිඵල ඇතිකරන බව පෙන්නුම් කර තිබේ.[29]

3. **සරල ලෙස දැනුවත්භාවය ඇතිකිරීමට වඩා සම්බන්ධතා ගොඩනැගීම සහ ළමයින් හදාවඩාගැනීමේ කුසලතා කෙරෙහි අවධානය යොමුකිරීම.**[30]
සම්බන්ධතා කුසලතා සංවර්ධනය කිරීම සඳහා සැබැවින්ම අරමුණු කරන මැදිහත්වීම්, එම කුසලතා ආරක්ෂිත අවකාශයන්හිදී භාවිතා කිරීමේ අවස්ථා ඇතුළුව, ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී සාර්ථක බව ඔප්පු වී තිබේ.[31] මව්පියන් අතර සාධනීය විනයගත කිරීමේ කුසලතා ගොඩනැගීම, කෝපය හා කලකිරීම වැනි දුෂ්කර හැඟීම් පාලනය කරගැනීමට මව්පියන්ට උපකාර කිරීම සහ සමීප සහකරුවන් අතර ධනාත්මක සන්නිවේදන කුසලතා මෙයට අයත් වේ.[32]

4. **එළඹුම් දේශීය සංදර්භයන්ට ගැලපෙන පරිදි අනුරූප කරගත යුතුය.** වැඩසටහන් අනුරූප කරගැනීම මගින් බඳවාගැනීම්වලට සහ බාධක ඉවත්කිරීමට උපකාර විය හැකිය. විශේෂයෙන්ම, පියවරුන් සම්බන්ධ කරගැනීමේදී එය වැදගත් වේ. එයට අමතරව, වැඩසටහන් විසින් ඉලක්ක කණ්ඩායමට ඔබ්බෙන් සමාජ සම්මතයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. එහි අරමුණ වන්නේ, පුද්ගල මට්ටමේ වෙනස්කම් තිරසර කළ හැකි සක්‍රිය පරිසරයක් නිර්මාණය කිරීමයි. උදාහරණයක් ලෙස, සමාජ හා චර්යා ක්‍රියාමාලා වැනි වෙනත් මූලෝපායන් හරහා විවිධ ක්‍රියාකරුවන් (ප්‍රජා හා ආගමික නායකයන්, සෞඛ්‍ය සේවකයන්, ගුරුවරුන්, පාසල් කළමනාකාර මණ්ඩලයේ මව්පියන්, පූර්ව ළමාවිය අධ්‍යාපනික සේවා සම්බන්ධ කරගැනීමෙන්

ක්‍රියාත්මක කිරීම හා ක්‍රමානුකූලව වර්ධනය කිරීම

5. **මව්පියන් හා රැකබලාගන්නන් සඳහා මූලික සංකල්ප වැරගන්වන හා සති ගණන්වලට වඩා මාස ගණන් ඉගෙනගන්නා බහුවිධ සැසි ඇතුළත් කරන්න.**[33, 34] එක් වරක් පමණක් පවත්වන සැසි එතරම් ඵලදායී බවක් නොපෙනේ. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නිර්මාණය කරන හා පවත්වාගෙන යන හානිකර සමාජ සම්මතයන් වෙනස් කිරීම සඳහා ඉගෙනීම නැවත වැරගැන්වීම සහ කාලයක් තුළ වැදගත් පණිවුඩ නැවත නැවත ලබාදීම අවශ්‍යය. තනි ලිංගික-භාවය හා මිශ්‍ර ලිංගික කණ්ඩායම් යන දෙකටම ඉඩදෙන බහුවිධ සැසි වැඩසටහන් කීපයකදීම සාර්ථකත්වය සඳහා වැදගත් සාධක විය.[35]

6. **පහසුකම් සපයන්නන් මනාව පුහුණු කර ඇති බව, නිරීක්ෂණය හා අධීක්ෂණය කරන බව තහවුරු කරන්න.**[36, 37] මාර්ගෝපදේශ හා සහාය වෙත ප්‍රවේශය සහතික කරන්න. නිවෙස් නිරීක්ෂණ වැඩසටහන්වල සාක්ෂි මගින් පෙන්නුම් කරනුයේ මෙම සාධක සාධනීය වැඩසටහන් ප්‍රතිඵල සමග සම්බන්ධ බවයි. ළමයින්ට නරක ලෙස සැලකීම සම්බන්ධ කාරණා ද එයට අයත් වේ.[38]

7. **ළමයින් හදාවඩාගැනීම පිළිබඳ සැසිවලට කුඩා කණ්ඩායම් සැසි මෙන්ම තනි සැසි ද ඇතුළත් කරන්න.** සමාජභාවී සම්මතයන් පිළිබඳ සහ බලය පිළිබඳ අනෙක් අය සමග සාකච්ඡාවන්ට සහභාගී වන්නන්ට අවස්ථා සැපයීම මගින් ආරක්ෂිත අවකාශයන් තුළ අලුත් ආකල්ප හා චර්යාවන් භාවිතා කිරීම හා ආදර්ශ සැකසීම සිදුවේ. එමගින් පුද්ගල හැඟීම් උපදේශකවරුන් සමග බෙදාගැනීම ද සිදුවේ.[39]

8. **ප්‍රචණ්ඩත්වයේ ඉහළ අවදානමක් තිබෙන පවුල් වෙත ළඟාවීමට සලකාබලන්න.** ස්ථිරව සේවා සමග සම්බන්ධ නැති නිවෙස් නිරීක්ෂණය විශේෂයෙන් ප්‍රයෝජනවත් වේ. නිවස තුළ ප්‍රචණ්ඩත්වය අත්දැකීමේ වැඩි අවදානමක් සහිත අය එයට අයත් වේ.[40]

9. **සහභාගීත්ව හා සෙල්ලම් පාදක කරගත් එළඹුඹ භාවිතා කරන්න.**[41] පාසල් කාලසටහනට සම්පූර්ණයෙන් ඇතුළත් කර තිබෙන, අන්තර් ක්‍රියාකාරී, විෂයමාලා පාදක එළඹුම් ළමයින් හා තරුණ පුද්ගලයන් සම්බන්ධ කරගැනීමේදී විශේෂයෙන් වැදගත් බව අවධාරණය කර තිබේ.[42] උදාහරණයක් ලෙස පකිස්තානයේ Right to Play's Positive Youth Development programme සැලකිය හැකිය.
ළමයින්ට සමාජ සම්මතයන් තේරුම් ගැනීමට හා ඒවා තමන්

වෙතින් ඉදිරිපත් කිරීමට ඉවහල් වන විෂයමාලා පාදක පාසල් ක්‍රියාකාරකම් කට්ටලයක් එයට ඇතුළත් විය. මව්පියන් හා දේශීය ප්‍රජාවන් වෙනුවෙන් තේමාත්මක නාට්‍ය එයට අයත් වේ.[43]

10. **ළමා හිතවාදී සහ සමාජභාවී වශයෙන් සංවේදී වාර්තාකරණය සහ යොමුකිරීම් යාන්ත්‍රණයන් ක්‍රියාත්මක බව සහතික කරන්න. ළමා ආරක්ෂණ ක්‍රියාකරුවන් සම්බන්ධීකරණය කිරීම ද එයට ඇතුළත්ය.** ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට පෙර මෙය සිදුකළ යුතුය. ක්‍රියාත්මක කරන්නන් මෙම යාන්ත්‍රණයන් පිළිබඳ දැනුවත් බව සහතික කරන්න.[44] මෙය ආරක්ෂා කිරීමේ හා 'හානියක් නොකිරීමේ' වැඩසටහනෙහි අත්‍යවශ්‍ය කොටසකි. වැඩසටහන් විසින් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමට සූදානම් විය යුතුය (ඒ වෙනුවෙන් බොහෝවිට විවිධ පාර්ශ්වකරුවන් සමග ක්‍රියාකිරීමට සිදුවේ). වාර්තා කිරීම අත්‍යවශ්‍ය පසුබිම්වලදී සේවා සම්පාදකයන් විසින් ශාරීරික හෝ ලිංගික අපයෝජන සිද්ධි පිළිබඳ බලධාරීන්ට දැනුම්දිය යුතුය. අනිවාර්ය වාර්තා කිරීම හා සම්බන්ධ ආචාරධාර්මික හා ආරක්ෂක සලකාබැලීම් ලෝක සෞඛ්‍ය සංවිධානයේ Good Practice Statement 7 Responding to children and adolescents who have been sexually abused හි දැක්වේ.

11. **ක්‍රමානුකූලව වර්ධනය කිරීමේදී පද්ධති හා ආයතන ශක්තිමත් කිරීම ඉතා වැදගත්ය.** විශේෂයෙන්ම, සිද්ධි කළමනාකරණය, යොමුකිරීම් සහ මනෝසමාජයීය සහාය ආදිය සපයන ප්‍රමාණවත් පුහුණු සමාජ ක්‍රියාකරුවන් කාඩරයක් සිටින ළමා ආරක්ෂණ පද්ධති මෙයට අදාළ වේ.

ඇතුළත් වීමේ ස්ථාන

ළමා සහ නවයොවුන් අපයෝජන සම්බන්ධයෙන් කටයුතු කිරීමේ එළඹුම්වල බලපෑම උපරිම කිරීම සඳහා බහුවිධ පසුබිම් සහ අංශ සමග සම්බන්ධ කළ හැකිය. දැනට කරමින් තිබෙන මූලපිරුම් මත පදනම් වීම වැළැක්වීමේ වැඩසටහන්වල ව්‍යාප්තිය වර්ධනය කිරීම සඳහා ඵලදායී විය හැකිය. එම මූලපිරුම් වෙනුවෙන්ම අමතර ධනාත්මක ප්‍රතිඵල ජනනය කිරීමේ විභවය එයට තිබේ. පහත දැක්වෙන වගුවෙහි අවධාරණය කරනු ලන්නේ මෙම මූලෝපාය සඳහා වන ප්‍රධාන පිවිසුම් ලක්ෂ්‍යයන්ය. වැඩසටහන් උදාහරණ ද එයට ඇතුළත් වේ.

පිවිසුම් ලක්ෂ්‍ය	තර්කනය
සමාජ ආරක්ෂාව සහ ආර්ථිකය සවිබලගැන්වීමේ මැදිහත්වීම් • මුදල් හුවමාරු • සමාජභාවී සම්මතයන් පිළිබඳ පුහුණුව සමග සම්බන්ධ ග්‍රාමීය ඉතුරුම් හා ණය සංගමය - Village Savings and Loans Associations (VSLAs) • සමාජභාවී සම්මතයන් පුහුණු කිරීම සමග සම්බන්ධ ක්ෂුද්‍ර මූල්‍ය • තරුණ රැකියා වැඩසටහන්	ආදායම් සහ ආර්ථිකය ශක්තිමත් කිරීමේ වැඩසටහන් විසින් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අවස්ථා ඍජුව හා වක්‍රව සපයයි. එය කරනු ලබන්නේ අවදානම් සාධක වෙත අවධානය යොමු කරමිනි. පවුල් හා කාන්තාවන්ට සමාජභාවී සම්මතයන් පිළිබඳ පුහුණුව සමග ආර්ථික අවස්ථා සපයන වැඩසටහන් ප්‍රචණ්ඩත්වය අවම කිරීමේදී සාර්ථක බව දක්නට ලැබේ.[45] නවයොවුන් පුද්ගලයන් සම්බන්ධයෙන් ගත් කල බහු ස්ථර දිගුකාලීන මැදිහත්වීම් වඩා ඵලදායී වේ.[46] උදාහරණයක් ලෙස ඇෆ්ගනිස්තානයේ සහ උගන්ඩාවේ නවයොවුන් පුද්ගලයන්ගේ ජීවනෝපාය සවිබලගැන්වීමේ - Empowerment and Livelihood for Adolescents (ELA) වැඩසටහන් හේතුවෙන් දූෂණය 50%කින් අඩු විය. එය නවයොවුන් ගැහැණු ළමයින්ට නවයොවුන් සමාජ හරහා මාර්ගෝ-පදේශනය, ජීවන කුසලතා හා ක්ෂුද්‍ර මූල්‍ය පුහුණුව සපයයි. වැඩසටහන මෙහෙයවනු ලබන්නේ සම වයස් මාර්ගෝපදේශකවරුන් විසිනි. සමාජභාවී සම්මතයන් හා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ දැනුවත්භාවය ඇතිකිරීම එයට අයත් වේ.[47] මූල්‍ය පහසුකම් සැපයීම ඇතුළු සමාජ ආරක්ෂණ ජාලයන් මගින් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ආරක්ෂණ ප්‍රතිඵල නිර්මාණය කළ හැකිය.[48] වඩාත්ම බලාපොරොත්තු සහගත සාක්ෂි අප්‍රිකාවේ නවයොවුන් කාන්තාවන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය සමග සම්බන්ධය. උදාහරණයක් ලෙස, කෙන්යාවේ අනාථ හා අවදානමට ලක්වන ළමයින්ට මුදල් ලබාදීමේ වැඩසටහන සම්බන්ධ ඇගයීම විසින් නවයොවුන් ගැහැණු ළමයින් අතර මුදල් වෙනුවෙන් කරනු ලබන ලිංගික චර්යා අඩු වී ඇති බව පෙන්වාදී තිබේ.[49] මුදල් ලබාදීම මගින් නරක ලෙස සැලකීම් 10%කින් අඩු කළ හැකි බව ද සමීක්ෂණය විසින් පෙන්නුම් කර තිබේ. නවයොවුන් පිරිමි ළමයින් අතර සමාජ හිතවාදී චර්යාවන් ද වැඩිකළ හැකිය.[50] කෙසේ වෙතත්, ළමයින් හා කාන්තාවන් වැඩියෙන් ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීමේ හැකියාව ඇති සැලසුම් ලක්ෂණ ගවේශනය කිරීම සඳහා මෙන්ම, විය හැකි නරක බලපෑම් අවම කරන ආකාරය සම්බන්ධයෙන් ද වැඩිදුර සමීක්ෂණ අවශ්‍යය.[51] වැඩිදුර විස්තර සඳහා බලන්න: RESPECT strategy on 'Poverty Reduced'

මූලෝපාය සාරාංශය

පිවිසුම් ලක්ෂ්‍ය	තර්කනය
අධ්‍යාපනය • ජීවන කුසලතා හා දැනුවත්භාවය නැංවීම • පරිපූර්ණ ලිංගිකත්ව අධ්‍යාපනය • ක්‍රීඩා සහ සෙල්ලම් • මුල් ළමාවිය සංවර්ධනය	ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් විශේෂයෙන් යෝග්‍ය පරිසරයන් වේ. ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ සමාජ සම්මතයන් අභ්‍යන්තරගත වන්නට පෙර වයසකදී එම වැඩසටහන් විශාල ළමයින් සංඛ්‍යාවක් වෙත සන්නිවේදනය වේ. මෙම වැඩසටහන් මගින් ළමයින්ට ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඉගැන්වීමේ හැකියාව තිබේ. ඒවා බොහෝ විට වැඩිහිටියන් හා වෙනත් ළමයින් වෙතින් ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීමෙහිලා තම අවදානම අවම කරගැනීම පිළිබඳ ඔවුන්ගේ කුසලතා සංවර්ධනය කරයි. උදාහරණයක් ලෙස, පකිස්තානයේ Right to Play වැඩසටහන විසින් සමාජභාවී සමානාත්මතාව හා අවිහිංසාව සමග බැඳුණු සමාජ සම්මතයන් වෙනස් කිරීම සඳහා සෙල්ලම් සහ ක්‍රීඩා පාවිච්චි කරන ලදී. අවසාන මට්ටමේ සමීක්ෂණය විසින් පෙන්වාදෙනු ලැබුවේ නිවසේදී හා පාසලේදී ශාරීරික දඬුවම් පැමිණවීම කැපීපෙනෙන පරිදි අඩුවී තිබෙන බවයි. එසේම, සම වයස් ප්‍රචණ්ඩත්වය පාසලේදී හා නිවසේදී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දැකීම අඩුවී තිබිණි.[52,53]
සෞඛ්‍ය • ලිංගික, ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන්කරණය, විශේෂයෙන්ම පූර්ව ප්‍රසව සත්කාර • ප්‍රජා සෞඛ්‍ය සේවකයන්ගේ සේවා ව්‍යාප්තිය	ප්‍රචණ්ඩත්වය අත්දැකීම, විශේෂයෙන්ම, නිවසේදී ප්‍රචණ්ඩත්වය අත්දැකීම බොහෝවිට සෞඛ්‍ය ක්ෂේත්‍රයට නිරීක්ෂණය වේ. ඒ සඳහා පිවිසුම් ලක්ෂ්‍යයන් වන්නේ පරීක්ෂා කිරීම් සහ සෞඛ්‍ය සේවකයන් විසින් නිවෙස් වෙත ගොස් පරීක්ෂා කිරීම් ආදියයි. වෙනත් වර්ගවල ප්‍රජා පාදක වැඩසටහන්කරණයන්ට ඇතුළත් නොවන පුද්ගලයන් එමගින් ඉලක්ක කළ හැකිය. උදාහරණයක් ලෙස, Parenting for Lifelong Health (PLH) වැඩසටහන තුළ පූර්ව ප්‍රසව මෙන්ම නවයොවුන් ළමයින් හදාවඩාගැනීම සම්බන්ධ එළඹුම් ද ඇතුළත් වේ. Infants වැඩසටහන මෙහෙයවනු ලබන්නේ සෞඛ්‍ය සේවකයන් විසිනි. මව්වරුන් ගර්භණී සමයේ ආරම්භ වන එය දරුවන් මාස හයක් වයස් වනතුරු ක්‍රියාත්මක වේ. වැඩසටහන විසින් උපදේශන එළඹුමක් භාවිතා කරනු ලැබේ. ධනාත්මක දරුවන් රැකබලාගැනීමේ හා මාපිය-ළදරු සම්බන්ධතා ගොඩනැගීමේ ක්‍රම එය සමග සම්බන්ධය.[54,55] මව්පියන් සහ නවයොවුන් ළමයින් සඳහා වන PLH විසින් ද මව්පියන් හා වයස අවුරුදු 10 - 17 අතර ළමයින් සඳහා ඒ හා සමාන එළඹුමක් භාවිතා කරනු ලැබේ. දකුණු අප්‍රිකාවේ වැඩසටහන් දෙකේම අධ්‍යයන මගින් සොයාගනු ලැබුවේ, අවම කරන ලද අපයෝජන හා ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් දිගුකාලීන මැදිහත්වීම් ප්‍රතිඵල සොයාගන්නා ලදී. එසේම ධනාත්මක අන්දමින් ළමයින් හදාවඩාගැනීම ද වර්ධනය වී තිබිණි.

ප්‍රයෝජනවත් සම්පත්

ළමා අපයෝජන සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමග එහි සම්බන්ධය අවබෝධ කරගැනීම

Bridging the gaps: a global review of intersections of violence against women and violence against children, Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini. Global Health Action, vol. 9, no. 10. 2016
ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර අන්තර් ඡේදනය පිළිබඳ සාක්ෂිවල ආඛ්‍යානමය සමාලෝචනයක් ඉදිරිපත් කරයි. සහකරුවන්/කාරියන් නොවන අයගේ ලිංගික ප්‍රචණ්ඩත්වය එයට අයත් වේ. පහළ සහ මැද ආදායම් රටවල් සම්බන්ධයෙන් අවධාරණය කරනු ලැබේ.

Intersections of violence against women and violence against children. Fulu, E., McCook, S. and K. Falb. What Works Evidence Review Cape Town: South Africa. 2017
ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධතා පිළිබඳ සාක්ෂිවල සාරාංශයක් ඉදිරිපත් කරයි. පොදු අවදානම් සාධක, පොදු සමාජ සම්මතයන් හා සමගාමී සිදුවීම හා පරම්පරාන්තර අපයෝජන චක්‍රය එයට අයත් වේ.

Global prevalence of past-year violence against children: a systematic review and minimum estimates Hillis, S., Mercy, J., Amobi, A., et al. Pediatrics, vol. 137; no. 3. 2016
ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඉතාම රළු සහ පසුගිය සමීප අවුරුදුවල ගෝලීය ව්‍යාප්ති තක්සේරු සපයයි.

Hidden in plain sight: a statistical analysis of violence against children, New York: UNICEF. 2014.
විවිධ ස්වරූපවල ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම පිළිබඳ දත්ත සපයයි. රටවල් 190ක ගෝලීය සංඛ්‍යා සහ දත්ත ඉදිරිපත් කරයි.

What works to prevent sexual violence against children: Evidence Review. Ligiero, D., Hart, C., Fulu, E., Thomas, A., & Radford, L. Together for Girls. 2019
ළමයින්ට හා නවයොවුන් පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධයෙන් සාර්ථක වන්නේ කුමක්ද යන්න ගැන දැනට පවත්නා සාක්ෂි පිළිබඳ භාවිතයට පහසු සාරාංශයක් ඉදිරිපත් කරයි.

ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ පරිමාණය අවබෝධ කරගැනීම සහ එයට ප්‍රතිචාර දැක්වීම

Violence Against Children Surveys (VACS), US Centers for Disease Control and Prevention (CDC).
ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමීක්ෂණවලට නායකත්වය දෙනු ලබන්නේ Together for Girls යටතේ තිබෙන CDC මගිනි. එමගින් පිරිමි හා ගැහැණු ළමයින්ට එරෙහි ශාරීරික, චිත්තවේගී සහ ලිංගික ප්‍රචණ්ඩත්වය මනිනු ලැබේ. බහුවිධ LMIC රටවල සමීක්ෂණ සිදුකර තිබේ. වෙබ් අඩවියෙන් විශ්ලේෂණය ලබාගත හැකිය.

The Economist Out of the Shadows index යනු රටවල් 60ක සැසඳුම් නියාමන දර්ශකයන්ය. එමගින් රටවල් ළමයින්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වයේ තර්ජනයට ප්‍රතිචාර දක්වන ආකාරය නිරීක්ෂණය කරනු ලැබේ.

ජාත්‍යන්තර කාර්යරාමු සහ මාර්ගෝපදේශ

United Nations Convention on the Rights of the Child (UNCRC), 1992
ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රකාශය. එහි වගන්ති 54ක් අඩංගුය. ඉතිහාසයේ වැඩියෙන්ම අපරානුමත කරන ලද ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුමයි.

INSPIRE: Seven strategies for Ending Violence Against Children, Geneva: World Health Organization (WHO); 2016
ළමයින්ට හා නවයොවුන් පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ හා එයට ප්‍රතිචාර දැක්වීමේ යෙදීසිටින රාජ්‍ය, ප්‍රජාමූල, සිවිල් සමාජ සහ පෞද්ගලික අංශ සඳහා සාක්ෂි මත පදනම් වූ සම්පත් එකතුවකි.

INSPIRE Handbook: action for implementing the seven strategies for ending violence against children, New York: UNICEF; 2018
ප්‍රතිපත්ති සම්පාදකයන්ට, සැලසුම්කරුවන්ට, භාවිතා කරන්නන්ට, අරමුදල් සපයන්නන්ට සහ උද්දේශනය කරන්නන්ට තම රට තුළ හෝ පසුබිම තුළ INSPIRE මූලෝපායන් හත ක්‍රියාත්මක කිරීම සඳහා උපකාර කිරීමට ඉලක්ක කරයි.

INSPIRE Indicator Guidance and Results Framework, New York: UNICEF; 2018
රජයට හා රාජ්‍ය නොවන සංවිධානවලට INSPIRE මූලෝපායන් හතේ ප්‍රගතිය කාලය තුළ අධීක්ෂණය කිරීම සඳහා සහ ගමන් පථය වෙනස් කිරීම සඳහා සැලසුම් කර තිබේ. ප්‍රතිඵල රාමුවක් හා මූලික දර්ශක කට්ටලයක් ලේඛනයෙහි අඩංගු වේ. එය භාවිතා කරන ආකාරය පිළිබඳ සවිස්තර මාර්ගෝපදේශයක් ද එහි අඩංගු වේ.

Preventing and responding to violence against children: Theory of Change, New York: UNICEF; 2017
ගැහැණු හා පිරිමි ළමයින්ටත්, නව යොවුන් පුද්ගලයන්ටත් එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ හා එයට ප්‍රතිචාර දැක්වීමේ UNICEF ආයතනයේ කටයුතුවලට මාර්ගෝපදේශ සැපයීම සඳහා ප්‍රමුඛ හා බහු ආංශික වෙනස්වීමේ න්‍යායක් ඉදිරිපත් කරයි.

Global Guidance on Addressing School-related Gender-based Violence, Paris and New York: UNESCO and UN Women; 2016
පාසල සම්බන්ධ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SRGBV) පිළිබඳ පරිසමාප්ත, සියල්ල ඇතුළත් සම්පත් පද්ධතියක් සපයයි.

පසු සටහන

[1] Hillis, S., Mercy, J., Amobi, A,, and Kress, H (2016)) Global prevalence of past-year violence against children: a systematic review and minimum estimates. Pediatrics;137(3):e20154079.

[2] වයස අවුරුදු 18ට අඩු ඕනෑම පුද්ගලයකුට එරෙහි ප්‍රචණ්ඩත්වය

[3] ගැහැණු හා පිරිමි ළමයින් යන දෙකොටසම විසින් ළමා හා නවයොවුන් අපයෝජන සම්බන්ධ අත්දැකීම් ලැබිය හැකිය. පිරිමි ළමයින් මිනීමැරුම්වල වින්දිතයන් හා වැරදිකරුවන් වීමේ වැඩි අවදානමක් තිබේ. සමීප සම්බන්ධයක් පවත්වන වයස අවුරුදු 15 - 19 අතර සෑම ගැහැණු ළමයින් තුන්දෙනෙකුගෙන් එක් අයෙකුම කිසියම් දිනෙක චිත්තවේගී, ශාරීරික හෝ ලිංගික ප්‍රචණ්ඩත්ව අත්දැකීම් ලබා තිබෙන බව වාර්තා කර තිබේ. එය උප සහරා අප්‍රිකාවේ ඇතැම් කොටස්වලදී 50%කට ආසන්න වේ. නවයොවුන් වයස යනු (පිරිමි ළමයින් සඳහා) ලිංගික ප්‍රචණ්ඩත්වය සිදුකිරීම ආරම්භ කරන වයස වේ. එහෙත්, එම වයස එය වැළැක්වීම සඳහා ප්‍රවේශ කවුළුවක් ලෙස ද සැලකිය හැකිය. බලන්න:
Stoltenborgh, MA., van Ijzendoorn MH, Euser, E., Bakerman-Kranenburg,. MJ (2011) A global perspective on child sexual abuse: Meta-analysis of prevalence around the world. Child Maltreatment. 16:79–101; WHO (2015) Preventing Youth Violence: An Overview of the Evidence. Geneva: World Health Organization;

[4] Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini (2016) Bridging the gaps: a global review of intersections of violence against women and violence against children, Global Health Action, vol. 9, no. 10.

[5] Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini (2016) Ibid.

[6] Fulu E, McCook S, Falb K (2017) What Works Evidence Review: Intersections of violence against women and violence against children

[7] Kenny, L., Cislaghi, B. et al. (2019) Addressing Social Norms at the VAW/VAC Intersection Learning Group on Social Norms and Gender-related Harmful Practices Convened by the Gender, Violence and Health Centre (GVHC) of the London School of Hygiene & Tropical Medicine (LSHTM).

[8] UNICEF (2014) A Statistical Snapshot of Violence against Adolescent Girls. New York: United Nations Children's Fund

[9] Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini (2016) Ibid; Fulu E, McCook S, Falb K (2017) Ibid.

[10] Fulu E, McCook S, Falb K (2017) Ibid.

[11] Guedes, A. (2020) Personal communication - table shared for forthcoming paper

[12] Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini (2016) Ibid.

[13] Fulu E, McCook S, Falb K (2017) Ibid.

[14] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, South Africa; What Works to Prevent VAWG

[15] DFID කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී සාර්ථක වන්නේ කුමක්ද යන වැඩසටහන මත පදනම්ව RESPECT රාමුව දියත් කිරීමෙන් පසු මෙම වර්ග කිරීම යාවත්කාලීන කර තිබේ. ධනාත්මක ළමයින් හදාවඩාගැනීමේ මැදිහත්වීම් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර බලන්න: Ker Wilson et al (2020)

[16] WHO (2013) Preventing Violence: Evaluating Outcomes of Parenting Programmes. Geneva: World Health Organization.

[17] Prosman, GJ., Lo Fo Wong, SH., van der Wouden, JC., Lagro-Janssen, AL (2015) Effectiveness of home visiting in reducing partner violence for families experiencing abuse: a systematic review, Family Practice. 32(3):247-56.

[18] Anderson, K, & van Ee, E (2018) Mothers and Children Exposed to Intimate Partner Violence: A Review of Treatment Interventions, International journal of environmental research and public health, 15(9), 1955.

[19] Doyle, K., Levtov, RG., Barker, G., Bastian, GG., Bingenheimer, JB., Kazimbaya, S & Shattuck D (2018) Gender-transformative Bandebereho couples' intervention to promote male engagement in reproductive and maternal health and violence prevention in Rwanda: Findings from a randomized controlled trial. PloS One, 13(4), e0192756

[20] Mathews, C., Eggers, SM., Townsend, L., Aarø LE, de Vries, PJ., Mason-Jones, AJ & Wubs, A (2016) Effects of PREPARE, a multi-component, school-based HIV and intimate partner violence (IPV) prevention Programme on adolescent sexual risk behaviour and IPV: Cluster randomised controlled trial. AIDS and Behavior, 20(9), 1821-1840.

[21] Mathews et al., (2016) Ibid.

[22] McFarlane, J., Karmalian, R. et al (2017) Preventing Peer Violence Against Children: Methods and Baseline Data of a Cluster Randomized Controlled Trial in Pakistan, Global Health: Science and Practice, 5(1): 115-137.

[23] What Works (2018) Right to Play: Preventing violence among and against children in schools in Hyderabad, Pakistan. Evidence Brief

[24] Kerr Wilson, A et al (2020) Ibid.

[25] UNICEF (2020) What works to prevent online and offline child sexual abuse and exploitation. A review of national education policies in East Asia and the Pacific. Bangkok.

[26] Eckenrode J, Ganzel B, Henderson CR Jr et al. Preventing child abuse and neglect with a program of nurse home visitation: the limiting effects of domestic violence. JAMA 2000; 284: 1385–91, cited in Prosman, GJ., Lo Fo Wong, SH., van der Wouden, JC., Lagro-Janssen, AL (2015) Effectiveness of home visiting in reducing partner violence for families experiencing abuse: a systematic review, Family Practice. 32(3):247-56.

[27] Kyegombe, N., Abramsky, T., Devries, K., Michau, L., Nakuti, J., Starmann, E., Musuya, T., Heise, L. & Watts, C. (2015) What is the potential for interventions designed to prevent violence against women to reduce children's exposure to violence? Findings from the SASA! study, Kampala, Uganda. Child abuse & neglect, 50. pp. 128-140.

[28] Kerr Wilson et al (2020) Ibid.

[29] Doyle K et al (2018) Ibid.

[30] Kerr Wilson et al (2020) Ibid.

[31] Jewkes, R., Willan, S., Heise, L., Washington, L., Shai, N., Kerr-Wilson, A, Christofides, N. (2020) Effective design and implementation elements in interventions to prevent violence against women and girls. What Works To Prevent VAWG? Global Programme Synthesis Product Series. South African Medical Research Council, Pretoria; Kerr Wilson et al (2020) Ibid.

[32] Prevention Collaborative (2019) Evidence Review: Parenting and caregiver support programmes to prevent and respond to violence in the home.

[33] Kerr Wilson et al (2020) Ibid.

[34] WHO (2009) Violence Prevention: The Evidence. Promoting gender equality to prevent violence against women. Geneva: WHO

[35] Siu GE, Wight D, Seeley J et al. (2017) Men's Involvement in a Parenting Programme to Reduce Child Maltreatment and Gender-Based Violence: Formative Evaluation in Uganda. Eur J Dev Res 29, 1017–1037.

[36] Kerr Wilson et al (2020) Ibid.

[37] Ligiero D, Hart C, Fulu E, Thomas A, & Radford L. (2019) What Works to Prevent Sexual Violence against Children: Evidence Review. Together for Girls. togetherforgirls.org/svsolutions

[38] Casillas KL, Fauchier A, Derkash BT, & Garrido EF (2016) Implementation of evidence-based home visiting programs aimed at reducing child maltreatment: A meta-analytic review. Child Abuse & Neglect, 53, 64-80

[39] Prevention Collaborative (2019) Ibid.

[40] Prosman et al. (2015) Ibid.

[41] Kerr Wilson et al (2020) Ibid.

[42] Ligiero et al (2019) Ibid.

[43] What Works (2018) Ibid.

[44] Wathen CN and HL MacMillan (2013) Children's exposure to intimate partner violence: impacts and interventions. Paediatric Child Health 18(8):419-422.

[45] Kerr Wilson et al (2020) Ibid.

[46] Kerr Wilson et al (2020) Ibid.

[47] WHO (2016) INSPIRE Framework: Seven strategies for ending violence against children. Geneva: World Health Organisation.

[48] Peterman, A., Neijhoft, A., Cook, S., & Palermo, T. M. (2017). Understanding the linkages between social safety nets and childhood violence: A review of the evidence from low- and middle-income countries. Health Policy and Planning, 32(7), 1049-1071;

[49] Rosenberg, M., Pettifor, A., Thirumurthy, H., Halpern, C. T., & Handa, S. (2014) The impact of a national poverty reduction program on the characteristics of sex partners among Kenyan adolescents. AIDS and Behavior, 18(2), 311-316; Buller, A. M., Peterman, A., Ranganathan, M., Bleile, A., Hidrobo, M., & Heise, L. (2018) A mixed-method review of cash transfers and intimate partner violence in lowand middle-income countries. UNICEF Office of Research Innocenti Working Paper.

[50] WHO (2016) INSPIRE: Seven Strategies for Ending Violence against Children, Geneva: World Health Organisation; Cancian M, Yang M, Slack KS. (2013) The effect of additional child support income on the risk of child maltreatment. Social Service Review.87(3): 417–37; Huston AC, Miller C, Richburg-Hayes L, Duncan GJ, Eldred CA, Weisner TS et al. (2003) New hope for families and children: five year results of a program to reduce poverty and reform welfare. New York: Manpower Demonstration Research Corporation. 117; Ozer EJ, Fernald LCH, Manley JG, Gertler PJ. (2009) Effects of a conditional cash transfer program on children's behavior problems. Pediatrics. 123:e630–7

[51] Ligiero D, Hart C, Fulu E, Thomas A, & Radford L. (2019) Ibid.

[52] What Works (2018) Ibid.

[53] Fulu et al (2017) Ibid.

[54] https://www.who.int/violence_injury_prevention/violence/child/PLH_Infants/en/

[55] WHO (2016) Ibid.

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT වියුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women and Social Development Direct (2020) Child and Adolescent Abuse Prevented, RESPECT: Preventing Violence against Women Strategy Summary.

RESPECT WOMEN

මූලෝපාය සාරාංශය

ආකල්ප, විශ්වාස සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම

(Transformed attitudes, beliefs and norms)

UN WOMEN

World Health Organization

අර්ථ නිරූපණ

විශ්වාස = ලෝකය පිළිබඳ පුද්ගලයන්ගේ පිළිගැනීම්
(උදා:කාන්තාවන්ට ස්වාභාවිකවම පිරිමින් විසින් මගපෙන්විය යුතු බව)

වටිනාකම් = පුද්ගලයකු වැදගත් යයි සලකන ගුණාංග. බොහෝවිට මේවා කාලයෙන් තොරව ගෝලීයව පිළිගත් ඒවාය
(උදා: සමානාත්මතාව, අවංකබව, පක්ෂපාතීත්වය)

ආකල්ප = පුද්ගලයකු තම විශ්වාසයන් හා වටිනාකම් ලෝකය තුළ සන්නිවේදනය කරන හා ප්‍රකාශ කරන අකාරය
(උදා: මගේ බිරිඳ වෙනුවෙන් මා තීරණ ගැනීම නිවැරදිය)

ඒකාකෘති = කණ්ඩායමක වටිනාකම්, ආකල්ප සහ චර්යාවන් සම්බන්ධයෙන් පුළුල්ව පිළිගත් අපේක්ෂා
(උදා: කාන්තාවන්ට පිරිමින්ට තරම් හැකියාවන් නොමැත)

චර්යා = පුද්ගලයකු සැබැවින්ම කරන දෙය. ඒවා බොහෝ විට ඔවුන්ගේ විශ්වාසයන් සහ වටිනාකම් සමග සමපාත වෙයි. එහෙත්, හැමවිටම නොවේ.

සමාජ සම්මතයන් = සාමාන්‍ය තත්වය හා සංස්කෘතික හෝ සමාජ කණ්ඩායමක යෝග්‍ය තත්වය පිළිබඳ පොදු විශ්වාසය
(උදා: පිරිමියෙකුට කාන්තාවක විනයගත ක හැකිය)

ආකල්ප, විශ්වාස සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම

මූලෝපායේ අරමුණ: සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන, පිරිමි බලයට සහ වරප්‍රසාදවලට අභියෝග කරන, වෙනස්කම් හා කාන්තාවන් යටත් කරන සමාජ සම්මතයන්ට අභියෝග කරන, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෙළාදකින ධනාත්මක ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් ප්‍රවර්ධනය කිරීම.

තාර්කිකත්වය

සමාජභාවී වශයෙන් අසමාන ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් යනු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ධාවනය කරන බලවත් සාධක වේ. පිරිමියකු හෝ කාන්තාවක වීම, නිවසේ, ප්‍රජාවේ හ පුළුල් පොදු ජීවිතයේ අසමාන සමජභාවී භූමිකාවන්, ප්‍රචණ්ඩත්වයට දිරිදෙන ආකල්ප සහ එය පවුලේ කාරණයක් බවට තර්ක කිරීම සමග සම්බන්ධ පුද්ගල විශ්වාසයන් හා සමාජ සම්මතයන් මේවාට අයත් වේ (1 රූපය බලන්න). වෙනත් ස්වරූපවල වෙනස්කොට සැලකීම්වලට අදාළ වන ජාතිවාදය, සමලිංගික භීතිකාව සහ පන්ති භේදය වැනි ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් ද එයට අයත් විය හැකිය. සුබවාදී ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයන් දිගුකාලීන ලෙස තිරසරව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීම, සමාජභාවී සමානාත්මතාව සාක්ෂාත් කරගැනීම සහ ප්‍රීතිමත්, සෞඛ්‍ය සම්පන්න, ආරක්ෂිත ප්‍රජාවන් නිර්මාණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

1 රූපය: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය හා තිරසර කරන පුද්ගල විශ්වාසයන් හා සමාජ සම්මතයන්

විශ්වාස/ සමාජ සම්මත වර්ගය	නිශ්චිත විශ්වාසයන් හා සමාජ සම්මතයන් සඳහා උදාහරණ
පුරුෂාධිපත්‍යය හා ස්ත්‍රීත්වය සම්බන්ධ පරමාදර්ශ	පුරුෂාධිපත්‍යය හා කාන්තා යටහත්භාවය පිරිමි ලිංගික හිමිකම් (විවාහය තුළ/ ඉන් පිටත) විවාහය තෙක් කාන්තාවන් කන්‍යාවන් විය යුතු බව සහ විවාහයෙන් බාහිර ලිංගික සම්බන්ධතා නොපැවැත්විය යුතු බව පිරිමින් රළු විය යුතු බව හා කාන්තා හැසිරීම් පාලනය කළ යුතු බව කාන්තාවන්ගේ වටිනාකම් සම්බන්ධ වන්නේ විවාහය හා දරුවන් හැදීම මත බව දික්කසාද, වැන්දඹු, තනිකඩ සහ සරුභාවය නොමැති කාන්තාවන් පිළිකුල් කිරීම
දැඩි සමාජභාවී භූමිකා	පිරිමින් ගෘහ මූලිකයන් වන අතර ප්‍රධාන තීරකයෝය. දැඩි ලෙස සමාජභාවී වන ශ්‍රම විභජනය - පිරිමින් සපයන්නන් ලෙස හා කාන්තාවන් සත්කාරකයන් ලෙස ගෘහ ආදායම හා දේපළ සම්බන්ධයෙන් පිරිමින්ගේ අධිකාරී බලය බිරියන් සැමියන්ට කීකරු විය යුතු බව
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය භාරගැනීම	කාන්තාවන් විනයගත කිරීම පිරිමින්ගේ භූමිකාවන් අතර වේ. ප්‍රචණ්ඩත්වය විනයගත කිරීමේ සාධාරණ ක්‍රමයකි. ප්‍රචණ්ඩත්වය ගැටුම් විසඳීමේ සාධාරණ ක්‍රමයකි. ප්‍රචණ්ඩත්වය පුද්ගල හා පවුල් ගරුත්වය ආරක්ෂා කිරීමේදී සාධාරණය.
පවුලේ පෞද්ගලිකත්වය	ප්‍රචණ්ඩත්වය හෙළිදරව් වීම පවුලේ ගෞරවයට තර්ජනයකි. වෙනත් අය පවුලේ කාරණාවලට අත නොපෙවිය යුතුය. ප්‍රචණ්ඩත්වය හෙළිදරව් කරන කාන්තාවන් පවුලට කරන්නේ අගෞරවයකි.

මූලෝපාය සාරාංශය

අවදානම් සහ ආරක්ෂක සාධක

මෙම මූලෝපාය විසින් පහත දැක්වෙන අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉලක්ක කරයි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන ආරක්ෂණ සාධක ප්‍රවර්ධනය කරයි.

මට්ටම	අවදානම් සාධක	ආරක්ෂණ සාධක
පුද්ගල	ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය දෙයක් ලෙස සාධාරණීකරණය කරන ආකල්ප (කාන්තා සහ පිරිමි) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුම අඩුවීම - නීති, ප්‍රතිපත්ති සහ වාර්තාකරන පටිපාටි ඇතුළු (කාන්තා සහ පිරිමි)	සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප (පිරිමි සහ කාන්තා) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ක්‍රියාකිරීමේ දැනුවත්භාවය සහ කුසලතා (පිරිමි සහ කාන්තා)
අන්තර් පුද්ගල	දුර්වල සන්නිවේදනය, අකාර්යක්ෂම ගැටුම් නිරාකරණය සහ ගැටලු විසඳීමේ කුසලතා සමීප සහකරු හා නීතිමය ඥාති සම්බන්ධතාවලදී ඉහළ මට්ටමේ අසමානතාව	ප්‍රචණ්ඩත්වය අවම කිරීමට හේතුවන සම්බන්ධතා කුසලතා (උදා: ගැටුම් නිරාකරණය, සන්නිවේදනය) සමාජභාවී සමානාත්මතාව ලක්ෂණයක් වන සම්බන්ධතා කුසලතා - තීරණ ගැනීමේ හා පවුල් වගකීම් මෙයට අයත් වේ.
ප්‍රජා	පිරිමින්ගේ වරප්‍රසාදිත තත්වය ප්‍රවර්ධනය කරන, කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය සීමාකරන හානිකර සමාජභාවී සමාජ සම්මතයන්	අහිංසාව සහ සමාජභාවී සාධාරණ සම්බන්ධතාවලට සහාය වන සහ කාන්තාවන් සවිබලගැන්වීම දිරිගන්වන සමාජ සම්මතයන්

1 කොටුව: සමාජ සම්මතයන් යනු මොනවාද? එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලනය වන්නේ කෙසේද?

සමාජ සම්මතයන් යනු, කිසියම් 'යොමු කණ්ඩායමකට' (යම් පුද්ගලයකුගේ අපේක්ෂාවන්ට බලපාන අවිධිමත් හෝ සංවිධිත සමාජ හා සංස්කෘතික කණ්ඩායම් හෝ ජාල) **සාමාන්‍ය සහ යෝග්‍ය තත්වය සම්බන්ධයෙන් පොදු විශ්වාසයන් වේ**.

සමාජ සම්මතයන් අනිවාර්යයෙන්ම පුද්ගල ආකල්ප සහ විශ්වාසයන් සමග සම්බන්ධ වන්නේ නැත. එමගින් නිර්මාණය කරනු ලබන සමාජ අපේක්ෂා පුද්ගල චර්යාවන් හසුරුවන ප්‍රබල සාධකයක් විය හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුද්ගල දැනුමේ හා ආකල්පවල වර්ධනයන් මගින් අනිවාර්යයෙන්ම ප්‍රචණ්ඩත්වය සිදුකිරීම සම්බන්ධ චර්යාවන්ගේ වෙනසක් සහ සිදු නොවන්නේ ඇයිද යන්න පැහැදිලි කරනු ලැබේ. පුද්ගලයන්ගේ චර්යාවන් ඔවුන්ගේ ආකල්පවලට පෙර වෙනස් විය හැකිය. ආකල්ප සහ චර්යාවන් යන දෙකම යහපත් අන්දමින් වෙනස් වීම අපේක්ෂා කරන නමුදු එම වෙනස සිදුවන ක්‍රියාවලිය රේඛීය නොවේ.

සමාජ සම්මතයන් ගතික වන අතර වෙනස් විය හැකිය. ප්‍රමාණවත් තරම් සංඛ්‍යාවකට වෙනස් අන්දමින් හැසිරීම සඳහා බලපෑමක් සිදුවේ නම්, කිසියම් හැරවුම් ස්ථානයක් හමුවිය හැකිය. එහිදී සාමාන්‍ය චර්යාවක් ලෙස පිළිගැනුණු දෙය වෙනස් වීමට ලක්විය හැකිය. මිථ්‍යාවන් පරාජය කිරීම හා පුද්ගලයකුගේ දැක්ම යථාර්ථය නොවන බව පෙන්වාදීම ද මෙහිදී ප්‍රයෝජනවත් විය හැකිය.

මූලෝපාය සාරාංශය

වෙනස් කිරීමේ න්‍යාය

සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් උදෙසා සරල කරන ලද වෙනස් කිරීමේ න්‍යායක් පහත දැක්වෙන රූපසටහන විසින් ඉදිරිපත් කරනු ලැබේ. ඒ සඳහා විශේෂිත වැඩසටහන් වැඩිදුර සංවර්ධනය කිරීම හා අනුරූප කරගැනීම අවශ්‍යය.

T: ආකල්ප, විශ්වාස සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම



මැදිහත්වීම් වර්ග

ඉහළ ආදායම් රටවල (HICs), අඩු සහ මැදි ආදායම් රටවල (LMICs) සමාජභාවය, බලය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආශ්‍රිතව අධිපති සමාජ සම්මතයන් හා සම්බන්ධව පුද්ගල විශ්වාසයන්, ආකල්ප සහ චර්යාවන් වෙනස්කිරීම සඳහා විවිධ මැදිහත්වීම් රැසක් ක්‍රියාත්මක කර තිබේ. RESPECT ව්‍යුහයෙහි අවධාරණය කර තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ග වගුව විසින් විස්තර කරනු ලැබේ. වර්තමාන සාක්ෂි[1] පදනම සහ උදාහරණ වැඩසටහන් ද එහි සංක්ෂිප්තව දැක්වේ. තිබෙන අවස්ථාවලදී, LMIC රටවල වැඩසටහන් උදාහරණ ප්‍රමුඛ ලෙස දක්වා තිබේ.

යතුර

- ● **බලාපොරොත්තු සහගත**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
ප්‍රජා ක්‍රියාකාරීත්වය/ එළඹුම් බලමුළුගැන්වීම	මෙම මූලෝපාය යටතේ වඩාත්ම කාර්යක්ෂම එළඹුමට ප්‍රජා ක්‍රියාකාරීත්වය/ එළඹුම් බලමුළුගැන්වීම අයත් වේ. ස්වේච්ඡා 'ප්‍රජා ක්‍රියාකාරකම්' මෙම එළඹුම සමග සම්බන්ධ වේ. එම ස්වේච්ඡා ප්‍රජා ක්‍රියාකාරකම් සිදුවන්නේ මෙම ප්‍රජාවන් තුළ ජීවත් වන හා වැඩකරන, ප්‍රජාවේ පිරිමින් සහ කාන්තාවන් සමග මම සම්බන්ධ හානිකර සමාජ සම්මතයන් සහ ආකල්පවලට අභියෝග කිරීම සඳහා අවිධිමත් ක්‍රියාකාරකම් ඔස්සේ සම්බන්ධ වීමට පුහුණුව සහ සහාය ලද අයයි. ආගමික හා සම්ප්‍රදායික නායකයන්, පොලිසිය, සෞඛ්‍ය සහ සමාජ සේවා අංශවල ප්‍රධාන ජනමත නායකයන් සමග ද මෙම එළඹුම් සම්බන්ධ වේ. එමගින් සමාජ සම්මතයන්ට බලපෑම් කරනු ලබන අතර දිවි ගලවාගත් පුද්ගලයන් වෙනුවෙන් ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිචාරාත්මක සේවා ශක්තිමත් කරනු ලැබේ.	L H	මනාව සැලසුම් කරන ලද, බහු වාර්ෂිකව ක්‍රියාත්මක කරන ලද මෙම වර්ගයේ මැදිහත්වීම් මගින් ප්‍රජා මට්ටමේ ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සඳහා වැඩසටහන් කාල රාමුව තුළදී කටයුතු කළ හැකි බව LMIC රටවලින් **බලපොරොත්තු සහගත සාක්ෂි** ලැබී තිබේ.[2] ප්‍රජා ක්‍රියාකාරකම්/ බලමුළුගැන්වීම් එළඹුම් වඩාත්ම සාර්ථක වන්නේ ඒවාට අධි තීව්‍රතාවකින් යුක්ත සම්පාදනයක්, ප්‍රජාවන්ගේ හරස්කඩක සම්බන්ධ වීමක් සහ අවිධිමත් ක්‍රියාකාරකම් සම්බන්ධ වීමක් තිබේ නම් බව සාක්ෂි මගින් පෙනේ. එමගින් විචාරාත්මක ලෙස ගැඹුරින් සලකා බැලීම හා සාකච්ඡා කිරීම පුබුදු කරවන අවිධිමත් ක්‍රියාකාරකම් නිර්මාණය වන බව ද සාක්ෂි විසින් පෙන්වාදෙනු ලැබේ.[3] මෙම මැදිහත්වීම් තවමත් ගැඹුරින් ඇගයීමට ලක්කර නැති බැවින් HIC රටවලින් **සාක්ෂි ලැබී නැත**.	SASA! (රටවල් 25+) SHARE (උගන්ඩාව) COMBAT (ඝානාව)

මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
ආකල්ප සහ සමාජ සම්මතයන්ගේ වෙනස්කම් ප්‍රවර්ධනය කිරීම සඳහා වන පිරිමි සහ කාන්තා කණ්ඩායම් පාදක වැඩමුළු	පිරිමින්, කාන්තාවන්, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් ඇතුළත් කුඩා සම කණ්ඩායම් වැඩමුළු මෙම එළඹුමට අයත් වේ. ඒවායේ අරමුණ විශ්වාසයන්, ආකල්ප සහ චර්යාවන් වර්ධනය කිරීමයි. සමාජභාවය, බලය සම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වටා නිර්මාණය වන සාකච්ඡාවලට සහභාගී වන්නන් බැරෑරුම් ලෙස සම්බන්ධ කරගන්නා සහභාගීත්ව සාමූහික අධ්‍යාපනික එළඹුම් ඒවායේ සාමාන්‍යයෙන් අන්තර්ගත වේ. මෙම එළඹුම් මගින් පුළුල් ප්‍රජා වෙනස්කම්වලට බලපෑම් කිරීම සඳහා කුඩා පුද්ගල කණ්ඩායම්වලට කුසලතා හා විශ්වාසය ලබාදිය හැකිය.[4]	L	පිරිමින් සහ කාන්තාවන් සමග කරනු ලබන තීව්‍ර සමූහ පාදක වැඩමුළු මගින් ඉලක්ක කරනු ලබන අයගේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම අඩුකිරීම ඇතුළු පුද්ගල ආකල්ප සහ චර්යාවන් වැඩිදියුණු කළ හැකි බවට LMIC රටවලින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** ලැබී තිබේ. HIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**.	Stepping Stones The Indashyikirwa programme (යුවල උපාංගය) (රුවන්ඩාව) Transforming Masculinities (DRC)
		H	සාක්ෂි මගින් යෝජනා කරනු ලබන්නේ මෙම එළඹුව් වඩාත් සාර්ථක වන්නේ ඒවා පිරිමින්, කාන්තාවන්, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් සමග ඒකාබද්ධ කළ විට බවයි. ඒ යුවල ලෙස හෝ සම්බන්ධීකරණය කරන ලද සම කණ්ඩායම් අධ්‍යාපන ක්‍රියාකාරකම් ලෙයසි. ඒවා සාමාන්‍යයෙන් සාර්ථක වන්නේ වෙන වෙනම වන අතර පසුව ඒකාබද්ධ කළ හැකිය. (වැඩිදුර විස්තර සඳහා බලන්න:**Relationships Skills Strengthened RESPECT Strategy Summary).**	
පිරිමින් සහ පිරිමි ළමයින් සමග ආකල්ප හා සමාජ සම්මතයන් වෙනස් කිරීමේ සමූහ අධ්‍යාපනය	මෙම එළඹුම සාර්ථක වන්නේ පිරිමින් සහ පිරිමි ළමයින් පමණක් සමගය (එනම්, එයට කාන්තාවන් සහ ගැහැණු ළමයින් සම්බන්ධ කර නොගත යුතුය). එහි අරමුණ වන්නේ, පිරිමින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුකිරීම අඩුකිරීම සඳහා සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප, සමාජ සම්මතයන් සහ චර්යාවන් ප්‍රවර්ධනය කිරීමයි. ඒ සඳහා සාමාන්‍යයෙන් සහභාගීත්ව සමූහ අධ්‍යාපනික එළඹුම් භාවිතා කරනු ලැබේ. පුරුෂාධිපත්‍යය සහ අසමාන සමාජභාවී ආකල්ප සහ චර්යාවන් මෙන්ම ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම පිළිබඳ සංකල්ප ද සාකච්ඡා කරනු ලැබේ.	L	LMIC රටවලින් ලැබී තිබෙන සාක්ෂි මගින් නිරූපණය වන්නේ පිරිමින් සහ පිරිමි ළමයින් සමග පමණක් වැඩකිරීම ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵල අඩුකිරීම සම්බන්ධයෙන් ඵලදායී නොවන බවයි. HIC රටවලින් වැඩිදුර සාක්ෂි අවශ්‍යය.	Yaari Dosti (ඉන්දියාව) ඉතියෝපියානු පිරිමි සමාජ සම්මත මූලපිරුම (ඉතියෝපියාව)
		H	සාක්ෂි මගින් යෝජනා කරන පරිදි, පිරිමින් සහ කාන්තාවන් සමග (සහ පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් සමග) වැඩකිරීම ප්‍රචණ්ඩත්වය අඩු කිරීමේදී තනි ලිංගික මැදිහත්වීම්වලට වඩා ඵලදායී වේ.[5]	

මූලෝපාය සාරාංශය

මැදිහත්වීම් වර්ගය	විස්තරය	කාර්යක්ෂමතාවේ සාක්ෂි		උදාහරණ වැඩසටහන්
සමාජ වෙඳපොළ ක්‍රියාමාලා හෝ 'විනෝද අධ්‍යාපනික' එළඹුම් සහ සමූහ අධ්‍යාපනය	මෙම එළඹුම විසින් ජනප්‍රිය විනෝදාස්වාද මාධ්‍ය (රූපවාහිනී සහ රේඩියෝ වැනි) සමග පණිවුඩ ඒකාබද්ධ කරනු ලැබේ. ඒ සමග කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සඳහා මුහුණට මුහුණ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වේ.	H	සමාජ වෙඳපොළ ක්‍රියාමාලා හෝ 'විනෝද අධ්‍යාපනික' එළඹුම් සහ සමූහ අධ්‍යාපනය හරහා පමණක් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම් අඩුකිරීම සම්බන්ධයෙන් LMIC සහ HIC රටවලින් වැඩිදුර සාක්ෂි අවශ්‍යය.[6]	Bell Bajao (ඉන්දියාව) Soul City (දකුණු අප්‍රිකාව) Sexto Sentido (නිකරගුවාව)
		L	කෙසේ වෙතත්, මනාව සැලසුම් කරන ලද ක්‍රියාමාලා සහ එළඹුම් ප්‍රජා ක්‍රියාකාරීත්වය/ බලමුළුගැන්වීම හෝ කණ්ඩායම් පාදක වැඩමුළු සමග දිගුකාලයක් (අවුරුදු 2ට වැඩි) ක්‍රියාත්මක කිරීම මගින් වැදගත් භූමිකාවක් ඉටුවේ. එය සිදුකරනුයේ විශේෂයෙන්ම ප්‍රජා මට්ටම සමග සම්බන්ධව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිග නැීම හා පුද්ගල ආකල්ප වෙනස් කිරීම සම්බන්ධව දැනුම වැඩිකිරීම හා සංවාද නිර්මාණය කිරීම සඳහාය.[7]	
තනි දැනුවත් කිරීමේ ක්‍රියාමාලා	මෙම එළඹුම විසින් ඉලක්ක කරනු ලබන්නේ ජන සන්නිවේදනය (රූපවාහිනිය, රේඩියෝව, දැන්වීම් පුවරු, අන්තර්ජාලය) හරහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමයි. කෙසේ වෙතත්, ඉහත දක්වන ලද එළඹුම් කුමක් වෙතත්, එයට පුද්ගලයන් හෝ ප්‍රජාවන් සමග මීට වඩා තීව්‍ර කාර්යයන් අයත් වන්නේ නැත.	L	LMIC සහ HIC රටවලින් ලැබී ඇති සාක්ෂි මගින් යෝජනා කරන පරිදි තනි දැනුවත් කිරීමේ ක්‍රියාමාලා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සම්බන්ධයෙන් ගත්කල ඵලදායී නැත. සාමාන්‍යයෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ජනසන්නිවේදන මාධ්‍ය භාවිතා කරන මෙම වැඩසටහන්වලට මහා පරිමාණ ජනගහනයකට ළඟාවීමේ හැකියාව තිබේ. එසේම ජනප්‍රිය ද විය හැකිය.[8]	වාර්ෂිකව එක් වරක් පමණක් ජාතිකව පැවැත්වෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි 16 දින ක්‍රියාකාරීත්වය (දැනුවත් කිරීම පමණක් ඉලක්ක කරන ඒවා)
		H		

උදාහරණ වැඩසටහන්

ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් වෙනස් කිරීමෙහි සහ වැඩසටහන් කාර්යරාමුව තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකරීමෙහිලා ඉවහල් වන වැඩසටහන් තුනක් පහත වගුවෙහි සාරංශ කර දැක්වේ. මෙම වගුව 11 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
SASA!	සමාජභාවී අසමානතාව, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන් වැඩියෙන් එච්අයිවී අවදානමට ලක්වීම පවත්වාගෙන යාමට හේතු වන සමාජ සම්මතයන් හා චර්යාවන් ප්‍රජා නායකත්වයෙන් වෙනස් කිරීම සඳහා වන ප්‍රජා බලමුළුගැන්වීමේ එළඹුමකි.	සෑම කලාපයකම රටවල් 25කට වැඩි ගණනක්	ප්‍රචණ්ඩත්වය, බලය සහ අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රශ්න පිළිබඳ උනන්දුවක් දක්වන කාන්තාවන්ගෙන් සහ පිරිමින්ගෙන් සැදුම් ලද ප්‍රජා ක්‍රියාකාරිකයන්. පළාත් පාලන සහ සංස්කෘතික නායකයන් ඇතුළු ප්‍රජා නායකයන්, ආයතනික නායකයන්, වෘත්තිකයන් මෙන්ම වෙනත් ප්‍රජා සාමාජිකයන්.	කාර්ය මණ්ඩලය පුහුණු කර එළඹුම අභ්‍යන්තර කරගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා කාලය ලබාදෙනු ලැබේ. දේශීය ක්‍රියාධරයන් ගැඹුරු පුහුණුවකට සහභාගී වන අතර අවිධිමත් ක්‍රියාකාරකම් ප්‍රජා මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම සඳහා මගපෙන්වීම ලබාදෙයි. ප්‍රජාවක් තුළ විවිධ ජන පරාසයන් වෙත ළඟාවීම සඳහා බහුවිධ මූලෝපායන් භාවිතා කරනු ලැබේ. ප්‍රාදේශීය ක්‍රියාකාරීත්වය, මාධ්‍ය හා උද්දේශනය සහ සන්නිවේදන මෙවලම් එයට අයත් වේ. SASA! Activist Kit[9] සංවිධානය කර තිබෙන්නේ සැලසුම් කර තිබෙන අදියර සඳහාය. දේශීය සංවිධායකයන්ට එය ඵලදායී හා විධිමත් ආකාරයෙන් භාවිතා කර ප්‍රජා මට්ටමේ වෙනස් කිරීමේ ක්‍රියාවලියක් මෙහෙයවිය හැකිය.	අවුරුදු 3+	**ඇගයීම් ස්වරූපය:** සසම්භාවී පාලක පරීක්ෂණය (RCT)[10] **බලපෑම:** මැදිහත්වීම මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය භාරගන්නා ආකල්පවල කැපීපෙනෙන අඩුවීමක් සිදුවිය. කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලැබීම ද කැපීපෙනෙන ලෙස අඩුවිය.

මූලෝපාය සාරාංශය

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
ප්‍රජා පාදක ක්‍රියාකාරී කණ්ඩායම් (COMBAT) හරහා ප්‍රජා පාදක ග්‍රාමීය ප්‍රතිචාර මූලෝපාය (RRS)	ඝානාවේ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුවීම අඩුකරන ප්‍රජා බලමුළුගැන්වීමේ එළඹුමකි. රාජ්‍ය සහ ප්‍රජා පාදක ව්‍යුහයන් ඔස්සේ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලැබේ.	ඝානා	දේශීය පිරිමින්ගෙන් සහ කාන්තාවන්ගෙන් සමන්විත ප්‍රජා පාදක ක්‍රියාකාරී කණ්ඩායම් (COMBATs). කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ප්‍රතිචාර කටයුතුවල නියුතු ආගමික හා සම්ප්‍රදායික නායකයන්, රාජ්‍ය නියෝජිතායතන ඇතුළු ප්‍රජා පාර්ශ්වකරුවන් සහ වෙනත් ප්‍රජා සාමාජිකයන්.	ප්‍රජා පාදක ක්‍රියාකාරී කණ්ඩායම් පරිස්සමෙන් තෝරාගනු ලබන අතර, පුළුල් ප්‍රජාව කෙරෙහි සංවේදී කිරීම පිණිස පුහුණු කරනු ලැබේ. ඔවුන්ට දැඩි ලෙස අවශ්‍ය දිවි ගලවාගත් පුද්ගලයන් සඳහා වන උපදේශනය, සහාය සහ යොමුකිරීම් තොරතුරු සපයනු ලැබේ. COMBATs සහභාගීත්ව ක්‍රමයට චරිත රංගන, නාට්‍ය හා දෙබස් අයත් වේ. එහි අරමුණ ප්‍රජා සාමාජිකයන් හට ප්‍රජා රැස්වීම් සහ වෙනත් සමාජ ගොනුවීම් හරහා අධ්‍යාපනය ලබාදීම හා ඔවුන් සංවේදී කිරීමයි.	අවුරුදු 2+	**ඇගයීම් ස්වරූපය:** අර්ධ පරීක්ෂණාත්මක **බලපෑම:** කාන්තාවන් ලිංගික සහ ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දැකීමේ අඩුවක්. පිරිමි සහකරුවන් චර්යාවන් පාලනය කරගැනීමේ කැපීපෙනෙන වර්ධනයක් සහ කාන්තාවන් අතර විෂාධයේ අඩුවක්. පිරිමින් සහ කාන්තාවන් අතර සමාජභාවී ආකල්පවල වර්ධනයක්.[11]
ආරක්ෂිත නිවාස සහ සෑම කෙනෙකුටම ගරුකිරීමේ (SHARE) මැදිහත්වීම්	කාලානුරූපව සිදුකරනු ලබන එච්අයිවී වැළැක්වීමේ සහ ප්‍රතිකාර සේවා සමග ඒකාබද්ධ කරන ලද ප්‍රජා පාදක බලමුළුගැන්වීම්	උගන්ඩාව	ප්‍රජා ස්වේච්ඡා සේවකයන් 40ක් - දේශීය කාන්තාවන් සහ පිරිමි ස්වේච්ඡා ප්‍රජා උපදේශන ආධාරකරුවන් 12ක්	සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ එච්අයිවී අවදානමට දායක වන ආකල්ප සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ ප්‍රජා පාදක බලමුළුගැන්වීම. එච්අයිවී සම්බන්ධ හෙළිදරව් කිරීම ආශ්‍රිත ප්‍රචණ්ඩත්වය සහ එච්අයිවී ප්‍රතිකාර හා උපදේශනය සොයන හා පරීක්ෂා කරන කාන්තාවන් මුහුණදෙන අවදානම අඩුකිරීම සඳහා පරීක්ෂා කිරීම් සහ මැදිහත්වීම්. SHARE සැලසුම් කරනු ලැබුවේ SASA! සහ Stepping Stones එළඹුම් අනුසාරයෙනි. එහිදී, කලින් පැවති සෞඛ්‍ය සහ සමාජ සහාය ව්‍යුහයට ඉහළ ගුණාත්මකභාවය සහ සංස්කෘතික වශයෙන් යෝග්‍ය ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාකාරකම් ඒකාබද්ධ කර තිබේ.	අවුරුදු 5	**ඇගයුම් ස්වරූපය:** පොකුරු සසම්භාවී පරීක්ෂණය **බලපෑම:** කලින් වසරේ ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කළ කාන්තාවන් සංඛ්‍යාව අඩුවීම. පිරිමින් සහ කාන්තාවන් අතර එච්අයිවී ව්‍යාප්තිය අඩුවීම සහ එච්අයිවී හෙළිදරව් කිරීමේ අනුපාතිකය අඩුවීම.[12]

මූලෝපාය සාරාංශය

වැඩසටහන	විස්තරය	ස්ථානය	ඉලක්ක ජනගහනය	මූලික ක්‍රියාකාරකම්	කාල පරිච්ඡේදය	ඇගයීම හා බලපෑම
සමාජභාවී භූමිකා, සමානාත්මතාව සහ වෙනස් කිරීම (GREAT) වැඩසටහන	නවයොවුන් පුද්ගලයන් කෙරෙහි අවධානය යොමුකරන ලද සමාජ සම්මතයන් වෙනස්කිරීමේ වැඩසටහන	උගන්ඩාව	**ළාබාල නවයොවුන් පුද්ගලයන්:** වයස අවුරුදු 10-14 අතර පාසල් යන පිරිමි ළමයින් හා ගැහැණු ළමයින් වයස අවුරුදු 15-19 අතර **වැඩිහිටි නවයොවුන්** ගැහැණු හා පිරිමි ළමයින් **අලුත විවාහ වූ හෝ දරුවන් සිටින නව යොවුන්** පුද්ගලයන්: වයස අවුරුදු 15-19 අතර විවාහක/ එකට ජීවත්වන, ළමයින් ඇති හෝ නැති පිරිමි සහ ගැහැණු ළමයි. වැඩසටහන විසින් නවයොමුන් පුද්ගලයන්ට වෙනස් වීම හා ප්‍රජාව පුරා විහිදුණු වෙනස අත්පත් කරගැනීම සඳහා සහාය පිණිස **ප්‍රජා සාමාජිකයන්** ද සම්බන්ධ කරගනු ලැබේ.	GREAT විසින් අවුරුදු පහක මැදිහත්වීම් නිර්මාණය කර පරීක්ෂා කරන ලදී: • ප්‍රජා ක්‍රියාකාරී චක්‍රය (CAC) විසින් ප්‍රජා නායකයන් (ගෝත්‍ර නායකයන්, ආගමික නායකයන් සහ පත්වූ ග්‍රාමීය නායකයන්) සම්බන්ධ කරගනු ලැබේ. • ඔවුන් විසින් රේඩියෝ මාලා නාට්‍යයක්, මුහුණට මුහුණ සාකච්ඡා සහිත රේඩියෝ වැඩසටහනක් පවත්වනු ලැබේ. • ග්‍රාමීය සෞඛ්‍ය කණ්ඩායම (VHT) සතුව සේවා සම්බන්ධතා තිබේ. • GREAT මෙවලම් කට්ටලය - සහභාගීත්ව සහ අන්තර් ක්‍රියාකාරී එළඹුමකි. විශේෂයෙන් නිර්මාණය කරනු ලැබුවේ නවයොවුන් පුද්ගලයන් හට තම සමාජභාවී සම්මතයන් සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහාය.	අවුරුදු 5	**ඇගයුම් ස්වරූපය:** මිශ්‍ර ක්‍රම සහ අර්ධ පරීක්ෂා **බලපෑම:** නවයොවුන් පුද්ගලයන් විසින් පහත දැක්වෙන කරුණු වාර්තා කරන ලදී: • පවුල් සැලසුම පිළිබඳ වැඩිදියුණු කරන ලද ආකල්ප සහ චර්යාවන් • සෞඛ්‍ය සේවා වෙත පැමිණීමේ අවස්ථාව වැඩිවීම සහ ඩ්‍යඹ වෙතින් සේවා ලබාගැනීමේදී වැඩි පහසුව • වැඩිදියුණු වූ සහකරු සන්නිවේදනය සහ හවුල් තීරණ ගැනීම • කාන්තාවන්ට එරෙහිව පිරිමින්ගේ ප්‍රචණ්ඩත්වය අඩුවෙන් පිළිගැනීම • අලුතෙන් විවාපත්/ දරුවන් සහිත තරුණ කාන්තාවන් සහ පිරිමින් විසින් කෝපයට පත්වූ විට තමන් තම සහකරුට/කාරියන්ට ප්‍රචණ්ඩ ලෙස ප්‍රතිචාර දක්වන බව පැවසීමේ අනුපාතිකය අඩුවීම

සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

ධනාත්මක ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් ප්‍රවර්ධනය කිරීමේ සහ/ හෝ හානිකර ඒවා පිටුදැකීමේ **ඵලදායී එළඹුම්වල පොදු මූලිකාංග හා මූලධර්මවලට** පහත දැක්වෙන ලක්ෂණ අඩංගු වේ:[13]

වැඩසටහන් සැලසුම් සහ අනුරූප වීම:

1. **ඕනෑම සන්දර්භයක් තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මෙහෙයවන නිශ්චිත සම්මතයන් සහ ආකල්ප හඳුනා ගැනීමට උසස් තත්ත්වයේ සංවර්ධනාත්මක සන්දර්භ විශ්ලේෂණ සහ පර්යේෂණ සිදු කරන්න.** සාර්ථක මැදිහත්වීම් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා මූලික හේතු පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී බලය විශ්ලේෂණයක් සිදු කරයි. එය ඔවුන්ට ප්‍රවර්ධනය කිරීමට හෝ වෙනස් කිරීමට අවශ්‍ය හැසිරීම, ප්‍රාදේශීය සන්දර්භය තුළ මෙම හැසිරීම් වලට බලපාන සම්මතයන් සහ ආකල්ප පිළිබඳ හොඳ අවබෝධයක් සහ සම්මතයන් පැවතීමට හේතු වන සමාජ ප්‍රතිලාභ සහ සම්බාධක පිළිබඳව විශේෂිත වේ. සමාජ සම්මතයන් සහ ඒවා විශේෂිත සන්දර්භයන් තුළ ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම සඳහා භාවිත කිරීමට යොදාගන්නා ලද සහ පරීක්ෂා කරන ලද ගුණාත්මක ප්‍රවේශයන් කිහිපයක් දැන් තිබේ. විවිධ තත්වයන් යටතේ හැසිරීමක් සාමාන්‍ය සහ යෝග්‍ය ලෙස සැලකිය හැකිද යන්න නිර්ණය කිරීම සඳහා වන කණ්ඩායම් පසුබිමකදී විවෘත අවසානයක් සහිත ප්‍රශ්න භාවිතා කිරීම සහ නිශ්චිත සම්මතයන් වටා ඇති ගතිකත්වය පිළිබඳ ගැඹුරු අවබෝධය සඳහා ව්‍යුහගත ප්‍රශ්න සමග උපකල්පිත ලේඛන භාවිතා කිරීම මෙයට ඇතුළත් වේ.[14] දැනට ක්‍රියාත්මක වැඩසටහන් අනුවර්තනය කිරීමේදී, මූලික මූලධර්මවලට පක්ෂපාතීත්වය සහතික කිරීම සහ වෙනත් තැන්වල අනුවර්තනය කරගැනීම් සම්බන්ධ අත්දැකීම්වලින් ඉගෙනගැනීම සඳහා ආරම්භකයින් සම්බන්ධ කරගන්නා ලෙස තරයේ නිර්දේශ කරනු ලැබේ.[15]

2. **මැදිහත්වීම සඳහා ශක්තිමත් ආයතනික සහාය සහතික කිරීම.** ප්‍රජා මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කිරීමට සහ සමාජ සම්මතය සම්බන්ධ වැඩසටහන්වල නියැලීමට ඕනෑම සංවිධානයක් සුදුසු නොවේ. ප්‍රචණ්ඩත්වය, වෙනස් කොට සැලකීම, බලය සහ ඔවුන්ගේම ජීවිත තුළ මෙන්ම සංවිධානය තුළ ද ඇති සබඳතා ගැන මෙනෙහි කිරීම සඳහා නායකයින් ඇතුළු තමන්ගේම කාර්ය මණ්ඩලයට සහාය වීමට කාලය ගත කිරීමට කැමති, සාරධර්ම මත පදනම් වූ සංවිධාන විසින් සාර්ථක මැදිහත්වීම් ලබා දී ඇත.[16]

3. **සන්දර්භය සම්බන්ධයෙන් නිශ්චිත ධනාත්මක සමාජ සම්මතයන් සහ හැසිරීම් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන්න.** කාලයත් සමග බහුවිධ වේදිකා හරහා ධනාත්මක නව සමාජ සම්මතයන්, ආකල්ප සහ හැසිරීම් ප්‍රවර්ධනය කිරීම සාමාන්‍යයෙන් වඩා ඵලදායී වේ. එනම්, හානිකර සමාජ සම්මතයන් සහ චර්යාවන් අවධාරණය කිරීමට වඩා 'කුමක් විය හැකිද?' යන්න අවධාරණය කිරීම වැනි වේ. එනම්, මෙම චර්යාව සාමාන්‍ය එකක් ලෙස අයෝග්‍ය පරිදි සන්නිවේදනය කළ හැකි 'ගැටලුව' සම්බන්ධයෙනි.[17] නිදසුනක් වශයෙන්, 'ගෘහස්ථ සංවර්ධනය සඳහා එකට වැඩ කිරීම' හෝ 'පියවරුන් ලෙස පිරිමින්ගේ භූමිකාව' වැනි අභිලාෂකාමී පණිවිඩ, ඉලක්කගත ජනගහනය කම්පනයට ලක්කිරීමට මෙන්ම ප්‍රති ප්‍රහාර ඒලවීමේ විභවය වළක්වා ගැනීමට ද උපකාරී වේ.[18] කෙසේ වෙතත්, පවුල් තුළ ඇති ගැඹුරු අසමාන විශ්වාසයන් සහ බල ගතිකත්වයන් නොසලකා හැරීම වැදගත් වේ. එය වඩාත් දුෂ්කර විය හැකි අතර වෙනස් වීමට වැඩි කාලයක් ගතවනු ඇත.

4. **පුද්ගලයන් සහ කුඩා ඉලක්ක කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරනවාට වඩා පුළුල් සමාජ වෙනසක් උත්ප්‍රේරණය කිරීමට සැලසුම් කිරීම.** සමාජ සම්මතයන් වෙනස් කිරීමේ මූලපිරීම් එකිනෙකින් වෙනස් වේ. බොහෝ විට කුඩා කණ්ඩායම්වල මෙනෙහි කිරීම් මත පදනම් වූ වැඩසටහන් (උදා: REAL සහ GREAT) සැලකිය හැකිය. ප්‍රජාව පුරා මෙනෙහි කිරීම් සිදුකිරීම සඳහා මාධ්‍ය (ගුවන්විදුලි නාට්‍ය, ප්‍රජා දැන්වීම් පුවරු) භාවිතා කරනු ලැබේ. ප්‍රජා බලමුළුගැන්වීමේ ප්‍රවේශයන් යනු තනි පුද්ගල සහ කණ්ඩායම් මට්ටමට වඩා ජනගහන මට්ටමින් වෙනස් වීම ස බලපෑම් කිරීමට උත්සාහ කරන බැවින් ඒවා වෙනත් බොහෝ මූලෝපායන්ට වඩා වෙනස් වේ. වෙනසක් සඳහා සහාය දක්වන පුද්ගලයන්ගේ තීරණාත්මක ලක්ෂ්‍යයකට හෝ විචාරාත්මක පුද්ගල සමූහයකට ළඟාවීම සඳහා, සංවිධානාත්මක මැදිහත්වීම් ක්‍රියාවලියක් හෝ උපාය මාර්ගයක් හරහා ප්‍රජාවේ හෝ ආයතනයේ ඉහළ ප්‍රතිශතයකට ළඟාවීමට ඉලක්ක කළ යුතුය. පොදු පසුබිම් තුළ ධනාත්මක හැසිරීම් ආදර්ශ ඉදිරිපත් කිරීම උදෙසා බලපෑම් සහගත ප්‍රජා සාමාජිකයින් සමග වැඩ කිරීම සහ ප්‍රධාන පණිවිඩ ප්‍රචාරය කිරීමට සහ මුහුණට මුහුණ අන්තර්ක්‍රියාවල බලපෑම වැඩිදියුණු කිරීමට සන්නිවේදන උපායමාර්ග ඒකාබද්ධ කිරීම උදාහරණ ලෙස සැලකිය හැකිය.[19]

5. **හුදකලා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්වලින් වළකින්න.** මේ දක්වාම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමග කටයුතු කිරීමේදී මෙය වඩාත් පොදු ප්‍රවේශයන්ගෙන් එකක් ලෙස සැලකුණද, සාක්ෂි විසින් පෙන්නුම් කරන්නේ එය ප්‍රමාණවත් නොවන බවයි. ඒවා විවේචනාත්මක චින්තනය ඇති කිරීමට වඩා පණිවිඩ යැවීම හෝ තොරතුරු ලබා දීම මත රඳා පවතී. එසේ නැතිනම්, ගැඹුරින් මුල් බැස ඇති සමාජ සම්මතයන් වෙනස් කිරීමට හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩු කිරීමට තරම් ප්‍රමාණවත් ලෙස ඒවා න්‍යාය මත පදනම් වීම සිදු නොවේ.

ක්‍රියාත්මක කිරීම සහ පුළුල් කිරීම

6. **ප්‍රජා ස්වේච්ඡා සේවකයන් හෝ පහසුකම් සපයන්නන් ඇතුළු සමස්ත වැඩසටහන් කාර්ය මණ්ඩලය පරිස්සමෙන් තෝරාගෙන, පුහුණු කර, අධීක්ෂණය කරන්න.** සාර්ථක එළඹුම් රඳාපවතින්නේ ප්‍රජාව තුළ හොඳින් මුල්බැසගත් ප්‍රජා ස්වේච්ඡා සේවකයන්ගේ හෝ ක්‍රියාකාරිකයන්ගේ මැදිහත්වීම මතය. මැදිහත්වීම ආරම්භයේ ඔවුන් ද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දරන්නේ එකම ආකල්ප හා සමාජ සම්මතයන්ය. වැඩසටහන ඉලක්ක කරන්නේ ඒවා වෙනස් කිරීමටයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, බලය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කිරීම සඳහාත්, ප්‍රමාණවත් ලෙස පෙළඹවීමෙන් යුක්ත වීම සඳහාත්, සමස්ත මැදිහත්වීම අතරතුරදී ප්‍රමාණවත් පුහුණුවක් සහ සහායක් ලබාගැනීම සඳහාත් සඳහා මෙම පුද්ගලයින්ට ප්‍රජාව තුළ හෝ ආයතනය තුළ විශ්වසනීයත්වයක් තිබිය යුතුය.[20] එය අවශ්‍ය වනුයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන ආදර්ශ චර්යාවන් සැකසීමටත්, සාකච්ඡා සඳහා දක්ෂ ලෙස පහසුකම් සැලසීමට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ප්‍රජාවන් සහ ආයතන පෙළඹවීමටත් ය.[21] වෙනස ආරම්භ වන්නේ ඇතුළතිනි. පළමුව ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට මෙනෙහි කිරීම සහ පුහුණුව සඳහා කාලය අවශ්‍ය වේ.[22]

7. **7. කාන්තාවන් සහ පිරිමින්, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් යන දෙපිරිසම සම්බන්ධ කරගන්න.**[23] පිරිමින් සහ ගැහැණුන් සහ පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වටා ඇති සමාජ සම්මතයන් අනුගමනය කරනු ලැබේ. එබැවින් ඔවුන් දෙපිරිසම සම්බන්ධ කරගැනීම වැදගත්ය.[24] කෙසේ වෙතත්, බොහෝ විට සමලිංගික කණ්ඩායම් සමග වෙනම සැසි කිහිපයක් පැවැත්වීම සහ සංවාද පැවැත්වීම මෙම උත්සාහයන්හිදී ප්‍රයෝජනවත් වේ. එය සහභාගිවන්නන්ට පහසුවෙන් කතා කිරීමට සහ අදහස් ගවේෂණය කිරීමට උපකාර කරයි.

8. **8. වෙනස ඉහළ සිට පහළට බලාත්මක නොකරන්න.** මෙම ප්‍රවේශයන් මිනිසුන් විසින් මෙහෙයවිය යුතු අතර බහු පාර්ශවකරුවන් (ප්‍රජා සාමාජිකයින්, ආගමික සහ සම්ප්‍රදායික නායකයින්, රාජ්‍ය ආයතන සහ පරිත්‍යාගශීලීන්) වැළැක්වීමේ ප්‍රයත්නයන් සඳහා සම්බන්ධ කර ගත යුතුය. බහුවිධ මාර්ග සහ නිරාවරණයන් හරහා පණිවිඩ ශක්තිමත් කළ යුතුය. පසුබෑම වැනි අනපේක්ෂිත සෘණාත්මක ප්‍රතිවිපාක හේතුවෙන් ප්‍රවේශමෙන් සැලසුම් කිරීම, නිරීක්ෂණය කිරීම සහ අවම කිරීම වැදගත් වේ.[25]

9. **අර්ථවත් පෞද්ගලික සම්බන්ධවීම් හරහා තිරසාර, විචාරාත්මක මෙනෙහි කිරීම් සඳහා ආරක්ෂිත අවකාශයන් නිර්මාණය කරන්න.** සාර්ථක ප්‍රවේශයන් එක් වරක් පවත්වන පුහුණුවීම් සහ සිදුවීම් ඉක්මවා යයි. වෙනස් කිරීමේ ක්‍රියාවලියකට පහසුකම් සැලසීම, ඔවුන්ගේ අදහස් සහ උපකල්පන ගවේෂණය කිරීමට සහ අභියෝග කිරීමට මිනිසුන් දිරිමත් කිරීම සහ ආරක්ෂිත අවකාශයන්හි ව්‍යුහගත සහභාගීත්ව ප්‍රවේශයන් හරහා විකල්ප ධනාත්මක හැසිරීම් පුහුණු කිරීම මෙහි අරමුණයි. මෙම ප්‍රවේශය සඳහා ප්‍රාදේශීය යෙදුම්, රූප, නිරූපණයන් සහ සංකල්ප සහිත සමාජ-සංස්කෘතික සැකසුමට උචිත වූ ප්‍රවේශමෙන් නිර්මාණය කරන ලද අධ්‍යාපනයක් අවශ්‍ය වේ.

10. **ප්‍රමාණවත් කාලය සහ තීව්‍රතාව (අවුරුදු 3 - 5).** ගැඹුරු සමාජ සම්මතයන් වෙනස් කිරීම අරමුණු කරගත් ප්‍රවේශයන් සඳහා 'සැහැල්ලු ස්පර්ශ' මැදිහත්වීම් සහ කෙටි කාල රාමු හරහා සාක්ෂාත් කරගත නොහැකි සංකීර්ණ සමාජ වෙනස්කම් සිදුකිරීමේ ක්‍රියාවලීන් අවශ්‍ය වේ. ගැඹුරින් මුල් බැසගත් සමාජ සම්මතයන් මහා පරිමාණයෙන් වෙනස් කිරීම සඳහා වසර ගණනාවක් ගත විය හැකි අතර සැලසුම් සහ අනුවර්තනය සඳහා ප්‍රමාණවත් කාලය ඇතුළු බහු ආංශික මැදිහත්වීම් අවශ්‍ය වේ.

11. **කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී දිවි ගලවා ගත් අය සඳහා ප්‍රජා පාදක රැකවරණය සහ සහාය ශක්තිමත් කිරීම.** නිදසුනක් වශයෙන්, ප්‍රජා ස්වේච්ඡා සේවකයන්ට ප්‍රජා සාමාජිකයින් සහ රාජ්‍ය ආයතන සහ අනෙකුත් රාජ්‍ය නොවන සේවා සපයන්නන් අතර වැදගත් පාලමක් ලෙස සේවය කළ හැකි අතර දිවි ගලවා ගත් අයට ශාරීරික හා මානසික සෞඛ්‍යය, ආරක්ෂාව, සමාජ සුබසාධනය සහ නීතිමය සේවාවන් සඳහා ප්‍රවේශය ලබාදිය හැකිය. එසේම, අවශ්‍ය තත්වයන්හිදී කාන්තාවන්ට යුක්තිය වෙත ප්‍රවේශය ලබාදිය හැකිය. (වැඩිදුර විස්තර සඳහා බලන්න **Services Ensured RESPECT Strategy Summary**)



මූලෝපාය සාරාංශය

ඇතුළත් වීමේ ස්ථාන

හානිකර සමාජ සම්මතයන්, ආකල්ප සහ විශ්වාසයන් වෙනස් කිරීමේ ප්‍රවේශයන්ගේ බලපෑම උපරිම කිරීම සඳහා ඒවා බහු පසුබිම් සහ අංශවලට ඒකාබද්ධ කළ හැකිය. පහත දැක්වෙන වගුව විසින් අවධාරණය කරනු ලබන්නේ හානිකර සමාජ සම්මතයන්, ආකල්ප සහ විශ්වාසයන් වෙනස් කිරීම සඳහා වැදගත් ඇතුළත් විය හැකි ස්ථානයි. වැඩසටහන් උදාහරණ ද එයට ඇතුළත් වේ.

ඇතුළත් වීමේ ස්ථානය	තර්කනය
දැනට තිබෙන ප්‍රජා රැස්වීම් හා ව්‍යුහයන්	ප්‍රජාව තුළ කාන්තා අයිතිවාසිකම් සංවිධාන සමග කටයුතු කිරීම වැදගත් වන අතර විශ්වාසවන්ත පුද්ගලයන් සහ කණ්ඩායම් සමග වැඩ කිරීමට ඔබට සහාය ලබා දීම සඳහා ප්‍රාදේශීය ප්‍රජා නායකත්වය දිනාගැනීම ද වැදගත් වේ. ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් රැස්වීම්, ක්‍රීඩා සමාජ, දෙමාපියන්ගේ රැස්වීම් හෝ ආගමික රැස්වීම් වැනි පිරිමින් සහ/හෝ කාන්තාවන්, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් මුණගැසෙන අවකාශයන්හි වැඩ කිරීම මගින් පුද්ගල කණ්ඩායම් සමග පුහුණුව ඇතුළත් වැඩසටහන් නිර්මාණය කළ හැකිය. මෙය සහභාගීත්වයේ සහ නියැලීමේ අනුපාතයන් ඉහළ නැංවීමට පමණක් නොව, කාන්තාවන් සවිබල ගැන්වීම වැඩි කිරීම වැනි අතරමැදි ප්‍රතිඵල කෙරෙහි වැඩි බලපෑමක් කිරීමට ද උපකාරී වේ.[26] උදාහරණයක් ලෙස, රුවන්ඩාවේ Indashyikirwa වැඩසටහන මගින් යුවල උපදේශනය ප්‍රජා ක්‍රියාකාරීත්වය සමග සම්බන්ධ කරනු ලැබේ. එමගින් දැනට ක්‍රියාත්මක කණ්ඩායම් මත පදනම්ව ප්‍රජාවන් සමග සම්බන්ධ වීමට අවස්ථාව ලබාදෙයි. දෙමාපියන්ගේ සන්ධ්‍යා සංසද සහ ගමේ ඉතුරුම් සහ ණය (VSLA) රැස්වීම් ද ඒ අතර වේ.[27]
පාසල් හා අධ්‍යාපනික පහසුකම්	පාසල් පසුබිම් තුළ පුද්ගල ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රවේශයන් ඒකාබද්ධ කිරීම මගින් (විෂයමාලා ඇතුළු සමස්ත පාසල් එළඹුම් හරහා) විශාල සංඛ්‍යාවක් ළමයින් සහ තරුණ පුද්ගලයන් වෙත ළඟාවීමේ හැකියාව ලැබේ. ඔවුන් අයත් වන්නේ ඉතා වැදගත් වයසකට වන අතර ඔවුන්ගේ ආකල්ප හා සමාජ සම්මතයන් ගොඩනැගෙමින් පවතී. එබැවින් ඒවා වෙනස සඳහා පහසුවෙන් අනුරූප වේ. මෙම මූලපිරීම් ඔස්සේ නවයොවුන් පුද්ගලයන් අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන්, තාවකාලික සම්බන්ධතාවන්ගේ ප්‍රචණ්ඩත්වය සහ ලිංගික අපයෝජන ආමන්ත්‍රණය කරනු ලැබේ. උදාහරණයක් ලෙස, ඉන්දියාවේ පාසල් පාදක ප්‍රවේශයෙහි ප්‍රධාන එළඹුමක් හැඳින්වෙන්නේ Gender Equity Movement in Schools (GEMS) ලෙසයි. උසස් පාසල් සිසුන් (වයස අවුරුදු 12 -14) අතර ස්ත්‍රී පුරුෂ සමාජ සමානාත්මතා සම්මතයන් ප්‍රවර්ධනය කරන එය මහාරාෂ්ට්‍රයේ පාසල් 25,000ක පමණ විෂයමාලාවට ඒකාබද්ධ කර තිබේ.[28]
ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍යය සහ එච්අයිවී උපදේශනය, පරීක්ෂණ සහ ප්‍රතිකාර ඇතුළු සෞඛ්‍ය සේවා	සමාජ සම්මතයන් සම්බන්ධ වැඩසටහන්වල නිරත වීම සඳහා වැදගත් ප්‍රවේශ ස්ථානයක් සැපයීමට සෞඛ්‍ය අංශයට හැකිය. රැඳීසිටින ශාලා, විභාග ශාලා සහ උපදේශන අවකාශයන්හි ඇති අධ්‍යාපනික ද්‍රව්‍ය සහ සම්පත්වලට වැදගත් පණිවුඩ ඇතුළත් කළ හැකි අතර, කාන්තා සහ පිරිමි සේවාදායකයින්ට/රෝගීන්ට වෙන වෙනම ද ඒවා ලබා දිය හැක. පවුල් සැලසුම් උපදේශනය සහ එච්.අයි.වී, උපදේශනය සහ පරීක්ෂණ වැනි සෞඛ්‍ය සේවාවන්ට ප්‍රාථමික වැළැක්වීමේ ක්ෂේත්‍රයෙහිදී වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකිය. උදාහරණයක් ලෙස, ටැන්සානියාවේ Stepping Stones with Children වැඩසටහන විසින් එච්අයිවී ආසාදිත ළමයින් (වයස අවුරුදු 5-14 අතර) සහ ඔවුන්ගේ සත්කාරකවරුන් සඳහා වැඩමුළු පවත්වන ලදි. එහිදී ඔවුන් එච්අයිවී, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය සහ ඔරොත්තුදීමේ කුසලතා පිළිබඳ ඉගෙනගත්හ. වැඩසටහන හේතුවෙන් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලක කණ්ඩායමට සාපේක්ෂව අඩුවිය. වෙනත් ප්‍රතිඵල අතර, CD4 සංඛ්‍යා සහ එච්අයිවී සමග ජීවත් වන ළමා සහභාගිකයන්ගේ බර වැඩි විය.[29]

වැදගත් සම්පත්

සමාජ සම්මත න්‍යාය අවබෝධ කරගැනීම

Violence prevention: the evidence. Changing cultural and social norms that support violence. Geneva: World Health Organisation; 2009.
උපදේශකයින්, වැඩසටහන් නිර්මාණකරුවන් සහ ක්‍රියාත්මක කරන්නන් සඳහා ප්‍රචණ්ඩත්වය පිළිබඳ සම්මතයන්ගේ බලපෑම ආමන්ත්‍රණය කිරීම සඳහා මැදිහත්වීම් පිළිබඳ දැනට පවත්නා දැනුම විස්තර කරන කෙටි විස්තරයකි.

Shifting social norms to tackle VAWG: A DFID Guidance Note. London: DFID 2016
මෙම මාර්ගෝපදේශ සටහනෙහි අරමුණ වන්නේ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වැඩසටහන් සන්දර්භය තුළ හානිකර සමාජ සම්මතයන් ආමන්ත්‍රණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ සාක්ෂි, අදාළ උදාහරණ සහ ප්‍රායෝගික මාර්ගෝපදේශ සමගින් උපදේශකයින්ට සහ වැඩසටහන් කළමනාකරුවන්ට සහාය වීමයි.

Addressing Social Norms at the VAW/VAC Intersection. London: London School of Hygiene & Tropical Medicine; 2019
සමාජ සම්මතයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමග සම්බන්ධ හානිකර පිළිවෙත් පිළිබඳ ඉගෙනුම් කණ්ඩායමේ දින දෙකක රැස්වීමක් මත පදනම්ව, සමාජ සම්මතයන් සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය (VAW) සහ ළමයින්ට එරෙහි හිංසනය (VAC) අතර අන්තර් සම්බන්ධය පැහැදිලි කරන කෙටි සාරාංශයකි.

Social norms, gender norms and adolescent girls: a brief guide. London: Overseas Development Institute; 2015.
නව යොවුන් වියේ ගැහැණු ළමයින්ට බලපාන ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතාවයට අදාළ සමාජ සම්මතයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි. ඉතියෝපියාව, නේපාලය, වියට්නාමය සහ උගන්ඩාව යන රටවල ක්ෂේත්‍ර කටයුතු මත පදනම්ව දිළිඳුකම සහ වෙනස්කොට සැලකීමේ සමාජභාවී සම්මතයන් අතර සම්බන්ධය සලකා බලයි.

Piecing together the evidence on social norms and VAW' Melbourne, Equality Institute; 2017
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ධාවනය කරන සහ එයට දායක වන සාධක පිළිබඳ වර්තමාන සාක්ෂි පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයන සරල පොත් පිංචක් වන මෙය සමාජ සම්මතයන්ගේ භූමිකාව කෙරෙහි අවධානය යොමු කරයි.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සමාජ සම්මත එළඹුම

Community-based norms focused interventions: definition and attributes. The Learning Collaborative to Advance Normative Change; 2018
මෙම සාරාංශය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ සම්මතයන් වෙනස් කිරීම සඳහා අවශ්‍ය ඵලදායී ප්‍රජා පාදක ප්‍රවේශයන්ගේ ප්‍රධාන ගුණාංග අවධාරණය කරයි. නවයොවුන් පුද්ගලයන්ගේ සහ තරුණ ජනයාගේ ප්‍රජනන සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් ද එයට අයත්ය.

සමාජ සම්මතයන් තක්සේරු කිරීමේ සමීක්ෂණ ක්‍රමවේද

Measuring gender-related social norms, Learning Report 1. London: Learning Group on Social Norms and Gender-related Harmful Practices of the London School of Hygiene & Tropical Medicine; Cislaghi B, Heise L. 2017
කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට විසඳුම් සෙවීමේ වැඩසටහන්වල අත්දැකීම් සමග සමාජ සම්මතයන් මැනීම සඳහා පරිණාමය වන ශිල්පීය ක්‍රම විස්තර කරයි.

Applying theory to practice: CARE's journey piloting social norms measures for gender programming. Cooperative for Assistance and Relief Everywhere, Inc (CARE); 2017
සංවර්ධන පරිචය සම්බන්ධයෙන් සමාජ සම්මත න්‍යාය යොදාගැනීම සඳහා CARE සංවිධානයේ කාර්යභාරය කෙරෙහි අවධානය යොමු කරයි.

සමාජ සම්මතයන් සම්බන්ධ මැදිහත්වීම් පුළුල් කිරීම

On the CUSP: the politics and prospects of scaling social norms change programming. Goldman, L., Lundgren, R., Gillespie, D., Bajenja, E., Muyhango, L. and Michau, L., Sexual and Reproductive Health Matters; 2019
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතීන් වැඩිදියුණු කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජ සමානාත්මතාවය සඳහා වූ මුල පිරීම් සමාජ සම්මතයන් පරිමාණය කිරීම පිළිබඳ පාඩම් සහ ඇඟවුම් සාරාංශ කරන ලිපියකි. Community for Understanding Scale Up (CUSP) වෙතිනි. සමාජ සම්මතයන් පිළිබඳ මැදිහත්වීම් පුළුල් කිරීමේ තවත් සිද්ධි අධ්‍යයන, අධ්‍යාපනික මෙවලම් සහ සම්පත් සඳහා CUSP බලන්න.

Guidance Note on Scaling Up Social Norm Change. K4D Emerging Issues Report. Brighton, UK: Institute of Development Studies. 2019
ආන්තික සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා සංකීර්ණ සමාජ වෙනස්කම් සඳහා ඇතුළත් ප්‍රවේශයන් පරිමාණය කිරීමට DFID සහාය ලබාදිය හැකි ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සපයයි. එයට සංකල්ප සහ සම්පත් පිළිබඳ අමතර සාරාංශ හතරක් ඇතුළත් වේ. පරිමාණකරණ වර්ග, සම්පත් සහ පරිමාණකරණයේ මූල්‍යමය වටිනාකම සහ අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය ද එයට ඇතුළත්ෙ වේ.

USAID. Scaling-up interventions to prevent and respond to gender-based violence: an analytical report. Washington DC: USAID; 2015
ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ වැඩසටහන් විශාලනය කිරීමේ අත්දැකීම විස්තර කරන අතර INSPIRE වැඩසටහන්, Yaari Dosti, IMAGE, Stepping Stones සහ Soul City හි සිද්ධි අධ්‍යයන ඉදිරිපත් කරයි.

පසු සටහන

[1] සාක්ෂි ශ්‍රේණිගත කිරීම් බොහෝ දුරට සසම්භාවී, පොකුරු සසම්භාවී සහ අර්ධ පර්යේෂණාත්මක ක්‍රම ඇතුළු පර්යේෂණාත්මක සැලසුම් භාවිතා කරන මැදිහත්වීම් එකකට වඩා වැඩි ගණනක ක්‍රමානුකූල සමාලෝචනවලින් ලබාගෙන ඇත. අධිකරණ අංශයේ මැදිහත්වීම් වැනි සමහර මූලෝපායන් සඳහා, සාමාන්‍යයෙන් අඩු ගුණාත්මක බවින් සලකනු ලැබුවද, කාල ශ්‍රේණි, නිරීක්ෂණ සහ හරස්කඩ සැලසුම් ඇතුළුව විකල්ප ඇගයීම් ක්‍රම වඩාත් යෝග්‍ය විය හැකි බව හඳුනාගෙන ඇත. මෙය නැගී එන ක්ෂේත්‍රයක් වන අතර, එබැවින් අධ්‍යයන සැලසුම් සහ ඇගයීමේ දැඩි බවෙහි විශාල වෙනසක් ඇත. මෙම සමාලෝචන සහ අධ්‍යයන සඳහා මූලාශ්‍ර සපයා ඇත්තේ යොමුකිරීම්වල කොටසක් ලෙස ය.

[2] Kerr-Wilson, Gibbs, Fraser et al., (2020) What Works Evidence Review

[3] Jewkes, R., Willan, S., Heise, L., Washington, L., Shai, N., Kerr-Wilson, A, Christofides, N. (2020) Effective design and implementation elements in interventions to prevent violence against women and girls. What Works To Prevent VAWG? Global Programme Synthesis Product Series. Pretoria: South African Medical Research Council.

[4] Fulu, E. Kerr-Wilson, A. and Lang, J. (2014). What works to prevent violence against women and girls? Evidence Review of interventions to prevent violence against women and girls.

[5] Ibid,; Jewkes, Flood and Lang (2014) From work with men and boys to changes of social norms and reduction of inequities in gender relations: a conceptual shift in prevention of violence against women and girls. Bangkok: UNDP, Bangkok

[6] Ellsberg et al, (2015) Prevention of violence against women and girls: what does the evidence say? Lancet, 18;385(9977):1555-66

[7] Kerr-Wilson et al (2020) Ibid.

[8] Ellsberg et al (2015) Ibid.; Jewkes, R., Willan, S., Heise, L., et al. (2020). Effective design and implementation elements in interventions to prevent violence against women and girls. What Works to Prevent VAWG? Global Programme Synthesis Product Series. South African Medical Research Council, Pretoria.

[9] මුල් SASA! Activist Kit පර්යේෂණ සහ ප්‍රායෝගික දැනුම මත පදනම්ව සංශෝධනය කර ඇත. ප්‍රජාවක සියලුම ස්ථර (ප්‍රාදේශීය ක්‍රියාකාරකම්, ප්‍රජා නායකයින්, ආයතනික ශක්තිමත් කිරීම) හරහා ළඟාවන නව උපාය මාර්ග SASA Together! හි ඇතුළත් වන අතර එය 2020 පෙබරවාරි මාසයේදී නිකුත් කරන ලදී. www.raisingvoices.org/sasatogether.

[10] Abramsky, T., Devries, K., Kiss, L. et al.(2014) Findings from the SASA! Study: a cluster randomized controlled trial to assess the impact of a community mobilization intervention to prevent violence against women and reduce HIV risk in Kampala, Uganda. BMC Med 12, 122 (2014).

[11] Adolphina A. Addo-Lartey, Deda Ogum Alangea, Yandisa Sikweyiya, Esnat D. Chirwa, Dorcas Coker-Appiah, Rachel Jewkes & Richard M. K. Adanu (2019) Rural response system to prevent violence against women: methodology for a community randomised controlled trial in the central region of Ghana, Global Health Action, 12:1,

[12] The Prevention Collaborative (2019a) Study Summary: Integrating IPV and HIV Prevention: Impacts of the SHARE Intervention in Uganda

[13] Informed by combined experiences of practitioners including the Community for Understanding Scale Up (CUSP)–a group of nine organisations with robust experience in scaling social norms approaches in various contexts.

[14] See for example Cislaghi, B and Heise, L (2017) Measuring social norms. Technical Brief July 2017. STRIVE.

[15] The Community for Understanding Scale-up (CUSP) have produced guidance on how to adapt and scale different initiatives effectively and ethically.

[16] Michau, L. Letiyo, E. Musuya, T. Goldmann, L. (2019) Social norms change at scale: insights from SASA! Community for understanding scale up (CUSP), July 2018.

[17] McLean, Lyndsay, Heise, Lori L and Stern, Erin A (2019) Shifting and transforming gender-inequitable beliefs, behaviours and norms in intimate partnerships: the Indashyikirwa couples programme in Rwanda. Culture, Health and Sexuality. ISSN 1369-1058; Cislaghi, B & Heise, L (2018) Theory and practice of social norms interventions: eight common pitfalls, Globalisation and Health, 8(83).

[18] McLean et al (2019) Ibid.

[19] Heise, L. (2011). What works to prevent partner violence? An evidence overview. London: STRIVE Research Consortium; Alexander-Scott, M., Bell, E. and Holden, J. (2016). Shifting social norms to tackle violence against women and girls. London: VAWG Helpdesk.

[20] Attention also needs to be paid to fund and support trainers to build networks, membership, and standards etc.

[21] Bartel, D (2018) Training and Mentoring Community Facilitators to Lead Critical Reflection Groups for Preventing Violence Against Women. The Prevention Collaborative.

[22] CUSP (2018) Social Norms Change at Scale: CUSP's Collective Insights

[23] As promoted in the original Stepping Stones structure and principles, involving intermittent sessions when the 4 peer groups come together to share and compare and build mutual respect, collaboration, empathy and trust across the genders and generations. See Guidelines for Adapting Stepping Stones and Salamandar Trust (2019) Stepping Stones and Stepping Stones Plus.

[24] Fulu, Kerr-Wilson and Lang (2014) Ibid. ; Jewkes, Flood and Lang (2014) Ibid.

[25] CUSP (2018) Ibid; Cislaghi, B & Heise, L (2018) Ibid.

[26] Alexander-Scott et al (2016) Ibid.

[27] The Prevention Collaborative (2019b) Programme Summary: The Indashykirwa programme, Rwanda.

[28] https://www.icrw.org/research-programs/gender-equity-movement-in-schools-gems/

[29] Holden, S., Gordon-Dseagu, V., Gordon, G., Chiziza, N., Kiwia, P., Magesa, D., Manyama, W. and Welbourn, A. (2018) Building resilience to adverse childhood experiences: An assessment of the effects of the Stepping Stones with Children training programme on Tanzanian children affected by HIV and their caregivers, Health Education Journal. https://doi.org/10.1177/0017896918787217

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT වියුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women and Social Development Direct (2020) Transformed Attitudes, Beliefs and Norms, RESPECT: Preventing Violence against Women Strategy Summary.

RESPECT WOMEN



කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා යෝග්‍ය වාතාවරණය ශක්තිමත් කිරීම

UN WOMEN

World Health Organization

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා යෝග්‍ය වාතාවරණය ශක්තිමත් කිරීම

සාරාංශය

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය (VAW) පිරිමින් සහ ගැහැණුන් අතර අසමාන බල සම්බන්ධකම් සමග මුල්බැස තිබේ. මෙම සමාජභාවී අසමානතා නිර්මාණය වන්නේ සහ වැරගැන්වෙන්නේ පවුල්, ප්‍රජාවන්, සේවා ස්ථාන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන තුළ වෙනස්කොට සලකන සමාජ සම්මතයන්, භාවිතාවන් මගිනි. සමාජභාවී අසමානතා ද ප්‍රචණ්ඩත්වය සහ ජාතිය, ජනවර්ගය, ලිංගික දිශානතිය, හැකියාවන්/ නොහැකියාවන් සහ පුරවැසි තත්වය වැනි වෙනත් ලක්ෂණ මත පදනම් වූ වෙනස්කොට සැලකීම සමග සම්බන්ධ වේ.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ප්‍රචණ්ඩත්වය ඇතිකරන හෝ පවත්වාගෙන යන පුළුල් පරිසරය සම්බන්ධයෙන් කටයුතු කිරීම ඉතා වැදගත්ය. ජාතික ප්‍රතිපත්ති සම්පාදකයන් සහ ඔවුන්ගේ අරමුදල් හවුල්කරුවන් හට ප්‍රධාන මාර්ග හතරක් ඔස්සේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා යෝග්‍ය වාතාවරණය ශක්තිමත් කිරීම සඳහා කළ හැකි දේ ගැන මෙම ලේඛනය විසින් මාර්ගෝපදේශ සපයනු ලැබේ.



දේශපාලනික කැපවීම නිර්මාණය කිරීම



කාන්තා සංවිධානවල ආයෝජනය කිරීම

ප්‍රතිපත්ති සහ නීති ක්‍රියාත්මක කිරීම

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සම්පත් ලබාදීම



දේශපාලනික කැපවීම නිර්මාණය කිරීම

ප්‍රතිඵලය: නායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් වෙතින් කතාකිරීම සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෙළාදැකීම වෙනුවෙන් දේශපාලනික කැපවීම නිර්මාණය කිරීම

අරමුණ: විවිධ මට්ටම්වල නායකයෝ සහ ප්‍රතිපත්ති සම්පාදකයෝ, විශේෂයෙන්ම, ජාතික, උප ජාතික සහ ප්‍රජා නායකයෝ, සමාජභාවී අසමානතා හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ කතා කරමින් එය හෙළාදකිති. එය වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රබල ක්‍රියාමාර්ග ගනිති.

තාර්කිකත්වය: සමාජභාවී අසමානතාව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා දේශපාලන කැපවීම නිර්මාණය කිරීම RESPECT රාමුව ක්‍රියාත්මක කිරීමේ මූලික කාර්යයකි. උදාහරණයක් ලෙස, ජාතික සහ උප ජාතික නායකයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් වෙතින් සහාය ලබාගැනීම මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය පෞද්ගලික ප්‍රශ්නයක් නොව මනව හිමිකම් උල්ලංඝනයක් සහ මහජන අවධානය යොමුවිය යුතු ප්‍රශ්නයක් ලෙස හඳුනාගෙන තිබේ. කාන්තාවන් සවිබලගැන්වීම සමග සම්බන්ධ අධ්‍යාපනය. දේපළ සහ නායකත්වය වැනි සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට මෙම සහාය වැදගත් වේ. සමාජභාවී සමානාත්මතාව ඔස්සේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රශ්න සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමට දේශපාලන නායකයන් හට හැකිය. ඒ සම්බන්ධයෙන් වෙනත් අයගේ සහාය සහ ක්‍රියාකාරීත්වයන් ලබාගත හැකිය.

දේශපාලන කැපවීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් පද්ධතිමය වෙනසක් සිදුකිරීම සඳහා ඉතා වැදගත්ය. ඒ සඳහා නව නීති, ප්‍රතිපත්ති සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම නිර්මාණය කිරීම හා තිරසර ලෙස ක්‍රියාත්මක කිරීම, මූල්‍ය සම්පත් වෙන්කිරීම අවශ්‍යය. වෙනත් බලපෑම් සහගත නායකයන් ඇතුළුව දේශපාලන නායකයන් හට වෙනස්කම් කිරීම හා ප්‍රචණ්ඩත්වය පිටුදැකීම පිළිබඳ කතාකිරීම මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වටා තිබෙන සමාජ සම්මතයන් වෙනස් කිරීමේ ක්‍රියාවලයේදී වැදගත් භූමිකාවක් ඉටුකළ හැකිය.[1]

ෆීජි සිද්ධි අධ්‍යයනය

ෆීජි ආණ්ඩුව සියල්ලන් ඇතුළත් කරගන්නා, සමස්ත රජය සඳහාම වන කාන්තාවන් සහ ගැහැණු ළමයින් එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ජාතික සැලැස්මක් සංවර්ධනය කරගත් ලොව මුල්ම රටවල් අතරින් එකකි. මෙම පස් අවුරුදු (2020-2025) මූලෝපාය වෙනුවෙන් ඉහළ මට්ටමේ කැපවීමක් තිබුණි. එය ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලි, වෙන් කරන ලද ඉහළ මට්ටමේ අයවැයක් තිබිණි. සාක්ෂි මත පදනම් වූ එළඹුමක් සහිත මෙම මූලෝපායට ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කෙටි, මධ්‍ය හා දීර්ඝකාලීන ක්‍රියාමාර්ග අයත් වේ.

ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ප්‍රධානතම සලකාබැලීම්: පහත දැක්වෙන සලකාබැලීම් මගින් බලපෑම් සහගත නායකයන් සහ වෙනත් ප්‍රතිපත්ති සම්පාදකයන් අතර දේශපාලන කැපවීම නිර්මාණය කිරීමේ කටයුතුවලට උපකාර කළ හැකිය.

මූලික සලකාබැලීම්	විස්තර
ජාතික, උප ජාතික සහ ප්‍රාදේශීය ප්‍රජා නායකයන් සම්බන්ධ කරගැනීම	• ජාතික, පළාත් සහ ප්‍රාදේශීය යන සෑම මට්ටමකම පාර්ශ්වකරුවන් අතර ප්‍රධාන බලපෑම් සහගත නායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් ඉලක්ක කරන්න. විධිමත් මෙන්ම අවිධිමත් ප්‍රජා නායකත්ව ව්‍යුහයන් (ඡන්දයෙන් තෝරා පත්කරගත්, සම්ප්‍රදායික සහ ආගමික නායකයන්) සම්බන්ධ කරගැනීම විශේෂයෙන් ග්‍රාමීය ප්‍රජාවන්හිදී වැදගත් බව සාක්ෂි මගින් පෙන්නුම් කෙරේ.[2]
ක්‍රියාකාරීත්වය සඳහා ආචාරධර්මික හා ආර්ථික පසුබිම් සැකසීම	• නායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ පරිමාණයන් හා ගතිකයන් සම්බන්ධයෙන් දැනුවත්භාවය වැඩිකිරීම සඳහා ප්‍රාදේශීය විශේෂඥයන් සමග ජාතික හා පළාත් සංදර්භයන්හිදී වැඩකරන්න. කාන්තාවන්ට, ඔවුන්ගේ ළමයින්ට, පවුල්වලට හා ප්‍රජාවන්ට සහ ජාතික ආර්ථිකයට ඇතිවන නිශේධනාත්මක සමාජ හා ආර්ථික බලපෑම් පිළිබඳ සාක්ෂි සහ එය ගෝලීය සාක්ෂි පදනම්වලට බලපාන ආකාරය එයට ඇතුළත්ය.[3] • සදාචාරාත්මක හා ආර්ථික යන දෙපැත්තෙන්ම තර්ක කරන්න: සමාජභාවී අසමානත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යනු මානව හිමිකම් උල්ලංඝනයන් වේ. එසේම, ඒවා පවුල් යහපැවැත්මට හා ආර්ථික සංවර්ධනයට බාධාකාරීය. පණිවුඩය සන්නිවේදනය කරන ග්‍රාහකයන් සහ ජනමත නායකයන් ඉලක්ක කරන්න. • මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවීම නිසා සිදුවිය හැකි විශාල සමාජ හා ආර්ථික පිරිවැයට සාපේක්ෂව වළක්වාගැනීමේ පිරිවැය අඩු බව අවධාරණය කරන්න.[4]

යෝග්‍ය වාතාවරණය

මූලික සලකාබැලීම්	විස්තර
කාන්තා ව්‍යාපාරවලට සහ කාන්තාවන් නායකත්වය දෙන සිවිල් සමාජ සංවිධානවලට අරමුදල් සපයන්න. ඔවුන් සමග හවුල්කාරිත්වයන් ගොඩනගාගැනීම	• කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය කෙරෙහි වැඩි අවධානයක අවශ්‍යතාව පෙන්වාදීම සඳහා ජාතික සහ උප ජාතික කාන්තා මූලික සංවිධානවලට සහාය සහ අරමුදල් ලබාදෙන්න. කාන්තා සංවිධානවලට උපකාර කිරීම මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය දේශපාලනික අධිෂ්ඨානය නිර්මාණය කළ හැකි බව සාක්ෂි මගින් පෙන්නුම් කරනු ලැබේ. මහජන සහාය ප්‍රදර්ශනය කිරීම හරහා නීති සම්පාදකයන්ගේ හා නිලධාරීන්ගේ සහාය එම ප්‍රයත්නයන් වෙනුවෙන් ලබාගත හැකිය.[5] • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ උද්දේශන න්‍යාය පත්‍ර වෙනුවෙන් කාන්තා ව්‍යාපාර, කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාර සහ සිවිල් සමාජයේ වෙනත් කොටස් අතර සන්ධාන ගොඩනැගීමට ආධාර කරන්න. ප්‍රාදේශීය, කලාපීය සහ ගෝලීය මට්ටමෙන් පොදු පණිවුඩ බෙදාගැනීම ද එයට අයත් වේ.
පක්ෂ අතර සහ රාජ්‍යයන් අතර ව්‍යුහයන්ගේ සහාය ලබාගැනීම	• කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් පක්ෂ අතර සහ රාජ්‍යයන් අතර ව්‍යුහයන්ගේ සහාය ලබාගන්න. සමාජභාවී අසමානතා සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බලය සහිත දැනට පවත්නා රාජ්‍ය ව්‍යුහයන් සමග වැඩකරන්න. ඒවා ශක්තිමත් කරන්න. උදාහරණයක් ලෙස, සමාජභාවී අමාත්‍යාංශය සහ ව්‍යවස්ථාදායකය ඇතුළු රජයේ ආයතන සමග වැඩකිරීමෙන් ඒවා සමාජභාවය සම්බන්ධයෙන් වැඩිපුර ප්‍රතිචාරාත්මක තත්වයට පත්කළ හැකිය.[6] • සමාජභාවී අමාත්‍යාංශවලට බොහෝවිට තිබෙන්නේ සීමිත දේශපාලනික බලපෑමකි. එසේම, ඒවායේ ධාරිතාව හා අයවැය ද අඩුය. වෙනත් අමාත්‍යාංශවල හවුල්කරුවන් සොයාගැනීමට හා හැකි අවස්ථාවලදී ධාරිතාවන් ශක්තිමත් කිරීමට ඒවා ප්‍රයෝජනවත් වේ. **කාම්බෝජයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන දෙවෙනි ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2014 - 2018) සැලසුම් කරනු ලැබුවේ අධිකරණයේ, නඩු පවරන්නන්ගේ, ප්‍රාදේශීය අධිකාරීන්ගේ, පොලිසියේ හා සිවිල් සමාජයේ ආධාරයෙනි. අදාළ රාජ්‍ය අමාත්‍යාංශ, සංවර්ධන හවුල්කරුවන්, සිවිල් සමාජය හා බේරුණු පුද්ගලයන් ද ඒ අතර වේ.**
ජාතික හා අන්තර්ජාතික නීතිය සහ කැපවීම් සම්බන්ධ කරගැනීම	• ජාතික හා කලාපීය සම්මුතීන්, ප්‍රකාශයන් හා යෝජනා සම්මතයන් සහ දැනට පවත්නා ජාතික නීති හා ප්‍රතිපත්ති ජාතික මට්ටමේ නීති හා ප්‍රතිපත්ති දිරිගැන්වීමේදී, වැඩිදියුණු කිරීමේදී හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී පදනම ලෙස භාවිතා කරන්න.[7] තිරසර සංවර්ධන අරමුණ හා නීතිමය වශයෙන් බැඳීම් ඇතිකරන කලාපීය හා ජාත්‍යන්තර ගිවිසුම් සහ ලේඛන (CEDAW, Maputo Protocol, Belém do Pará සහ Instanbul Convention වැනි) ජාතික න්‍යායපත්‍ර හා ප්‍රතිපත්ති සැකසීමේදී වැදගත් වේ. • එක්සත් ජාතීන් සහ වෙනත් බහුපාර්ශ්වීය හෝ කලාපීය සංසදයන් තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් නායකත්වය පෙන්වීම සඳහා ජාතික නායකයන් හට ලබාදිය හැකි අවස්ථා සොයාබලන්න.
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රශ්න කෙරෙහි අවධානය යොමුවීම වර්ධනය කරගැනීම	• කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ පරිමාණය හා එහි තීව්‍රතාව ද ප්‍රතිඵල ද ලේඛනගත කිරීම සඳහා දත්ත එක්රැස් කරන්න. දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියේදී ජාතික පාර්ශ්වකරුවන්ගේ හිමිකාරිත්වය හා උනන්දුව නිර්මාණය කිරීම සඳහා මාර්ග සෙවීම වැදගත් වේ. • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිව කතාකිරීම සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ නායකයන් හා ප්‍රසිද්ධ පුද්ගලයන් දිරිගන්වන්න. උදාහරණයක් ලෙස, උප සහරා කලාපයේ රාජ්‍ය නායක බිරියන් විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිව ප්‍රචාරණ ක්‍රියාමාලා කීපයක් සිදුකර තිබේ.[8] • ක්‍රීඩකයන්, ජනප්‍රිය පුද්ගලයන් වැනි වෙනත් ක්ෂේත්‍රවල ජනමත නායකයන් සම්බන්ධ කරගන්න. • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට සහාය පිණිස ප්‍රකාශ සිදුකිරීමට නායකයන්ට හා ප්‍රතිපත්ති සම්පාදකයන්ට වේදිකා සහ අවස්ථා සපයන්න. • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා මාධ්‍ය සමග වැඩකරන්න. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පවතින ප්‍රමාණය සහ එහි ප්‍රතිඵල ගැන දැනුවත්භාවය වර්ධනය කළ හැකිය. හානිකර සමාජභාවී සමාජ සම්මතයන් හා ඒකාකෘති වැරගැන්වීම වැළැක්විය හැකිය.[9] • විනෝද අධ්‍යාපනික හා ඩිජිටල් තාක්ෂණයන් සතුව විශාල පිරිසක් වෙත ළඟාවීමේ හැකියාව තිබේ. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුම වර්ධනය කළ හැකිය. එහෙත්, එමගින් පමණක් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කළ හැකි බවට සාක්ෂි නැත.[10]

සියරා ලියොන් සිද්ධි අධ්‍යයනය

සියරා ලියොන්හි සිවිල් සමාජ සංවිධාන ඉහළ පෙළේ ලිංගික ප්‍රචණ්ඩත්ව සිද්ධි කීපයක් මෙන්ම කලින් වසරේ ලිංගික ප්‍රහාර සිද්ධිවල තියුණු වැඩිවීමක් පෙන්වන දත්ත ද භාවිතා කරමින් රජයට ක්‍රියාත්මක වීම සඳහා බලපෑම් කරන ලදී. එයට රාජ්‍ය නායක බිරිය විසින් නායකත්වය දෙන ලද ප්‍රචාරණ ක්‍රියාමාලාවක් ද ඇතුළත් විය. 2019 පෙබරවාරියේදී, ජනාධිපතිවරයා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් හදිසි තත්වයක් ප්‍රකාශ කළේය. එමගින් ඔහුගේ රජයට හදිසි රෙගුලාසි හඳුන්වාදීමේ අවස්ථාව ලැබිණි. බේරුණු පුද්ගලයන් සම්බන්ධයෙන් අලුත් විධිවිධාන සහ වැරදිකරුවන්ට වඩා දැඩි දඬුවම් පැමිණවීම ඒ අතර වේ.

හදිසි තත්වය හේතුවෙන් රජයට ඉක්මණින් ක්‍රියාත්මක වන්නට හැකි විය. ලිංගික ප්‍රචණ්ඩත්වය කෙරෙහි ජාතික අවධානය යොමුකිරීමට හැකි විය. උසාවිවල නඩු ඉක්මන් කළ හැකි විය. එහෙත්, එයට ලැබුණු ප්‍රතිචාර මිශ්‍ර ඒවා විය. නීතිමය වෙනස්කම් කිරීම සඳහා හදිසි අවස්ථාව භාවිතා කිරීම ප්‍රශ්න කිරීමට ලක්විය. එයට ප්‍රතිචාර ලෙස රජය 2019 ජූනි මස හදිසි අවස්ථාව ඉවත් කළේය. 2012 ලිංගික අපරාධ පනතට පාර්ලිමේන්තුව හරහා සිදුකරන ලද සංශෝධන 2019 සැප්තැම්බර් මාසයේදී සම්මත කරන ලදී. දූෂණය සඳහා අවම දඬුවම වැඩිකිරීම, බලය පාවිච්චි කිරීම වැනි අලුත් වැරදි ඇතුළත් කිරීම වෙනස්කම් අතරට ඇතුළත් විය.

මූලාශ්‍රය: Martin, L.S. and Koroma (2020) Sierra Leone declared a state of emergency over sexual violence. African Arguments.

අමතර මූලාශ

'Feminist mobilisation and progressive policy change: why governments take action to combat violence against women', Weldon, S.L. and Htun, M. in Gender & Development 21 (2). 2012. 1985 සිට 2005 දක්වා රටවල් 70ක කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ මෙම වෛතිහාසික විශ්ලේෂණය මගින් හෙළිදරව් වන පරිදි ප්‍රතිපත්තිමය වෙනස්කම් නිර්මාණය කිරීම සඳහා ඉවහල් වන ස්ථාවර සාධකය වන්නේ ස්ත්‍රීවාදී ක්‍රියාකාරීත්වයයි.

'Economic and Social Costs of Violence: Evidence Brief' What Works to Prevent VAWG Programme. 2020. මෙම සාක්ෂි සාරාංශය විසින් දේශපාලන නායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් සමග සංවාදය සඳහා ප්‍රයෝජනවත් මෙවලමක් සපයනු ලැබේ. පකිස්තානය, ඝානා සහ දකුණු සුඩානයේ ජාතික ආර්ථිකයන්ට හා සමාජයට කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය බලපාන ආකාරය පිළිබඳ වැදගත් සොයාගැනීම් මෙමගින් ඉදිරිපත් කරනු ලැබේ.

'Estimating Macroeconomic Loss Due to Violence Against Women and Girls: A Policy Toolkit.' Raghavendra, S., Kim, K., Ashe, S., Chadha,M., Piiroinen, P.T. and Duvvury, N. Galway: NUI Galway. 2019. මෙම ප්‍රතිපත්ති මෙවලම් කට්ටලය විසින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයෙහි සෘජු හා වක්‍ර පිරිවැය ගණනය කිරීම සඳහා සරල මාර්ගෝපදේශයක් සපයනු ලැබේ. ප්‍රචණ්ඩත්වය ආර්ථික වර්ධනයට බලපාන ආකාරය පිරිවැය ඔස්සේ තක්සේරු කිරීම මගින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආර්ථික වර්ධනයට තිබෙන පිරිවැය විග්‍රහ කරන ආකාරයක් ද මෙවලම් කට්ටලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

Global Scoping of Advocacy and Funding for the Prevention of Violence Against Women and Girls. The Equality Institute (2019). කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් සඳහා 2012-2017 අතර කාලයේදී ආධාර පිරිනමන්නන්ගේ සහ අරමුදල් සම්පාදන රටාවල සාරාංශයක් මෙම පත්‍රිකාව විසින් ඉදිරිපත් කරනු ලැබේ. උගත් පාඩම්, අවස්ථා, අඩුපාඩු, උද්දේශනය සහ අරමුදල් වෙනුවෙන් නිර්දේශ ද එහි ඉදිරිපත් කරනු ලැබේ.



කාන්තා සංවිධාන වෙනුවෙන් ආයෝජනය කිරීම

ප්‍රතිඵලය: කාන්තා සංවිධාන වෙනුවෙන් ආයෝජනය කරන්න. සම්පත් සපයන්න. ඔවුන්ගේ කාර්යභාරය ශක්තිමත් කරන්න.

අරමුණ: කාන්තා අයිතිවාසිකම් සංවිධාන සහ ව්‍යාපාර සතුව සමාජභාවී සමානතාව වෙනුවෙන් පෙනී සිටීම, නවෝත්පාදනීය හා ඵලදායී ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රම සහ ප්‍රතිචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත්, ධාරිතාව සහ අවකාශය තිබේ. එසේම, රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකරුවන් කාන්තාවන් සම්බන්ධයෙන් වගවිය යුතු තත්වයට පත්කළ හැකිය.

තාර්කිකත්වය: බේරුණු පුද්ගලයන්ට උපකාර කිරීමේදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන (WROs) සිටින්නේ ඉදිරියෙන්මය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිව ප්‍රතිචාර දැක්වීමේදී ඒවා විසින් ඵලදායී ආදර්ශයන් සඳහා නායකත්වය දී තිබේ. ප්‍රචණ්ඩත්ව මට්ටම් අඩුකර තිබෙන ප්‍රජා බලමුළුගැන්වීම් මූලෝපායන් සැලසුම් කිරීම, වඩා හොඳ යොමුකිරීමේ පද්ධති සහ විධිමත් සේවාවන් (උදා: කාන්තා පොලිස් ස්ථාන, පවුල් උසාවි) වෙනුවෙන් පෙනීසිටීම, අවිධිමත් සේවා සම්පාදනය (උදා: ආරක්ෂිත නවාතැන්, මනෝ සමාජ සහාය) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අධීක්ෂණය කිරීමට හා කාන්තාවන්ගේ ආරක්ෂාවට සහාය වීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම එයට ඇතුළත්ය.[11]

කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් සමාජ වෙනස වෙනුවෙන් පෙනීසිටීම සඳහා ප්‍රාදේශීයව නිර්මාණය කරගන්නා සහ කාන්තාවන්ට වගකියන සාමූහික කාන්තා ක්‍රියාකාරකම් සඳහා අවකාශ නිර්මාණය කරනු ලැබේ. ඔවුන් නීතිමය වෙනස්කම් වෙනුවෙන් ක්‍රියාත්මක වී තිබේ. ස්ත්‍රීවාදී ව්‍යාපාර විසින් සිදුකරන ලද ප්‍රතිපත්ති උද්දේශනය සහ ඒවා පවත්වාගෙන යන කාන්තා අයිතිවාසිකම් සංවිධාන සියලු ආකාරවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා වන ජාතික නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුවලදී වැදගත්ම සාධකය වූ බව සමීක්ෂණ මගින් ඔප්පු වී තිබේ.[12]

පුද්ගල මට්ටමේදී, කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් කාන්තාවන්ට නායකත්ව හා තීරණ ගැනීමේ භූමිකාවන් සඳහා අවස්ථා නිර්මාණය කරයි. විශේෂයෙන්ම, සම්ප්‍රදායික දේශපාලන ව්‍යුහයන් විසින් කාන්තාවන් බැහැර කරන පසුබිම්වලදී එය වැදගත් වේ. එමගින් කාන්තාවන්ගේ දේශපාලනික සවිබලගැන්වීමට මාර්ගයක් සැකසේ. එය සමාජභාවී සමානාත්මතාව වර්ධනය කිරීමේලා වැදගත් වන එක් සාධකයකි.[13]

ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මූලෝපායික, තිරසර, ව්‍යුහාත්මක සහ පිරිවැය කාර්යක්ෂම සමාජ වෙනස්කම් ක්‍රියාත්මක කිරීමේදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් ඉටුකරනු ලබන භූමිකාව කෙතරම් වැදගත් වුව ද, ඒවාට අරමුදල් සැපයෙන්නේ සැලකිය යුතු තරම් අඩුවෙනි. සමාජභාවී සමානාත්මතාව වෙනුවෙන් කැපකර තිබෙන ආධාර අරමුදල් අතරින් ඔවුන්ට ලැබෙන්නේ 1.5%ක් පමණි.[14] කාන්තා ව්‍යාපාර විසින් නායකත්වය සැපයීම අඛණ්ඩව පැවතීම සඳහා සහ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රයත්නයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ප්‍රමාණවත් අරමුදල් සැපයිය යුතුය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කරනු ලබන සමීක්ෂණ, වැඩසටහන් සහ තීරණගැනීමේ කටයුතුවලදී ඔවුන්ට වැදගත් භූමිකාවක් අවශ්‍යය.

ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ප්‍රමුඛ සලකාබැලීම්: පහත දැක්වෙන ප්‍රමුඛ සලකාබැලීම් මගින් කාන්තා අයිතිවාසිකම් සංවිධාන වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා කැපවී සිටින සංවිධානවලට මාර්ගෝපදේශනය සැපයිය හැකිය.

මූලික සලකාබැලීම්	විස්තර
විවිධ කාන්තා හිමිකම් සංවිධානවලට උපකාර කිරීම	• ප්‍රාදේශීය මට්ටමේ කුඩා, අවිධිමත් සංවිධානවල සිට උද්දේශනය හා වගවීම සම්බන්ධයෙන් ජාතික, කලාපීය හා ජාත්‍යන්තර මට්ටම්වල ක්‍රියාත්මක විශාල, ඉහළපෙළේ සංවිධාන දක්වා විවිධ කාන්තා අයිතිවාසිකම් සංවිධාන රැසකට සහාය වීම. • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම කෙරෙහි අවධානය යොමුකරන ඒවාට සහ තරුණ හා වැඩිහිටි කාන්තාවන්, ආබාධ සහිත කාන්තාවන් හෝ ලිංගික හෝ වාර්ගික සුළුතරයන්ට අයත් කාන්තාවන් වැනි විශේෂිත කණ්ඩායම්වලට එරෙහි ප්‍රචණ්ඩත්වය හා වෙනස්කම් කිරීමට එරෙහිව ක්‍රියාත්මක වන සංවිධානවලට අමතරව කාන්තා අයිතිවාසිකම් වඩා උසස් කිරීම සඳහා පුළුල් ලෙස ක්‍රියාත්මක වන කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර කිරීම.[15]

යෝග්‍ය වාතාවරණය

මූලික සලකාබැලීම්	විස්තර
හොඳම අරමුදල් වර්ගය පරිස්සමෙන් සලකාබලන්න	• කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ව්‍යාපාර හැදීම සඳහා, බලාපොරොත්තු නොවූ අවස්ථා හා තර්ජනවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සහ සංවිධානමය ධාරිතාව ගොඩනගාගැනීම සඳහාත්, වැඩසටහන් පුළුල් කිරීම සඳහාත්, තිරසර ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකිරීම සඳහාත් හොඳින්ම සහාය ලබාදෙන නම්‍යශීලී, මූලික හා දිගුකාලීන අරමුදල් සැපයීම.[16] • උද්දේශනය සහ ජාලගතවීම, කෙටිකාලීන නවෝත්පාදනය, සමීක්ෂණ හා අධ්‍යාපනය, දිගුකාලීන මූලික සහාය ආදිය සඳහා නම්‍යශීලී අරමුදල් සැපයීම පිණිස විවිධ ප්‍රමාණවල කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර කිරීම සඳහා අරමුදල් ස්වරූප පරාසයක් සලකා බැලීම. • කාන්තා අරමුදල් වැනි විශේෂඥ අරමුදල් සපයන්නන් හරහා කුඩා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට අරමුදල් සැපයීමට සහාය වීම.[17]
සෘජු අරමුදල් සැපයීමට වඩා අමතර සහාය සැපයීම	• කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ ඔවුන්ගේ කාර්යය ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර පිණිස අඛණ්ඩ, නම්‍යශීලී, දිගු කාලීන සහාය සැපයීම. තාක්ෂණික උපදෙස්, මූල්‍ය ආධාර සහ ඉගෙනීම බෙදා ගැනීමට ඇති අවස්ථා එයට ඇතුළත් වේ. • අරමුදල් ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම සඳහා ධාරිතා ගොඩනැගීම සහ ජාතික සහ ප්‍රාදේශීය ආණ්ඩු ඇතුළුව දේශීයව සම්පත් බලමුළුගැන්වීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර කිරීම • න්‍යායපත්‍ර ගෝලීය සහ බහුපාර්ශ්වික අවකාශයන් වෙත ගෙන ඒම සඳහා ජාතික කාන්තා ව්‍යාපාර සමග වැඩකිරීම සහ ජාල සහ සන්ධාන පිහිටුවීමට සහ අදහස් පළකිරීම ශක්තිමත් කිරීමට කාන්තා අයිතිවාසිකම් සංවිධාන සඳහා අවස්ථා සහ වේදිකා නිර්මාණය කිරීම. උදාහරණ ලෙස, ජාලගතවීම්වලට අරමුදල් සැපයීමෙන් සහ අවස්ථා සංවිධානය කිරීමෙන් ද, කාන්තා අයිතිවාසිකම් සංවිධාන විධිමත් රාජ්‍ය දූත පිරිස්වලට ඇතුළත් කිරීමෙන් ද එසේ කළ හැකිය. • සාම ක්‍රියාවලීන් සහ තිරසාර මූල්‍ය ආධාර ඇතුළු කාර්යයන්හිදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන දේශපාලනික තීරණගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කරගැනීම සඳහා වන ස්ත්‍රීවාදී න්‍යාය පත්‍ර සඳහා ජාත්‍යන්තරව සහ දේශීයව පෙනීසිටීම.[18] • බහුවිධ අවාසි සහගත තත්වයන්ට මුහුණ දෙන කාන්තාවන් නියෝජනය කරන කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට අරමුදල් ලබාගැනීමේ පහසුව හා ඇතුළත්කාරිබව නිර්මාණය කිරීම සඳහා ඔවුන් ප්‍රගාමී ලෙස සම්බන්ධ කරගැනීම.[19]
කාන්තා අයිතිවාසිකම් සංවිධානවල ආරක්ෂාව හා ස්වාධීනත්වය සඳහා උපකාර කිරීම[20]	• කාන්තා මානව හිමිකම් ආරක්ෂකයන් (WHRDs) හඳුනා ගැනීම සහ සහාය දීම. ඔවුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ලේඛනගත කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිපත්ති සංවාදයේ සහ පුළුල් රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නවල කොටසක් ලෙස මෙය මතු කිරීම එයට ඇතුළත්ය.[21]
කාන්තා අයිතිවාසිකම් සංවිධාන දැනට කරන කටයුතු මත පදනම්ව ඉදිරියට කටයුතු කිරීම	• තම ප්‍රජාවන් සහ සංදර්භයන් පිළිබඳ කාන්තා අයිතිවාසිකම් සංවිධානවල ගැඹුරු දැනුම පිළිගැනීම හා ඇගයීම. • ඔවුන්ගේ කාර්යයන්, ඉගෙනීම සහ බලපෑම් ලේඛනගත කිරීමට සහ බෙදා ගැනීම උදෙසා ඔවුන්ගේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර කිරීම. උදා: අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමු, සමීක්ෂණ ආරම්භ කිරීම සහ ප්‍රායෝගිකත්වය පදනම් වූ ඉගෙනුම් ලේඛනගත කිරීම.[22] • කාන්තා අයිතිවාසිකම් සංවිධාන සමග එක්ව හවුල්කාරිත්වයන්, ඔවුන් උත්ප්‍රේරණය කිරීමට උත්සාහ කරන ව්‍යුහාත්මක වෙනස්කම් නිරීක්ෂණය කරන වාර්තාකරණ පද්ධති සහ මෙම වෙනස නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට සරල, නිර්මාණශීලී සහ කාර්යක්ෂම පියවරයන්ට අවස්ථාව සංවර්ධනය කිරීම.[23]
ශක්තිමත් හවුල්කාරිත්වයන් ගොඩනැගීම	• අරමුදල් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීමේ විශේෂඥයන් ලෙස ලෙස කාන්තා අයිතිවාසිකම් සංවිධාන සම්බන්ධ කරගන්න. ඔවුන් අරමුදල් මණ්ඩලවලට ඇතුළත් කිරීම තහවුරු කරන්න. • වැඩසටහන් අයවැය පාලනය කිරීම, තීරණ ගැනීමේදී අදහස් දැක්වීමේ අවස්ථාව සහ සියලු මට්ටම්වල තොරතුරු ලබාගැනීමේ හැකියාව වෙනුවෙන් කාන්තා අයිතිවාසිකම් සංවිධාන සමග සම හවුල්කාරිත්වය දිරිගන්වන්න. • සාමූහික හඬ සහ බලපෑම ශක්තිමත් කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධාන සහ වෙනත් සමාජ ව්‍යාපාර අතර සන්ධාන ගොඩනැගීම සඳහා අරමුදල් සහ ආධාර සපයන්න.

සිද්ධි අධ්‍යයනයන: Raising Voices සහ උගන්ඩාවේ CEDOVIP

Irish Aid iy Raising Voices සහ උගන්ඩාවේ CEDOVIP අතර දිගුකාලීන සහ නම්‍යශීලී හවුල්කාරිත්වය යනු අරමුදල් සපයන්නන් හා කාන්තා අයිතිවාසිකම් සංවිධාන අතර සම්බන්ධතා එම සංවිධාන වර්ධනය වන විට හා දේශීය අරමුදල් හා සහාය මූලාශ්‍රයන් සොයාගන්නා විට කාලයත් සමග පරිණාමය වන ආකාරය පිළිබඳ යහභාවිතාවන් සඳහා උදාහරණයකි.

Raising Voices යනු උගන්ඩාව පදනම් කරගත් කාන්තා අයිතිවාසිකම් සංවිධානයකි. එය සමාජ සම්මතයන් වෙනස් කිරීමට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩු කිරීමට ප්‍රජා පාදක ප්‍රවේශයන් සංවර්ධනය කර ක්‍රියාත්මක කරයි. එහි හවුල්කරු වන්නේ 2003 දී Raising Voices විසින් සම දායකත්වයෙන් ආරම්භ කරන ලද ස්වාධීන උගන්ඩා රාජ්‍ය නොවන සංවිධානයක් වන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මධ්‍යස්ථානය (CEDOVIP) ය.

Irish Aid මුලදී උගන්ඩාවේ අයර්ලන්ත තානාපති කාර්යාලය හරහා Raising Voices සඳහා අරමුදල් සැපයූ අතර මෙම සහයෝගය Raising Voices සංවිධානයට එහි ප්‍රමුඛතම ප්‍රජා බලමුළුගැන්වීමේ වැඩසටහනක් වන SASA! නිර්මාණය කරගැනීමට උපකාරී විය. එය 2012 දී, එක්සත් රාජධානියේ ඒකාබද්ධ අරමුදල් ඔස්සේ අහඹු පාලන අත්හදා බැලීමක් (RCT) හරහා සාර්ථක ප්‍රතිඵල සහ පරිමාණය ඉහළ නැංවීමේ හැකියාව පෙන්නුම් කළේය. Raising Voices විසින් විවිධ සංදර්භයන් තුළ භාවිතා කිරීම සඳහා ක්‍රමවේදය අනුවර්තනය කිරීමට පටන් ගත් අතර, එහි උපදේශනය සහ ඉගෙනීමේ උත්සාහයන් වැඩි කිරීමත් සමග Irish Aid සිය අරමුදල් තානාපති කාර්යාලයේ සිට මූලස්ථානය වෙත මාරු කිරීමට තීරණය කළේය. එසේම, ව්‍යාපෘති මත පදනම් වීමේ සිට නම්‍යශීලී, මූලික අරමුදල් වෙත ද මාරු කිරීමට තීරණය කළේය. Irish Aid විසින් අමතර මූල්‍ය නොවන සහාය ද පිරිනමන ලදී. Raising Voices නව හවුල්කරුවන් සහ අරමුදල් සපයන්නන් සමග සම්බන්ධ කිරීම සහ ඔවුන්ගේ ගෝලීය බලපෑමට පහසුකම් සැලසීම එයට ඇතුළත්ය.

Raising Voices එහි ක්‍රමවේදය උගන්ඩාවෙන් ඔබ්බට පුළුල් කරන විට, CEDOVIP උගන්ඩාහි ඔවුන්ගේ ව්‍යාපෘති කටයුතු කරගෙන ගියේය. ඔවුහු එක්ව උගන්ඩා රජය සමග හවුල්කාරිත්වයක් ඇති කර ගත්හ. මෙමගින් Irish Aid හට Raising Voices සහ CEDOVIP සමග එක්ව වසර දෙකක සංක්‍රාන්ති කාලපරිච්ඡේදයක් තුළ කටයුතු කිරීමට හැකි විය. එය සැලසුම් කරනු ලැබුවේ මේ දක්වා අත්කර ගෙන ඇති ප්‍රගතිය රජය සහ අනෙකුත් පරිත්‍යාගශීලීන් සමග ඇති හවුල්කාරිත්වය තුළින් තිරසාර වනු ඇති බව සහතික කිරීම සඳහාය.

මූලාශ්‍රය: Esplen, E. (2016) Donor support to southern Women's Rights Organizations: OECD Findings.
OECD DAC Network on Gender Equality

අමතර මූලාශ

'Toward a Feminist Funding Ecosystem: A framework and practical guide' AWID Resourcing Feminist Movements Initiative. 2019. මෙම මාර්ගෝපදේශය අරමුදල් භාවිතයන් මගින් ස්ත්‍රීවාදී ව්‍යාපාරවලට වඩා හොඳින් සේවය ලබාදිය හැක්කේ කෙසේදැයි අධ්‍යනය කරයි.

'Feminist Pocketbook' The Coalition of Feminist for Social Change (COFEM). 2017. This useful resource includes Tipsheet 4: Staying Accountable to Women and Girls and Tipsheet 10: Feminist Movement Building

'Donor support to southern women's rights organisation: OECD Key Findings' Esplen, E. 2016. දකුණුදිග කාන්තා අයිතිවාසිකම් සංවිධාන වෙත පරිත්‍යාගශීලීන්ගේ සහයෝගයේ ප්‍රවණතා සහ උපාය මාර්ග මෙම වාර්තාව මගින් ලේඛනගත කරනු ලැබේ. ආධාරවල ප්‍රමාණය සහ ගුණාත්මකභාවය ශක්තිමත් කිරීම සඳහා ආධාරකරුවන් සඳහා ප්‍රවේශයන්, ආකෘති සහ යාන්ත්‍රණයන් ද එමගින් හඳුනාගනු ලැබේ.

'Standing with the changemakers: lessons from supporting women's movement' Womankind Worldwide. 2017 මෙම වාර්තාව මගින් කාන්තා අයිතිවාසිකම් සංවිධානවල භූමිකාවන් සහ කාන්තා අයිතිවාසිකම් උසස්කිරීම සම්බන්ධ චලනයන් සහ ඒ වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රජාවට ලබාදිය හැකි සහාය අවධාරණය කරනු ලැබේ.

නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

ප්‍රතිඵලය: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන සහ ද්විතියික අධ්‍යාපනයට ප්‍රවේශය ඇතුළු සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන නීති සහ ප්‍රතිපත්ති සම්පාදනය සහ ඒවා ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.

අරමුණ: ආයතනවල සහ වගකීම් දරන්නන්ගේ ධාරිතාව සහ වගවීම වර්ධනය කිරීම ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම ඔස්සේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා නීති[24] සහ ප්‍රතිපත්ති නිර්මාණය කර බලාත්මක කරනු ලැබේ.

තාර්කිකත්වය: ජාතික නීති යනු අයිතිවාසිකම් සහ මූලික නිදහස සහතික කිරීමේ පළමු පියවර බව Declaration on the Elimination of Violence Against Women, Belém do Pará සම්මුතිය Maputo Protocol සහ Instanbul Convention වැනි ජාත්‍යන්තර හා කලාපීය ලේඛනවල දැක්වේ. අයිතිවාසිකම් පිළිගැනීම, ආරක්ෂාව සහ ඒවා බලාත්මක කිරීම සඳහා නීති විසින් පදනම සපයනු ලැබේ. සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන රජයේ ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් ද කැපවීමේ වැදගත් ප්‍රකාශයක් විය හැකි අතර එමගින් ක්‍රියාකාරීත්වය සඳහා රාමුවක් සපයයි.

පසුගිය වසර 30 තුළ, ගෘහස්ථ හිංසනය විසඳීම සඳහා නීති හඳුන්වා දුන් රටවල් සංඛ්‍යාව 1990 දී බිංදුවට ආසන්නව සිට 2020 වන විට 155 දක්වා ඉහළ ගොස් තිබේ.[25] ගෘහස්ථ හිංසන සිද්ධි සම්බන්ධයෙන් නඩු පැවරීමේ හැකියාව, ආරක්ෂාව සලසන ලෙස නියෝග නිකුත් කිරීම සහ බේරුණු පුද්ගලයන් සඳහා වන සේවා සඳහා අයිතිවාසිකම් විස්තර කිරීම එයට අයත් වේ. සමහර අවස්ථාවල නොමිලේ සෞඛ්‍ය සේවා සහ නීති ආධාර සපයනු ලැබේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ලිංගික අපයෝජන, කාන්තා ලිංගික අවයව විකෘති කිරීම, ගෘහස්ථ හිංසනය, ළමා විවාහ සහ බලහත්කාර අපරාධ බවට පත්කිරීමේ නීති ඇතුළුව වෙනත් විශේෂිත නීති මාලාවක් ද එයට ඇතුළත්ය.

උරුමය, ඉඩම් සහ දේපළ අයිතිවාසිකම්, විවාහක භාරකාරත්වය සහ දික්කසාදය ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන පුළුල් නීති කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මට්ටම් අඩු කිරීමට උපකාරී වන බවට සාක්ෂි මතුවෙමින් තිබේ. නිදසුනක් වශයෙන්, ඉන්දියාවේ ප්‍රාන්ත 16ක කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මට්ටම් අනුව පිරිමින්ගේ සහ කාන්තාවන්ගේ උරුම අයිතිවාසිකම් සමාන කිරීමෙන් ඇතිවූ බලපෑම අධ්‍යයනයකින් තක්සේරු කරන ලදී. සංශෝධනවලින් පසුව විවාහ වූ කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය[26] අත්විඳීමට ඇති ඉඩකඩ අඩු බව සොයා ගන්නා ලදී. ගැහැණු ළමයින් සවිබල ගැන්වීම සහ පිරිමි සහකරුවන් මත කාන්තාවන්ගේ අනාගත ආර්ථික යැපීම අඩු කිරීම සඳහා ද්විතීයක අධ්‍යාපනය වෙත ප්‍රවේශය වැඩිකිරීමේ නීති හා ප්‍රතිපත්ති වැදගත් වේ. ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කර ඇති පිරිමින් විසින් ශාරීරික සහ/හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සිදු කිරීමට ඇති ඉඩකඩ අඩුය.[27]

කෙසේ වෙතත්, ආරක්ෂාව සහ ප්‍රතිචාරය සඳහා ශක්තිමත් නෛතික සහ ප්‍රතිපත්ති රාමු වැදගත් වන බව සඳහන් කළ යුතුය. එය යුක්තිය සඳහා කාන්තාවන්ගේ ප්‍රවේශය පුළුල් කිරීමේ අත්‍යවශ්‍ය අංගයකි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහි නීති අපරාධකරුවන්ට බාධාවක් ලෙස ක්‍රියාත්මක වන බවට හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මට්ටම අඩු කිරීමට ඉවහල් වන බවට සාක්ෂි නැත.[28] බොහෝ රටවල, ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු සැලකිය යුතු මට්ටමකින් පවතින අතර විශේෂයෙන් දුරස්ථ ප්‍රදේශවල නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන්නේ නැත. නීති සහ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලන කැපවීම, ඒ වෙනුවෙන් කැපකරන ලද අයවැය, පුහුණු කාර්ය මණ්ඩල, සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාමාර්ග සහ සේවා සඳහා පුළුල් ප්‍රවේශය අවශ්‍ය වේ.[29]

ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ප්‍රමුඛ සලකාබැලීම්:
ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටින සහ ඒවාට සහාය දක්වන ජාතික ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා නීති සහ ප්‍රතිපත්තිවල සඵලතාවය වර්ධනය කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ අධීක්ෂණය කිරීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු කිහිපයක් මෙසේය.[30]

මූලික සලකාබැලීම්	විස්තර
ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය	• කාන්තා ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට, එයින් ආරක්ෂාව සැලසීමට, නඩු පැවරීමට, දඬුවම් කිරීමට සහ සහන සැලසීමට රාජ්‍යයන් විසින් 'සාධාරණ' ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය කරන ජාත්‍යන්තර නීතියේ යෝග්‍ය නිසි ප්‍රමිතියට රාජ්‍යයන් අනුකූල වන බවට සහතික වීම. • ප්‍රචණ්ඩත්වය සරලව අපරාධයක් බවට පත් කිරීමෙන් ඔබ්බට විහිදෙමින්, සිවිල් පිළියම් සහ වැළැක්වීම, දැනුවත්භාවය නැංවීම, ආයතනික යාන්ත්‍රණ සහ බේරුණු පුද්ගලයන්ගේ අධිකරණ ආරක්ෂාව සම්බන්ධ නීති සම්පාදනය කිරීම සඳහා පුළුල් ව්‍යවස්ථාදායක ප්‍රවේශයක් අනුගමනය කරන්න.

මූලික සලකාබැලීම්	විස්තර
	• දිවි ගලවා ගත් අය, කාන්තා සංවිධාන සහ අදාළ සිවිල් සමාජ සංවිධාන, රජයේ දෙපාර්තමේන්තු සහ සේවා සපයන්නන්, ජාතික මානව හිමිකම් ආයතන, පොලිසිය, නීති වෘත්තිකයන්, සෞඛ්‍ය සේවා වෘත්තිකයන්, සමාජ සේවා, ජාතික සංඛ්‍යාලේඛන කාර්යාල, ආගමික සහ ප්‍රජා නායකයින් ඇතුළු අදාළ පාර්ශ්වකරුවන්ගෙන් උපදෙස් ලබා ගන්න.
විධිවිධාන	• කාන්තාවන්ට එරෙහි හිංසනය එහි පුළුල්ම ආකාරයෙන් (ශාරීරික, ලිංගික, චිත්තවේගීය සහ ආර්ථික ප්‍රචණ්ඩත්වය ආවරණය කරමින්) සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලව නිර්වචනය කරන්න. ඒ අනුව නීතිවල පහත සඳහන් විශේෂ විධිවිධාන අඩංගු විය යුතුය. ලිංගික හිරිහැර, පවුල තුළ සහ අන්තර් පුද්ගල සම්බන්ධතා තුළ විවිධ ආකාරයේ හිංසනයන් මෙන්ම විවිධ ආකාරයේ හිංසනයන් සඳහා විවිධ අවකාශයන් (උදා: පොදු අවකාශයන්, නිවාස, සේවා ස්ථාන, පාසල්, සයිබර් ප්‍රචණ්ඩත්වය) ආවරණය කිරීම. • විවිධ කාන්තා කණ්ඩායම්වලට වෙනස්කම් නොකිරීමේ විධිවිධාන සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඇතුළත් කිරීමේ විධිවිධාන සහිතව සියලුම කාන්තාවන් හට සමාන ආරක්ෂාව සලස්වන්න. • චාරිත්‍රානුකූල සහ/හෝ ආගමික නීති සහ අවිධිමත් සහ විධිමත් යුක්ති පද්ධතීන් අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. එම පටිපාටි දෙකම යටතේ ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ගේ අයිතිවාසිකම් එයට ඇතුළත් වේ.
ක්‍රියාත්මක කිරීම	• රජයේ (සහ සිවිල් සමාජයේ) විවිධ ක්‍රියාකාරීන් විසින් නීති සහ ප්‍රතිපත්ති පුළුල් සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් හෝ උපාය මාර්ගයක් ස්ථාපිත කිරීම. කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණ යාන්ත්‍රණ නිර්මාණය කිරීම එයට ඇතුළත් වේ. • නව නීති සහ ප්‍රතිපත්ති ව්‍යාප්ත කිරීමට සහ ප්‍රචලිත කිරීමට නිශ්චිත උපාය මාර්ගයක් සකස් කිරීම. සමාජභාවී අසමානතා සහ ප්‍රචණ්ඩත්වය පිළිගන්නා සමාජ සම්මතයන් මාරු කිරීම පටන් ගැනීමට සහ ක්‍රියාත්මක කිරීම යන දෙකටම මෙය වැදගත් වේ. • ඉදිරිපෙළ වැළැක්වීමේ සහ ප්‍රතිචාර සේවා ඇතුළුව, නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අයවැයක් වෙන් කරන්න. උදාහරණයක් ලෙස, සමාජභාවයට ප්‍රතිචාර දක්වන අයවැය හරහා (සම්පත් වෙන්කිරීම සාරාංශය බලන්න) • සෞඛ්‍ය සේවා වෘත්තිකයන්, පොලිසිය සහ අධිකරණ නිලධාරීන් ඇතුළු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දක්වන රාජකාරි කරන්නන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ පරිවර්තනයන් සිදුවන ආකාරය පිළිබඳ විශේෂිත හා අඛණ්ඩ පුහුණුව සහ ප්‍රොටෝකෝල ලබා දීමෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමට සහ සමාජභාවී සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට ආයතනික හැකියාව ගොඩනැගීම. මෙය ඵලදායී වීමට නම්, සමාජභාවී සමානාත්මතාව, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ හානිකර ආකල්ප සහ සම්මතයන් කෙරෙහි පුහුණුවේ අවධානය යොමු කළ යුතුය. දැනුම අලුත් කිරීමේ පුහුණුව සහ සේවය අතරතුර උපදේශනය ද වැදගත් වේ. • බේරුණු පුද්ගලයන්ට විවිධ අංශ (උදා: සෞඛ්‍ය, ආරක්ෂක, නීති, සමාජ සේවා) විසින් සපයනු ලබන සම්බන්ධීකරණය කරන ලද සත්කාර සහ සහාය සේවා වෙත ප්‍රවේශ විය හැකි බව සහතික කරන්න. ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන කාන්තාවන්ට තොරතුරු සහ සහාය සැපයීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක දුරකථන උපකාරක සේවා සහ ආරක්ෂිත නිවාස පහසුකම් ලබාගැනීමේ හැකියාව ද වැදගත් වේ. • නීති ආධාර, විශේෂිත උසාවි හෝ පටිපාටි ඔස්සේ, විශේෂයෙන් පුහුණු වූ විනිසුරුවරුන් සහිත උසාවි සහ වෙනත් යාන්ත්‍රණයන් ආදිය හරහා බේරුණු පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන යුක්තිය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම.
අධීක්ෂණය	• පැහැදිලි ප්‍රතිඵල, දර්ශක සහ පසුකළ යුතු මංසළකුණු සහිත නව නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අධීක්ෂණ සහ වගවීමේ රාමුවක් සකස් කිරීම. • ආයතනික යාන්ත්‍රණ හරහා නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම. උදාහරණයක් ලෙස, බහු-ආංශික කාර්ය සාධක බලකායන්, කමිටු, ජාතික වාර්තාකරුවන් හෝ නිරීක්ෂණාගාර පිහිටුවීම මගින්. • වාර්තා කිරීමේ සෙවණැලි යාන්ත්‍රණයන් පිහිටුවීමට සිවිල් සමාජ ක්‍රියාකරුවන් සහ කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට හැකිය. ප්‍රගතිය අධීක්ෂණය කර, වැඩිදුර වෙනස්කම් සඳහා උද්දේශනය කළ හැකිය.

රටක උදාහරණයක්: බ්‍රසීලය

බ්‍රසීලයේ Maria de Penha Law නීතිය ඓතිහාසිකය. සැමියාගේ ප්‍රහාරයකින් දෙපා පණ නැති තත්වයකට පත්වූ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියකගේ නමින් එය නම්කර තිබේ. 2006 දී පණවන ලද එම නීතිය කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ හිංසනයට එරෙහිව සටන් කරන පළමු බ්‍රසීලියානු ෆෙඩරල් නීතිය විය. එමගින් ගෘහස්ථ සහ පවුල් ප්‍රචණ්ඩත්වයේ ආකාර නිර්වචනය කරන අතර 60,000 කට වැඩි ජනගහනයක් සිටින නගරවල ගෘහස්ථ හා පවුල් ප්‍රචණ්ඩත්වය සඳහා දැඩි දඬුවම් පැණවීමේ බලය සහිත විශේෂ උසාවි, කාන්තා පොලිස් ස්ථාන සහ කාන්තාවන් සඳහා පැය 24 පුරා ආරක්ෂිත නිවාස ඇතුළු වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණ මාලාවක් නිර්මාණය කර ඇත. නීතිය ක්‍රියාත්මක වන්නේ කොහිදීද සහ කෙසේද යන්න සොයා බැලීම සඳහා කාන්තාවන්ගේ නායකත්වයෙන් නිරීක්ෂණාගාරයක් ද[31] ස්ථාපිත කරන ලදී. සමීක්ෂණ මගින් පෙන්නුම් කරන පරිදි සියලුම බ්‍රසීලියානුවන් පාහේ (98%) මෙම නීතිය ගැන අසා තිබේ. බොහෝදෙනාට (66%) එහි අරමුණ සහ ක්‍රියාකාරිත්වය හුරුපුරුදුය.[32] කෙසේ වෙතත්, කායික ප්‍රචණ්ඩත්වයේ වැඩිවීමක් සහිත මිශ්‍ර ප්‍රතිචාර වාර්තා විය., දැනුවත් කිරීම සහ වාර්තා කිරීම වැඩි වීම නිසා ද මෙය සිදුවිය හැකිය.[33] වඩා මෑත කාලයේ 2015දී, බ්‍රසීලය විසින් සමාජභාවය සමග සම්බන්ධව කාන්තාවන් ඝාතනය කිරීම පැහැදිලිව නිර්වචනය කිරීමට සහ වැරදිකරුවන්ට වසර 30 දක්වා සාපරාධී දඬුවම් වැඩි කිරීමට ස්ත්‍රී ඝාතන නීතියක් සම්මත කළේය.

අමතර මූලාශ

Handbook for Legislation on Violence against Women: United Nations Division for the Advancement of Women in the Department of Economic and Social Affairs (DESA/DAW). 2010 කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම, අපරාධකරුවන්ට දඬුවම් කිරීම සහ බේරුණු පුද්ගලයන්ගේ අයිතිවාසිකම් තහවුරු කරන නීති සම්මත කර ගැනීමට සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා සවිස්තරාත්මක මග පෙන්වීමක් සපයයි.

Protecting Women from Violence - Bridging the Implementation Gap Between Law and Practice: Global Indicators Group. 2019. Women, Business and the Law දත්ත කට්ටලය මත පදනම්ව, නීති ක්‍රියාත්මක කිරීමේදී සහ කාන්තාවන් ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීමේදී පවතින අඩුපාඩු මෙම සාරාංශයෙන් හඳුනාගනු ලැබේ.

Do our Laws Promote Gender Equality? A Handbook for CEDAW-based Legal Reviews: CEDAW. 2012. මෙම අත්පොත ජාතික නීති CEDAW සමග අනුකූල වීම තක්සේරු කිරීම සඳහා රාමුවක් ඉදිරිපත් කරයි. මූලික වශයෙන් අග්නිදිග ආසියාවේ වෘත්තිකයන් සඳහා ඉලක්ක කර ඇතත්, එය වෙනත් කලාපවල ද භාවිතා කළ හැකිය.

Women, Business and the Law. The World Bank. මෙම වාර්ෂික වාර්තා මගින් කාන්තාවන් ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීම ඇතුළු දර්ශක පරාසයක් ආවරණය කරමින් රටවල් 173 කින් සංසන්දනාත්මක ගෝලීය නිරීක්ෂණ දත්ත සපයයි.

Virtual Knowledge Centre legislation module. UN Women. ජාතික නීති කෙටුම්පත් කිරීම, ඒවා වෙනුවෙන් පෙනී සිටීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ උපදෙස් සපයයි.

VAWG Resource Guide: Citizen Security, Law and Justice Brief: The World Bank. 2015. මෙම සාරාංශය විසින් පුරවැසි ආරක්ෂාව, නීතිය සහ යුක්තිය සමග කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනා ගනී.

සම්පත් වෙන්කරන්න

ප්‍රතිඵලය: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වැඩසටහන්, පර්යේෂණ සහ ආයතන ශක්තිමත් කිරීම සඳහා සහ සෞඛ්‍යය, අධ්‍යාපනය, නීතිය ක්‍රියාත්මක කිරීමේ සහ සමාජ සේවා අංශවල හැකියාවන් වර්ධනය කිරීම සඳහා සම්පත් වෙන් කිරීම.

අරමුණ: කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීම සහ එයට ප්‍රතිචාර දැක්වීම සඳහා ඵලදායී මැදිහත්වීම් සිදුකිරීම සඳහා පර්යේෂණ, නවෝත්පාදන, වැඩසටහන් සහ සේවා සඳහා වැඩියෙන් සහ තිරසාර ලෙස ආයෝජනය කිරීම.

තාර්කිකත්වය: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සක්‍රිය පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ජාතික සහ පළාත් පාලන ආයතන විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා කැප වූ මූල්‍ය හා මානව සම්පත් ආයෝජනය කිරීම අවශ්‍ය වේ. නිශ්චිත වැළැක්වීමේ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ සහ දත්ත රැස් කිරීම, නීතිමය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා සහ රජයේ ආයතන, සේවා සහ සිවිල් සමාජ හවුල්කරුවන්ගේ දිගුකාලීන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා අරමුදල් අවශ්‍ය වේ. පහත දැක්වෙන අංශ හා පද්ධති තුළදී ද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට ප්‍රමුඛතාව හා සම්පත් ලබාදිය යුතුය. සෞඛ්‍යය, අධ්‍යාපනය, නීතිය බලාත්මක කිරීම සහ සමාජ සේවා අංශ ඇතුළුව ඒවාට පමණක් සීමා නොවී අනෙකුත් අංශ සහ පද්ධති හරහා එසේ කළ යුතුය. ආයතනවල සමාජභාවී පදනම්න් සිදුවන වෙනස්කොට සැලකීම් විසඳීමට සහ ආයතනික ධාරිතාව ගොඩනැගීමට සම්පත් වෙන් කිරීම ද සක්‍රිය පරිසරය ශක්තිමත් කිරීම සඳහා ඉතා වැදගත් වේ.

ගෝලීය වශයෙන්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ආයෝජනවල වර්ධනයක් සිදුවී ඇත. කෙසේ වෙතත්, අරමුදල් බොහෝ විට අක්‍රමවත් වන අතර අභියෝග යේ පරිමාණයට නොගැලපෙන කුඩා පරිමාණ ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කරයි. ජාතික මට්ටමේදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා වගකිව යුතු රජයේ අමාත්‍යාංශ සතුව බොහෝ විට තිබෙන්නේ කුඩාම අයවැයකි. එබැවින් බොහෝ දුරට අවධානය යොමු කර තිබෙන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රතිචාර සේවා සඳහා මිස වැළැක්වීම සඳහා නොවේ. එබැවින් එමගින් සහාය ලැබෙන්නේ ප්‍රචණ්ඩත්වයට ලක්වී සිටින හෝ අවදානමට ලක්ව සිටින කාන්තාවන්ගෙන් සුළුතරයකට පමණි.[34]

වැළැක්වීමේ ඵලදායි ආකෘතීන් ඉහළ නැංවීමට සහ නව ප්‍රවේශයන් සහ මැදිහත්වීම් අලුතින් නිර්මාණය කිරීමට සහ සංවර්ධනය කිරීමට ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීමේ අවශ්‍යතාවක් පවතී.



පසුගිය පස්වසර තුළදී, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා එක්සත් ජනපද ඩොලර් බිලියන 2.042ක් වෙන්කර ඇති බව තක්සේරු කර තිබේ. එය වසරකට ඩොලර් මිලියන 408කි. කෙසේ වෙතත් මෙය වාර්ෂික වාර්ෂික නිල සංවර්ධන සහායෙන් (ODA) 0.002%ට අඩුය.[35]

ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ප්‍රමුඛ සලකාබැලීම්: පහත දැක්වෙන්නේ ජාතික ප්‍රතිපත්ති සම්පාදකයන් සහ ඔවුන්ගේ අරමුදල් සහකරුවන් සඳහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සම්පත් වෙන්කිරීමේදී වැදගත් වන සලකාබැලීම් කීපයකි.[36]

මූලික සලකාබැලීම්	විස්තර
මූලෝපායික හා සාක්ෂි මත පදනම් වූ එළඹුම	• නිශ්චිත වැළැක්වීමේ ඉලක්ක / ප්‍රතිඵල හඳුනාගෙන ඒවා සහ ඒවායේ සම්පත්වලට අදාළ ඇඟවුම් සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ග කීපයක් සලකා බලන්න. උදා: » කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධයෙන් ප්‍රගතියක් අත්පත් කරගැනීම සඳහා පවතින අවස්ථා සහ පිවිසුම් ස්ථාන හඳුනා ගැනීම. උදා: කලාපීය මුලපිරීම්, නව හවුල්කාරිත්වයන්, සමාජ පරිවර්තන, සේවා විමධ්‍යගත කිරීම. » ඔබගේ ජාතික සන්දර්භය තුළ දැනටමත් පරීක්ෂා කර, ඵලදායී බව ඔප්පු කර ඇති මැදිහත්වීම් පුළුල් කිරීම සලකා බලන්න. මැදිහත්වීම් වඩා හොඳින් අනුවර්තනය කර පුළුල් කරගන්නේ කෙසේද යන්න තේරුම් ගැනීම සඳහා වැඩසටහන් නිර්මාණකරුවන්, ක්‍රියාත්මක කරන්නන් සහ පර්යේෂකයන් සමග සාකච්ඡා කරන්න.

යෝග්‍ය වාතාවරණය

මූලික සලකාබැලීම්	විස්තර
	කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මැදිහත්වීම් පුළුල් කරන ආකාරය පිළිබඳ උපදෙස් Community for Understanding Scale Up (CUSP) සහ ALiGN platform වෙතින් ලබාගත හැකිය. » ඔබගේ ජාතික හෝ ප්‍රාදේශීය සන්දර්භයන් තුළ ක්‍රියාත්මක කිරීමෙන් ඵලදායී බව ඔප්පු වූ වැළැක්වීමේ ප්‍රවේශයන් අනුරූප කරගැනීම සලකා බලන්න. මේ සඳහා වැළැක්වීමේ තාක්ෂණික විශේෂඥතාව සහ ශක්තිමත් සන්දර්භීය දැනුම යන දෙකම අවශ්‍ය වේ. » සාක්ෂි මත පදනම් වූ මූලපිරුම් අනුරූප කරගැනීම පිළිබඳ උපදෙස් What Works to Prevent VAWG වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.[37] » අඩු සම්පත් ප්‍රමාණයකින් වැඩි බලපෑමක් ඇති කිරීමට තිබෙන අවස්ථා හඳුනා ගැනීම. උදාහරණයක් ලෙස දැනට කරගෙන යන මූලපිරීම් සඳහා එළඹුම් ඒකාබද්ධ කිරීම හෝ අංශ තුළ සහ අංශ හරහා වැඩ කිරීම.
සම්පත් සැලසුම් කිරීම	• වැළැක්වීමේ මැදිහත්වීමක් සඳහා අවශ්‍ය නිශ්චිත යෙදවුම් හඳුනා ගන්න. උදා: ස්ථාවර වියදම් (වේතන්, ගොඩනැගිලි, උපකරණ, වාහන), සංවර්ධන වියදම් (වේතන්, පුහුණුව, අත්පොත්), සහ වඩාත් නම්‍යශීලී වියදම් (වේතන්, කාර්ය මණ්ඩලය, සැපයුම්, වාහන/ගොඩනැගිලි නඩත්තු කිරීම)[38] • විවිධ යෙදවුම්වල පිරිවැය ගණනය කරන්න. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ විවිධ මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමේදී කෙතරම් වියදමක් යන්නේදැයි ගණනය කිරීමේදී guidelines for conducting cost analyses වෙතින් උපදෙස් ලබාගන්න. විවිධ සංදර්භයන්හිදී වැළැක්වීමේ වැඩසටහන්වලට යන පිරිවැය සන්සන්දනය කරන්න. • අවශ්‍ය නම් වෙනත් මූලාශ්‍රවලින් සම්පත් බලමුළුගැන්වීම සඳහා සැලැස්මක් සකස් කිරීම. උදා: රාජ්‍ය/පෞද්ගලික හවුල්කාරිත්වයන්, පරිත්‍යාගශීලීන්ගේ පරිත්‍යාග සහ ජාත්‍යන්තර ආධාරකරුවන්.[39] • ආධාරකරුවන් වෙතින් අරමුදල් ලබාගැනීමට ඉලක්ක කරන්නේ නම්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ආයෝජනය කිරීමේ වැදගත්කම පෙන්වාදෙන්න. ප්‍රචණ්ඩත්වයේ ආර්ථික හා සමාජීය පිරිවැය අවධාරණය කිරීම සඳහා අවශ්‍ය සම්පත් කිහිපයක් පහත දැක්වේ (DFID-funded What Works study on the impact of VAW on national economies and society in Ghana, South Sudan and Pakistan.
සම්පත් වෙන්කිරීම	• බහු පාර්ශ්වකරුවන් සහභාගී වන වැළැක්වීමේ උපාය මාර්ග සංවර්ධනය කිරීමට සහ ඒවායේ හිමිකාරිත්වය ගොඩනැගීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීම සඳහා බහුවාර්ෂික අරමුදල් චක්‍රයක් භාවිතා කරන්න. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් සැලසුම් කිරීම, අනුරූප කරගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පාලන හා සම්බන්ධීකරණ ව්‍යුහයන් ක්‍රියාත්මක කරන්න. • කාන්තා අයිතිවාසිකම් සංවිධාන හවුල්කරුවන් සහ ක්‍රියාත්මක කරන්නන් ලෙස සලකා අරමුදල් සපයන්න. කාන්තා අයිතිවාසිකම් සංවිධාන සඳහා සහාය වන්නේ සහ ආයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනගැනීමට මීට පෙර කොටස බලන්න. • උපාය මාර්ග, මැදිහත්වීම් සහ සේවාවන් ඔබේ සන්දර්භයට අනුවර්තනය කරගැනීම, ඒවායේ කාර්යක්ෂමතාව මෙන්ම ඕනෑම අනපේක්ෂිත ප්‍රතිවිපාකයක් නිරීක්ෂණය කිරීම සහ වැළැක්වීමේ සාක්ෂි පදනම ගොඩනැගීම සඳහා ප්‍රමාණවත් පර්යේෂණ, නියාමනයන් සහ අධීක්ෂණය සඳහා සම්පත් යොදවන්න. • වැඩසටහන් / ව්‍යාපෘති මට්ටමින්, දිගු කාලීන අරමුදල් සහතික කිරීම. උදාහරණයක් ලෙස, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් සඳහා වසර 1-2 කෙටිකාලීන ව්‍යාපෘති චක්‍ර සාර්ථක නොවන බවට සැලකිය යුතු තරම් සාක්ෂි තිබේ.[40] සංවර්ධනාත්මක පර්යේෂණ, මැදිහත්වීම් සැලසුම් / අනුවර්තනය සහ ධාරිතා සංවර්ධනය සඳහා කල් අවශ්‍ය වේ. ප්‍රමුඛ කාර්ය මණ්ඩලය ප්‍රවේශමෙන් තෝරා ගැනීමට සහ පුහුණු කිරීමටත්, අඛණ්ඩ සහාය සහ උපදේශනය සැපයීමටත් ප්‍රමාණවත් කාලය සහ අයවැය අවශ්‍යය.[41] • මැදිහත්වීමක් අවසන් වූ පසු, තිරසාරභාවය සඳහා සැලසුම් කරන්න. වෙනස්කම් පවත්වා ගැනීම සඳහා අර්ථවත් නායකත්වය සහ ප්‍රජාවන් තුළ හිමිකාරිත්වය එයට අයත් වේ.[42]
සම්පත් අධීක්ෂණය	• අදාළ රාජ්‍ය දෙපාර්තමේන්තු වෙත අරමුදල් ලැබෙන බව සහතික කිරීම සඳහා අරමුදල් බෙදාහැරීම් නිරීක්ෂණය කිරීම සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාකාරකම් උදෙසා වියදම් කිරීම. • ආධාරකරුවන්ට, කාන්තා අයිතිවාසිකම් සංවිධාන / සිවිල් සමාජය අරමුදල් ඵලදායී හා කාර්යක්ෂම ලෙස භාවිතා කරන්නේදැයි තක්සේරු කිරීමේ හැකියාව ඇතිවන පරිදි සම්පත් භාවිතයේ විනිවිදභාවය තහවුරු කරන්න. ආයෝජනය අඩු වියදම් එකක් බවට පත්නොවී, පිරිවැයට සාපේක්ෂව දීර්ඝකාලීනව ඵලදායීද යන කරුණ කෙරෙහි අවධානය යොමුකරන්න.

රටක උදාහරණයක්: VicHealth, Australia[43]

ඕස්ට්‍රේලියාවේ, වික්ටෝරියා ප්‍රාන්තය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සමස්ත රජයේ එළඹුමක් වර්ධනය කිරීමට නායකත්වය දී ඇත. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීමේ කාර්යය, National Plan to Prevent Violence aganst Women and their Children 2010-2022 සංවර්ධනය කිරීම සහ ඉන් අනතුරුව 'Change the Story' ජාතික වැළැක්වීමේ රාමුව (2015) මෙයට ඇතුළත් කර ඇත. පළාත්, ප්‍රාදේශීය සහ රාජ්‍ය මට්ටමින් නායකත්වය, පාලනය සහ සම්බන්ධීකරණය සඳහා ආයෝජනය කර තිබේ. දිගුකාලීන ක්‍රියාත්මක කිරීම් සහ පර්යේෂණ සඳහා කැපවූ අරමුදල් වෙන් කිරීම ද සිදු කර තිබේ. ANROWS (Australia's National Research Organisation for Women's Safety) නිර්මාණය කිරීම සහ ඒ සඳහා කැපවුණු OurWatch අරමුදලට ආයෝජනය කිරීම ඒ අතර තිබේ.

රටක උදාහරණයක්: දකුණු අප්‍රිකාව[44]

2018 නොවැම්බරයේදී, දකුණු අප්‍රිකානු ජනාධිපති රැම්ෆෝසා විසින් National Gender-based Violence and Femicide Summit සහ ඉන් අනතුරුව National Strategic Plan කැඳවන ලදී. අයවැය ප්‍රමුඛතාවන් නැවත සැකසීම මත පදනම්ව, සැලැස්ම සඳහා රජය ZAR බිලියන 1.6 (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 92) වෙන්කරන ලදී. සැලැස්මේ දැක්වෙන වඩා පුළුල් ජාතික ප්‍රමුඛතා අනුව ආයෝජන පෙළගැස්වීම සඳහා පෞද්ගලික අංශය, සංවර්ධන හවුල්කරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගෙන් ලබාගත් දායකත්වයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ බහුආංශික අරමුදලක් ද පිහිටුවන ලදී. සම්පත් වෙන් කිරීම ඇතුළු සැලැස්ම ක්‍රියාත්මක කිරීම මෙහෙයවන මෙහෙයුම් කමිටුව ජනාධිපති කාර්යාලයේ පිහිටා ඇති අතර සිවිල් සමාජ සංවිධාන සහ රජය විසින් එහි සම සභාපතිත්වය දරනු ලැබේ. මෙම සැලැස්ම විසින් වැළැක්වීමේ වැඩසටහන් සඳහා සම්පත් වෙන්කරනු ලැබේ. එසේම, අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතිය ශක්තිමත් කිරීම සිදුකරමින් සියලු වයස්, ස්ථාන, ආබාධිත, ලිංගික දිශානතිය, ලිංගිකභාවය සහ සමාජභාවය, ජාතිකත්වය සහ වෙනත් කාරණා සම්බන්ධ විවිධත්වයන් සහිත පුද්ගලයන්ට වඩා හොඳ ආරක්ෂාවක් ලබාදෙයි.

අමතර මූලාශ

Handbook of National Action Plans on Violence against Women UN Women. 2012. අයවැය පිළිබඳ 3.6 පරිච්ඡේදය විවිධ රටවල සන්දර්භයන්හිදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය කටයුතු සඳහා අරමුදල් සපයා ඇති ආකාරය පිළිබඳ උදාහරණ සපයයි.

Global scoping of advocacy and funding for the prevention of violence against women and girls Equality Institute. 2019. මෙම පරාසකරණ අධ්‍යයනය ජාත්‍යන්තර මට්ටමින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කටයුතු සඳහා ආධාර සපයන ප්‍රධාන පරිත්‍යාගශීලීන් සහ අරමුදල් රටා පිළිබඳ විශ්ලේෂණයක් සපයයි.

Guidelines for Conducting Cost Analyses of Interventions to Prevent Violence against Women and Girls in Low and Middle Income Settings. What Works to Prevent VAWG Programme. 2019. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මැදිහත්වීම් පිරිවැය සැකසීම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශයක් සපයයි. ඔබේ මැදිහත්වීම ලබාදීම සඳහා ඔබට අවශ්‍ය නිශ්චිත සම්පත් හඳුනාගැනීමට සහ මෙම සම්පත්වලට වටිනාකමක් ලබා දෙන්නේ කෙසේද යන්න හඳුනා ගැනීමට ඔබට උපකාර කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ සැලසුම් කර ඇත.

පසු සටහන

[1] Alexander-Scott, M. Bell, E. and Holden, J. (2016) DFID Guidance Note: Shifting Social Norms to Tackle Violence Against Women and Girls (VAWG). London: VAWG Helpdesk

[2] Jewkes, R. et al. (2019) Community activism approaches to shift harmful gender attitudes, roles and social norms. Pretoria: What Works.

[3] ජාතික මට්ටමින් තත්ත්ව විශ්ලේෂණයක් සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩිදුර මග පෙන්වීම සඳහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කළ ජාතික උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා වැඩපොතේ පියවර 1 බලන්න.

[4] Georgia, T. (2015) DFID Guidance Note on Addressing Violence Against Women and Girls (VAWG) Through DFID's Economic Development and Women's Economic Empowerment Programmes – Part B, London: VAWG Helpdesk; What Works to Prevent VAWG Programme (2020) 'Economic and Social Costs of Violence: Evidence Brief' Pretoria: What Works.

[5] Weldon, S.L. and Htun, M. (2012) 'Feminist mobilisation and progressive policy change: why governments take action to combat violence against women', in Gender & Development 21 (2).

[6] V4C Nigeria (2017) Thinking and Working Politically for Legal Reform on Gender Equality. Abuja: V4C

[7] Fraser, E and Wood, S (2018) VAWG Legislation, Helpdesk Research Report No. 156. London, UK: VAWG Helpdesk.

[8] E.g. in this one in West Africa; Gambia; Malawi; and Namibia

[9] See UN Women (2019) The Big Conversation. Handbook to Address Women against Women in and through the Media. Geneva.

[10] Kerr-Wilson, A.; Gibbs, A.; McAslan Fraser E.; Ramsoomar, L.; Parke, A.; Khuwaja, HMA.; and Rachel Jewkes (2020). A rigorous global evidence review of interventions to prevent violence against women and girls, What Works to prevent violence among women and girls global Programme, Pretoria, South Africa

[11] Bishop, K and McLean, L (2017) Ibid.

[12] Weldon, S.L. and Htun, M. (2012) 'Feminist mobilisation and progressive policy change: why governments take action to combat violence against women', in Gender & Development 21 (2).

[13]13 Womankind (2017) Standing with the changemakers: lessons from supporting women's movements. Womankind Worldwide.

[14] ActionAid (2020) Women's Rights Organizations Challenging Violence. ActionAid UK.

[15] Womankind Worldwide (2017) Ibid.

[16] Moosa, Z. and Daly, S. (2015) Ibid. ; Esplen, E. (2016) Ibid.

[17] Esplen, E. (2016) Ibid.

[18] AWID (2019) Ibid.

[19] Esplen, E. (2016) Ibid.

[20] Nagarajan, C and Fraser, E (2016) Supporting a healthy WRO/CSO sector working on VAWG (and related gender outcomes) at the national/ large sub-national level, VAWG Helpdesk Research Report No. 122. London, UK: VAWG Helpdesk.

[21] Womankind Worldwide (2017) Ibid.

[22] Esplen, E. (2016) Ibid.

[23] Esplen, E. (2016) Ibid.

[24] මෙයට නීති සහ ප්‍රතිපත්ති ඇතුළත් වේ. ඒවා නම්, ලිංගික අපයෝජන අපරාධයක් බවට පත්කිරීම, උරුමයේ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම, ළමා විවාහ සහ කාන්තා ලිංගේන්ද්‍රිය විකෘති කිරීම තහනම් කිරීම, කාන්තාවන් සඳහා සමානාත්මතාවය සහතික කරන විවාහ, භාරකාරත්වය සහ දික්කසාද නීති, සමාජභාවී සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය විසඳීම සඳහා ක්‍රියාකාරී සැලසුම්, අත්අඩංගුවට ගැනීමේ නියෝග සහ නීති ආධාර වැනි යුක්තිය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ සේවාවන් ක්‍රියාත්මක කිරීම ආදියයි.

[25] World Bank (2020) Women, Business and the Law 2020, Washington D.C.: World Bank.

[26] Amaral, Sofia (2017) "Do Improved Property Rights Decrease Violence Against Women in India?" Institute for Social and Economic Research. Available at SSRN: https://ssrn.com/abstract=2504579. For a summary see https://prevention-collaborative.org/wp-content/uploads/2018/11/Study-summary-Inheritance-India-FINAL.pdf

[27] Abramsky T, Watts C, Garcia Moreno C, et al. (2011) What factors are associated with recent intimate partner violence? Findings from the WHO multi-country study on women's health and domestic violence. Biomed Central Public Health; 11(109): 1-17.

[28] Heise, L. (2011) What Works to Prevent Partner Violence: An Evidence Overview.

[29] කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ජාතික නීති සහ ප්‍රතිපත්ති සම්මත කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සවිස්තරාත්මක මගපෙන්වීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ නීති සම්පාදනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ අත්පොතෙහි සොයාගත හැකිය.

[30] ප්‍රධාන සම්පත් මංජුසාවේ අවධාරණය කරන ලද සාක්ෂි මත පදනම් වේ.

[31] Observatório Lei Maria da Penha (Maria de Penha observatory consortium - OBSERVE)

[32] Gattegno, M, Wilkins, J and Evans, D (2016) 'The relationship between the Maria de Penha Law and intimate partner violence in two Brazilian states', International Journal of Equity and Health, 15: 138.

[33] Gattegno, M, Wilkins, J and Evans, D (2016) Ibid.

[34] Equality Institute (2019) Global scoping of advocacy and funding for the prevention of violence against women and girls

[35] Equality Institute (2019) Ibid.

[36] Based on lessons from evidence highlighted in the Key Resources box

[37] Including VAW prevention curricula, a rigorous evidence review, and effective design and implementation elements in VAW interventions.

[38] The What Works to Prevent VAWG research programme has conducted the first ever substantial multi-country body of evidence on the impact and cost effectiveness of preventing VAW. The research found that staff costs make up a sizeable portion of costs in VAW prevention interventions and that type and intensity of interaction between staff and beneficiaries is therefore the key cost driver for VAW prevention. See: Torres-Rueda, S., Ferrari, G., Orangi, S., Hitimana, R., Daviaud, E., Tawaih, T., et al (2020) What will it cost to prevent violence against women and girls in low- and middle-income countries? Evidence from Ghana, Kenya, Pakistan, Rwanda, South Africa and Zambia, Health Policy and Planning, czaa024.

[39] For an overview of key donors, see the Equality Institute's (2019) Global scoping of advocacy and funding for the prevention of violence against women and girls

[40] What Works to Prevent VAWG global research programme / Equality Institute (2019)

[41] Jewkes, R., Willan, S., Heise, L., Washington, L., Shai, N., Kerr-Wilson, A, Christofides, N. (2020) Effective design and implementation elements in interventions to prevent violence against women and girls. What Works To Prevent VAWG? Global Programme Synthesis Product Series. South African Medical Research Council, Pretoria

[42] Goldmann, L., Lundgren, R., Welbourn, A., Gillespie, D., Bajenja, E., Muvhangom, L. & Michau, L. (2019) On the CUSP: the politics and prospects of scaling social norms change programming, Sexual and Reproductive Health Matters, 27:2, 51-63.

[43] See https://www.vichealth.vic.gov.au/-/media/ResourceCentre/PublicationsandResources/PVAW/Violence-Against-Women-Research-Overview.pdf

[44] Letter from President Ramaphosa to South Africans: https://www.sabcnews.com/sabcnews/president-ramaphosa-personally-responsible-gender-violence-action-plan/

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT** **ව්‍යුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women and Social Development Direct (2020) RESPECT Framework Strengthening the Enabling Environment for VAW Prevention.

RESPECT

WOMEN

ජාතික සැලැස්ම මාර්ගෝපදේශය හා වැඩපොත

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා කැපකර තිබේ

UN WOMEN

World Health Organization

ජාතික සැලැස්ම මාර්ගෝපදේශය හා වැඩපොත:

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා කැපකර තිබේ

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සාක්ෂි මත පදනම් වූ එළඹුමක් ප්‍රකාශයට පත්කිරීම සඳහා ජාතික හා උප ජාතික ක්‍රියාවලිවලදී අවශ්‍ය ප්‍රායෝගික පියවර අමාත්‍යාංශ හවුල්කරුවන් ඇතුළු එක්සත් ජාතීන්ගේ කාර්යමණ්ඩලය ඇතුළු ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත ජාතික සැලැස්ම මාර්ගෝපදේශය හා වැඩපොත විසින් සපයනු ලැබේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමේ සම්ප්‍රදායික ප්‍රයත්නයන් විසින් බොහෝවිට අවධානය යොමුකරනු ලබන්නේ ව්‍යවස්ථාදායක සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ, බහු පාර්ශ්වීය සේවාවන් වෙත සම්බන්ධීකරණය කරන ලද ප්‍රවේශය සහ වැඩිදියුණු කරන ලද සම්පාදනයන් සහ වඩා යහපත් අන්දමින් දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය සහ භාවිතා කිරීම කෙරෙහිය. මේවා පරිපූර්ණ එළඹුමකදී අතිශය වැදගත් වේ. එහෙත්, ඒවා මුල් අවධියේදී ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා අවශ්‍ය ඉලක්ක ආයෝජන නොවේ. පසුගිය දශකය පුරාම, අතිවිශාල සාක්ෂි සම්භාරයක් එක්රැස් කර ගෝලීය ව්‍යුහයන් තුළ ඉදිරිපත් කර තිබේ. වැළැක්වීම කළහැක්කක් බව සහ ඒ සඳහා ඔප්පු කරන ලද උපායමාර්ග තිබෙන බව එමගින් නිරූපණය කෙරේ.

මෙම මාර්ගෝපදේශය හා වැඩපොත පදනම් වන්නේ වැළැක්වීම සඳහා වන ගෝලීය ව්‍යුහය මතය. එයට එක්සත් ජාතීන්ගේ වැළැක්වීමේ රාමුව (2015) සහ එහි ඊළඟ අදියරයන් ද, RESPECT Women Framework (2019) ද අයත් වේ. එහි අරමුණ වන්නේ, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දුරලීමේ ඇපකැපවීම ඌනපූරණය කිරීම සඳහා වැළැක්වීම සඳහා නිශ්චිත වූ ජාතික සහ උප ජාතික සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා කැපවූ සැලැස්මක් සංවර්ධනය කිරීමට උපකාර කිරීමයි.[1] පරිපූර්ණ ජාතික සැලැස්ම වෙනුවට ආදේශ වීම එහි අරමුණ වන්නේ නැත. ඒ වෙනුවට එමගින් කරනු ලබන්නේ වැළැක්වීමේ සාධකය ජාතික සහ උප ජාතික සංදර්භයට ගැලපෙන පරිදි විස්තර කිරීම මගින් එය ඌනපූරණය කිරීමයි. මාර්ගෝපදේශය හා වැඩපොත යනු පුළුල් තාක්ෂණික සම්පත් හා මෙවලම් පැකේජයක කොටසකි. ඒවා සකස් කර තිබෙන්නේ RESPECT Women Framework ක්‍රියාත්මක කිරීම සඳහාය.

1 පියවර: වැළැක්වීමේ රාමුවලට හුරුපුරුදු වීම

RESPECT Women: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම විසින් සාක්ෂි මත පාදක වූ මූලෝපාය හඳුනාගැනීම සඳහා භාවිතයට පහසු රාමුවක් පිරිනමනු ලැබේ. එම මූලෝපාය විසින් ප්‍රචණ්ඩත්ව වැරදි කිරීමේ සහ වින්දිතභාවයට පත්වීමේ අවදානම් අවම කරනු ලැබේ. එසේම, වින්දිතභාවයට පත්වීමෙන් සහ වැරදි කිරීමෙන් ආරක්ෂා කරන්නන්ට තිබෙන අවදානම ද අවම කරනු ලැබේ. මෙම රාමුව පදනම් වන්නේ, ඇගයීම්වලින් සහ විධිමත් සමාලෝචනයන්ගෙන් උකහාගන්නා ලද ගෝලීය තොරතුරු සහ දැනුම එකතුව මතය. එම දැනුම එකතුව විවිධ රටවල සහ සංදර්භයන්ගේ මූලපිරුම් පරාසයක් ආවරණය කරයි. RESPECT Women Framework විසින් මනා පසුබිමක් සහ ජාතික මට්ටමේදී වැඩිදුර අධ්‍යයනය කළ යුතු අන්තර්ගතයන් සහ ගැටලු සපයනු ලැබේ. RESPECT රාමුවෙහි ඉදිරිපත් කර තිබෙන ඇතැම් සාධක විශ්වීය වේ. ඒවා ඔබගේ සංදර්භයන්ට ගැලපිය හැකිය. අනෙක් ඒවා සුවිශේෂ ජනවිකාස කණ්ඩායම් සහ සමාජ හා සංස්කෘතික සංදර්භයන් අනුව වෙනස් වේ. පිවිසුම් ස්ථානවල සහ සාක්ෂි පදනමෙහි සවිස්තර හැදෑරීමක් සඳහා ඔබට පහත දැක්වෙන ව්‍යුහය සමාලෝචනය කළ හැකිය: Framework to Underpin Action to Prevent Violence against Women (UN Prevention Framework).

කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ ගෝලීය ව්‍යුහයන්

UN Prevention Framework (2015) විසින් ප්‍රතිපත්ති සම්පාදකයන් සහ වැඩසටහන් සම්පාදකයන් හට මනා ලෙස සාක්ෂි මත පදනම් වූ මූලෝපායන් මූලාශ්‍රයක් සපයනු ලැබේ. එය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහි වැඩසටහන් සැලසුම් කර, ක්‍රියාත්මක කර, අධීක්ෂණය කර ඇගයීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට උපකාර වේ.

RESPECT Women Framework (2019) සම්පාදනය කරනු ලබන්නේ ඉහත සඳහන් කරන ලද සාක්ෂි මත පදනම් වූ මූලෝපාය අනුවය. එය ප්‍රතිපත්ති සම්පාදකයන්ට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැඩසටහන් සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට, අධීක්ෂණයට සහ ඇගයීමට උපකාර වේ.





2 පියවර: ක්‍රියාවලිය තුළ නිමග්න කරගනු ලබන ප්‍රධාන පාර්ශ්වකරුවන් තීරණය කිරීම

RESPECT Women Framework සමාලෝචනය කිරීමෙන් පසු, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩකරන ප්‍රධාන ආයතන හා ක්‍රියාකරුවන් හඳුනාගන්න. මීට පෙර පියවරවලදී ඉගෙනගත් දෙය මත පදනම්ව වැදගත් භූමිකාවක් ඉටුකිරීමේ වගකීම ඔවුන්ට තිබේ. ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර කාන්තා/ සමාජභාවී, සෞඛ්‍ය, අධ්‍යාපන, රැකියා, දිළිඳුභාවය හා තාරුණ්‍යය සමග සම්බන්ධ ආයතන මෙන්ම වෙනත් රාජ්‍ය ආයතනවල තාක්ෂණික කාර්යමණ්ඩලය, එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ක්‍රියාකරන සිවිල් සමාජය හෝ කාන්තා අයිතිවාසිකම් සංවිධාන නියෝජිතයන් ඇතුළත් විය හැකිය. එසේම, සම්ප්‍රදායික, සංස්කෘතික සහ ආගමික නායකයන් ද ප්‍රධාන පුද්ගල පාර්ශ්වකරුවන් අතර සිටිය හැකිය.

කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ෆීජි ක්‍රියාකාරී සැලැස්ම

කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සංවර්ධනය කරනු ලබන බව 2020දී ෆීජි රජය විසින් නිවේදනය කරන ලදී. ඒ අනුව එරට කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සමස්ත රජය විසින් ඇතුළත්කාරී, සාක්ෂි මත පදනම් වූ එළඹුමක් ලබාගත් (ඕස්ට්‍රේලියාව ද ඇතුළුව) ලොව රටවල් දෙක අතරින් එකක් බවට පත්විය. මෙම ක්‍රියාවලියට නායකත්වය ලබාදුන්නේ කාන්තා, ළමා සහ දිළිඳුකම දුරලීමේ අමාත්‍යාංශයයි. සෞඛ්‍ය හා වෛද්‍ය සේවා, අධ්‍යාපන, උරුමය සහ කලා සහ රැකියා, ඵලදායිතාව, කර්මාන්ත සම්බන්ධතා, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශ ආදිය එයට උපකාර කළහ. එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය, ෆීජි කාන්තා අර්බුද මධ්‍යස්ථානය, ෆීජි කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාරය, House of Sarah, Medical Services Pacific, Fiji Disabled People's Federation, Haus of Kameleon, DIVA සහ වෙනත් සංවිධාන වැදගත් පාර්ශ්වකරුවන් අතර වූහ.

බලන්න Joint Ministerial Press Release.

අදාළ පාර්ශ්වකරුවන් නිර්ණය කිරීම සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ දැනට සිටින ක්‍රියාකරුවන්ගේ විශ්ලේෂණයක් සිදුකරන්න. ඔවුන් දැනටත් වැළැක්වීම සඳහා ක්‍රියාකරමින් සිටිනවා විය හැකිය. නැතිනම්, එසේ කිරීමේ හැකියාව තිබෙන අය විය හැකිය. වැළැක්වීම සඳහා හඳුනාගෙන තිබෙන ක්‍රියාකරුවන් සහ ප්‍රවේශ ස්ථාන ලැයිස්තුවක් සඳහා බලන්න: RESPECT Strategy Summaries.

මූලෝපාය	හවුල්කාරිත්වය		
අපට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කුමන මූලෝපායද?	ඒ සඳහා අපට උපකාර කළ හැක්කේ කාටද?		ඔවුන් දැනට කරමින් සිටින දෙය මූලෝපාය සමග සම්බන්ධ වන්නේ කෙසේද?
	අංශය	ක්‍රියාකරුවන්	
උදාහරණ: ගෞරවනීය සම්බන්ධතා	අධ්‍යාපනය තරුණ ක්‍රීඩා	අධ්‍යාපන අමාත්‍යාංශය තරුණ සමාජ ජාතික ඔලිම්පික් කමිටුව	- අධ්‍යාපන අමාත්‍යාංශය පරිපූර්ණ ලිංගිකත්ව අධ්‍යාපනය සඳහා ඇපකැපවී සිටියි. - තරුණ සමාජ සක්‍රිය ලෙස සමාජභාවී සමානාත්මතාව වෙනුවෙන් පෙනීසිටින අතර ඒ වෙනුවෙන් ක්‍රියාමාලාවල යෙදෙයි. - පරම්පරා සමානාත්මතා මූලපිරුම සඳහා ක්‍රීඩා සමග ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ ජාතික කාර්යාලය එක්වී සිටියි. සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ හා එයට ප්‍රතිචාර දැක්වීමේ මූලපිරුම් එයට අයත් වේ.

3 පියවර: ආයතනික දත්ත සමාලෝචනයක් මෙහෙයවන්න. රටෙහි කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ අවබෝධය ග්‍රහණය කරගැනීම සඳහා උපදෙස් විමසීමක් සිදුකරන්න

RESPECT Women Framework පදනම් වන්නේ, විවිධ රටවල සහ සංදර්භයන්ගේ මූලපිරුම් පරාසයක ඇගයීම් සහ විධිමත් සමාලෝචනයන් මගින් ලබාගන්නා ලද තොරතුරු සහ දැනුමෙහි ගෝලීය සම්පිණ්ඩනයකිනි. සිදුවන ප්‍රචණ්ඩත්වයේ ස්වරූපයන්, පීඩාවට පත්වන ජනගහනයන්, වැරදි සිදුකිරීමේ හා වින්දිතකරණයේ අනුපාතිකය, පීඩාවට පත්වන විවිධ ජනගහනයන්ට අදාළ වන පරිදි වැරදි සිදුකිරීමට හා වින්දිතකරණයට බලපාන අවදානම් සාධක (ඉහත දක්වන ලද ආදර්ශය බලන්න) සහ එය සිදුවන්නේ ඇයිද යන්න පැහැදිලි කරන සෙසු සාධක ඇතුළු රටේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ තත්වය තක්සේරු කිරීම වැදගත්ය.

දැනට ලබාගත හැකි තොරතුරු විධිමත් දත්ත සමාලෝචනයකට ලක්කිරීම මගින් සහ වැදගත් කණ්ඩායම්වලින් උපදෙස් විමසීමෙන් මෙම තොරතුරු ලබාගත හැකිය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සමීක්ෂණ ක්‍රමවේදය, Demographic and Health Surveys (DHS); International Men and Gender Equality Studies (IMAGES); UN Multi-Country Study on Men and Violence සහ සමාජභාවය සහ ප්‍රචණ්ඩත්වය පැවැත්ම, සංදර්භීය සාධක, ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් තක්සේරු කිරීම සඳහා ජාතික හෝ උප ජාතික වශයෙන් මෙහෙයවන ලද වෙනත් ඕනෑම සමීක්ෂණයක් වන ඕනෑම මහා පරිමාණ සමීක්ෂණයක සමාලෝචනයක් ආයතනික දත්ත සමාලෝචනයට ඇතුළත් විය යුතුය (අමතර මූලාශ්‍ර යෝජනා සඳහා ඇමුණුම බලන්න). වෙනත් වැදගත් තොරතුරු මූලාශ්‍ර අතරට පහත දැක්වෙන ඒවා අයත් වේ: ජාතික සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, අධ්‍යාපනික ආයතන සහ එක්සත් ජාතීන් විසින් මෙහෙයවන ලද සමීක්ෂණ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ එය නිර්මාණය කර පවත්වාගෙන යන සාධක හඳුනාගැනීම සඳහා ප්‍රමාණාත්මක සහ/හෝ ගුණාත්මක අධ්‍යයන හඳුනාගැනීම සඳහා ගූගල් හෝ වෙනත් අදාළ විද්‍යුත් දත්ත පදනමක් (PubMed, Science Direct වැනි) භාවිතා කළ හැකිය.

දැනට තිබෙන සාක්ෂි පදනම සීමිත වන සංදර්භයන්හිදී, ජාතික සැලැස්ම හා ප්‍රතිපත්තිවල අඩුපාඩු සපිරීම සඳහා වැඩිදුරටත් සමීක්ෂණ සිදුකිරීම පිණිස අරමුදල් සම්පාදනය සලකාබැලීමට ප්‍රතිපත්ති සම්පාදකයන් කැමැත්තක් දැක්විය හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සියලු සමීක්ෂණ ආචාරධාර්මික ප්‍රමිතිවලට අනුකූල විය යුතු අතර කාන්තාවන්ගේ ආරක්ෂාව සහතික කළ යුතුය. එවැනි සමීක්ෂණවලට අනුග්‍රහය දැක්වීමේදී ඇසිය යුතු වැදගත් ප්‍රශ්න මෙවැනි ඒවායටි

- රට තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ රටාවන් (වර්ග, මට්ටම්, බේරුණු පුද්ගලයන්, වැරදි කරන්නන්) වෙනස් වන්නේ කෙසේද?
- ප්‍රචණ්ඩත්වය සිදුවන්නේ කොහේද? එනම්, පෞද්ගලික (නිවාස වැනි) තැන්වල ද, නැතිනම් පොදු ස්ථානවලද (උදා: වීදිය, වෙළඳපොළ, පුස්තකාල, විවේක ස්ථාන, පොදු ප්‍රවාහනය, සේවා ස්ථාන, සමාජ හෝ දේශපාලන අවස්ථා සහ පාසල් ආදී)?
- ප්‍රචණ්ඩත්වයේ අවදානමට වැඩිපුර ලක්විය හැක්කේ කුමන කාන්තා කණ්ඩායම්ද? (උදා: වයස, ජනවර්ගය, ජාතිය, විවාහක තත්වය, එච්අයිවී තත්වය, ආගම, ආබාධිත තත්වය, සමාජ ආර්ථික තත්වය, සංක්‍රමණික තත්වය, ලිංගිකභාවය සහ සමාජභාවී අනන්‍යතාව)
- කාන්තාවන් ප්‍රචණ්ඩත්වය අත්විඳීමේ වැඩි අවදානමට ලක්කරන්නේ කුමන සාධක විසින්ද?
- පිරිමින් ප්‍රචණ්ඩත්වය අත්විඳීමේ වැඩි අවදානමට ලක්කරන්නේ කුමන සාධක විසින්ද?
- පිරිමින් ප්‍රචණ්ඩත්වය සිදුකිරීමේ සහ කාන්තාවන් ප්‍රචණ්ඩත්වය විඳීමේ අවදානම අවම කරනු ලබන්නේ කුමන සාධක විසින්ද? (එනම්, ආරක්ෂක සාධක)
- ප්‍රචණ්ඩත්වය පවත්වාගෙන යන නිශ්චිත සමාජ සම්මතයන්2 සහ ආකල්ප මොනවාද? ඒවා ප්‍රවර්ධනය කරන්නේ කවුරුන්ද?

මෙම ප්‍රශ්නවලට පිළිතුරු මගින් ද උපදෙස් විමසීම්වල අඩංගු කරගත යුතු පාර්ශ්වකරුවන් සහ වැළැක්වීමේ මූලපිරුම් ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ පිළිතුරු ලබාගත හැකිය.

වැඩමුළු ස්වරූපයේ වැඩසටහනක් වෙනුවෙන් සාක්ෂි සහ අත්දැකීම් මගින් දායක විය හැකි පාර්ශ්වකරුවන් ඒකරාශී කළහැකි පුහුණු පහසුකම් සපයන්නකු හඳුනාගන්න. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ පොදු අර්ථකථන සහ සංකල්පගත කිරීම් ඉලක්ක කරන්න. එය විස්තර කරන භාෂාවට එකඟ වන්න. වැදගත් පාර්ශ්වකරුවන් විසින් රටේ සංදර්භය තුළ එය වලංගු කළ යුතුය. මෙම තත්වය සාක්ෂාත් කරගැනීම සඳහා කාලසීමාව තුළ රැස්වීම් කීපයක් අවශ්‍යය. එසේම, සහභාගි වීමට බැරි වූ කණ්ඩායම් තුළ තොරතුරු වලංගු කරගැනීම ද අවශ්‍ය විය හැක (උදා: ආබාධිතභාවය ගැන).

එකිනෙක හරහා යන අනන්‍යතා සහිත සහ සත්‍ය අත්දැකීම් මගින් මූලෝපායට දායක විය හැකි කණ්ඩායම්වල අරුත්බර නියෝජනයක් උපදෙස් විමසීම් තුළ අඩංගු විය යුතුය. උපදෙස් විමසීම් පැවැත්විය යුත්තේ දෘඪ බහුපාර්ශ්වීය සන්ධාන හා ස්ථාපිත සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් මගින් තිරසර කිරීමේ හැකියාව තිබෙන ජාලයන් ගොඩනැගීමේ අරමුණෙනි.

තොරතුරු ලේඛනගත කිරීම සඳහා පහත දැක්වෙන කාර්ය පත්‍රිකාව භාවිතා කරන්න

අවදානම හා ආරක්ෂක සාධක තක්සේරු කිරීමේදී සුවිශේෂ කොන්කරන ලද කාන්තා කණ්ඩායම්වලට විශේෂ අවධානය යොමුකළ යුතුය. ඔවුන් ලිංගික හා සමාජභාවී අසමානතා නිසා සහ වයස, ජාතිය, ලිංගිකභාවය සහ සමාජභාවී අනන්‍යතාව, ආදායම, පුරවැසි තත්වය, ආබාධිතබව සහ/ හෝ වෙනත් සාධක සමග සම්බන්ධවන වෙනත් අසමානකම් හේතුවෙන් වෙනස්කම්වලට ලක්වීමේ අත්දැකීම් නිසා ප්‍රචණ්ඩත්වයට මුහුණදීමේ වැඩි අවදානමකට ලක්විය හැකිය. ජනගහනය තුළ විවිධ කාන්තාවන් (වැරදිකරුවන්) හට අදාළ වන අවදානම් සහ ආරක්ෂක සාධක අවශ්‍ය පරිදි හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන වගුව ආකාරයේ එකක් යොදාගත හැකිය.

අවදානම් සාධක	ජනගහන කණ්ඩායම හඳුනාගන්න: සියලු කාන්තාවන් සංක්‍රමණික කාන්තාවන් ආබාධ සහිත කාන්තාවන් ජනවාර්ගික හෝ ජාති සුළුතරයන්ට අයත් කාන්තාවන්	ආරක්ෂක සාධක
ඔබෙන්ම අසන්න: වැරදි කිරීමට හා වින්දිතකරණයට දායක වන්නේ කුමන සාධක සහ කොන්දේසිද?		**ඔබෙන්ම අසන්න:** වැරදි කිරීමේ හෝ වින්දිතකරණයේ හැකියාව අවම කිරීම සඳහා දායක වන්නේ කුමන තත්වයන්ද?
	පුද්ගල	
	අන්තර් පුද්ගල	
	ප්‍රජාව	
	සමාජීය	

පහත දැක්වෙන රූපසටහන විසින් නිරූපණය කරනු ලබන්නේ, පුද්ගල, සම්බන්ධතා, ප්‍රජා සහ ආයතනික මට්ටම්වලදී පරිසර විද්‍යාත්මක ආදර්ශයට අනුකූලව පවත්වන ලද ගෝලීය සමීක්ෂණ මගින් තහවුරු කරන ලද බහුවිධ අවදානම් සහ ආරක්ෂණ සාධකයි. ජාතික මට්ටමේදී ලේඛනගත කරන ලද සොයාගැනීම් වැඩිදුරටත් වලංගු කිරීම සඳහා එය භාවිතා කළ හැකිය.

පරිසර විද්‍යාත්මක ආදර්ශය අවබෝධ කරගැනීම

සමාජ පාරිසරික ආදර්ශය

සමාජයීය
- කාන්තාවන් හට ආර්ථික අයිතිවාසිකම් අවම වීම
- වෙනස්කොට සලකන පවුල් නීති
- සාමූහිකවාදී සංස්කෘතික නැමියාව
- වැටුප් ගෙවන රැකියාවන්වලට කාන්තාවන්ට ප්‍රවේශය අවම වීම

අන්තර් පුද්ගල
- අසමාන තීරණ ගැනීම
- දුර්වල සන්නිවේදන කුසලතා
- ඉහළ මට්ටමේ සම්බන්ධතා ගැටුම්

කාන්තාවන් (කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අත්දැකීම)
- තරුණ
- ළමාවියේදී ප්‍රචණ්ඩත්වයේ අත්දකින
- ළමාවියේ ප්‍රචණ්ඩත්වය දකින
- ප්‍රචණ්ඩත්වය/ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිගන්නා ආකල්ප
- පහළ මට්ටමේ සමාජ සහාය

කාන්තාව - විවිධ සංදර්භයන් තුළ අවදානම් හෝ ආරක්ෂණ සාධක
- කාන්තාවන්ගේ රැකියා/ ආදායම් උත්පාදනය
- වත්කම් හිමිකාරීත්වය
- ණය වෙත ප්‍රවේශය



අවදානම් සාධක

ප්‍රජාව
- කාන්තාව මත පුරුෂාධිපත්‍යය ඉවසන සමාජ සම්මතයන්
- පිරිමින්ගේ ගෞරවය කාන්තාවන්ගේ ගරුත්වය සමග සම්බන්ධ කරන සමාජ සම්මතයන්
- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ තත්වය පාලනය කරන සමාජ සම්මතයන්
- දික්කසාද/ තනි කාන්තාවන් සම්බන්ධයෙන් පවතින අපකීර්තිමත් ආකල්ප
- පවුල් රහස් සම්බන්ධ සමාජ සම්මතයන්
- ප්‍රාදේශීය දරිද්‍රතාව
- විරැකියාව
- පුළුල් අසල්වැසි පරිසරයේ ප්‍රචණ්ඩත්වය
- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිව සමාජ හෝ නීතිමය සම්බාධක නොමැති වීම

පිරිමි (කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව වැරදි සිදුකිරීම)
- තරුණ
- පහළ අධ්‍යාපනික මට්ටම
- ළමාවියේදී ප්‍රචණ්ඩත්වය අත්දැකීම/ දැකීම
- සමාජභාවී වශයෙන් සමානාත්මතාවාදී නොවන ආකල්ප
- ප්‍රචණ්ඩත්වය භාරගන්නා ආකල්ප
- මානසික අක්‍රමවත්භාවය
- මත්පැන්/ මත්ද්‍රව්‍ය භාවිතය

කාන්තාවන්ට හා ගැහැනු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මූලික හේතු

ගැහැණු ළමයින්ට සහ කාන්තාවන්ට එරෙහි සමාජභාවී අසමානතා සහ වෙනස්කොට සැලකීම් හැඩගැසෙන්නේ ආර්ථික, දේශපාලන හා සමාජ සාධක, ප්‍රතිපත්ති හා නීතිමය ව්‍යුහයන් ඇතුළු පද්ධති හා සමාජ සම්මතයන්, ඓතිහාසික සාධක (උදා: ගැඹුරට පැතුරුණු සංස්කෘතික භාවිතාවන්, යුද්ධය, යටත්විජිතකරණය), වයස, ආදායම, ජාතිය, ජනවර්ගය, ආබාධිතභාවය, සමාජභාවී අනන්‍යතාව, ලිංගික නැඹුරුව හා වෙනත් ලක්ෂණ මත පදනම් වූ ව්‍යුහාත්මක විශේෂතා අනුවයි.

4 පියවර: ජාතික සංදර්භයට එරෙහි මැදිහත්වීම පිළිබඳ ජාත්‍යන්තර සාක්ෂි තක්සේරු කරන්න

ඔබගේ ජාතික හෝ උප ජාතික කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සැලැස්ම පදනම් විය යුත්තේ ජාත්‍යන්තරව ස්ථාපිත කරන ලද සාක්ෂි මතය. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ විශ්වසනීය භාවිතාවන් ලබාදිය යුතුය[3]. පසුගිය දශකය තුළදී, ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වල ගෝලීය සාක්ෂි පදනමෙහි[4] කැපීපෙනෙන වර්ධනයක් සිදුවිය. එමගින් එක්සත් ජාතීන්ගේ වැළැක්වීමේ සහ RESPECT ව්‍යුහයන්ගේ සංවර්ධනයට මෙන්ම එළඹුම් හැඩගස්වාගැනීමේ සහ වර්ධනය කරගැනීමේ මෙවලම් සහ සම්පත්වලට තොරතුරු ලැබිණි.

RESPECT ව්‍යුහය මගින් මූලෝපායේ කුලුනු හත වටා සංවිධානය කරන ලද සාක්ෂි පදනම පිළිබඳ වර්තමාන සාරාංශයක් සපයනු ලැබේ. එය පහත දැක්වෙන රූපසටහනෙහි සරල ලෙස ඉදිරිපත් කර තිබේ.

- **R** සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම
- **E** කාන්තාවන් සවිබලගැන්වීම
- **S** සේවාවන් සහතික කිරීම
- **P** දිළිඳුකම අවම කිරීම
- **E** ආරක්ෂිත පරිසරයක් සැපයීම
- **C** ළමා හා නව යොවුන් අපයෝජන වැළැක්වීම
- **T** ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් පරිවර්තනය කිරීම

5 පියවර: වැළැක්වීමේ සැලැස්මක් සංවර්ධනය කිරීම

සාක්ෂි පදනම්න් සහ උපදෙස් විමසීම්වලින් තොරතුරු ලබාගෙන, කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ප්‍රධාන ස්වරූප, මූලෝපායන්, පසුබිම් හා ජනගහනයන් හඳුනාගන්නා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් මූලෝපායක් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන් හට හැකිය. ජාතික හා උප ජාතික වැළැක්වීමේ මූලෝපායන් දුර විහිදෙන, විවිධ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ස්වරූප සියල්ල ඇතුළත් කරගන්නා සහ සමස්ත ජනගහනයම ඉලක්ක කළ, කිසිවකු බැහැර නොකරන මූලධර්මයට බැඳුණු ඒවා විය යුතුය.

සාක්ෂිවලින් පැහැදිලි වන ආකාරය අනුව, කාර්යක්ෂම සහ තිරසර වීම සඳහා, ප්‍රාථමික වැළැක්වීමේ මූලෝපායන් තුළට බහුවිධ මාර්ග ඔස්සේ පුද්ගල ආකල්ප සහ ප්‍රචණ්ඩත්වයට උපකාර කරන ඉවසන හෝ එයට සමාව දෙන සංවිධානමය, සමාජ හා සංස්කෘතික භාවිතාවන් සම්බන්ධ කරගෙන වැඩකිරීම ඇතුළත් විය යුතුය. සමාජභාවී අන්දමින් වෙනස්කම් කරන සහ සංස්කෘතිය, ආකල්ප සහ චර්යාවන් ඒකාකෘතිගත කරන භාවිතාවන් ඒ අතර වේ. මූලෝපායන් නීත්‍යානුකූල විය යුතු අතර නීතිමය ව්‍යුහය විසින් ඉලක්ක විවිධ ජන කණ්ඩායම් ශක්තිමත් කිරීම ඉලක්ක කළ යුතුය. එම ජන කණ්ඩායම් ජීවත්වන, වැඩකරන හා සමාජානුයෝජනය වන විවිධ පරිසරයන් ද එහිදී අදාළ වේ. එසේම, පසුබිම් පරාසයක් (පාසල්, සේවාස්ථාන සහ මාධ්‍ය වැනි) තුළ වැඩකිරීම සහ විවිධ ජන කණ්ඩායම් (පිරිමින් හා පිරිමි ළමයින්, මව්පියන්, ළමයින් වැනි) ද අදාළ වේ. එසේ වැඩ කරන්නේ, පරිසර විද්‍යාත්මක ව්‍යුහයේ පුද්ගල, සංවිධානමය, ප්‍රජා සහ සමාජ මට්ටම්වලය.

ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා රාජ්‍යයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සැලැස්ම (2010 -2020) යනු, ප්‍රාථමික වැළැක්වීම උදෙසා වන දිගුකාලීන හා බහු පාර්ශ්වීය ව්‍යුහයකි. එය සමස්ත රාජ්‍ය එළඹුම හරහාම විහිදේ. එම සැලැස්ම සඳහා තොරතුරු ලබාගත්තේ සාක්ෂි සමාලෝචනයකිනි. එය ලබාගත්තේ සෞඛ්‍ය ප්‍රවර්ධනයේ සෞඛ්‍ය ප්‍රවර්ධනයේ හා ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සමාජ පරිසර විද්‍යාත්මක ආදර්ශයෙනි. එම සැලැස්ම විසින් ක්‍රියාකාරිත්වය සඳහා යෝජිත පරිසරය හා ජන කණ්ඩායම් හඳුනාගනියි. එසේම, සමාජ, ප්‍රජා/ සංවිධානමය සහ පුද්ගල/ සම්බන්ධතා මට්ටම් වැරගන්වන්නා වූ ප්‍රතිපත්ති එයට ඇතුළත් වේ.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මූලික මට්ටමේදී වැළැක්වීමේ මාර්ගෝපදේශ රාමුව

ප්‍රචණ්ඩත්වයේ ප්‍රධාන නිර්ණය සාධක සහ ක්‍රියාකාරිත්වය සඳහා තේමාව

පිරිමින් සහ ගැහැණුන් අතර සමාන හා ගෞරවනීය සම්බන්ධකම් ප්‍රවර්ධනය කිරීම

පුද්ගල/ සම්බන්ධතා නිර්ණය සාධක

- දෘඪ සමාජභාවී භූමිකා සහ අනන්‍යතා, සමාජභාවී සමානාත්මතාව සඳහා දුබල සහාය
- බැඳීමෙහි පුරුෂ නැමියාව/ හැඟීම
- සම්බන්ධතාවෙහි ධනය පාලනය කිරීමේලා පුරුෂ ආධිපත්‍යය

ප්‍රජා සහ සංවිධානමය නිර්ණය සාධක

- සමාජභාවය හා ලිංගිකත්වය සම්බන්ධ සංස්කෘතික වශයෙන් නිශ්චිත සමාජ සම්මතයන්
- පුරුෂ සම කණ්ඩායම් හා සංවිධානමය සංස්කෘතිය

සමාජමය නිර්ණය සාධක

- ආයතනික හා සංස්කෘතික සහාය හෝ සමාජභාවය වෙනුවෙවි දුබල සම්බාධක සහ දැඩි සමාජභාවී භූමිකා

දායක වන වැදගත් සාධක හා ක්‍රියාකාරිත්වය සඳහා තේමා

ප්‍රචණ්ඩ නොවන සමාජ සම්මතයන් ප්‍රවර්ධනය කිරීම/ කලින් ප්‍රචණ්ඩත්වයට මුහුණදීමේ බලපෑම් අවම කිරීම

පුද්ගල/ සම්බන්ධතා දායකත්ව සාධක

- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා ආකල්පමය සහාය
- ළමයකු ලෙස පවුලේ ප්‍රචණ්ඩත්වය දැකීම හෝ අත්දැකීම් ලැබීම
- වෙනත් ආකාරවල සාමූහික ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම
- අන්තර් පුද්ගල ගැටුම් විසඳීමේ ක්‍රමයක් ලෙස ප්‍රචණ්ඩත්වය පිළිගැනීම

ප්‍රජා සහ සංවිධානමය දායකත්ව සාධක

- ප්‍රචණ්ඩත්වයට සහයෝගී හෝ අඩුවෙන් සම්බාධක පණවන අසල්වැසි, සම කණ්ඩායම් සහ සංවිධානමය සංස්කෘතිය
- ප්‍රජා හෝ සම කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය

සමාජමය දායකත්ව සාධක

- ප්‍රචණ්ඩත්වය/ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයඅනුමත කිරීම හෝ දුබල සම්බාධක පැණවීම
- අන්තර් පුද්ගල, පුරවැසි හෝ දේශපාලන ආරාවුල් විසඳීමේ ක්‍රමයක් ලෙස ප්‍රචණ්ඩත්වය භාරගන්නා ආචාර විධි
- යටත්විජිතකරණය

සම්පත් හා ආධාරක පද්ධති වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම

පුද්ගල/ සම්බන්ධතා දායකත්ව සාධක

- සමාජ හුදකලාව සහ උපකාරක පද්ධති වෙත සීමිත ප්‍රවේශය
- ආදායම්, අධ්‍යාපනය, රැකියා
- සාපේක්ෂ ශ්‍රම බලකා තත්වය
- මත්පැන් හා නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය*
- දුර්වල මව්පිය භූමිකා
- පෞරුෂත්ව ලක්ෂණ සහ දුර්වල මානසික සෞඛ්‍යය
- සම්බන්ධතා හා විවාහ ගැටුම්
- දික්කසාදය/ වෙන්වීම

ප්‍රජා සහ සංවිධානමය දායකත්ව සාධක

- දුර්වල සමාජ සම්බන්ධතා හා සමාජ සංහිඳියාව සහ කාන්තාවන් අතර සීමිත සාමූහික ක්‍රියාකාරකම්
- පවුලේ රහසෘහාවය සම්බන්ධයෙන් දැඩි සහාය
- අසල්වැසි ලක්ෂණ (සේවා යටිතලය, විරැකියාව, පිළිඳුකම, සාමූහික කාර්යක්ෂමතාව)

සමාජමය දායකත්ව සාධක

- පවුලේ රහසෘහාවය හා ස්වාධිපත්‍යය වෙත දක්වන සහාය
- ද්‍රව්‍යමය සම්පත් අසමාන ලෙස බෙදීයාම (උදා: රැකියා, අධ්‍යාපනය)

ජනගහන කණ්ඩායම් සහ වැළැක්වීමේ ක්‍රියා

වැළැක්වීමේ ක්‍රියා

- සමීක්ෂණ, අධීක්ෂණය හා ඇගයීම
- සෘජු සහභාගීත්ව වැඩසටහන්
- සංවිධානමය හා ශ්‍රම බලකාය සංවර්ධනය
- ප්‍රජාව ශක්තිමත් කිරීම
- සන්නිවේදනය හා සමාජ අලෙවිකරණය
- උද්දේශනය
- නීතිමය හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ

ජනගහන කණ්ඩායම්

- ළමයින්
- තරුණ ජනයා
- කාන්තාවන් සහ පිරිමින්
- අවාසිදායක තත්වයන් නිසා පීඩාවට පත් අසල්වැසියන්
- ස්වදේශික කණ්ඩායම්
- ග්‍රාමීය ප්‍රජාවන්
- සංස්කෘතික හා වාග් විද්‍යාත්මක වශයෙන් විවිධ වන ප්‍රජාවන්
- ආබාධ සහිත කාන්තාවන්

ක්‍රියාකාරිත්වය සඳහා පසුබිම හා අංශ

- ප්‍රජා සේවා
- සමාගම්
- ආගමික ප්‍රජාවන්
- අධ්‍යාපනය
- සේවාස්ථාන
- සංස්කෘතික ආයතන හා ජාලයන්
- කලා
- ක්‍රීඩා හා විනෝද
- මාධ්‍ය හා ජනප්‍රිය සංස්කෘතිය
- පළාත් පාලනය
- සෞඛ්‍යය
- සයිබර් අවකාශය/ නව තාක්ෂණයන්
- යුක්තිය
- අධ්‍යාපනික
- හමුදා/ ඒ හා සමාන ආයතන

අතරමැදිකාලීන ප්‍රතිඵල

පුද්ගල/ සම්බන්ධතා

- සම්පත් හා සහාය සඳහා වැඩිදියුණු කරන ලද සම්බන්ධතා
- ගෞරවනීය හා සාධාරණ සමාජභාවී සම්බන්ධතා
- සමාජභාවී සමානාත්මතාව, සමාජභාවී භූමිකා සහ ප්‍රචණ්ඩත්වය/ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩිදියුණු වූ ආකල්ප
- අන්තර් පුද්ගල ගැටුම් විසඳීම සම්බන්ධයෙන් වැඩිදියුණු කරන ලද කුසලතා
- වගකීම් සහිත ලෙස මත්පැන් භාවිතා කිරීම

සංවිධානමය

පහත දැක්වෙන ආකාරයේ සංවිධාන

- සමාන ගරුත්වය හා අහිංසාවාදී සමාජභාවී සම්බන්ධතා ආදර්ශ නිර්මාණය කරන, ප්‍රවර්ධනය කරන හා ඒවාට පහසුකම් සපයන
- ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අංශ අතර හවුල්කාරිත්වයෙන් වැඩකරන
- සාක්ෂි මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරන
- කාන්තාවන්ට ළඟාවිය හැකි, ආරක්ෂාකාරී සහ උපකාරශීලී

ප්‍රජා

දැක්වෙන ආකාරයේ පරිසරයන්

- අහිංසාවාදී සහ ගෞරවනීය හා සාධාරණ සමාජභාවී සම්බන්ධතා සහිත සමාජ සම්මතයන් අගය කරන හා ඒවාට සහාය වන
- ජනයා හා තමන් අතර සම්බන්ධතා ගොඩනගහ සහ විධිමත් හා අවිධිමත් සහාය ලබාදෙන
- ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පියවර ගැනීම

සමාජයීය

පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් ශක්තිමත් නීතිමය හා නියාමන ව්‍යුහයන් සහ යෝග්‍ය සම්පත් වෙන්කිරීම් සහිත සමාජයන්

- සමාජභාවී සමානාත්මතාව
- ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හා තහනම් කිරීම
- කාන්තාවන් සාධනීය ලෙස නිරූපණය කිරීම: උදා: දැන්වීම් ආදියෙහි)
- කාන්තාවන් සහ පිරිමින් අතර සාධනීය සම්බන්ධතා ගොඩනැගීම

දිගුකාලීන වාසි

පුද්ගල/ සම්බන්ධතා

- ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත මානසික සෞඛ්‍ය ගැටලු හා මරණ අවම කිරීම
- වර්ධනය වූ අන්තර් පුද්ගල, පවුල් හා සමාජභාවී සම්බන්ධතා
- ප්‍රචණ්ඩත්වය හා එහි බලපෑම් පරම්පරාවෙන් පරම්පරාවට මාරුවීම් අවම වීම

සංවිධානමය

- ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සම්පත් හා ක්‍රියාකාරකම් අංශ හා පසුබිම් අතර ඒකාබද්ධ කිරීම
- ගෞරවනීය සමාජභාවී සම්බන්ධතා අගය කරන හා ප්‍රවර්ධනය කරන සංවිධාන
- සම්පත් හා සහායක පද්ධති වෙත වැඩිදියුණු කරන ලද ප්‍රවේශය

ප්‍රජා

- කාන්තාවන් සහ පිරිමින් අතර සමාජභාවී සමානාත්මතාව සහ ගෞරවනීය සම්බන්ධතා අගය කරන ප්‍රජාවන්
- සමාජ හුදකලාභාවය අවම කිරීම සහ ප්‍රජා සම්බන්ධතා වැඩිදියුණු කිරීම

සමාජයීය

- සමාජ අසමානාත්මතා අවම කිරීම
- පිරිමින් හා කාන්තාවන්ගේ ජීවිත ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම
- ප්‍රචණ්ඩත්වය/ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම
- ඵලදායිතාව වැඩිකිරීම

වැළැක්වීම සඳහා සම්පත්

1 පියවර: ගෝලීය ව්‍යුහයන් සහ සාක්ෂි

- UN Prevention Framework (2015) විසින් වෙනස් කිරීමේ නයාය සිතියම්ගත කිරීමේ එළඹුමක් ඔස්සේ මනා ලෙස ඉලක්ක කරන ලද වැළැක්වීමේ එළඹුම් ක්‍රියාත්මක කිරීම සඳහාත් වැළැක්වීම සඳහා වැඩසටහන් සම්පාදනය ආරම්භ කිරීම සඳහාත් සම්පත් සපයයි.
- RESPECT Women: Preventing Violence against Women Framework (2019) පදනම් වන්නේ එක්සත් ජාතීන්ගේ වැළැක්වීමේ ව්‍යුහය මතය. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට උපකාර පිණිස සාක්ෂි මත පදනම් වූ මූලෝපායක් සම්පාදනය කරයි.
- Global Framework on Women's Safety in Rural Spaces (2019) අවධානය යොමුකරන්නේ පොදු ස්ථානවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා හිංසනය වැළැක්වීම කෙරෙහිය. මෙම ව්‍යුහය විසින් තේ කර්මාන්ත අංශය සම්බන්ධයෙන් පොදු අවබෝධයක් ඇතිකිරීමට උපකාර කරනු ලැබේ. එය කෘෂිකර්මාන්ත වටිනාකම් දාමවල අනෙකුත් පාරිභෝගික භාණ්ඩ අංශවලට ද යොදාගත හැකිය.
- What Works to Prevent VAWG Evidence Hub විසින් එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුවේ (DFID) සන්නාම ගෝලීය සමීක්ෂණ සහ රටවල් 13ක නවෝත්පාදන වැඩසටහන්වල සොයාගැනීම් ඉදිරිපත් කරනු ලැබේ. DFID කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ උපකාරක කාර්යාංශය විසින් කාර්තුවකට වරක් පළකරන VAWG Evidence Digests විසින් අලුත්ම සමීක්ෂණ, ප්‍රතිපත්ති සහ ප්‍රවෘත්ති සාරාංශයක් ඉදිරිපත් කරනු ලැබේ.
- UN Trust Fund (UNTF) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා සාක්ෂි සහ අධ්‍යයන මධ්‍යස්ථානක් විසින් රටවල් හා භූගෝලීය කලාප 80ක කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මූලපිරුම්වල වාර්තා පුස්තකාලයක් සපයයි.
- Prevention Collaborative's Knowledge Platform විසින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ මනාව සංවිධානය කරන ලද, පහසුවෙන් ලබාගත හැකි වැදගත් සාක්ෂි සහ භාවිතාවන් සමුදායක් සපයයි. වැඩසටහන් එළඹුම් ද එයට අයත් වේ.

2 පියවර: ජාතික සංදර්භය හා සාක්ෂි තක්සේරු කරන්න

- International Men and Gender Equality Studies (IMAGES) සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ පිරිමින්ගේ (සහ කාන්තාවන්ගේ) ආකල්ප සම්බන්ධයෙන් ජනගහන පාදක දත්ත සපයයි.
- UN Multi-country Study on Men and Violence රටවල් හතක ක්‍රියාත්මක කරන ලදී. එහිදී පිරිමින් විසින් කාන්තාවන්ට එරෙහිව සිදුකරන ප්‍රචණ්ඩත්වය අවබෝධ කරගැනීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේද භාවිතා කරන ලදී. එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මෙවලම් කට්ටලයක් ද එයට ඇතුළත්ය.
- WHO multi-country study on women's health and domestic violence against women හි සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ ආකල්ප සහ වෙනත් අවදානම් සාධක පිළිබඳධ ප්‍රශ්න අඩංගු වේ.
- Demographic and Health Surveys (DHS) විසින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ජනගහනය පාදක කරගත් දත්ත සම්පාදනය කරනු ලැබේ. ආකල්ප හා විශ්වාසයන් ද එයට ඇතුළත් වේ.
- Fundamental Rights Agency Survey on Violence against Women මගින් යුරෝපා සංගමයේ රටවල් 28ක් ආවරණය කරනු ලැබේ.
- International Men and Gender Equality Study in the Middle East and North Africa මගින් පුරුෂමූලිකත්වය අවබෝධ කරදෙනු ලැබේ.
- OSCE Survey on the Well-being and Safety of Women රටවල් හතක ක්‍රියාත්මකකරන ලදී. එහි අරමුණ වන්නේ ගිනිකොණදිග යුරෝපයේ සහ නැගෙනහිර යුරෝපයේ රටවල ප්‍රචණ්ඩත්වයේ පැවැත්ම හා එය ධාවනය කරන බලයන් අවබෝධ කරගැනීමයි.
- Oak Foundation iy Economist's Out of the Shadows යනු රටවල් 60ක සැසඳුම් නියාමනයන් සිදුකරන දර්ශකයකි. එමගින් ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති, භාවිතාවන් සහ ප්‍රමිති අධ්‍යයනය කරනු ලැබේ.

අමතර මූලාශ්‍ර

- Sexual Violence Research Initiative (SVRI) යනු, පහළ සහ මැද ආදායම් සහිත රටවල ලිංගික හිංසනය සම්බන්ධ ගුණාත්මක සමීක්ෂණ සඳහා වන ගෝලීය ජාලයකි.
- Community for Understanding Scale Up (CUSP) යනු, විවිධ සංදර්භයන් තුළ වැළැක්වීමේ මැදිහත්වීම් සංවර්ධනය සඳහා දැනුම සහ පාඩම් බෙදාහදාගන්නා සංවිධාන නවයක කණ්ඩායමකි.
- එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ Virtual Knowledge Centre to End VAW විසින් මූලපිරුම්, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ පියවරෙන් පියවර මාර්ගෝපදේශ සපයනු ලැබේ. විශේෂිත අංශ, කණ්ඩායම් හෝ මැදිහත්වීමේ කලාප සමග වැඩකිරීමේ මාර්ගෝපදේශය ද එයට අයත් වේ.
- Equality Institute (EQI) යනු සමාජභාවී සමානාත්මතාව උසස් කිරීමට සහ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම වෙනුවෙන් වැඩකරන ගෝලීය සමීක්ෂණ හා නිර්මාණාත්මක නියෝජිතායතනයකි.
- Partners for Prevention යනු කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කළ එක්සත් ජාතීන්ගේ අන්තර් නියෝජිතායතන මූලපිරුමකි. ආසියා පැසිෆික් කලාපයේ ක්‍රියාත්මක වන එය ප්‍රචණ්ඩත්වය පවත්වාගෙන යන සාධක සහ වැඩසටහන්කරණයෙන් උගත් පාඩම්වල සාරාංශ සම්බන්ධ ගැඹුරු සමීක්ෂණ සිදුකරයි.

පසු සටහන

[1] CEDAW, SDGs, Beijing Platform for Action, Maputo Protocol (අප්‍රිකාව), Belém do Pará (ඇමරිකා) සහ Istanbul Convention (යුරෝපය) ආදිය

[2] බලන්න DFID's (2016) Guidance Note on Shifting Social Norms to Tackle VAWG.

[3] දැඩි ඇගයීම් නොමැති ඒවා සඳහා විශ්වාසනීය භාවිතාවන්ට පහත දැක්වෙන ඒවා අයත් වේ: භාවිතාව මත පදනම් වූ දැනුම සහ/හෝ නියෝජනාත්මක ප්‍රතිඵල ඔස්සේ (උදා: සමාජ සම්මතයන් වෙනස් කිරීම) ප්‍රතිඵල ප්‍රදර්ශනය කිරීම

[4] සාක්ෂි පදනම ලෙස සැලකෙන්නේ, දැඩි ඇගයීම් ක්‍රම භාවිතා කිරීම ඔස්සේ ප්‍රචණ්ඩත්වයේ අඩුවීමක් ප්‍රදර්ශනය කර තිබෙන වැඩසටහන් මැදිහත්වීම්ය.

[5] "Framework to Guide Primary Prevention of Violence Against Women" උපුටාගනු ලැබුවේ 'Preventing violence before it occurs. A framework and background paper to guide the primary prevention of violence against women in Victoria' වෙතිනි. එය පළකරනු ලැබුවේ Victorian Health Promotion Foundation විසිනි.

© UN Women 2020

මෙම ලේඛනය **RESPECT වියුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

Suggested citation: UN Women and Social Development Direct (2020), RESPECT: Preventing Violence against Women National Plan Guide & Workbook.